# ක්‍රිස්තියානි ධර්මය

## 13 වන ශ්‍රේණිය

**ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය**

**(2010 වසරේ සිට ක්‍රියාත්මක වේ.)**

ආගම් දෙපාර්තමේන්තුව
විෂයමාලා සංවර්ධන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

නිපුණතා පාදක විෂයමාලාව පාසල් පද්ධතියට හඳුන්වාදීමේ කාර්යය 13 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හඳුන්වාදීමත් සමඟ සම්පූර්ණ වේ. 12 වන හා 13 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පවතින දැඩි තරගයට ගොදුරුවීම නිසා නිරන්තරව ම යම් තරමක පීඩනයකට යටත් වේ. නව විෂයමාලාව ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙ.) සඳහා යොදා ගැනෙන විට මෙම පීඩනය තවත් දැඩි වේ. එවැනි අවස්ථාවක ඔබ අතට පත්වන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, විෂය නිර්දේශ තරමට ම ගුරුවරුනට වැදගත් වන්නේ ය. මෙහි මූලිකව ම ගුරුවරයා සැලකිල්ලට ගත යුතු පැති තුනක් ඇත. එනම් ගුරු මාර්ගෝපදේශ විෂය නිර්දේශය හා පූර්ණව ගැළපී තිබීම, විෂයමාලාවේ අපේක්ෂිත නිපුණතා පාදකව විෂයමාලාවේ දර්ශනය හා දැක්ම මුල්කොට ගෙන සකසා තිබීම හා 12 - 13 ශ්‍රේණිවල දරුවාගෙන් අපේක්ෂිත සාධන මට්ටම මෙනෙහි කොට සකසා තිබීම. එහෙයින් මෙය හොඳින් පරිශීලනය කිරීම ගුරුවරයාට අත්‍යවශ්‍ය කාර්යයක් හා වගකීමක් වන්නේය.

ජාතික අධ්‍යාපන ආයතනය ඉහත කී කරුණු තුන ම ඔබගේ අවධානයට ගෙන ඒම සඳහා 13 වන ශ්‍රේණිවල ඉගැන්වීම් කරන සියලුම ගුරුවරුනට ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම සඳහා ද ක්‍රියාත්මක වී සිටී. නිරන්තරව පැවැත්වෙන මෙම පුහුණු සැසිවලට අදාළ ගුරුවරුන් සහභාගිවීම අතිශයින් ම අවශ්‍ය කරුණක් වන්නේ මෙහි දැක්වෙන ඉගෙනුම්-ඉගැන්වීම් මූල ධර්ම හා ක්‍රියාදාම වටහා ගැනීමට පුහුණුව බෙහෙවින් ඉවහල් වන නිසා ය. විශේෂයෙන් ම පාසල් පාදක ඇගයීම් ක්‍රියා, නිපුණතා වර්ධනය සඳහා ඉවහල් කර ගැනීම අපේක්ෂා කෙරේ. විෂය කරුණුවලට පමණක් ඉගැන්වීම යටත්වීමට නොදී සිසුනගේ කුසලතා ඔප ගැන්වීමේ අභිලාෂය ඉටුකරදීමට මේ සියලු මැදිහත්වීම් අවශ්‍ය බව අධ්‍යාපන හා ඇගයීම් කාර්යයේ නියැලෙන අප සියලු ම දෙනා වටහා ගත යුතු වේ.

ගුරු මාර්ගෝපදේශ පිළියෙල කිරීමේ අතිශය වෙහෙසකාරී කාර්යය ඉටුකරලීමට මැදිහත් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලුම ශාස්ත්‍රීය අංශවල නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල හා බාහිරව ඒ සඳහා දායක වූ විද්වත් හැම දෙනාට ම ද මාගේ විශේෂ ස්තුතිය හිමි වේ.

**ආචාර්ය උපාලි එම්. සේදර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම් ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන්ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලි ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. එහිදී ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනය අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම නිර්මාණශීලී ව භාවිත කිරීමට නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ.

13 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගැන්වීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලි හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ට මාගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය උපාලි එම්. සේදර මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදු කර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබා දෙන්නේ නම් කෘතඥ වේ.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(විෂයමාලා සංවර්ධන පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යාපන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය

## උපදේශක මණ්ඩලය හා ලේඛක මණ්ඩලය

**මෙහෙයවීම** : ආචාර්ය උපාලි සේදර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

**උපදේශනය** : විමල් සියඹලාගොඩ මහත්මා
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
විෂයමාලා සංවර්ධන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

**අධීක්ෂණය** ඃ ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
අධ්‍යක්ෂ (ආගම්)
ජාතික අධ්‍යාපන ආයතනය.

**උපදේශක මණ්ඩලය**ඃ අති උතුම් දේවධර්මාචාර්ය වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණෝ.
සභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යාපනය පිළිබඳ රදගුරු කොමිසම

අති උතුම් දේවධර්මාචාර්ය තෝමස් සෞන්දනායගම් රදගුරු හිමිපාණෝ
උප සභාපති, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යාපනය පිළිබඳ රදගුරු කොමිසම

අතිගරු අයිවන් පෙරේරා පියතුමා
ජාතික කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ

අතිගරු ආචාර්ය ජයසිරි පීරිස් දේවගැතිතුමා
මහලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

ගරු ඥානමුත්තු පිලේන්ද්‍රන් පියතුමා
අංශ ප්‍රධානි, ක්‍රිස්තියානි හා ඉස්ලාම් සංස්කෘතික අධ්‍යයන අංශය
යාපනය විශ්ව විද්‍යාලය

ගරු ග්‍රෙගරි ප්‍රනාන්දු සා.බෙ.නි පියතුමා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
ආගමික හා සාර්ධර්ම අංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

ආචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ
ප්‍රධානි, ක්‍රිස්තියානි සංස්කෘතික අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

**සම්බන්ධීකරණය** ගරු ලොයිඩ් ශාන්තිකුමාර් පියතුමා
ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය

ගරු ගැමුණු ඩයස් ජයවර්ධන පියතුමා
සහකාර ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපනය ආයතනය.

**ලේඛකමණ්ඩලය** : ආචාර්ය ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා
අධ්‍යක්‍ෂ, දේව ධර්ම නිකේතනය, කොළඹ 08

ශාස්ත්‍රපති ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමා
අධ්‍යක්ෂ , අගරදගුරු පදවි ධර්මෝපදේශ සේවාව

ශාස්ත්‍රපති ගරු ෂෙරොන් චන්දන ඩයස් පියතුමා
කථිකාචාර්ය, ජාතික දෙව්සත්හල , අම්පිටිය

ශාස්ත්‍රපති ගරු ආනන්ද වීරකෝන් පියතුමා
කථිකාචාර්ය, දේව ධර්ම නිකේතනය, කුරුණෑගල ශාඛාව

ශාස්ත්‍රපති ගරු පිලිප්ස් ර්. ජේසුදාසන් පියතුමා
"අම්ල උදයම්" උප්පුවේලි, ත්‍රිකුණාමලය

ශාස්ත්‍රපති එස්. ජී.කේ. ඩී. එල්. සී. ප්‍රසාද් මහත්මා
ගරු උපදේශක, හෝමාගම අධ්‍යාපන කලාපය

**විවිධ සහය** : ශාස්ත්‍රපති ගරු ක්‍රිස්ටෝපර් බාල්රාජ් දේවගැතිතුමා
ශාස්ත්‍රපති ගරු රංජිත් ජයවීර දේවගැතිතුමා
ශාස්ත්‍රවේදී ගරු සුරංග ද මැල් දේවගැතිතුමා
සුරංගි නෙළුමා මහත්මිය
ටී.ජේ. පෝල් ඇන්තනී මහත්මිය
ඩී.අයි. ජෝශප් මෙනවිය
ඒ. කේ. එස්. ඒන්ජල් මේරි මෙනවිය
ඒ. මැටිල්ඩා පුෂ්පරාණි මෙනවිය
එෆ්.ඒ.එෆ්. නිස්මියා මහත්මිය

**සංස්කරණ සහය** : ශාස්ත්‍රපති ගරු ආනන්ද වීරකෝන් පියතුමා

**පරිගණක වචන සැකසීම:** ආර්. ආර්. කේ. පතිරණ මහත්මිය
ජාතික අධ්‍යාපන ආයතනය

**පිටකවරය** : එෆ්.ඒ.එෆ්. නිස්මියා මහත්මිය
කාර්මික සහකාර
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


| | පිටුව |
|---|---|
| පෙරවදන | i |
| සංඥාපනය | ii |
| අධ්‍යාපන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය | |
| උපදේශක මණ්ඩලය හා ලේඛක මණ්ඩලය | iv |
| විස්තරාත්මක විෂය නිර්දේශය | 1 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය | 228 |

**නිපුණතාව 6.0 : යුගයෙන් යුගයට වූ සභා ව්‍යාප්තිය හඳුනාගනිමින් වර්තමාන සභාවේ උන්නතිය උදෙසා කැපවෙයි.**

**නිපුණතා මට්ටම 6.1 : සභාවේ ආරම්භක අවධිය පිළිබඳ කරුණු හදාරයි.**

**කාලච්ඡේද : කාලච්ඡෙද 50**

**ඉගෙනුම් ඵල :**

- ශුද්ධ වූ සභාවේ මුල් යුගය ගැන අධ්‍යයනය කිරීමට මූලාශ්‍ර සොයා ගැනීම.
- අපොස්තුලුවරුන්ගේ යුගයේ අවසාන කාලයේදී සභාව ව්‍යාප්තව පැවති ආකාරය සිතියමේ ලකුණු කරයි.
- මුල් සභාව ඉතා වේගයෙන් ව්‍යාප්ත වීමට දායක වූ පුද්ගයන්ගේ නම් ලැයිස්තු ගත කරයි.
- මුල් සභාව ඉතා වේගයෙන් ව්‍යාප්ත වීමට තුඩු දුන් හේතු සාධක සාකච්ඡා මගින් දැන ගනියි.
- ශුද්ධ පාවුලු තුමා ධර්මදූත ගමන් වලින් බැහැදුටු ස්ථාන සිතියමක සඳහන් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**6.1.1 කිතුනු සභාවේ ආරම්භක අවධිය :**

සභාව යනු කුමක් ද? අපගේ ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයාණන් ලෙසත්, සියලු ලෝකවාසින්ගේ මිදුම් කරුවාණන් ලෙසත් පිළිගෙන උන්වහන්සේ කෙරෙහි විශ්වාස කර උන්වහන්සේගේ ඉගැන්වීම් පිළිගෙන, ජීවත් වී උන්වහන්සේ ගේ නාමයෙන් බව්තිස්ම ස්නාපනය ලබා ජීවත් වෙන කණ්ඩායම අපි සභාව හැටියට හඳුන්වමු.

සභාවේ ආරම්භක යුගය හෙවත් ඉතිහාසය යනු කුමක් ද? මුල් සභාවේ ඉතිහාසය යනු සභාවේ ආරම්භයේ පටන් පළමුවන ශතවර්ෂ 03 ක් තුළ සභාව අත් දුටු වර්ධනය එනම් සභාවේ ස්ථාපිතය, ආරම්භක ව්‍යුහය, නමස්කාර ක්‍රමය, එහි අභිවෘධිය, ව්‍යාප්තිය සභාවේ ඉටු කළාවූ යහපත් ක්‍රියා, සභාවට ඇතිවුණු විරුද්ධත්වය, එය මුහුණ දුන් අභියෝගය, එය ලබාගත් ජය හා පරාජය වැනි දත්තයන්ය. මේ යුගය අපොස්තලික යුගය, සභා පියවරුන්ගේ යුගය, දුර්වලතාවලට විරුද්ධ වී නිවැරදි මත ඉදිරිපත් කළාවූ කාල පරිච්ඡේදය ලෙස හැඳින්විය හැකි ය.

**මේ යුගය දැන ගන්නට උපකාරවන මූලාශ්‍රයන් -**

අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත, අපොස්තුලුවරුන්ගේ, විශේෂයෙන් පාවුලුතුමාගේ සංදේශ (යැවුම් පත්‍ර), සුබාරංචි පොත් හතර සභා පියවරුන්ගේ හා ක්ෂමනවාදීන්ගේ ග්‍රන්ථ එකළ ක්‍රිස්තියානි නොවන ඉතිහාසඥයන්ගේ (ප්ලේවියන්, ජෝසප්, සෙරස්, ප්ලෙනි වැනි අය) ග්‍රන්ථ යනාදිය මූලාශ්‍ර වේ.

ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේගේ මෙහෙය ආරම්භයේ දී උන්වහන්සේ සමග සිටිමටත්, ශුභාරංචිය ප්‍රචලිත කිරිමටත් දොළොස් දෙනාව තෝරාගෙන ඔවුන්ව සුදානම් කරමින් ( මාක් 3 ፡ 13 -19) ඔවුන්ව ප්‍රායෝගිකව පුහුණු ( මාක් 6፡6- 13) කළේ ය. මෙලෙස උන්වහන්සේ සභාවට අත්තිවාරම දමමින් ඇතුලාන්ත ව්‍යුහය සකස් කළහ ; තවද මේ කණ්ඩායම සමඟ තවත් හැත්තෑදෙදෙනකු එකතු කරගත්හ.

ඒ කණ්ඩායමේ නායකත්වය දැරීමට පේදුරුතුමාට නියම කරන ලදී. (මතෙව් 16፡19) ඔවුන් විසින් ඉටු කළ යුතු මෙහෙවර පැහැදිලි කරන ලදී. " ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේද පුත්‍රයාණන්ගේද ශුද්ධාත්මයාණන්ගේද නාමයෙන් ඔවුන් බව්තිස්ම ස්නාපනය කරන්න." (මතෙව් 28፡ 18 - 20)

ක්‍රිස්තුස් වහන්සේගේ මරණයෙන් පසුව මේ කණ්ඩායම උන්වහන්සේගේ මෑණියන්වූ මරියතුමිය හා අනෙකුත් පිරිස ඇතුළත් කරගෙන 120 දෙනා ගෙන් යුක්ත වූ කණ්ඩායම හැටියට වර්ධනය විය. ( ක්‍රියා 1 ፡ 15)

උන්වහන්සේ සභාවට අවශ්‍ය සියල්ල සුදානම් කර නිම වූ පසු ඒ කණ්ඩායම ක්‍රියාශීලී වීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය බලාපොරොත්තුවෙන් සිටින්නැයි පවසමින් ස්වර්ගාරෝහණය විය. "ඔබ ජෙරුසලමෙන් ඉවත්ව නොගොස් මා වදාළ පරිදි පියාණන් වහන්සේගේ පොරොන්දුව බලාපොරොත්තුවෙන් සිටින්න... නොබෝ දවසකින් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම සනාපනය කරණු ලබන්නාහුය.'' ( ක්‍රියා 1 ፡- 4 - 5)

**ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය (ක්‍රියා ፡ 2 ፡ 1 13)**

ජේසුස් වහන්සේගේ වදනට අනුව ගෝලයෝ 120 පමණ පිරිසක් ජෙරුසලමේ උඩුමහල් කාමරයක යාච්ඤාකරමින් ශුද්ධාත්මයාණන්ගේ ආගමනය බලාපොරොත්තුවෙන් සිටියෝ ය.

ජුදෙව්වන්ගේ පෙන්තකොස්ත මංගල්‍යය ළංවිය. ජුදෙව්වන්ගේ නමස්කාරයේ දී විශේෂ මංගල්‍යය තුනක් තිබුණි.

1. පාස්කු - මිසරයේ වහල්කමේ සිට රතු මුහුද තරණය කරමින් විමුක්තිය ලැබීමේ සිද්ධිය මතක් කිරීමක්.
2. සති මංගල්‍යය - 50 වෙනි දින (පෙන්තකොස්ත) මංගල්‍ය - සීනායි කන්දේ දි ගිවිසුම සිහි කරනු ලැබීම.
3. කුඩාරම් මංගල්‍ය - වසර 40 කාන්තාරයේ දී ජීවත්වුණු ආකාරය සිහි කිරිම

මේ මංගල්‍ය දිනවල දෙවියන් වහන්සේ තෝරා ගත් අයට තමන් ඉදිරියෙහි පැමිණීමට අණ කළේය. නමුත් පාස්කු මංගල්‍යයේ දී පලස්තීනයේ ජීවත්වුණු ජුදෙව්වෝ පමණක් ජෙරුසලමට පැමිණියෝය. එහෙත් පෙන්තකොස්ත මංගල්‍යයට ලොව සෑම තැනම පැතිරි සිටි ජුදෙව්වෝ බොහෝ දෙනෙක් ජෙරුසලමට පැමිණියෝ ය.

පෙන්තකොස්ත දිනයේ දී බලාපොරොත්තු නොවූ අන්දමින් ශුද්ධාත්මයාණගේ ආගමනය සිදුවිය. (ක්‍රියා ː 2 ː 1-13) ඒ සිද්ධිය වචනයෙන් විස්තර කිරීමට කතුවරයා තැක්කල ආකාරයද දැකිය හැකි ය." ''සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිසියෙන් අහසින් නික්මුණේ ය... ගිනි දලු වැනි දිව් බෙදී ගොස්...." පරණ ගිවිසුම තුළ දෙවියන් වහන්සේගේ මහිමය විස්තර කිරීමට භාවිතකොට ඇති වචනද මෙහි භාවිත කිරීම තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේ බවද, එතුමාණන් ඉහළ සිට පහළට පැමිණෙන බවද කර්තෘවරයා පෙන්නුම් කරයි.

ශුද්ධාත්මයාණන් වහන්සේ බෙදුනු ගිනි දිව් ලෙස එහි රැස්වි සිටියාවූ අය මත වැඩහුන් බව කතුවරයා පැහැදිලි කරයි. " ගිනි දලු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු . . ." සියලු දෙනාම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ විය. අන්‍ය භාෂාවලින් කතා කළහ.... " පෙන්තකොස්ත මංගල්‍යයේ විශේෂත්වය ශුද්ධාත්මයාණන් වහන්සේගේ පැමිණීම සහ උන්වහන්සේ එහි සිටි සියලු දෙනා මත පහළ වීම යන්නය.

මෙහිදී ශුද්ධාත්මයාණන් වහන්සේ සමහර අයට සමහර කාලයකට පමණක් නොව එහි රැස්ව සිටියා වූ සියලු දෙනාටම සදාකාලිකව පහළ වූ සේක." ඔවුන් හිඳගෙන සිටි ගෙය මුළුමනින්ම එයින් පිරී ගියේ ය. මෙය ජොවෙල් දිවැසිවරයාගේ වදන් මගින් තහවුරු වේ. ''අන්තිම දවසේ දී සියල්ලන් මත මම මාගේ ආත්මය වගුරවන්නෙමි.'' මෙලෙස විස්තර කිරිම තුළින් මෙම කර්තෘවරයා අලුත් යුගයක ආරම්භය ගැනද නව ජීවනය ලබන ආකාරයද ශුද්ධ වූ සභාවේ ආරම්භය ද මෙලෙස පෙන්නුම් කර සිටියි. ශු. සභාවේ උපන් දිනය ලෙස පෙන්තකොස්ත දින හඳුන්වනු ලැබේ.

- ජේසුස් වහන්සේගේ ගෝලයෝ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ බව ඔවුන්ගේ ක්‍රියාව තහවුරු කරයි. නුගත් ගලීලියයන් විසින් අසල් වාසි භාෂාවක් කතා කිරීම, ජුදෙව්වන්ට භය වී වැසුණු කාමරයක සැඟවී සිටි ගෝලයන් එඩිතර වී පිටතට ගොස් විශාල සංඛ්‍යාවක් ඉදිරියෙහි නිර්භිතව ශුභාරංචිය දේශනා කිරීම ඔවුන් ශුද්ධාත්මයණන්ගේ දීමනාව සම්පූර්ණයෙන් ලැබ සිටි බව තහවුරු කරයි.

- ලෝකයේ සෑම තැනම සිට ජෙරුසලම් නගරයට පැමිණ සිටි ජුදෙව්වන් තම තමන්ගේ භාෂාවෙන් ශුභාරංචිය දේශනා කිරිම සවන් දීම තුළින් තහවුරු වන්නේ

ඔවුන් ලෝකයේ හැම තැනටම ගොස් ශුභාරංචිය දේශනා කළයුතු බවය. පේදුරුතුමා විවිධ දේශයෙන් පැමිණි අයට නිර්භිතව කතා කිරීම. කිතු දහම යම් කිසි ජාතිකයට හෝ භාෂාවකට හෝ සීමා නොවන අතර එය මුළු ලෝකයටම දී තිබෙන්නාවූ ආගමක් බව තහවුරු කරවයි.

- ගෝලයෝ දොළොස්දෙනාගේ නමින් පේදුරුතුමා කළ ප්‍රථම දේශනය පේදුරුතුමාගේ නායකත්වයද අපොස්තුලුවරුන්ගේ ඉගෙනීම් ද පැහැදිලි කරයි. දිවැසිවරුන්ගේ අනාවැකි ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ බව පෙන්නුම් කරමින් ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් තෝරාගත්, දිවැසිවරුන්ගේ අනාවැකි අනුව ඔවුන් බලාපොරොත්තු වූ මෙසියස් වහන්සේ ම බව පැහැදිලි කරයි. මේ ජේසුස් වහන්සේව ව්‍යවස්ථාව නොදන්නා අය කුරුසපත් කර මරා දැමුවෝය. නමුත් දෙවියන් වහන්සේ උන්වහන්සේව මරණයේ වේදනාවෙන් ගලවාගෙන නැවත උත්ථාන කළ සේක. (ක්‍රියා 2 ඃ 23 - 32)

- පේදුරුතුමාගේ දේශනාව කරණකොටගෙන තුන්දහසකට අධික පිරිසක් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් තමන්ගේ වැරදි තේරුම්ගෙන පසුතැවී බව්තිස්මය ලබමින් සභාවට එක් වුවෝ ය. පසුදා පේදුරුතුමා දේවමාලිගාවේ සුවපත් කරමින් සලමොන් මණ්ඩපයේ දී කළ දේශනය මගින් පන්දහකට අධික පිරිසක් දෙවියන් වහන්සේ තුළ විශ්වාසය තැබූහ. මෙලෙස ශුද්ධාත්මයාණන් වහන්සේගේ පහල් වීමේ සිද්ධියෙන් උපන් සභාව දිනෙන් දින ව්‍යාප්ත විය.

**ජුදෙව් පසුබිම තුළ කිතු සසුන**

කිතු දහම (සභාව) ජුදෙව් පසුබිමෙහි බිහි විය. ජුදෙව්වන්ගේ අගනුවර වන ජෙරුසලමෙහි ජුදෙව්වන් අතර ආරම්භ විය.

- ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජුදෙව් පවුලක ඉපදුණ ජුදෙව්වෙකි, ජුදෙව් ආගමික, සංස්කෘතික පසුබිමෙහි වැඩුණු කෙනෙකි ජුදෙව්වන්ට තමන්ගේ ශුභාරංචිය දේශනා කළේ ය.

  ජේසුස් වහන්සේ තෝරාගත් ශ්‍රාවකයෝ ජුදෙව්වෝය. ඔවුහු ජුදෙව්වන්ටම ශුභාරංචිය දේශනා කළහ.

- පෙන්තකොස්ත මංගල්‍යය නිමිත්තෙන් ජෙරුසලමේ රැස්වී සිටි ජුදෙව්වන්ට ජේසුස් වහන්සේ පිළිබඳ දේශනා කරන ලදී. හෙබ්‍රෙව් භාෂාව නැත්නම් ග්‍රීක වැනි වෙනත් භාෂාවක් කතා කළා වූ ජුදෙව්වන් තුන්දාහක් වැනි පිරිසක් පසුතැවී බව්තිස්මය ලබමින් සභාවට එකතු වූහ. සලමොන්ගේ මණ්ඩපයේදී පසුතැවී බව්තිස්මය ලැබූ පන්දහසක් දෙනා ද ජුදෙව්වෝය.

- ස්තේපන්ගේ වේදසාක්ෂිත මරණයෙන් පසු සැම තැනටම විසිර ගිය ගෝලයෝ තමන්ගේ ජාතිය වන ජුදෙව්වන්ට ඒ ඒ ස්ථානවල ශුභාරංචිය දේශනා කළෝ ය.

- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අනුගාමිකයින් තැබූ විශ්වාසය ඔවුන් සියලු දෙනාවම එක්රැස් කරන ලදී. ඔවුන් ජුදෙව් සමූහය තුළ ඉතා සුළු කණ්ඩායමක් හැටියට ජීවත් විය. ඔවුන්ට ක්‍රිස්තු ධර්මය ජුදෙව් ආගමේ තවත් ශාඛාවක් හැටියට පැවතිණි.

- මුල් කිතුනුවෝ සියලු දෙනාම ජුදෙව්වන් හැටියට සිටිය නිසා පැරණි ජුදෙව් ආගමික සිරිත් විරිත් අත් හැරිය යුතු යැයි නොසිතුහ. පළමුව ජේසුස් වහන්සේත් පසුව අපොස්තුලුවරුනුත් පසුව සියලුම කිතුනුවනුත් ජෙරුසලම් දේවමාලිගාවටත් සිනගෝගයටත් ගොස්, එහි පැවැත්වුණු ජුදෙව් නමස්කාර වලටත් පූජාවන් හා යාච්ඤාවලටත්, සහභාගී වූහ. ඔවුන්ගේ මංගල්‍යයන්වලදීත් , යාච්ඤාකාලවලදීත්, දණ නමස්කාර ඉරියව්ව ද වචන භාවිතය ද තව දුරටත් කරගෙන ගියහ.

- තමන්ට කියා බව්තිස්මය, රොටි කැඩීම, හිස ඉහළින් අත් විවෘතව තබා යාච්ඤා කිරීම, පාපමෝචන සිරිත් විරිත්, ආලේප කිරීම, විවාහය, හස්තාලේපනය යන විශේෂ අංග නමස්කාරය තුළ තිබුණු නමුත් ඔවුන් සමාන්‍යයෙන් චර්මඡේදනය , නිරහාරව සිටීම, වැනි ජුදෙව් වත් පිළිවෙත් හා නීති රීති ද පිළිපදින ලදී.

- අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් මගින් ජීවත්වුණු නමුත් ක්‍රිස්තියානි අයට කියා එක් ශුද්ධ ලියවිල්ලක් නො තිබුණි. ජුදෙව්වන්ගේ ශුද්ධ ලියවිල්ල (පරණ ගිවිසුම) තමන්ගේද ශුද්ධ ලියවිල්ල ලෙස ඔවුහු පිළිගත්හ.

- මේ තත්ත්වය ක්‍රිස්තුවර්ෂ හැත්තෑවේ දී ජෙරුසලම් දේවමාලිගාවේ රෝමවරුන් ගෙන් පහරදීම්වලට ලක්වෙමින් ජුදෙව්වන්ගේ ජම්නා සංගමය විසින් කිතුනුවන් ජුදෙව් සංගම්වලින් නෙරපා දමන තෙක් පවත්වාගෙන යන ලදී.

- ශතාධිපති කොරනේලියස්ගේ සිත් හැරීමෙන් පසු, විශේෂයෙන් ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණය කරණ කොට ගෙන විජාතිකයින් සභාවට ඇතුලත් වීම සමග මෙතෙක් කල් ජුදෙව් අභාෂයෙන් පිරි තිබුණු සභාව ක්‍රමක්‍රමයෙන් විජාතිකයන්ගේ අභාෂයට ලක් විය.

- මේ වෙනස්වීම් නිසා කිතු දහම ජුදෙව් ආගමේ ශාඛාවක් නොව තනි ආගමක් යන අදහස් ඇති වීමට හේතුවක් විය. ක්‍රමක්‍රමයෙන් කිතුනුවන් ජුදෙව් ආගමික නමස්කාරය හා සිරිත් විරිත් වලින් මිදී තනි ආගමක් ලෙස පරිවර්තනය විය.

- කිතුනුවන්ගේ සංඛ්‍යාව වර්ධනය වීමත් සමග සභා පරිපාලනය අධිකාරිත්ව ව්‍යුහ පිළිවෙලකට කරනු ලැබීය. ප්‍රථමයෙන් සභාවේ නායකත්වය දැරුවේ පේදුරුතුමාය. ඊළඟට අපොස්තුලුවරුන්ගේ කණ්ඩායම, ඊළඟට ප්‍රධානීන්, වැඩිහිටියන්, තේවාචාර්යවරුන්, ගෝලයන්, ඇදහිලි වන්තයන්, වර්ගීකරණය කරනු ලැබීය. සභාවේ නායකත්වය බලය ලත් දෙයක් ලෙස නොව ජනතාවට සේවය කරන්නාවූ රැළ ආරක්ෂා කරන්නාවූ එඬේරාගේ මෙහෙයට සමානව තිබුණේ ය.

**මුල් සභාවේ විශේෂ ලක්ෂණ (ක්‍රියා 2/42 47 4 : 32 37, 5 : 12 16, 6 : 1 7)**

- දොළොස්දෙනා වැනි සුළු පිරිසකින් ආරම්භ වූ සභාව ඔවුන්ගේ දැඩි උත්සාහය දේශනය, ඉගැන්වීම්, භාස්කම් නිසා සීඝ්‍රව වර්ධනය විය. පේදුරුතුමාගේ පෙන්තකොස්ත දින දේශනයට පසුව තුන්දහසකට ආසන්න පිරිසක් පේදුරුතුමන්ගේ ඉගැන්වීම් පිළිගෙන ජේසුස් වහන්සේව අදහා ගත්හ. පසුවදා ජෙරුසලමේ සලමොන් මණ්ඩපයේ කළ දෙවන දේශනාවේ දී පිරිමි පන්දහසක් ඇතුලු තවත් පිරිසක් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අදහා ගත්හ.

- මුල් සභාවේ අපොස්තුලුවරුන්ගේ ඉගැන්වීම් පිළිගෙන මෙසියස් හා ස්වාමීන් වන ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ අයට ක්ෂණිකව බව්තිස්ම ස්නාපනය ලබා දෙමින් ඔවුන්ව සභාවට ඇතුළු කර ගත් හ.

- බව්තිස්මය මගින් සභාවට ඇතුලුවුණු අය, එකම විශ්වාසයේ බැඳුණු එක් සමාජයක් ලෙස ජීවත් වූහ. බහුතර ජුදෙව්වන් අතර සුළු සමාජයක් ලෙස ජීවත් වුවද ඔවුන්ව අනෙකුත් ජුදෙව්වන්ගෙන් වෙන්කළ හැකි සමහර විශේෂ ගුණාංග ඔවුන් සතුව තිබීම අපට දැකිය හැකි ය.

- " ඔවුන් ඉගැන්වීමෙහිද, සහභාගිකමෙහි ද, රොටී කැඩීමෙහි ද යාච්ඤාවෙහිද, නිරතව කල් ගත කළහ." (ක්‍රියා 2/42) අද අපි මුල් සභාවෙහි ආගමික වතාවත් වල පැවති වැදගත් ලක්ෂණ හතරක් ගැන ඉගෙන ගන්නෙමු.

- මුල් කිතුනුවන් පේදුරුතුමාගේ දේශනාව තුළින් ඔවුන් පළමුව ලබාගත් ඇදහිල්ල, පසුව අපෝස්තුවරුන්ගේ දේශනා ඇසීම තුළින් වර්ධනය වී ශක්තිමත් විය.

- ඔවුහු සියලු දෙනා අපොස්තලුවරුන්ගේ නායකත්වය යටතේ පොදු ජීවිතයක් ගතකරමින් අන්‍යොන්‍ය සහයෝගයෙන් හා වගකීමෙන් යුක්තව සිටියහ. අවංක කිතුනුවෙක් ලෙස ක්‍රිස්තුස්වහන්සේ ඉදිරිපත් කළා වූ ප්‍රේමයන් ද, එකමුතු කමින් ද එකට ජීවත් වූහ.

- මුල් කිතුනුවෝ ජෙරුසලම් දේවමාලිගාවට සිනගෝගයට ගොස් එහි නමස්කාරයටද, පූජාවටද, සහභාගි වූහ. නමුත් සැම දෙනාම තම නිවෙස්වල හවස් වරුවේ එකතු වී කිතුනුවන්ට ආවේණික වූ ශුද්ධ සහභාගිකමේ නමස්කාරයේදී යටත් සිතින් හා ප්‍රිතියෙන් සහභාගි වූහ. රොටි කැඩීම යනු ශුද්ධ වූ සහභාගිකමේ දේව මෙහෙය සඳහන් කරන්නට යොදා ගන්නා වූ වචනයයි. තවද සබත් දිනද ඉතා භක්තියෙන් අනුගමනය කළෝය.

- ඔවුහු තනි තනිවම පමණක් නොව එකට එකඟ වී එක් පවුලක් ලෙස එක් සමූහයක් ලෙස දෙවියන් වහන්සේ ප්‍රශංසා කර තමන්ගේ හා අන් අයගේ අවශ්‍යතාව උදෙසා දේව උදව් ඉල්ලා යාච්ඤා කළෝය.

- ඔවුන් අතර අපෝස්තුලුවරුන් මගින් හාස්කම්ද සිදුවිය. ඔවුහු දෙවියන් වහන්සේ තමන් අතර වැඩසිටින බව විශ්වාස කර දේවබියෙන් ජීවත් වූහ. මෙලෙස, උත්ථාන වු ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරූ සමූහයක් ලෙස ජීවත් වූහ.

- ඔවුන් අතර කිසිම වෙනසක්කමක් නොමැතිව ඔවුහු එකමුතුව එක්සිත්ව ප්‍රේමයෙන් පුර්ණ වි අන් අයටද ආදර්ශවත් ලෙස ජීවත් වූහ.

- මුල් කිතුනුවන්ගේ ජීවිතයේදී සමාජ සේවයට විශේෂ තැනක් තිබිණි. වැන්දඹුවන්, අනාථවුවන්, වැඩිහිටියන් වැනි අය විශේෂ සැලකිල්ලට භාජනය විය.

- එම නිසා ඔවුන් අන් අයගේ ප්‍රශංසාවට ලක් විය. දෙවියන් වහන්සේගේ අනුග්‍රහය හා ආශිර්වාදය ඔවුන්ට ලැබුණේය. දිනපතා අලුත් සාමාජිකයන්ද ඔවුන්ට එකතු විය.

- මෙලෙස වැඩෙන්නාවු සභාව තුළ හැම දෙය තුළින්ම සම්පූර්ණත්වය දකින්නට පිළිවන් විය. සභාව දූර්වල ජනතාවකින් යුක්ත විය. එමනිසා සභාවේ යම් යම් අඩු පාඩු ද දක්නට ලැබුණි. අනනියාස් සපිරා සිද්ධිය, ග්‍රීක භාෂාව කතා කරන කිතුනුවන් හා හෙබ්‍රෙව් භාෂාව කතා කරන කිතුනුවන් අතර ඇති ගැටුම් මෙයට නිදසුන් වේ.

**ජෙරුසලමේ මන්ත්‍රණ සභාව (ක්‍රියා 15 : 1 29)**

- ස්තේපන්ගේ මරණය විශාල ජුදෙව් කැරැල්ලකට මුල් විය. ග්‍රීක භාෂාව කතා කල ජුදෙව්වන් පීඩාවට ලක්විය. අපොස්තුලුවරුන් ජෙරුසලමෙහි සැඟවී ජීවත් වූ අතර අනෙකුත් කිතුනුවෝ ජෙරුසලමෙන් පිට ජුදාහි ගම්බිම් ප්‍රදේශවලද සමාරියාව, කයිසාරිය, ඉස්ත්‍රාව, ජොප්පාව, දමස්කය, පෙනිසිය, සයිප්‍රසය, ගලීලය, අන්තියෝකිය වැනි ප්‍රදේශවලට විසිර ගියෝය. මේ පීඩාවන්වල දී ප්‍රධානියා වුයේ පාවුලු නැමති සාවුල් ය.

- විසිර ගිය අය තමන් ගිය සෑම ස්ථානයකදීම ශුභාරංචිය ප්‍රකාශ කළහ. ස්තේපන්ගේ වේදසාක්ෂික මරණයත් ඊට පසුව ඇති වූ කැරැල්ලත් හේතුකොට ගෙන ශුභාරංචිය ජෙරුසලමෙන් පිටතට ව්‍යාප්ත විය. ජනයා කළ නපුරු ක්‍රියාව තුළින් දෙවියන් වහන්සේ යහපත ඇති කළ සේක. ග්‍රීක භාෂාව කතා කළ ජුදෙව්වන් සභාවේ ප්‍රථම ධර්මදූත මෙහෙකරුවන් ලෙස හැඳින්විය හැක. ඔවුහු ගිය සෑම තැනම තමන්ගේ ජාතිය වන ජුදෙව්වන්ටම ශුභාරංචිය ප්‍රකාශ කළහ.

- ස්තේපන්ට පසුව ග්‍රීක ජුදෙව්වන්ගේ නායකයා ලෙස පිලිප් කටයුතු කළේය. සමාරියාවෙහි පිලිප් කළ මෙහෙය ශුභාරංචිය ප්‍රකාශ කිරීම, අශුද්ධාත්මයන් දුරු කිරීම, රෝගීන් සුව කිරීම, බව්තිස්ම ස්නාපනය ලබා දීම, සමාරියයන්ව ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරවීම, ඔහුගේ විශේෂ ක්‍රියාවන් විය. එතියෝපීය නපුංසකයාටද මායාකාර සීමෝන්ටද බව්තිස්ම ස්නාපනය ලබා දුන්නේ පිලිප්මය.

- පේදුරු හා ජොහන්ගේ මෙහෙය වූයේ සමාරියාව ඉස්ත්‍රාව, ජොප්පාව සෙසරිය වැනි ප්‍රදේශවලට ගොස් එහි පිලිප් ස්ථාපිත කළ සභාවන් බැහැදකිමින් එයට අනුමැතිය ලබාදීම හා දිරිගැන්වීම, යාච්ඤා කරමින් ශුද්ධාත්මයාණන් ලබාදීම , මායාකාර සිමොන්ට තරවටු කිරීම, සුව කිරීම නැවත ජීවත් කරවීම වැනි පුදුම ක්‍රියා කරමින් බොහෝ අයගේ සිත් හැරවීම ආදිය විය.

- පේදුරු තුමා කයිසාරියෙහි දී ශුද්ධාත්මයාණන්ගේ මඟ පෙන්වීමට අනුව ප්‍රථමවරට විජාතියයකු වන කොර්නේලියස් නමැති ශතාධිපතියා ද, ඔහුගේ පවුලේ අයද, ඔහුගේ මිතුරන්ද සභාවට එක් කළේ ය.

- ප්‍රථමවරට විජාතිකයන් සභාවට එක් කිරීම නිසා ජෙරුසලම් සභාව පේදුරුතුමාට විරුද්ධ විය. විජාතිකයින් චර්මඡේදනය නොකිරිම, එනම් ඔවුන් ජුදෙව්වන් නොකිරීම, අපවිත්‍ර ලෙස සැලකූ ඔවුන්ගේ නිවෙස්වලට යෑම සහ ඔවුන් සමග ආහාර වැළඳීම පේදුරු තුමා විසින් ජුදෙව්වන්ට විරුද්ධව කළ වැරදි ක්‍රියා ලෙස සලකන ලදී.

- ජොප්පාහි දී තමා දුටු, දර්ශන සහ ශුද්ධාත්මයාණන්ගෙන් තමා ලද මඟ පෙන්වීම් විස්තර කරමින් සභාව තුළ යම් සන්සුන් බවක් ඇති කිරීමට පේදුරු තුමා සමත් විය. නමුත් ජුදෙව් කිතුනුවන්ගේ සිත් තුළ තව දුරටත් මෙම ගැටලුව රැඳී තිබුණි. කෙසේ වුවද ශුද්ධ වූ සභාවේ මුලිකයා ලෙස කටයුතු කළ පේදුරු තුමා ශුද්ධාත්ම මඟ පෙන්වීම මත විජාතිකයන් සභාවට එක් කළ බව සඳහන් කළ යුතු ය.

**ජෙරුසලම් මන්ත්‍රණ සභාව රැස්වීමට හේතු**

- කොර්නේලියස් බව්තිස්ම ස්නාපනය ලැබූ සිද්ධිය ක්‍රියා පොතේ තුන් වරක් සඳහන් වේ. එය එසේ වන්නේ එහි ඇති වැදගත්කම අවධාරණය කිරීම සඳහා ය. සහා ඉතිහාසයේ  නව යුගයක ආරම්භය මේ සිද්ධිය තුලින් දැක්වේ.

- කොර්නේලියස් ගේ සිත් හැරීමට පසු කයිසාරියේ සහ අන්තියෝකියේද, පාවුලු තුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාවට පසු මධ්‍යධරණී රටවලද විජාතිකයෝ බහුලව සභාවට එක්වූහ. ජුදෙව්වන් ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ ලෙස පිළිගැනීමට පසුබට වුවද, විජාතිකයන් බව්තිස්ම ස්නාපනය ලබමින් සභාවට එක් වුයේ ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබමිනි. මේ හේතු කොට ගෙන සභාව ක්‍රමක්‍රමයෙන් " විජාතිකකරණය" විය. මේ තත්ත්වය නිසා ජෙරුසලමෙහි විසූ ජුදෙව්වෝ බොහෝ සේ නොසතුටට පත් වූහ.

- මෙතෙක් කිතු දහම ජුදා දහමේ ශාඛාවක් ලෙස සිතු ජුදෙව්වන්ට සභාව තුළ ඇති වූ මෙම වෙනස විශාල ප්‍රහේළිකාවක්/ ප්‍රශ්නයක් විය.

- කිතු දහම සහ ජුදෙව් දහම අතර ඇති සබඳතාව කුමක් ද? එය ජුදෙව් දහමේ ශාඛාවක් ද? විජාතිකයන් සභාවට එක්වන විට සම්පූර්ණ කළ යුතු කොන්දේසි මොනවාද ? චර්මඡේදනයෙන් තොරව, මෝසෙස්ගේ ව්‍යවස්ථාව නොපිළිපැද, කිතුනුවකු විය හැකි ද? මුල් කිතුනුවන් ජුදෙව්වන් නිසා ඔව්හු චර්මඡේදනය ලැබූ අය වූහ. ජුදෙව්වන්ගේ ශුද්ධ ලියවිල්ල දැන මෝසෙස්ගේ ව්‍යවස්ථාව  පිළිපදින අය වූහ. කිතු දහම ජුදෙව් දහමේ ශාඛාවක් ලෙස සිතන්නට පුරුදු වුයේ මෙය පාදක කර ගෙනය. නමුත් ජුදෙව් නොවන අය කිතු දහම දුටුවේ නව ආගමක් සහ වෙනත් ආගමක් ලෙසය.

- බාර්ණබස් සහ පාවුලු තුමා විසින් මෙහෙයවන ලද සිරියාව තුළ අන්තියෝකියේ සභාව මිශ්‍ර සභාවකි. එය ජුදෙව් කිතුනුවන්ගෙන් සහ ජුදෙව් නොවන කිතුනුවන්ගෙන් සමන්විත වූ අතර ඔව්හු සාමකාමීව ජීවත් වූහ.

- එක් අවස්ථාවක ජෙරුසලමේ සිට සිරියාවේ අන්තියෝකියට පැමිණි ජුදාවාදීන් පිරිසක්  තම දේශන තුළ පහත දැක්වෙන අදහස් ද ප්‍රකාශ කළ හ. මෝසෙස්ගේ ව්‍යවස්ථාව නොපිළිපදින, චර්මඡේදනය නොලැබූ අයට බව්තිස්ම ස්නාපනය ලබා සභාවට එක් විය නොහැක. තවද විජාතිකයන්ට ගැලවීම ලැබිය නොහැක.

- පාවුලු තුමා සහ බාර්ණබස් මෙම අදහස්වලට විරුද්ධව තර්ක කළහ. සිරියාව තුළ අන්තියෝකියේ සභාවේ කලබල සහ බෙදීම් ඇති වී නොසන්සුන් තත්ත්වයක් බිහි වීමට මෙම විවාදය පාදක විය. මෙයට විසඳුම් සෙවීම සඳහා අන්තියෝකීය සභාව

කළේ පාවුලු තුමා සහ බාර්ණබස් සමග තවත් සමහරකු ජෙරුසලමේ සභා නායකයන් වෙත පිටත් කර හැරීමය. මෙම කරුණු ජෙරුසලම් මන්ත්‍රණ සභාව රැස් කිරීමට පසුබිම විය.

**ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ ගත් තීරණ (ක්‍රියා 15 : 4 35)**

- ක්‍රිස්තු වර්ෂ 50 දී පමණ ජෙරුසලමේ රැස් වූ මෙම මන්ත්‍රණ සභාව කිතුනු සභාවේ මුල්ම මන්ත්‍රණ සභාව ලෙස හැඳින්වේ. පේදුරු තුමා මෙම මන්ත්‍රණ සභාවේ නායකත්වය දැරූ අතර විවිධ ප්‍රදේශවල සිට අපෝස්තුලුවරු සහ නායකයෝ කැඳවනු ලැබ සිටියහ.

- මෙසේ රැස්වීමට හේතුවූයේ අන්තියෝකියේ සභාවේ ඇතිවුණ ගැටලුවට විසඳුම් සෙවීමය. එනම් යම් කෙනෙකු කිතුනුවකු වීමට පෙර චර්මඡේදනය ලැබීම අනිවාර්ය ද ? මෝසෙස්ගේ ව්‍යවස්ථාව පිළිපැදිය යුතුම ද? යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ය.

- සහභාගී වූවන් අතර ප්‍රධාන කණ්ඩායම් දෙකක් විය. එක් කණ්ඩායමක් සමන්විත වූයේ එවකට ජෙරුසලමේ සභාවේ බිෂොප්තුමා/ රදගුරුතුමා ව සිටි ජාකොබ් තුමාගේ නායකත්වයෙන් යුතු ජුදාවාදීන් හා පරිසිවරුන්ය. අනෙක් කණ්ඩායම පාවුලු තුමා සහ බාර්ණබස්ගේ නායත්වයෙන් යුතුවූ විජාතිකයන්ගෙන් සමන්විතවිය.

- ප්‍රථමයෙන් සිදු වූයේ කණ්ඩායම් දෙක මගින් තර්ක විතර්ක ඉදිරිපත් කිරීමය.

- අවසානයේ දී මන්ත්‍රණ සභාවට නායකත්වය දුන් පේදුරු තුමා තම අදහස් ඉදිරිපත් කළේය. එතුමා කයිසාරියෙහි කොර්නේලියස්ගේ බව්තිස්ම ස්නාපයේදී තමා ලද අත්දැකීම බෙදා ගනිමින් මෙසේ පැවසීය. " දෙවියන් වහන්සේ අපට ශුද්ධාත්මය දානය කලා සේම ඔවුනට ද ශුද්ධාත්මය දානය සිදු කොට ඔවුන්ද පිළිගත් සේක. අප හා ඔවුන් අතර කිසිම වෙනසක් උන්වහන්සේ නොදකින සේක. ජේසුස් වහන්සේ මගින් අප මිදීම ලබන ආකාරයෙන්ම ඔව්හු ද මිදීම ලබති. "

- පේදුරුතුමාගේ කථාවෙන් ඔවුන්ගේ ගැටලුවට විසඳුම් ලැබිණ. චර්මඡේදනය නොව ඇදහිල්ල මගින් අප පවිත්‍ර කරනු ලබයි. අප සැමට මිදීම ලබා දෙන්නේ මෝසෙස්ගේ ව්‍යවස්ථාව මගින් නොව ජේසුස් වහන්සේගේ කරුණාව මගිනි. පේදුරු තුමාගේ මෙම තීරණ සියලු දෙනා පිළිගත් අතර ඒවා විජාතිකයන්ට පාක්ෂිකව තිබූ බව සඳහන් කළ යුතුය.

- මන්ත්‍රණ සභාව තුළ පේදුරු තුමාගේ කතාවෙන් පසු පාවුලු තුමා සහ බාර්ණබස්ද තම ධර්මදූත චාරිකාවේ දී විජාතිකයන් අතර දෙවියන් වහන්සේ කළ පුදුම ක්‍රියා ගැන පවසමින් මන්ත්‍රණ සභාව ඇමතුහ. එම පුදුම ක්‍රියා තුල පිළිඹිබු වන්නේ ශුද්ධාත්මයාණන්ගේ අභිමුඛත්වය සහ මඟපෙන්වීම බව ඔවුන්ගේ අවධාරණය විය.

- අවසානයේ දී අපෝස්තුලුවරයකු හා ජෙරුසලම් සභාවේ ප්‍රධානියා වන ජාකොබ්තුමා තම නිගමනය ඉදිරිපත් කළේ ය. පේදුරුතුමා පැවැසූ දේ තහවුරු කරමින් දිවැසිවර ආමොස් තුමා සඳහන් කළ පරිදි මුලින් ජුදෙව්වන් ද, පසුව විජාතිකයන්ද ගැලවීම ලබන බව එතුමා පෙන්වා දුන්නේය. (ආමොස් 9 :1- 12)

- විජාතිකයන්ට තවත් අප කරදර නොකළ යුතු බවත්, ඔවුනට චර්මඡේදනය ලැබීමට අවශ්‍ය නොමැති බවත් එතුමා තව දුරටත් සඳහන් කළේ ය.

- තවද මෙතෙක් ගත් තීරණ ජුදෙව්වන්ට විශේෂයෙන් පරිසිවරුන්ට එරෙහිවන ඒවා නිසා ඒ අයද සතුටු කිරීම පිණිස එතුමා විජාතිකයන්ට මෙසේ පැවසීය. " විජාතිකයන් ජුදෙව්වන් සමග සිටින විට ජුදෙව්වන් පිළිකුල් කරන ආහාර වැළඳීමෙන් වැළකිය යුතුය. එනම් පිළිමවලට පිදූ ආහාර, ගෙල මිරිකා මැරූ සතුන්, රුධිරය සමග මාංශ වැළඳීමෙන් වැළකී ආහාර වලට ගිජු බවින් මෑත් වී සිටීම කිතුනු සබඳතාවන්ට සුදුසු වේ."

- අන්තියෝකීය සභාවේ ගැටලුව සඳහා මන්ත්‍රණ සභාව ගත් තීරණ එම සභාවට දැන්වීම සඳහා ලිපියක ලියා එම ලිපිය මන්ත්‍රණ සභාව විසින් තෝරා ගත් බර්සබස් නම් ලත් ජුදස් සහ සීලස්ද පාවුලු තුමා සහ බාර්ණබස්ද අන්තියෝකීය සභාව වෙත යවන ලදී.

- ලිපියේ සඳහන් කරුණු
  1. අනවශ්‍ය ලෙස විජාතිකයන් මත බර නොපැටවිය යුතු ය.
  2. පිළිමවලට පිදූ ආහාර වැළඳීමෙන් වළකින්න.
  3. සතුන්ගේ රුධිරය අනුභව කිරීමෙන් වළකින්න.
  4. ගෙල මිරිකා මැරූ සතුන්ගේ මාංශ අනුභවයෙන් වළකින්න
  5. ආහාරවලට ගිජු බවින් වළකින්න.
- සමහර බයිබල් විශාරදයින්ගේ මතය වූයේ ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ සාකච්ඡා තුළින් මතුවූ පළමු තීරණය පමණක් ලිපියේ සඳහන්ව තිබූ බවය. ජුදෙව්වන් සතුටු කරනු පිණිස අනිකුත් කරුණු ලිපියට ඇතුලත් කර තිබූ බව වෙනත් අය අදහස් කරති.

- ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණ තුළින් ඇතිවූ කිතුනු සභාවේ සමහර වෙනස්කම් කිතු දහම විශ්වීය දහමකි.
  එය කිසිදු ජාතියකට හෝ භාෂාවකට හෝ පමණක් සීමා නොවේ.

ශ. ස්තේපන්තුමා හා සභා ව්‍යාප්තිය

- සභාව වර්ධනය වී කිතුනුවන්ගේ සංඛ්‍යාව වැඩිවීම සමග, ඔවුන්ගේ පොදු ජීවිතය තුළ ගැටලු ඇති විය. අපොස්තුලුවරුන් දහම් දෙසුමට මුල් තැන දීම හේතු කොටගෙන ඔවුන්ට සමාජ සේවයට නිසි කාලය දෙන්නට නො හැකි විය.

- තේවාචායර්යවරුන් (දියාකෝනවරුන්) ආහාර බෙදා දීම, එනම් සමාජ සේවාව සඳහා පත්වී තිබුණු නමුත්, ඔවුන් (ස්තේපන්, පිලිප්) දහම් දෙසුමටද, බව්තිස්ම ස්නාපනය කිරීමටද, හාස්කම් කිරීමටද යෙදුණි.

- සමහර ජුදෙව් පූජකවරුන් පවා ජේසුස් වහන්සේව ස්වාමින් වහන්සේ ලෙස පිළිගෙන සභාවට ඇතුළු වූ නිසා කිතුනුවන් කෙරෙහි ජුදෙව්වන්ට තිබූ වෛරය වැඩි විය. ක්‍රම ක්‍රමයෙන් කිතුනු ජුදෙව් ගැටුම් වර්ධනය විය.

- ජුදෙව් ගැටුම්වලට තුඩු දුන් සාධක -
ජුදෙව්වන් ජේසුස් වහන්සේව කුරුසි පත් කිරිමට ඉදිරිපත් කළ ඒ හේතුන් නිසාම, කිතුනුවන්ටත් එසේම විරුද්ධ විය.

- ජුදෙව්වන් , විශාල හමුදාවක් සමග පැමිණෙන මෙසියස් වහන්සේ ව බලාපොරොත්තුව සිටිය බැවින් ගවලෙනක ඉපදුණු වඩුවකුගේ පුත්‍ර ජේසුස් වහන්සේව මෙසියස් වහන්සේ ලෙසට පිළිගැනීමට සුදානම් ව සිටියේ නැත. උන්වහන්සේගේ ඉගැන්වීම්ද, ක්‍රියාවන්ද ඔවුන්ගේ බලාපොරොත්තුවට පටහැනිව තිබුණු බැවින් උන්වහන්සේව එසේ පිළිගැනීමට බැරිවීමට එයද තවත් හේතුවක් විය. තවද ජේසුස් වහන්සේගේ කුරුසියේ මරණය නිසා ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් ශාප කරන ලැබූ අයකු බව ඔවුන්ගේ අදහස විය. නමුත් කිතුනුවෝ ජේසුස් වහන්සේව මෙසියස් වහන්සේ ලෙස පමණක් නොව දේව පුත්‍රයා ලෙස ද පිළිගනිමින් විශ්වාස කළ හ.

- තවද කිතුනුවෝ ජේසුස් වහන්සේ ගේ මරණය පිළිබඳ ජුදෙව්වන්ට දොස් පැවරූහ. ආබ්‍රහම්, ජෝසප්, මෝසෙස් වැනි අය මගින් කතා කළ ශුද්ධාත්මයාණන්ට ඔවුන් සවන් නොදුන් බවටද දොස් පැවරූහ. ජේසුස් වහන්සේගේ පැමිණීම පෙර කී දිවැසිවරුන් ද ඔවුන් මරා දැමූ බවටත් දොස් කී හ.

- රෝමවරුන් විසින් ජෙරුසලම් දේව මාලිගාව බිඳ දැමීම හා , රෝම වරුන් විසින් ඔවුන් පීඩාවට ලක් වීම සිදුවූයේ ද, කිතුනුවන් ජේසුස් වහන්සේව මෙසියස් ලෙස පිළිගනිමින් ඇතිවුණු පාපය නිසා බව ජුදෙව්වෝ කියා සිටියහ.

- සද්දුසිවරුන් හා ජුදෙව් පූජකවරුන් නැවත නැගිටීම ගැනද, මතු ජීවිතය ගැනද විශ්වාස නොකළහ. නමුත් කිතුනුවෝ උත්ථානය ගැන විශ්වාස කළා පමණක් නොව,

නැවත නැවත එය ගැන දේශනා කරමින්, ජේසුස් වහන්සේගේ උත්ථානයට තමන්ව සාක්ෂි කරුවන් ලෙසද ඉදිරිපත් කළහ. ජේසුස් වහන්සේගේ නමින් හාස්කම්ද කළ හ.

- ජුදෙව්වෝ මෝසෙස්ගේ ව්‍යවස්ථාවටත් ජෙරුසලම් දේව මාලිගාවටත් මුල් තැන දුන්හ. නමුත් කිතුනුවෝ ජුදෙව් සිරිත් විරිත්, මෝසෙස්ගේ ව්‍යවස්ථාව වැනි දේට එතරම් ප්‍රමුඛත්වයක් නොදුන්හ. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් යුක්ත අණ පණතටද, ප්‍රේමනීය සමුහයක් යන අදහසටද විශේෂ තැන දුන්හ.

- ජුදෙව් නායකයන් ද වූ සද්දුසිවරුන් පරිසිවරුන් හා නායක පූජකවරුන් ද කිතු දහමේ ව්‍යාප්තිය ගැන බියට පත් වූහ. තමන්ට හිමි ස්ථානද නැතිවී තමන්ගේ රැකියා පවා අහිමි වේ යයි සිතුහ. ඉහත කී හේතුන් නිසා ජුදෙව්වෝ කිතුනුවන් ව පිළිකුල් කළ හ.

- මේ ගැටුම්කාරී තත්ත්වයේ උච්චස්ථාන ග්‍රීක භාෂා කථා කරන ජුදෙව්වන් හා ජුදෙව් තේවාචාරී (දියාකෝන) ස්තේපන් අතර මෝසෙස් ගේ ව්‍යවස්ථාව, දේව මාලිගාව පිළිබඳව ඇති වූ තර්ක තුළින් දක්නට හැකිය. ස්තේපන් ග්‍රීක සංස්කෘතික ජුදෙව්වන්ගේ නායකයා ලෙස සිටියේය. ඔහුට එරෙහිව තර්ක විතර්ක කරන්නට නොහැකි වූ ජුදෙව් ජනතාව පොළඹවමින් , කැරැල්ල ඇති කරමින්, ඔහුව අත් අඩංගුවට ගනිමින් ස්තේපන්ට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ චෝදනා මෙසේය.
    1. ශුද්ධ ස්ථානයට හා ව්‍යවස්ථාවට විරුද්ධව කථා කිරීම.
    2. නාසරෙත්හි ජේසුස් වහන්සේ ශුද්ධ ස්ථානය විනාශ කර දමන බව පැවසීම.
    3. මෝසෙස් අපට ලබා දුන් දේ ජේසුස් වහන්සේ වෙනස් කරන බව පැවසීම.
- නායක පූජකවරයා ස්තේපන් ගෙන් විමසූ විට, ඔහු තමාගේ න්‍යාය ඉදිරිපත් නොකර, ශු. බයිබලයෙන් පිළිතුරු දුන්නේය. (ක්‍රියා 7: 9 1-5)

- ව්‍යවස්ථාවට විරුද්ධව ස්තේපන් කථා කළ බවට චෝදනා කළ විට ඔවුන් ව්‍යවස්ථාව නොපිළිපදින බවට ඔවුන්ට විරුද්ධව ස්තේපන් චෝදනා කළේ ය.

- දෙවියන් වහන්සේට ඉශ්රායෙල්වරුන්ගෙන් පිට තමන් වහන්සේට ජනතාව තෝරාගත හැකි යැයිද දේව මාලිගාවෙන් පිට දෙවියන් වහන්සේව නැමැදිය හැකි බවද පවසමින් කිතු දහම ජුදෙව් දහමේ ශාඛාවක් නොව අලුත් ආගමක් යන අදහස ඉදිරිපත් කළේ ය.

- මේ නිසා ආවේගශීලී වූ ජුදෙව්වෝ නගරයෙන් පිටතට ස්තේපන්ව ඇද ගෙන ගොස් ගල් ගසා මැරා දැමූහ.

- ස්තේපන් තමන්ට ගල් ගැසූ අය වෙනුවෙන් යාච්ඤා කරමින් දිවි පිදුවේ ය.

**සභාවේ වර්ධනය**

- එදා ජෙරුසලමේ දී පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම තුළ එකසිය විසිදෙනෙකුගේ ශ්‍රාවකත්වයෙන් ඇරඹි සභාව ඉක්මනින් වර්ධනය වී මුළු ලොව පුරා ව්‍යාප්ත විය. එය ශු. බයිබලයේ සඳහන් අබ ඇටයේ උපමාව මෙනි.

- එසේ ඇති වූ සභාවේ ව්‍යාප්තිය සඳහා බොහෝ දෙනෙක් දායක වූ හ.

- එදින පෙන්තකොස්ත මංගල්‍යයේ ආරක්ෂාව සැපයීම සඳහා පැමිණි රෝම සෙබළුන් එම දායකත්වයේ ප්‍රථම කණ්ඩායම ලෙස හැඳින්විය හැක. ජේසුස් වහන්සේගේ දුක් විඳීම මරණය සහ නැවත නැගිටීමේ පුවතට සවන් දීමට එදින ඔවුන්ට අවකාශ ලැබිණි. ඔවුන් ආපසු තම ප්‍රදේශවලට ගිය විට එම පුවත තම අසල්වාසීන් සමග බෙදා ගන්නට ඇතැයි මෙහිදී උපකල්පනය කළ හැක.

- දායකත්වයේ ඊළඟ කණ්ඩායම පෙන්තකොස්ත මංගල්‍යය සඳහා ලොව සෑම දෙසින්ම පැමිණි ජුදෙව්වන්ය. ආපසු තම ප්‍රදේශවලට ගිය ජුදෙව්වෝ එදින සවන් දුන් සහ එහි දී දුටු සියලු දේ තම ජනතාව සමග බෙදා ගත්හ.

- පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමත් සමග බලවත් වූ අපෝස්තුලුවරුන් ඉතා උනන්දුවෙන් දේශනා කළහ ඃ හාස්කම් සහ ලකුණු ඉදිරිපත් කළහ. එහි ප්‍රතිඵලය වූයේ දහස් ගණනක් (3000 - 5000 ක් පමණ) පසුතැවිලි වී සභාවට එක් වීමයි.

- මුල් කිතුනු සමාජයේ තිබූ ප්‍රේමය, එකමුතුකම, බෙදාගැනීම සහ සමානත්වයෙන් යුක්ත වූ ආදර්ශවත් ජීවන ක්‍රමය සභාව වෙත බොහෝ දෙනා ආකර්ශනය කළ සාධක ලෙස හැඳින්විය හැක.

- ස්තේපන්ගේ වේද සාක්ෂික මරණයෙන් පසු කිතුනුවන්ට විරුද්ධව ආරම්භ වූ ජුදෙව් කැරැල්ල ක්‍රිස්තු ධර්මය ජෙරුසලමෙන් ඔබ්බට ව්‍යාප්තවීමට ඉවහල් විය. ග්‍රීක භාෂාව කථා කළ ජුදෙව් කිතුනුවෝ බිය වී ආරක්ෂාව පතා ජුදෙව් ග්‍රාමීය ප්‍රදේශවලටත්, සමාරිය, කසිසාරිය, ලුස්ත්‍රාව, ජොප්පාව, දමස්කය, පිනීසිය, සයිප්‍රසය, ගලීලය සහ අන්තියෝකියටත් දිව ගියහ. පසුතැවුණු දහස් ගණනක් සභාවට ඇතුළු වීමට හේතු වූයේ මෙසේ විසිරී ගිය කිතුනුවන් තමන් ගිය සෑම ප්‍රදේශයකම කිතුනු ශුභාරංචිය ප්‍රකාශ කිරීමය.

- ජේදුරුතුමා විසින් කයිසාරියේ අන්‍ය ජාතික රෝම ශතාධිපතියකු වූ කොර්නේලියස්ට, ඔහුගේ පවුලේ අයට සේම ඔහුගේ නිවසට රැස් වූ හිත මිතුරන්ට ශුද්ධාත්ම මග පෙන්වීම තුළ බව්තිස්ම ස්නාපනය ලබා දීමෙන් ඔවුන් සභාවට එක් කර ගන්නා ලදි. මෙය සභා වර්ධනයෙහි නව යුගයක ආරම්භය ලෙස හැඳින්විය හැක. මන්ද බව්තිස්ම ස්නාපනය ලබා දීමෙන් මෙතෙක් සභාවට ඇතුලත් කර ගන්නා ලද්දේ ශුභාරංචිය අසා විශ්වාස කළ ජුදෙව්වන් පමණක් වන හෙයිනි.

- කිතුනුවන් විය හැක්කේ ජුදෙව්වන්ට පමණක්ය යන්න එදා මූලික අදහස විය. මේ අතර අන්‍ය ජාතිකයකු වූ කොර්නේලියස් බව්තිස්ම ස්නාපනය ලබා සභාවට ඇතුලත් වූ ප්‍රථම අන්‍ය ජාතිකයා වූ අතර එමගින් සිදුවූයේ සභාවේ දොරටුව අන්‍ය ජාතිකයන්ට විවෘත වීමය. එහි ප්‍රතිඵලය වූයේ කොර්නේලියස්ට පසුව අන්‍ය ජාතික දහස් ගණන් පිරිස් සභාවට ඇතුලත් වීමය. ඒ අනුව ජුදෙව් කිතුනුවන්ගෙනුත්, අන්‍ය ජාතික කිතුනුවන්ගෙනුත් සමන්විත විශාල මිශ්‍ර කිතුනු සමාජයක් අන්තියෝකියේ බිහිවිය.

- මෙම මිශ්‍ර සභාවේ ආරම්භයේහි දී ඇති වූ ගැටලු සහගත තත්ත්වය නිරවුල් කිරීම සඳහා ජෙරුසලමේ පළමු මන්ත්‍රණ සභාව කැඳවන ලදී. එහි දී ගනු ලැබූ තීරණ අන්‍ය ජාතිකයන්ට වාසි සහගත ලෙස පැවතිණ, ඇදහිල්ලේ අත්‍යවශ්‍ය දේවල් හැර වෙනත් කිසිම බරක් අන්‍ය ජාතිකයන් මත පැටවිය යුතු නැත. අප සියලු දෙනා පවිත්‍ර කරනු ලබන්නේ චර්මඡේදනයයෙන් නොව ඇදහිල්ලෙනි. අප සියලු දෙනාටම මිදීම ලබා දෙන්නේ මෝසෙස්ගේ ව්‍යවස්ථාව නොව ජේසුස් වහන්සේගේ අනුග්‍රහයයි. (වරප්‍රසාදයයි)

- සභාව ව්‍යාප්ත වීමෙහි ලා මහත් දායකත්වයක් ලබා දුන් අයෙකි, ශුද්ධ වූ පාවුලු අපෝස්තුලු තුමා (ප්‍රේරිත තුමා) මුලදී කිතුනු සභාවට විරුද්ධව කටයුතු කළ එතුමා දමස්කයට යන අතර මග ලැබූ මනස්ස්ථාපනයේ අත්දැකීම තුළ වෙනස් පුද්ගලයකු බවට පත්විය. ඉන්පසු එතුමා විසින් කරන ලද ධර්මදූත චාරිකා මගින් සභාවේ වර්ධනයට ලැබුණේ ඉමහත් දායකත්වයකි.

- එතුමාගේ දැඩි උත්සාහය නිසාත්, හරබර දේශනා නිසාත් අපෝස්තලුවරුන්ගේ කාලයේ සභාව ජෙරුසලම, ජුදයාව, සමාරිය, ගලීලය, අන්තියෝකිය, සයිප්‍රස් දූපත්, පම්පිලියාව, ගලාතිය, පර්ගය, සිරියාවේ අන්තියෝකිය, ඉකෝනිය, ලුස්ත්‍රාව, දර්බය, පිලිප්පිය, එපීසය, තියෝතිරා, ලවෝදිසය, තෙසලෝනිස, කොරින්තිය, රෝමය, ස්මරණ ආදී ප්‍රදේශ කරා ව්‍යාප්ත විය.

- සභාව වර්ධනය වූයේ එහි සාමාජික සංඛ්‍යාවෙන් සහ කිතුනු සමූහයන්ගෙන් පමණක් නොවේ. ඇදහිලිවන්තයන්ගේ ජීවිත, පරිපාලන ව්‍යුහය, නමස්කාර විධි, දේව ධර්මය සහ ආගමික අධ්‍යාපනයන මගින් ද සභාව මහත් ලෙස වර්ධනය විය.

- සභාවට විරුද්ධව ඇතිවුණු ජුදෙව් රෝම කැරලි, කිතු දහම විනාශ කිරීමට වඩා කිතුනුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමට ඉවහල් විය. මෙම කැරලි වලදී මෙන්ම මෙම කැරලි වලට තුඩු දුන් හේතු අභිමුව, කිතුනුවන් දැක්වූ ඉවසීම, ධෛර්යය, ඔවුන් විශ්වාස කළ සත්‍යතාවයන් වෙනුවෙන් කළ සාක්ෂි දැරීම සහ සත්‍යය වෙනුවෙන් තමන්ගේ ජීවිතයම පුද දෙන්නට ඉදිරියට පැමිණීම කැරලි කරුවන් පසු බෑමකට ලක් කළ වැදගත් සාධක බවට පත් වුණි. තවද මෙම සාධක තමන් කරන දේ පිළිබඳව

සිතීමට කැරලි කරුවන් පෙළඹවීමටද හේතු පාදක විය. වේද සාක්ෂිකයන්ගේ රුධිරය සභාවේ බීජයක් බවට පරිවර්තනය විය.

- සභාවේ ඉදිරි ගමන වැලැක්වීම පිණිස එහි ඇතුළු වූ භේද දේව ධාර්මික අධ්‍යාපනයෙහි වර්ධනයට උපකාර විය. රැස්කරන ලද බොහෝ මන්ත්‍රණ සභා විසින් සභාවේ සත්‍යතාවන් දැඩි විමසීමකට භාජනය කරන ලදි. තවද සත්‍යතාවන් පිළිබඳ පැහැදිලි නිර්වචනයන් සහ තේරුම් ගැනීම් ලබාදීමට මෙම මන්ත්‍රණ සභා දැඩි පිටිවහලක් වීය. බොහෝ දේව ධර්ම විදුහල් බිහිවූයේ මෙම වටපිටාව තුළ ය.

- දෙවන සහ තෙවන ශතවර්ෂවලදී ජනතාව අතර ඇති වූ ආගමික ඇල්ම සහ ආගමික පුනර්ජීවනය කිතු දහමේ වර්ධනයට බොහෝ සේ උපකාරී විය. කිතු දහමේ ඇති ආගමික මතවාද වෙත ජනතාව මහත්සේ ආකර්ශනය වූහ. පීඩිත ජීවිතයේ බර දරමින් පීඩාවන් අත්විඳි මනුෂ්‍යයන්ට විනාශනොවන ආත්මය, පාප කමාව, සදාතන ජීවිතය වැනි ඉගැන්වීම් වලින් ලැබුණේ මහත් සහනයකි.

- ක්‍රිස්තු ධර්මය සෑම පෙදෙසකම ප්‍රචලිත වීමට පහත සඳහන් කරුණු බොහෝ සෙයින් උපකාර විය. රෝම අධිරාජ්‍යයේ ව්‍යුහය, සැකැස්ම සහ පරිපාලනය හේතු කොට ගෙන ඇති වු සාමකාමී තත්ත්වය, එකම පරිපාලනයක් යටතේ අවට ඇති රාජ්‍යයන් වෙතට යොමු වු හොඳ මං මාවත් ; ඒ නිසාම බිහි වූ ආරක්ෂා සහිත ගමනාගමන ක්‍රමවේදයන් සහ සෑම ස්ථානයකම ග්‍රීක භාෂාව භාවිත වූ නිසා එකිනෙකා සමග සම්බන්ධ වීමට තිබු හැකියාව ආදිය.

- තුන්වන සියවසේ සභාව ආසියානු, අප්‍රිකානු සහ යුරෝපා මහාද්වීප තුළ තිබූ මසිදෝනිය, මිසරය, ග්‍රීසිය, ඉතාලිය, ස්පාඤ්ඤය, ප්‍රංශය, ජර්මනිය, බ්‍රිතාන්‍යය, ස්කොට්ලන්තය, අයර්ලන්තය, පර්සියාව සහ ආරාබිය වැනි රටවලට ව්‍යාප්ත විය.

- සභා වර්ධනයේ මුල් ශත වර්ෂ තුන තුළ එය මුහුණ පෑ ජුදෙව් කැරැල්ල, රෝම කැරැල්ල, භේද සහ දුර්මත ආදී බොහෝ විරෝධතා සහ බාධා සභා වර්ධනයට බොහෝ අහිතකර ලෙස බලපෑහ. එහෙත් මෙම බාධා සහ විරෝධතා මධ්‍යයේ මුල් සියවස් තුන තුළ ඇති වු සභා වර්ධනය සහ ව්‍යාප්තිය මෙන් වර්ධනයක් සහ ව්‍යාප්තියක් වෙන කිසිම කලෙක සභාව තුළ දැකිය නො හැක. ඒ නිසා සභා ඉතිහාසයේ පළමු සියවස් තුන සභාවේ ' ස්වර්ණමය යුගය' ලෙස හැඳින්වේ.

### 6.1.2 ශුද්ධ පාවුලු තුමාගේ ධර්මදූත ගමන්

පාවුලු නමැති සාවුල් මුල් සභාවේ වර්ධනය සඳහා බොහෝ ලෙස දායක වූ කෙනෙකි. දෙවියන් වහන්සේ විසින් විජාතිකයින්ගේ අපෝස්තුලුවරයකු ලෙස තෝරා ගනු ලැබූ එතුමා විජාතිකයින්ට සුබ අස්න ප්‍රකාශ කිරීම සඳහා ඔවුන් වෙත යවනු ලැබීය. පාවුලු තුමා ධර්ම දූත චාරිකාවල යෙදුණේ තමාට පැවරුණු එම කාර්යය ඉටු කිරීම සඳහාය. තම චාරිකා තුළින් මධ්‍යධරණී මුහුද ආශ්‍රිත රටවල පමණක් නොව ලෝකයේ සීමාව ලෙස එදා හැඳින්වුණු රෝමය දක්වා එතුමා ගමන් කළේය. එතුමා සුබ අස්න දේශනා කළේ විවිධ විරෝධතා සහ පීඩාවන් මධ්‍යයේ ය. බොහෝ දෙනෙකුට සුබ අස්න තුළින් පසුතැවීමට මග පෙන්වූ එතුමාට ඒ ඒ ස්ථානවල කිතුනු සමූහයක් ස්ථාපිත කිරීමට හැකිවිය. එම නිසා සභාවේ වර්ධනය ගැන මනා අධ්‍යයනයක් කිරීම සඳහා පාවුලු තුමාගේ ජීවිතය සහ මෙහෙය ගැන පුළුල්ව දැන සිටීම යෝග්‍ය කරුණකි.

**ශු පවුලු තුමාගේ ජීවිත පසුබිම**

පාවුලු නැමැති සාවුල් ග්‍රීක භාෂාව කථා කළ, ග්‍රීක සංස්කෘතියට අයත් ජුදෙව් ජාතිකයෙකි. විදේශික ආක්‍රමණ හේතු කොට ගෙන පලස්තීනයෙන් විසිරී ගොස්, සුළු ආසියාවේ තාර්සිස් නම් ග්‍රීක නගරයේ ජීවත් වූ බෙන්ජමින් ගෝත්‍රයට අයත් ජුදෙව් පවුලකට දාව ක්‍රි. ව. 10 දී එතුමා උපත ලැබීය. තාර්සිස් එකල විශාල ජුදෙව් සමූහයක් ජීවත් වූ නගරයක් විය.

- ඔහු ජුදෙව්වන් පමණක් නොව තම පියා හරහා රෝම පුරවැසිභාවය ලද කෙනෙකි. 'පාවුල්' යන රෝම ග්‍රීක නම ඔහු භාවිතයට ගත්තේ විජාතිකයින්ගේ අපෝස්තුලුවරයෙක් ලෙස සේවය කළ කාලය ආරම්භයේ දී ය.

- සාවුල්ට ළමා වියෙහි දී දැනුම සහ පුහුණුව ලැබුනේ ග්‍රීක ආභාෂයට ලක් වූ ජුදෙව් පවුලක් ලෙස දිවි ගෙවූ තම දෙමව්පියන්ගෙනි. තම වයස අවුරුදු 06 සිට ශුද්ධ ලියවිල්ල එනම් පරණ ගිවිසුම සහ හෙබ්‍රෙව් බස අධ්‍යයනය කිරීමට එතුමාට හැකිවූයේ තාරසීස් සිනගෝගයේදී ය.

- තාර්සිස් ව්‍යාපාරික නගරයක් වුවද එහි අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාලද පිහිටා තිබිණ. ග්‍රීක සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස හැඳින්විය හැකි එම නගරය බොහෝ විද්වතුන් සහ දාර්ශනිකයින් බිහි කළ ස්ථානයක් විය. මෙම පසුබම තුළ හැදී වැඩුණු සාවුල් , විජාතිකයින්ට විශේෂයෙන් ග්‍රීක ජාතිකයින්ට සුබ අස්න ගෙන යෑමට ඉතාමත් සුදුසු පුද්ගලයකු ලෙස හැඳින්විය හැක.

- ජේසුස් වහන්සේගේ මරණින් පසු තම තරුණ වියෙහි දී ජෙරුසලමට පැමිණි ඔහු ශුද්ධ ලියවිල්ල මනා ලෙස හැදෑරුවේ ගමාලියෙල් නම් පඬිවරයා යටතේ ය. පලස්තීනයේ ජීවත් වූ ජුදෙව්වන් සිරිත් විරිත් ගැන මනා දැනුමක් ලැබූ ඔහු ව්‍යවස්ථාව හැදෑරීමට අමතරව එය දැඩි ලෙස පිළිපැදි පරිසිවරයකු සහ රබ්බිවරයකු විය.

- ඉන්පසු බාර්ණබස් විසින් අන්තියෝකියේ දී පිහිටුවනු ලැබූ ජුදෙව් හා ජුදෙව් නොවන අයගෙන් යුතු වූ ප්‍රථම මිශ්‍ර සභාවේ සේවය කිරීම සඳහා පාවුලු තුමා පැමිණි අතර අවුරුද්දක පමණ කාලයක් එතුමා එහි සේවය කළේ ය.

- එක් දිනක, නමස්කාර අවස්ථාවකදී, තම විශේෂ කාර්යයක් සඳහා පාවුලු සහ බාර්ණබස් වෙන් කරන ලෙස, අන්තියෝකීය සභාවේ දිවැසිවරුන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ඉල්ලා සිටින ලදී.

- ඉක්බිති උපවාසයේ යෙදුණු ඔවුහු පාවුලු සහ බාර්ණබස් මත අත් තබමින් යාඥා කළහ. ඉන් පසු විජාතීන් වෙත සුබ අස්න ප්‍රකාශ කිරීමට ඔවුන් දෙදෙන පිටත් කර හරින ලද අතර ඔවුන් දෙදෙන ගියේ බාර්ණබස් උපත ලැබූ සයිප්‍රසයටය.

- පාවුලු තුමාගේ ධර්මදූත චාරිකා සංඛ්‍යාව තුනක් (03) ලෙස ශු ලූක් තුමා ක්‍රියා පොතෙහි දක්වා ඇත.

**පාවුලු තුමාගේ පළමුවන ධර්මදූත චාරිකාව (ක්‍රියා 13, 14)**

- සිදුවූ කාලය : ක්‍රි.ව 46 සිට 49 දක්වා
- සහභාගිවූවෝ : බාර්ණබස් සහ ජොහන් මාක්
- අරමුණ (දැක්ම :) අන්තියෝකීය සභාවේ තවමත් සුබ අස්න නොඇසූ අයට සුබ අස්න දේශනා කිරීම. මෙහි දී විශේෂ කරුණක් වන්නේ ශුභාරංචි දේශකයන් පිටත් කර හැරීම සභාව විසින් කරනු ලැබීමය.
- ස්ථාන - සයිප්‍රසයට ගිනි කොන පළාත්වලට සුළු ආසියාවේ නගරවලට
- ගමන් මාර්ගය - අන්තියෝකීයේ පිහිටි සිලුකීය වරාය දක්වා ගොඩ බිමින් සහ එහි සිට සයිප්‍රසයට නැව් මගින්
- ළඟා වූ ස්ථාන - සලමිසය, පාපප්, පම්පිලියේ පර්ගාය, පිසිදියේ අන්තියෝකිය, ඉකෝනිය, ලුස්ත්‍රාව, දර්බය
- සිදුවූ වැදගත් සිදුවීම්

  **පාපස්** - 'බාර් ජේසුස්' නම් බොරු දිවැසිවරයා සමග සිටි සර්ගියස් පාවුලස් නම් දේශාධිපතියාගේ හැරීම.

  **පර්ගාය** - ජොහන් මාක් ජෙරුසලමට හැරී යාම

  **පිසිදියේ අන්තියෝකිය** - පළමු සබත් දින ධර්මශාලාව තුල පාවුලුගේ දේශනය, බොහෝ දෙනෙක් පාවුලු සහ බාර්ණබස් අනුව යෑම, දෙවන සබත් දින විජාතිකයන් දේව වචනයට ගෞරව දැක්වීම, හැරීම සහ ජුදෙව්වන් පාවුලු සහ බර්ණබාස් පීඩනයට පත් කර තම පෙදෙස් වලින් පිටතට නෙරපා දැමීම.

  **ලුස්ත්‍රාව** - දේශනා කිරීම, ඇවිදගත නොහැකි මනුෂ්‍යයාට සුවය, ජුදෙව්වන් පාවුලුට ගල් ගසා නුවරින් පිටතට දැමීම, දර්බයට යෑම

**ආපසු ගමන** - වැදගත් සිදුවීම් -

දර්බය, ලුස්ත්‍රාව, ඉකෝනිය, පිසිදියේ අන්තියෝකිය පම්පිලිය, පර්ගාය, අත්තාලිය සිට අන්තියෝකියට නැව් නැගීම,

දේශනා කිරීම - එක් එක් සභාවන් සඳහා සභා මූලිකයන් පත් කිරීම.

පාවුලු සහ බාර්ණබස් - අන්තියෝකියේදී සභාව රැස්කර දෙවියන් වහන්සේ තමන් මගින් කළා වූ දේ බෙදා ගත්හ.

**පාවුලුතුමාගේ දෙවන ධර්මදූත චාරිකාව (ක්‍රියා 15 :36 18 : 23)**

| | |
|---|---|
| සිදුවූ කාලය - | ක්‍රි.ව 50 සිට 52 දක්වා |
| සහභාගි වූවෝ - | සීලස්, තිමෝති, ලූක් |
| අරමුණ (දැක්ම) - | ස්ථාපිත කළ සභාවන්ට ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණ දැනුම් දීම, ඔවුන්ව දිරි ගැන්වීම සහ ඇදහිල්ලේ ශක්තිමත් කිරීම, ගැටුම් නිරාකරණය කිරීම. |
| ගමන් මාර්ගය - | අන්තියෝකියේ සිට ගොඩබිමින් ගමන් කළහ. |
| ළඟා වූ ස්ථාන - | සිරියාව, සිලිසියාව, දර්බය, ලුස්ත්‍රාව, ත්‍රෝවසය, පිලිප්පිය, තෙසලෝනිකය, බෙරියාව, ඇතැන්ස් කොරින්තිය |

- සිදු වූ වැදගත් සිදුවීම්

  **ලුස්ත්‍රාව** තිමෝතියස් ගේ එක්වීම සහ චර්මඡේදනය අනිවාර්ය නොවූවද ඔහු චර්මඡේදනය කිරීම, එසේ කලේ ග්‍රීක පෙළපතකට නෑකම් කියූ ඔහු ජුදෙව්වන් අතර සුබ අස්න ප්‍රකාශ කිරීම සඳහා බාධාවක් නොවන පිණිසය.
- ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ ආසියාවේ දේශනා නොකොට පිරීගිය සහ ගලාතිය හරහා ගොස් බිතිනියට යෑමට උත්සහ කළ හ. නමුත් ශුද්ධාත්ම මඟ පෙන්වීම වුයේ බිතිනියට නොයෑමය. ඒ නිසා මිසිය පසුකොට ත්‍රෝවසයට පැමිණිය හ.
  - **ත්‍රෝවසය** - පාවුලු රාත්‍රියේ දුටු දර්ශනය
  - **පිලිප්පිය** - වැදගත් සිද්ධීන් 04 කි.

1. ලිදියාගේ හැරීම (ක්‍රියා 16 : 11 - 15)
2. ජේන කියන වහල් තරුණියකට සුවය ( ක්‍රියා 16 : 16 - )
3. පාවුලු සහ සීලස් සිරගත කිරීම (ක්‍රියා 16 : 19 - 34)
4. පාවුලු සහ සීලස් නිදහස් කිරීම (ක්‍රියා 16 : 35 - 40)

**තෙසලෝනිකය** - ධර්මශාලාව තුළ සබත් දින 03 ක් ජුදෙව්වන් සමග වාද කිරීම, මහත් සමූහයකගේ හැරීම, ජුදෙව්වරුන් ගේ කරදර නිසා පාවුලු සහ සීලස් බෙරියාවට පිටත් කර යැවීම

**බෙරියාව** - ධර්මශාලාවේ දේශනා, බොහෝ දෙනෙකුගේ හැරීම . තෙසලෝනිකයේ ජුදෙව්වරු පැමිණ කළ කැලඹීම

**ඇතැන්ස්** - එහි පසුබිම අදාළව පුජාසන ගැන සඳහන් කරමින් අරියෝපග ශාලාවේ

කළ දේශනය, සමහර අයගේ හැරීම.

**කොරින්තිය -** අකිලා සහ ප්‍රිස්කිලා මුණ ගැසීම, දේශනා කිරීම සහ කොරින්තිවරු බොහෝ දෙනෙකු අදහා බව්තිස්මය ලැබීම, රාත්‍රියේ දී පාවුලු තුමා දුටු දර්ශනය, වසර 1 1/2 ක් කොරින්තිගේ උගන්වමින් ගත කිරීම

- වසර 03 ක් තිස්සේ සිදු වූ මෙම චාරිකාව පාවුලු තුමාගේ චාරිකාවල ඉතා වැදගත් දීර්ඝතම චාරිකාව බව සඳහන් කළ හැක. යුරෝපයේ මුල් වරට සුබ අස්න ප්‍රකාශ කරනු ලැබුනේ මෙම චාරිකාව තුළදී ය. පිලිප්පිය, තෙසලෝනිකය සහ කොරින්තිය තුළ පාවුල් තුමා නිරත වූ දීර්ඝ මෙහෙය සහ ස්ථාපිත සභාවන් ගැන මෙම චාරිකාව තුළ විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ධනවත් ග්‍රීක කාන්තාවන් පාවුලු තුමා සමග සේවයේ යෙදුන අතර ග්‍රීක ජුදෙව්වන් පාවුලු තුමා පසු පස යමින් ඔහුට කරදර කළෝ ය. නමුත් රෝම පාලකයින් මේ වන විට කිතුනුවන් කෙරෙහි යහපත් අදහස් අති කර ගෙන තිබීමද විශේෂයෙන් මෙහි දී සඳහන් කිරීම යෝග්‍යය.

**පාවුලු තුමාගේ තුන්වන ධර්මදූත චාරිකාව ( ක්‍රියා 18 : 23 21 : 20)**

| | | |
|---|---|---|
| සිදුවූ කාලය | - | ක්‍රි. ව 54 සිට 58 දක්වා |
| සහභාගී වූවෝ | - | තිමෝති, තීතස් |
| අරමුණ (දැක්ම) | - | සභාවන් නැවත බැහැදකිමින් කිතුනුවන් ශක්තිමත් කිරීම |
| ස්ථානය | - | ගලාතිය, පිරිගිය, මසිදෝනිය |
| ගමන් මාර්ගය | - | අන්තියෝකියෝ සිට ගොඩබිමින් ගමන් කළ හ. |
| ළඟා වූ ස්ථාන | - | එපීසය - වසර 03 තුනක් එහි රැඳී සිටි සේවය කළහ. පසුව ත්‍රෝවසය, පිලිප්පිය සහ තෙසලෝනිකය හරහා කොරින්තියට ගියහ. |

**සිදුවූ වැදගත් සිදුවීම්**

**එපීසය :** රෝම පාලනය යටතේ ආසියාවේ එක් අගනුවරක් වූ එපීසය ධනවත් දර්ශනීය නගරයකි. ලෝකයේ ඇති පුදුම හතෙන් එකක් වන ඩයනා දෙවඟන වෙනුවෙන් ගොඩ නගා ඇති දේව මන්දිරය ද පිහිටා තිබුණේ එපීසයේ ය. විදේශිකයන් විශාල වශයෙන් මෙම නගරටය පැමිණි අතර මෙම දේව මන්දිරය සහ එහි නමස්කාරය නිසාද, එහි තිබූ විජ්ජා සහ භූත කර්ම නිසා ද, එදා ලෝකය තුළ එපීසය ප්‍රකට නගරයක් විය. ඩයනා දෙවඟනගේ සහ දේව මන්දිරයේ තිබූ පිළිම වල අනු රූ සකස් කර විකිණීම විශාල ලෙස මුදල් ඉපයීමේ මාර්ගයක් විය.

- ස්නාවක ජොහන්ගේ ශ්‍රාවකයින් 12 දෙනෙකු පාවුලු තුමා විසින් බව්තිස්ම කරනු ලැබූ අතර ඔවුන් මත අත තැබීමෙන් පසු ඔවුහු අන්‍ය භාෂා වලින් කථා කරමින් දිවැසි වැකි පැවසූහ.

- පාවුලු තුමා මාස 03 ක කාලයක් සිනගෝග තුළ දේව රාජ්‍ය පිළිබඳව දේශනා කළේ ය. සමහර අසත්නත් කළ හෙළා දැකීම් නිසා ඔවුන්ගෙන් ශ්‍රාවකයන් වෙන් කර ගෙන තුරානස්ගේ ශිල්ප ශාලාවේහි දී තම තර්ක කිරීම් ඉදිරියට ගෙන ගියේ ය.

- බොහෝ දෙනෙක් අදහා ගත්තෝ ය. මහත් හාස්කම් සිදු වූ අතර බොහෝ සුව වීම් ද අත්දැකීමට හැකි විය.

- නායක පූජකවරයකු වූ ස්කේවා නම් ජුදෙව්වරයාගේ පුතුන් 07 දෙනා ජේසුස් වහන්සේගේ නාමයෙන් අශුද්ධාත්ම දමනය කිරිමට ගොස් ලැබූ අමිහිරි අත්දැකීම,

- පිළිම වන්දනාවට විරුද්ධව දේශනා කිරීම, බොහෝ දෙනෙකු ඩයනා දෙවඟනගේ දේව මන්දිරයට යැම අත් හැරීම, මෙම කරුණු නිසා දේව මන්දිරයේ ආදායම අඩුවීම.

- පිළිම වන්දනාවට විරුද්ධව පාවුලු තුමාගේ දේශනය, දෙමෙත්‍රියස් නම් කලා කරුවාගේ පිළිම නිර්මාණයට එය අභියෝගයක් වීම. යන මෙම සඳහන් කරුණු එපීසයේ මහත් කළ කෝලහල ඇතිවීමට හේතු විය.

- කොරින්තියේ සභා වෙත ගිය පාවුලු තුමා ජෙරුසලම් සභාවට උපකාර කරන ලෙස කළ ඉල්ලීම, පිලිප්පියේ දී පැවැත් වූ පසුකර යෑමේ මංගල්‍යයට පසු, පාවුලු තුමා ත්‍රෝවසය බලා ගියේ ඇති වූ ජුදෙව් කුමන්ත්‍රණයේ ප්‍රතිඵල වශයෙනි.

- ත්‍රෝවසයේ දී යුතිකස් නම් තරුණයට පණ දීමේ සිද්ධිය.

- මිලේතසට ගිය පාවුලු එපීසයට පණිවුඩ යවා සභාවේ මූලිකයන් කැඳවීය. ක්‍රියා 20 : 17 - 35 දක්වා අප දකින්නේ පාවුලු තුමාගේ සමු ගැනීමේ කථාවය. ඔහු කළ සියල්ලත් ඔහුගේ වැඩිදුර උපදෙස් දීමත් එහි අන්තර්ගතය. 36 සිට 38 පද වල දැක්වෙන්නේ ඔවුන් පාවුලු තුමාගෙන් ඉතා හැඟීම් බරව සමුගැනීමයි.

- **කයිසාරිය** - මිලේතසෙන් නැව් නැග පාවුලු සහ පිරිස නගර කිහිපයකින් පසු අවසානයේ කයිසාරිය වෙත ළඟා වූහ. එහි දී ධර්මදූත පිලිප් ගේ නිවසේ නතරව සිටින කාලයේ දී අගබස් නම් දිවැසිවරයා පාවුලු තුමා ජෙරුසලමේ දී විජාතීන්ගේ අත් වලට පාවා දීම ගැන ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ ප්‍රකාශ කළේ ය.
ජෙරුසලමට නොයන ලෙස කළ ඉල්ලීම ප්‍රතික්ෂ්ප කළ පාවුලු තුමා තම පිරිස සමග ඉන් පසු ජෙරුසලමට ළඟා විය.

- **ජෙරුසලම** - සහෝදරයෝ සියලු දෙනා ආදරයෙන් පිළිගත්හ. මෙහි දි ජාකොබ් හමු වීමට ගිය පාවුලු තුමා රැස්ව සිටි සභා මුලිකයන් සමග විජාතීන් අතර තම මෙහෙය පිළිබඳව සහ දෙවියන් වහන්සේ තමා එම මෙහෙය සඳහා භාවිත කළ ආකාරය බෙදා ගත්තේ ය.

### 6.1.3 පාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම්

- පාවුලු තුමා විජාතීන් වෙත ගිය ප්‍රථම අපෝස්තලුවරයා පමණක් නොව ඔවුන් වෙත පැමිණි ප්‍රථම කිතුනු දේවධර්මාචාර්යවරයා ද විය.

- ඉහළ සුදුසුකම් ලද ජුදෙව් පරිසිවරයෙක් වූ පාවුල තුමා ජුදෙව් ව්‍යවස්ථාව , සම්ප්‍රදාය සහ දේව ධර්මය මනා ලෙස දැන සිටි කෙනෙකි. එයට සමාන ලෙසට ග්‍රීක දර්ශන වාදය පිළිබඳව ද ඔහු දැන සිටියේ ය.

- ඔහු කිතුනුවන්ට එරෙහි වීමට හේතු වූයේ ඔහු තුළ ජුදෙව් දහම කෙරෙහි තිබූ ඇල්මත්, ජුදෙව් ව්‍යවස්ථාව ගැන තිබූ දැනුමත්ය. ස්තේපන්ගේ වේද සාක්ෂික මරණින් පසු ජෙරුසලමෙහි ආරම්භ වූ ජුදෙව් අරගලයට සාවුල් දැඩි උනන්දුවකින් සහභාගී විය. සාවුල් ගේ නම ඇසූ පමණින් කිතුනුවන් බොහෝ සේ බියට පත් විය.

- දමස්කයේ කිතුනුවන් ජීවත් වන බව දැනගත් සාවුල් ඔවුන් සිරකරුවන් ලෙස ජෙරුසලමට ගෙන ඒමට උත්තම පූජකවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු තවත් අය සමග දමස්කයට ගියේ ය.

- දමස්කය වෙත යන විට සාවුල් ලැබූ අත්දැකීම ඔහුගේ ජීවිතයේ විශාල වෙනසක් සිදු කළ සිදුවීමකි. උත්ථාන වූ ජේසුස් වහන්සේ මුහුණට මුහුණ හමුවීම එම අත්දැකීම විය. අහසින් පැමිණි ආලෝකයක් සාවුල් වටා පැතිරිණ. දැස් පෙනීම නැති වූ ඔහු බිම වැටුණේය. " සාවුල් සාවුල්, ඔබ මට පීඩා කරන්නේ මන්ද ?" යන හඬ ඔහුට ඇසිණි. " ස්වාමීනි ඔබ කවරෙක් ද ?" සාවුල් විමසුවේය. එවිට " මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්ය. ඔබ නැගිට නුවරට ඇතුළුවන්න. . ඔබ කළ යුතු දේ ඔබට කියනු ලබන්නේය." එම හඬ සාවුල්ට පැවසී ය.

  දැස් පෙනීම නැතිව ගිය සාවුල් දමස්කයට රැගෙන යෑමට ඔහු සමග පැමිණි අය කටයුතු කළ හ. එහි දී සාවුල් අනනියස්ගෙන් බව්තිස්මය ලබා සභාවට එක්විය.

- දමස්කයට යන අතර මඟ සාවුල්ට මුණ ගැසුණු උත්ථානවූ ජේසුස් වහන්සේ නිසා ඔහුගේ ජීවිතයේ විශාල වෙනසක් ඇතිවිය. මේ නිසා ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධව කටයුතු කළ සාවුල් උන්වහන්සේගේ අපෝසතුලුවරයකු විය. ඒ නිසාම ඔහු කිතුනුවන්ගේ මිතුරකු බවටද පත්විය. තමාට ආවේණික වූ ජ්වලිත බවින් යුතුව මෙම නව කාර්යය ඉතා උනන්දුවෙන් ඉටු කිරීමට පාවුලු තුමා පටන් ගත්තේය.

**දේව අනුග්‍රහය**

- ''දේව වරප්‍රසාදය'' යන වචනයට ශු පාවුලු තුමා භාවිත කර ඇති ග්‍රීක වචනය 'කාරිස්'ය. මෙම වචනයේ අර්ථය " දයාව" හෝ " අචල ප්‍රේමය" වෙයි.

- පාපයේ බලපෑමෙන් දෙවියන් වහන්සේගෙන් වෙන් වී උන් වහන්සේ සමග ඇති කරගත් සම්බන්ධතාව බිඳ දමා නපුරාට වහල්වී ජීවත්වන මිනිසා මෝසෙස්ගේ ව්‍යවස්ථාව විශ්වාසවන්තව අනුගමනය කිරීම වැනි යහපත් ක්‍රියාවන් තුළින් තමන්ව තමාම ගලවාගනියි. එනම් තමාව දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගයෙකු බවට පත්කර ගනියි. යන්න ජුදා ආගමේ මූලික අදහසයි.

- දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙකු වීම යනු දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ටයෙකුවීම, දෙවියන් වහන්සේ සමග බිඳුණු සම්බන්ධතාව නැවත ගොඩ නගා ගැනීම, හෝ ගැලවීම ලබාගැනීම වැනි අර්ථය ලබයි.

- ජුදා ආගම කෙරෙහි හා ජුදා ව්‍යවස්ථාව කෙරෙහි ගැඹුරු ඇල්මක් ඇති ජුදා පරිසිවරයකු වූ පාවුලු, එම දේව ධර්ම සංකල්පය තුළම ජීවත්වීය. මිනිසා ව්‍යවස්ථාව අනුගමනය කරනවිට තම යහපත් ක්‍රියාවන් මගින් තමාව දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙකු බවට පත් කර ගනී යන සංකල්පය මත පාවුලු ව්‍යවස්ථාවට ගරු නොකළ කිතුනුවන්ගේ සතුරකු වෙමින් ඔවුන්ට පීඩා කළේ ය.

- එතුමාගේ දමස්කය කරා ගිය ගමනේ අත්දැකීම, එතුමාගේ ව්‍යවස්ථාව සම්බන්ධ සංකල්පය නැවත සිතා බලන්නට අවස්ථාවක් විය. උත්ථානවූ ක්‍රිස්තුස් වහන්සේ තමා කිතුනුවන්ට පීඩා කළ පව්කාරයෙක්ව සිටියදි (" මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්ය')තමා වෙත අනුකම් පා වී, තමාගේ පව් කමාකර ශුද්ධාත්මයාණන් වහන්සේව දානය කර තමාව ගලවා වසාගත් සේක. එම නිසා තමාව දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයකු බවට පත් කළේ ව්‍යවස්ථාව නොව ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයයි, උන්වහන්සේගේ දයාවයි. තමාට ගැලවීම දානය කළේ ව්‍යවස්ථාව අනුව ජීවත්වීමේ යහපත් ක්‍රියාවන් නොව දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය බව පිළිගත්තේය. ''දැන් මිනිසුන් (රෝම 3 : 21)

- මිනිසා ව්‍යවස්ථාව පිළිපැදීමෙන් නොව, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි තබන විශ්වාසයෙන් පමණයි ඔහු දෙවියන්වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙකු වන්නේ. ප්‍රසන්න වීම දෙවියන් වහන්සේගේ දයා වේ කාර්යයකි. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ දායාදයකි. එය දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයකි. පාවුලු තුමාගේ ඉගැන්වීම හා ශුභ ආරංචිය වන්නේ මෙයයි.

- ව්‍යවස්ථාව දෙවියන් වහන්සේගෙන් පැමිණෙන්නේය. එය ශුද්ධ වූද යහපත් වූද දෙයකි. එය ඉශ්‍රායෙලුන්ට දෙවියන් වහන්සේ විසින් දානය කරන ලද විශේෂ සම්පතකි. ව්‍යවස්ථාව පාපය කුමක්දැයි පැහැදිළි කරයි . නමුත් පාපයේ ග්‍රහණයෙන් බේරෙන්නේ කෙසේදැයි නොපවසයි. මිනිසාව පාපයට පත් කරන්නේ ව්‍යවස්ථාවයි. පාපයට වහල්කරයි. සාරධර්මයේද එය හොඳ නරක ගැන කියාදෙයි නමුත් යහපත කරන්නට හැකියාව නොදෙයි (රෝම 7 : 16) යනු පාවුලු තුමාගේ අවසන් තීරණයයි.

- අපි පව් කරන විට ව්‍යවස්ථාවට විරුද්ධව නොව, දෙවියන් වහන්සේට විරුද්ධව පව් කරන්නෙමු. එම නිසා පාපය මහා දුෂ්ට දෙයකි. එයින් ගැලවෙන්නට නිමක් නැති වන්දි ගෙවිය යුතුයි. ඉතා කුඩාවු , පව්කාරවු අප විසින් කිසිමදාක නිමක් නැති වන්දි ගෙවීමට නොහැකිය. අපට අපවම පාපයෙන් බේරාගැනීමට හැකියාව නැත. අප අපවම දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ටයන් කරගැනීමට නොහැකිය. අපට දේව වරප්‍රසාද අවශ්‍යයය.

- මුල් කාලයේ ව්‍යවස්ථාව දේව ජනතාවට මග පෙන්වීමක් හා උපදේශකයෙකු ලෙස පැවතුණේය. ගැලවුම්කාරයකුගේ අවශ්‍යතාව සිත් තුල ඇති කළේ ය. නමුත් දැන් ගැලවුම් කරුවාණන් පැමිණ අවසානයි. එම නිසා ව්‍යවස්ථාවට අර්ථයක් නැත. ක්‍රිස්තුස් වහන්සේ ව්‍යවස්ථාවේ පූර්ණත්වයයි.

- ජේසුස් වහන්සේගේ වරප්‍රසාදය උන්වහන්සේගේ කුරුසිය මගින් අප වෙත ගලා එයි. උන්වහන්සේ කෙරෙහි අප තබන විශ්වාසය, වරප්‍රසාද මගින් විශ්වාස කරන්නාවු සැම, දෙවියන් වහන්සේ තමන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයන් බවට පත්කරන සේක. එමනිසා ප්‍රසන්නවීම හෝ ගැලවීම දෙවියන් වහන්සේ අපට නොමිලේ දානය කරන වරප්‍රසාදයකි. දේව දීමනාවකි. එසේ හෙයින් අපි ව්‍යවස්ථාව සම්බන්ධ ක්‍රියාවෙන් නිසා නොව ඇදහිල්ල මගින් විශේෂයෙන් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි තබන්නා වූ ඇදහිල්ලේ බලාපොරොත්තුවෙන් දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයින් වෙමු.

- කිසිවෙක් ව්‍යවස්ථාව සම්බන්ධ ක්‍රියාවන් මගින් දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ට අය නොවන්නාහ. අපට ව්‍යවස්ථාව ලැබෙන්නටත් වසර හාරසියය තිහකට පෙර ආබ්‍රහම් තම ඇදහිල්ල මගින් දෙවියන්වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ට කෙනෙක් විය." "ඔහු.. (උත්පත්ති 15 :6) ආබ්‍රහම් තම ඇදහිල්ල මගින් දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ටයෙක් වූවා සේ, දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව අනුව අප වෙත එවන ලද ක්‍රිස්තුස් වහන්සේ අදහාගනිමින් දෙවියන් වහන්සේට ධර්මිෂ්ට අය වන්නෙමු.

- ගලාතිවරු ව්‍යවස්ථාව ගැන කිසිවක් නොදැන සිටි අවස්ථාවක ශුද්ධාත්මයාණන් වහන්සේ ලබාගත්තෝ ය. එසේ වුයේ ඔවුන් දේව ප්‍රේමයේ ශුභආරංචිය අසා දෙවියන් වහන්සේ අදහාගත් නිසාය ( ගලාති 3 : 1 - 4)

- ජුදෙව්වන් වේවා, අන්‍ය ජාතිකයින් වේවා, අප සැම ගැලවීම ලබන්නේ, දෙවියන් වහන්සේ ඉදිරියේ පිළිගනු ලබන අයවන්නේ ව්‍යවස්ථාව මගින් හෝ ව්‍යවස්ථාවට අදාළ ක්‍රියාවන් මගින් නොව ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල මගින් ය.

- ගැලවීම " මිළදී ගත් දෙයකි " කියා පාවුලු තුමා සඳහන් කරයි. (1 කොරි 6 : 20 - ගලාති 3 : 13) " දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ලෙයින් උරුමකරගත් ක්‍රිස්තුස් වහන්සේගේ ශු. සභාව ගැන කතා කරයි (තීතස් 2 : 14) ක්‍රිස්තුස් වහන්සේගේ කල්වාරි යාගය අපේ ගැලවීමයි; දෙවියන් වහන්සේට ප්‍රසන්න වීමයි; දෙවියන් වහන්සේ විසින් ධර්මිෂ්ටයයි ගණන් ගනු ලැබීමේ උපකරණයයි. ඒ වෙනුවෙන් දී ඇති මිලයයි.

- ගැලවීම දෙවියන් වහන්සේගේ දීමනාවයි. දේව වරප්‍රසාදයයි. ජුදෙව්වරු වුවද අන්‍ය ජාතිකයින් වුවද සැම දෙනා පාපය මගින් දෙවියන් වහන්සේගෙන් ලැබුණු උදාරත්වය නැති කරගත්හ. නමුත් සැම කෙනා ක්‍රිස්තුස් වහන්සේ ඉටු කළ ගැලවීමේ ක්‍රියා මගින් දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන් නොමිලේ උන්වහන්සේට ප්‍රසන්න අය වන්නාහ. දෙවියන් වහන්සේ පව්කාරයින්වත් යහපත් අය මෙන් ගණන් ගන්නා සේක.

### 6.1.3 නායකත්වය හා බැහැපැත්කම (එපිස 1 : 3 10. කොලො 1 : 15 20)

- ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය ගැන පාවුලු තුමාගේ ඉගැන්වීම නෝස්ටිකවරුන්ගේ ඉගැන්වීමේ පසුබිම මතයි තේරුම් ගත යුත්තේ, නෝස්ටිවරුන්ගේ අදහස අනුව දෙවියන් වහන්සේ වෙතින් නික්මුණු විවිධ බල ශක්ති අතරින් ක්‍රිස්තුස් වහන්සේ එක් ශක්තියකි. එම නිසා උන්වහන්සේ උසස්, සමාන කළ නොහැකි, එකම පුද්ගලයෙක් නොවන්නේය. තවද දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළින් මුළුමනින්ම එළිදරව් වන බවද ඔවුහු නොපිළිගනිති.

- මෙයට විරුද්ධව, පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ සමාන කළ නොහැකි භාවය, නායකත්වය ගැන කතා කරයි ක්‍රිස්තුස්වහන්සේ අදෘශ්‍ය....' (කොලො 1 : 15)

- " ස්වරූපය' යන වචනයට පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය "නියෝජ්‍ය" හෙළිදරව්ව යන තේරුම ලබයි. එම නිසා පාවුලුතුමා දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ මගින් සම්පූර්ණව හෙළිදරව් වන බව පවසයි. දෙවියන් වහන්සේව මනුෂයා දැක, දැනගෙන තේරුම් ගන්න තරමට ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේව සම්පූර්ණයෙන් නියෝජනය කරන සේක. උන්වහන්සේ දෙවියන් වහන්සේය.

- තව දුරටත් පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේ හා මැවිල්ල අතර ඇති සම්බන්ධතාව ගැන කතා කරයි. ක්‍රිස්තුස් වහන්සේ මුළු මැවිල්ලේ අගතැන් ගන්නා සේකැයි, කියයි. හෙබ්‍රෙව්, ග්‍රීක චින්තනයේ මෙම කියමන, ක්‍රිස්තුස් වහන්සේ මුල් මැවිල්ලේ අගතැන් ගන්නා බවට, අර්ථය නොදෙයි, ඒ වෙනුවට උතුම් බව හා තේජාන්විත බව සඳහන් කරයි. එසේ නම් මැවිල්ල අතර ඉතා උතුම්බව හා තේජාවින්තබව සඳහන් කරයි.

- ''තවද සගලොවත් . . . . මවන ලද්දේ ය.'' (කොලෝ 1 : 16)

- එපමණක් නොව සියලු දේ උන්වහන්සේ උදෙසා මවනු ලැබුවේය. ජේසුස් වහන්සේ මැව්ලි සියල්ලේ මැවුම්කාරයාණන් පමණක් නොව, මැවිල්ලේ පරමාර්ථයද අවසානයද වනසේක, මැවිල්ලේ ආරම්භය හා අවසානයට අතරමැද කලයේ එය ආරක්ෂා කරන්නාවු තැනැන් වහන්සේය. සොබාදහමේ නීතිය නිකුත්වන්නේද උන්වහන්සේගේ හදවතෙහි ය.

- තව දුරටත් පාවුලු තුමා සභාවත් ක්‍රිස්තුස් වහන්සේත් අතර ඇති සම්බන්ධතාව ගැන කතා කරයි. කොලො (1 ፡ 18-19) ක්‍රිස්තුස් වහන්සේ සභාව නැමැති ශරීරයේ හිසය, ක්‍රිස්තුස්වහන්සේ තුළින් සභාව උපත ලැබුවේය.

- පාපයේ විපාකය මගින් දෙවියන් වහන්සේ හා මනුෂ්‍යා අතර පවතින යහපත් සම්බන්ධතාව සිඳබිඳ මිනිසා දෙවියන්වහන්සේගෙන් ඈත්ව ජීවත්විය. නමුත් දෙවියන් වහන්සේ නොකඩවා මිනිසාට ප්‍රේම කළසේක. එම නිසා සමගි සන්ධානය කිරීම සඳහා ක්‍රිස්තුස් වහන්සේව මෙලොව එවූ සේක. ක්‍රිස්තුස් වහන්සේ සමගි කිරීමේ සේවාව සඳහා මෙලොවට වැඩිය සේක.

- අහසේ හා පොළොවේ සියල්ල තමන් වහන්සේ ඒකාබද්ධ කරගැනීමට උන්වහන්සේ අදහස් කළ සේක යි. පාවුලු තුමා පවසයි. මිනිසා සමග පමණක් නොව පණ ඇති පණ නැති සෑම මැවිල්ලක් ඒකාබද්ධවීම උන් වහන්සේගේ අභිප්‍රාය විය. ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ මරණය මගින් සියලු මැවිල්ල දෙවියන් වහන්සේ සමඟ එකාබද්ධ විය. මෙසේ පාවුලුතුමා මැවිලි සියල්ල ක්‍රිස්තුස් වහන්සේට සමාන නැත. උන් වහන්සේ සෑම මැවිල්කටම වඩා උතුම් වූ තැනත්තන් වහන්සේය, ඉතා උසස් තැන්වහන්සේය, ක්‍රිස්තුස් වහන්සේ ගේ ස්වාමිත්වය අප සෑම පිළිගත යුතුය, අපේ ජීවිතයේ, අපේ පවුල්වල උන් වහන්සේ රජාණන් විය යුතු යැයි පවසයි.

**බැගෑපත්කම (පිලිප් 2 ፡ 5 11)**

"ජීවත්වන්නේ මා නොව, මා තුළ ක්‍රිස්තුස් වහන්සේ ජීවත්වන සේක. මගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයට හරවන්නට නම් මගේ සිත ක්‍රිස්තුස් වහන්සේගේ සිත මෙන් විය යුතුය.. එම නිසා ක්‍රිස්තුස් වහන්සේ තුළ ...... " (පිලිප් 2 ፡ 5) කියා විස්තර කරන පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය මගින්, ක්‍රියාව මගින්, හෙළිදරව්වු උන් වහන්සේගේ හදවතේ ස්වභාවය අපට පෙන්නුම් කර එම ස්වභාවයම අප හදවත් තුළ ඇතිකරගත යුතුයැයි කියා, විශේෂයෙන් උන්වහන්සේගේ බැගෑපත්කමේ උතුම්කම අපට විස්තර කරන්නේ ය.

- දෙවියන් වහන්සේගේ ස්වරූපය දරූ උන් වහන්සේ එය ඉවතලා අප හා සමාන මනුෂයකු වූ සේක. " ස්වරූපය" කියා පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය, ඕනෑම පරිසරයක වෙනස් නොවන බව සඳහන් කරයි. ජේසුස් වහන්සේ වෙනස් නොවන දේවත්වය දැරූ තැනන් වහන්සේය. උන්වහන්සේ දෙවියන් වහන්සේ ය.

- නමුත් උන්වහන්සේ දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙනම තබාගත යුතු වස්තුවකැයි නොසිතු සේක.

- සියලු දේ ඉවතලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මනුෂ්‍යයකු වූ සේක. "හිස් කරගැනීම" පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය, කිසිවක් නොතබා සම්පූර්ණ හිස්වීමය එය නැති වීමේ අර්ථය දෙයි.

- ජේසුස් වහන්සේ ගේ මෙලොව ජීවිත තත්ත්වය පැහැදිළි කරයි. ජේසුස් වහන්සේ ගේ මාංශගතවූ මේ අභිරහස පාවුලු තුමා ජීවමානව විස්තර කරයි. උන් වහන්සේ මනුෂ්‍යත්වය ගැනීම සඳහා තමන් වහන්සේගේ දේවත්වයෙන් සිය කැමැත්තෙන් හිස් වූ සේක. තමන් වහන්සේගේ අයිතීන්, දේව ස්වභාවය, තේජශ්‍රීය සැම ඉවත දැමූ සේක.

- ''වහලකුගේ ස්වරූපය ගෙන " මෙතැන නැවත " ස්වරූපය " යන වචනය වෙනස් කිරීමට නොහැකි තත්ත්වය සඳහන් කරයි. ජේසුස් වහන්සේ මිනිසා මෙන් වහලකු මෙන් රඟපෑවේ නැත. සැබැවින්ම මිනිසෙක් වූ සේක. මිනිසාගේ සතුට දුක, වේදනාව, දිළිඳුභාවය සැම අංශයකින්ම පංගුකාරයකුවූ සේක. පාපය හැර අනිත් සියලු දෙයින් මිනිසාට සමානවූ සේක.

- මිනිසකුවූවා පමණක් නොව, උන් වහන්සේ වහලකු වූ සේක. වහලකු යනු තමා වෙනුවෙන් ජීවත් නොවන කෙනෙකි. තමාට කියා කිසිවක් නොමැති කෙනෙකි. අනිත් කෙනා වෙනුවෙන් ජීවත්වෙන කෙනෙකි.

- කුරුසියේ මරණය දක්වා උන් වහන්සේ බැගෑපත් වූ සේක. වහලකු වුවා පමණක් නොව, ඉතා පහත් මට්ටමේ වහලකු වූ සේක. කුරුසියේ මරණය වහලකුට තමාගේ අයිතිවාසිකම් සියල්ලම නැතිවූ කෙනෙකුට නියමිත දඬුවම් ක්‍රමයේ ඉතා නීච ක්‍රමයයි.

- ක්‍රිස්තුස් වහන්සේ ගේ මෙලොව ජීවිතයේ කැපීපෙනුන ගුණාංග වන බැගෑපත්කම පරිත්‍යාගය ගැන පාවුලුතුමා විස්තර කරයි. උන් වහන්සේ මිනිසා මත බලය පෑමට නොව, ඔවුන්ට සේවය කිරිමට කැමතිවූ සේක. උන් වහන්සේ තමාගේ කැමැත්ත අනුව ජීවත් වූ කෙනෙකු නොව පියාණන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් වීමට අභිප්‍රාය කළ සේක. උන් වහන්සේ තමන් වහන්සේව උසස් කරගත්තේ නැත. ජනතාව වෙනුවෙන් තමන්ව පහත් කරගෙන තමාට හිමි මහිමය අත් හැරදැමුවේය.

- ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගශීලී කරුණාව ඔබ දන්නාහු ය. ... ( 2 කොරි. 8 : 9)

- තමා පහත් කරගන්නා උසස් කරනු ලබන්නේ ය" කියා නව ගිවිසුමේ කියවා ඇත. ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගශීලීභාවය උන් වහන්සේගේ හිස්වීම, බැගෑපත්කම, කිසිදු මිනිසකුට නොලැබුණු තේජමාන තත්ත්වය උන් වහන්සේට ලබා දුණි. මරණය පරාජය කොට නව ජීවිතයක් වෙත උත්ථාන කරනු ලැබිණි. දෙවියන් වහන්සේ උන්වහන්සේ මරණයෙන් උත්ථාන කළ සේක, මහිමයට පත්කළ සේක.

- දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේව මහිමයට පත්කර, උන්වහන්සේට සියලු නාමවලට වඩා අග්‍ර නාමය දානය කළ සේක. අලුත් නමක් තැබීම කෙනෙකුගේ ජීවිතයේ නවක තත්ත්වයක් ආරම්භ කිරීම සඳහන් කරයි. දෙවියන් වහන්සේ තැබූ නව නාමය "ස්වාමීන් වහන්සේ" යන්නයි. මුල් සභාවේ ජේසුස් වහන්සේ මේ නාමයෙන් හඳුන්වනු ලැබීය. උන් වහන්සේ සැම දෙනාගේම අයිතිකරු ය. ස්වාමීන්ය.

### 6.1.4 පවුල් දිවිය (1 කොරි : 6 : 16 එපීස 5 : 22 30

- කිතුනු පවුල ශු. සභාවේ ජීවනාලියයි. කිතුනු පවුල් රාශියකින් ගොඩනැගුණු දෙවියන් වහන්සේගේ විශේෂ පවුල ශු සභාවයි. කිතුනු පවුලක් ගෘහස්ථ සභාවකි. එම නිසා පවුල් ජීවිතය හා ශු සභාවේ ජීවිතය අතර කිට්ටු සම්බන්ධතාවක් ඇත.

- කිතුනු පවුල් ජීවිතය ගැන ශු. පාවුලු තුමා තුළ පැවැති ආකල්පයේද වෙනසක් අද අපි දකිමු. ප්‍රථමයෙන් ලියූ ලිපිවල (කොරි) විවාහය සම්බන්ධ විරුද්ධ අදහස් හා විවාහ ජීවිතය සුළු කොට සළකා තමාමෙන් හැමදෙනම විවාහ නොවී සිටීම යහපතැයි ප්‍රකාශ කරයි.

- කොරින්තිවරුනට ලියන ලද පළමු ලිපියේ ශු පාවුලු තුමා විවාහය හා පවුල් ජීවිතය ගැන ලියා ඇති දේ අපි නිසියාකාරව තේරුම් ගැනීමට නම් කොරින්ති ජනතාව ජීවත් වු පරිසරයත් ඔවුන් මුහුණ දුන් ප්‍රශ්නත් හොඳින් දැන සිටිය යුතු ය. එම කාලයේ කොරින්ති නගරය වානිජමය, විනෝදකාමී සදාචාරයෙන් ඈත්ව ජීවත්වූ ජනතාවක් සිටි එකකි. පාපයට ඇදී යාමට හැකි පරිසරයක් හා පාපිෂ්ට ක්‍රියාවල යෙදීමට ගැළපෙන අවස්ථා ඇති කරන වාතාවරණයක් ද එහි පැවතුණි.

- තවද සමහර කොරින්තිවරුන්ගේ අදහස් අනුව ශරීරය අයහපත් දෙයකි. එම නිසා එය දමනය කළ යුතුය. විනාශ කළ යුතුය. එසේ නැතිනම් ස්වභාවිකව සියලු ආශාවන් තෘෂ්ණ හැඟීම් දමනය කළ යුතුය. කෙනෙකු සැබෑ කිතුනුවෙකු වීමට කැමතිනම් ඔහු තම ශරීරය සම්බන්ධ සැම දෙයින් ඈත් වි විවාහ නොවී සිටිය යුතු යි.

- පාවුලුතුමාගේ කීම අනුව විවාහ ජීවිතය මගින් ස්වාමි පුරුෂයා හා භාර්යාව දෙවියන් වහන්සේ කෙරෙහි තිබිය යුතු ගෞරවය දැක්වීම අඩු කරයි. එම නිසා හැමදෙනාම

විවාහ නොවී සිටීම යහපත්යැයි එතුමා කියයි. හැම දෙනාටම එවැනි වරප්‍රසාදයක් නො ලැබෙයි. නමුත් කොරින්තියේ පැවතුණු පරිසරය අනුවත් මිනිස් දුර්වලකම නිසාත් ස්වදමනය කිරීමට නොහැකි නම් ඒ අයට විවාහ ජීවිතයට ඇතුළුවීම සුදුසුයැයි පාවුලුතුමා කියයි (1 කොරි 7: 1-7)

- එකිනෙකා තම තමාගේ තත්ත්වය, ආශාවන්, දුර්වලකම් ගැන දැන සිටිය යුතු ය. පාවුලු තුමාගේ මෙම කීම, කාම තෘෂ්ණාවේ පාපයෙන් වැලකීමට විවාහය අනුමත කරන බව හැඟේ. ඉන්පසු එතුමා විවාහ නොවුවන්ට හා වැන්දඹුවන්ට උගන්වන දෙයින් මෙම අදහස්ම දකින්නට ලැබේ. (1 කොරි 7 :8-9) එම නිසා පාවුලු තුමා තුළ පැවතුණේ විවාහ ජීවිතය ගැන විරුද්ධ අදහස් හා අවතක්සේරුවක් වේ.

- තව දුරටත් විවාහ ජීවිතයේ ස්වභාවය, වගකීම්, හිමිකම් ගැන කථා කරයි.

- ස්වාමි පුරුෂයා, තම භාර්යාව තමාගේ අවශ්‍යතා ඉටුකරගැනීමේ උපකරණයක් හැටියට හෝ භාර්යාව තම ස්වාමි පුරුෂයා තමාගේ අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමේ උපකරණයක් හැටියට භාවිත නොකළ යුතු යි. ස්වාමි පුරුෂයාගේ ශරීරය භාර්යාවට හිමිවෙයි. භාර්යාවගේ ශරීරය ස්වාමි පුරුෂයාට හිමිය.

- විවාහ සම්බන්ධතාවයේ දෙදෙනා අතර ගරු කිරීමක් තිබිය යුතුය. දෙදෙනා ශාරීරික වශයෙන් ද, ආධ්‍යාත්මික වශයෙන් ද, දෙපක්ෂය අතර, එකිනෙකා වෙනුවෙන් අනිත් කෙනා තමාව කැප කළ යුතුය.

- " යාච්ඤා . . . . එක්වෙනවා " (1 කොරි 7 : 5)

- විවාහ වූ අයට ශු. පාවුලුතුමා දෙන අවවාදනය නම්, ස්වාමි පුරුෂයා හා භාර්යාව වෙන්වී ජීවත්වීම සුදුසු නැත. එය දෙවියන් වහන්සේගේ නියෝගයයි. එසේ වෙන්වී ජීවත් වීමට සිදුවුවත්, නැවත විවාහ වීම සුදුසු නැත. හැකිතාක් ඉක්මනින් දෙදෙනා එක්විය යුතුයි. සමගි විය යුතුයි.

- අන්‍යාගමික පුද්ගලයින් සමග විවාහවීම සම්බන්ධව කොරින්ති නගරයේ ජනතාව අතර වැරදි ආකල්ප පැවතිණි. විවාහයේ යෙදෙන කිතුනුවකු අන්‍යාගමික පුද්ගලයකු සමග විවාහ වුනොත්, ඒ දෙදෙනා එකට ජීවත්වීම වැරදිය. අන්‍යාගමික පුද්ගලයාව හරවා යැවිය යුතු ය.

- පාවුලු තුමා ඉහත කරුණට විරුද්ධව මෙසේ අදහස් ප්‍රකාශ කරයි. එනම් කිතුනුවකු හා අන්‍යාගමිකයකු විවාහ වුණොත් දෙදෙනා එක්ව ජීවත් විය යුතුයි. එසේ කිරීමෙන් යම් විටක කිතුනු පුද්ගලයාගේ විශ්වාසය මගින් අන්‍යාගමික තැනැත්තා ශුද්ධවත් කෙනෙකු විය හැකි ය.

- නමුත් අන්‍යාගමික තැනැත්තා වෙන්වී ජීවත්වීමට කමැත්ත දැක්වූවහොත් එසේ කළ හැකි ය. කිතුනු පාර්ශවයේ තැනැත්තාට නැවත විවාහ වීමට නිදහස ඇත.

- නමුත් ඔවුන් එක්ව ජීවත්වීම පාවුලුතුමාගේ කැමැත්තය.

- පාවුලුතුමා එපීසවරුනට ලියූ ලිපියේ තවත් අදහසක් ප්‍රකාශ කරයි. (එපීස 5 : 22-30) විවාහය ගැන පාවුලු තුමාගේ වැඩිවූ අදහස් කිහිපයක් අපි දකිමු.

- ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාවය ඉතා උසස්, පිරිසිදු එකක් වෙයි. පාවුලු තුමා ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව, ක්‍රිස්තුස් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවය ට සමාන කරයි. මෙම සම්බන්ධතාවයේ පදනම ආදරයයි.

- පාවුලු තුමා ස්වාමි පුරුෂයා භාර්යාව කෙරෙහි දැක්විය යුතු ආදරය ගැන එතුමාගේ අදහස් ප්‍රකාශ කරයි. එය පරිත්‍යාගශීලී ආදරයකි. ක්‍රිස්තුස් වහන්සේ ශු සභාවට ප්‍රෙම කළාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතුය. කිසිවිටක එය ස්වආලයේ ආදරයක් නොවිය යුතු ය.

- ක්‍රිස්තුස් වහන්සේ සභාව මගින් යම් දෙයක් ලැබෙයි යන බලාපොරොත්තුවෙන් ඇයට ප්‍රේම කළේ නැත; නමුත් තමන් වහනසේ විසින් සභාවට යහපත් දේ ඉටුවීමයි උන්වහන්සේ ගේ බලාපොරොත්තුව. ස්වාමි පුරුෂයා තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම කළ යුතුය. භාර්යාව ද තම ස්වාමි පුරුෂයාට ගරු කළ යුතුය. මෙසේ පාවුලු තුමා ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු ප්‍රේම සම්බන්ධතාව විස්තර කරයි.

- ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත්වන ඔවුන් තුළ ස්ත්‍රී පුරුෂ භේදයක් නැත. ඒ දෙදෙනා ක්‍රිස්තුස් වහන්සේ තුළ එක් කෙනෙක් වන්නේ ය. (ගලාති 3 : 28) දෙදෙනා දෙවියන් වහන්සේගේ ස්වරූපයට මවනු ලැබූ අය වෙති. එම නිසා දෙවියන් වහන්සේ ඉදිරියේ ඔවුන් දෙදෙනා සමාන වන්නෝ ය.

- කිතුනු පවුලක ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව ගැන කතා කළ පාවුලුතුමා , අවසානයේ දෙමව්පියන් හා දරුවන් අතර පැවැතිය යුතු සම්බන්ධතාව ගැනද කතා කරයි... " දරුවනි ....." ඇති දැඩි කරන්න. (එපීස 6:1-4) ක්‍රිස්තුස් වහන්සේ සභාවට හිස වන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භර්යාවට හිසය. එය බලය පෙන්වීමේ නායකත්වයක් නොව ප්‍රේම කිරීමේ නායකත්වයක් වේ.

- සභාව දෙවියන් වහන්සේට යටත්ව සිටින්නාසේ භාර්යාවන් ස්වාමි පුරුෂයිනට යටත් විය යුතු ය. මෙම යට වීම බියෙන් නොව ප්‍රේමයෙන් ඇතිවෙන යටහත් පහත් භාවයක් විය යුතු ය. ක්‍රිස්තුස් වහන්සේ සභාවට දැක්වූ ප්‍රේමය නිසා සභාව ශුද්ධවත් කර දෙවියන් වහන්සේට පිළිගැන්වූ සේක. ස්වාමි පුරුෂයාගේ ප්‍රේමය ද තම භාර්යාව පිරිසිදු කර ඇයව වඩා යහපත් පුද්ගලයෙකු කළ යුතු ය.

- ස්වාමි පුරුෂයාගේ ප්‍රේමය භාර්යාව කෙරෙහි සැලකිල්ල දක්වන, ඇයගේ යහපත් ජීවිතය කෙරෙහි සැළකිල්ල දක්වන ප්‍රේමයක් විය යුතු ය. ස්වාමිපුරුෂයා තම ශරීරයට ප්‍රේම කරන්නාක් මෙන් තම භාර්යාවටද ප්‍රේම කළ යුතුයි. මෙය සේවය ලබාගන්නා ආදරයක් නොව සේවය කිරීමේ ආදරයක් විය යුතු ය.

- ස්වාමි පුරුෂයා භාර්යාව කෙරෙහි දක්වන ආදරය කිසිම දිනක වෙන් කරන්නට බැරි ආදරයකි. මෙම ප්‍රේමය නිසා ස්වාමි පුරුෂයා තම දෙමව්පියන් අත්හැර සිය භාර්යාවට ඇලුම් වන්නේය. ඒ දෙදෙනා එක්නෙක් වන්නෝය. දෙදෙනා එකම ශරීරයක් වන්නෝය.

**සහෝදරත්වය සහ එකමුතුකම ( 1 කොරි 8 : 9 13, 13 : 3 8, 2 කොරි 8 : 9)**

- ශු පාවුලු තුමා ගෘහස්ත සභාව නැමැති පවුල තුළ ස්වාමිපුරුෂයා හා භාර්යාව, දෙමව්පියන් හා දරුවන් අතර තිබිය යුතු ආදරය, සම්බන්ධතාව, එකමුතුකම, ගැන කතා කළ පසු දෙවියන් වහන්සේගේ විශාල පවුලවන ශු සභාව තුළ තිබිය යුතු ප්‍රේමය - සහෝදරත්වය , එකමුතුකම ගැන උගන්වයි.

- පාවුලුතුමා තමා දමස්කයට ගිය ගමනේදි ශු සභාව හා ක්‍රිස්තුන් වහන්සේ අතර පවතින ප්‍රේමය අත් දුටුවේය. " සාවුල්, සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන් ද? " මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්ය" එම අත්දැකීමෙන් ඇතිවූ උද්යෝගය, තව තවත් තමා තුළ වර්ධනය වී ඇති බව එතුමා ලියා ඇති ලිපිවල අපට දකින්නට ලැබේ.

- එම කාලයේ විවිධ කිතුනු සභා තුළ, විශේෂයෙන් කොරින්තියේ සභාව තුළ දකින්නට ලැබුණු භේද, අසමගිභාවය, අවස්ථාවක් කර ගනිමින් ශු පාවුලුතුමා ශු සභාව සම්බන්ධව තමාගේ ගැඹුරු අදහස් අපට පැහැදිලිව ඉදිරිපත් කරයි.

- ශුද්ධාත්මයාණන්ගේ වරමින්, ක්‍රිස්තුස් වහන්සේ තුළ විශ්වාසය තබා ජීවත්වන අය ක්‍රිස්තුස් වහන්සේ සමග හා එකිනෙකා සමග එකමුතුව සිටිති. ප්‍රසාද සනාපනය මගින් ක්‍රිස්තුස් වහන්සේ ගේ ගැළවීමේ ක්‍රියාවේ සහභාගිවී උන්වහන්සේ සමග උන්වහන්සේ තුළ ජීවත් වෙති.

- ශු පාවුලු තුමා ශු සභාවේ සාමාජිකයින් අතර පවතින එකමුතුකම, මිනිස් සිරුරක අවයවයන් අතර පවතින එකමුතුකම හා සමානකොට අත් දකියි.

- කිතුනුවන් සැමට එක්ම ආත්මයාණන් වහන්සේ ජීවනය දෙන සේක. ඔවුහු සියලු දෙනා එකම ඉලක්කය කරා ගමන් ගන්නා අය වෙති. ඔවුහු සියලු දෙනා එකම බලාපොරොත්තුව ඇතිව ජීවත්වන අය වෙති. ඔවුන් සැමට එකම දෙවියන් වහන්සේ ය. සැම දෙන එකම විශ්වාසයෙන් හා එකම ප්‍රසාද ස්නාපනයෙන් පංගුකාරයන් වී එකම දෙවියන් වහන්සේව තම එකම පියාණන්වහන්සේ ලෙස පිළිගත් අය වෙති.

එම දෙවියන් වහන්සේ සැමදෙනා තුළින් ම සැමදෙනා මගින් ක්‍රියා කරන සේක. එම නිසා කිතුනුවන් සැමදෙන එකම හදවතකින් ජීවත්වීමෙන් එම එකමුතුකම රැකගත යුතුයි.

- පාවුලුතුමා කිතුනුවන්ව තම සහෝදර සහෝදරියන් කියා අමතා, තමා හා ඔවුන් එකම පියාණන් වහන්සේගේ දරුවන් බව සිහිගන්වයි. එම නිසා කිතුනු සමාජයේ භේද බින්න වෙනස්කම් ඇතිවීම සුදුසු නැතැයි මතක් කරමින් ඔවුන් සහෝදර ප්‍රේමයේ එකමුතුව තුළ ජීවත් විය යුතුයි කියා උගන්වයි.

- යමෙකු කිතුනු සංඝය ට ඇතුළුවන විට එම සංඝයට නියමවූ ජීවිත ක්‍රමය ඔහු ජීවත්විය යුතුයි. " ඔබ ලත් කැඳවීමට .... උත්සාහ කරන්න (එපීස, 4 :23) මෙම එකමුතුකමට , ඒකත්වයකට අත්තිවාරම හා පදනම් වූ හේතුව නම්, ඔවුන් සැමදෙනාටම එකම බලාපොරොත්තුව, එකම ශරීරය , එකම ස්ප්‍රීතුව, එකම දෙවියන් වහන්සේ, එකම ඇදහිල්ල, එකම ප්‍රසාද ස්නාපනය, එකම දෙවි පියාණන් ඇති බැවිනි.

- කිතුනු ජීවිතය මිනිසා හා මිනිසා අතර නව සම්බන්ධතාවක් හඳුන්වා දෙයි. මෙම නව සම්බන්ධතාවයේ ජාති - කුළ - පුරුෂ භේද මැකීයන්නේය. " මන්ද ජුදෙව්වරුන්ද ...... ස්නාපනය ලැබීමු" (1 කොරි 12: 13) ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත්වන අය අතර මෙම වෙනස්කම් නැත. මෙම නව සම්බන්ධතාවය සියලු ලෞකික මට්ටමේ සම්බන්ධතාවන් ඉක්මවා යන එකකි.

- ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ සියල්ලන් ........ භේදයක් නැත" (ගලා 3 : 6 - 28)

- මෙම අදහසම ශු. පාවුලු තුමා පිලමොන්ට ලියන ලද ලිපියේ දකිමු. පාවුලුතුමා වහලෙක්වූ ඔනේසිමස් නම් පුද්ගලයෙකුව " මා හිරගෙදර සිටියා දී මාගේ දරුකමට පත්වූ ඔනේසිමස්" කියා අමතයි (පිලොමොන් 1 : 10 ) තවද පාවුලුතුමා ඔනේසිමස්ව සහෝදරයෙක් මෙන් භාරගන්න කියා පිලෙමොන්ගේ ඉල්ලා සිටීයි. (පිලෙමොන් 1 : 17) අවසාන වශයෙන් පාවුලුතුමා ශරීරයේ අවයවයන් නහරවලින් ඒකාබද්ධ කර තිබෙන නිසා ශරීරය නිරෝගිව ක්‍රියාශීලීවීමට හැකිවන්නාක් මෙන් ශු සභාවේ ක්‍රිස්තුස් වහන්සේ හිසය, අවයවන්වූ අපි උන්වහන්සේ සමග ඒකාබද්ධ වී සිටීමෙන් සභාවද නිසි ආකාරව ක්‍රියාශීලි වේ යයි පවසයි. මෙසේ කිතුනුවන් සියලු දෙනා තම තමාට ලබා ඇති කැඳවීමට අනුව විශ්වාසවන්තව ක්‍රියා කිරීමෙන් සභාව ස්ථිරවෙයි. වර්ධනය වෙයි. මෙසේ පාවුලුතුමා , සභාව තුළ තිබිය යුතු ඒකත්වය එකමුතුකම තහවුරු කර එය ආරක්ෂා කර ගොඩ නැගීමට අපට ඇති වගකීම පැහැදිලි කරයි.

**උත්ථානය හා දෙවන පැමිණීම**

- ශු සභාවේ මුල් අවදියේ, මළාවූ අය නැවත නැගිටීම සම්බන්ධයෙන් පැහැදිළි තේරුමක් නොපැවතුණි. බොහෝ දෙනා ක්‍රිස්තුස් වහන්සේගේ දෙවැනි පැමිණීම කඩිනමින් සිදුවේයයි යන බලාපොරොත්තුවෙන් ඉතා ආශාවෙන් බලා සිටියෝය. එහෙත් ක්‍රිස්තුස්

වහන්සේ ගේ පැමිණීම ප්‍රමාද වූ අතර, කිතුනුවන්ගෙන් සමහරුන්ට මෙලොව ජීවිතයේ අවසන් කාලයද පැමිණියේය. මෙසේ ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමට පෙර මළාවූ අයට කුමක් සිදුවේද යන ප්‍රශ්නයක් ඔවුන් අතර මතුවුණි. (1 තෙස 4 : 14) තවද සමහර කොරින්තිවරු මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන විශ්වාස කළේ නැත. (1කොරි : 15:12)

- තෙසලෝනිකවරුන් හා කොරින්තිවරුන් අතර පැවති මළාවූ අය නැවත නැගිටීම සම්බන්ධ සැකය හෝ ගැටලුව නිරාකරණය කිරීම සඳහා පාවුලුතුමා මේ සම්බන්ධ ඉගැන්වීම ලියා ඇත.

- මළාවූ අය නැවත නැගිටීම, අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම තුළින් අපට ලැබුණු දෙයකි. ක්‍රිස්තුස් වහන්සේ නැවත නැගිට වදාළ බැවින්, මළවුන්ගෙන් නැවත නැගිටීම ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යකි. ක්‍රිස්තුස් වහන්සේගේ මාංශගතවීම පිළිගන්නා අපි, උන් වහන්සේගේ උත්ථානයද පිළිගනිමු. එසේ උන් වහන්සේව අනුගමනය කරන අපටද උන් වහන්සේ මෙන් දිනක එම අත්දැකීම ක්‍රිස්තුස් වහන්සේ දෙන සේක. උත්ථා ..... (1 තෙස 4 : 14) " ක්‍රිස්තුස් වහන්සේ ..... (1කොරි 15 - 13)

- දෙවියන් වහන්සේ මහිමාන්විතව දෙවන වරට පැමිණෙන විට, ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා මළාවූ අය ප්‍රථමයෙන් උත්ථාන කරනු ලබන්නෝය. ක්‍රිස්තුස් වහන්සේ දෙවන වරට පැමිණෙන විට උන්වහන්සේ ප්‍රථමයෙන් තමන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූවාවූ සැම උත්ථාන කරන බව පාවුලුතුමාගේ අදහස වෙයි.

- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අප තබන්නාවූ විශ්වාසයයේ ප්‍රකාශයයි ප්‍රසාද ස්නාපනය ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් දානය කරන්නාවූ ප්‍රසාද ස්නාපනය (1 කොරි 1 : 13) එම ප්‍රසාදස්නාපනය ලබාගන්නාවූ තැනැත්තාව අප ක්‍රිස්තුස් වහන්සේගේ මරණයත් සමග සම්බන්ධ කරයි (රෝම 8 : 3 කොලො 2 : 12) වතුරේ ස්නාපනය ක්‍රිස්තුස් වහන්සේගේ මරණයත්, වළලනු ලැබීමත් සංකේතවත් කරයි. දියෙන් ගොඩවීම ක්‍රිස්තුස් වහන්සේ සමග ඒකාබද්ධවී උත්ථාන වීමට සලකුණක් වෙයි. පාපයට නැසීමත්, ජීවිතය වරප්‍රසාදයක් සේ ලබාගැනීමත් වෙන් කළ නොහැකි එකම ක්‍රියාවකි.

- අපගේ විශ්වාසය, හා ප්‍රසාද ස්නාපනය මාර්ගයෙන් අපි ක්‍රිස්තුස් වහන්සේ හා උන්වහන්සේගේ ජීවිතය මරණය හා උත්ථානය සමග එක්වෙමු. " ජීවත්වන්නේ මම නොව, මා තුළ ක්‍රිස්තුස් වහන්සේ ජීවත්වන සේක." ක්‍රිස්තියානි කාරයෙක්, ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත්වන පුද්ගලයෙක් දිනපතා පාපයට මැරී ක්‍රිස්තුස් වහන්සේගේ නව ජීවනයට උත්ථානවෙයි. ඔහුගේ ජීවිතය , නිතර තමා තුළ නැසීයාම හා උත්ථානවීමය.

- ප්‍රසාද ස්නාපනය මගින් ශුද්ධාත්මයාණන්ව ලබාගත් මිනිසා දේව දරුවෙක් හැටියට තමා රස විඳින, දෙවියන්වහන්සේගේ මහිමය පූර්ණත්වයේ බලාපොරොත්තුවෙන් ජීවත්වෙයි. එම දිනදී ඔහුගේ ආත්මය පමණක් නොව, ඔහුගේ ශරීරයද විනාශ නොවී මරණයෙන් හා පාපයේ වහල් බවින් මිදීමට බලාපොරොත්තුවෙන් පුල පුලා බලා සිටී.

- ශු පාවුලුතුමා මළාවු අය නැවත උත්ථාන වන බව විශ්වාස නොකරන සමහර කොරින්තිවරුන්ට ඉතා කෝපයෙන් බැනවදී " මළවුන්ගෙන් උත්. . . . . සහතිකය වේ (1කොරි 15 :12-20)

- මෙම බලාපොරොත්තුව තම ජීවිතයේ බොහෝ අනතුරුවලට මුහුණදීමට ශක්තිය දුන් බව පාවුලුතුමා ප්‍රකාශ කරයි. එමෙන්ම මතු පැමිණෙන්ට තිබෙන මහිමය ගැන ක්‍රිස්තියානිකාරයන් සැම තුළ බලාපොරොත්තුවක් ඇති කිරීම සඳහා පාවුලුතුමා මෙසේ කියයි (රෝම 8 : 18-25)

- මිනිසා පමණක් නොව සියලු මැවිල්ල පැමිණෙන්නට තිබෙන මහිමය සඳහා බලාපොරොත්තුවෙන් සිටින බව කියයි. මිනිසා කළ පාපය නිසා සාපයට ලක්වූ විශ්වය එයින් නිදහස්වීම, ජරාපත්වීමේ වහල්කමින් මිදීම, බලා සිටි පාවුලු තුමා ජුදෙව්වන් තුළ අන්තිම දවස් ගැන පැවතුණු අදහස් පදනම් කොට අද පවතින ලෝකය ගැනත් පැමිණෙන්නට තිබෙන ලෝකය ගැනත් කතා කරයි... " මේ ජීවිතයේ ... කරමි " (රෝම 8 : 18) එම දවසේදී දෙවියන් වහන්සේ සාතන් හා සියලුම දුෂ්ට ශක්තීන් ජයගෙන සකල ජනයා, මැවිල්ල හා ස්වභාව ධර්මය මුදාගන්නා බව කියයි. මුළු විශ්වයම දෙවියන් වහන්සේගේ එකම රාජ්‍යයක් යටතේ ගෙන එනු ලබයි. සාමය හා සතුට සැමතැන පැතිරී යයි.

**මාංශ උත්ථානය**

- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය හා ක්‍රිස්තුන් වහනසේ කෙරෙහි විශ්වාසය තබා නැසීගිය අයගේ උත්ථානය ගැනත් තහවුරු කරන පාවුලු තුමා, අවසානව නැසීගිය අය කෙබඳු ශරීරයකින් නැවත උත්ථානවේද යන කරුණු ගැනත් අපට උගන්වයි. එයට හේතුව සමහර කොරින්තිවරු මාංශ උත්ථානය නොපිළිගත් බැවිනි. වළලනු ලැබ දිරාපත්වී ගිය ශරීරය නැවත උත්ථානවන්නේ කෙසේදැයි ඔවුහු ප්‍රශ්න කරති. එම නිසා ග්‍රීකවරුන්ගේ අදහස අනුව ඔවුහු දිරාපත් නොවන ආත්මය ගැන අදහස පිළිගත්හ. මාංශ උත්ථානය නොපිළිගත්හ.

- පාවුලුතුමා මළවුන්ගේ මාංශ උත්ථානය තහවුරු කරයි. මළාවු අය වළලනු ලැබූ එම සිරුරෙන්ම අන්‍යරූපවූ ශරීරයකින් උත්ථානවෙති. එනම් වළලනු ලබන්නේ ස්වභාවික ශරීරයකි. උත්ථාන කරනු ලබන්නේ ආධ්‍යාත්මික ශරීරයකි. උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේගේ සිරුරේ ඇති කැළැල් දකින්නට ලැබුණේ ය.

- උත්ථාන කරනු ලබන ශරීරයේ ස්වභාවය විස්තර කිරීමට පාවුලුතුමා වළලනු ලබන බීජයක් උපමා කරගන්නේ ය. අපි තිරිඟු බීජයක් වපුරමු. එය පොළොවේ මැරී තවත් අලුත් පැලයක් හටගනී. දෙවියන් වහන්සේ, තමන් වහන්සේගේ අභිප්‍රාය අනුව එම බීජයට අලුත් ජීවිතයක් දෙන සේක. එකම බීජය නමුත් පිටස්තර පෙනුම වෙනස් වී ඇත. (1 කොරි 15 : 35-38) වළලනු ලබන ශරීරයත්, උත්ථාන කරනු ලබන ශරීරයත්, වපුරනු ලබන බීජයත් එයින් හටගන්නා පැළයත් බාහිර පෙනුමින් වෙනස් වන්නේ ය. එහෙත් සම්බන්ධතාවක් හා වෙනත් පරිවර්තනයක් දකින්නට ලැබෙන්නේය.

- පාවුලුතුමා, නැසීයන මොහොතේ ශරීරයේ ස්වභාවය හා උත්ථානවන විට ශරීරයේ ස්වභාවය සංසන්දනය කර පෙන්වයි.

| **මැරෙන මොහොතේ** | **උත්ථානවන මොහොතේ** |
|---|---|
| දිරන සුලුයි | නොදිරන සුලුයි |
| මැරෙන සුලුයි | අමරණීය සුලුයි |
| දුර්වලයි | බලවත් ශරීරයකි. |
| මිනිස් ස්වභාවයකි | ශුද්ධාත්ම ස්වභාවයය |
| පසෙන් මවනු ලැබු ශරීරයකි | ස්වර්ගයෙන් පැමිණි තැනැන්වහන්සේගේ ශරීරය. |

**දෙවන පැමිණීම**

- ශුද්ධවූ පාවුලු තුමා ක්‍රිස්තුන් වහන්සේගේ දෙවැනි පැමිණීම ගැන උගන්වන දේ අපි පරණ ගිවිසුමේ අවසන් කාලය ගැන කියා ඇති අදහස් පසුබිම් කරගෙන එහි පෙන්වා ඇති " දෙවියන් වහන්සේගේ දවස් " යන පසුබිම මත තේරුම් ගත යුතුයි.

- ජුදෙව්වරුන්ගේ අවසන් කාලය සම්බන්ධ අදහස් අනුව ලෝක ඉතිහාසය පවතින යුගය, පැමිණෙන්නට තිබෙන යුගය කියා කාලවකවානු දෙකට බෙදා ඇත. අපි දැන් පවතින යුගයේ සිටිමු. එහි සාතන්, මරණය පාලනය කරයි. බොහෝ විගසින් මෙම යුගය අවසානයට පැමිණෙයි. මෙසියස් වහන්සේ පැමිණ සාතන්ව ජයගෙන ජනතාව මුදා පැමිණෙන්නට තිබෙන යුගය ආරම්භ කරයි.

- මෙම කාලවකවානු දෙකට අතර " දෙවියන් වහන්සේගේ දවස" පැමිණෙයි. එනම් පවතින යුගයේ අවසාන දිනයේ උදාවෙන නව යුගය ආරම්භයේ මෙය සිදුවෙයි. එය ඉතා බිය ජනක දවසයි. පවතින යුගය අවසන් වී පැමිණෙන්නට තිබෙන යුගය උදාවෙයි. එම දවස දෙවියන් වහන්සේ මෙසියස්තුමා යවා සාතන් සමග අවසන් සටන් පවත්වා ඔහු පරාජය කොට ලෝකය මුදාගන්නා දවසයි. එම දවසේ දී භූමිකම්පා ඇතිවී පෘථිවිය සොලවනු ලබයි.

- පැමිණෙන්නට තිබෙන යුගයේ අපි දෙවියන් වහන්සේගේ යටතේ, දේව රාජ්‍යයේ සාමයෙන් ජීවත්වෙමු. මළාවූ අය උත්ථාන වන්නේ ද පැමිණෙන්නට තිබෙන යුගයේ දී ය.

- දමස්කයට යන මග ශුද්ධ පාවුලු තුමා උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේව මුණ ගැසීම එතුමාගේ ජීවිතයේ විශාල වෙනසක් ඇති කළේ ය. මක්නිසාද ක්‍රිස්තුන් වහන්සේ උත්ථානවූ සේක් නම් සැබවින් ම පැමිණෙන්නට තිබුණු යුගය උදාවී ඇත. මරණය ජයගෙන සාතන්ව පරාජය කර අවසානයි. එම නිසා අවසන් සටන ද නිමාවී ඇත. එය කොතනද? කවදා සිදුවුණේ ද ? එය කල්වාරියේ සිදුවෙන්නට ඇත. එම නිසා ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ විසින් දෙන ලද පොරොන්දුව හා දිවැසිවරුන් විසින් පෙර දැනුම් දෙන ලද ඉශ්‍රායෙල්වරුන් විසින් බලාපොරොත්තු වූ මෙසියා බව තීරණය කරගත් එතුමා සැබැවින්ම, ස්ථිරයෙන්ම එය විශ්වාස කළේ ය.

- ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රථම පැමිණීමට හා දෙවෙනි පැමිණීමට අතර කාලය මෙසියස්ගේ කාලය කියා අපි නම් කරමු. එම නිසා අපි දැන් මෙසියස්ගේ කාලයේ ජීවත්වෙමු මෙය පවතින යුගයටත් පැමිණෙන්නට තිබෙන්නාවූ යුගයටත් අතර කාලයයි. මෙම කාලයේ මෙසියා වන ජේසුස් වහන්සේ තම ශුද්ධාත්ම දේහය වන ශුද්ධවූ සභාව මගින්, ලෝ සැම තැන පැතිර සැඟවී ක්‍රියා කරන දුෂ්ට ශක්තීන් සොයා ඒවා විනාශ කර මුළු ලෝකයම පියවරෙන් පියවර දෙවියන් වහන්සේගේ පාලනය යටතට ගෙන එන සේක.

- ශු සභාවේ සේවාව මගින් සියලු මැවිල්ල ක්‍රිස්තුන් වහන්සේගේ පාලනය යටතට ගෙන්වනු ලැබීමෙන් පසු ක්‍රිස්තුන් වහන්සේ විගස නැවත (දෙවෙනි වතාවට) මහිමාන්විතව පැමිණ ජනතාව විනිශ්චය කර තමන් වහන්සේගේ පාලනය යටතට ගෙනැවිත් මුළු ලෝකයම පාලනය කරන්නට දෙවියන් වහන්සේට භාර දෙන සේක. පැරණි ගිවිසුමේ " දෙවියන් වහන්සේගේ දවස " නමින් හඳුන්වනුයේ එම දවසයි නව ගිවිසුමේ " පරූසියා" නමින් හඳුන්වනු ලබන මෙය දෙවියන් වහන්සේගේ දෙවෙනි පැමිණීමේ දවස කියා තේරුම් ලබයි.

- එම දවස භයානක දවසයි ක්‍රිස්තුන් වහන්සේ විනිශ්චකර වදාරන්නට නැවත පැමිණෙන විට සතුටුදායක විනිශ්චය ලබන්නට මාර්ගය නම් අපි දැන් සිටම උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිම යුතු බව පවසයි.

- පාවුලු තුමා තමාගේ සේවයේ මුල් කාලයේ තෙසලෝනියේ සේවය කළ විට තෙසලෝනිකවරුන්ට මෙය පැහැදිලිකර ඇත. එම අදහස එතුමා විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමු ලිපියේ අපට දකින්නට ලැබෙයි. " මන්ද . . . . ස්වර්ගයේ බැස ( 1 තෙස 4 : 16)

- තෙසලෝනියේ සේවය කළ අවස්ථාව් ක්‍රිස්තුන් වහන්සේගේ දෙවැනි පැමිණීම වහාම සිදුවන බවත්, එම මොහොතේ ජීවතුන් අතර සිටින අය අතරට පාවුලුතුමා තමාවත් ඇතුලත් කරගනියි. (1 තෙස 4 :15) ක්‍රිස්තුන් වහන්සේගේ දෙවැනි පැමිණීම ප්‍රමාද වූ නිසා වසර හතරකට පසු කොරින්තිවරුන්ට ලියන ලද පළමු ලිපිය එම දවසේ දි මරණයෙන් උත්ථානවන අය අතර තමාද එක් කෙනෙක් වන බව කියයි (1 කොරි 6 : 14)

- ක්‍රිස්තුන් වහන්සේ මහිමාන්විතව නැවත පැමිණෙන විට උන්වහන්සේ සිදු කරන ප්‍රථම කාර්යය වන්නේ තමන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිව නැසීගිය අය උත්ථාන කිරීම බව පාවුලුතුමා පවසයි. ඉන්පසු ජීවත්ව සිටින අයවද වලාකුළු මැදින් ඔසවා දෙවියන් වහනසේ හමුවේ ඔවුන්වද හිඳවන සේක.

- උත්ථානයේ දී නැසීගිය අය අන්‍යරූප වෙයි. එනම් ආත්මයාණන්ට අයිති ශරීරයක් ලබයි. මෙතැනදි එකල ජුදෙව්වන් තුළ පැවැති ආකල්ප වර්ධනයක් අපිට දකින්නට ලැබේ.

- තවදුරටත් කොරින්තිවරුන්ට ලියන ලද දෙවෙනි ලිපියේ තවත් වර්ධනයක් දකිමු. මෙහි දේව සේවකයන් අතර උත්ථානවීම සිදුවන බවත්, මිනිසාගේ ඇතුලාන්ත ස්වභාවය අලුත්කරනු ලබනවිට ආත්මයාණන්ට හිමි ශරීරයක් අතිවන බව කියයි. තවද ශරීරය මැරුණු විගස ස්වර්ගයේ නිවස අපට ලැබෙන බවත් කියයි ( 2 කොරි 5 : 2 - 10)

- රෝමවරුන්ට ලියන ලද ලිපියේ පාවුලුතුමා ප්‍රසාද ස්නාපනය මගින් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයේ පංගුකාරයන් වූ අපි ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ ද පංගුකාරයන් වන බව පවසයි. (රෝම 6:3, 8/15-17)

- ක්‍රිස්තුන් වහන්සේ සැබැවින්ම නැවත පැමිණෙන සේක. නමුත් එම දවස හදිසියෙන්, සොරෙක් මෙන්, ප්‍රසූත වේදනාවක් ඇතිවනවාසේ කිසිවෙකු් බලාපොරොත්තු නොවූ වේලාවේ සිදුවෙයි. ක්‍රිස්තුන් වහන්සේ පවා, එම දවස කවදා සිදුවේද කියා කිසිම කෙනෙකු නොදන්නා බවත්, තමන් වහන්සේද ඒ බව නොදන්නා බවත්, පියාණන් වහන්සේ පමණක් දැන සිටින බවත් පවසා ඇත (මාක් 13 :22)

- ඒ දවස දෙවියන් වහන්සේ මුළු මිනිස් සංහතියටම විනිශ්චය වදාරන්නට පැමිණෙන දවස නමුත් කිතුනුවන් ඒ ගැන බිය වීමට හෝ බලාපොරොත්තු නොවූ එම දිනයේ කලබල වීමට හෝ හේතුවක් නොමැත. අඳුරේ ජීවත්වන තැනැත්තෝ නපුරු දේ කරන තැනැත්තෝ සූදානම් නැති අවස්ථාවේ දෙවියන් වහන්සේ පැමිණිවිට උන්වහන්සේට මුහුණ දීමට නොහැකිව කලබලයට පත්වෙති. වරදකරුවන් හැටියට අසුවෙති. නමුත් ආලෝකයේ ජීවත්වන කිතුනුවන්ට එම දවස කවදා සිදුවුනත් ප්‍රශ්නයක් නොමැත. "ක්‍රිස්තුන් වහන්සේ සමඟ . . . . . . විනිශ්වයක් නොමැත " (රෝම 8 :11)

- අවසානව පාවුල තුමා ක්‍රිස්තුන් වහන්සේගේ දෙවෙනි පැමිණීමට පෙර ලෝකය තුළ යම් යම් සළකුණු දකින්නට ලැබේ යැයි පවසයි. ( 2 තෙස 2:3 -12)

- සාතන්ගේ නපුරු බලවේග මෙතෙක් මුලුමනින්ම විනාශ නොවී පවතින නිසා, නපුරු බලවේග මැද කිතුනුවා අවදියෙන් හා සිහි කල්පනාවෙන් ජීවත්විය යුතුය. එසේ ජීවත් වීමෙන් ඔහු ඕනෑම අවස්ථාවක එම දවසට මුහුණ දීමට සුදුස්සෙක් වෙයි.

**ශුද්ධාත්මයාණන්ගේ දීමනා හා ඵල (1 කොරි 12, 14 :1  8)**

- ආත්මය යන වචනය හඳුන්වා දීමට පාවුලු තුමා භාවිත කරන ග්‍රීක වචනය ''නෙයුමා''ය. " පරණ ගිවිසුමේ භාවිත කළ හෙබ්‍රෙව් වචනය " " රූ ආක්"ය. මෙම වචනය ආත්මය යන අර්ථය පමණක් නොව සුළඟ යන අර්ථයද දෙයි. පැරණි ගිවිසුමේ මෙම වචනය මිනිස් ශක්තිය ඉක්මවා යන දේවත්වයේ ශක්තිය, බලය, හැකියාව යන අර්ථය දීමට භාවිත කර ඇත.

- මෙය නව ජීවිතයේ බලවත්, ප්‍රධාන ශක්තියයි. දෙවියන් වහන්සේගේ ජීවිතයේ බලයයි. ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ කාර්ය මගින්, මිනිසා පාපයට ඇදීයන මිනිස් ස්වභාවයෙන් මිදී ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් වසාගෙන ඇත. ඔවුන් තමන් තුළ  ඇති දුබල මිනිස් ශක්තිය ඉක්මවා යන ශක්තිය - බලය ලබා ගෙන ඇත.

- ශුද්ධාත්මයාණන් වහන්සේ වෙතින් අප ලබන්නාවූ විශේෂ වරප්‍රසාදය " දීමනා" යන වචනයෙන් හඳුන්වනු ලබයි, එය " කරිස්මා" යන වචනයෙන් ගත් අර්ථයයි. දෙවියන් වහන්සේ අපට දක්වන උන්වහන්සේගේ අසීමිත ආදරය හා කරුණාව හේතුකොට ගෙන ''අපට නොමිලේ දානය කරන දීමනා " යනුවෙන්ද එය අර්ථය ලබයි.

- දෙවියන් වහන්සේ අපට දානය කරන දීමනා අතරින් උසස්තම දීමනාව උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේය. එම ශුද්ධාත්මයාණන් වහන්සේ අප හදවත් තුළ ලැගුම් ගන්නා සේක. උන්වහන්සේ නොමිලේ දානය කරන දීමනා තුළින් උන්වහන්සේව අපට එළිදරව් කරන සේක.

- මුල් අවදියේ ශුද්ධ සභාව තුළ මෙම දීමනා බොහෝ සේ දකින්නට ලැබුණි. ශු පාවුලුතුමා ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනා ගැන එතුමා ලියූ ලිපි මගින් අපට කතා කරයි. (1 කොරි 12)

- " ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ" කියා ප්‍රකාශ කිරීමට අපට හැකියාව දානය කරන්නේ ද ශුද්ධාත්මයාණන් වහන්සේය. (1 කොරි 12) ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් සිටීමට අපව මෙහෙයවන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය. උන්වහන්සේ අපට දානය කරන පළමු, ප්‍රථම දීමනාව මෙයයි.

- ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ කියා පිළිගන්නා අයට, එම එකම ශුද්ධාත්මයාණන් දානය කරන තවත් බොහෝ දීමනා ඇත. උන්වහන්සේ මෙම දීමනා අපට දානය කිරීමේ පරමාර්ථය කුමක් ද? කියා පාවුලු තුමා විස්තර කරයි. " අන්‍යෝන්‍ය ...... වීමක් ඇත. (1 කොරි : 12-7) මෙම දීමනා අපේ පෞද්ගලික යහපත සඳහා නොව පොදු යහපත හා කිතුනු සංඝයේ,  ශු. සභාවේ යහපත සඳහා දානය කරන බව පෙන්වා දෙයි.

- සියලු දෙනාට සියලුම දීමනා නොලැබේ. ශු සභාව තුළ විවිධ කාර්යයන් ඉටු කරන, විවිධ පුද්ගලයන්ට, විවිධ දීමනා දානය කරනු ලබයි. මේ සියල්ල දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන බැවින් ඒවා උන් වහන්සේගේම අභිප්‍රාය අනුව උන් වහන්සේගේම සේවය සඳහා භාවිත කළ යුතුය.

- ශුද්ධවූ පාවුලුතුමා ප්‍රථමයෙන් ප්‍රඥාවෙන් පිරුණු කථික ශක්තියක් හා දැන ගැන්මෙන් පිරුණු කථික ශක්තියක් ගැන කතා කරයි. මෙම ක්‍රියාවන් දෙක එකක් සේ පෙනුනද, එය දෙවිධියේ ක්‍රියාවන් වේ. " ප්‍රඥාව" දෙවියන් වහන්සේ සමග ඇති සම්බන්ධතාව මත ලැබෙන උන් වහන්සේ සම්බන්ධ ගැඹුරු සත්‍යතාවන් දැනගැනීමේ හැකියාව ය. " දැනීම" එම ප්‍රඥාව අපේ එදිනෙදා ජීවිතයේ ක්‍රියාවේ යෙදවීමට හැකිවීමයි.

- තවද පාවුලු තුමා මෙම ප්‍රඥාව හා දැන ගැන්ම පිළිගන්නා විශ්වාසය ගැන සඳහන් කරයි. ඉහත දි අපි ක්‍රිස්තුන් වහන්සේව දෙවියන් වහන්සේ කියා පිළිගන්නා විශ්වාසය ගැන කතා කළෙමු. එය අපි ඇදහිල්ල නම් ධර්ම ගුණය කියා නම් කරමු. මෙහි අපි ප්‍රඥාව හා දැනගැනීම පිළිගන්නා විශ්වාසය ගැන කතා කරන්නෙමු. පාවුලු තුමා එය හදවතින් පිළිගන්නවා පමණක් නොව එය ක්‍රියාවට නංවන හැකියාව ගැනද, එයට විශ්වාසවන්තව ජීවත්වීම ගැනද සඳහන් කරයි.

- ඉන්පසු පාවුලුතුමා ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාවක් වන සුව කිරීමේ බලය ගැන සඳහන් කරයි. මෙම හැකියාව මුල් කිතුනු සභාව තුළ ව්‍යාප්තව දනින්නට ලැබුණු දීමනාවකි. අද සභාව තුළද නැවත අපි එය දකිමු.

- ඉන්පසු පාවුලු තුමා හාස්කම් කිරීමේ හැකියාව ගැන සඳහන් කරයි. එය යක්ෂයා දුරු කිරීමේ හැකියාවයි. ඒ කාලයේ සියලු ශාරීරික දුර්වලතාවන් යක්ෂයාගේ බලපෑමෙන් ඇතිවූ විපාක හැටියට සලකනු ලැබුවේ ය. එම දුෂ්ට ආත්මයන් දුරු කිරීම ශු සභාවේ සේවාවන් අතර එකක් හැටියට සලකනු ලැබුවේය. අදත් සභාව තුළ අපි මෙම සේවාව දකිමු.

- තවද පාවුලුතුමා දිවැස් වැකි දෙසීමේ හැකියාව ගැනද විවිධ ශබ්දවලින් කතා කිරීමේ හැකියාව ගැනද එම ශබ්දය පහදාදීමේ හැකියාව ගැනද කතා කරයි.

- අද අපි ශුද්ධාත්ම දීමනා - **ප්‍රඥාව තේරුම් ගැනීම දැනගැන්ම දැනුමැතිකම ධෛර්යය, දේව භක්තිය දේව භය** කියා දැන සිටින්නෙමු. කිතුනුවකුගේ ජීවිතයත් ශුද්ධ සභාවේ පොදු සේවාවන් සියල්ලත් මෙම ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාමත රැඳී ඇත.

- සමහර දීමනා දේව සේවාවන් සමග සම්බන්ධ දීමනා වෙති. එම සේවාවන්, අපෝස්තලික සේවාව, දිවස් දෙසීමේ සේවාව, ඉගැන්වීමේ සේවාව, ශුභාරංචිය දේශනා කිරීමේ සේවාව, මඟ පෙන්වීමේ සේවාව, වැනි විවිධ දූත කාර්යයවේ.

- තවත් සමහර වරප්‍රසාද, සේවය කිරීම, දේශනා කිරීම, උනන්දු කිරීම, දයාවේ ක්‍රියාවන් වැනි අවස්ථාවලදී සභාවේ යහපත සඳහා ප්‍රයෝජනවත් වෙයි. ප්‍රඥාවෙන් පිරුණු දේශනය, දැනීමෙන් යුතු දේශනය, විශ්වාසය, සුවකිරීමේ හැකියාව, භාෂ්කම් කිරීමේ හැකියාව,විවිධ ශබ්දවලින් කතා කිරීම, ආත්ම විසඳීමේ හැකියාව වැනි සේවාවන් තුළ මෙම වරප්‍රසාදයේ සහය ලැබෙයි.

- අවසාන වශයෙන් ශුද්ධ පාවුලු තුමා ශුද්ධාත්ම දීමනා අතරින් ඉතා උසස් දීමනාව නැමැති ප්‍රේමය ගැන කතා කරයි. සියලුම වරප්‍රසාදයන්වලට පදනම වනනේ ප්‍රේමයයි. ප්‍රේමය නැතිනම් වෙනත් කිසිම දෙයකින් අනිත් සෑම දෙයින්ම පලක් නැත.

- ප්‍රේමය නැමැති ශුද්ධාත්ම දීමනාවේ ගුණාංග පහළොවක් ගැන පාවුලු තුමා කියයි. ඉවසීම, යහපත කිරීම, ඊර්ෂ්‍යා නොවීම, තමා පාරට්ටු නොකරගැනීම, උඩඟු නොවීම, පහත් දේ නොකිරීම , සවආලය නොබැඳීම, වෛර නොකිරීම, අයහපත නොපැතීම, අයහපතේ දී සතුටු නොවීම , විශ්වාසය බලාපොරොත්තුව, සිත් ධෛර්යය වැනි ගුණාංගයෝය.

- ශු.පාවුලුතුමා තෘෂ්ණාවන්වලට විරුද්ධව ශුද්ධවූ ඵල අපට ඉදිරිපත් කරයි. ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව යහපත්කම, විශ්වාසය, මෘදුකම හා ආත්ම දමනය (ගලා 5 : 22)

- **ප්‍රේමය** නම් වචනය ශු පාවුලුතුමා " අගාපේ" යන ග්‍රීක වචනයෙන් අපට හඳුන්වා දෙයි. කිසිදු ප්‍රතිලාභයක් නොතකා, අන් අය අපට අයහපතම කළත්, පැතුවත්, ඒ අයට යහපත කරන, පතන ගුණාංගයයි. " අගාපේ" යන වචනයෙන් සඳහන් කරන්නේ.

- **ප්‍රීතිය** යනු වචනයේ අර්ථය අනුව මෙලොව වස්තුවලින් ඇතිවන සතුට නොවෙයි. මෙය දෙවියන් වහන්සේගෙන් ලැබෙන වරප්‍රසාදයකි.

- **සාමය** නම්, රණ්ඩු දබර නොමැති නිසා දැනෙන සාමය නොව, දෙවියන් වහන්සේගෙන් ලැබෙන සුරක්ෂිතභාවය තුළින් ලැබෙන සාමයයි.

- **ඉවසීම** යනුවෙන් අපට උගන්වන්නේ, අන් අය අපට අයහපත කළත්, පළිගැනීමට සිතේ ඉඩ නොදී දෙවියන් වහන්සේ අපට සමාව දානය කරන්නාක් මෙන් අපට අයහපත කරන අයට පවා සමාව දීමයි.

- **යහපත්කම** - ක්‍රිස්තුස් වහන්සේ පව්කාරයන් වෙත දැක්වූ දයාව කරුණාව මෙම වචන තුලින් අදහස් කරයි.

- **විශ්වාසවන්තකම** - අන් අයගේ විශ්වාසය දිනා ගැනීම හා අන් අයට විශ්වාසවන්ත වීම.

- **මෘදුකම**- තමාගැන නොසිතා අන් අය කෙරෙහි දක්වන කරුණාව - සැලකිලිවන්ත කම මෙම වචනයෙන් අදහස් කරයි.

- **ආත්ම දමනය** නම් තමාගේ හැඟීම් පාලනය කිරීම හා අන් අය ඉදිරියේ බැගෑපත්වීම වැනි ගුණාංග මින් අදහස් වේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1- ශුද්ධ වූ සභාවේ ආරම්භක අවධිය ගැන කතිකාවතක් ගොඩනගන්න.

පියවර 2 - පාවුලුතුමගේ ධර්මදූත ගමන් ගැන සාකච්ඡා කරන්න

පියවර 3- පාවුලුතුමාගේ මූලික ඉගැන්වීම් ගැන සාකච්ඡා කරන්න.

මූලාශ්‍ර


- New Jerome Biblical Commentary
- ශුද්ධ වූ බයිබලය
- Alan Schreck ගේ " The Compact Histroy of the Catholic Church"
- J.W.C වොන්ඩ්. මුල් යුගයේ ක්‍රිස්තු ශාසන ඉතිහාසය (ක්‍රි.ව. 500 දක්වා), පරිවර්තනයː පිළිමතලාවේ ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය, වැස්ලි මුද්‍රණාලය, කොළඹ 06, 1972.
- මහාචාර්ය G.P.V සෝමරත්න, කිතු සසුනේ සංශෝධනය
- JEDIN Hubert, History of the Church, Vols I-X , Crossroad, New York, 1989.
- LAUX John, M.A,Church History, Tan Books and Publishers, Illionois, 1989.
- Walker williston, A History of the Christian Church, Charles Scribner's Sons, New york . 1985

**නිපුණතාව 6.0** : **යුගයෙන් යුගයට වූ සභා ව්‍යාප්තිය හඳුනා ගනිමින් වර්තමාන සභාවේ උන්නතිය උදෙසා කැපවෙයි.**

**නිපුණතා මට්ටම 6.2** : **සභා පිය යුගය තුළ කිතුනු සභාවේ වර්ධනය හදාරයි**

**කාලච්ඡේද** : **කාලච්ඡෙද 20**

**ඉගෙනුම් ඵල** :

- ප්‍රධාන මන්ත්‍රණ සභා පිළිබඳව හදාරයි.
- සභා පියවරුන් පිළිබඳව අවබෝධයක් ලබා ගනියි.
- සභා පිය දිවිය තම දිවියට ආදර්ශයක් කර ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**6.2.1 ප්‍රධාන මන්ත්‍රණ සභා**

රෝම අධිරාජ්‍යය තුළ සියවස් දෙක තුනක පමණ කාලයක් කිතුනුවන්ට එරෙහිව පැවැති දරුණු පීඩන කාලය කොන්ස්තන්තීනු අධිරාජයාගේ පාලනය හා මිලාන් ආඥාව සමඟ ක්‍රි. ව. 112-113 පමණ කාලයේ දී අවසන් විය. මෙම පීඩන කාලය තුළ විවිධ අධිරාජවරු කිතුනුවන් මර්දනය කිරිමෙහි ලා ඉතා දැඩි ක්‍රියා මාර්ග ගත්හ. සභා පියවරුන් පෙන්වා දෙන පරිදි මෙලෙස කිතුනු සභාව මර්දනය කිරීමට ගත් පියවර එහි වර්ධනයට හේතුවන අයුරින් දෙවියන් වහන්සේ සැලසුම් කළ සේක. ටර්ටුලියන් නැමැති සභා පියතුමා තම කෘතියක සඳහන් කරන පරිදි "ප්‍රාණපරිත්‍යාගින්ගේ රුධිරය කිතු දහමේ බීජය" බවට පත්විය.

කිතුනු සභාවට එල්ල වූ මෙවැනි බාහිර පීඩා හා බලපෑම්වලට වඩා දරුණු පීඩා හා බලපෑම් කිතුනු සභාව තුළින්ම හට ගැනීම සභා මාතාව ඉතා දැඩි අපහසුතාවයකට පත් කලේය. එනම් ධර්මය හා විනය නීති රීති පිළිබඳව ඇතිවු නොයෙක් ගැටලු හා මතභේදය. විශේෂයෙන්ම ධර්මය පිළිබඳව බිහි වූ වේද භේදික මත නැතහොත් දුර්මත සභාව තුළ අවුල් වියවුල් ඇති කිරීමට මුල් විය. එම අර්බුද සභාවේ ඒකත්වයට පමණක් නොව අධිරාජ්‍යයේ ඒකත්වයට හා සාමයට තර්ජනයක් විය.

එවැනි අවස්ථාවල දී කිතුනු සභාවේ වේද සත්‍යතාවන් පහදා දීමටත් වේද භේදික මතවල ඇති වැරදිබව පෙන්වා දීමටත් ඒවා හෙළා දැකීමටත් මන්ත්‍රණ සභා කැඳවීමට සිදුවිය. මෙම මන්ත්‍රණ සභා හැඳින්වූයේ ඒවා පැවැත්වූ ස්ථානයේ නමින්ය. උදාහරණයක් ලෙස 'නිසියාහී මන්ත්‍රණ සභාව' පෙන්වාදිය හැකිය. පොදුවේ ගත් කළ මන්ත්‍රණ සභාවක් කැඳවීම, මෙහෙයවීම හා අනුමත කිරීම ශුද්ධෝත්තම පියතුමාගේ මූලික කාර්යභාරය වේ. ශුද්ධෝත්තම පියතුමා හෝ එතුමාගේ නියෝජිතයෙකු හෝ මෙම මන්ත්‍රණ සභා සඳහා අනිවාර්යයෙන්ම සහභාගි විය. මේ අනුව ශුද්ධෝත්තම පියතුමාගේ

අනුමැතිය රහිතව ආරම්භවූ කිසිම මන්ත්‍රණ සභාවක් නිල වශයෙන් වලංගු නොවේ. මේවා 'සොරුන්ගේ මන්ත්‍රණ සභා" ලෙස හැඳින්වේ. එනමුත් සභාවේ මුල් යුගවල රෝම අධිරාජ්‍ය පාලනය හේතුකොට ගෙන මන්ත්‍රණ සභා පැවැත්වීමේදී වුවද වැඩි බලතලයක් එවකට සිටි අධිරාජයා සතුවූ අවස්ථා ද දැකිය හැකිය. උදාහරණයක් ලෙස 'නිසියාහී මන්ත්‍රණ සභාව" එවකට සිටි කොන්ස්තන්තීනු අධිරාජයා විසින් කැඳවනු ලැබීම පෙන්වාදිය හැකිය.

සභාවේ සියලු මන්ත්‍රණ සභාවලට පූර්වාදර්ශයක් වූයේ ක්‍රි.ව. 50 - 51 දී අපොස්තුලුවරුන් විසින් ජෙරුසලමෙහි පවත්වන ලද මන්ත්‍රණ සභාව ය (ක්‍රියා 15 : 1 - 11)ඉතිහාසය මෙය හඳුන්වන්නේ අපොස්තුලුවරුන්ගේ රැස්වීමක් ලෙසය. සභාවට ඇතුළුවන අන්‍ය ජාතිකයන් චර්මඡේදනය කළ යුතුද යන ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා එය පවත්වන ලදී.

ඉන් පසුව 4 වන සියවස තෙක් සභාව ව්‍යාප්ත වූ විවිධ ප්‍රදේශවල පැන නැගුණ ප්‍රාදේශීය ගැටලු එම ප්‍රදේශවල සභා නායකයන් එක්වී සාකච්ඡා කර නිරාකරණය කරගැනීම සඳහා ප්‍රාදේශීය වශයෙන් මන්ත්‍රණ සභා කිපයක්ම නොයෙක් ප්‍රදේශවල පවත්වා ඇත. ඒවා ප්‍රාදේශීය රාජගුරු සංසද හෙවත් *(Synods)* ලෙස හැඳින්වේ.

හතරවන සියවන වනවිට සභාව තුළ බිහිවූ ප්‍රධාන වේද භේද කිහිපයක් නිසා වසර 150 ක් පමණ කාලයක් තුළ දී මන්ත්‍රණ සභා හතරක් පැවැත්වීමට සිදුවිය. මේ මන්ත්‍රණ සභා හතරම සභාවේ මුල් යුගයට අයිති වේ. මේවා ජගත් මන්ත්‍රණ සභා ලෙස ද හැඳින්වේ. එයට හේතුව එවකට සභාවේ සිටි සියලුම පෙදෙස්වලින් රාජගුරුප්‍රසාදිවරුන් මෙවාට සහභාගිවීම සඳහා කැඳවනු ලැබීමයි. තවද ඒවා ශුද්ධෝත්තම පියතුමාගේ අනුදැනුම ඇතිව පැවැත්වූ අතර එම තීරණ ස්ථිර කිරීමට ශුද්ධෝත්තම පියතුමාගේ අනුමැතිය ලබා ගත්තේ ය.

මේ මුල් ජගත් මන්ත්‍රණ සභා කැඳවීමේ දී අධිරාජයාගේ ද මැදිහත්වීම පැහැදිලිව දැකිය හැකිය. දසත විහිදී ගිය රෝම අධිරාජ්‍යයේ එක්සත්භාවය ආරක්ෂා කර ගැනීමත්, සභාවේ ලෞකික පාලකයා වශයෙන් සභාව රැකගැනීමත් යන පරමාර්ථ ඇතිව අධිරාජයා මෙම මන්ත්‍රණ සභා රැස්කිරීම සඳහා පෙරමුණ ගෙන ක්‍රියා කළේය. තවද මේවා මඟින් ඔහු දේශපාලන ප්‍රයෝජන ලබාගැනීමට උත්සාහ කළ බව බොහෝ දෙනාගේ මතයයි.

මුල් යුගයේ මන්ත්‍රණ සභා හතරම පවත්වන ලද්දේ අධිරාජ්‍යයේ පෙරදිග ප්‍රදේශයට අයිති නගරවලය. ආරම්භක යුගයේ දී සභාව වැඩි වශයෙන් මෙම ප්‍රදේශවල ව්‍යාප්ත වීමත් අධිරාජයා ඔහුගේ නව අගනුවර වන කොන්ස්තන්තිනෝපලයේ වාසය කිරීමට යෑමත් එම මන්ත්‍රණ සභා පෙරදිග නගරවල පැවැත්වීමට ප්‍රධාන හේතු වශයෙන් පෙන්වා දිය හැකිය.

ක්‍රි. ව 325-451 දක්වා ජගත් මන්ත්‍රණ සභා සතරක් පවත්වා ඇත. ඒවා හඳුන්වා ඇත්තේ එම මන්ත්‍රණ සභා පවත්වන ලද නගරවල නම් වලින් ය. පසු කාලයක පවත්වන ලද ජගත් මන්ත්‍රණ සභා සතර මෙසේ ය.

1. නයිසීන මන්ත්‍රණ සභාව (ක්‍රි.ව 325)
2. කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව (ක්‍රි. ව 381)
3. එපීසීයේ මන්ත්‍රණ සභාව (ක්‍රි. ව 431)
4. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව (ක්‍රි. ව. 451)

මෙම මන්ත්‍රණ සභා පැවැත්වීමට තුඩු දුන් කරුණු සහ ඒවා පැවැත්වූ පසුබිම පිළිබඳව වැදගත් කරුණු කිහිපයක් විමසා බැලීම යෝග්‍ය වේ. මෙලෙස කරුණු විමසීමේ දී මන්ත්‍රණ සභා පැවැත්වීමට තුඩු දුන් හේතු කිහිපයකි.

1. කිතුණු දහම හා විශ්වාසය පිළිබඳ සභා ඉගැන්වීම නිර්වචනය කිරීම.
2. සභා ඉගැන්වීම් කැපවීමෙන් ප්‍රකාශ කිරීම හා ඉගැන්වීම
3. සභා ඉගැන්වීම් කාලෝචිතව හා නිවැරදි ආකාරයෙන් ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත සඳහන් ජගත් මන්ත්‍රණ සභා ක්‍රිස්තුවේදී මන්ත්‍රණ සභා ලෙස ද හඳුන්වනු ලැබේ. ඒවා එලෙස හඳුන්වන්නේ ක්‍රිස්තුවේදී මතභේද සමතයකට පත් කිරීම ඒවායේ මූලික අරමුණවීමයි. නැතහොත් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දුර්මතවාදීන් ඉදිරිපත් කළ සභාවේ ඉගැන්විම්වලට පටහැණි මත හා ඉගැන්වීම් අධ්‍යයනය කිරීම, ප්‍රතික්ෂේප කිරීම හා සභාවේ සම්මත නිවැරදි දහම පෙන්වාදීම මෙම මුල්ම මන්ත්‍රණ සභාවල මූලික කාර්යය විය.

**නයිසීන මන්ත්‍රණ සභාව (Council of Nicea) ක්‍රි.ව 325**

**පසුබිම**

මෙම මන්ත්‍රණ සභාව පැවැත්වීමට මූලික පසුබිම වූයේ ඒරියන් වාදය යි. (Arianism) මෙහි නිර්මාතෘවරයා වන ඒරියස් (Arius) නැමැති කිතුනු පූජකවරයා ක්‍රි. ව 310 දී පමණ ඇලැක්සැන්ඩ්‍රියාවේ ජීවත් වූවෙකි. ඒරියස් සභාවේ ප්‍රධාන ඉගැන්වීම්වලට විරුද්ධව තර්ක කළේ ය. ඔහුගේ ප්‍රධාන තර්කය වූයේ ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ තවත් මැවිල්ලක් බවයි. එහෙයින් ක්‍රිස්තුන් වහන්සේ ට සැබෑ දිව්‍යමය ස්වරූපයක් නොමැති බවත් පියාණන් වහන්සේගේ දේවත්වය වෙන අයෙකුට පැවරිය නොහැකි බවත් ඔහු පැවසුවේය.

ඒරියස් මෙම අදහස් තවදුරටත් ගෙන යමින් පුත්‍රයාණන් මැවීමේ ප්‍රථමයා බවත් එබැවින් ඔහු දේව දූතයන්ට වඩා උසස් බවත් පැවසීය. කෙසේ වෙතත් පුත්‍රයාණන් දෙව්පියාණන්ට වඩා පහත් බව තරයේ කියා සිටියේය (Subordinationism) ක්‍රිස්තුන්

වහන්සේ සර්ව බලධාරී දෙවියන් වහන්සේට සමාන නොවන බව ඒරියන් තර්කවාදීන්ගේ මතය විය. දුක් විඳීම හා මරණය තුළ වේදනා විඳින මිදුම්කරු ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ විය නොහැකි බව ඒරියස්ගේ තීරණයයි. (Docetism) ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් හා මිනිසා අතර සම්බන්ධතාව ඇති කරන මැදිහත්කරුවකු පමණක් වන බව ඔහුගේ මතයයි. ඔහු ශුද්ධවූ ත්‍රිත්වය පිළිබඳවත් වැරදි මත කිහිපයක් ඉගැන් වූයේය. ඔහුගේ ධර්ම විරෝධි මතවලට අනුව ශු. ත්‍රිත්වය බුද්ධිමය සංකල්පයක් පමණි. ඇත්තේ එකම සදාතනික දෙවි කෙනෙකි. එනම් දෙවි පියාණන් වහන්සේ පමණි. ජේසුස් වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා වුවත් එතුමා මවන ලද කෙනෙකි. මැවිල්ලේ විශිෂ්ට මැවිල්ල එතුමාණන් වුවත් එතුමන් තුළ දේවත්වයක් නො මැත. එබැවින් එතුමාට දේව පුත්‍රයා යැයි කිව නො හැකි ය. ශුද්ධාත්මයාණන් ද දෙවි කෙනෙක් නොවේ. එතුමන් ද මවන ලද්දකි.

ඒරියස් මේ මත තැන් තැන්වල දේශනා කළා මිස ඒවා ලේඛන ගත කළේ නැත. එනමුත් පසු කලෙක මේවා ලේඛන ගත කළ අතර ඒවා වලින් ද ඉතිරි වී තිබෙන්නේ තලෙයියා (Thaleia) නමින් හඳුන්වන ගීත කිහිපයක කොටස් පමණය. මෙම ගීතයෙන් කියවෙන්නේ පුත්‍රයාණන්ගේ ධර්මිෂ්ඨභාවය නිසා දේව පුත්‍රයා නමැති නාමය ඔහුට දුන් බවත් එතුමා ත්‍රිත්වයේ දෙවැනි තැනැන් වහන්සේ වුවත් පියාණන් වහන්සේ මෙන් සදාකාලික නො වන බවයි..

මෙවැනි මත කිතුනු වේද සත්‍යතාවන් විකෘති කිරීමක් විය. ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ප්‍රතික්ෂේප කිරීම නිසා උන්වහන්සේ ලොවට උරුමකර දුන් විමුක්තිය අර්ථ විරහිත කිරීමක් විය. ආරම්භයේ දී ම ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ධූරය දැරූ ශු. සිරිල් රදගුරු තුමා විසින් ඔහුගේ ඉගැන්වීම් වේදභේදික මත බව පෙන්වා දෙන ලදී. එලෙසම ඒවා ප්‍රතික්ෂේප කරන ලදී. එහෙත් පසුව නිකෝමේඩියාවේ (Nicomedia) රදගුරුව සිටි එව්සේබියස් තුමා විසින් අනුගාමිකයන් ගේ සහාය ඇතිව මේ වේදභේදික මත අධිරාජ්‍යයේ පෙරදිග ප්‍රදේශවල ව්‍යාප්ත කෙරිණි.

**මන්ත්‍රණ සභාව පැවැත්වීම.**

මේ පිළිබඳව ජනයා අතර මතභේද ඇති විය. අධිරාජ්‍යයේ එක්සත්කම හා සාමය ආරක්ෂා කරගැනීම අරමුණු කොට මහා මන්ත්‍රණ සභාවක් කැඳවීමට කොන්ස්තන්තීනු අධිරාජයා ඉදිරිපත් විය. එවකට පාප් ධූරය දැරූ සිල්වෙස්ටර් පාප්තුමාගේ අනුමැතිය ඇතිව ක්‍රි.ව 325 නිසියාවේ දී මෙම ජගත් මන්ත්‍රණ සභාව පවත්වන ලදී. අධිරාජ්‍යයේ නොයෙක් ප්‍රදේශවලින් පැමිණි රාජගුරු ප්‍රසාදීවරු 300 ක පමණ සංඛ්‍යාවක් මෙයට සහභාගි වූහ.

නිකොමිඩියාවේ රදගුරු වූ එව්සේබියස් තුමා විසින් ඉදිරිපත් කරන ලද එරියස්ගේ මත එකොළහම මන්ත්‍රණ සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදි. එම මත නිවැරදි කරමින්

සභාවේ වේද සත්‍යතාවන් පසු කාලයක විශ්වාස ලක්ෂණයකට අඩංගු කර ඉදිරිපත් කරන ලද්දේ මෙසේය. "පිතා පුත්‍රයා, ශුද්ධාත්මයාණන් කෙරෙහි විශ්වාස කරමු. දෙවියන්ගෙන් ඒක ජනිත පුත්‍රයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන්ගේ දෙවියෝ ද, සැබෑ දෙවියන් ද බවත්, ජනිතවූ නමුත් මවනු නො ලැබ පියාණන් සමග එකම භවත්වය (of the Same Substance) ඇතිව වැඩ සිටන බවත් විශ්වාස කරමු."

මේ කරුණු කිතුනු දේව ධර්මයේ ඉගැන්වීම් අනුව සකස් කිරීමට විශේෂයෙන්ම අනුහස ලැබුවේ ඇලැක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමන්ගේ සහායක වූ ශු. ඇතනාසියුස් තුමාගේ අදහස් අනුව ය. ක්‍රිස්තුන් වහන්සේගේ දේව ස්වභාවය පිළිබඳව එතුමා ඉදිරිපත් කළ "**Homo - ousios**' හෙවත් පියාණන් සමග එකම භවත්වය ඇතිව යන සංකල්පය සභාවේ වේද සත්‍යතාවක් බවට පත්විය.

**මෙම මන්ත්‍රණ සභාවේ දි විනය නීති රීති පිළිබඳව ගත් තීරණ**

1. ඒරියස් හා ඔහුගේ ප්‍රධාන අනුගාමිකයින් සභාවෙන් නෙරපා දැමීම.
2. පශ්චාත්පිකවූ ප්‍රසිද්ධ පව්කරුවන් සභාව නැවත පිළිගැනීම.
3. වේද භේදික අදහස් දැරූ අය නැවත සභාවට ඇතුළත් කර ගැනිමේ දී නැවත ප්‍රසාද ස්නාපනය දීම අනවශ්‍ය බව.
4. පාස්කු මංගල්‍ය පිළිබඳව නියමිත දිනයක් ස්ථිර කිරීම.
5. පූජකවරුන් සඳහා විනය නීති පැනවීම.
6. ජනවන්දනාව, දිව්‍ය පූජාව පැවැත්වීම පිළිබඳව අවශ්‍ය නීති රීති මාලාවක් ඉදිරිපත් කිරීම.
7. රෝමය, අන්තියෝකිය, ඇලැක්සැන්ඩ්‍රියාව යන නගර තුනේ රදගුරුවරුන්ට විශේෂ පාලන බලයක් පැවරීම.
8. ජෙරුසලමේ රදගුරුතුමන්ට විශේෂ ගෞරවයක් ලබාදීම.

ඉහත සඳහන් කරුණු සභා සම්මත නීති බවට පත්විය. කෙසේ වෙතත් ඒරියන් වේද භේදය මින් නිමාවට පත් නො වීය. ඒරියස්ට සහය දුන් ඔහුගේ අනුගාමිකයෝ සභා භේදයක් ඇති කරමින් අධිරාජ්‍යය තුළ නොයෙක් ආරවුල් ඇති කළහ. එම නිසා මෙම වේද භේද මුල් කරගෙන නැවත වරක් මන්ත්‍රණ සභාවක් ක්‍රි. ව. 381 දි පැවැත්වුණි.

**කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව (*Council of Constantinople*) ක්‍රි. ව. 381**

**පසුබිම**

ඒරියන් වේද භේදය නිසියාවේ මන්ත්‍රණ සභාවෙන් පසුව, ඉහත සඳහන් කළ පරිදි අවසන් වූයේ නැත. නිකෝමේඩියාවේ රදගුරුතුමන් වූ එව්සේබියස් හා ඔහුගේ අනුගාමිකයන් විසින් මෙය සුළු ආසියාවේ නොයෙක් ප්‍රදේශවල පතුරවන ලදී. අධිරාජයා තමන්ගේ පක්ෂයට නම්මා ගෙන සභාවට පක්ෂපාත වූ රදගුරුතුමන්ලා නෙරපා දමා ඒරියන් මත දරන අය ඒ සඳහා පත්කර ගැනීමට මොවුහු සමත් වූහ.

ඇලැක්සැන්ඩ්‍රියාවේ ශු. ඇතනාසියුස් තුමා ඒරියන්වාදින්ට එරෙහිව සටන් කළ පුරෝගාමියා විය. සභාවේ ධර්මය ආරක්ෂා කර ගැනීමට වෙහෙස දැරූ එතුමන්ට නොයෙක් දුක් කරදර විඳීමට සිදුවිය.

මෙහිදී ඒරියන් වේද භේදය හා සමග පැන නැගුණු තවත් දුර්මතයක් නම් අප්‍රධානතා වාදයයි. (*Subordinationism*) ත්‍රිත්වයේ වැඩ වසන දිව්‍යමය වචනය පුත්‍රයාණන් නිසා පියාණන් වන දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ සමාන තත්ත්වයක නො සිටින බව මෙයින් අදහස් කෙරේ. එසේම ශුද්ධාත්මයාණන් මේ දෙදෙනා වහන්සේටම වඩා පහත් බවද ප්‍රකාශ කරයි. (*Eunomianism and Macedonianism*) මේ දෙදෙනා වහන්සේ ප්‍රධාන කමින් දෙවන හා තුන්වන තැන ගන්නෝය, යන අදහස ඉදිරිපත් කරයි. ත්‍රිත්වයේ එක් වහන්සේ නමක් මේ ආකාරයට පහළ මට්ටමකට දැමීම වේද භේදී දුර්මතයක් ලෙස සැලකේ. ඒරියන්වාදී දර්ශනයකට සමානකම් කියන මෙය ක්‍රි.ව. 325 දි නිසියා මන්ත්‍රණ සභාවේදී ප්‍රතික්ෂේප කරන ලදී.

**මන්ත්‍රණ සභාව පැවැත්වීම**

මෙම වේද භේදය නිසා සභාවේ ඒකත්වයට ද අධිරාජ්‍යයේ එක්සත් භාවයට හා සාමයට ද එය බාධාවක් විය. මෙය අවබෝධ කරගත් තියෝඩෝසියස් (***Theodoisius***) අධිරාජයා ක්‍රි.ව. 381 දි කොන්ස්තන්තිනෝපල් නගරයේ දි 2 වන මන්ත්‍රණ සභාව කැඳවීමට පාප් තුමාගෙන් අවසරය ලබා ගන්නා ලදී. පෙරදිග ප්‍රදේශවලින් රදගුරුවරුන් 180 දෙනෙක් පමණ මෙයට සහභාගි වී ඇත. පාප්තුමාගේ අනුමැතිය ඇතිව පැවැත්වුණ මේ මන්ත්‍රණ සභාවේ දී නිසියානු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කළ ධර්මය නැවත ස්ථිර කරන ලදී. විශේෂයෙන්ම එහිදි සම්මත වූ පියාණන් සමග ක්‍රිස්තුන් වහන්සේගේ එකම භවත්වය යන දේව ධාර්මික සංකල්පය අනිවාර්යයේම ස්ථිර විය. දැනට දිව්‍ය පූජාවේ දි උච්චාරණය කරනු ලබන නිසියානු විශ්වාස ලක්ෂණය (*Nicean Creed*) භාවිත කිරීමට නියෝග කරන ලද්දේ මේ මන්ත්‍රණ සභාවේ දී ය.

සභාවේ විනය හා පාලනය පිළිබඳව මෙහි දී ගත් තීරණයක් පසුකාලයක අර්බුදයකට මඟ පැදූ කරුණක් විය. එනම් "කොන්ස්තන්තිනෝපලයේ රදගුරු තුමන්ගේ තනතුර රෝමයේ රදගුරු තුමන්ගේ තනතුරට පමණක් දෙවැනි තැන ගැනීම". යන ප්‍රකාශනය මෙවැනි තීරණයක් ගැනීමට හැකිවුයේ අපරදිග (රෝම) ප්‍රදේශවල රදගුරුතුමන්ලා මෙම මන්ත්‍රණ සභාවට සහභාගි නොවූ නිසා බව සඳහන් වේ. එනිසා හයවැනි සියවස තෙක් මෙය ජගත් මන්ත්‍රණ සභාවක් ලෙස අපරදිග ප්‍රදේශවලින් පිළිගැනීම ප්‍රමාද විය.

**ඒපිසයේ මන්ත්‍රණ සභාව (*Council of Ephesus*) ක්‍රි. ව 431**

**පසුබිම**

කොන්ස්තනිනෝපලයේ රදගුරු ධූරය දැරූ නෙස්ටෝරියස් විසින් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ගැනත්, උන් වහන්සේ තුළ මනුෂයත්වය හා දේවත්වය සම්බන්ධ වීම ගැනත්, වැරදි මත ඉදිරිපත් කළේය. ඒ අනුව ඔහුගේ මතය වූයේ ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව ස්වභාවයත් මනුෂ්‍ය ස්වභාවයත් වෙන් වෙන් වශයෙන් පැවති බවය. ඒ අනුව උන් වහන්සේ පුද්ගලයින් දෙදෙනෙකි. නැතහොත් දේව පෞරුෂය හා මිනිස් පෞරුෂය වශයෙන් පුද්ගලයන් දෙදෙනෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ වැඩ සිටින බව ඔහු ප්‍රකාශ කළේය. මරිය තුමියගේ කුසයෙහි පිළිසිඳ ගත්තේ මනුෂ්‍ය ස්වභාවයෙන් යුක්ත වූ ක්‍රිස්තුන් වහන්සේ පමණකි. එබැවින් මරිය තුමී දෙවි මව නොව *(Non-Theotokos)* ජේසුස් ක්‍රිස්තුස් යන මිනිසාගේ මව *(Christo-tokos)* පමණක් බවත් දිව්‍ය සත්ප්‍රසාදය තුළින් අප ලබන්නේ ජේසුස් යන මිනිසාව පමණක් බවත් ඔහුගේ මතය විය. දෙවියන් වහන්සේට සම්බන්ධව ඇත්තේ ජේසුසි වහන්සේගේ දේව ස්වභාවය පමණක් ය යන මතය නෙස්ටෝරියස් ඉදිරිපත් කළේ ය.

දුර්මතධාරියකු වශයෙන්, සළකා ඒපීසියේ පැවැත්වූ සම්මේලනයේ දී හෙළා දකින ලද නෙස්ටෝරියස් සිරියාවේ ජෙර්මානිෂියා *(Germanicia)* නම් ගමේ ක්‍රි.ව 381 දී උපත ලද්දෙකි. ඔහු දේව ධර්මය ඉගෙන ගත්තේ මොප්සුවෙස්ටියාවේ තෙයොදෝර් *(Theodore of Mopsuestia)* යටතේ ය . නෙස්ටෝරියස් ක්‍රි. ව 428 දී කොන්ස්තනිනෝපල් නුවර රදගුරු පදවියට පත්විය. පදවිය ලත් විගස ඒරියන් වාදය හා නොවාසියන් වාදයට *(Noatianism)* එරෙහිව සටනක් දියත් කළේය.

එලෙසම ඔහු මරියාවන් *(THEO - TOKOS)* හෙවත් දෙවිඳුන් දරා සිටිය තැනැත්තී යැයි සභාවේ සමහරුන් දැක්වූ ප්‍රකාශයට විරුද්ධ විය. නෙස්ටෝරියස් මෙම මතය ඉදිරිපත් කිරීම කිසා ක්‍රි.ව. 431 දී එපීසයේ පැවැත්වූ මන්ත්‍රණ සභාවේ දී දුර්මතධාරියකු වශයෙන් හෙළා දැකීමට ලක්විය. ක්‍රි.ව. 451 දි ඉහළ මිසරයේ දි මිය ගියබව ඉතිහාසයේ සඳහන් වේ.

**මන්ත්‍රණ සභාව පැවැත්වීම**

ඇලැක්සැන්ඩ්‍රියාවේ රදගුරු ධූරය දැරූ ශු. සිරිල්තුමා වේද භේදය ව්‍යාපත්වීම දැනගත් විට ඒවා ගැඹුරු ලෙස අධ්‍යයනය කර සභාවේ නිවැරදි මත පෙන්වා දුන් ලේඛනයක් සෙලෙස්ටින් පාප්තුමන් *(Celestine)* වෙත යවන ලදී. පාප්තුමා එය විමර්ශනය කිරීමෙන් පසුව සිරිල් තුමා සභාවේ ධර්මය නිවැරදිව පහදා දී ඇති බවත්, නෙස්ටෝරියස් සභාවේ පිළිගත් නිවැරදි මත දින දහයක් තුළ දී පිළිගත යුතු බවත් එසේ නොකළ හොත් රදගුරු ධූරයෙන් ඔහුව නෙරපා දමන බවත් දන්වන ලදී. එවිට නෙස්ටෝරියස් පාප්තුමන්ගේ තීරණයට එකඟ නොවී අධිරාජයාගේ පිහිට පැතීය. එවිට දෙවන තියෝඩෝසියස් අධිරාජයා මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා මන්ත්‍රණ සභාවක්

කැඳවීම ගැන පාප්තුමන්ට දන්වන ලදී. ඒ අනුව ක්‍රි.ව. 431 දී ඒපිසියේ මන්ත්‍රණ සභාව පැවැත්විණි.

**මෙම මන්ත්‍රණ සභාවේ දී ගත් තීරණ**

මෙම මන්ත්‍රණ සභාවේ දී ප්‍රධාන අවධානය යොමු වූයේ ජේසුස් වහන්සේගේ පුද්ගලභාවය හෝ පෞරුෂය පිළිබඳව යි. මෙකී කාරණාව පිළිබඳ නෙස්ටෝරියස්ගේ මතය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කරන ලදී. මේ අනුව මෙම මන්ත්‍රණ සභාවේ දී ගත් මූලික තීරණ හතරකි.

1. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක පෞරුෂයකි. එනම් එතුමාණෝ එක පුද්ගලයෙක් වන්නාහ.
2. එතුමන් තුළ දේව ස්වභාවයත් මනුෂ්‍ය ස්වභාවයත් ඒකාබද්ධව පවතී.
3. එතුමන් සැබෑ දේව පුත්‍රයා වන අතර සැබෑ මනුෂ්‍ය පුත්‍රයා ද වේ.
4. මරිය තුමියගේ කුසයෙහි මනුකය ගෙන පිළිසිඳ ගත්තේ දේව පුත්‍රයා වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නිසා එතුමියට දෙව් මව *(Theo-tokos)* යැයි කිව හැකි වේ.

පොදු ජනයා විසින් මෙම තීරණ ඉතා ජයෝත්සවයෙන් යුතුව පිළිගන්නා ලදී. මෙලෙස මරිය තුමිය දෙව් මව ලෙස මුළු සභාවම පිළිගැනීම දේවමාතා භක්තියේ වර්ධනයට ඉමහත් රුකුලක් විය. මරිය දහමට(*Mariology*) මෙම මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් තුළින් ප්‍රබල පන්නරයක් ලැබුණි.

එපිසියේ මන්ත්‍රණ සභාවේ තීරණ නො පිළිගත් නෙස්ටෝරියස්ව සභාවෙන් නෙරපන ලදී. අධිරාජ්‍යයෙන් ද පිටුවහල් කරන ලද ඔහු තම නෙස්ටෝරියානු ක්‍රිස්තු ධර්මය පර්සියාව තුළ ප්‍රචාරය කළේ ය.

**කැල්සිඩෝන් මන්ත්‍රණ සභාව** (*Council of Chalsidon*) **ක්‍රි. ව 451**

**පසුබිම**

**එව්ටිකස් /එව්කේකියන් වාදය** EUTYCHIANISM

එව්ටිකස් (*Eutyches*) නමැති කොන්ස්තන්තිනෝපලයේ තාපසයකු විසින් ක්‍රිස්තුන් වහන්සේගේ ස්වභාවය පිළිබඳව ප්‍රචාරය කරන ලද භේදික මතයක් මෙම මන්ත්‍රණ සභාව පැවැත්වීමට හේතු සාධක විය. ඔහුගේ මතය වූයේ ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එකම දේව ස්වභාවයක් පමණක් වන අතර මනුෂ්‍ය ස්වභාවයේ මාත්‍රයක් පමණක් එතුමන් තුළ ඇති බව ය. මෙය එව්ටිකියන් වාදය (Eutychianism) හා මොනිෆිටියන් වාදය (Monophysitism) ලෙස හඳුන්වනු ලැබේ. මෙය ක්‍රිස්තු තුමන් තුළ ඒකාබද්ධව තිබූ මනුෂ්‍ය ස්වභාවය ප්‍රතික්ෂේප කිරීමකි.

මාංශගත වීමෙන් පසු ක්‍රිස්තුන් වහන්සේට වූයේ එක ස්වභාවයක් පමණක් බව ඔහුගේ අදහස විය. එය දිව්‍යමය ස්වභාවය විය. මෙය ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය මනුෂයත්වය ප්‍රතිකෂේප කිරීම නිසා එක්තරා අන්දමක එක ස්වරූපයක වාදයකි. මෙම දුර්මතවාදය ප්‍රතික්ෂේප කරමින් ක්‍රිස්තුන් වහන්සේ සැබෑ ස්වරූප දෙකක් ගන්නා බව කැල්සිඩොන් සභාවේදී තහවුරු කෙරිණි.

**මන්ත්‍රණ සභාව පැවැත්වීම**

මෙම වේද භේදික සංකල්පය සාමාන්‍ය ජනයා අතර ව්‍යාප්ත වීමත් සමග ක්‍රිස්තුන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ යම් යම් ප්‍රශ්න ඇතිවිය. එවිට කොන්ස්තන්තිනෝපලයේ රදගුරු ධූරය දැරූ ප්ලේවියන් තුමා විසින් එව්ටිකස්ගේ මතය වේද භේදයක් ලෙස පෙන්වා දෙන ලදී. එනමුත් තම මතය වේද භේදික මතයක් ලෙස පිළිගැනීමට ඔහු අකමැතිවිය. සභාවේ නීති රීතිවලට අනුව ඔහුව සභාවෙන් නෙරපා දැමීමට මෙය හේතුවක් විය. එවිට එව්ටිකස් තම මතය නිවැරදි බව කියා අධිරාජයාගේ සහය පැතීය.

ඉන්පසුව ක්‍රි. ව 451 දී සතරවන මන්ත්‍රණ සභාව කැඳවන ලදී. මෙය කැල්සිඩොන් යන නගරයේ පැවැත්වුණු නිසා කැල්සිඩොන් මන්ත්‍රණ සභාව ලෙස හැඳින්වේ. ආසියාවේ බොහෝ ප්‍රදේශවල රදගුරුවරු මෙයට සහභාගි වූ අතර රෝමයේ රදගුරුවරයාගේ නියෝජිතයෙක් ද මේ සඳහා එවා තිබුණි. මෙම සම්මේලනය වැගත් වන්නේ එහිදි නිකුත් කළ '' කැල්සිඩෝන් නිර්වචනය'' නිසාය . ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයෙන් උන් වහන්සේගේ මනුෂ්‍යත්වය වෙන් නො කළ හැකි බවත්, එමනිසා උන් වහන්සේ සැබෑ දෙවියෝ ද සැබෑ මනුෂ්‍යයා ද වන බවත් කැල්සිඩොන් මන්ත්‍රණ සභාවේ ස්ථාවරය විය. මෙසේ එව්ටිකස්ගේ මතය ප්‍රතික්ෂේප කෙරිණි.

මෙම සම්මන්ත්‍රණයේ දී නයිසීනු ඇදහිලි සම්බන්ධ ප්‍රකාශය තවදුරටත් සම්මත කෙරිණි. ඒ අතර ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා ගේ ලිපිය ද ලියෝ තුමාගේ මතය ද ගැන ප්‍රශ්න මතු විය. සිරිල් තුමාගේ ප්‍රකාශය අනුව ක්‍රිස්තුන් වහන්සේ ස්වභාව දෙකකින් ඉදිරිපත් වූ අතර ලියෝ තුමාගේ මතය අනුව 'ස්වභාව දෙකක් තුළ' යන්න සඳහන් විය. මේ නිසා සභාවේ ප්‍රධාන පිරිස ක්‍රිස්තුන් වහන්සේ එක පුද්ගලයෙක් හා ස්වභාව දෙකක් ඇත්තෙක් ලෙස විස්තර කළහ. සවභාව දෙක ආරක්ෂා වූයේ එක පෙනුමක් (*Prosopon*) සහ එක උපස්ථාවක් (*Hypostasis*) වූ නිසා ය. මේ අනුව එක දේවත්වයත් දෙව් මිනිස් ස්වභාවයත් මැවිල්ලට පෙර වැඩ විසූ බවත් කන්‍යා උපතත් පිළිගැණුනි.

### 6.2.2 සභා පියවරු

**සභා පියෙක් යනු කවරෙක් ද?**

මුල් කිතුනු සභාවේ නිර්මල කිතු දහම හා විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා ඉගැන්වීමෙන්, දේශනාවෙන්, හා ලේඛනකරණයෙන් දායක වූ මුල් උගතුන් පිරිස සභා පියවරුන් ලෙස හඳුන්වනු ලැබේ. සභා පියෙක් යනු කවරෙක්ද? පිළිබඳ ප්‍රථම විද්‍යාත්මක නිර්වචනය ලෙරින්ස්හි වින්සන්ට් (*Vincent of Lerins*) විසින් ක්‍රි.ව 434 දි ඉදිරිපත් කරන ලදී. මෙම නිර්වචනය පාදක කොටගෙන ශුද්ධ වූ සභා මාතාව තම නිර්වචනය ඉදිරිපත් කරන්නීය. ඒ අනුව මුල් යුගයේ කිතුනු ලේඛකයකු සභා පියකු වශයෙන් නම් කිරීමේ දී සළකා බැලිය යුතු කරුණු හතරකි.

- ඉදිරිපත් කළ ධර්මයේ නිරවද්‍ය භාවය (*Orthodoxy*)
- ශුද්ධවත් ජීවිතය (*Sanctity*)
- ශුද්ධවූ සභාවේ අනුමැතිය (*Apostolicity*)
- ජීවත්වූ කාල වකවානුව (*Antiquity*)

**මුල් කිතුනු ලේඛකයන් "පියවරුන්' ලෙස හඳුන්වන්නේ ඇයි ?**

පියතුමා යන වචනය කතෝලික සභාවෙන් නිකුත් වූවකි. එසේම එය රදගුරුතුමකු ගෞරවාන්විතව හැඳින්වීම පිණිස යොදා ගන්නා ලදී. තම ගෝලයන්ගේ ආධ්‍යාත්මික පෞරුෂත්වය ගොඩනගා ගැනීමෙහි ලා ගුරුතුමා බෙහෙවින් දායක වූ බැවින් එතුමාව පියා ලෙස සලකයි. මෙලෙස ගුරුතුමා පියකු ලෙස හඳුන්වා දීම ඉපැරණි මිනිසුන් විසින් කළ ක්‍රියාවකි. මේ නිසාම සභාවේ ඉගැන්වීමේ කාර්යය පැවරෙන රදගුරුවරුන්ද පියා යන නමින් හැඳින්වීම සභා ඉතිහාසයේ දැකිය හැක.

උදා - ක්‍රි.ව. 251 දී පමණ ජීවත් වූ සිප්‍රියානු රදගුරුතුමා හඳුන්වාදී ඇත්තේ සිප්‍රියාන් පාපා( පියතුමා) යනුවෙනි.

මේ ආකාරයෙන් සභාවේ මුල් කිතුනු ලේඛකයන්ගේ මූලික කාර්යය කිතුනු ධර්මය ඉගැන්වීම වූ බැවින් ඔවුන්වද පියවරුන් ලෙස හඳුන්වනු ලැබීණි. ග්‍රීක සභා පියවරුන් ලෙස ඇතනේසියස් බැසිල් තුමා, ක්‍රිසොස්ටම් තුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා යන අය සඳහන් කළ හැකි ය. ලතින් පියවරුන් ලෙස හිලරි තුමා, ජෙරොම් තුමා, අම්බ්‍රොස්තුමා, අගොස්තීනුතුමා යන අය සඳහන් කළ හැකිය. ඉන් අනතුරුව ආම්බ්‍රොස්තුමා, ජෙරොම්තුමා අගොස්තීනු තුමා හා ග්‍රෙගරි තුමා යන අය මහ සභාපියවරු ලෙස නිල වශයෙන් ප්‍රථම වතාවට 8 වන බොනිෆස් ශුද්ධෝත්තම පියතුමා විසින් නම් කරන ලදී.

**සභාපිය යුගය**

සභාපියවරුන්ගේ ක්‍රියාකාරිත්වය හා ඔවුන් තම වගකීමෙහි නියැලුණු කාල පරිච්ඡේදය 1 සියවසේ සිට 8 වන සියවස දක්වා ලෙස සඳහන් වේ. නැතහොත් අපෝස්තුලුවරුන්ගෙන් පසු කාලයේ සිට අටවන සියවසේ අගභාගය දක්වා ඇති කාල පරිච්ඡේදය සභාපිය යුගය ලෙස සඳහන් කළ හැකි ය.

**සභාපිය කාර්යය**

ජුදා ආගමින් හා අන්‍ය ආගම් තුළින් නැගුණු ප්‍රශ්ණවලට පිළිතුර සවිස්තර ලෙස දැක්වීම සභාපිය කාර්යය විය. ඔවුහු බොහෝ විට අධිකාරී බලයකින් ක්‍රියා කළහ. මේ අය සභාවේ නිල බලයෙන් පත්වූ රදගුරුවරු වූහ.

නිර්මල කිතු දහම නව ගිවිසුමට අනුව ආරක්ෂා කිරීම ඔවුන්ගේ පරම යුතුකම විය. ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වුයේ ඉගැන්වීමයි. සභාව පිළිබඳ හා එහි ධර්මය පිළිබඳ ඓතිහාසික පදනමක් දැමීමට ඔවුන්ට හැකිවිය. මේ අයගේ දේශන හා ලියැවිලි මඟින් ක්‍රිස්තියානි සම්ප්‍රදාය ආරක්ෂා වූවා පමණක් නොව කිතු දහම තව තවත් වර්ධනය විය. ඔවුන් ගත කළ ශුද්ධවත් ජීවිතය එයට ප්‍රධාන හේතුවක් විය. සභා පියවරුන් පිළිබඳ අධ්‍යයනය යනු විශ්වාසය තුළ දෙවිඳුන්ගේ දැනුම වර්ධනය කරන විද්‍යාවකි. විධිමත් ක්‍රම වේදයක් පදනම් කරගෙන මුල් කිතුනු සභාවේ ක්‍රිස්තියානීන් දැනුවත් කිරීමෙහි ලා නොයෙක් විට දේශනා කළ හා විවිධ දේ රචනා කළ සභා ලේඛකයන් හැදෑරීම මෙහි මූලික අරමුණයි. මේ අනුව සභා පියවරුන්ගේ ලිපි ලේඛන මගින් ඉදිරිපත් කළ ඉගැන්වීම් සභා පිය ධර්මය (*PATROLOGY* ) හෙවත් සභා පිය සාහිත්‍යය ලෙස හැඳින්වේ.

**සභාපිය සාහිත්‍ය භාෂාව**

මෙම සභාපිය සාහිත්‍ය කෘති දෙවන සියවසේ මැද භාගය වනතෙක් ග්‍රීක් භාෂාවෙන් ලියැවී තිබෙන අතර පසුව ලතින් භාෂාවෙන්ද ඒවා ලියැවී ඇත. එබැවින් සභා පියවරුන් එම කෘති ලේඛනගත කිරීම සඳහා භාවිත කළ භාෂාව අනුව ඔවුන් ග්‍රීක් හා ලතින් පියවරුන් ලෙසද හඳුන්වා දී ඇත.

**ලතින් සභා පියවරුන්**

ඉරනේයස් තුමා
අම්බ්‍රෝස් තුමා
අගොස්තීනු තුමා
ජෙරොම් තුමා
ජස්ටින් තුමා
මහා ග්‍රෙගරි තුමා
හිලරි තුමා

**ග්‍රීක් සභා පියවරුන්**

සිරිල් තුමා (ඇලෙක්සැන්ඩ්‍රියාවේ)

බැසිල් තුමා

ජෝන් ක්‍රිසොස්ටම් තුමා

ඇතනේසියස් තුමා

ග්‍රෙගරි නසියන්සස් තුමා

ඉග්නාසියුස් තුමා (අන්තියෝකියේ)

**ප්‍රාණපරිත්‍යාගී ජස්ටින් තුමා (100165)**

2 වන සියවස තුළ ජීවත් වූ මොහු තර්ක වේදීන් අතර ශ්‍රේෂ්ඨතම තර්ක වේදියා ය. මෙතුමා පලස්තීනයේ ෂිකේන් නම් ප්‍රදේශයෙන් පැමිණි අයෙකි. ක්‍රිස්තු ධර්මය ජුදා පරිසරයෙන් හෙලනිස්ත සමාජයට (ග්‍රීක සමාජය *Hellenistic Society*) සේන්දු වීමෙන් දර්ශනවාදීන්ගේ අභියෝගවලට මුහුණ පෑමට සිදු විය. එසේම ජුදා ජාතිකයන්ගෙන් පවා විවිධ චෝදනා එල්ල විය. එතුමාගේ කාර්යය වූයේ ක්‍රිස්තු ධර්මයේ සත්‍ය දර්ශනය සොයා ඉදිරිපත් කිරීමයි. ජුදෙව් හෝ සමාරිය හෝ පරපුරට මොහු අයත් නොවූවද ඔහුගේ දෙමාපියෝ අන්‍ය ආගමිකයෝ වූහ. එම නිසා මෙතුමා අදේවවාදී පරිසරයක ජීවත් වූ අයෙකි. ඉගෙනීම ලැබුවේ ග්‍රීක සම්ප්‍රදාය තුළ ය. ස්ටොයික්, ඇරිස්ටෝටල්, පයිතගරස්, ප්ලේටෝ යන දාර්ශනිකයන්ගෙන් ආභාෂය ලත් ගුරුවරුන්ගෙන් ඉගෙනීම ලැබුවේය. නමුත් මේ අයගෙන් ඔහු සෙවූ සත්‍යය ඔහුට සොයා ගත නොහැකි විය. එහෙත් ප්ලැටොනික් වාදීන්ගෙන් පමණක් ආත්මික සහනයට මග පෑදුණු බවක් සඳහන් වේ.

සත්‍යය සෙවීමේ දී සහා ඉතිහාසයේ විවිධ ගුරු කුළවලට අයත් වී වෙහෙස වුවද අවසානයේ දී එපීසයේ ජීවත් වූ එක්තරා ක්‍රිස්තු භක්තික තරුණයකුගෙන් ක්‍රිස්තු ධර්මයේ දර්ශනවාදී ලක්ෂණ ඉගෙන ගැන්මට එතුමාට හැකි විය. ඉන් පසු ක්‍රිස්තු ධර්මය වැළඳගෙන මිනිසා ගළවා ගන්නා පරිපූර්ණ හා සත්‍යය වූත් දර්ශනය නම් සැබෑ ක්‍රිස්තු දර්ශනය බව අවබෝධ කර ගත්තේ ය. එබැවින් මෙතුමාගේ ප්‍රථම කාර්යය වූයේ ක්‍රිස්තියානිකාරයන් දැනුවත් කිරීම සඳහා රෝමයේ දර්ශන පීඨ කිහිපයක් ඇරඹීමයි.

ක්‍රිස්තු ධර්මය දාර්ශනිකව හා තර්කානුකූලව හැදෑරූ ජස්ටින් තුමා එවකට රෝම අධිරාජයාව සිටි අන්තෝනියුස් පියුස් ( Anthonius Pius) නැමැත්තාට සත්‍ය ධර්මය පහදා දෙමින් ක්‍රිස්තියානින්ට අසාධාරණ ලෙස පීඩා නොකරන ලෙස ඉල්ලා සිටියේ ය.

**ජස්ටින් තුමාගේ ලේඛන කාර්යය**

සභා ඉතිහාසය තුළ ඔහු විසින් ලියන ලද මූලික ඇපොලොජිස්ත ලේඛන 03 ක් සඳහන් වේ.

1. අන්තෝනියුස් පියුස් අධිරාජයාට ලියූ ඇපලොජිස්ත ලේඛනය
2. රෝම සෙනට් සභාවට ලියූ ඇපලෝජිස්ත ලේඛනය
3. ජුදා ජාතික ට්‍රයිෆෝ (*Trypho*) යන තැනැත්තා අතර ඇති වූ සංවාදය හා සම්බන්ධ ලේඛනය

**ඇතනේසියස් තුමා ( ක්‍රි.ව 295 373)**

**ජීවිත පසුබිම**

ක්‍රි.ව 295 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපත ලද මෙතුමාගේ දෙමව්පියෝ ක්‍රිස්තු භක්තිකයෝ වූහ. මුලින්ම ක්‍රිස්තියානි අධ්‍යාපනයක් නොලැබුවද ඔහු කුඩා කල සිටම තපස් ජීවිත කෙරෙහි ඇල්මක් දැක්වූවේය.

එහෙත් උගත් බුද්ධිමත් අයෙක් වූ බැවින් ක්‍රි.ව. 325 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුවරයාගේ ලේකම් බවට පත්විය. මෙම තනතුර නිසා නිසියානු මන්ත්‍රණ සභාවට සහභාගි වීමට එතුමාට ඉඩ ලැබුණි. මෙම මන්ත්‍රණ සභාවේ දී එරියන් වාදයට විරුද්ධව කථාකරන්නට ඔහුට ද හැකිවිය. ඔහුගේ ජීවිතයේ වැඩි කාලයක් තුළ ඒරියන් වාදයට විරුද්ධව සටන් කිරීම නිසා ඇතනේසියස් ගැන කථා කිරීමේ දී ඒරියන් වාදය අමතක කළ නොහැකි ය.

ක්‍රි.ව 328 දි ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු තුමාගෙන් පසුව ඇතනේසියස් තුමාව නව රදගුරු තුමා ලෙස පත් කරන ලදී. ගිහි පැවිදි දෙපක්ෂයේම ප්‍රසාදය ලැබූ ඇතනේසියස් තුමා එජිප්තුව, ලිබියාව ඇතුළු විශාල පළාතකට අගරදගුරු ලෙස පත් කරන ලදි. එතැන් සිට වසර 7 ක් තම ප්‍රදේශයේ සැරිසරමින් සෙනග දිරිගන්වමින් විශාල සේවයක් කළේය. අන්තවාදී තර්ජනයෙන් ප්‍රදේශ බේරා ගැනීම ඔහුගේ එකම අරමුණ විය. දූර්මතධාරියකු ලෙස සභාවෙන් ප්‍රතික්ෂප කළ ඒරියස් සභාවට පිළිගන්නා ලෙස රෝම අධිරාජයා කළ බල කිරීම්වලට මෙතුමා එකඟ වූයේ නැත.

**ඇතනේසියස් තුමාගේ කෘති**

තාපසාරාමවල ගතකළ ජීවිතය තුළ මෙතුමා විශේෂ කාර්යයක යෙදුණේය. එනම් පොත්පත් රැසක් ලියා සභාවට දායාද කිරීමයි. මේවා ඉතා සරල රචනා විය. ඒවා බොහෝමයක් ලියන ලද්දේ ඒරියස්ගේ දර්ශනයට විරුද්ධවය. මේ පොත් අතරින් ශුද්ධවූ බයිබලයට ලියන ලද ටිකාවක් (ගැටපද විවරණයක්) ඉතිරිව ඇත.

මෙතුමාගේ ලේඛනවල විශේෂත්වය වූයේ නිතරම ව්‍යාංගර්ථයෙන් ඉදිරිපත් කිරීමයි. මොහු බයිබලය හැඳින්වූයේ ක්‍රිස්තු කේන්ද්‍රීය යන තේමාව ඔස්සේ ය.

මෙතුමා ලියූ පොත් අතර මරියතුමියගේ කන්‍යාභාවය ගැන ලියූ පොත් කීපයක් ද ඇත. ඒරියන් වාදයට විරුද්ධව ක්‍රි. ව 325 දි කැඳවන ලද නිසියානු සභාවේ දී පියාණන් එකම හවාර්ථයක් ඇතිව වැඩ සිටින බව ඇතනේසියන් පෙන්වා දෙන ලදද්දේ ඒ සඳහා ප්‍රකාශකල ඔහුගේ *De Decretis Nicaenae Synodi* නමැති කෘතිය මගින්ය. එතුමා විසින්ම විශ්වාස ලක්ෂණයක් නිර්මාණය කරන ලදි ( *Symboum Athanasii*) මෙලෙස නිසියානු විශ්වාස ලක්ෂණයේ මුල් පියවර තැබූවේ මෙතුමාය.

**ඇතනේසියස් තුමාගේ දේව ධර්මය**

මෙතුමා ඉහළ පෙළේ දේව ධර්මාචාර්යවරයෙකු නොවුනත් දෙවියන් හා පුත්‍රයාණන් පිළිබඳවත් මරියතුමි පිළිබඳවත් සත්‍යතාවක් ඉදිරිපත් කර ඇති බව ඔහුගේ කෘති සාක්ෂි දරයි. ශුද්ධාත්මයාණන් වහන්සේ පියාණන් හා පුත්‍රයාණන් වහන්සේ වෙතින් නිකුත් වන බව ඉදිරිපත් කරන ප්‍රකාශනයක් ක්‍රිස්තියානි සාහිත්‍යයේ මුල්වරට හමුවන්නේ ඔහුගේ පොත්වලය. පියාණන් හා පුත්‍රයාණන් සදාතනයෙන් වැඩ සිටින බව පුන පුනා ප්‍රකාශ කිරීම ඔහුගේ දේවධර්මයේ විශේෂ අංගයකි. ඔහු පුත්‍රයාණන් හැඳින්වූයේ මැවිල්ලේ කුලුදුලා ලෙසටය.

ශුද්ධ සහභාගිකම හෙවත් පූපකැඩීමේ මෙහෙයේදී මිදි යුෂ හා පූපවලට ශුද්ධාත්මයාණන් වැඩම කරන බව ඔහු ප්‍රකාශ කළේ ය. කතෝලික සභාව එම සත්‍යතාව අදත් ඒ අයුරින්ම පිළිගනියි.

**ජෙරොම් තුමා (ක්‍රි.ව 342 420)**

**ජීවිත පසුබිම**

ජෙරොම් තුමා ( *St. Jerome*) ක්‍රි. ව. 342 දී අක්විලියාවේ උපත ලබා රෝමයේ දී මූලික අධ්‍යාපනය ලබා ගත්තේ ය. ඩැමේසෙස් පාප්තුමාගේ ලේකම්වරයා ලෙසද ටික කලක් කටයුතු කළ මෙතුමා ක්‍රි.ව. 385 දී බෙත්ලෙහෙමට ගොස් තම ජීවිතයේ ඉතිරි කාලයේ තාපසයකු ලෙස ජීවත් විය.

ඩැමේසස් පාප්තුමාගේ (*Pope Damasus*) ඉල්ලීම පරිදි මෙතුමා ක්‍රි.ව. 386 දී ශුද්ධ වූ බයිබලය ලතින් භාෂාවට ක්‍රමානුකූලව පරිවර්තනය කළේ ය. වල්ගේට් (*Vulgate*) නමින් හඳුන්වන මෙම පරිවර්තනය නිසා මෙතුමාට සභා පඬිවරයෙකු ලෙස කීර්ති නාමයක් ලබා ගැනීමට හැකිවිය. ඊට අමතරව බයිබලය හැදෑරීමට උපකාරී වන ග්‍රන්ථ කීපයක් ද මෙතුමා විසින් සම්පාදනය කළේය.

ද්විතීය සම්මත ග්‍රන්ථ හා ජුදෙව් ලියැවිලි අතර සම්බන්ධය ගැන තේරුම් ගැනීමට පළමුවෙන් හැකිවූයේ ජෙරොම් තුමාට ය. ශුද්ධවූ ලියැවිලි වශයෙන් පිළිගත යුතු පොත් පෙළ (*Canonical Books*) විනිශ්චය කිරීම සඳහා ක්‍රි.ව. 397 දී කාතේජ් මන්ත්‍රණ සභාවේදී ජෙරොම් තුමාගේ මග පෙන්වීම හා දායකත්වය ඉතා ප්‍රයෝජනවත් විය.

**ජෙරොම්තුමාගේ දේව ධර්මය**

ජෙරොම් තුමා ඔරිගන් තුමාගේ කෘති (*De Principiis* )වැනි කෘති ලතින් භාෂාවට පරිවර්තනය කළ අතර එවැනි ආගමික ලේඛකයින් ගැන තොරතුරු ඇතුළත් ලියවිල්ලක් ද සම්පාදනය කළේය. මෙලෙස ක්‍රි.ව. 392 දී පමණ එකල ජීවත් වූ සභා ශ්‍රේෂ්ඨයින්ගේ ජීවිත කතා ඇතුලත් "විශිෂ්ට පුද්ගලයින්ගේ ජීවන චරිත" නැමැති ග්‍රන්ථය ඔහු විසින් සභා ඉතිහාසයට දෙන ලද දායාදයක් ලෙස සැළකේ. පේදුරු තුමන්ගෙන් පටන් ගෙන තමා දක්වා වූ සභාවේ නායකයින් රැසකගේ ජීවන චරිත 135 ක් මෙම ග්‍රන්ථයේ අඩංගු වී ඇත. පසු කල සාන්තුවරයන්ගේ චරිත කථා ලිවීමට මෙතුමාගේ මෙම කෘතිය පූර්වාදර්ශයක් වී ඇත.

එසේම මිත්‍යා මතධාරීන්ට විරුද්ධව ඉතා වේගවත් භාෂා ශෛලයකින් ලිපි රචනා කළේය. මෙතුමා ශුද්ධ වූ ලියවිල්ල කියවීමෙන් හා එය භාවනා කිරීමෙන් තමා ලැබූ අත්දැකීම් පාදක කොට ගෙන විවිධ ලිපි ලේඛන ලියමින් තම තාපස ජීවිතය ගත කළ බව ඉතිහාසයේ සඳහන් වේ . තාපසයකු ලෙස ශුද්ධ වු දේශයේ තාපසාරාමයක ඉතා දුෂ්කර තපස් ජීවිතයක් ගත කළ ජෙරොම් තුමා ක්‍රි.ව. 420 දි එහිම මිය ගියේ ය. විශ්ෂ්ට බයිබල් විශාරදයකු ලෙස වත්මන් සභාවේ ද ඔහු ප්‍රකටය.

**ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා**

**ජීවිත පසුබිම**

- ක්‍රි.ව. 376 දී ඊජිප්තුවේ දී මෙතුමා උපත ලැබුවේ ය. මෙතුමා ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමන්ව සිටි තියෝෆිලස තුමන්ගේ බෑණා විය. ඇලෙක්සැන්ඩ්‍රියාවේ දේවධර්මය පිළිබඳ විද්‍යා පීඨයේ ඉගෙනුම ලැබුවේ ය.

- ක්‍රි.ව 412 දී රදගුරු තියෝෆිලස් තුමන්ගේ අභාවයෙන් පසුව සිරිල් තුමා ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු ධූරයට පත්විය.

- 5 වන සියවසේ දී මෙතුමා ඉතා ප්‍රසිද්ධ ධර්මාචාර්යවරයෙක්ද විය. ... දේවභක්තිය ඇති පාරම්පරික කිතුනුවකු වූ මෙතුමා මිථ්‍යා ඇදහිලිවලටද, වැරදි ප්‍රතිපත්තිවලටද විරුද්ධව සටන් කළේ ය. මෙතුමාගේ ප්‍රධාන විරුද්ධවාදියා වූයේ කොන්ස්තන්නි - නෝපලයේ රදගුරුවූ නෙස්ටෝරියන් හා ඔහු ආරම්භ කළ නෙස්ටෝරියන් වාදයයි.

- නෙස්ටෝරියන්, ඒරියන් ඉදිරිපත්කළ ජේසුස් ක්‍රිස්තුස් දේව පුත්‍රයා නොවේ යන වේද භේදයට විරුද්ධව වාද කර, ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ඉස්මතු කර දේශනා කර, අවසානයේ ජේසුස් වහන්සේ තුළ දේවත්වයත්, මනුෂ්‍යත්වයත් ඇති බවත්, මරිය තුමී මනුෂ්‍යත්වය ගත් ජේසුස් වහන්සේගේ මව පමණක් බවත්, දේවත්වයක් ඇති ජේසුස් වහන්සේගේ මව නොවන බවත් පවසා සිටියේ ය.

- මේ වේදභේදය ගැන සොයා බැලීමට එපීසයේ ක්‍රි.ව. 431 දී පළවන සෙලස්තියන් පාප් වහන්සේ විසින් රැස්කරන ලද ජගත් මන්ත්‍රණ සභාවේ දී ශුද්ධ වූ සිරිල්තුමා ශ්‍රේෂ්ඨ ධර්මාචාර්යවරයා ලෙස කටයුතු කළේ ය.

- ජේසුස් වහන්සේ දේවත්වයත්, මනුෂ්‍යත්වයත් ඇති තැනැත්තු බවද, මරියතුමී එක් ස්වභාවයක් පමණක් ඇති තැනැත්තකු බිහිකළා නොව, ස්වභාව දෙකම ඇති තැනැත්තකුව බිහිකළ බව ද මරිය තුමිය ඇත්ත වශයෙන් ම දේව මාතාව බවද එපීස මන්ත්‍රණ සභාව ප්‍රකාශයට පත් කළේ ය.

- ශුද්ධ වූ සිරිල් තුමා මරියාවන් දේව මාතාවන්ය යන එපීස මන්ත්‍රණ සභාවේ තීරණය තහවුරු කිරීමට ඉතා වෙහෙසව කටයුතු කර , දුෂ්කරතාවන්ටද මුහුණ දුන්නේ ය.

- ශුද්ධවූ ත්‍රිත්වය ගැනත්, ජේසුස් වහනසේගේ ස්වභාව ගැනත් කිතුනුවන්ට පහදා දෙමින්, දේව ධර්මය දේශනා කිරීමේ වැඩි දායකත්වයක් දැරුවේ ය. ඒතුමා ක්‍රි.ව 444 දී ස්වර්ගස්ථ විය.

**ශුද්ධවූ සිරිල්තුමා ලියූ ලිපි ලේඛන**

- මෙතුමාගේ සාහිත්‍ය කෘති වර්ග දෙකකි.
- ක්‍රි.ව. 428 දක්වා මෙතුමාගේ කෘතී, ශුද්ධ බයිබලීය විවරණ, ඒරියන් වේදභේදයට විරුද්ධව විවාද ආදිය විය.
- පසුව ලියැවුණු කෘතී නෙස්ටෝරියන් වේදභේදයට විරුද්ධව ලියූ ඒවාය.
- එතුමා ලියූ ශුද්ධාත්මයාණන් හා සත්‍යය තුළ වන්දනාව ගෞරවය යන ග්‍රන්ථය පංච පුස්තකය ගැන පැහැදිලි විවරණයක් විය. මෙය ශුද්ධ වූ සිරිල් තුමා සහ බැල්ටියුස් අතර ඇතිවන සංවාදයක් ලෙස සැකසී ඇත.
- ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳව ලියු කෘතිය, ඒරියන් වේදභේදය විමර්ෂණය කර එය වැරදි බව තහවුරු කරයි.
- නෙස්ටෝරියන්ට විරුද්ධ ලියූ " පරිච්ඡේද පත " යන ග්‍රන්ථය නෙස්ටෝරියන් ප්‍රකාශයට පත්කළ දේශනාවල සමස්ථය විමර්ශණය කර එහි ඇති වැරදි පෙන්වා දෙයි.

**අගොස්තීනු මුනිතුමා (ක්‍රි.ව. 354 430)**

**ජීවිත පසුබිම**

කිතුනු සහා ඉතිහාසයේ විශිෂ්ටතම සභාපියා ලෙස සැළකෙන ශුද්ධවූ අගුස්තීනු මුනිතුමා උතුරු අප්‍රිකාවේ තගස්තේ නමැති ග්‍රාමයේ ක්‍රි.ව. 354 නොවැම්බර් මස 13 වන දින උපත ලැබුවේය. ඔහුගේ පියා පැට්‍රීෂියස් ද,මව මොනිකා ද වූහ. තම විශ්වාසය හා කිතුනු සාක්ෂි දැරීම නිසාම තම මව වන මොනිකා තුමියව ශුද්ධවන්තියක් ලෙස සභාමාතාවගේ ගෞරවයට පාත්‍රය වන්නේය. ඔහුගේ මව ක්‍රිස්තු භක්තියෙකු වුවත් පියා අන්‍යාගමිකයෙක් විය. ඔහු රෝම අධිරාජ්‍යයේ සේවය කළේ ය. තගස්තේ පිහිටියේ උතුරු අප්‍රිකාවේ නුමේඩියා නමැති රෝම අධිරාජ්‍ය ප්‍රදේශයේ, එනම්

වර්තමානයේ ඇල්ජීරියාව යන ප්‍රදේශයේ ය. රෝම සංස්කෘතිය මෙම ප්‍රදේශයේ ඉතා දැඩි ලෙස මුල්බැස ගෙන තිබූ නිසාම එහි ජීවත් වූ බොහෝ ජනතාවගේ මව් භාෂාවත්, අධ්‍යාපන මාධ්‍ය මෙන්ම රාජ්‍ය භාෂාවලින් ලතින් භාෂාව විය.

රෝමයේ කොන්ස්තන්තීනු අධිරාජ්‍යයාගෙන් පසුව කිතුනු ආගම රෝම අධිරාජ්‍යයේ ආගම වුවද ඉතා විශාල වූ බැවින් එහි පරිපාලනය කටයුතු පසුකර ගැනීමට අධිරාජ්‍ය කොටස් දෙකකට බෙදා පීලනය කිරීම නිසා එහි රාජ්‍ය භාෂා දෙකක් විය. එනම් අප්‍රිකාව ඇතුළු බටහිර යුරෝපය රෝමය මූලස්ථානය කරගෙන පාලනය වූ අතර එහි මූලික භාෂාව ග්‍රීක භාෂාව විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සභා ඉතිහාසය තුළ ග්‍රීක හා ලතින් වශයෙන් සභාපියවරුන් දෙකොටසක් බිහිවිය. මේ අනුව ශුද්ධවූ අගොස්තීනු මුනිතුමා ලතින් සභා පියවරුන් අතර ශ්‍රේෂ්ඨතම තැනැත්තා ලෙස සභා ඉතිහාසයේ සඳහන් වේ.

ශුද්ධවූ අගොස්තිනු තුමා ජීවත් වූයේ පැරණි රෝම අධිරාජ්‍ය පරිහානිය කරා යමින් තිබූ යුගයකය. විශේෂෙයෙන් ගොත්, විසිගොත්, හන් හා වැන්ඩල් නමැති දරුණු ආක්‍රමිකයන් රෝම අධිරාජ්‍යය විනාශකාරී මුඛය කරා ගෙනයමින් පැවතියේ මෙම කාලයේදීය. ඔවුහු ඉපැරණි රෝම අධිරාජ්‍යයේ පැවිත සෞභාගය, උසස් සංස්කෘතිය හා අධ්‍යාපනික දියුණුව ක්‍රමක් ක්‍රමයෙන් විනාශයට පත්කරමින් රෝම අධිරාජ්‍යය තම ග්‍රහණයට නතුකර ගනිමින් සිටියහ. ක්‍රි.ව. 410 අගෝස්තු මස 24 වන දින ඇලරික් නම් වූ විසිගොත් ගෝත්‍ර නායකයා යටතේ සිදු කළ ආක්‍රමණික ප්‍රහාරයෙන් හේතුවෙන් දස සියවසක් පමණ ඉතාමත් ශක්තිමත්ව රෝම නගරය ආරක්ෂා කළ රෝම ප්‍රාකාරය කඩා බිඳ වැටුණි. මෙම යුගය රෝම අධිරාජ්‍යයට මෙය ඉතාමත් අඳුරු යුගයක් වෙයි. ක්‍රි. ව. 43 දී ශුද්ධ වූ අගොස්තීනු මුනිතුමා මිය යන විට ඔහු ජීවත්වූ උතුරු අප්‍රිකාවේ හිප්පෝ නගරයත් ඉතා දරුණු වැන්ඩල් ගෝත්‍රිකයන්ට යටත්ව තිබුණා බව ඉතිහාසයේ සඳහන්වේ.

ශුද්ධවූ අගොස්තිනු මුනිතුමා තම යෞවන කාලය ඉතා සැහැල්ලුවෙන් ගත කළේය. ඔහුට උසස් අධ්‍යාපනයක් ලබාදීම තම දෙමාපියන්ගේ අභිප්‍රාය විය. තමන් සතුවූ සහජ දක්ෂතාවන් හා ආත්ම ශක්තිය තම මිතුරන් අතර කැපීපෙනෙන්ට ඔහුට මඟ සැළසුවේය. ද්විතීය අධ්‍යාපනය ඉතා සාර්ථකව හැදෑරූ ඔහු ලතින් භාෂාවට, සාහිත්‍යයට හා ඉතිහාසයට ඉතා ලැදියාවක් දැක්වූයේය. එනමුත් ඔහු ග්‍රීක භාෂාවට එතරම් ලැදිකමක් නොදැක්වූ බව ඔහු විසින් කිසිම ලියැවිල්ලක් ග්‍රීක භාෂාවෙන් නොලියැවී තිබීමෙන් ගම්‍ය වේ.

කල් යත්ම පාසැල් ජීවිතයට තිබූ ඇල්ම ටිකෙන් ටිකෙන් අඩුවන්නට විය. පාසැල් ජීවිතයට වඩා තම මිතුරන් සමග මැරකම් කිරීමට පවා පෙළඹුණු බව ද සඳහන් වේ. ළදරුවිය හා ළමා කාලය අවසන්ව තරුණ වියට පා තැබූ ශුද්ධ වූ අගොස්තීනු

මුනිතුමාට ජීවිත ගැටලු හා තමන් හසුරුවාගැනීමේ අපහසුතාවයක් ද විය. අවුරුදු දහසය පමණ වියේ දී ඔහුට උසස් අධ්‍යාපනය සඳහා විය හියදම් කිරීමට තම දෙමාපියන්ට නොහැකි වූයෙන් ද්විතීය අධ්‍යාපනය අවසන් කර වසරකින් පමණ පසුව රොවින්යානස් නමැති ත්‍යාගශීලී ධනවත් තැනැත්තාගේ ආධාරයෙන් ශුද්ධ වූ අගොස්තීනු මුනිතුමාට උසස් අධ්‍යාපනය සඳහා රෝම අධිරාජ්‍යය තුළ අප්‍රිකාවේ එවකට පැවැති අගනුවර වූ කාර්තේජ් නගරය කරා යාමට හැකිවිය. කාර්තේජ් යනු විවිධ සංස්කෘතීන් එකට කැටි වූ, උගතුන් හා බුද්ධිමතුන් ජීවත් වූ සැපසම්තින් පිරුණු, විනෝදකාමී, ජීවිත රටාවක් පැවතුණු හා වානිජකරණයට ඉතා දැඩි ලෙස හසුව පැවැති නගරයකි. මෙහිදී තම ගෙදර අත් නොදුටු නිදහසක් ඔහු අත් දකින්නට විය. ශුද්ධ වූ අගොස්තිනූ තුමාගේ ළදරු හා තරුණ විය පිළිබඳ බොහෝ කරුණු කාරණා අපට එතුමන් විසින්ම රචිත " පාපොච්චාරණය" (*The Confessioin*) යන පුරාවෘතාන්තයෙහි හමුවේ. ප්‍රේම කිරීමටත් ප්‍රේම කරනු ලැබීමටත් ඔහු මහත් සේ රුචියක් දැක්වූ බවද එහි සඳහන්වේ. ඔහුගේ තරුණ වියේදීම ඔහු අවංකව ප්‍රේම කළ නිත්‍යානුකූල නොවන බිරිඳට දාව බිහිවූ පුතෙක් ඔහුට සිටියේය. ඔහුගේ නම " අඩෙයොඩාටස්" වූ අතර එහි අර්ථය නම් දෙවියන් වහන්සේ විසින් දෙන ලද තැනැත්තා යන්න විය. මෙලෙස සාරානුරාගී ජීවිතයක් ගත කළ ද අන් ශිෂ්‍යයන්ට වඩා උසස් අන්දමින් නීති විද්‍යාලයෙහි තම අධ්‍යාපන කටයුතු කරගෙන ගියේ ය. ඔහු එහි ශිෂ්‍ය නායකයාද විය.

ශුද්ධ වූ අගොස්තිනූ තුමා තම උසස් අධ්‍යාපනය යටතේ නීතිය හදාරන කාලයේ තර්ක ශාස්ත්‍රයට, කථික ශාස්ත්‍රයට හා දර්ශනයට වැඩි අවධානයක් දුන්නේය. සිසරෝගේ හෝර්ටෙන්සස් නැමැති දාර්ශනික ග්‍රන්ථයේ ආභාෂායෙන් දර්ශනවාදයට ඇලුම් කරන්නට පටන් ගත් අගුස්තීනු තුමා සිසරෝගේ සිතුවිලිවලින් ප්ලොටීනස් කෙරෙහි ද, පසුව ප්ලේටෝ කෙරෙහි ද ඇලුම් කරන්නට විය. එක්තරා අවස්ථාවක බොහෝ කිතුනුවන් ඩැහැගත් මැනිකියන් වාදයට ද මෙතුමා ඇදී ගියේ ය. එයින් තමා සොයන සත්‍ය එහි නොතිබුණ නිසාත් සමහර ප්‍රශ්නවලට සෙවූ පිළිතුරු හමු නොවූ නිසාත් පසුව මැනිකියන් වාදය ප්‍රතික්ෂේප කළේය. මෙම සියලුම ක්‍රියාදාමයන්ගේ අවසානයේ ලෞකික සියල්ල ගැන කළකිරී මෙවැනි නිගමනයකට පිවිසියේය. " දෙවියන්, ඔබවහන්සේ අප මැව්වේ ඔබ වහන්සේ සඳහා ය. එබැවින් ඔබවහන්සේ තුළ සැතපෙන තුරු අපට සැබෑ සහනයක් නොවන්නේමය.

ශුද්ධවූ අගොස්තිනූ මුනිතුමා හට වයස අවුරුදු දහ අටක් වූ කාලයේ දී ඔහුගේ පියා මියයාම නිසා එතුමාගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය විය හියදම් තම මව වූ මොනිකා තුමි විසින් සිදු කරන ලදී. ක්‍රි.ව. 376 දී උපාධිය හිමිකරගත් මෙතුමන් හට කාර්තේජ් උසස් අධ්‍යාපන ශාස්ත්‍ර ශාලාවේම ආචාර්ය තනතුරක් ද හිමි විය. පසුව තමාගේම ශාස්ත්‍ර ශාලාවක් ආරම්භ කිරීමේ අරමුණ ඇතිව ක්‍රි.ව. 383 දි රෝමයෙන් පිටව ගියේය. එම උත්සාහය අසාර්ථක වීම හේතුවෙන් වසරකට පසුව රෝමයේ

පිළිගත් පුද්ගලයෙකුගේ අනුමැතිය ඇතිව ඉතාලියේ මිලාන් නුවර කථික ශාස්ත්‍රය හා තර්ක ශාස්ත්‍රය ඉගැන්වීමට අවස්ථාවක් ලබාගත්තේය. මෙතුමා මිලානයේ සිටි කාලයේ දී තම මව වූ මොනිකා තුමී ඔහු සොයා පැමිණියේ ය. මිලානයේදී අම්බ්‍රෝස් නැමැති විශාරද රදගුරුතුමාගේ දේශනයට සවන් දුන් ශුද්ධ වූ අගොස්තිනු තුමා තම ජීවිතයේ පරිවර්තනයකට අඩිතාලම් දැම්මේය. තම නිත්‍යානුකූල නොවූ බිරිඳ ව අප්‍රිකාවට පිටත් කර හැරියේය. ඔහුට ගැළපෙන , නිත්‍යානුකූල විවාහයක් කරගැනීමට තම මවගෙන් යෝජනා ආවද ඔහුගේ අසහනකාරී හෘද සාක්ෂිය ඔහුට හිරිහැර කරන්නට විය. අවසානයේ දී විවාහයත් අන් සියලු දෙයත් අත් හැර ශාස්ත්‍ර ධූරයෙන් ද අස්වී භාවනා යෝගීව කල්ගත කර ක්‍රි.ව. 387 පාස්කු ඉරුදින අම්බ්‍රෝස් රදගුරුතුමා අතින් ප්‍රසාද ස්නාපනය ලබා ගත්තේය. මෙම අවස්ථාව සඳහා තම මව ද පුතා වූ අඩෙයොඩාටස් ද සහභාගී වූ අතර තම පුතා ද මෙම අවස්ථාවේම ප්‍රසාද ස්නාපනය ලැබූ බව ද සඳහන් වේ. ඉන්පසු අප්‍රිකාවේ තම උපන් ගම වූ තගස්තයට පිටත්ව යන්නට සිටි මොහොතේ දි තම මව මිය ගියාය. ඉන් වසරකින් පසු තම පුතා සමග තම උපන් ගමට පැමිණි මොහොතේ දී හදිසියේම තම පුතා ද මිය ගියේ ය.

වසර තුනක් ගෙවී ගිය පසු පූජකවරයද, ක්‍රි.ව. 395 දී හිප්පොහී රදගුරු පදවිය ද ලැබූ ශුද්ධ වූ අගොස්තිනු තුමා ලෞකික හා ආත්මික වශයෙන් ජයග්‍රහණයක් හිමිකර ගත්තේය. පවට නැමුණු සිත, අයහපත් පරිසරය, කාමයට ලොල්වූ ජීවිත පැවැත්ම, උගත්කම හා තීක්ෂණ බුද්ධිය, නොසන්සිඳුණු බුද්ධිමය විමසීම හා දේව අනුග්‍රහය අතර ඇතිවූ ගැටුම්කාරී තත්ත්වය යන විවිධාකාරී ජීවිත අරගල බොහෝමයක් අවසානයේ දී දෙවියන් වහන්සේගේ වරමින් ජය ගන්නට ඔහුට හැකිවිය.

පූජකතුමකු හා රදගුරුතුමකු ලෙස ඔහුට පැවරුණු බහුල පරිපාලන කටයුතු මැද පවා දාර්ශනික හා දේව ධාර්මික තර්ක විතර්කවල හා ලේඛනාකරණයේ ඔහු යෙදුන බව තම ලියවිලිවලින් ගම්‍ය වේ. හිප්පෝ නගරයේ එවකට රදගුරුව සිටි මහලු වලේරියස් තුමාගේ තැනට පත්කර ගැනීමට සුදුසු පූජකතුමකු සොයමින් ඒ ගැන තම ජනතාව සමග කතා කරමින් එහි සිටි පූජකවරයවත් නොලත් ගිහියෙකු ශුද්ධවූ අගොස්තිනු තුමාව ඒ සඳහා සුදුසු බව රැස්ව සිටි සියල්ලෝම අනුමත කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ඉතා කෙටි කාලයක් තුළ පළමුව පූජකවරයත් පසුව රදගුරු පදවිය ඔහු ලැබුවේය. තමාට පැවරුණු සියළුම කාර්යයන් නොපිරිහෙලා ඉටු කිරීමට ඔහු සෑම ප්‍රයත්නයක්ම දැරුවේය. අවසාන කාලයේ දී පැවැදි ආරාමවාසී ජීවිතයක් වැළඳගත් එතුමා තාපස ජීවිතය හා භාවනා ක්‍රම පිළිබඳ පොත් 113 ක් ද, අනුශාසනා ලිපි 218 ක් හා දේශනා 500 ක් පමණ ද සම්පාදනය කර ඇත්තේය. ශුද්ධ වූ අගොස්තිනු තුමාගේ ලේඛනකරණය තුළ විශ්ව සාහිත්‍යයට හිමිකම් කියන, පාපොච්චාරණය ශුදධ වූ ත්‍රිත්වය පිළිබඳ දේවධාර්මික ග්‍රන්ථය හා දේව නගරය යන රෝමය ඉතිහාසයේ යම් යම් කරුණු පාදක කොටගෙන ලියැවුණු කෘතිය ද සුවිශේෂී ස්ථානයක් ගනී.

**ඔරිගන් තුමා (ක්‍රි.ව 185 253)**

**ජීවිත පසුබිම**

ඔරිගන් තුමා ක්‍රි.ව 185 දී පමණ ඊජිප්තුවේ ඇලැක්සැන්ඩ්‍රියාව නම් ස්ථානයේ දී කිතුනු පවුලකට දාව උපත ලැබීය. ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරු කුලයේ ප්‍රධානියා වශයෙන් ඉතිහාසයේ ඔහුව නම් කර ඇත. නමුත් පසු කලෙකදී ඔහු කුමන ගුරු කුලයකට අයත් දැයි සැක පහල වී ඇත.

ඔහුගේ කාල පරිච්ඡේදය වකවානු 03කට වෙන් කර ඇත.

ක්‍රි.ව. 203-215 දක්වා ඇලෙක්සැන්ඩ්‍රියාවේ ජීවත්වූ කාලය (212 දි රෝමයේ )

ක්‍රි.ව 215-231 ඔහුගේ පූජක පත්වීම හා ආසියා කරයේ ජීවත්වූ කාලය (215 දි අරාබිකරයේ 216 දී පලස්තීනයේ)

ක්‍රි.ව 231 - 253 ඔහුගේ පලස්තීනයේ සංචාරය (231 දී ඩිමෙට්‍රියස් (*Demetrius* )රදගුරු තුමා විසින් සභාවෙන් නෙරපීමෙන් අනතුරුව)

**ඔරිගන් තුමාගේ ප්‍රධාන ග්‍රන්ථ**

- හෙක්ස්සප්ලා (*Hexapla*) ග්‍රන්ථය. මෙය ශුද්ධ වූ ලියවිල්ලේ විවරණය හා විචාරණය පිළිබඳ ලියැවුණ ප්‍රධානතම ග්‍රන්ථයයි.
- සෙල්සස්ට විරුද්ධව ලියූ ග්‍රන්ථය (*Aganist Celsus/ Contra Celsum* ) මෙය සෙල්සස් නැමැති මිත්‍යාලබ්ධික දර්ශනවාදියාගේ (*True Discourse*) නැමැති ග්‍රන්ථයට එරෙහිව ලියන ලද ඇපොලොජිස්ත ග්‍රන්ථයයි.
- ප්‍රධාන මූලධර්ම පිළිබඳ ග්‍රන්ථය (*De Principiits* )මෙය ආගමික සිද්ධාන්තයක් පිළිබඳ අත් පොතකි. දෙවියන් වහන්සේ , විශ්වය, මිනිස් නිදහස හා දේව අනාවරණය වැනි කිතුනු ආගමික සිද්ධාන්ත පිළිබඳ ගැඹුරු දර්ශනයක් මේ මගින් ලබාදෙයි.

**ඔරිගන් තුමාගේ දේව ධාර්මික ඉගැන්වීම්**

සභා ඉතිහාසය තුළ මොහු ඉතාම ප්‍රසිද්ධියක් උසුලයි. ශු.බයිබලය පිළිබඳ මූලික දේව ධර්මාචාර්යවරයකු ලෙස සභා ඉතිහාසයේ නම් කරයි. හෙබ්‍රෙව්, ග්‍රීක් වැනි භාෂා ගැන ඔහුට හසළ බුද්ධියක් තිබුණි. ඔරිජන්ට අනුව බයිබලීය විවරණයේ දී ක්‍රම වේද තුනක් භාවිතා කළ හැකි ය.

- වචනාර්ථයෙන් බයිබලය විවරණය කිරීම *(Literal)*
- මනෝවිද්‍යාත්මක ක්‍රමයට බයිබලය විවරණය කිරීම *(Psychological)*
- ආධ්‍යාත්මික නැතහොත් ඇලගොරිකල් ක්‍රමයට බයිබලය විවරණය කිරීම *(Spritual or Allegorical)*

ටර්ටූලියන් තුමා (ක්‍රි.ව 160220)

**ජීවිත පසුබිම**

උතුරු අප්‍රිකාවේ කාතේජ් (*Carthage*) නගරයේ ධනවත් පවුලක ක්‍රි.ව. 160 දී ටර්ටූලියන් තුමා උපත ලැබීය. තම දෙමාපියන්ගේ ධනවත්කම නිසාම ඔහුගේ ළමා වියේ සිටම ඔහු හොඳ අධ්‍යාපනයක් ලැබීය. ග්‍රීක හා ලතින් සාහිත්‍යය පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් ලැබූ මෙතුමාට ලතින් භාෂාවෙන් පොත් පත් ලියා තම අදහස් ප්‍රකාශ කිරීමට මනා හැකියාවක් තිබුණි. වෘත්තියෙන් නීතිඥයෙක් වූ මෙතුමා ටික කාලයක් රෝමයේද ජීවත් විය. එම කාල වකවනානුවේ දී ඔහු කිතු දහම වැළඳගත් බවත් ඉන් පසුව එතුමා කාතේජ් නගරයේ වාසය සඳහා ගිය බවත් ඉතිහාසයේ සඳහන් වේ.

**ප්‍රධාන ඉගැන්වීම්**

එවකට උතුරු අප්‍රිකාවටද බලපෑ කිතුනු ආගම් පීඩනය නිසා කිතුනු බැතිමතුන්ට නොයෙකුත් හිරිහැර විඳීමට සිදුවී ඇත. මෙම දරුණු පීඩන සියැසින්ම දුටු ටර්ටූලියන් තුමා අහිංසක කිතුනුවන්ට පීඩා කිරීම ගැන රෝම පාලකයින්ට දොස් පවරමින් ලේඛන නිකුත් කළේ ය. අන්‍යාගම්  ඉතා සූක්ෂම ලෙස විග්‍රහ කරමින් ඒවායේ අඩුපාඩුකම් පෙන්වා දුන්නේය. එසේම කිතු දහම අනෙකුත් සියලු ආගම්වලට වඩා ඉතා උසස් බවද ඔහු ප්‍රකාශ කළේ ය. ඔහු විසින් ලියන ලද ඇපොලොජෙටිකුස් (*Apologeticus*) යන ග්‍රන්ථය තුළ මෙම කරුණු ඉතා පැහැදිලි ලෙස අඩංගු වී ඇත.

කිතුනුවන් මුහුණපෑ පීඩනය විස්තර කරමින් " ප්‍රාණපරිත්‍යාගින්ගේ ලේ කිතුනුවන් බිහිවන බීජ වේ" යන අගනා කියමන ඉදිරිපත් කළේ මෙතුමාය. මෙම කියමනේ සත්‍යතව රෝම ආගම් පීඩනවලට පසුව ඇතිවූ සභා ව්‍යාප්තිය තුළින් මනා ලෙස පැහැදිළි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** ප්‍රධාන මන්ත්‍රණ සභාවන නයිසීන, කොන්සේතන්තිනෝපල්, එපීස හා කැල්සිඩොන් යන සභා ගැන සාකච්ඡා කරන්න.

**පියවර 2-** සභා පියවරුන පිළිබඳව විවාදාත්මක ලෙස කතිකාවතක් ගොඩ නඟන්න.

**මූලාශ්‍ර -**


අතිගරු ජේ ඇලෙක්ස් ප්‍රනාන්දු මාහිමි, අ.පො.ස.උසස් පෙල විභාගයට නියමිත නූතන කතෝලික සභාව, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10. 1970 සහ 2008

- මහාචාර්ය ජී. පී. වී සෝමරත්න, ක්‍රිස්තු ශාසනයේ ප්‍රථම පියවරු
- Thomas p.  General Councils of the Church  St. þul's  Press. Bombay,  1993

**නිපුණතාව 6.0** : **යුගයෙන් යුගයට වූ සභා ව්‍යාප්තිය හඳුනා ගනිමින් වර්තමාන සභාවේ උන්නතිය උදෙසා කැපවෙයි.**

**නිපුණතා මට්ටම 6.3** : **යුරෝපය තුළ සභාව මුල් බැසගත් ආකාරය පිළිබඳ ඓතිහාසික කරුණු හදාරයි**

**කාලච්ඡේද** : **කාලච්ඡෙද 20**

**ඉගෙනුම් ඵල** :

- මුල් ශතවර්ෂවල යුරෝපය තුළ සභාව ව්‍යාප්ත වූ ආකාරය හදාරයි.
- මධ්‍යතන යුගය තුළ සිදු වූ විශේෂ සිද්ධීන් නිරීක්ෂණය කරයි.
- ඉතිහාසය තුළ සභාවේ වැටීම් හා නැගිටීම් මූලිකව විශ්ලේෂණය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**6.3.1 යුරෝපයේ කිතුනු සභා ව්‍යාප්තිය**

**පස්වන සියවස තුළ කිතුනු සභාව :**

ඇදහිල්ල හා නව දේශපාලන ක්‍රමයේ බලපෑම්

පස්වන සියවසේ දී අධිරාජ්‍යයේ පාලන කටයුතු දේශපාලනමය වශයෙන් නැගෙනහිර හා බටහිර වශයෙන් දෙකඩවීම ආරම්භ විය. අධිරාජ්‍යයේ නැගෙනහිර කොටස ග්‍රීක භාෂාවට මුල්තැන දුන් අතර බටහිර කොටසේ මූලික භාෂාව ලතින් විය. ඇලරික්ගේ නායකත්වය යටතේ ක්‍රි.ව 410 දී විසිතේ නමැති ගෝත්‍රිකයින් රෝමය විනාශ කිරීම බටහිර අධිරාජ්‍යයට තදින් බලපාන්නට විය. ඊට අමතරව වැන්ඩල් හා හන්ස යන ගෝත්‍රද බටහිර අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවල බලය අල්ලා ගත්හ. අවසානයේ දි දී ක්‍රි.ව 476 පමණ වන විට මුළු බටහිර අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවල බලය අල්ලා ගත්හ. ක්‍රි. ව. 476 පමණ වන විට මුළු බටහිර අධිරාජ්‍යයම මෙම ගෝත්‍රිකයන්ගේ පාලන බලයට යටත් විය. රෝමයේ ඇතිවූ දේශපාලන අස්ථාවරබව කිතුනු ජීවිතයට බලපෑම් එල්ල කිරීම නිසා එවකට සිටි පාප්තුමන්ලා හා රදගුරුතුමන්ලා කිතුනුවන් නැතහොත් දෙවියන් වහන්සේගේ ජනතාව ශාරීරිකව හා ආධ්‍යාත්මිකව පෝෂණය කිරීමට , මග පෙන්වීමට හා ආරක්ෂා කිරීමට උත්සහ ගත්හ. මෙම කිතුනු නායකයන් අතර පළමුවන ලියෝ පාප්තුමා (ක්‍රි.ව 440- 461) ඉතා වැදගත් තැනක් ගනී. එතුමා ඇට්ටිල්ලා නමැති හන් ගෝත්‍රික නායකයාගේ පහරදීම්වලින් රෝමය ආරක්ෂා කළ අතර තවත් විටෙක ජෙනෙසෙරික් නමැති වැන්ඩල් ගෝත්‍රික නායකයාව රෝමය විනාශ නොකර එහි බලය අල්ලා ගැනීමට මෙහෙයවිය. මෙම සියලු සිදුවීම් අතර ක්‍රි.ව. හයවන සහ හත්වන සියවස පමණ වන විට ඒරියන්වාදී ඇදහිලිකරුවන් සත්‍යය කතෝලික ඇදහිල්ල කරා ගෙන ඒමට කිතුනුවන් හට හැකියාව ලැබී තිබීම සුබ වදනක් විය. ශුද්ධවූ සභා මාතාව මේ ආකාරයෙන් තමන්ව යටත් කරගත් අයව සිත් හැරීම තුළ තම ඇදහිල්ලට හරවා ගැනීම මගින් යටත් කරගත් බව ඉතිහාසය සඳහන් කරයි.

**පිලාජියානුවාදය**

ඩොනටිස්වාදයට පසු බටහිර කිතුනු සභාවේ දේව ධර්මයට දැඩි තර්ජනයක්ව පැවතියේ පෙලාජියන්වාදයයි. සැලකිය යුතු කාලයක් පුරා පැවති මෙම වේදහේදී බලපෑම ක්‍රි.ව. 412 දී දේශපාලන මැදිහත්කමකින් සභාවට ජය ගන්නට හැකිවිය. පෙලාජියස් නමැති බ්‍රිතාන්‍ය ජාතික තාපසතුමා තම වාදය තුළ මිනිසාගේ මනුෂ්‍ය ස්වභාවය ජම්ම පාපය මගින් විනාශවී ඇතැයි යන මතය තරයේ ප්‍රතික්ෂේප කළ අතර මනුෂ්‍යාට පාපයෙන් මිදී ගැලවීම අත්කර ගැනීමට දේව වරප්‍රසාදය හා අනුග්‍රහය අවශ්‍ය නොවන බවත් මනුෂ්‍යාට ක්‍රිස්තුන් වහන්සේ මෙන් යහපත් ජීවිතයක් ගතකිරීම මගින් ගැලවීම අත්කර ගැනීමට හැකියාව ඇතිබවත් තම ඉගැන්වීම් වලදී පෙලාජියස් ඉදිරිපත් කළේ ය. ඔහුගේ මතයට අනුව ගැලවීම දේව වරප්‍රසාදයෙන් තොරව මනුෂ්‍යාගේ උත්සාහයෙන් පමණ ලබා ගතහැකි දෙයක් වීම නිසා බටහිර කිතුනු සභාව විසින් පෙලාජියස්ගේ මතය තරයේ හෙළාදක්නා ලදී. පෙලාජියස්ට විරුද්ධව කටයුතු කළ අය අතර අගුස්තීනු තුමා මූලික තැනක් ගනී. ඔහු පෙලාජියස්ගේ මතය තරයේ ප්‍රතික්ෂේප කරමින් ගැලවීම බොහෝසේ රඳා පවත්නේ දේව වරප්‍රසාදය මත බවත් මනුෂ්‍යාට ඒ සඳහා කළ හැකි දේ ඉතාමත් ස්වල්ප බවත් ප්‍රකාශ කළේ ය. අගොස්තීනු තුමාගේ මතයට අනුව ගැලවීමේ ක්‍රියාවලිය තුළ ඇති මනුෂ්‍යාගේ සහභාගිකම සුළු කොට දැක්වීම නිසා ක්‍රි.ව. 529 දී ඔරේන්ජ්හි පැවති දෙවන මන්ත්‍රණ සභාව මගින් අගොස්තීනු තුමාගේ මතය සංශෝධනයකට ලක්කොට ගැලවීම සඳහා දේව වරප්‍රසාදය අනිවාර්ය වන නමුත් දේව වරප්‍රසාදය පිළිගැනීමේ දී මනුෂ්‍යයා දැක්විය යුතු අනුග්‍රහය ද අවශ්‍ය බව පහදා දුන්නේය.

**පෙරදිග සභා**

නැගෙනහිර ප්‍රදේශයේ ගිහි පැවිදි වශයෙන් වැඩි පරතරයක් නොවූ අතර සභාව හා රජය අතර ද එතරම් දුරස්ථභාවයක් නොපැවතුණි. බොහෝ අධිරාජ්‍යවාදීහු දේවධර්මවේදීන් හා සභා පාලකයන් ලෙස මෙම කාලයේ දී ක්‍රියා කළෝය. ඔවුහු සභාවට මගපෙන්වූ අතර රදගුරුවරුන් නම් කිරීම හා ඔවුන්ව නෙරපා දැමීම පවා සිදුකළහ. සභාව හා රජය අතර පැවති මෙම ඉතා දැඩි බැඳීම මුස්ලිම්වරුන්ගේ ආක්‍රමණ දක්වාම නැගෙහිර අධිරාජ්‍යය තුළ පැවතුණි.

නැගෙනහිර සභාවේ නැතහොත් බිසන්තීන සභාවේ කිතුනුවන් ඉතා තත්ත්වයෙන් උසස් හා තේරුම් සහිත නමස්කාර පිළිවෙත් ක්‍රම වැඩි දියුණු කරගත් අතර එම පිළිවෙත් ක්‍රම අද දක්වාම පවතී. එම පිළිවෙත් තුළ විශ්වාසය පිළිබඳ දේව අභිරහස්වල ශුද්ධවූ භාවයට ඉතා වැඩි අවධානයක් යොමුකර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ ජනවන්දනා උත්සව හා වත් පිළිවෙත් දැකුම්කළු ලෙස නාට්‍යමය ස්වරූපයක් ගනී. ඔවුහු තමන්ටම ආවේනික වූ ජනවන්දනා වත්පිළිවෙත් හඳුන්වා දුන්හ. මේ අතර ජෝන් ක්‍රිසොස්ටම් තුමාගේ ජනවන්දනා පිළිවෙත ඉතා වැදගත් තැනක් ගන්නා අතර එය බටහිර නැතහොත් ලතින් සභාවේ එවකට පැවති ජනවන්දනා ක්‍රමවලට වඩා

වෙනස් ස්වරූපයක් ගත්තේය. නැගෙනහිර සභාවද දේව මාතාවන්ට, සාන්තුවරයන්ට හා ශුද්ධවූ ධාතුන්ට දැඩි භක්තියක් හා වන්දනා පූර්වක ගෞරවයක් දැක්විය.

**සයවන සියවස තුළ කිතුනු සභාව**

**නව යුගයක ආරම්භය**

මෙම යුගය තුළ රෝම අධිරාජ්‍යය හ සභාව විවිධ අස්ථාවරතාවන්ට මුහුණ දුන්නේය. සයවන සියවන මුල් භාගයේ දි විවිධ හේතු නිසා සභාව තුළ පැවති දේවධාර්මික හා ආධ්‍යාත්මික නවෝදයේ යුගයට නැතහොත් සභාපියවරුන්ගේ යුගයට නැවතීමේ තිත වැටෙන්නට විය. අධිරාජ්‍යයේ බටහිර කොටස උතුරු, දකුණු හා නැගෙනහිර දෙසින් පැමිණි ආක්‍රමණික ගෝත්‍රයින්ගෙන් බේරීමට ලොකු සටනක නියැලී සිටියේය. සාමාන්‍යයෙන් සුරක්ෂිතව පැවති අධිරාජ්‍යයේ නැගෙනහිර කොටස මුස්ලිම් ආක්‍රමණ නිසා අස්ථාවරභාවයට මුහුණ දුන්නේය.

බටහිර අධිරාජ්‍යය තුළ ඒරියන්වාදීන් මර්දනය කරමින් ඔවුන්ව කිතුනු ධර්මයට හරවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භවීමත් සමග විවිධ ගෝත්‍රිකයන් විසින් යටත් කරගෙන සිටි බටහිර රාජධානීන් ඔවුන්ගෙන් ගිළිහෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 532 දී බර්ගුන්ඩියන් ගෝත්‍රික රාජධානියද, ක්‍රි.ව. 533 දී වැන්ඩල් ගෝත්‍රික රාජධානියද ක්‍රි.ව 553 දී ඔස්ත්‍රොගොත් ගෝත්‍රික රාජධානියද බිඳ වැටුණි. මීට අමතරව ක්‍රි.ව. 496 දී ක්ලොවිස් නැමැති ෆ්‍රැන්ක් ගෝත්‍රික රජු කිතුනු දහමට හැරුණු අතර ඔහු එවකට පැවැති බටහිර සභාවට බොහෝසේ සහය දැක්විය ක්‍රි.ව. 529 දී ඉතාලියේ මොන්ටෙ කසීනෝ යන ස්ථානයේ ශුද්ධවූ බෙනදික් තුමන් පිහිටවූ තාපය සංඝය නිසා යුරෝපයේ පැවති ස්වරූපය යහපත් ලෙස වෙනස් කිරීමට එය උපකාරී විය. යාච්ඤාව හා කය වෙහෙසා වැඩකිරීම යන ප්‍රතිපත්තිය තුළ ක්‍රියාත්මක වූ තාපසාරාම රෝම හා බටහිර සංස්කෘතිය රැකගැනීමේ හා සුබ අස්න පැතිරවීමේ මූලික මධ්‍යස්ථාන බවට පත්විය. පළමුවන ග්‍රෙගරි නැතහොත් මහා ග්‍රෙගරි පාප්තුමා යටතේ බෙනදිකාන නිකායේ තාපසවරු ඉතා ප්‍රබල ධර්මදූතවරු වූහ. ඔවුහු කිතුනු විශ්වාසයේ පණිවුඩකරුවෝද, බටහිර සංස්කෘතියේ ආරක්ෂකවරු හා ශිෂ්ටාචාර ජීවිත ක්‍රම හඳුන්වා දෙන්නෝද් වූහ. අධ්‍යාපනය සඳහා ඔවුන්ගෙන් සිදුවූ මෙහෙය එංගලන්තයේ ඇති ඉතා සුවිශේෂී විශ්වවිද්‍යාල වන ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් වැනි අධ්‍යාපන ස්ථාන වලින් සිදුවූ සේවයටත් වඩා වැඩි බව ඉතිහාසය පවසයි.

බෙනදිකාන නිකායට පෙර ශුද්ධවූ පැට්‍රික් තුමා (ක්‍රි.ව 461) අයර්ලන්තය තුළ කිතුනු ධර්මය ප්‍රචාරය කළ අතර දැඩි තාපස ජීවිත ක්‍රමයක් ද හඳුන්වා දුන්නේය. ශුද්ධ වූ කොලුම්බා නැමැති අයර්ලන්ත ජාතික තාපසතුමා විසින් සෙල්ටික් තාපසාරාමය ස්කොට්ලන්තයේ ඉයෝනා යන ස්ථානයේ දී ක්‍රි.ව. 563 දී ආරම්භ කරන ලදී. මේවායේ ප්‍රතිඵලයක් ලෙස සයවන සියවසේ දී බ්‍රිතාන්‍ය දූපත් තුළ බොහෝ දෙනා කිතුනු දහම වැළඳගත්හ. මෙම සියවසේ අවසානය සහා ඉතිහාසයේ මධ්‍යතන යුගයේ ආරම්භය ලෙස සැළකේ.

**හත්වන සියවස තුළ කිතුනු සභාව**

**රාජ්‍ය සහ සභාව**

දෙවන සියවස් හත සිත්හැරීම් නිසා නව කිතුනුවන් සභාවට විශාල වශයෙන් එකතුවූ යුගයක් විය. නමුත් මෙම කාලයේ දී සභාව හා රජය අතර අරගලද ඇතිවූ බව සඳහන් වේ. සභාව සහ අධිරාජ්‍යය අතර පැවති ඉතා කිට්ටු සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් ලෙස කිතුනු රාජ්‍යයක් (Christendom) ඇති වන්නට විය. මෙහිදී සභාව හා රජය අතර සම්මුතියක් ඇතිවිය. එමගින් බොහෝ වාසිදායක තත්ත්ව සභාවට උදාවූ අතරම යම් යම් අනිසි බලපෑම් නිසා පාප්තුමන්ලා හා අධිරාජවරුන් අතර ගැටුම් ද ඇතිවිය. විශේෂයෙන්ම අධිරාජ්‍යවාදීන් සභා පරිපාලනයට ඇති කළ අනිසි බලපෑම් මෙම ගැටුම්වලට හේතුවිය. උදාහරණයක් ලෙස සභා නායකයන් පත් කිරීම හා සභාවෙන් පහකිරීම යම් යම් අවස්ථාවලදී අධිරාජවරුන් කැමති ආකාරයෙන් සිදුවීම හා අධිරාජ්‍යයට විරුද්ධව පැවැති යුද්ධ සඳහා සභාවේ සහයෝගය සැමවිටම බලාපොරොත්තුවීම සඳහන් කළ හැකිය (රජය සභාව තුළ අධිකාරි බලයකින් කටයුතු කිරීම). මෙම කාලයේ දී බටහිර රෝමානු කතෝලික සභාව හා නැගෙනහිර ඕතඩොක්ස් සභා අතර ද ගැටුම් ඇතිවිය. සභාවේ නියම සත්‍ය නිල ඉගැන්වීම් වලට විරුද්ධව වෙදහේදී ඉගැන්වීම් ද හිස ඔසවන්නට විය.

**කලාව හා ආධ්‍යාත්මිකත්වය**

ඒ හා සමගාමීව ඉතා උසස් දියුණුවක් මධ්‍යතන යුගයේ ඇතිවීම නොරහසකි. ඉතා ප්‍රබල කිතුනු සාන්තුවරයන් හා උගතුන් බිහිවූ කාලයකි. කිතුනු සංස්කෘතිය කිතුනු කලාවේ , සාහිත්‍යයේ, වාස්තු විද්‍යාවේ හා දේවධර්මයේ ඇතිවූ දියුණුවේ ආභාෂයෙන් පෝෂණය විය. නව පැවිදි නිකාය බිහිවූ අතර පැවති පැරණි පැවදි පංති හා නිකාය් ප්‍රතිසංස්කරණය විය. එය සභාවට නව ජීවිතයක් ගෙන දෙන්නට විය. විටෙක මෙම යුගය තුළ සභාවේ බිඳවැටීමක් ඇති වුවද දේව අනුග්‍රහයෙන් ඒවා ජයගන්නට සභාවට හැකිවිය. දේශපාලන බලවේග සභාවට යුරෝපයෙන් පිටත ධර්මදූත කටයුතු සඳහා සීමා මායිම් පැමිණෙව්වද යුරෝපය තුළ කිතුනු සභාව ශක්තිමත් කිරීමෙහිලා එය අවස්ථාවක් විය. මුස්ලිම්වරුන්ගේ ආක්‍රමණ හමුවේ තනියම කිතුනු ඇදහිල්ල ආරක්ෂාකර ගැනීමට නැගෙනහිර සභාවටද අවස්ථාවක් උදාවිය.

**අටවන සියවස තුළ කිතුනු සභාව**

**ධර්මදූත සේවාව**

අටවන සියවස තුළද විවිධ ගෝත්‍රික ජනතාවගේ සිත්හැරීමේ කාර්යය තවදුරටත් දියත්විය. ක්‍රි.ව. 723-739 යන කාලයේ දී බෙනදිකාන නිකායට අයත් ඉංග්‍රීසි ජාතික පැවිදිවරයකුවූ වින්ෆ්‍රිඩ් නැතහොත් පසුකලෙක ජර්මනියේ අපෝස්තුලුවරයා ලෙස නම් ලත් ශුද්ධවූ බොනිෆස්තුමාගෙන් සිදුවූ ප්‍රාතිහාර්යාත්මක ක්‍රියා බොහෝ දෙනෙකුගේ සිත්හැරීමට හේතු විය. (දෙවිවරුන්ගේ වාසස්ථානයක් ලෙස සැලකූ ඉතා විශාල ගසක් තම දේවස්ථානය සෑදීම සඳහා කැපීමේදී එම දෙවිවරුන්ගෙන් කිසිම අනතුරක්

සිදු නොවීම). එතුමා යුරෝපයේ කිතුනු ඇදහිල්ල, පාප්තුමාගේ මඟ පෙන්වීම යටතේ ගොඩනඟා මිය ගියේය.

**අධ්‍යාපන සේවාව**

මහා චාර්ලස් රජතුමා අධ්‍යාපන තත්ත්වය දියුණු කිරීමට වෙහෙසවිය. මේ සඳහා ඔහු තම ලේකම්වරයා වූ ඉංග්‍රීසි ජාතික තාපස අල්කුයින්ගේ (*Alcuin*) නායකත්වය යටතේ බුද්ධිමතුන් පිරිසක් ඔහුගේ රජමාලිගාවට එක් රැස් කළේය. තම තමන්ගේ ආසන දෙව්මැදුරට යාබදව පාසැලක් ආරම්භ කරන ලෙස සෑම රදගුරුවරයකුටම රජතුමා අණ කළේය. නමුත් ඔහුගේ මරණින් පසු චාර්ල්ස් අධිරාජ්‍යයේ දෙකඩ වීම නිසා අධ්‍යාපනය නඟාලීමට ඔහු ගත් පියවර බිඳ වැටීමකට ලක්විය. තාපසාරාම වල හැර යුරෝපය පුරා බුද්ධිමය පරිහානියක් හා ආත්මික පරිහානියක් ඇතිවිය.

**නවවන සියවස තුළ කිතුනු සභාව**

**බටහිර අධිරාජයාගේ කඩාවැටීම**

මේ කාල වකවානුව වන විට බාහිර සහ අභ්‍යන්තර බලපෑම් හා නැගෙනහිරින් පැමිණි විකින්ග්ස් ගෝත්‍රිකයන්ගේ (*Vikings*) හංගේරියන් හා නැගෙනහිර හා දකුණු දිශාවන්ගෙන් පැමිණි මුස්ලිම් ආක්‍රමණ නිසා අධිරාජයාගේ බලය හිනවී තිබුණේය. මේ නිසා මහා චාර්ල්ස් රජතුමාගේ සමයේ අධිරාජ්‍යය තුළ පැවැති සාමය හා එකමුතුකම බිඳවැටී තිබුණි.

මෙම බටහිර අධිරාජ්‍යයේ බිඳවැටීම බටහිර කතෝලික සභාවේ බිඳවැටීමටද හේතුවිය. පළමු නිකුලස් පාප්තුමාගෙන් පසුව සභාව හොඳින් හා ප්‍රබලව මෙහෙයවීමට පාප්තුමකු බිහි නොවීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව 858 - 879 යන කාලය තුළ රෝමයේ පාප්තුමන්ලා හා කොන්ස්තන්තිනෝපලයේ ආදී පීතෘවරුන් අතර සභා භේදයක් (*schism*) පවා ඇති විය. පළමු නිකුලස් පාප්තුමාගේ බල තණ්හාව මෙම බෙදීමට හේතුවිය. එසේම කොන්ස්තන්තිනෝපලයේ ආදි පිතෘවරයා වූ ෆෝටියුස් (*Photius*) විසින් ෆිලියෝක්වේ (*filioque*) යන කොටස නයිසීන විශ්වාස ප්‍රකාශනයට එකතු කිරීම, ශුද්ධික්ගිනිස්ථානය පිළිබඳ සභා ඉගැන්වීම හා තවත් කරුණු සම්බන්ධයෙන් කතෝලික සභාවට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරන ලදී. මෙයද මෙම සභා භේදයට හේතුවක් විය. නමුත් පසුව ෆෝටියුස් තම චෝදනා ඉල්ලා අස්කර ගත්තේය. ඔහු එවකට සිටි නවක පාප්තුමන්ලා හා සමග එක්ව කටයුතු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. දහවන සියවන පමණ වන විට නැගෙනහිර හා බටහිර සභාවන් අතර සැළකිය යුතු එකමුතුකමක් ඇතිවිය. නමුත් සෑම ගැටලුවක්ම නියමාකාරයෙන් නිරාකරණය නොවීම පසු කලෙක එනම් ක්‍රි.ව. 1054 දී පමණ ආරම්භ වූ නැගෙනහිර හා බටහිර අතර ඇතිවූ මහා සභාභේදයට හේතු විය.

නවවන සියවස අග භාගයේදී පමණ ඉස්ලාම් ආගම නැගෙනහිර සභාව යටපත් කරමින් සිටි අතර දේශපාලන අස්ථාවරකම් හා පාප්තුමන්ලාගේ දුර්වලකම් බටහිර සභාවේ බිඳ වැටීමකට මග පෑදුවේය. සභාවේ පූජක හා පැවිදිවරුන්ව ලෞකික නායකයන් විසින් පාලනය කළ අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් නූගත් අය හා විශ්වාසවන්ත ලෙස බඹසර ජීවිතයක් ගත නොකරන අය වූහ. තාපසාරාම තමන්ට ආවේනික ජීවිත රටාවෙන් බොහෝසේ ඈත්වී ලෞකික බවට පෙරළී පරිහානිය කරා යොමු විය. සභාව තුළ පැවති මෙවැනි අඳුරු යුගවල පවා දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ දූත කාර්යය ශුද්ධ වූ සභා මාතාව මගින් ඉටු කරන්නට කටයුතු කළ සේක.

නවවන සියවස අග භාගයේ දි තාපසයන් දෙදෙනෙක් වු මෙතෝඩියස් සහ සිරිල් නැගෙනහිර යුරෝපයේ කාෂාර්ස් (Khazars) හා ස්ලැවික් ගෝත්‍රික ජනතාව අතර කිතු දහම පැතිරවීමේ දූත කාර්යයට උරදුන්හ. කිතුනු ඇදහිල්ලට අමතර නව ජනතාවක් වූ ස්ලැවික් ගෝත්‍රික ජනතාවට, සිරිල් තුමා නව අක්ෂර මාලාවක් ද හඳුන්වා දුන්නේය. එම නව අක්ෂර මාලාව හා භාෂාව තම සංස්කෘතිය ගොඩනැගීමට අවශ්‍ය වාහකයක්ද විය.

### 6.3.2 මධ්‍යතන යුගය (10 12 ශත වර්ෂ)

**දහවන සියවස තුළ කිතුනු සභාව**

**පළමුවන ඔට්ටෝ රජතුමා**

මෙය සභාවේ ආධ්‍යාත්මිකත්වය පිරිහෙමින් පැවති සමයකි. පාප්තුමා සතු නිලබලය රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන නිලතලවලට පත්ව සිටි නුසුදුසු රෝම රදළවරුන් විසින් පාලනය කරනු ලැබූහ. එයට උදාහරණයක් නම් දොළොස්වන ජෝන් පාප්තුමන්ය. (ක්‍රි.ව 955- 964). ඔහු බොහෝ ලෙස පිරිහුණු පාප්තුමකු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දෙවියන් වහන්සේ කතෝලික සභාවේ පාලනය පළමු ඔට්ටෝ නැමැති ජර්මානු ජාතිකයින්ගේ පළමු රෝම අධිරාජයාගේ අතට පත්වන්නට සැළසු සේක. ඔට්ටෝ ඇතුළු ඔහුගෙන් පසුව පැමිණි අධිරාජවරුන් කතෝලික සභාව තම අධිරාජ්‍යය තුළ සැලැස්මක් ස්ථාපිත කිරීමට ආයුධයක් කර ගත්තේය. මෙහිදී අධිරාජවරු තමන්ට කැමති ලෙස ගිහි ජනතාව සභාවේ නිලතල වලට තෝරාගත් අතර සභාවේ රදගුරුවරුන් හා පාප්තුමන්ලා පත්කිරීම ද, ඔවුනට කැමැති ආකාරයෙන් සිදු කළහ. නමුත් දේව වරප්‍රසාදය තුළ මෙලෙස ජර්මානු අධිරාජවරුන් විසින් පත්කරන ලද පාප්තුමන්ලා ඉතා යහපත් හා චරිතවත් අය වූහ. උදාහරණයක් ලෙස මෙසේ පත්වූ දෙවන සිල්වෙස්ටර් පාප්තුමා (ක්‍රි.ව 999 - 1003) සඳහන් කළ හැකි ය. ඔවුන්ගේ පිහිට එවකට පැවති බටහිර සභාවේ උන්නතියට හේතු විය.

**තාපස ජීවිතයේ ප්‍රතිසංස්කරණය -**

තාපස ජීවිත ක්‍රමය තුළ ඇතිවූ නව ප්‍රතිසංස්කරණ මෙකල සභාවේ ඇතිවූ පුනරුදයට මහත්සේ දායක විය. ප්‍රංශයෙ ක්ලූනි යන ස්ථානයේ ක්‍රි. ව 910 දී ආරම්භවූ තාපසාරාමය මෙහිදී ප්‍රධාන තැනක් ගනී. ක්ලූනි තාපස නිකාය අනෙකුත් බෙනදිකාන තාපස නිකායන්ගෙන් වෙනස් විය. බෙනදිකාන තාපසාරාම ඉතා නිදහස් ලෙස කටයුතු කළ අතර ක්ලූනි තාපසාරාම ප්‍රධාන තාපසාරාමය හා ඉතා දැඩිව බැඳී පැවතුණි. එක් එක් තාපස නිවෙස් හෝ තාපසාරාම බාරව සිටි තාපසවරු ක්ලූනිහී තාපසාරාමාධිපතිට යටහත් පහත්ව සේවය කළහ. මෙම කුඩා තාපසාරාම වල නායක තාපසවරු වසරක් පාසා ක්ලූනීහි තාපසාරාමාධිපති තුමා හා එක්ව සාකච්ඡාවක් පැවැත්වූහ. මෙම තාපස නිකාය අනෙකුත් බෙනදිකාන තාපස නිකායවලට පවා ආදර්ශයක් වූ නිසාම ක්‍රි. ව 1016 දී එවකට සිටි ශුද්ධෝත්තම පියතුමා වූ අටවන බෙනඩික්ට් විසින් ක්ලූනි තාපස නිකායට තවදුරටත් ව්‍යාප්ත වන්නට ඉඩකඩ සලාසා දෙන ලදී. පසු කලෙක මොවුන් ද යාච්ඤාවට මෙන්ම කය වෙහෙසා වැඩකිරීමට ද වැඩි තැනක් දුන්හ. ක්ලූනි තාපසාරාමය පසුව යුරෝපයේ පැවති ඉතා ධනවත්ම තාපසාරාමය බවට පත්විය.

තාපසවරුන් තම ඇබට්වරු හෙවත් නිකායේ ප්‍රධාන නායකයාව පත්කර ගත් අතර ඔහු පාප්තුමන්ට පමණක් දෙවැනි විය. ගිහියන්ට එහි කිසිම බලයක් නොවීය. ක්ලූනි තාපසාරාමයේ යහපත් ක්‍රියාකාරිත්වය නිසාම බොහෝ රදගුරුවරු සහ කුමාරවරු (කාර්දිනල්වරු) තම තමන්ගේ රදගුරු පදවි වලද ඔවුන්ගේ තාපාසාරාම පිහිටුවන ලෙස ඉල්ලා සිටියහ. මේ අතර නෙදර්ලන්තය, ඉතාලිය, ස්පාඤ්ඤය, එංගලන්තය හා ජර්මනිය වැනි රටවලින් ක්ලූනිවරුන්ට ආරාධනා ලැබිණි. ක්ලූනිවරුන්ගේ ප්‍රතිසංස්කරණ අන් තාපසාරාම වලද ප්‍රතිසංස්කරණ ඇති කිරීමට හේතුවූ අතර නව තාපස ජීවිත ක්‍රම ඇතිවීම කෙරෙහිද බලපෑවේය. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ වූ රොමෝල්ඩ් මුනිතුමන් විසින් ආරම්භ කළ කැමල්ඩොලේස් තාපස ක්‍රමය හා ශුද්ධ වූ බෲනෝ මුනිතුමන් විසින් ආරම්භ කළ කාර්තුෂියන් තාපස ක්‍රමය විශේෂ තැනක් ගනී. මෙම පුනරුදය කතෝලික සභාවේ නවෝදයක් ඇති කළ අතර ක්‍රි.ව. එකොළොස්වන සියවසේදී තාපසාරාම සභාවේ මෙම නාවෝදය ඇතිකිරීමට ඉවහල්වීම නිසා බොහෝ තාපසවරුන්ව තාපසාරාමවලින් ඉවත්කොට වවිධ පදවිවල ද නවෝදයක් ඇතිකරන අටියෙන් එම පදවිවල රදගුරුවරුන් ලෙස පත්කරන ලදී. පාප්තුමාගේ මගපෙන්වීම යටතේ ගොඩනැගුණු ක්ලූනි තාපස නිවෙස් පාප්තුමාගේම ආධ්‍යාත්මික හා සදාචාරාත්මක අධිකාරියටද නව පණක් දුන්නේය. ඉතිරි සියවස් දෙක තුළ පාප් ධුරයට පත්වූ හත්වන ග්‍රෙගරි, දෙවන උර්බාන් හා දෙවන පාස්කල් යන අය මූලිකව ක්ලූනි තාපස නිකායට අයත් වූහ.

**එකොළොස්වන සියවස තුළ කිතුනු සභාව**

එකොළොස්වන සියවසේදී ඔට්ටෝනියන් අධිරාජ්‍යයේ සිටි ජර්මන් අධිරාජවරු බොහෝ විට බටහිර සභාව පාලනය කළහ. සභාවේ ඉඩකඩම්වල අයිතිය ඔවුන් යටතේ පවත්වාගෙන ගිය අතර පාප්තුමන්ලා හා රදගුරුතුමන්ලා පත්කිරීමද ඔවුන්ගේ සිතැඟි පරිදි මේ යුගයේ දී සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෞකික බලවේග නිසා සභාවට නිදහස අහිමිවන බව එවකට සිටි පාප්තුමන්ලා හා රදගුරුතුමන්ලා තේරුම් ගත්හ.

**viii වන ග්‍රෙගරි පාප්තුමන්ගේ ප්‍රතිසංස්කරණය**

ක්‍රි. ව 1073 දි කාර්දිනල් හිල්ඩෙබ්‍රෑන්ඩ් හත්වන ග්‍රෙගරි නමින් පාප්තුමන් වශයෙන් පත්වීම ලැබීමත් සමග මේ තත්ත්වය මදකට මගහැරි ගියේය. ක්‍රි.ව. 1075 දි තමන් විසින්ම ප්‍රකාශයට පත්කරන ලද *Dictus Papae* යන ලේඛනයේ පාප්තුමන්ලා තම අධිකාරි බලය අපෝස්තුලුවරුන් මාර්ගයෙන් ක්‍රිස්තුන් වහන්සේගෙන් ලබා ඇතිබවත් එමනිසා ඔවුන් සතු බලය ඉතා උසස් බවත් එතුමා සඳහන් කළේය. හත්වන ග්‍රෙගරි පාප්තුමන්ට අනුව පාප්තුමන්ට සභාව තුළ විශ්වගත බලයක් ඇති අතර ඒ අනුව අධිරාජවරුන් පවා තම බලයෙන් පහකිරීමට හා දෙවියන් වහන්සේගේ නීතියට හා සභා නීතියට අනුකූල නොවන නීති වෙනස් කිරීමටත් ඔවුන්ට හැකියාව ඇත. පාප්තුමා සතු මෙම බලය උපයෝගී කරගෙන ග්‍රෙගරි පාප්තුමා සභාවේ සියලුම අංශ තුළ නව ප්‍රවණතාවක් ඇති කිරීමට උත්සාහ කළේය. එසේ කිරීමෙන් දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය තුළ පාප්තුමකු මාර්ගයෙන් තමන් තුළ ප්‍රතිසංස්කරණ ඇතිකර ගැනීමකට සභාවට හැකිබව අනාවරණය කළේය. එතුමා පළමුවෙන්ම බඹසර රැකීමේ පොරොන්දුවට විශ්වාසවන්තව සිටින්නට හා සිමෝනියාවේ විවිධ ප්‍රභවයන්ගෙන් බැහැරවන්නට හා කිසිම හෙයිකින් සක්‍රමේන්තු දානය කිරිමේදී මුදල් අය නොකරන ලෙසත් පූජකවරුන්ගෙන් තදින් ඉල්ලා සිටියේය. එසේ නොකරන අයට විරුද්ධව ඉතා දැඩි පියවර ගත් අතර විටෙක සමහරුන්ව සභාවෙන් පවා නෙරපා දැම්මේය. ග්‍රෙගරි පාප්තුමා කෙතරම් ප්‍රබල ලෙස කටයුතු කළාද කියතොත් එවකට ශුද්ධ වූ රෝමයේ සිටි හතරවන හෙන්රි අධිරාජයාව පවා සභා ප්‍රතිසංස්කරණය සඳහා සහය නොදැක්වීම නිසා සභාවෙන් නෙරපා දැමුවේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුව ග්‍රෙගරි පාප්තුමා හට විප්‍රවාස ගත වන්නට සිදුවූ අතර එම කාලයේදී එනම් ක්‍රි.ව. 1085 දි එතුමා මරණයට පත්විය.

තාපසාරාමවල සහයෝගය ඇතිව ග්‍රෙගරි පාප්තුමා සභාව තුළ ඉතා විශාල නවෝදයක් ඇති කළ අතර ලෞකික හා දේශපාලනමය බලවේගයන්ගෙන් සභාව නිදහස් කර දෙන්නට බොහෝ උත්සාහ කළේ ය. එතුමා සභා සම්ප්‍රදාය අනුව පාප්තුමා සතු අධිකාරි බලය හා නායකත්වය නැවත සභාවට ලබාදුන්නේය. ඔහුගෙන් පසුව එකොළොස්වන සියවස තුළ දෙවන උර්බාන් (ක්‍රි.ව 1088 - 99) හා දෙවන පාස්කල් (ක්‍රි.ව 1099 - 1118) යන පාප්තුමන්ලාද සභා නවෝදයට උර දුන්හ.

**පෙරදිග හා අපරදිග සභා අතර ඇතිවූ සභා භේදය**

එකොළොස්වන සියවස තුළ සභා ඉතිහාසය තුළ සිදුවූ අවාසනාවන්ත සිදුවීම වන්නේ ක්‍රි.ව. 1054 දී පෙරදිග හා අපරදිග සභා අතර ඇතිවූ සභා භේදයයි (*The schism between the Eastern Church and the Western Church)'*මෙම සභා භේදය ජේසු සමිඳුන් මගින් එකම ජනතාවක් හා එකම සභාවක් ඇතිකිරීමේ දේව අභිමතයට පිටුපෑමක් විය. කිතුනු සභාව, කතෝලික සභාව හා ඕර්තඩොක්ස් සභාව වශයෙන් දෙකඩ වූ අතර කතෝලික සභාවේ මෙලොව නායකයා රෝමයේ පාප්තුමාවූ අතර ඕර්තඩොක්ස් සභාවේ මෙලොව නායකයා කොන්ස්තන්තිනෝපලයේ ආදිපීතෘතුමා (*Patriarch*) විය. මෙම සභා භේදයට ප්‍රධාන හේතු දෙකකි. ඒක හේතුවක් නම් සභා නායකත්වය (*dealing with the primacy of the Pope)* වන අතර අනෙක් හේතුව දේව වේදයයි ( *dealing with the filioque*) රෝමයේ පාප්තුමාගේ නායකත්වය මුළු ශුද්ධවූ සභාවටම පොදු බව අපරදිග සභාව පිළිගත් අතර රෝමයේ රදගුරුවරයා හා කොන්ස්තන්තිනෝපලයේ ආදිපීතෘ තුමා යන දෙදෙනාම ශුද්ධවූ සභාව තුළ සම නායකත්වයක් දරණ බව පෙරදිග සභාවේ මතය වීම මෙම සභා භේදයට එක හේතුවක් විය. නයිසීන විශ්වාස ප්‍රකාශනයට කොන්ස්තන්තිනෝපලයේ ආදිපීතෘ තුමා විසින් " පිලියෝක්වේ" (*filioque*) යන වගන්තිය එක් කිරීම අනෙක් හේතුව විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම සභා දෙක අතර අන්‍යොන්‍යය ලෙස යම් යම් පුද්ගලයන්ව සභාවෙන් නෙරපා දැමීම සිදුවිය. මෙම ගැටුම ක්‍රි.ව. 1965 දී හයවන පාවුලු පාප්තුමා එවකට සිටි ඇතනගොරස් ආදිපීතෘ තුමා හමුවී සුහද ලෙස සාකච්ඡා පැවැත්වීම දක්වා පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්මනේ මෙම සභා දෙක අතර එකඟතාවක් පවතියි.

**දොලොස්වන සියවස තුළ කිතුනු සභාව**

**මුස්ලිම්වරුන්ට විරුද්ධව සභාව ගෙන ගිය කුරුස යුද්ධ** (*Cruades* )

මෙම යුගයේ දේශපාලන අරගල කිරීමට බොහෝ විට පාප්තුමන්ලාට සිදුවූයේ සභාවේ නිදහස ලෞකික බලවේගයන්වලින් ආරක්ෂා කරගැනීමටය. මෙහිදී පාප්තුමන්ලා හමුදා බලය හා යුධ ශක්තිය උපයෝගීකර ගනිමින් තම විරුද්ධවාදීන්ට එරෙහිව නැගී සිටියහ.

ඊට අමතරව මෙවැනි යුධ මෙහෙයුම් ශුද්ධවූ දේශය මුස්ලිම්වරුන්ගෙන් නැවත ලබා ගැනීමටත් කිතුනු ඇදහිල්ල හා කිතුනු වන්දනාකරුවන් ඔවුන්ගෙන් ආරක්ෂාකර ගැනීමටත් පාප්තුමන්ලා විසින් මෙහෙයවන ලදී. මෙවැනි යුද්ධ කුරුස යුද්ධ යනුවෙන් හඳුන්වන ලදී. ඉතා ශ්‍රේෂ්ට සභාපියෙක් වන ශුද්ධවූ අගොස්තීනුතුමන් විසින් ඉදිරිපත් කොට තිබූ "සාධාරණ -යුද්ධය" නැමැති සංකල්පය නිසා මෙලෙස ආගම හා ඇදහිල්ල රැකගැනීමට යුධ මෙහෙයුම් ඇතිකිරීම යහපත් දෙයක් බව එවකට සභා මාතාව සැළකුවාය. පළමුවරට කුරුස යුද්ධය මෙහෙයවූ දෙවන උර්බාන් අධිරාජයා

හුදෙක් ප්‍රශංසාව හා ලෞකික සැපසම්පත් රැස්කර ගැනීමේ අරමුණින් මෙවැනි යුද්ධයන්ට සම්බන්ධ නොවන ලෙස තම හමුදාවට අණ කළේ ය. කුරුස යුද්ධවල අරමුණ යහපත් වුවද මිනිස් දුබලකමේ ප්‍රතිඵලයක් ලෙස ඒවා ඉතා දරුණු ප්‍රතිඵල පවා ඇති කළේය. පළමු කුරුස යුද්ධයේදී අන්තියෝකියේ ග්‍රීක ආදි පීතෘතුමාව එම ස්ථානයෙන් ඉවත් කිරීම එවකට පැවති සභා භේදය තවදුරටත් උත්සන්න කිරීමට හේතුවක් වූ අතර යුද්ධය අවසානයේදී ජෙරුසලම අල්ලාගැනීමට හැකිවුවද යුද්ධයෙන් සියගණනක් අහිංසක ජනයා ද මිය ගියහ.

දෙවන කුරුස යුද්ධය ක්‍රි.ව. 1146 දී පැවති අතර එය ආසාර්ථක වෑයමක් විය. ක්‍රි.ව. 1189 දී පැවති තුන්වන කුරුස යුද්ධයේදී නැවතත් ජෙරුසලම අත්පත් කරගැනීමට හැකිවූ අතර එමගින් ශුද්ධවූ දේශයට යන වන්දනාකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට සභාවට හැකිවිය. මෙම කුරුස යුද්ධ බොහෝ විට පෙරදිග හා අපරදිග සභා අතර පැවැති සභා භේදය තව තවත් උත්සන්න කළේය.

### සභා ප්‍රතිසංස්කරණ හා සභාව මුල් වේදභේදයන්ට මුහුණ දීම

ක්‍රි.ව. 1098 දී මොලෙස්මාහි රොබට් තාපසතුමා විසින් ආරම්භ කරන ලද සිස්ටර්ශියන් තාපස නිකාය බෙනදිකාන තාපස පංතිය තුළ හා සභාව තුළ ද ආත්මීක නවෝදයක් ක්‍රි.ව. එකොළාස්වන හා දොළොස්වන සියවස්වල ඇති කළේය. මෙම නවෝදය තුළ සභාවේ කටයුතු ගැන කතාකරමින් සභාව සුබ අස්නට අනුව ජීවිතය ගත නොකරන ලෙසට විවේචනය කළ සභා විරෝධී කණ්ඩායමක් බිහිවූහ. මේ අතර වැල්දේසියන්වරු (*Waldensians*) සභාවේ ධනවාදි හා සැපවත් ජීවිත තත්ත්වය විවේචනය කරමින් දිළිඳුකම හඳුන්වා දුන්හ. සභාව සමග ගැටුණු ඔවුන්ව සභාව විසින් හෙළාදකින ලදී.

### කිතුනු දේවවේදයේ හා කිතුනු සංස්කෘතියේ සිදුවූ වර්ධනය

තාපාසාරාම තුළ ඇතිවූ නවෝදය හා ආසන දෙව්මැදුරු ආශ්‍රිතව ගොඩනැගුණු පාසැල් සභාවට නව ජීවයක් දුන්නේය. මුල් යුගයවල පැවැති විවෘත හා චතුරශ්‍රාකාර රෝම ගොඩනැගිලි ක්‍රම ක්‍රමයෙන් ඉතා උස් හා උල් ස්වභාවයක් ගන්නා ගොතික් (*Gothic*) ගොඩනැගිලි බවට පත්විය. එවකට පැවැති ක්‍රිස්තු රජාණන්ගේ ප්‍රතිමා වෙනුවට දුක්විඳින හා කුරුසියේ මරණයට පත්ව සිටින ජේසු සමිඳුන්ගේ ප්‍රතිමාවලට මූලික අවධානයක් ලැබෙන ලෙස දේවස්ථාන සකස් කරන ලදී. මෙම ප්‍රතිමා මගින් ජීවිතයේ වේදනාකාරි, ගැටුම්කාරි හා අවිනිශ්චිතතාව ඉස්මතු කර දැක්වීමට ඔවුහු උත්සාහ ගත්හ. පෞද්ගලික භක්ති අභ්‍යාසය හා වන්දනාවට මූලික තැනක් දීම නිසා සාන්තුවර භක්තිය හා දේවමාතා භක්තිය වර්ධනය විය. එසේම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට, එහි අඩංගු ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ වැඩසිටීම පිළිබඳ විශ්වාසයට හා දිව්‍ය පූජාවට සැළකිය යුතු අවධානයක් දෙන්නට පටන් ගත්හ. මෙම වන්දනා හා භක්ති අභ්‍යාස් ද විවිධ මන්ත්‍රණ සභාවලින් අනුමත කර ඒවා ධෛර්යවත් කරන ලදී.

පූප සහ මිදිරස නියමාකාරයෙන් හා සත්‍ය වශයෙන්ම ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය බවට පත්වීමේ ක්‍රියාවලිය හැඳින්වීමට දේව ධර්මය හැදෑරීමේ දි යොදාගැනෙන " ට්‍රාන්ස්සබ්ස්ටැන්සියේෂන්" (*Transubstantiation*) යන පදය මුල්වරට දේවධර්මය තුළ භාවිතයට හඳුන්වා දෙනු ලැබුවේ මෙම කාලයේදීය. මධ්‍යතන යුගයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගැනීමට වඩා එය දෙස නෙත් යොමාගෙන, අවධානය යොදාගෙන සිටීමට මූලික ස්ථානයක් හිමි විය. එසේම එසමයෙහි දිව්‍යපූජාව හුදෙක් නාට්‍යක ස්වභාවයක් ගත්තේය. ඒ සඳහා පැමිණි අය එය නරඹමින් සිටි අතර එය කිසිසේත්ම එකමුතුකමේ හා සහභාගිකමේ සක්‍රමේන්තුවක ස්වභාවයක් නොගත්තේය.

ශාස්ත්‍රීයවාදී දේවවේදයේ නැතහොත් දේවධර්මයේ (*Scholasitic Theology*) ආරම්භය හා දේවධර්මය උගන්වන පාසැල්වල (*The Theology of the Schools*) ආරම්භය දොළොස්වන සියවසේ දී සිදුවූ තවත් සුවිශේෂී සිද්ධීන් වේ. මෙම ශාස්ත්‍රාලවල අරමුණු වූයේ විශ්වාසයේ අභිරහස් හා දේවධර්මය පිළිබඳ නියම අවබෝධයක් ලබා දීමයි. ශුද්ධවූ බයිබලය, සභාපිය ඉගැන්වීම් හා දර්ශනවාදය පිළිබඳ දැනුම කැටි කොටගත් ඉගැන්වීමක් ඉදිරිපත් කිරීම ශාස්ත්‍රීයවාදී දේවවේදීන්ගේ ප්‍රයත්නය විය. ඇදහිල්ල හා විචාර බුද්ධිය (*Faith and Reason*) අතර තිබෙන්නේ එකිනෙකට පරස්පර විරෝධී තත්ත්වයක් ( *contradictory of conflicting*) නොවන බවත් එහි ඇත්තේ එකිනෙකට සහයෝගයෙන් බැඳී පවතින (*complementary*) තත්ත්වයක් බවත් ඔවුහු පෙන්වා දුන්හ. එනම් දේවධර්මය හා දර්ශනවාදය අතර පවතින්නේ සම්පූර්ණයෙන්ම පරස්පර විරෝධී තත්ත්වයක් නොවන බව ඔවුන්ගේ මූලික තර්කයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස එකොළොස්වන හො දොළොස්වන සියවස්වල ජීවත්වූ ශාස්ත්‍රීයවාදි දේවවේදයේ පියා ලෙස හඳුන්වනු ලබන කැන්ටබරිහි ශුද්ධවූ ඇන්සලම්තුමා (ක්‍රි.ව 1033-1109) දේවධර්මයට අර්ථකතනයක් ඉදිරිපත් කරමින් " දේවධර්මය යනු අවබෝධය සොයා යන ඇදහිල්ලක් " (*Faith seeking Undestanding*) ලෙස හඳුන්වා දුන්නේය. පසුව පීටර් අබෙලාර්ඩ් (*Peter Abelard*) සහ පීටර් ලොම්බාර්ඩ් (*Peter Lombard*) වැනි අයද ඉතා උසස් ගණයේ දේවධාර්මික ඉගැන්වීම් ඉදිරිපත් කළහ. මේ අතර පීටර් ලොම්බාර්ඩ්තුමන් විසින් රචිත *Book of Sentences* නැමැති ග්‍රන්ථය දහතුන්වන සියවසේදී ක්‍රමවත් දේවධාර්මික අත්පොතක් බවට පත්විය. දොළොස්වන සියවසේදී ජීවත් වූ ග්‍රාෂියන් (*Gratian*) නැමැති කමල්ඩෝල්සේ තාපසතුමා සභා ඉගැන්වීම් හා කතෝලික සභාවේ නීතිය ක්‍රමවත් කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සභා නීතියට විද්‍යාත්මක පදනමක් බිහිවිය. පාප්තුමන් අතර ඇතිවූ දේශපාලන අර්බුද හා කුරුස යුද්ධ නිසා පැණනැගුණු අහිතකර ප්‍රතිඵල අතර වුවද සභාව තුළ දේව හස්තය ක්‍රියාත්මක වූ බව මෙ සමයේ දේවධර්මයේ ඇතිවූ වර්ධනය මගින් පැහැදිළිවේ. විශේෂයෙන්ම දහතුන්වන සියවසේ දී සභාව තුළ ඇතිවූ ආධ්‍යාත්මික , සංස්කෘතික හා බුද්ධිමය නව ප්‍රවණතාවලට දොළොස්වන සියවස අගභාගයේදී සිදුවූ සභා වර්ධනය මහත් රුකුලක් විය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** 5- 9 ශතවර්ෂවල යුරෝපයේ කිතුනු ව්‍යාප්තිය ගැන කතිකාවතක් ගොඩනගන්න.

**පියවර 2-** මධ්‍යතන යුගය (10-12 ශත වර්ෂ) තුළ කිතුනු සභාව පිළිබඳව සාකච්ඡා කරන්න.

**මූලාශ්‍ර**


- ගරු සයිමන් මිහිඳුකුළ සහෝදරතුමා, සංක්ෂිප්ත කතෝලික සභා ඉතිහාසය, පුබුදු මුද්‍රණාලය, රාගම
- අතිගරු ජේ. ඇලෙක්ස් ප්‍රනාන්දු මාහිමි, අ.පො.ස උසස්පෙළ විභාගයට නියමිත ඃ නූතන කතෝලික සභාව , ඇස් ගොඩගේ සහ සහෝදරයෝ , කොළඹ 10 , 1970 සහ 2008
- WALKER Williston, a History of the Christian Church, Charles Seribner's Sons, New York. 1985.

**නිපුණතාව 7.0** : **යුරෝපය තුළ සභාව මුහුණු දුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය හදාරමින් දේව විශ්වාසය තහවුරු කරගනියි.**

**නිපුණතා මට්ටම 7.1** : යුරෝපයේ සභාව බෙදීයාම පිළිබඳ කරුණු හදාරයි.

**කාලච්ඡේද** : කාලච්ඡෙද 30

**ඉගෙනුම් ඵල** :

- මධ්‍යගත යුගයෙන් පසු පැවැති සභාවේ ස්වභාවය තේරුම් ගැනීමට හැකිවෙයි.
- ප්‍රොතෙස්තන්ත හා රෙපරමාදු විප්ලවයට හේතු විමසයි.
- ප්‍රොතෙස්තන හා රෙපරමාදු විප්ලවය පිළිබඳ ඓතිහාසික කරුණු හදාරයි.
- සභාවේ බෙදී යාම රෝමානු කතෝලික සභාවට බලපෑ ආකාරය විමසයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**7.1.1 සභාව බෙදීයාමේ පසුබිම :**

දහසයවන සියවසේ යුරෝපයේ ඇතිවූයේ ආගමික ප්‍රබෝධමත් වීමේ ව්‍යාපාරයකි. යුරෝපයේ නොයෙක් රටවල ඇතිවූ ආගමික ප්‍රගමන මෙම නව ව්‍යාපාරයට හේතු සාධක වී ඇත. මෙම කාලයේ විවිධ නව ආගමික ව්‍යාපාර ඇතිවීම සඳහා සමාජීය හා ආර්ථික අංශයෙහි ඇතිවූ නාගරිකරණය සහ වානිජවාදය මුදල් භාවිතය, මුද්‍රණ ශිල්පය, යාන්ත්‍රික ශිල්පය, මධ්‍යම පන්තියේ උදාව, වරින් වර ඇතිවූ කැරලි, පුනරුදය හා චින්තනය විප්ලවය යන සෑම අංශයක්ම බලපා ඇත.

මධ්‍යගත යුගයේ කතෝලික සභාවේ අඩු පාඩුකම් තිබුණාය යන්න නොරහසකි. කතෝලික සභාවේ මුල් යුගය හා සසඳන කළ මධ්‍යගත යුගයේ දී කතෝලික සභාව දේව ධර්මය හා චර්යාව අතින් ඉතා පහළ මට්ටමක පැවතුණි. බලතලවලට හා නොවරදින සුලු භාවයට *( Infalibility)* විරුද්ධව ද කරුණු ඉදිරිපත් විණි. ගිහි ජනතාවට ශුද්ධවූ ලියවිලි පරිහරණය කිරීමට සභාව විසින් පැණවූ සීමාවන් පවා එහි දී ප්‍රතික්ෂේප විණි. එවකට කතෝලික සභාවේ පැවති ජීවිත ක්‍රමය ද ප්‍රතිසංස්කරණවාදීන්ගේ විවේචනයට ලක්විය. ගිහි ජනයාගේ ජීවිතය පැවිදි හා පූජක ජීවිතයට වඩා පහත් යැයි යන මතය ප්‍රතික්ෂේප කළ ප්‍රතිසංස්කරණවාදීහු මරිය තුමියගේ මැදිහත්භාවය හා සාන්තුවරයන් කෙරෙහි ඇති භක්තිය හා විශ්වාසය ද ප්‍රතික්ෂේප කළහ. මධ්‍යගත යුගයේ දී කතෝලික සභාව විසින් පිළිගන්නා ලද දේවප්‍රසාද නිධාන අතරින් බව්තිස්මය නැතහොත් ප්‍රසාද ස්නාපනය හා ශුද්ධවූ සහභාගිකම නැතහොත් දිව්‍ය පූජාව ඔවුහු පිළිගත්හ. පූජකයා හා ගිහියා අතර පැවැති පරතරය නැති කරමින් කිතුනු සියල්ලන්ම පූජකවරයට දෙවියන් වහන්සේ විසින් කැඳවා ඇති බව ඔවුහු පැවසූහ. එමගින් පූජකවරුන්ගේ පාලන ග්‍රහණයෙන් ගිහි ජනතාව ඉවත් කරන්නට උත්සාහ දැරූහ. ප්‍රතිසංස්කරණවාදීන් සභාවේ තත්ත්වය වෙනස් කරන්නට

ගත් පෙරළිකාර වැයමට විරුද්ධව කතෝලික සභාවේ අන් අය චෝදනා කළ අතර එයට පිළිතුරක් ලෙස ලූතර් කියා සිටියේ ඔවුන්ගේ උත්සාහය සභාව එහි මුල් ස්වරූපය කරා ගෙනයෑම බව ය. ප්‍රතිසංස්කරණවාදී දේව ධර්මය ඇදහිල්ල තුළ දෙවියන් වහන්සේ කේන්ද්‍ර ගත කරයි. ඔවුන් අතර බොහෝ දේවවේදී අදහස් පැවතුණි.

**7.1.2 මාටින් ලූතර් ගේ විප්ලවය (ක්‍රි.ව. 14831546)**

ඔහු ජර්මන් ජාතික දේව ධර්මවේදියෙකි. ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ප්‍රගමනයේ ආරම්භකයා ද ඔහු ය. ක්‍රි.ව. 1483 නොවැම්බර් මස 10 වන දා උපත ලද ඔහු ක්‍රි.ව. 1501 දී එර්ෆට් සරසවියේ ඉගෙනුම ලබා ක්‍රි.ව. 1505 දී ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තේය. ඉන්පසු එර්ෆට්හි වූ ඔගස්ටිනියන් තාපසාරාමයේ පැවදිවරයෙක් වූයේ ය. ක්‍රි.ව. 1507 දී පූජක වරම් ලැබූ ඔහු ක්‍රි.ව. 1510 දී රෝමයේ නිල සංචාරයක් සඳහා පිටත්ව ගියේ ය. එම සංචාරයේ දී රෝමයේ එවකට පැවති දූෂණ ගැනත් සුඛෝපභෝගී ජීවන රටාව ගැනත් දැන ගැනීමට ඔහුට හැකිවිය. ක්‍රි.ව. 1512 දී ආචාර්ය උපාධිය ලබාගත් ලූතර් ඉගැන්වීමේ කාර්යයේ යෙදී සිටින අතරේ නව ගිවිසුමේ ඇදහිල්ල හා අනාගතය පිළිබඳ ඉගැන්වීම් වලට වැඩි අවධානයක් යොමු කළේ ය.

ක්‍රි.ව. 1517 ඔක්තෝබර් මස 17 වන දින ලූතර් සභාවේ අනියම් ක්‍රියා හෙළිකරමින් ලේඛනයක් ප්‍රකාශයට පත් කළේ ය. මෙහි මූලික නියාමකයන් 95 ක් අඩංගු විය. මේ අතර ප්‍රධාන වශයෙන් සභාවේ එවකට පැවති අදණ්ඩනාවසරය විවේචනයයට ලක් කළේ ය. අදණ්ඩනාවසරය යනු යම් යම් පාපාවලට නියමිත දඬුවම් වලින් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීමයි. මේ නිදහස් කිරීම් මුදල් මත කිරීමට පෙළඹී සිටීම එහි වරද වූයේ ය. ඔහු මෙය පූර්ණඵල වෙළඳාම නැතහොත් ශුද්ධ වෙළඳාම යනුවෙන් හැඳින් වූයේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1520 වසරේ ජූනි මස 15 වන දින ලූතර්ගේ ඉගැන්වීම හෙළා දකින ලදී. පසුව ක්‍රි.ව. 1521 ජනවාරි මසායේ දී පමණ ඔහුව සභාවෙන් නෙරපා දමන ලදී.

**මාටින් ලූතර්ගේ මත**

- මොන ආගමකට අයත් කෙනෙකු වුවත් දේව භක්තිය හා දේව කැමැත්ත ස්වකීය විඥානය හා සංස්කෘතිය තුළින් දැනගැනීමට අවස්ථාව ඇත.
- දේව වරප්‍රසාද ලබාගැනීමට එකිනෙකා පෞද්ගලිකව කටයුතු කළ යුතුය.
- විමුක්තිය දෙවියන් වහන්සේගෙන් ලැබෙන තෑග්ගක් විනා පින් බලයෙන් අයිතිවාසිකම් කිව හැක්කක් නොවේ.
- ලෝකය තුළ ජීවත් වනතෙක් කිතුනුවෝ පව්කරුවන් මෙන්ම සාන්තුවරයන් ද වෙති.
- සභාව තුළ හා ලෝකය තුළ පාපය පවතී.
- සාන්තුවරයා සදාචාරය පිළිබඳ උතුම් ආදර්ශයක් නොව දේව අනුග්‍රහ පිළිගත් පව්කරුවෙකි.

- යහපත් පුරවැසියකු නම් දෙවියන් වහන්සේගේ සමාව අයදින අපරාධකාරයාය.
- දෙවියන් වහන්සේ අපට හෙළිකරන ප්‍රමාණය අනුව උන්වහන්සේ ගැන අපට දැනගත හැකිවේ.

**ලූතර්වාදය**

මෙය දහසයවන සියවසේ දී පමණ ඇතිවූ ප්‍රොතෙස්තන්ත සංවිධානයකි. මෙහි ආරම්භකයා මාටින් ලූතර්ය. මෙම සංවිධානය ගොඩනැගීමට හේතු වූයේ ඔහුව සභාවෙන් නෙරපා දැමීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රෝමයේ නායකත්වයෙන් පැවති බටහිර කිතුනු සභාව දෙකඩ විය.

ලූතර්වාදය යන යෙදුම ගැන ඔහු මහත් සේ විරුද්ධ වූ අතර මෙම සංවිධානය මුලින්ම හඳුන්වන ලද්දේ එවැන්ජලිකල් සභාව හෝ අවුස්බර්ග් ඇදහිල්ලේ සභාව යනුවෙනි.
- ලූතර්වාදය ඉගැන්වීම් අතර ශුද්ධ වූ ලියවිල්ලට ඉතා උසස් ස්ථානයක් හිමි වේ.
- බයිබලීය අධ්‍යනයේ මූලික තේමාව වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය.
- යමකුට ගැලවීම ලැබෙන්නේ ඔහු සතු පින් බලයෙන් නොව උන්වහන්සේගේ තිළිණයක් වන දේව දයාව නිසාමය.
- ජන්ම පාපය නිසා සෑම මිනිසකුම පාපයේ වහල් කරුවකුව ඇත.
- මිනිසා පාපයට වහල්ව ඇති බැවින් තමන්ගේ ගැලවීම ලබාගැනීමට තමන්ට නොහැකි ය.
- ගැලවීම ලැබෙන්නේ ඇදහිල්ලෙන් නැතහොත් විශ්වාසයෙන් පමණකි.
- කිතුනු ජීවිතයේ කේන්ද්‍රස්ථානය ශුද්ධ වූ බයිබලයයි.
- දේව ප්‍රසාද නිධාන හතක් නොව දෙකකි. එනම් දිව්‍ය පූජාව නැතහොත් ශුද්ධ සහභාගිකම සහ ප්‍රසාද ස්නාපනයයි. ඔවුන්ට අනුව බයිබලයේ සඳහන් ප්‍රසාද නිධාන මේවා පමණකි.
- නමස්කාර කටයුතු කළ යුත්තේ ජනයාගේ භාෂාවලින් මිස ලතින් භාෂාවෙන් නොවේ. මේ නිසා බයිබලය ජර්මන් භාෂාවට හැරවීම.
- මිදියුෂ හා රොටී යන දෙවර්ගයම දානය කිරීම
- ජම්ම පාපය නිසා ප්‍රසාද ස්නාපනය ළදරු කාලයේ දී ලබාදීම
- සාන්තුවරයා සදාචාරය පිළිබඳ උතුම් ආදර්ශයක් නොව දේව අනුග්‍රහය පිළිගත් පව්කරුවෙකි.
- ස්ත්‍රී - පුරුෂ සියලු දෙනා දේව සේවය සඳහා පූජක කැඳවීම ලැබීම
- දේවගැති තනතුර උසස් නිලයකි.
- දේවගැති වරුන්ට විවාහ වීමට අයිතියක් තිබීම
- අපෝස්තලික සහ නයිසීන ඇදහිලි ප්‍රකාශන පිළිගැනීම

### 7.1.3 කැල්වින් හා ස්වින්ග්ලි

**ජෝන් කැල්වින් ( ක්‍රි. ව 1509 1564)**

ප්‍රංශයේ උපත ලද ජෝන් කැල්වින් (*Jean Calvin*) පැරිස් නුවරින් දේවධර්මය හා නීතිය හදාරා තම තරුණවියේදීම ලූතර්ගේ ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ප්‍රගමනයට නායකත්වය දෙන්නට ඉදිරිපත් විය. පසුව ස්විට්ස්ටර්ලන්තයේ ජිනීවා නගරයේ පදිංචියට ගිය ඔහු දැඩි නීති රීති සහිත කිතුනු ජීවිතයක් සභාවට නැවත හඳුන්වා දුන්නේය. එහි පැමිණි ස්කොට්ලන්තයේ ජෝන් නොක්ස් (*John Knox*) ක්‍රි.ව. 1513- 1572 කැල්වින්ගේ මෙම නව දේවධාර්මික පාසැල ගැන පැහැදී එහි ඉගැන්වීම් තම රටට ගෙන ගොස් ප්‍රෙස්බිටේරියන් සභාව පිහටුවන ලදී. කැලවින් විසින් රචිත ප්‍රධාන ග්‍රන්ථයක් වන්නේ ක්‍රි.ව. 1536 දී ප්‍රසිද්ධියට පත් කරන ලද " කිතුනු ආගමේ සංහිතා (*Institute of the Christian Religion*) යන ග්‍රන්ථයයි. මෙය කැල්වින් වාදයේ ස්වරූපය ඉතා හොඳින් දැනගැනීමට අපට ඇති අත්පොතකි. මෙම පොත ලිවීමේ අරමුණ ප්‍රොතෙස්තන්ත ධර්මනියාමන බයිබලයේ ඉගැන්වීම් වලට එකග බව ප්‍රංශයේ පළමුවන ප්‍රැන්සිස් රජුට (ක්‍රි.ව. 1515 - 1547) පහදා දීමය. ශුද්ධ වූ ලියවිලි විමසීම සම්බන්ධයෙන් කැල්වින්ගේ උපක්‍රම හා ක්‍රමවේද මෙම ග්‍රන්ථයෙන් දැනගත හැකිවේ. සමකාලීන මානව වාදීන්ගේ (*Humanists*) සහ වෙනත් උගත් ගුරුකුල භාවිත කළ අධ්‍යයන උපක්‍රම භාවිත කරමින් තවදුරටත් කළ පර්යේෂණවල ප්‍රතිඵල පොතේ ඊළග සංස්කරණවලට එක් කළේ ය.

කැල්වින් ශුද්ධවූ බයිබලයේ සඳහන් නොවන සෑම ඇදහිල්ලක් ම ප්‍රතික්ෂේප කළ අතර ඔහුගේ අනුගාමිකයන්ගේ විශ්වාසය ශුද්ධ වූ ලියවිල්ල මත පමණක් පදනම් කරගත යුතු බවට අනිවාර්ය කළේය. ඔහු විසින් ගොඩනගන ලද දේවස්ථාන ඉතා සරල ස්වභාවයක් ගත්තේය. ඒවා නොයෙකුත් කැටයම් වලින් තොර, සුදු පැහැති බිත්ති ඇති, අල්තාර, සුරුවම්, ආගමික පින්තූර, ඕගන් වාදන සංගීත සහ පාට වීදුරු සහිත ජනෙල් රහිත දේවස්ථාන විය. කැල්වින් ශුද්ධ වූ බයිබලය පදනම් කරගත් දේව වේදියෙකි.

ජෝන් කැල්වින් රෙපරමාදු ව්‍යාපාරයේ දෙවන පරම්පරාවට අයත් වේ. ඔහුගේ දේවවේදයේ අරමුණ වූයේ කිතුනු සිසුන් දිරිමත් කිරීමය. රෙපරමාදු සහ ප්‍රෙස්බිටේරියන් යන සභාවල නිර්මාතෘවරයා කැල්වින්ය.

**කැල්වින්වාදය (*Calivinism*)**

ඔහු විසින් ඉදිරිපත් කළ ප්‍රධාන ඉගැන්වීමක් වන්නේ ලෝකාරම්භයේ සිටම ගැලවීම ලබන සහ නොලබන අය කවුරුන් දැයි දෙවියන් වහන්සේ තීරණය කර ඇති බවයි. (*Predestination*) එහෙයින් තම ගැලවීම සඳහා මනුෂ්‍යාට තම ශක්තියෙන් කළ හැකි කිසිවක් මිහිපිට නැත. කැල්වින් තම ඉගැන්වීම් ශුද්ධ වූ

බයිබලය මත පදනම් කළේය. ශුද්ධ ලියවිල්ල දේවානුභාවය තුළ ලියැවී ඇති බව අන් රෙපරමාදු නායකයන් මෙන් ඔහු ද පිළිගත්තේය. ස්වභාවික ලෝකය තුළ දෙවියන් වහන්සේ තමන් වහන්සේව අනාවරණය කළ ද ජම්ම පාපයේ හේතුවෙන් දේව අනාවරණය නියමාකාරයෙන් තම ශක්තියෙන් වටහා ගන්නට මිනිසාට හැකියාවක් නැති බව ඔහුගේ මතයයි. ස්වාභාවික අනාවරණය නියමාකාරයෙන් දෙවියන් වහනසේගේ විමුක්තිදායක ස්වභාවය හෙළිදරව් නොකරන බවත්, ඒ සඳහා උපකාරී වන්නේ දෙවියන් වහන්සේව සෘජුව ප්‍රකාශ කරන දිවැස්වරු, අපෝස්තුලුවරු හා ක්‍රිස්තුන් වහන්සේ යන අය දේශනා කළ දේව වචනය බවත් පවසයි.

ශුද්ධ ලියවිල්ල පිළිබඳ ඔහුගේ විග්‍රහය ඔහු නිතර භාවිත කළ ශුද්ධ ලියවිල්ල පමණක් (*Sola Scriptura*) යන යෙදුමෙන් පැහැදිලි වේ. ශුද්ධ ලියවිල්ල හැදෑරීමේ දී මධ්‍යතන යුගයේ භාවිත කළ ව්‍යාංගය, අධ්‍යාත්මිකකරණය, ආචාරිකරණය, සාහිත්‍යමය වශයෙන් වූ සිව්විධ විග්‍රහය ඔහු පිළිගත්තේ නැත. ඔහුට අනුව ශුද්ධ ලියවිල්ල නියමාකාරයෙන් විග්‍රහ කළ හැක්කේ එහි ඓතිහාසික පසුබිම වටහා ගැනීමෙන් බව ඔහු පවසයි.
දේවත්වය සම්බන්ධයෙන් කැල්වින් සාම්ප්‍රදායික ත්‍රිත්වය පිළිගත්තේය. දෙවියන් වහන්සේ ස්වෛරීවන සේක. උන් වහන්සේ සියල්ලෙන් සම්පූර්ණ වන සේක. ශුද්ධ බවින් හා දැහැමි බවින් පරිපූර්ණ වන සේක. උන් වහන්සේ සාදාතනික වන අතර සම්පූර්ණ වශයෙන් ස්වාධීන වන සේක. උන් වහන්සේ සියල්ල අභිබවා යන සේක. මේ නිසා දෙවියන් වහන්සේ ස්වකීය මැවිල්ලට අභිරහසකි. උන් වහන්සේ සියල්ලේම මූලාරම්භය වන්නේ මැවුම්කාරයාණන් බැවිණි.

දෙවියන් වහන්සේ මිනිසා මවන ලද්දේ තමන් වහන්සේගේම ස්වරූපය අනුවය. දෙවියන් වහන්සේ මිනිසා සමග ගිවිසුමකට එළඹුණු අතර එහිදී දෙවියන් වහන්සේ මැවිල්ල සම්බන්ධයෙන් බලය මිනිසාට පවරා සියල්ලේ දී උන් වහන්සේට කීකරුවන ලෙස ඉල්ලා සිටි සේක. තම අකීකරුකම නිසා පාපය වැටුණු මිනිසාට ගැලවීම ලැබෙන්නේ ඇදහිල්ල මගින් පමණක් බව (*Sola Fide*) කැල්වින් පවසයි. පාපය නිසා නැතිවූ දෙව් මිනිස් සබඳතාව නැවත අත්කර ගත හැකි වන්නේ බව්තිස්ම ස්නාපනය මගිනි. පාපය සියල්ලන්ටම පොදු නිසා කුඩා දරුවන් මෙන්ම වැඩිමහල්ලන් ද බව්තිස්මය ලබා ගත යුතු වේ. ශුද්ධ සහභාගිකම ක්‍රිස්තුන් වහන්සේගේ විමුක්තිදායක ක්‍රියාව සිහිකිරීමක් වන අතර එහි දී ඇදහිල්ලෙන් යුතුව රොටී සහ මිදි යුෂ ගන්නා අයට ආශිර්වාදය ලැබේ. සභාපාලනය සම්බන්ධව කතා කරන කැල්වින් සභාපාලනය එහි ජ්‍යෙෂ්ඨයන් නැතහොත් වැඩිහිටියන් (*elders*) විසින් කළ යුතු බව පවසයි.

**ස්වින්ග්ලි (ක්‍රි.ව. 14831531)**

ලූතර් සහ කැල්වින් වැනි උන්මූල ප්‍රොතෙස්තන්ත රෙපරමාදු නායකයන්ට අමතරව තව බොහෝ දෙනා කතෝලික විශ්වාසයෙන් ඉවත්ව විවිධ සභා පිටුවාගත්හ. මේ අතර ස්විට්ස්ටර්ලන්ත ජාතිකයකුවූ ස්වින්ග්ලි ද ස්විට්සර්ලන්තයේ අගනුවර වූ සූරික් (*Zurich*) නගරයේ නව සභාවක් පිහිටෙව්වේය. ස්වාමීන් වහන්සේගේ අවසන් රාත්‍රි භෝජනය හුදෙක් සැමරුමක් පමණක් බවත් එය සිහිකිරීමක් ලෙස අප පුදන දිව්‍ය යාගය තුළ ලබන්නාවූ දිව්‍ය සත්ප්‍රසාදය මගින් සැබෑ ලෙස ක්‍රිස්තුස් වහන්සේව අපට නොලැබෙන බව ඔහුගේ මූලික ඉගැන්වීමක් විය. කෙසේවෙතත් දැඩි මතවාදී ප්‍රොතෙස්තන්ත නායකයෙක් වූ ලූතර් පවා ස්වින්ග්ලිගේ මෙම මතය ක්‍රි.ව. 1529 දි මාර්බර්ග්හි (*Marburg*) පැවැති සාකච්ඡාවක දී තරයේ ප්‍රතික්ෂේප කළේ ය. ක්‍රි.ව. 1531 දී පැවැති යුද්ධයකින් මිය ගියේ ය.

**7.1.4 එංගලන්තයේ ඇතිවූ ප්‍රගමන නැතහොත් ප්‍රතිසංස්කරණ**

රෙපරමාදු සභා අතර බොහෝ සෙයින් කතෝලික සභාවේ බාහිර ලක්ෂණ උසුලන සභාව එංගලන්ත සභාව නැතහොත් ඇන්ග්ලිකන් සභාව බව සඳහන් වේ. එංගලන්ත සභාව යනු එංගලන්තයේ අටවන හෙන්රි රජතුමා (ක්‍රි.ව. 1507-1547) සදාචාරාත්මක හා දේශපාලනමය හේතුවක් මත පිහිටවූ සභාවක් ලෙස සැළකේ. අටවන හෙන්රි රජතුමා යනු පෙර සිටි පාප්තුමකු විසින් විශ්වාසයේ ආරක්ෂකයා (*Defender of Faith*) යන විරුදාවලිය ලත් රජ කෙනෙකි. තම රජකමට උරුමක්කාරයෙක් මොලොවට බිහිකිරීමට නොහැකි වූ වරදට තම බිරිඳ වූ ඇරගොන්හී කැතරින්ව (*Catherine of Aragon*) දික්කසාද කිරීමට ගත් තීරණය ඔහුට කතෝලික සභාවෙන් ඉවත්ව යැමට හේතුවක් විය. එවකට සිටි හත්වන ක්ලෙමන්ට් නමැති පාප්තුමා රජු දික්කසාදය සඳහා අවසර ඉල්ලා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. එවකට කැන්ටබරියේ අගරදගුරුතුමාව සිටි කාර්දිනල් වොල්සේ (*Cardinal Wolsey* ) මාර්ගයෙන් කළ ඉල්ලීමෙන් ද ප්‍රතිඵලයක් නොවූ නිසා හෙන්රි රජු ක්‍රි.ව. 1529 දි කාර්දිනල් වොල්සේව තනතුරින් පහකර දමා තමාගේ හිතවතකු වූ සර් තෝමස් ටුවර් (*Sir Thomas More*) යන කතෝලික නීතිඥයා එංගලන්තයේ කුලපති ලෙස (*Chancellor of England*) පත් කර ගන්නා ලදී. නමුත් සර් තෝමස් මුවර් පාප්තුමාට යටහත් පහත් කතෝලිකයකු වශයෙන් තම මිතුරු හෙන්රි රජතුමා තමන්ට දුන් තනතුර බාරගැනීමට පෙර තමාට රජුගේ දික්කසාදය පිළිබඳ ප්‍රශ්නයට මැදිහත්වන්නට නොහැකි බව රජුට ප්‍රකාශ කර සිටියේ ය.

අවසානයේ දී ක්‍රි.ව. 1534 දී අටවන හෙන්රි රජතුමා එංගලන්ත සභාව පිහිටුවා එහි නායකත්වය ද ඔහුටම පවරා ගත්තේය. ඔහු කතෝලික සභාව හා විශේෂයෙන් රෝමය සමග ඉතා අමනාපයෙන් කටයුතු කළේ ය. සර් තෝමස් මුවර් ද තම තනතුර පිළිගැනීමේ දී එංගලන්තයේ රජු ඉදිරිපිට කළ යුතු ව තිබූ පොරොන්දු ගැනීම පවා

ප්‍රතික්ෂේප කළේය. ඔහු කළ දේ නීත්‍යානුකූල නොවුණ ද එංගලන්ත නීති ක්‍රමයේ පැවැති නිශ්ශබ්දභාවය නිසා සර් තෝමස් මුවර් එරෙහිව කිසිදු නීතිමය පියවරක් නොගත්තේය. එහෙත් හෙන්රි රජතුමා ඔහුට සමාව නොදුන් අතර පසුව ක්‍රි.ව. 1535 දී තෝමස් මුවර්ගේ හිසගසා දැම්මේය. මෙලෙස සර් තෝමස් මුවර් කතෝලික විශ්වාසය ආරක්ෂා කිරීමෙහි ලා දිවිපිදූ ප්‍රාණපරිත්‍යාගිවරයකු බවට පත්විය. පසු කලෙක රොචෙස්ටර්හි රදගුරුවරයාව (*Bishop of Rochester*) සිටි ජෝන් ෆිෂර්වද ( *John Fisher* ) හිසගසා මැරුවේය. සර් තෝමස් මවුර් තුමා හා ජෝන් ෆිෂර් තුමා පසු කලෙක කතෝලික සභාව විසින් තම සාන්තුවර භාවයට ඔසවන ලදී. එංගලන්ත සභාව මුල් කාලයේ දී පාප්තුමාගේ අධිකාරී බලය ප්‍රතික්ෂේප කරමින් කතෝලික සභාවෙන් ඉවත්ව ගිය ද පසුව කැල්වින්වාදයට හසුවී බොහෝ ලෙස ප්‍රොතෙස්තන්ත ස්වභාවයක් ගත්තේය. ක්‍රි.ව. දහසය හා දහහත්වන සියවස් වලදී එංගලන්තය තුළ කතෝලිකයෝ ඉතා දැඩි ලෙස පීඩාවට පත් කරනු ලැබූහ. පාප්තුමාට යටහත් පහත් අය දේශපාලන වශයෙන් රජයට විරුද්ධ පිරිසක් ලෙස ඔවුහු හංවඩු ගැසූ හ. නමුත් පසුව කාලයාගේ ඇවෑමෙන් එංගලන්ත සභාවෙන් වැඩි කොටසක් නැවතත් කතෝලික ස්වරූපයක් ගත්තේය. මේ අතර විශේෂයෙන්ම එංගලන්ත සභාවේ උසස් සභාවට අයත් ඇන්ග්ලිකන්වරු (*High Church Anglicans*) ප්‍රොතෙස්තන්ත ලක්ෂණ වලට වඩා කතෝලික ලක්ෂණ උසුලන ඇදහිලිවන්තයන් පිරිසක් ලෙස පෙනේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** මධ්‍යතන යුගයෙන් පසු සභාවේ පැවැති ස්වරූපය පිළිබඳව සාකච්ඡා කිරීම.

**පියවර 2** ප්‍රොතෙස්තන්ත විප්ලවය හා රෙපරමාදු විප්ලවය ඇතිවීමට බලපෑ කරුණු, ඇතිවූ ආකාරය හා එහි ප්‍රතිඵල පිළිබඳව සාකච්ඡා කිරීම.

**පියවර 3** සභාවේ බෙදී යාම රෝමානු කතෝලික සභාවට බලපෑ ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම.

**මූලාශ්‍ර** :


- අතිගරු ජේ. ඇලෙක්ස් ප්‍රනාන්දු මාහිමි, අ.පො.ස උසස්පෙළ විභාගයට නියමිත : නූතන කතෝලික සභාව , ඇස් ගොඩගේ සහ සහෝදරයෝ , කොළඹ 10 , 1970 සහ 2008

- මහාචාර්ය ජී. පී. වී සෝමරත්න, කිතු සසුනේ සංශෝධනය

- JEDIN Hubert, History of the Christian Church, Vols. I-X, Crossroad, New York. 1989.

**නිපුණතාව 7.0** : **යුරෝපය තුළ සභාව මුහුණු දුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය හදාරමින් දේව විශ්වාසය තහවුරු කරගනියි.**

**නිපුණතා මට්ටම 7.2** : ලෝකාස්වාදය සැලසීම හා සභා ක්‍රියාකාරිත්වය විස්තර කරයි.

**කාලච්ඡේද** : කාලච්ඡෙද 20

**ඉගෙනුම් ඵල** :

- පුනරුදය සහා ප්‍රතිසංස්කරණය පිළිබඳ අවබෝධයක් ලබයි
- පුනරුද යුගයේ බිහි වූ නව තාපස නිකායන් පිළිබඳව පැහැදිලි කරයි
- ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව පිළිබඳ තොරතුරු රැස්කරයි.
- පුනරුද සමයේ බිහිවු ශුද්ධවන්තයින් පිළිබඳව පවසයි.
- නූතන යුගයේ ශුද්ධෝත්තම පියවරු හා පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**7.2.1 ප්‍රතිසංස්කරණය හා පුනරුදය (ක්‍රි.ව 1500 1750) :**

- ප්‍රතිසංස්කරණවාදී සභාවල අරගලය නිසා යුරෝපා රටවල් වන ස්වීඩනය, ඩෙන්මාර්කය, ඕලන්දය , නෝර්වේ, එංගලන්තය වැනි ප්‍රදේශ මුළුමනින්ම ප්‍රතිසංස්කරණවාදී දහම වැළඳ ගත්හ.
- කතෝලික සභාවෙන් විශාල පිරිසක් වෙන්වී ගියේ ය. ශුද්ධ සභාවේ පුනරුදයක් හා වෙනසක් ඇතිවිය යුතු යැයි සභා නායකයෝ පිළිගත්හ.

**7.2.1.1 නව තාපස නිකාය හි බිහිවීම**

- මෙම කාලය තුළ කතෝලික සභාව තුළ පුනරුදයක් හා ප්‍රතිසංස්කරණයක් කිරීම සඳහා බොහෝ තාපස නිකාය බිහිවිය. එලෙසම පැවැති නිකායවල ප්‍රතිසංස්කරණ අවශ්‍ය විය. ශුද්ධ වූ සභාවේ ප්‍රතිසංස්කරණ කාර්යය ඉදිරියට ගෙනයාමට ශුද්ධවන්ත, ක්‍රියාශීලී පූජකවරුන්ගේ නායකත්වය අවශ්‍ය විය.

**ජේසු නිකාය**

- 1534 දී ශුද්ධ වූ ඉග්නාසියුස් ලොයලා තුමන් විසින් ආරම්භ කරන ලද ජේසු නිකාය මෙම කාර්යයේ පෙරමුණ ගන්නා ලදී.
- නූගත් ජනතාවට හා දිළිඳුන්ට යැයි ආරම්භ කරන ලද අධ්‍යාපන සේවය පසුව රජ කුමාරවරුන්ට හා රජවරුන්ට ලබා දෙන ලදී.
- ශුද්ධ වූ සභාවට හා ශුද්ධෝත්තම පියතුමන්ට කීකරුවීම මෙම නිකායේ විශේෂ ලක්ෂණයකි. කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා එවා ආරක්ෂා කරගැනීම මොවුන්ගේ කාර්යය විය.

- ආධ්‍යාත්මිකත්වයෙන් හා දේව ධාර්මිකත්වයෙන් පූර්ණ වූහ. ශුද්ධ වූ ඉග්නාසියුස් ලොයලා තුමන් විසින් රචිත 'ආධ්‍යාත්මික පුහුණුව' (Spiritual Exercise) නමැති ග්‍රන්ථය විශේෂ ස්ථානයක් ගෙන ඇත. ප්‍රතිසංස්කරණවාදී සභාවල පවා ප්‍රශංසාවට ලක්වූ කතෝලික විශ්වාසයේ ධර්මෝපදේශ ග්‍රන්ථය ශුද්ධ වූ පීටර් කැනීෂියස් තුමන් විසින් රචිත කෘතියකි. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ශුද්ධවූ නෝබට්, බෙලාර්මින් වැනි අය දේවධර්මාචාර්යවරු ලෙස කටයුතු කළහ.

**වින්සෙන්තියානු සභාව**

- ශුද්ධ වූ වින්සෙන්ති ද පාවලු පුනරුදය සඳහා පුරෝගාමීව කටයුතු කළ කෙනෙකි. දිළිඳුන් කෙරෙහි ගැඹුරු ආදරයක් හා කරුණාවක් දැක්වූ කෙනෙකි.
- 1626 දී ප්‍රංශ රටේ පදවි පූජකවරුන්ගේ ශුද්ධවන්තභාවය වර්ධනය කිරීම සඳහා තාපස නිකාය ආරම්භ කළේ ය. ධර්මදූත කාර්යය සඳහා වන පූජකවරුන් ගේ සභාව ( Congregation of the Priests of the missions) ලෙස ආරම්භ වූ මෙම තාපස නිකාය 'වින්සෙන්තියානු සභාව' ලෙසද හඳුන්වනු ලැබේ.
- ශුද්ධ වූ වින්සෙන්ති ද පාවුලු තුමන් දයාවේ සොයුරියන්ගේ නිකායද (Sisters of Charity) ආරම්භ කළේ ය. 1633 දී ආරම්භ කරන ලද මෙම නිකාය කාන්තාවන් අපොස්තලික සේවාවේ නියැලීම සඳහා අරඹනු ලැබූ නිකායවල ප්‍රථම නිකාය විය.

**කාර්මෙල් නිකාය**

- පලස්තීනයේ කාර්මෙල් කන්දේ ආරම්භ වූ මෙම නිකායට තපස් ජීවිතය සඳහා වන විනය රීති මාලාවක් 12 වන සියවසේ සකස් කර දෙන ලදී.
- ශුද්ධ වූ සයිමන් ස්ටොක් මෙම පැවිදි ජීවිතයේ සම්ප්‍රදාය එංගලන්තයට රැගෙන ගොස් කාර්මෙල් පැවිදි ජීවිතයට සහාය ලබා දුන්නේය.
- කාර්මෙල් නිකායේ පැවදිවරියක වූ අවිලා හි තෙරේසා තුමිය (1515-1582) තම පැවිදි නිකාය තුළම නවෝදයක් ඇති කිරීමට උත්සාහ කළා ය. දෙවියන් වහන්සේ මෙතුමියට විවිධාකාරයෙන් දර්ශනය වූ සේක. කාර්මෙල් නිකායේ ආරම්භයේ වූ තපස් දිවිය හා භාවනායෝගි contemplative දිවිය කාර්මෙල් නිකාය තුළ නැවත ඇති කරලීමට උත්සාහ කර නවෝදයක් ඇති කළා ය. " පූර්ණ දිවියකට මඟ" The way of Perfection " ඇතුළාන්ත මන්දිරය' Interior Castle නැමැති ආධ්‍යාත්මික කෘති ග්‍රන්ථාරූඪ කළා ය.
- අවිලාහි තෙරේසාතුමියගේ යොමුකිරීම හා මඟ පෙන්වීම තුළ ශුද්ධ වූ කුරුසියේ පේදුරුතුමා (1542- 1591) මෙම පුනරුදමය කාර්යයෙහි නියැලුණේය. මෙතුමා විසින් ද ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ග්‍රන්ථ ලියා ඇත.
  ඒවා නම්, කාර්මෙල් පර්වතය නැග්ම - The Ascent of Mount Carmel
  අඳුරු රාත්‍රිය -Dark Night
  ආධ්‍යාත්මික ගීතය - The Spiritual

- ප්‍රේමයේ ජීවන දැල්ල - The living flame of love
- මොවුන් දෙදෙනාගේ ආධ්‍යාත්මික ජීවිත කෘති බොහෝ දෙනාගේ ජීවිතවලට ඉමහත් සහනයක් විය. යාච්ඤාමය ජීවිතය, භාවනායෝගී යැදුම්, contemplative Prayer අත්දැකීම් කරගන්නා ආකාරය පිළිබඳ මොවුන්ගේ ආධ්‍යාත්මික නිර්මාණ බොහෝ ඵලදායී ඒවා විය.
- ආධ්‍යාත්මික ජීවිතයේ දේව සබඳතාව අත්දැකීමට බැගෑපත් කම නැතිවම බැරිය යන උපදෙසට ජේසුගේ කුඩාමල වන තෙරේසා තුමිය සාක්ෂි දරන්නීය.

**කැපුචින් නිකාය**

- 13 වන ශතවර්ෂයේ ශුද්ධවූ අසීසියේ ෆ්‍රැන්සිස් තුමන් විසින් ස්ථාපිත ෆ්‍රැන්සිකාන පැවිදි නිකායේ (පුනරුදයක්) නවෝදයක් අවශ්‍ය බව හැඟුණි.
- 16 වන සියවසේ දී අසීසියේ ෆ්‍රැන්සිස් තුමන්ගේ නීති ඉතා සූක්ෂම ලෙස පිළිපැදිය යුතු යැයි ද මුල් කාලයේ මෙම නිකායේ වූ ශුද්ධ ලියවිලි උපදේශාත්මක ජීවිත ක්‍රමය නැවත ඇති කළ යුතු යැයි මතෙඔ පස්සි Matteo Di þassi නමැති ෆ්‍රැන්සිස්කාන පැවිදිවරයොගේ නායකත්වයෙන් බොහෝ පැවිද්දෝ තීරණය කළ හ.
- මෙම නවෝදය සෙමින් සෙමින් ඉදිරියට ඇදුණි. තම ඉගැන්වීමේ සේවාවත්, තපස් ජීවිතයත් සම්බන්ධ කරමින් දිවි ගෙවූහ. රෝගීන්ට උපස්ථාන කිරීම හා දුෂ්කර ක්‍රියා කිරීම තුළින් මහන්සි වී උපයාගෙන දිවි ගෙවූහ.
- ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට විරුද්ධව ඉගැන්වූහ.

**7.2.1.2 ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (15451563) :**

- ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරු දීම සඳහා කතෝලික සභාවේ රදගුරුවරු මන්ත්‍රණ සභාවක් කැඳවීමට කැමැත්ත දැක්වූහ. කතෝලික සභාවේ ඒකීය තීරණ හා ධාර්මික පදනම ප්‍රසිද්ධ කිරීම මෙම මන්ත්‍රණසභාවේ අරමුණ විය.
- තුන්වන පාවලු ශුද්ධෝත්තම පියාණන් විසින් 1545 දී ආරම්භ කරන ලද ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ දී ගත් තීරණ
  - ශුද්ධ බයිබලය, සම්ප්‍රදාය යන දෙකම ධාර්මික සත්‍යතාවන්හි උල්පත් වන්නේ ය.
  - පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ ග්‍රන්ථ සියල්ලම දේවානුභාවයෙන් ලියන ලද ඒවා විය. ශුද්ධ ලියවිලි පාඨ දෙවියන් වහන්සේ වෙතින්ම නික්මුණු ඒවා බවත්, එබැවින් ඒවායේ අර්ථය ගෙනහැර දැක්වීමේ බලය ශුද්ධ වූ සභාවට පමණක් අයත් බව
  - දේශනා කිරීමේ බලයත්, ඉගැන්වීමේ බලයත් ශුද්ධ වූ සභාවට ක්‍රිස්තුස් වහන්සේ විසින් දානය කරන ලද ඒවාය.
  - ශුද්ධ වූ පේදුරුතුමාත්, එතුමාට පසුව අඛණ්ඩව පැමිණෙන ශුද්ධෝත්තම පියවරු ශුද්ධ වූ සභාවේ නායකත්වය දරති. ශුද්ධෝත්තම පියතුමන් නොවරදින සුලු භාවයේ වරම ලද කෙනෙකි.

- වල්ගේට් Vulgate යැයි හඳුන්වනු ලැබූ ශුද්ධ වූ බයිබලය ශුද්ධ වූ සභාවේ අනුමැතිය ලද කෘති වේ.
- ප්‍රසාද නිධාන හතම ක්‍රිස්තුස් වහන්සේ විසින්ම ස්ථාපනය කරන ලද ඒවා විය.
- දිව්‍ය යාගය, කල්වාරි යාගය, නිරය, සාන්තුවර බැතිය, ශුද්ධ වූ ප්‍රතිමා තැබීම, පූර්ණ ඵල ආදිය ශුද්ධ වූ සභාව විසින් පිළිගන්නා ලදී.
- විවාහය සක්‍රමේන්තුවකි. විවාහ බන්ධනය සදාකාලිකය.
- විශ්වාසයේ ඵලයන් වන යහපත් ක්‍රියා තුළින් ප්‍රකාශ වන විශ්වාසය නිසා මිනිසා විනිශ්චයකාරයකු වේ.

**මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදමය ව්‍යාපෘති**

- පූර්ණඵල ලබාදීම පිළිබඳ දේශනා කරන ක්‍රමය ඉවත් කිරීම
- මරියතුමිය හා ශුද්ධවන්තයින්ට නියමිත පරිදි ගෞරව කිරීමට උනන්දු කරවීම.
- පූජක පුහුණුව සඳහා සෑම පදවියකමට සෙමනේරියක් (දෙව්සත්හලක්) ආරම්භ කිරීම.
- කතෝලිකයින් සතියකට වරක්වත් දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම
- නිතර නිතර සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ඒ මගින් පව් සමාව ලබා ගැනීම.
- දිව්‍ය සත් ප්‍රසාද වන්දනාව හා දිව්‍යා සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගැනීමට උනන්දු කරවීම.

- ශුද්ධ වූ සභාවේ ධර්මෝපදේශකයින් සඳහා " ත්‍රිදෙන්තීනු ධර්මෝපදේශය" නැමති කෘතිය 5 වනපියුස් Pius v) ශුද්ධෝත්තම පියතුමා 1566 දී ප්‍රකාශයට පත් කළේ ය.

**7.2.2 නවීන යුගය (1750 සිට)**

**7.2.2.1 ප්‍රංශ විප්ලවය (17891795)**

1788 දී මහත් ආර්ථික දුෂ්කරතා ඇතිවිය. ගොයම් පාළුවීම හේතුවෙන් සාගතය ඇතිවී ජනතාව කුසගින්නේ මියැදුනහ. ජීවන බර දැරිය නොහැකිව දිළිඳු ප්‍රජාව හා කම්කරුවෝ රටේ නීති ක්‍රමය සංශෝධනය කළ යුතු යැයි පවසමින් විප්ලව කළහ. සමහර පහළ ස්ථරයේ පූජකවරු හා ප්‍රභූවරු ඔවුන් සමග එක් වූහ.

රටේ ජනතාවගේ කැමැත්තට පාලනය කළ යුතුය යන රූසෝගේ අදහස මෙයට හේතු කාරකයක් විය. එකල රට පාලනය කළ ලුවී රජ තුමන්ව මැරූහ. ජනරජ ක්‍රමයට විරෝධය පෑ දහස් ගණන් ප්‍රභූවරුන් , පූජකවරුන් හා පැවිද්දන් මරනු ලැබූහ. ප්‍රභූවරෑ හා ඉඩම් හිමි විශාල පිරිසක් රටින් පිටුවහල් වූහ. අනෙකුත් අය තම පාරම්පරික උරුමය අත් හැරියෝය..

පැවති තත්ත්වය සමතයකට පත් කිරීම සඳහා ප්‍රංශ රටේ නීති සභාව වන ස්ටේට්ස් ජෙනරල් (States General) 1789 මැයි 5 වන දින ලෙර්සෙයිල්සිල් හි රැස්ව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනගන ලදී.

මෙම නීතිය නොපිළිගත් රදගුරුවරුන්ට හා සිය ගණන් පූජකවරුන්ට බලපෑම් කළහ. සමහරු මරනු ලැබූහ. තවත් සමහරු රටින් පිටුවහල් කරනු ලැබූහ. 1793 දී ප්‍රංශයෙන් කිතුදහම තුරන් කළ යුතු යැයි වෘත්තීය උත්සව, දැනුම මංගල්‍ය, යහගුණ මංගල්‍ය යැයි උත්සව සමරමින් කිතුනු මංගල්‍ය දින හා ඉරු දින වන්දනාවට බාධා පැමිණවූහ. ප්‍රසිද්ධ දේවස්ථානයක් වන නෝට්‍ර ඩෑම් Notre Dame දේවස්ථානයේ අල්තාරය මත ගණිකාවක් සිටුවා 'මැය සාමාන්‍ය දැනුමේ දෙවියා " යැයි වන්දනා කළහ.

- 1797 දී නැපෝලියන් අධිරාජයා ලෙස පත්වූ පසු, 6 වන පියුස් ශුද්ධෝත්තම (Pius vi) පියතුමා සමඟ ගිවිසුමක් අත්සන් කොට ශුද්ධ සභාවෙන් බොහෝ ඉඩම්, රටවල් හා මිළ අධික අතින් ලියන ලද ග්‍රන්ථ පිටපත්, කලා වස්තූන් ලබා ගත්තේය. 1798 දී රෝමයේ ප්‍රංශ ජාතිකයකු මරනු ලැබීම අළලා රෝමය අල්ලාගෙන ශුද්ධෝත්තම පියතුමන්ගේ වස්තු පැහැර ගෙන වැනීසියට ශුද්ධෝත්තම පියතුමන්ව පිටුවහල් කරනු ලැබීය. 1799 දී මෙතුමා ස්වර්ගස්ථ විය.

- නැපෝලියන් , ශුද්ධෝත්තම පියතුමාණන් වන 7 වන පියුස් පාප්තුමන් (Pius vii) සමග 1882 දී ගිවිසුමක් අත්සන් කොට ශුද්ධ වූ සභාවේ අයිතීය නැවත ලබා දුන්නේය. දේවස්ථාන විවෘත කරනු ලැබීය. පැවිදි නිකාය තම සේවාවන් ආරම්භ කළෝ ය. කතෝලික දහම ප්‍රසිද්ධියේ පිළිගනු ලැබීය.

- නමුත් නැපෝලියන් ඒකාධිපති පාලකයකු ලෙස වෙනස් වී, රෝමය පළාත් අගනුවර කර ශුද්ධ වූ සභාවට නැවත බලපෑම් කිරීමට පටන් ගත්තේය. නමුත් 7 වන පියුස් ශුද්ධෝත්තම පියතුමා නොබියව නැපෝලියන්ට විරුද්ධ වී ශුද්ධ වූ සභාව ආරක්ෂා කළේ ය. 1815 දී වොටර් ලූ water Loo යුද්ධයෙන් නැපෝලියන් පරාජය වූ පසු ශුද්ධ වූ සභාව නිදහසේ ප්‍රංශය තුළ ව්‍යාප්ත වන්නට පටන් ගැනුණි.

7 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ගේ කාලය නව පැවිදි නිකාය ආරම්භ විය. මාරියනිස්ට්ස් Marianists. මාරිස්ට් Marist ද ලාසල් සහෝදරවරු Christian Broteß. දයාවේ සොහොයුරියෝ Sister of Charity. ලොරෙට්ටෝ පැවිදි සොයුරියෝ Sister of Loretto පෝලිස්ට්ස් Paulists, සැලේසියානු නිකාය Salesians දේව වචනයේ සභාව Society of Divine Word, සුදු පියවරුන් White Fathers යන මෙම පැවිදි නිකාය ධර්මදූත කාර්ය, සමාජ සේවය, අධ්‍යාපන, එඬේරිය සේවය වැනි කාර්යයන් හි නිරත වී ශුද්ධ වූ සභාවට නව ජීවයක් හා නවතාවක් ලබා දුන්හ. 1815 දී විශ්වාසය පැතිරිවීමේ සභාව ස්ථාපනය කළේ ය.

**7.2.2.2 පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව (18691870)**

- 1869 දෙසැම්බර් 8 වන දින පළමු වතිකානු මන්ත්‍රණ සභාව රෝමයේ දී රැස්වුණි.
- ශුද්ධ වූ සභාවේ මූලික සත්‍යතාවන්. දෙවියන් වහන්සේ ජීවමානයි යන අදහස ස්වභාව ධර්මයත් දෙවියන් වහන්සේත් දෙවියන් වහන්සේගේ ප්‍රකාශනත්, සාමාන්‍ය බුද්ධිය හා දේව එළිදරව්ව අතර ඇති සම්බන්ධතාව වැනි ඉගැන්වීම් ඩෙයි ෆීලියුස් (Dei Filius) නමැති ප්‍රථම අදහස් මාලාව ප්‍රකාශ කරන ලදි.

- ශුද්ධෝත්තම පියතුමා නායකත්වය ගෙන ශුද්ධවූ පේදුරු තුමාගේ ශුධාසනයේ යේ සිට ධාර්මික පදනම ප්‍රකාශයට පත් කරන විට නැතහොත් පහදන විට ශුද්ධාත්ම වරමින් සත්‍ය කථා කරයි. ශුද්ධෝත්තම පියාණන්ගේ නොවරදින සුලු ස්වභාවය infallibility යැයි එය හඳුන්වනු ලැබේ. ඒ සමඟ ම ශුද්ධෝත්තම පියතුමන්ගේ නායකත්වය Primacy පිළිගන්නා ලදී.

- 1870 දී ප්‍රංශ - බෘ‍ෘසිය අතර යුද්ධය ආරම්භ වූ නිසා මන්ත්‍රණ සභාව අත් හිටවන ලදී. මේ නිසා ශුද්ධ වූ සභාවේ සේවය, ගිහියන්ගේ හා පැවිද්දන්ගේ තත්ත්වය යන්න පිළිබඳව සාකච්ඡා කළ නොහැකි විය.

- නමුත් 18 වන සියවසේ දී අඩපණ වූ ශුද්ධෝත්තම පිය තනතුරත්, ආත්මික අධිකාරියත්, 19 වන සියවසේ. මැද භාගයේ අති මහත් ආත්මික හා ශීලධාර්මික අධිකාරියත් (Spiritual and moral) ශුද්ධෝත්තම පියතුමන්ට නැවත ලබා දෙන ලදි.

**7.2.2.3 විශේෂිත ශුද්ධෝත්තම පියවරු (1878 1963)**

13 වනලියෝ **ශුද්ධෝත්තම පියතුමා** (Leo xiii 1878- 1903)

- ශුද්ධෝත්තම පිය නායකත්වයත්, ශුද්ධ වූ සභාවේ බලයත් නූතන යුගය තුළ නැවත ලබා ගැනීමට උත්සාහ දැරීය.

- ශුද්ධෝත්තම පියතුමන්ගේ නොවරදින සුලු භාවය නොපිළිගත්තවුන් තනතුරුවලින් පහ කළේ ය. එකල වූ දූෂණ මොනවාදැයි දැනගැනීම කෙරෙහි තම සිත යොදවා ප්‍රයෝජනවත් විවිධ අපෝස්තලික ලිපි ලිව්වේය.

- විශ්වාසය හා බුද්ධිවාදය, ශුද්ධ වූ සභාව හා රජය, සමාජවාදය භයානක බව, විවාහයේ ශුද්ධත්වයත්, අයිතිය හා බලය, කම්කරු අයිතිවාසිකම් වැනි විෂයය ඇතුළත් කොට මෙතුමා බොහෝ විශ්ව ලේඛන නිකුත් කරමින් ශුද්ධ වූ සභාවට මඟ පෙන්විය.

- දේව ධර්මවේදියකු වූ මෙතුමා දේවධර්මය පිළිබඳ අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ සිදු කළේ ය. ශුද්ධ වූ ඇක්වායිනස් තුමන්ගේ දේවධර්මය උගත යුතු යැයි පැවසීය. විද්‍යාත්මකව ශුද්ධ බයිබලය හැදෑරීමට මඟ පෑදීය. වතිකාන ලේඛනාගාරය සැම දෙන භාවිත කළ හැකි යැයි දන්වා, අධ්‍යාපන ගවේෂණවලට තම සහය දැක්වීය.

- මෙතුමා ප්‍රජාතන්ත්‍රවාදයට සහය දැක්වූ හෙයින් බොහෝ රටවල් සමග සබඳතා පැවැත්විය. කතෝලිකයින්ට හොඳින් සළකන ලෙසට රුසියාවෙන් ඉල්ලීය.

- " වෙහෙසන මිනිස්සු' යැයි හඳුන්වනු ලබන " රේරුම් නොවාරුම්' Rerum Novarum යන විශ්ව ලේඛන මගින් කම්කරුවන්ට සාධාරණ වේතනයක් හා අයිතිවාසිකම් ලබාදීම කිතුනුකම බව පහදා දුන්නේය.

- 1902 රෝමයේ ශුද්ධ බයිබලීය කොමිසම ස්ථාපනය කළේ ය.

**11වන පියුස් ශුද්ධෝත්තම පියතුමා** (Pius XI 1922 - 1939)

- 11 වන පියුස් ශුද්ධෝත්තම පියතුමාගේ කාලය පීඩා අධික කාලයක් විය.
- ඉතාලියේ බෙනිටෝ මුසොලිනිගේ පැසිස්ට් වාදයට මුහුණ දී ශුද්ධ වූ සභාව ආරක්ෂා කළ යුතු විය. ශුද්ධ වූ සභාවේ පාරම්පරික උරුමය රජයට පවරාදීමට ශුද්ධෝත්තම පියතුමා අකමැති වූයේ ය. නිදහස් සීමාවක නිදහසේ පාලනය කිරීම ශුද්ධ වූ සභාවේ සැබෑ නිදහස යැයි පැවසීය. මුසොලිනි ශුද්ධෝත්තම පියතුමාගේ මෙම අදහස පිළිගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඉතාලි රජය හා ශුද්ධෝත්තම පියතුමා අතර 1929 පෙබරවාරි 11 වනදා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ගිවිසුම ලතරානු ගිවිසුම (Lateran Ttreaty) යැයි හඳුන්වනු ලැබේ.

- ලතරානු ගිවිසුමට අනුව වතිකානය ස්වාධීන රටක් ලෙසත්, මධ්‍යස්ථ රටක් ලෙසත්, එම රජ ශුද්ධෝත්තම පියතුමන් යැයිද දන්වනු ලැබීය. තවද ඉතාලි රටේ දහම, කතෝලික දහම යැයිද ශුද්ධත්වය හිමි ශුද්ධෝත්තම පියතුමන්ට පහරදෙන. පහරදීමට උත්සාහ කරන, අවමන් කරන අය දැඩි දඬුවම් ලැබිය යුත්තන් බවද ගෙනහැර දැක්විණ. ඉතාලි පාසල්වල ධර්මෝපදේශය ස්ථිරව ලබාදිය යුතු බව පිළිගන්නා ලදී. ශුද්ධ වූ සභාවේ නීතියට අනුව සිදුවූ විවාහ රජය පිළිගන්නා ලදී.

- අධ්‍යාපනය ලබාදීම රජයේ අයිතිය යැයිද මුසොලිනි ප්‍රකාශයට පත්කළ විට ශුද්ධෝත්තම පියතුමා එය දැඩිව හෙළා දැක්කේය. " තරුණයින්ගේ කිතුනු අධ්‍යාපනය'' පිළිබඳව 1929- දෙසැම්බර් 31 වන දින මෙතුමා ලියූ අපොස්තලික

ලිපියේ විස්තරාත්මකව කරුණු පෙන්වාදී ඇත. සියලුම කතෝලික තරුණයින්ට කතෝලික අධ්‍යාපනය ලබාදීම සභාවේ අයිතියයි. තමන්ට කතෝලික පාසල් අවශ්‍යයැයි කතෝලිකයන් කරන උද්ඝෝෂණයට බලපෑම් සුදුසු නැත. හොඳ කතෝලිකයන් හොඳ පුරවැසියන් වේ. රජයටද කීකරු වෙයි. මෙවැනි උසස් තරුණ පරපුරක් ඇති කිරීම සිදුවන්නේ කතෝලික පාසල් මගින් යැයි මෙම ප්‍රකාශනයේ සඳහන් කර ඇත.

- හිට්ලර්ගේ නාට්සි වාදයට විරුද්ධව සටන් කළ යුතු විය. 1933 දී හිට්ලර් සමග ශුද්ධෝත්තම පියතුමා ගිවිසුමක් ඇති කරගත්තේය. කතෝලිකයන්ට ජර්මනියේ ජීවත්වීමේ අයිතිය ඇති බව පෙන්වාදීම මෙහි අරමුණයි. මේ ගිවිසුම වැඩි කාලයක් නොපැවැතුණි. හිට්ලර් ශුද්ධ වූ සභාවට එරෙහිව ගොස් ජුදයින් මරා වැළලුවේය.

- 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන්ගේ 'වෙහෙසන මිනිස්සු' 'රේරුම් නොවාරුම්' විශ්ව ලේඛනය ප්‍රකාශයට පත් කර 41 වන වර්ෂ පූර්ණය සැමරීමට කම්කරුවෝ රෝමයට ආහ. මූලධනය, ආදායම උපයා ගැනීම පිළිබඳව මෙතුමා ක්වාඩ්රාජෙස්සිමෝ අන්නෝ Quadragessimo Anno නමැති විශ්ව ලේඛනයෙන් බල කළේ ය. යැදුම්, සේවා, පරිත්‍යාග තුළින් සමාජයේ යහපත සඳහා කම්කරුවන් කටයුතු කළ යුතු ය. ආර්ථික ප්‍රතිපත්ති කාලනුරූපීව නීතිමය පදනමින් කම්කරුවන්ට හා මුදලාලි වරුන්ට ප්‍රයෝජනවත් වන ආකාරයට වෙනස් කර සකස් කරනු ලැබේ. කොමියුනිස්ට් වාදි සමාජවාදියකුගේ අදහස් කිතුනු ඇදහිල්ලට පටහැනි බැවින් කතෝලිකුට එකම අවස්ථාවේ සැබෑ කතෝලිකයකු ලෙසත් සැබෑ කොමිනියුස්ට්වාදියකු (සමාජවාදියකු ) ලෙසත් කටයුතු කළ නොහැකි යැයි මෙම ප්‍රකාශනයෙන් පෙන්වා දී ඇත.

- කිතුනු ඒකත්වය සඳහා සියලුදෙනාම ක්‍රියාත්මක වියයුතු යැයි ආරාධනා කළේය. කිතුනුවන්ගේ රාජ්‍යය මගින් පමණක් සැබෑ නිදහසත් සැබෑ සතුටත් ඇතිවේයැයි බලකරමින් ක්‍රිස්තු රජාණන්ගේ මහා මංගල්‍යය කතෝලික සභාව සැමරිය යුතු යැයි ප්‍රකාශයට පත්කළේ ය.

23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා (John xiii 1958 -1963)

- ශුද්ධ වූ සභාවේ උත්කෘෂ්ට බව ලොවට විදහා පෑවේය. මනුෂත්වයෙන් පූර්ණ කෙනෙකු ලෙස ධර්මය පිළිබඳ උනන්දුවෙන් පිරි කිතුනු ඒකත්වය වෙනුවෙන් මිනිසාගේ යහපත වෙනුවෙන් හා ලෝක සාමය වෙනුවෙන් තමන්ව කැපකර සේවය කළේ ය.

- කිතුනු ඒකත්වය නමැති සංගමයේ පෙරමුණගත් කෙනෙකු විය. ශුද්ධෝත්තම පියතුමන්ගේ සාකච්ඡා, ප්‍රතිපත්ති , ප්‍රතිසංස්කරණ සභා ශුද්ධ වූ සභා අතරේ වූ භේද භින්න සමතකයට පත් කරනු ලැබීය. කිතුනු ඒකත්වයට ස්වාධීන ලේකම් කාර්යාලයක් ඇති කළේ ය.

- 'මව සහ ගුරුවරිය' Mater Et Magistra නමැති විශ්වලේඛනය මගින් මිනිස්කමට ගරු කළ යුතු යැයි ද දිළින්දන්, ධනවතුන් උසස් පහත් භේදය තුරන් විය යුතු යැයි ද පැවසීය " ලෝක සාමය'' Pacem in Terris නමැති විශ්වලේඛනයේ ඒක පුද්ගල වටිනාකමත් නිදහසත් අවධාරණය කර යහපත් මිනිසුන් එක් වුවහොත් යහපත් සාමයෙන් පිරි සමාජයෙක් ගොඩනැගේ යැයි සඳහන් කළේය.

- ශුද්ධාත්ම බලයෙන් පොළඹවනු ලැබූ ශුද්ධ වූ සභාව මෙම කාලයට අනුව මග පෙන්වන්නට ඉතිහාසයේ මන්ත්‍රණ සභාවක් කැඳවීමට ඇති බව දැන්වීය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව යැයි හඳුන්වනු ලබන මෙම මන්ත්‍රණ සභාව ශුද්ධවූ සභාවේ ගුණාංග පිළිබඳවත් රදගුරුවරුන් , පූජකවරන්, ගිහියන් කුමන ආකාරයකින් ශුද්ධ වූ සභාවේ අභිවෘද්ධියට දායක විය හැකි දැයි නිර්ණය කරන ලදී.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

| | |
|---|---|
| 1 පියවර | පුනරුදය හා සභා ප්‍රතිසංස්කරණය පිළිබඳව කතිකාවතක් ගොඩනගන්න. |
| 2 පියවර | ක්‍රි.ව 1750 සිට පටන් ගන්නා නූතන යුගය තුළ සභා ක්‍රියාකාරිත්වය පිළිබඳ සාකච්ඡා කරන්න. |

**මූලාශ්‍ර**


1. අතිගරු ජේ. ඇලෙක්ස් ප්‍රනාන්දු මාහිමි, අ.පො.ස උසස් පෙළ විභාගයට නියමිත් : නූතන කතෝලික සභාව, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10 , 1970 සහ 2008

2. මහාචාර්ය ජී.පී.වී සෝමරත්න, කිතු සසුනේ සංශෝධනය සාකච්ඡා කිරීම.

නිපුණතාව 7.0 : **යුරෝපය තුළ සභාව මුහුණදුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය හදාරමින් දේව විශ්වාසය තහවුරු කරගනියි.**

**නිපුණතා මට්ටම 7.3** : ලෝකයට සභාවේ දායකත්වය පැහැදිලි කොටගෙන ජනතාවගේ උන්නතිය සඳහා කැපවෙයි.

**කාලච්ඡේද** : කාලච්ඡෙද 10

**ඉගෙනුම් ඵල** :

- අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම පිළිබඳ අවබෝධයක් ලබා ඒ පිළිබඳව කතා කරයි.
- විද්‍යාව හා තාක්ෂණික දියුණුව කෙරෙහි සහය දැක්වූ කිතුනු විද්‍යාඥයින් මෙන් තමා ජීවත්වන සමාජය තුළ සමාජ සේවය කිරීමට ඉදිරිපත් වෙයි.
- කොන්ස්තන්තීනු අධිරාජයා නිදහස දීමත් සමඟම දේවස්ථාන ගොඩනැගිලි ක්‍රමය ක්‍රමවත්ව ආරම්භවූ බව දැන ගනියි.
- මුල් කිතුනුවන් යුකරිස්තිය සඳහා භාවිත කළ කිතුනු සංකේත ක්‍රිස්තියානි චිත්‍ර කලාවේ ආරම්භක චිත්‍ර බව පිළිගනියි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**7.3.1 අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම :**

රෝම අධිරාජ්‍යයේ පිරිහීමත් සමග ඇතිවූ දේශපාලනික අරගල හා යුධමය වාතාවරණය නිසා යුරෝපයේ දැනුම පුපුරායාමේ ප්‍රවණතාව ඉතා පහත් තත්ත්වයක පැවතුණි. එසේ වුවත් කිතුනු පූජකවරුන් තමන්ට අවශ්‍ය දැනුම යම් මට්ටමකින් පෝෂණය කිරීමට උනන්දු වූහ. මධ්‍යතන යුගය තුළ අක්ෂර ඥානය, ප්‍රාථමික අධ්‍යාපනයේ පැතිරීම, විශ්වවිද්‍යාල බිහිවීම හා පැතිරීම, පුරාතන රෝම - ග්‍රීක දැනුමත් ඉස්ලාමීය දැනුමත් යුරෝපය තුළට ගෙන එන ලදී. ඒ නිසා බටහිර පඩිවරුන්ගේ චින්තනය තුළ වර්ධනයක් ඇතිවීම ප්‍රධාන කරුණකි.

ක්‍රි.ව. 800 දී පමණ චාල්ස් මේන් රජකාලයේ, එතුමන්ගේ නියෝගය පරිදි සෑම දෙව් මැඳුරක්ම, තාපාසාරාමයක්ම අයත් ප්‍රදේශවල ප්‍රාථමික පාසල් ආරම්භ කළ යුතු විය. මේ අනුව බටහිර යුරෝපයේ විවිධ ප්‍රදේශවල පාසල් හා පුස්තකාල විවිධ තාපසාරම ආශ්‍රිත ප්‍රදේශවල ස්ථාපනය කරන ලදී. නමුත් වෛකිං (Viking) වරුන්ගේ යුධමය කටයුතු නිසා ප්‍රාථමික අධ්‍යාපනයේ ඇතිවූ වර්ධනයට මහත් බලපෑමක් විය. නමුත් ප්‍රාථමික අධ්‍යාපනය සමහර තාපසාරාම හා ආසන දේව්මැඳුරු ආශ්‍රිතව වර්ධනය විය. නමුත් ක්‍රි.ව. 1050 දක්වා බටහිර යුරෝපයේ ප්‍රාථමික අධ්‍යාපනයේ තත්ත්වය හා පැතිරයාම ඉතා අවම තත්ත්වයක පැවතුණි. නමුත් 11 වන සියවසේ ඇතිවූ ආගමික ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස ආසන දෙව්මැඳුරු ආශ්‍රිත පාසල් වල (Cathedral)

නිදහස් අධ්‍යාපනය ලබාදුණි. කැන්ටබරි (Cantabary) චාර්ටස් (Chartes) හා පැරීසිය (Paris) යන ස්ථාන නිදහස් අධ්‍යාපනය (Liberal Arts) ලබාදෙන අධ්‍යාපනයේ ප්‍රධාන සන්ධිස්ථාන විය.

ගිහි ජනතාව සඳහා වන පාසල් ඇතිවීමත්, ගිහි ජනතාවට අධ්‍යාපනය ලබාදුන් ශුද්ධවූ සභාවේ පාසල්වල ක්‍රියාකාරිත්වයත්, ගිහි ජනතාවගේ අධ්‍යාපනය විශාල වශයෙන් වර්ධනය කිරීමට මඟ පෑදීණි.. යුරෝපා ඉතිහාසයේ උසස් මධ්‍යතන යුගයේ ඇතිවූ අධ්‍යාපන සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාල යුරෝපය තුළ බිහිවිය. වෛද්‍ය විද්‍යාවට මුල් තැන දුන් සලෙර්නො (salerno) හා නීති අධ්‍යාපනයට මුල්තැන දුන් බොලොඤ්ඤ විශ්වවිද්‍යාලය විශේෂ විය.

12 වන ශතවර්ෂයේ මැදභාගයේ දී පැරිස් විශ්වවිද්‍යාලය බිහිවිය. පැරීසියේ රදගුරුතුමන් විසින් මෙය විශ්වවිද්‍යාලයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර විවිධ ආයතන හා පීඨවලින් එය සමන්විත විය. 13 වන ශතවර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාල පීඨ 4 කට බෙදා වෙන් කරන ලදී. ඒවා නම් දේව ධර්ම පීඨය, වෛද්‍ය පීඨය, සභානීති පීඨය හා කලා පීඨය ය. ක්‍රිස්තියානි දේව ධර්මය, ග්‍රීක, ඉස්ලාම්, දර්ශනය මෙහි ඉගැන්වූ හෙයින් ඒවායේ සබඳතා දර්ශන ලෝකය තුළ මහත් පෙරළියක් ඇති කළේ ය. 14 වන ශත වර්ෂය වන විට මෙම විශ්වවිද්‍යාලයට අයත් පෞද්ගලික කොලේජ් 40 ක් විය. ඒ ලෞකික හා ආධ්‍යාත්මික ඒවා විය.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය ක්‍රිස්තු වර්ෂ 872 දී මහා ඇල්ෆ්‍රඩ් විසින් අරඹන ලදී. ක්‍රි.ව. 1226 දී කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය බිහිවිය. ක්‍රි.ව. 1218 දී IX අල්පෝන්සු රජු විසින් සලමන්කා විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී. මෙය ස්පාඤ්ඤයේ ඇති ඉපැරණිම විශ්වවිද්‍යාලයයි. මෙය ක්‍රි.ව. 1254 දී IV වන ඇලෙක්සැන්ඩර් පාප්තුමන් විසින් ලෝකයේ ඇති ප්‍රධානතම විශ්වවිද්‍යාල 4 න් එකක් බවට ප්‍රකාශයට පත් කළේ ය. (ඔක්ස්ෆර්ඩ්, පැරිස් හා බොලොඤ්ඤා විශ්ව විද්‍යාල සමඟ)

### 7.3.2 විද්‍යාව හා තාක්ෂණික දියුණුව උදෙසා කිතුනු විද්‍යාඥයින්ගේ දායකත්වය

නවීන ලෝකය තුළ විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව උදෙසා දායකවූවන්ගෙන් බහුතරය කිතුනුවන්ය. එම විද්‍යාඥයින්ගේ හැකියා සහ කුසලතා තුළින් දෙවියන් වහන්සේගේ හස්තය ක්‍රියාත්මක වී ඇත. කිතුනු සභාවෙන් ලෝකයට දායාද කළ සුවිශේෂි වු එම පුද්ගලයන්ගෙන් කීප දෙනෙකු පිළිබඳව සොයා බලා අධ්‍යයනය කරමු.

**ටෙයියාර්ඩ් ඩෙ ෂාර්ඩැන් පියතුමා** (Pierr Teilhard de Chardin) **1881-1955**

- ජේසු නිකායට අයත් පියතුමෙකි.
- පෘථිවිය මත වසන මිනිසාගේ පරිණාම ඉතිහාසය පිළිබඳව සම්පූර්ණ දර්ශනයක් ඉදිරිපත් කළ චින්තකයින් අතරෙන් මෙතුමාට විශේෂ තැනක් හිමිවේ.
- අචේතනික (Nanimate) ද්‍රව්‍යයවලින් පටන්ගෙන ජීවයේ ඇතිවීම පසුකර නූතන මිනිසාගේ වර්ධනය පමණක් නොව ඉදිරි අනාගතය දක්වා යන්නාවූ මානව වර්ධනය පිළිබඳවවූ ප්‍රක්ෂේපනයක් (Projection) සහිත පුළුල් දර්ශනයක් එතුමා ලෝකයට දී ඇත.
- මෙතුමා භූමි විද්‍යා සහ පාෂාණීය ධාතු විද්‍යා පිළිබඳව විද්‍යාඥයකු වූ අතර දර්ශනවාදියකු හා කිවිඳකු ලෙස දස්කම් දක්වා ඇත.
- ෂාර්ඩැන්ගේ චින්තනය අතිශයන් වැදගත් වන්නේ ඔහු එකවිටම දැඩි ක්‍රිස්තු භක්තියකු ද අග්‍රගණයේ විද්‍යාඥයකු ද වීම නිසාය. ආගම හා විද්‍යාව යන ක්ෂේත්‍ර 2 එකිනෙකට පටහැනි යැයි ඔහු කිසිවිටක සැළකුවේ නැත. පැරණි ජීවීන්ගේ ඇටකටු පිළිබඳ පර්යේෂඛ හැමවිටම අවසන් වන්නේ සප්‍රාණික ජේසු ක්‍රිස්තුතුමන් ඒවා තුළින් දර්ශනය කිරීමට ලැබීමෙනැයි ඔහු නිතර පැවසුවේය.

**ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල්** ( 1847 1922)

- ක්‍රි.ව. 1847 දී ස්කෝට්ලන්තයේ එඩින්බරෝ නුවරදී උපත ලබා එඩින්බරෝ හා ලන්ඩන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා ඇති අතර ක්‍රි.ව. 1876 මාර්තු 10 දින දුරකථනය සොයාගනු ලැබීය.
- තවද ශ්‍රව්‍ය දෘශ්‍ය ආබාධිත ළමුන්ගේ තත්ත්වය සතුටුදායක කිරීමට මෙවලම් කීපයක් නිපදවූ අතර එම ළමුන්ට ඉගැන්වීම සඳහා වෙනම ගුරුවරුන් පුහුණු කිරීමටත්, ඒ සඳහා විශේෂ පාඨමාලා සැකසීමටත් මොහු පුරෝගාමී විය. බොස්ටන්හි ශ්‍රව්‍ය ආබාධිත ළමුන් සඳහා වූ විශ්වවිද්‍යාලය ඔහු විසින් පිහිටුවන ලද්දෙකි.

**අයිසෙක් නිව්ටන් (16431727)**

- එංගලන්තයේ වුල්ස්තොප් නම් ග්‍රාමයේ උපන් අයිසෙක් නිව්ටන් භෞතික විද්‍යාඥයෙක්, ගණිතඥයෙක්, තාරකා විද්‍යාඥයෙක්, නූතන යුගයේ දාර්ශනිකයෙක් මෙන්ම දේව ධර්මාචාර්යවරයෙක් ද වෙයි.
- විද්‍යාවට පටහැනි නොවන දෙවි කෙනෙක් පිළිබඳ මොහු විශ්වාස කර ඇති අතර ගුරුත්වාකර්ෂණය මොහු විසින් සොයාගෙන ඇත. චලිතය (Motion) පිළිබඳ නියමය 3 ක් මොහු ඉදිරිපත් කර ඇත.

- වර්ණ හඳුනාගැනීම ,සූර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු අනාවරණය, පරාවර්තනය දුරේක්ෂයක් තැනීම, මුහුදේ වඩදිය හා බාදිය හටගැනීම යනාදි කරුණු රාශියක් අනාවරණය කරගෙන ලොවට ප්‍රකාශ කර ඇත.

**ඇල්බට් අයින්ස්ටයින් ( 1879 1955)**

- ජර්මනියේ උල්ම් නගරයේ උපත ලැබූ යුදා ජාතික කතෝලිකයෙකි.
- සාපේක්ෂතාවාදය ඉදිරිපත් කිරීමත් සමඟම ඉතා ජනප්‍රිය වූ මොහු විදුලිය, කාන්දම් බලය, ගුරුත්ව බලය යන මේවා එකම මූලයකින් බිහිවන බව කියා සිටියේය.
- ක්‍රි.ව. 1922 දී ඔහුට භෞතික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය ලැබුණේය.

**ඇලෙක්සැන්ඩර් ප්ලේමිං ( 18811955)**

- 1881 අගෝස්තු මස 06 වන දින ස්කොට්ලන්තයේ අයේෂර්හි ලොප්පීල්ඩ් නැමැති ගමේ දිළිඳු පවුලක උපන් කිතනුවෙක් වු මොහු ආර්ථික ප්‍රශ්න වලින් පෙළුණු බාලවියේදීම ලන්ඩන් නගරයට ගොස් ලිපිකරු තනතුරක් ලබාගෙන ඉතිරිකරගත් මුදල්වලින් ලන්ඩනයේ ශාන්ත මේරි ආරෝග්‍යශාලාවට අනුබද්ධ වෛද්‍ය විද්‍යාලයට පිවිස වයස අවු 28 දී ශල්‍ය වෛද්‍ය විශේෂඥයෙක් විය.
- පෙන්සිලින් ප්‍රතිජීවක ඖෂධය සොයාගත් මොහුට 1945 දී ඒ සඳහා නොබෝල් ත්‍යාගයද පිරිනමා ඇත.
- **තෝමස් අල්වා එඩිසන් (18471931)**
  **ලුවී පාස්චර් (18221895)**
  **නිකලස් කොපර්නිකස් (14731543)**
  **එඩ්වඩ් ජෙනර් (17491823)**
  යන විද්‍යාඥයින් පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනයකළ හැකි ය.

**7.3.3 කලාවේ උන්නතිය උදෙසා සභාවේ දායකත්වය**

ක්‍රිස්තියානි සභා ඉතිහාසයේ විවිධ කාලවකවානුවල දී ක්‍රිස්තියානි කලාව වර්ධනය වී ඇත. කිතුනු ලේඛනය, කිතුනු සංගීතය, ගෘහ නිර්මාණ, චිත්‍ර, කැටයම්, මූර්ති යනාදියේ උන්නතිය උදෙසා විවිධ කණ්ඩායම් හා පුද්ගලයින් දායක වී ඇත. ඉහත සඳහන් කළ සෑම අංගයක්ම කලාවට ඇතුලත් වේ.

**කිතුනු ලේඛනය :**

මධ්‍යකාලීන යුගය වනතෙක් ලතින් භාෂවෙන් සාහිත්‍ය කෘතී රචනා කොට තිබුණි. ඩාන්ටේ අලිගියෙරි (ක්‍රි.ව. 1265-1321) ඉතාලි භාෂාවෙන් නිර්මාණ‍ කළේ ය. නිදසුන් ලෙස (The Divine Comedy) හෙවත් දේව සුඛාන්තය දැක්විය හැකි ය. තෝමස් අකම්පේ ලියූ ක්‍රිස්තු අනුසාරය (The Imitation of Christ) නැමැති කෘතියද වැදගත් වේ.

අවිලාවේ සාන්ත තෙරේසා, කුරුසියේ සාන්ත ජෝන්, ජෝන මිල්ටන් යනාදි ලේඛකයින් විසින් ලෝක කිතුනු සාහිත්‍යයට අද්විතීය මෙහෙවරක් සිදුකරන ලදි.

**සංගීතය**

ප්‍රථම වතාවට ක්‍රිස්තියානි සංගීත ක්‍රමයක් ආරම්භ වන්නේ ක්‍රි.ව. 500-1000 අතර කාලයේ දී ය. අඳුරු යුගය ලෙස හැඳින්වූ මෙම වකවානුව තුළ ජනවන්දනා ක්‍රමය විධිමත් ලෙස සකස් කරන ලදී. සාන්ත බෙනදික් තුමා තාපසාරාම තුළ සකස් කළ ජනවන්දනාක්‍රමය ක්‍රිස්තියානි සභාවට ගැළපෙන විලාශයකට මහා ග්‍රෙගරි පාප්තුමා ( ක්‍රි.ව 540-604) විසින් සකස් කරන ලදී. තනි තාල ක්‍රමයක් (Plane chant) වූ මෙම සංගීත ක්‍රමය ග්‍රෙගෝරියානු තාල ක්‍රමය (Gregorian Chant) ලෙස ජනප්‍රිය විය.

11 හා 12 වෙනි ශතවර්ෂවල ග්‍රෙගෝරියානු තනි තාල ක්‍රමයට වඩා වෙනස් මිශ්‍ර තාල ක්‍රමයක් පැරීසියේ නොට්‍රඩාම් ආසන දෙව්මැදුරේ ආරම්භ විය. එය පොලිෆොනි සංගීත ක්‍රමය ලෙස හඳුන්වයි. පූජාවක තාලයට ගායනා කළ යුතු වු කොටස් 6 ක් මිශ්‍ර තාල සංගීත ක්‍රමය තුළින් තීරණය වී තිබුණේ ය. නූතන දිව්‍ය පූජා යාගයේ දී මෙම කොටස් ගායනා කරනු ලැබේ.

i කීරියේ (ස්වාමීනි කරුණා කළ මැනව)

ii ග්ලෝරියා (උත්කෘෂ්ඨ වු දෙවියන්ට මහිමය වේවා)

iii ක්‍රේඩෝ ( මම විශ්වාස කරමි)

iv සාන්තුස් ( සුවිශුද්ධය)

v බෙනඩික්තුස් (වඩින තැනැත්තා ආශිර්වාදිතය)

vi ආඤ්ඤුස් ඩේයි (දේව අජබාලකයාණෙනි)

- ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන් පසු විශිෂ්ට මිශ්‍ර තාල සංගීත ක්‍රමයක් බිහිවිය.
- තූර්ය භාණ්ඩ හා කටහඬ එකට මිශ්‍ර කරමින් ඔරතෝරියෝ කෘති සංගීත ක්‍රමය නිර්මාණය කොට ඇත.
- 19 වෙනි සියවසේ දී ගායනා පූජා සහ දුක් ගායනා පූජා නිර්මාණය කරන ලදී.

**ගෘහ නිර්මාණ ශිල්පය**

- ක්‍රි.ව. 313 දි කොන්ස්තන්තීනු අධිරාජයා විසින් ක්‍රිස්තියානි ධර්මයට නිදහස දීමෙන් පසු ක්‍රිස්තියානි ගොඩනැගිලි කලාව ආරම්භ විය. මෙම අවධියේ දී
    - රෝමානු දේවස්ථාන ක්‍රමය
    - බයිසන්තියානු දේවස්ථාන ක්‍රමය යනුවෙන් දේවස්ථාන තැනීමේ ක්‍රම දෙකක් හඳුන්වා දිය හැකිය.

- ක්‍රි.ව 1000 සිට 1500 දක්වා කාලය එනම් මධ්‍යතන යුගයේ දී ක්‍රිස්තියානි අනන්‍යතාවෙන් යුතු දේවස්ථාන ගොඩනැගිලි ඉදිරිකිරීම් ක්‍රම 2 ක් බිහිවිය ඒවා නම්
    - රෝමනස්ක හෙවත් මධ්‍යකාලීන රෝමාණු දේවස්ථාන
    - ගෝතික (Gothic) දේවස්ථාන

**කැටයම් ශිල්පය**

ක්‍රිස්තියානි කැටයම් කලාවද ආරම්භ වූයේ මධ්‍යතන යුගයේ දීය. යුරෝපයේ ආසන දෙව්මැදුරු ඉදිකිරීමත් සමඟම කැටයම් කලාව ආරම්භ විය. නමුත් මේ යුගයේ දී කැටයම් කලාව ආරම්භ වුවත් එය ස්වාධීන කලාවක් නොවීය. කැටයම් යොදා ගත්තේ ගොඩනැගිලි සරසන ක්‍රමයක් සේය. එනම් ගොඩනැගිලි කලාවේම අංගයක් ලෙසටය.

උදා - i කොත් මුදුන් සැරසීමට දේවදූතයන් යොදා ගැනිණි.

ii වැහි පීලිවලින් වතුර පිටකිරීම සිදු කලේ මිනිස් හෝ සත්වරූප වල කටවල් භාවිත කිරීමෙන් ය.

iii ද්වාර මණ්ඩපවල පුරාණ හා නව ගිවිසුම්වල කථා පුවත් දක්වන රූප අඹා තිබුණි. මෙම රූප සම්පූර්ණ පිළිම නොවූ අතර ඒවායින් කොටසක් බිත්තියටම ගිල්වෙන විලාසයකට නිර්මාණය කොට තිබුණි.

- ක්‍රිස්තියානි කැටයම් කලාව ස්වාධීන කලාවක් ලෙස ලෝකය හඳුනාගත්තේ ග්‍රීක රෝම පුනරුදයේ දායාදයක් වශයෙනි. ක්‍රිස්තියානි ඉතිහාසය තුළ කැටයම් කලාව ස්වාධීන කලාවක් බවට පත් කලේ මයිකල් ආන්ජලෝය ඃ පියෙටා (Pieta) කැටයම ඔහුගේ ශ්‍රේෂ්ඨ නිර්මාණයකි.

- මධ්‍යකාලීන යුගයේ ඉදිකළ ආසන දෙව් මැදුරුවල විශේෂයෙන් ගෝතික (Gothic) දේවස්ථානවල සැරසිලි කිරීමට කැටයම් කලාව භාවිත කළේය. කොත් මුදුන්වල දේවදූතරූප, මිනිස් රූප, සත්ත්ව රූප නිර්මාණය කර ඇත.

- පශ්චාත් රෙපරමාදු කතෝලික කලාව හෙවත් බැරොක් සම්ප්‍රදාය තුළ හමුවන ලොරෙන්සෙන් බර්නිනී අද්විතීය ගණයේ කැටයම් ශිල්පියකු ලෙස හඳුන්වාදිය හැකි අතර රෝමයේ ශාන්ත පීතර බැසිලිකාවේ පූජාසනයට ඉහළින් නිර්මාණය කර ඇති ලෝකඩ උඩු වියන ඔහුගේ අද්විතීය නිර්මාණයකට නිදසුනක් ලෙස දැක්විය හැකි ය.

**චිත්‍ර මූර්ති ශිල්පය**

ක්‍රිස්තියානි පීඩන සමයේ දී පොළොව යට තනා තිබූ කැටකුම්බ (Catacombs) නම් සොහොන් බිම් තුළ ස්තෝත්‍ර පූජාව හෙවත් යුකරිස්තිය පවත්වා ඇත. එහි දී කිතුනුවන්ට පමණක් තේරුම්ගත හැකි රහසිගත කිතුනු සංකේත භාවිත කර ඇත. ප්‍රථම ක්‍රිස්තියානි චිත්‍ර හමුවන්නේ මෙම කැටකුම්බ ආශ්‍රිතවය. ඒ නිසා මේවා කැටකුම්බ චිත්‍ර ලෙස හඳුන්වයි.

මුල් කිතුනුවන් භාවිත කළ සංකේත කිහිපයක් පහත දැක්වේ.

i මාළුවා - ක්‍රිස්තුස් වහන්සේ

ii පරෙවියා - ආත්මය

iii මොනරා - සදාකාලිකත්වය

iv කරෙහි බැටළුවකු තබාගෙන සිටින තරුණයා - යහපත් එඬේරා

v දෑත් ඔසවාගෙන සිටින මිනිසෙක් හෝ ගැහැණියක - යාච්ඤාව හා දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව

- ක්‍රි.ව 1931 දී කැනීම්වලින් සොයාගෙන ඇති ධුරා යුරෝපස් හි නිවෙසක රෝමයේ පිහිටා ඇති දොමිනිල්ලාගේ සොහොන් ගැබෙහි තිබී ක්‍රිස්තියානි බිතුසිතුවම් රැසක් හමුවී ඇත. එම චිත්‍රවලට තේමා වී ඇත්තේ ශුද්ධ වූ බයිබලයේ අඩංගු කථාන්තරවේ.

  ඒවා නම් - ආදම් සහ ඒව
  - මෝසෙස්ට පර්වතයකින් ජලය ලැබීම
  - ජෝනා තල්මසකුගෙන් බේරීම
  - සිංහයින්ගෙන් දානියෙල් ආරක්ෂා වීම
  - ජේසුස් වහන්සේ හා ගෝලයින් දක්වන චිත්‍රය ආදිය වේ.
- සෞන්දර්යාත්මක වශයෙන් සලකන විට මේවා ඉතා ප්‍රාථමික ලක්ෂණවලින් යුක්ත නිර්මාණ වුවද එමගින් එම යුගයේ බැතිමතුන් ගත කළ දුෂ්කර ජීවිත රටාව අවබෝධ කරගත හැකි ය.

- **මොසැයික් හෙවත් වීදුරු කැටකලාව**

  මොසැයික් චිත්‍ර බයිසෙන්තියානු කලාවේ නවතම කලා අංගයකි. වීදුරු කැට කලාව සේද මෙය හඳුන්වන අතර ගෙවල් හා දේවස්ථාන වල සීලිම්, බිත්ති, බිම සැරසීමට මෙම ක්‍රමය උපයෝගී කර ගෙන ඇත.

  මොසැයික් චිත්‍ර කලාවේ ලක්ෂණ

  i චිත්‍රය අලංකාර හා අලෝකවත් භාවයකින් යුක්ත වේ.

  ii වීදුරු කැටවලින් නිර්මාණය කළ නිසා චිත්‍ර රූප දරදඬුයි

  iii නොසෙල්වෙන සුලුය. පැළඳ සිටින වස්ත්‍රවල රැළි නොමැත.

  iv ඒවා දෙසින් භක්තියක් සහ ලෝකොත්තර භාවයක් පැහැදිලිව ප්‍රකාශ වේ.

  v පුද්ගලයකුගේ සප්‍රාණිකභාවයක් දක්නට නැත. එම නිසා මෙම කලාකරුවෝ චිත්‍රයේ ස්වභාවිකත්වයට වඩා ගම්භීරත්වයට මුල් තැන දුන්හ.

  vi පන්ටොක්‍රැක්ටොර් (Pantocrastor) හෙවත් සියලු දෙයටම අධිපති ලෙස ක්‍රිස්තුස් වහන්සේව නිර්මාණය කොට ඇත.

- **අයිකොන් රූප**

  මොසැයික් චිත්‍ර අනුගමනය කරමින් චිත්‍ර ක්‍රමයක් බිහිවිය. දේවස්ථාන වල දක්නට ලැබුණු මොසැයික් චිත්‍රවල හැඩයට ජේසුස් වහන්සේගේ, මරියතුමියගේ සහ ශුද්ධවන්තයන්ගේ රූප කුඩා ලී ලෑලිවල පිටපත් කිරීමේ සම්ප්‍රදායක් බිහිවන්නට විය. එහා මෙහා ගෙන යා හැකි වූ එම චිත්‍ර රූප, ග්‍රීක් බසින් අයිකොන්සේ හැඳින්වුණේ ය. අයිකෝන් රූපවල ලක්ෂණ

  i කුඩා ලෑලිවල තීන්තෙන් මෙම චිත්‍ර රූප ඇඳ ඇත.

  ii නිතරම පසුබිම රන්වන් පාටින් වූ අතර මොසැයික් චිත්‍රසේම මුහුණු දරදඬුවිය.

  iii ලෝකෝත්තර ගම්භීරත්වයෙන් යුක්තය.

  අයිකොන් චිත්‍රයට විශිෂ්ඨතම නිදසුන වශයෙන් ශ්‍රී ලංකාවේ අතිශයින් ජනප්‍රියත්වයට පත්වී ඇති සදාසරණ දේව මාතා චිත්‍රය ගත හැකි ය.

- **වර්ණ වීදුරු කලාව** (Stainded glass)

  වර්ණ වීදුරු චිත්‍ර ගෝතික (Gothic) කලාවට ආවේණික වූ කලා සම්ප්‍රදායකි. ගෝතික දේවස්ථානවල විශාල කවුළු රාශියක් තැබීම නිසා එම කවුළුවල තිබූ වීදුරුවල මෙම චිත්‍ර ඇඳ ඇත. මෙ කවුළු බොහෝ විට චක්‍රාකාර සහ පුෂ්පාකාර වැනි විවිධ හැඩවලින් සාදා ගෙන ඇත. මෙම චිත්‍ර වල ඇති සුවිශේෂත්වය නම් වීදුරු තුළට සායම් කවා මෙම චිත්‍ර නිර්මාණය කිරීමයි. මෙම තාක්ෂණ ක්‍රමය මොසැයික් නිර්මාණවලටත් වඩා දුෂ්කර වී ඇති බව කිව යුතුය. වීදුරු තුළට වර්ණ කැවීමේ මෙම ක්‍රමය ගෝතික කලාකරුවන් රහසිගතව තබා ගැනීම නිසා පැරණි ක්‍රම අභාවයට ගියේය. නූතනයේ වර්ණ වීදුරු කලාව ඇතත් පැරණි ක්‍රමය තරම් ඒවා සමකළ නොහැකිය. මධ්‍යකාලීන යුගයේ චිත්‍ර ශිල්පයේ උන්නතියට දායක වූ පුද්ගලයින්

  i ප්‍රෙස්කෝ (Fresco) චිත්‍ර හෙවත් නව බිත්ති මත (එනම් බදාම වේලීමටත් පෙර) චිත්‍ර ඇඳීමේ ක්‍රමයක් සොයාගත් **ජියෝට්ටෝඩ් බොර්ඩොනේ චිත්‍ර ශිල්පියා (Giotto Di Bordone)** ක්‍රි.ව. 1266 1337 විශේෂිතවෙයි.

  ii ප්‍රා ඇන්ජෙලිකෝ (**Fra Angelico**)- ක්‍රි.ව. 1387 1455, **ලියනාඩෝ ඩා වින්චි (Leonardo da Vinchi)** ක්‍රි.ව. 14521519, මයිකල් ආන්ජලෝ **(Michael Angelo)** ක්‍රි.ව. 1475 1564 හා රෆායෙල් සෙන්සියෝ **(Raffaelo Sanzzio)** ක්‍රි.ව. 14831520 කළ අමරණීය කලා කෘතී නිසා ශ්‍රේෂ්ඨ පුද්ගලයෝ බවට පත්වූහ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම පිළිබඳව විවේචනාත්මක කතිකාවක යෙදෙන්න.
- විද්‍යාව හා තාක්ෂණික දියුණුව උදෙසා කිතුනු විද්‍යාඥයින් දායක වූ ආකාරය සාකච්ඡා කරන්න.
- මුල් කිතුනුවන් සංකේත චිත්‍ර, භාවිත කරමින් ස්තෝත්‍ර පූජාව පැවැත්වූ ආකාරය මූලාශ්‍ර ඇසුරින් රැස් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- නිදහස් යුගයේ හා මධ්‍යතන යුගයේ දේවස්ථාන කලාවේ අංග පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන්ව යොමු කරවන්න.
- කිතුනු ලේඛකයින් හා ක්‍රිස්තියානි චිත්‍ර කලාවට දායක වූ චිත්‍ර ශිල්පීන් මගින් සාහිත්‍ය හා කලාව පෝෂණය වූ අන්දම සොයා බැලීමට සිසුන්ව ගවේෂණයක යොදවන්න.

මූලාශ්‍ර :

- www. Salamanca' univerisity.org
- www. liv.ac.uk/history
- www.eug.unibio.it
- ක්‍රිස්තියානි ඉතිහාසය, සාහිත්‍ය කලාව, ආචාර්ය ඇන්තනි ප්‍රනාන්දු

**නිපුණතාව 8.0** : **ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය හදාරා ලාංකේය කිතුනු අනන්‍යතාවට සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 8.1** : යුරෝපීයයන් යටතේ ශ්‍රී ලංකාවේ සභා ආරම්භය හා විකාශය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : කාලච්ඡෙද 30

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ තොරතුරු සොයා බලයි.
- මෙරටට පැමිණි විදේශීය ධර්මදූතවරුන් ඉටුකළ කාර්ය භාරය ගැන අධ්‍යයනය කරයි.
- විවිධ පීඩන මධ්‍යයේ ලක් කිතු සසුන වර්ධනය වූ අයුරු අවබෝධ කරගනියි.
- භාග්‍යවත් ජුසේ වාස් පියතුමන් ඇතුළු ඔරතෝරියානු නිකායික පියවරුන්ගෙන් මෙරට කිතුනු සභාවට වූ සේවය අගය කරයි.
- කිතුනු ධර්මදූත ව්‍යාපාරය තුළින් ශ්‍රී ලංකාවේ ආගමික, අධ්‍යාපනික හා සමාජීය ක්ෂේත්‍රයන්ට ලැබුණු දායකත්වය හඳුනා ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය යනු කිතුනු ශාසනය ලක්දෙරණ තුළ ආරම්භ වී, වර්ධනය වෙමින් අද දක්වා මේ තාක් ආ ගමන පිළිබඳ ඓතිහාසික විස්තරයයි. මෙරට දේශපාලන, ආගමික, සමාජීය හා සංස්කෘතික මංපෙත් ඔස්සේ බාධක හා අභියෝග පසුකරමින් දේව සැලසුම් ප්‍රකාරව කිතු සසුන ගමන් කළ ආකාරය එම ඉතිහාසය තුළින් අපට හඳුනා ගත හැකිය.

**ශ්‍රී ලංකා සභා ඉතිහාසය හැදෑරීමේ වැදගත්කම**

- දේශීය කිතුනුවන් ලෙස අපගේ ආරම්භය හා අනන්‍යතාව පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගැනීම සඳහා
- සභා ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ මැදිහත්වීම හා ක්‍රියාකාරීත්වය තේරුම් ගනිමින් අපගේ විශ්වාසයේ ජීවිතය ශක්තිමත් කරගැනීම සඳහා
- මෙරට කිතු සසුන ගොඩනගන්නට දායකවූවන් අගය කරමින් ඔවුන්ගේ ආදර්ශය අනුව යමින් සභාවේ වර්ධනය සඳහා ඇප කැපවී සේවය කිරීමට දිරිගැන්වීම් ලබනු සඳහා
- සභාවේ අතීතය දෙස බලා එහි වර්තමානය හා අනාගතය නිසි ලෙස හැඩගස්වා ගනු සඳහා

ශ්‍රී ලංකා සභා ඉතිහාසයේ විවිධ යුග

1. පැරණි යුගය - පෘතුගීසීන්ගේ පැමිණීමට පෙර යුගය
2. පෘතුගීසි යුගය - ක්‍රි. ව 1505 - 1657
3. ලන්දේසි යුගය - ක්‍රි. ව 1658 - 1796
4. බ්‍රිතාන්‍ය යුගය - ක්‍රි. ව 1796 - 1948
5. නිදහස් යුගය - ක්‍රි. ව 1948 න් පසුව

**8.1.1. පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය**

ශ්‍රී ලංකාවේ කතෝලික සභාව පිළිබඳ ලේඛනගත ඉතිහාසය ඇරඹෙන්නේ ක්‍රි. ව. 16 වැනි සියවසේ සිටය. ඒ ක්‍රි. ව 1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණීමත් සමගය. එහෙත් මෙරට කිතුනු විශ්වාසයේ උරුමය ඊට සියවස් ගණනකට පෙර සිට පැවත එන බව කිව යුතුය. පෘතුගීසි ආගමනයට පෙර පවා ශී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි පවතී.

**1. කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ට්ස් නැමැති දේශ සංචාරකයාගේ සාක්ෂිය**

ක්‍රි. ව 6 වැනි සියවසේ විසූ ඔහු තම සංචාරවලදී ඇසූ දුටු දේ ඇසුරින් ග්‍රන්ථයක් සකස් කළේය. එය ඉංග්‍රීසි බසින් The Christian Topography ( ද ක්‍රිස්ටියන් ටොපෝග්‍රෆි) නම් විය.

එකල ලක්දිව පර්සියාවෙන් පැමිණි ක්‍රිස්තු භක්තික පිරිසක් සිටි බවද, ඔවුන්ට පූජකවරයකු හා තේවාචාර්යවරයකු සිටි බව ද, දේව වන්දනාව සඳහා අවශ්‍ය දෑ තිබුණු බවද කොස්මස් තම පොතේ සඳහන් කර ඇත.

**2. අනුරාධපුරයේ හමු වූ නෙස්ටෝරියන් කුරුසිය**

ක්‍රි. ව 1912 දී අනුරාධපුර නටබුන් අතර තිබී ගලක කෙටූ කුරුසයක් සොයාගෙන ඇත. එය පර්සියානු ජාතික නෙස්ටෝරියන් ක්‍රිස්තු භක්තිකයනට අයත් එකක් බව ඉතිහාසඥ මතයයි. එසේ නම් ඒ කොස්මස් සඳහන් කළ කිතුනුවන් විය හැකිය.

**3. සීගිරි සමයේ සිටි මිගාර සේනාපති**

ක්‍රි. ව 5 වැනි සියවසේ ඉන්දියාවෙන් පැමිණ පළමු කාශ්‍යප රජු හා ඉන්පසු රජවූ පළමු මුගලන් යටතේ සේවය කළ ක්‍රිස්තු භක්තිකයකු වූ මිගාර නම් සේනාපතියකු ගැන චූල වංශයේ සඳහන් ය . ඔහු " අභිෂේක - ජින" වෙනුවෙන් මැදුරක් තනා එය කැප කිරීමට උළෙලක් පැවැත්වූ බව එහි දැක්වේ. හිටපු පුරාවිද්‍යා කොමසාරිස් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව මෙහි " අභිෂේක - ජින" ලෙස හඳුන්වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේවය. එසේ නම් සිගිරි සමයේදී මෙරට ක්‍රිස්තු භක්තිකයින් සිටි බවට එය වැදගත් සාක්ෂියකි.

තවද මුගලන් රජ සමයේ කිතුනු ලාංඡන සහිත රන් කාසි තිබුණු බවද පරණවිතාන මහතා පවසයි.

4. ක්‍රි. ව 52 දී තෝමස් අපෝස්තුලු තුමා ඉන්දියාවට පැමිණ දහම් ප්‍රචාරය කළ අතර එතුමන්ගේ අනුගාමිකයින් ලෙස සැලකෙන ක්‍රිස්තු භක්තිකයෝ කණ්ඩායමක් පෘතුගිසීන් පැමිණීමට පෙර පටන් දකුණු ඉන්දියාවේ සිටියහ. එසේ නම් ඔවුන්ගෙන් සමහරු ඇතැම් අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන්නට ඇත. එබැවින් ලක්බිමට පෘතුගිසීන් පැමිණෙන්නට පෙර කිතුනුවන් මෙහි සිටි බවට එයද සාධකයක් වේ.

පැරණි යුගයේ ලක්දිව පැවැති කිතුනු ඇදහිල්ල පිළිබඳ ලේඛනගත තොරතුරු විරල වුවද පවතින සාක්ෂිවලින් තහවුරු වන්නේ මෙරට කිතුනු ඇදහිල්ලට දිගු ඉතිහාසයක් ඇති බවය. එම යුගයේදී කිතුනු විශ්වාසය මෙරට රෝපණයවීමට හේතුවුවා යැයි සැළකිය හැකි කරුණු කීපයකි. එනම්,

1. ශ්‍රී ලංකාව ඉන්දියාවට ඉතා සමීපව පිහිටීම - මේ නිසා ඉන්දියාවේ දේශපාලන, ආගමික, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන්ගේ බලපෑම ලංකාවට දැණිනි. එසේ නම් දකුණු ඉන්දියාවේ වෙරළාසන්න පෙදෙසහි වර්ධනය වූ කිතු දහමද මෙරටට හඳුන්වාදීම පහසුවෙන්ම සිදුවන්නට ඇත.

2. විදෙස් රටවල් සමග පැවැති සබඳතා - වෙළඳ සබඳතා නිසා මෙරට පැමිණි ඉන්දියානු හා පර්සියානු කිතුනු වෙළඳුන් නිසා කිතු දහම මෙරට පැතිරෙන්නට ඇතැයි සිතිය හැක.
3. අපගේ පැරණි රජදරුවන් අනුමනය කළ විවෘත ආගමික ප්‍රතිපත්තියද මෙරට කිතුනු ඇදහිල්ලේ ආරම්භයට හේතු වූ බව කිව යුතු ය.

**8.1.2 පෘතුගීසී යුගය ක්‍රි. ව 1505 1657**

**පෘතුගීසීන් පෙරදිගට පැමිණීම**

15, 16 සියවස්වල යුරෝපයේ ඇතිවූ පුනර්ජීවනයේ එක් අංශයක් වූයේ අලුත් රටවල් සොයා යාමය. පෘතුගීසි ජාතිකයෝ වසර ගණනාවක් මුළුල්ලේ වෙහෙස දරා අප්‍රිකාවේ කේප් තුඩුව පසුකර නැගෙනහිර අප්‍රිකානු වෙරළබඩ තොටුපලවලට ගොඩබැස්සෝය. එම උත්සාහයේ ප්‍රතිඵලය ලෙස වස්කෝ ද ගාමා ඉන්දියාවට යන මුහුදු මාර්ගය සොයා ගැනීමත් සමග පෙරදිග රටවල් සමග පෘතුගීසීන්ගේ වෙළඳ කටයුතු ආරම්භ විය. ඔවුහු ඉන්දියාවේ ගෝව නගරය තම පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය කර ගත්හ. පෘතුගීසීන් පෙරදිගට පැමිණීමට හේතුවූ තවත් කාරණයක් වූයේ පෘතුගීසීන්ට මුස්ලිම්වරුන් සමග තිබුණු වෙළඳ තරගයයි. කලක් මුස්ලිම්වරුන්ගේ පාලනයට නතුව සිටි පෘතුගාලය එයින් මිදීමත් සමග එම ජාතීන් දෙකොටස අතර වූයේ වෛරී සහගත හැඟීමකි. එසේම එදා යුරෝපා ජාතීන් කෙරෙහි වෙළඳ අධිකාරිය අයත් කරගෙන සිටි මුස්ලිම්වරුන්ගෙන් එය සියතට ගැනීම පෘතුගීසීන්ගේ අභිලාෂය විය.

ඔවුන් පෙරදිගට පැමිණීමේ තවත් අරමුණක් වූයේ දහම් ප්‍රචාරයයි. එම කාර්යයට ඔවුන් උනන්දු වුයේ 'පද්‍රෝආදෝ' සැලසුම නිසාය.

**පද්‍රෝආදෝ (PADROADO) හෙවත් සහා ආරක්‍ෂක භාරය**

යටත් විජිතවල කිතු දහම ප්‍රචාරය කිරීම සඳහා ශුද්ධාසනය විසින් යුරෝපයෙන් බටහිර රටවල් ස්පාඤ්ඤයට ද නැගෙනහිර රටවල් පෘතුගාලයට ද පවරන ලදී. එය පද්‍රෝආදෝ සැලසුම නම් විය. ඒ අනුව යටත් විජිතවල ධර්මදූතවරුන් යැවීම. ඔවුන් ආරක්ෂා කිරීම, මිල මුදලින් ආධාර දීම, දෙව්මැදුරු හා තාපසාරාම ඉදිකිරීම සහ නඩත්තු කිරීම මෙන්ම එම ප්‍රදේශවලට නව රදගුරුවරුන් පත් කිරීම ද එම දෙරටට පැවරිණි.

**ලොරෙන්සෝ ද අල්මේදා ලක්දිවට ගොඩබැසීම**

ප්‍රැන්සිස්කෝ ද අල්මේදා පෙරදිග පෘතුගීසි රාජ්‍යයේ ආණ්ඩුකාරයාව සිටි සමයේ ඉන්දියන් සාගරයේ මාලදිවයින් පෙදෙසෙ ගමන් ගත් මුස්ලිම් වෙළඳ නැව් අල්ලා ගනු සඳහා පෘතුගීසි නැව් කණ්ඩායමක් පිටත් කර යැව්වේය. ඉන්දියාවේ කොචින් නගරයෙන් ගමන් ඇරඹූ නැව් 7 කින් යුත් එම කණ්ඩායමේ නායකයා වූයේ ප්‍රැන්සිස්කෝ ද අල්මේදාගේ පුත් ලොරෙන්සෝ ද අල්මේදා ය. ඔවුන්ගේ ආගමික කටයුතු සඳහා ප්‍රැන්සිස්කාන නිකායික ' විසෙන්තේ' නම් පූජාප්‍රසාදි තුමකු ද විය. මේ පෘතුගීසි නැව් කණ්ඩායම මාලදිවයින් දෙසට යාමට අරමුණු කර සිටියත් මුහුදේදී කුණාටුවකට හසුවීම නිසා පෙර සැලසුමකින් තොරව සේන්දු වූයේ ගාලු වරායටය. තමන් ළඟා වූ රට ලංකාව බව දැනගත් ඔවුහු උතුරු දෙසට යාත්‍රාකර කොළඹ වරායට පැමිණියහ.. එය සිදුවූයේ ක්‍රි. ව. 1505 නොවැම්බර් 15 වන දිනදීය.

පසුව, එවකට සිටි කෝට්ටේ රජුගෙන් අවසර ලබාගත් පෘතුගීසීහු වෙළඳ ගබඩාවක් කොළඹ ඉදි කළ හ. ඒ අසල කුඩා දෙව් මැදුරක් ද තනා එය ලොරෙන්සෝ ද අල්මේදාගේ නාමසාන්තුවරයා වූ ශු ලෝරන්ස් මුනිතුමාට කැප කළ හ. නැවියන් සමග සිටි විසෙන්තේ පියතුමා විසින් එම දෙව්මැදුරේ දිව්‍ය පූජාව සිදු කරන ලදී. එය ලක්දෙරණේ පැවැත්වූ ප්‍රථම දිව්‍ය පූජාවයි.

**ශුද්ධෝත්තම පියතුමාට දැන්වීම**

එකල "තප්‍රබෝනය" ලෙස හැඳින්වුණු මේ දිවයිනට පෘතුගීසින් පැමිණීමේ පුවත පෘතුගාලයේ සිටි 1 වන මනුවෙල් රජුට දන්වන ලදුව එතුමා විසින් එවකට සසුන් එඬේරාණන් සිටි දෙවන ජුලියස් ශුද්ධෝත්තම පියාණන්ට දන්වන ලදී.

" අති උතුම් පියාණෙනි, ඔබට සතුටු වන්නට සුබාරංචියක් දන්වා එවමි. නව ජාතීන් වෙත දෙවියන් වහන්සේගේ සුබාරංචිය ගෙනයාමේ සුපුවත ඔබට ඉතා සතුටින් දැනුම් දෙමි. අපේ පෙරදිග නායකයා තම පුත් සමග අපගේ සතුරන් පරදා ඉතා වැදගත් දූපතට ඇතුළු වී තිබේ. එය නම් තප්‍රබෝන ය යි........."

**කෝට්ටේ රාජධානිය තුළ පෘතුගීසීන්ගේ බලය ව්‍යාප්ත වීම.**

පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට මෙරට රජවරුන් තිදෙනෙකු යටතේ පාලනය වූ දේශපාලන ප්‍රදේශ තුනක් විය.

| | | |
|---|---|---|
| කෝට්ටේ | - 9 වන ධර්ම පරාක්‍රමබාහු | ( 1489 -1513) |
| කන්ද උඩරට | - සේනාසම්මත වික්‍රමබාහු | ( 1469 -1511) |
| උතුර | - පරරාජසේකරන් | (1478 - 1519) |

මේවායින් වඩා බලවත් වූයේ කෝට්ටේ රාජධානියයි. අලුතින් දිවයිනට පැමිණි යුරෝපීයයන් බලවත් ජාතියක් බව දැනගත් කෝට්ටේ රජතුමා පෘතුගීසීන් හා ගිවිසුම්වලින් සම්බන්ධකම් පවත්වන්නට පටන් ගත්තේය. ඒ අනුව කෝට්ටේ රාජ්‍යය සතුරන්ගෙන් ආරක්ෂාකර දීම පෘතුගීසිනට පවරන ලදී. ඒ වෙනුවෙන් පෘතුගීසින්ට වෙළඳ කටයුතු සහ ආගම ප්‍රචාරය සඳහා නිදහසක් හිමිවිය.

ධර්ම පරාක්‍රමබාහු රජුට පසුව කෝට්ටේ රජවූ 6 වන විජයබාහු රජුගේ කාලයේ දී එම රාජධානිය අවුල් සහගත තත්ත්වයකට පත්විය. විජයබාහු රජ තමා විසින් හදාවඩාගත් අයෙකුට රජකම දීමට අදහස් කළ බැවින් රජුගේ පුත්‍ර කුමාරවරුන් තිදෙනා එයට විරුද්ධ වූහ. එහි ප්‍රතිඵලය වූයේ පුතුන් විසින් පිය රජු මරා රජ මාලිගයේ වස්තුව කොල්ල කා රාජධානිය තමන් අතරේ බෙදා ගැනීමය. ක්‍රි. ව 1521 දී සිදු වූ මේ සිද්ධිය 'විජයබා කොල්ලය' නමින් ලක් ඉතිහාසය තුළ ප්‍රකටය. එතැන් සිට කෝට්ටේ රාජධානිය කුමාරවරුන් තිදෙනා අතර බෙදී ගියත්,

| | | |
|---|---|---|
| වැඩිමහල්ලා වූ 7 වන බුවනෙකබාහු | - | කෝට්ටේ ද |
| දෙවැන්නා වූ මද්දුම බණ්ඩාර | - | රයිගම ද |
| බාලයා වූ මායා දුන්නේ | - | සීතාවක ද රජ වූහ. |

මේ බෙදීම හා ඉන්පසු ඇති වූ භේද නිසා සිදු වූයේ වෙළඳාම පිණිස මෙරටට පැමිණි පෘතුගීසින්ට කෝට්ටේ රාජධානිය තුළ දේශපාලනයට මැදිහත්වීමට අවස්ථාව උදාවීමයි. මායාදුන්නේ රජුගෙන් කෝට්ටේ රාජ්‍යයට වු හිරිහැර නිසා රාජධානිය ආරක්ෂා කර ගැනීමට 7 වන බුවනෙකබාහු රජු පෘතුගීසීන්ගේ සහය පැතීය. ඒ සඳහා පෘතුගීසින් හා සිංහල රජතුමා අතර සබඳතාව වඩා තහවුරු කරගනු වස් බුවෙනකබාහු විසින් රාජදූතයකු වූ සලප්පු ආරච්චි පෘතුගාලයේ 3 වන ජෝන් රජතුමා වෙත යවන ලදී. බුවනෙකබාහු රජ ඉල්ලා සිටියේ,

- තමාට පසුව තම දියණිය (සමුද්‍රදේවී ) ගේ පුත් ධර්මපාල කුමරා කෝට්ටේ රජකමට පිළිගන්නා ලෙසත්
- එසේ පිළිගැනීමේ සංකේතයක් ලෙස තමා එවන ධර්මපාලගේ කුඩා රන් පිළිරුවට ඔටුනු පළඳන ලෙසත්

- තමා හා ධර්මපාල කුමරු සතුරන්ගෙන් ආරක්ෂා කරන ලෙසත්
- කෝට්ටේ රාජ්‍යයට කතෝලික ධර්මදූතයින් එවන ලෙසත් ය.

1551 දි බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසු ධර්මපාල කුමරු රාජ්‍යයට පත්විය. පෘතුගීසින් ඔහුව කතෝලික සමයට හරවා ගැනීමට උත්සාහ කළත් බුවෙනකබාහු රජ මෙන් ඊට අකමැති වූයේ බෞද්ධ රටවැසියා තමා හැරදමා මායාදුන්නේ සමග එක්වෙතියි යන බිය නිසාය. එනමුත් ධර්මදූතවරුන්ට ධර්ම ප්‍රචාරයට අවකාශ ඔහුගෙන් ලැබිණි. පසුව 1557 දී ධර්මපාල රජු ද 'දොන් ජුවන් ධර්මපාල' නමින් බව්තිස්මය ලබා කතෝලික දහම වැළඳගත්තේය. සිංහල රාජ පරපුරේ ප්‍රථම කතෝලික රජතුමා ලෙස එතුමා ඉතිහාසයට එක්වේ.

ධර්මපාල රජු කතෝලිකයකු වූ පසුව, ඊට පෙර බෞද්ධයකුව සිටි කාලයේ තමාත්, තමාට පෙර සිටි බෞද්ධ රජවරුනුත් බොදු සමයට දුන් ආධාර දැන් කතෝලික ආයතනවලට දිය හැකිය යන චේතනාවෙන් කෝට්ටේ රාජ්‍යයේ බෞද්ධ විහාරස්ථාන ඒවායේ ඉඩකඩම්, ගොඩනැගිලි සහ ඒවායේ ආදායම් ද සමග ලියවිල්ලකින් ප්‍රැන්සිස්කානු ධර්මදූතයින්ට පවරා දුන්නේය. මේ අදූරදර්ශී ක්‍රියාව නිසා රටවැසි බෞද්ධයින් බොහෝ දෙනෙක් මායාදුන්නේ වෙතට හැරුණාහ. ධර්මදූතයින්ටද එම ක්‍රියාවේ ප්‍රඥා විරහිත බව තේරෙන්නට විය.

ධර්මපාල රජු සිදුකළ තවත් ක්‍රියාවක් නිසා කෝට්ටේ රාජ්‍යයේ පලනය හිමිකර ගැනීම පෘතුගීසින්ට පහසුවිය. ඒ වනාහි ධර්මපාල රජුට දරුවන් නොසිටි නිසා තමාගෙන් පසු රාජ්‍යයේ උරුමය පෘතුගීසි රජුට තෑගි ඔප්පුවකින් පවරා දීමය. ඒ අනුව 1597 ධර්මපාල රජුගේ මරණින් පසු මුළු කෝට්ටේ රාජ්‍ය පෘතුගීසින් අතට පත්විය.

දොන් ජුවන් ධර්මපාල සිංහල රාජාවලියේ ප්‍රථම කතෝලික රජු වූවා පමණක් නොව, තම රාජ්‍යය පෘතුගීසීන්ට පැවරීමෙන්, කෝට්ටේ රාජ්‍යය කෙළවරට පැමිණවීමේ අභාග්‍යයේ කතුවරයා ද විය. ඔහුගේ රජ සමය ඉතා අවාසනාවන්ත එකක් විය. බෞද්ධ විහාරස්ථාන ධර්මදූතවරුන්ට ප්‍රදානය කිරීමේ අනුචණ හා ආසාධාරණ ක්‍රියාවෙන් රජුගේ අවාසනාවන්ත තත්ත්වය තවත් උග්‍රවිය. එම ක්‍රියා බොදු සසුනට පමණක් නොව කතෝලික සසුනට ද පොදු වශයෙන් රටට ද අහිතකර විය. හානිකර විය.

**ධර්මදූතවරුන් ලක්දිවට පැමිණීම**

ධර්ම දූත සේවය සඳහා ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකාවට පැමිණියේ ප්‍රැන්සිස්කාන නිකායික පියවරුන් ක්‍රි.ව. 1543 දීය. 7 වන බුවනෙකබාහු රජතුමා පෘතුගාලයේ රජුට ඉදිරිපත් කළ ඉල්ලීම අනුව ජෝන් ද විලා ද කොන්ඩෙ පියතුමාගේ නායකත්වය යටතේ

පස්දෙනෙකුගෙන් යුක්ත ධර්මදූත කණ්ඩායමක් මෙහි සැපැත්වූහ. බුවෙනකබාහු රජ සමයේ දී දහම් ප්‍රචාරය තරමක සෙමින් ගමනක් වුවද එම ධර්මදූතවරු ඉතා උද්‍යෝගිමත්ව ධර්ම ප්‍රචාර කටයුතුවල නියුක්ත වූහ. ලංකාවේ උතුරු හා බටහිර ප්‍රදේශ ඔවුන්ගේ සේවයට යොමු වූ අතර තැනින් තැන දෙව්මැදුරු තනා , ආගම ධර්මය උගන්වා කුඩා කණ්ඩායම් බව්තිස්මය කර කුඩා කිතුනු සංග පිහිටුවූහ.

1557 ධර්මපාල රජු මිය යාමත් සමග කෝට්ටේ රාජ්‍යය පෘතුගීසී පාලනයට යටත් වූ හෙයින් ධර්ම ප්‍රචාරයට වැඩි නිදහසක් හා අවස්ථාව උදාවිය. ඒ අනුව මෙරට සේවය සඳහා වෙනත් නිකායවල ධර්මදූතවරුන් ද ලක්දිවට ගෙන්වා ගැනීමට එවකට ලක්දිවට රදගුරු වූ කොචීනයේ රදගුරු තුමා ක්‍රියා කළේ ය. එහි ප්‍රතිඵලය ලෙස ක්‍රි. ව. 1602 දී ජේසු නිකායික ධර්මදූතවරුන් ද 1605 දී දොමිනිකාන නිකායික ධර්මදූතවරුන් ද , 1606 දී අගෝස්තීනු නිකායික ධර්මදූතවරුන් ද ලංකාවේ දහම් සේවයට එක්වන්නට යෙදුණි. එම කණ්ඩායම්වලට කොචිනයේ රදගුරුතුමා විසින් බෙදා දුන් ප්‍රදේශ මෙපරිදි විය.

| | |
|---|---|
| මහ ඔයෙන් උතුර | - ජේසු නිකාය |
| සබරගමුව | - අගෝස්තීනු නිකාය |
| සත්කෝරළේ | - දොමිනිකාන නිකාය |
| සෙසු ප්‍රදේශ | - ප්‍රන්සිස්කාන නිකාය |

මෙසේ තමන්ට පැවරුණු ප්‍රදේශවල සේවය කළ ධර්මදූතවරු ආගම ධර්මය ප්‍රචාරය කළා පමණක් නොව විවිධ සමාජ සේවාන්හි ද නියුතු වුහ. ඒ අතර අධ්‍යාපනයට විශේෂ ස්ථානයක් හිමිවිය. දෙව්මැදුරු අසල කුඩා පාසල් බිහිකරමින් දරුවන්ට මූලික අධ්‍යාපනය හා ආගම ධර්මය ඉගෙනීමට මං සැලසූහ. ඊට අමතරව ජේසු නිකායික පියවරුන් 'කොලිජි' නමින් උසස් පාසල් කීහිපයක් අරඹා උසස් අධ්‍යාපනය සඳහා ද අවස්ථාව ලබාදුන්හ.

අධ්‍යාපනයට අමතරව, අනාථ දරුවන් රැකබලා ගැනීම, රෝගීන්ට උපස්ථාන කිරීම, මහළු අය රැකබලා ගැනීම, කාර්මික පාසල් ආරම්භ කිරීම හා පුණ්‍යායතන පවත්වාගෙන යාම වැනි සේවාවන් ද පෘතුගීසි ධර්මදූතවරුන්ගෙන් ඉටුවිය.

**පෘතුගීසි මිෂනාරි ප්‍රයත්නය සාර්ථකවීමට බලපෑ හේතු**

1. ධර්මදූතයින්ගේ දැඩි කැපවීම හා උද්යෝගය නොදන්නා දේශයක නාඳුනන සෙනගකට සේවය කිරීමේදී භාෂාව, සංස්කෘතිය, දේශගුණික නුහුරු නුපුරුදු දේ වුවද ඒ සියල්ලම හුරුපුරුදු වෙමින් තමන්ගේ ජීවිත කාලය කැපකිරීමට ධර්මදූතයින් පසුබට නොවීය.

2. ධර්මදූතවරුන්ට පෘතුගීසි පාලකයින්ගෙන් ලැබුණු අනුග්‍රහය - පෘතුගීසී පාලන ප්‍රදේශවලින් දහම් ප්‍රචාරයට පූර්ණ නිදහස හා අනුග්‍රහය පෘතුගීසි රජයෙන් ලබාදෙන ලදී.

3. ධර්මදූතයින්ගේ ධර්ම ප්‍රචාර ක්‍රම - ඔවුන් දේශීය භාෂා ඉගෙන එම භාෂාවලින් ධර්ම ප්‍රචාරය කිරීම, ආගමික පොත පත දේශීය භාෂාවන්ගෙන් සැකසීම, කුඩා දරුවන්ට දහම ඉගැන්වීම සඳහා ප්‍රාථමික පාසල් ඇරඹීම, විවිධ දයාවේ සේවාවල නියැලීම සහ පෘතුගීසි ධර්මෝපදේශ ක්‍රම වන නාට්‍යකරණය, පෙරහැරයාම, සුරුවම් භාවිතය වැනි දෑ තුළින් ආගමික ප්‍රබෝධයක් ඇති කිරීම.

4. ධර්මදූතයින්ගේ සරල, චාම් ජීවිත රටාව හා ආදර්ශවත් දිවි පැවැත්ම

**පෘතුගීසී ධර්ම ප්‍රචාරයේ ඌණතාව**

පෘතුගීසි යුගයේ දී යුරෝපීය ධර්මදූතයින් වසර සියයකටත් අධික කාලයක් මෙරට සේවය කළද , ඔවුහු දේශීය අපේක්ෂකයින් පූජක දිවියට සූදානම් නොකළ හ. එහි ප්‍රතිඵලය වූයේ ලන්දේසි සමයේ දී ඔවුන් රටින් පන්නා දැමුණු කල දේශීය කතෝලික ජනතාවට සේවය කිරීමට ලක්දිව කතෝලික පූජකවරුන් නොසිටීමයි.

**පෘතුගීසි යුගයේ දී ඇතිවූ කතෝලික විරෝධි පීඩන**

1. **වීදිය බණ්ඩාරගේ පීඩනය**

දොන් ජුවන් ධර්මපාල රජුගේ පියා වූ වීදිය බණ්ඩාර පෘතුගීසීන් සමග ඇති කරගත් අමනාපය නිසා ඔවුන්ගෙන් පලිගැනීම පිණිස කිතුනු සංහාරයක් දියත් කළේ ය. ඒ අනුව දකුණු දිග ප්‍රදේශයේ දෙව්මැදුරු ගිනිබත් කළේ ය. ඒවායේ සේවය කළ පියවරුන් හා ක්‍රිස්තියානින් විනාශ කළේ ය. ක්‍රි. ව. 1555 දී සිදුවූ මේ විරෝධයෙන් ක්‍රිස්තු භක්තිකයෝ ද, ධර්මදූතවරුන් කිහිප දෙනෙක් ද ඝාතනය කරනු ලැබූහ.

2. **සංකිලි රජු යටතේ පීඩනය**

1542 ඉන්දියාවට පැමිණි ප්‍රැන්සිස් සාවියර් තුමා දකුණු ඉන්දියාවේ ගිනිකොණ දිග මුහුදුකරයේ විසූ සෙනඟට සේවය කළේ ය. එහි විසූ පරවර, කරෙයියාර් වැනි කුලවල ජනයාට කිතු දහම හඳුන්වා දුන්නේ ය. එවකට ලංකාවේ මන්නාරම දූපතේ විසූ කරෙයියාර් කුලයේ ජනයා ද ප්‍රැන්සිස් සාවියර් තුමන්ට මෙහි පැමිණෙන ලෙස ආරාධනා කරමින් ඉල්ලා සිටියේ තමන්ට ප්‍රසාද ස්නාපනය දානය කරන ලෙසටය. ඒ අනුව සාවියර් තුමාගේ නියෝජිතයකු මන්නාරමට එවන ලදුව සිය ගණනක් හින්දු භක්තිකයෝ ක්‍රිස්තියානිය වැළඳ ගත්හ. මේ බව හින්දු පූජකයින් විසින් යාපනයේ සංකිලි රජුට දන්වන ලදී. කුපිත වූ සංකිලි රජ හමුදාවක් යවා කිතුනුවන් 600 ක් පමණ දෙනා මරා දැම්මේ ය. එම කිතුනුවන් පිරිස " මන්නාරමේ ප්‍රාණපරිත්‍යාගින් ' ලෙස හැඳින්වෙයි.

**කිතු දහම වැළඳගත් රජදරුවෝ**

**1. ධර්මපාල කුමරා**

7 වන බුවනෙකබාහු රජුගේ මුණුබුරා වූ ධර්මපාල කුමරු දොන් ජුවන් ධර්මපාල නමින් බව්තිස්මය ලැබීය. ධර්මපාල කතෝලිකයකු වූයේ පෘතුගීසින්ගේ උපකාර අවශ්‍ය වූ නිසාත්, රටවැසියන්ගෙන් සමූහයක් කතෝලික ආගම වැළඳගත් නිසාත්, ධර්මදූතයින්ගේ උත්සාහය නිසාත් විය හැකිය. ඒ කෙසේ වුවද ඔහු කතෝලික දහම මැනවින් දැනසිටි බවද මරණය දක්වා එම දහමට ඇලුම්ව සිටි බවද හෙළිවේ.

**2. ජයවීර බණ්ඩාර**

මහනුවර රජකම් කළ වික්‍රමබාහු රජුගේ පුත්‍රයාය - පෘතුගීසින්ගේ උදව් පතා කිතු දහම වැළඳගත් නමුත්, සීතාවක රාජසිංහ රජුගේ ආක්‍රමණ නැවතුණ පසු ආගම ප්‍රතික්ෂේප කළේය.

**3. කරලියද්දේ බණ්ඩාර**

මොහු ජයවීර බණ්ඩාරගේ පුතුණුවෝය. මහනුවර ධර්ම ප්‍රචාරය කිරීමේ නිදහස ද ලබා දුන්නේය. 1 වන රාජසිංහ රජු මහනුවර ආක්‍රමණය කළ විට පෘතුගීසීන්ගේ ආරක්ෂාව පතා ත්‍රිකුණාමලයට පළා ගිය අතර රජ පවුලේ සියලු දෙනා ක්‍රිස්තියානිය වැළඳ ගත්හ.

**4. වීරසුන්දර බණ්ඩාර**

උඩරට කුමාරයකු වූ මොහු පෘතුගීසීන් විසින් ගෝවට යවනු ලැබ එහිදී " වික්ටර් ලෙපානෝ ' නමින් බව්තිස්මය ලැබීය.

**5. දෝන කතරිනා ( කුසුමාසන දේවි)**

කරලියද්දේ බණ්ඩාරගේ දියණිය වූ ඇය, පෘතුගීසි හමුදාව විසින් මහනුවරට ගෙනයන ලද්දේ රජකම ලබාදීමටය. එහෙත් පෘතුගීසී හමුදාව පරාජය වී දෝන කතරිනා කුමරිය විමලධර්මසූරිය රජු අතට පත්විය. ඇය විමලධර්මසූරිය රජුටත්, ඉන්පසු සෙනරත් රජුටත් බිසව වූ අතර ඇගේ ආගම අදහීමට බාධා ඇතිවිය.

**6. යාපනය රජ පවුලේ කුමර කුමරියන්**

පරරාජසේකරම් රජුගේ දරුවන් පෘතුගීසීන් විසින් කොළඹට ගෙන්වන ලදුව කුමරා - ' කොන්ස්තන්තීනු ' නමින් ද කුමරියන් දෙදෙනා ' ඉසබෙල්' හා ' මරියා' නමින් ද ප්‍රසාද ස්නාපනය ලබන ලදී. කුමරා ගෝවට යවන ලද අතර ප්‍රැන්සිස්කාන නිකායේ පූජකවරයෙක් විය. කුමරියන් දෙදෙනා ගෝවේ අගෝස්තීනු නිකායේ කන්‍යා සොයුරියෝ වූහ.

7. **දොන් ජුවන් යමසිංහ**

මහනුවර පිලිප් යමසිංහ රජුගේ පුත්‍රයාය. මොහු ඉන්දියාවේ ගෝව නගරයේදී අධ්‍යාපනය ලබා පෘතුගාලයේ කොයිම්බ්‍රා විශ්වවිද්‍යාලයේ දේව ධර්මය හදාරා පූජකවරය ලැබුවේය. ලිස්බනයේ ' ටෙල්හිරාස්' නම් ස්ථානයේ දෙව්මැදුරක් ද එතුමා විසින් ඉදිකරන ලදී.

**පෘතුගීසි පාලනයේ ප්‍රතිඵල**

1. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමඟ හිමිවූ විශේෂතම දායාදය වනුයේ කතෝලික දහමයි. පෘතුගීසී පාලන යුගය අවසන් වන විට ලංකාවේ මුහුදුබඩ පළාත්වල ජනයාගෙන් බොහෝ දෙනෙක් මේ දහම වැළඳගෙන සිටියහ.

2. අපරදිග භාෂා සහ අපරදිග අධ්‍යාපන ක්‍රම මෙරට ව්‍යාප්ත වූයේ ද පෘතුගීසී සමයේ ය. විශේෂයෙන්ම ලතින්, ග්‍රීක්, පෘතුගීසි යන භාෂා මෙරට ජනයාට හඳුන්වා දෙන ලද්දේ පෘතුගීසින් විසිනි. එමෙන්ම විධිමත් පාසල් තුළින් අධ්‍යාපනය ලබාදීමේ ක්‍රම ද ඔවුන්ගෙන් අපට හිමි විය.

3. පෘතුගීසී සංස්කෘතියේ ආභාෂය නිසා මෙරට සංස්කෘතියට හා ජන ජීවිතයට නව අංග එක්විය. පෘතුගීසි ගායනා, සංගීතය, නැටුම් යනාදිය තවමත් අප අතර පවතී. (බයිලා, කපිරිඤ්ඤා)

4. පෘතුගීසි භාෂාව ජනයා අතර ව්‍යාප්තවීමෙන් අපගේ භාෂා පෝෂණයට එය රුකුලක් විය. කොන්ත, කුරුස, සුරුවම, කැවුම්, කොකිස්, අල්මාරි, පෙට්ටගම, ආරුක්කු, පාන් ආදී වචන ඉන් ස්වල්පයකි.

5. විවාහයේ ස්ථාවරත්වය තහවුරු වූයේ ද පෘතුගීසී ආභාෂය නිසාය. මෙරට පැවති එකගෙයි කෑම වැනි චාරිත්‍ර අහෝසිවීමටද එය හේතුවිය.

6. පෘතුගීසින් විසින් අධ්‍යාපනයට ආගම සම්බන්ධ කළ නිසා අද පවා ආගම ධර්මය, අධ්‍යාපනය තුළ වැදගත් අංගයක් ලෙස සැළකේ.

7. " පෘතුගීසී දයා සංගමය' (Misericordia)) මගින් දිළින්දන්ට, රෝගීන්ට, මහළු අයට හා අසරණයින්ට සහයවීමට සමාජ සේවා ක්‍රියාත්මක කරන ලදී. මෙරට රෝහල් පිහිටුවා බටහිර වෛද්‍ය විද්‍යාව හඳුන්වාදීමට පූරෝගාමී වූයේ පෘතුගීසින්ය.

8. ප්‍රථම සිංහල හටන් කාව්‍යය ලෙස සැලකෙන ' කොන්ස්තන්තීනු හටන ' නිර්මාණය වූයේ ද පෘතුගීසි යුගයේය. ඒ පෘතුගීසි රජයේ තෝම්බු සකස් කරන්නකු ලෙස සේවය කළ , කිතු දහම වැළඳගත් අලගියවන්න මුකවෙටි කවියා විසින් ය.

8.1.3 ලන්දේසි යුගය ක්‍රි. ව. 1658 1796

**පෘතුගීසි පාලනයේ නිමාව හා ලන්දේසි පාලනයේ උදාව**

කෝට්ටේ රාජ්‍ය හා යාපනයේ රාජ්‍ය පෘතුගීසි පාලනයට යටත්ව තිබුණ නමුත් කන්ද උඩරට රාජ්‍ය ස්වාධීනව සිංහල රජ කෙනෙකු යටතේ විය. සිංහල රජුටත්, රටවැසියන්ටත් පෘතුගීසි පාලනය නීරසවීමට බලපෑ හේතු රැසකි.

- තම රට විදේශිකයිනට යටත්ව තිබීම රජු හා රටවැසියන්ට නොරිස්සීම
- ඇතැම් පෘතුගීසි පාලකයින්ගේ හා නිළධාරීන්ගේ කෲරකම් හා අකටයුතුකම්
- පෘතුගීසීන්ගේ යුද්ධවලින් ලේ සිඳහෙලීමක්, ජීවිත විනාශයක් සිදුවීම
- පෘතුගීසින් තම ආගම මුවාවෙන් මෙරට බෞද්ධයින්ට නොයෙකුත් හිරිහැර කිරීම

මෙවන් වූ පසුබිමක තුළ පෘතුගීසීන් මෙරටින් පළවාහැර රට බේරාගැනීමට - උඩරට දෙවන රාජසිංහ රජතුමා සහය පැතුවේ ඕලන්ද ජාතිකයින් හෙවත් ලන්දේසීන්ගෙනි. ඒ සඳහා ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකර ගත්තේය. ඒ අනුව මුහුදුබඩ ප්‍රදේශයවල තිබුණු පෘතුගීසි බලකොටු එකිනෙක ලන්දේසීන් විසින් අල්ලා ගනු ලැබිණි. අවසාන වශයෙන් 1656 දී කොළඹ කොටුවද, 1658 දී යාපනය කොටුවද ලන්දේසීන් අතට පත්වීමෙන් ලක්දිව පෘතුගීසි ආධිපත්‍ය නිමවී ලන්දේසි ආධිපත්‍ය ඇරඹිණි. රාජසිංහ රජු බලාපොරොත්තු වූ ආකාරයට පෘතුගීසීන්ගෙන් මුදාගත් ප්‍රදේශ සිංහල රජතුමාට පවරා දෙනවා වෙනුවට ලන්දේසීන් කළේ එම ප්‍රදේශවල තමන්ගේ බලය පිහිටුවා ගැනීමය.

**පෘතුගීසීන් හා ලන්දේසීන් අතර පැවති භේදය**

16 වැනි ශතවර්ෂයේ ඇතිවූ රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණයේදී පෘතුගාලය කතෝලික දහමටද, ඕලන්දය ජොන් කැල්වින්ගේ රෙපරමාදු දහමටද බෙදී වෙන්විය. මේ හේතුවෙන් පෘතුගීසින් හා ලන්දේසීන් අතර අතිවූයේ වෛරී සහගත හැඟීමකි. එසේම 16 වන සියවසේ අගභාගයදී ඕලන්දය ස්පාඤ්ඤයේ ආධිපත්‍යයෙන් මිදී යුරෝපයේ ප්‍රබල රටක් බවට පත්විය. ඕලන්දය බලසම්පන්න රටක් වීමට විශේෂයෙන් ආධාර වූයේ වෙළඳ සමාගම් කීපයක් එකට සම්බන්ධ කිරීමෙන් සංවිධානය කරන ලද " පෙරදිග ඉන්දීය සමාගමයි. එම සමාගමේ පරමාර්ථය වූයේ වෙළදාම දියුණු කිරිමය. ක්‍රි. ව 1602 දී පෙරදිග ඉන්දියා සමාගම පිහිටු වූ අධිකාර පත්‍රයෙහි ආගම පතුරුවා හැරීම සමාගමේ කටයුත්තක් ලෙස සඳහන් වූයේ නැත. එහෙත් සමාගමේ පොදු විධිවිධාන අතරේ කතෝලිකයින්ට විරුද්ධ වූ නියෝග ඇතුළත් කරන ලදී.

මෙසේ පෘතුගීසින් හා ලන්දේසින් එකිනෙකට ප්‍රතිවිරුද්ධ ආගම් දෙකක් ඇදහූ හෙයින් ද, පෙරදිග වෙළඳ ව්‍යාපාරයෙහි තරඟකරුවන් වූ හෙයින්ද එම දෙපාර්ශවය අතර පැවතියේ භේදයකි. ඒමනිසා පෘතුගීසීන් පෙරදිගින් නෙරපා දමීම ලන්දේසීන්ගේ ද අභිලාෂය විය.

## ලන්දේසීන්ගේ කතෝලික විරෝධී ප්‍රතිපත්තිය

ලන්දේසීන්ගේ පෙරදිග ඉන්දියා සමාගම පිහිටුවීමේ දී ආගම ප්‍රචාරය සමාගමේ කටයුත්තක් ලෙස සඳහන් නොවුණ ද, ක්‍රි. ව. 1642 දී එම වෙළඳ සමාගම නිකුත් කළ බෙතාවියානු නීති සංග්‍රහයේ මෙලෙස සඳහන් කර තිබේ. "රෙපරමාදු ක්‍රිස්තියානි දහම හැරුණුවිට වෙනත් කිසිම ආගමක් ප්‍රසිද්ධියේ හෝ රහසින් ඇදහීමට කිසිම ඉඩ ප්‍රස්ථාවක් නොදිය යුතුය. මේ නීතියට විරුද්ධව ක්‍රියාකරන අයගේ දේපළ රාජ සන්තක කළ යුතු අතර ඔවුන් රටින් පිටුවහල් කළ යුතු ය.... "

පෘතුගීසින් පළවා හැරීම සඳහා රාජසිංහ රජු සහ ලන්දේසීන් අතර ඇතිවූ ගිවිසුමේ කොන්දේසියක් වූයේ ද, කිසිම කතෝලික පූජකවරයකුටවත්, පැවදිවරයකුවටත් තම රාජ්‍යයේ නවැතී සිටීමට රජු ඉඩ නොදිය යුතු බවත්, එවැන්නන් රටින් පන්නා දැමිය යුතු බවත්ය.

1682 ජුලි 1 දරණ ආඥා පණතකින් කතෝලිකයින්ට,

- අප්‍රසිද්ධියේ හෝ ප්‍රසිද්ධියේ රැස්වීම් පැවැත්වීම ද
- කතෝලික වත්පිළිවෙත් පැවැත්වීම හා ඒවාට සහභාගිවීම ද
- පූජකවරයකු නැතිව හෝ ධර්ම දේශනවලට සවන්දීම හා ගී ගැයීම ද
- තමන්ගේ නිවෙස්වල කිතුනු ප්‍රතිමා හා චිත්‍ර තබා ගැනීම ද
- කිසිම පූජකවරයකු විසින් වත්පිළිවෙත් පැවැත්වීම ද
- පූජකවරුන් විසින් කිසිවකුට බව්තිස්මය දීම ද තහනම් කරන ලදී.

මේ නියෝග කඩකරන අයට දඩගැසීම, සිරගත කිරිම හා අන් දරුණු දඬුවම් නියම විය.

මෙසේ ලන්දේසි යුගය ලක්දිව කිතුනුවන්ට අතිශයින් පීඩාකාරී සමයක් විය. අප්‍රසිද්ධියේ හෝ තම ආගම ඇදහීම නීතියෙන් තහනම් විය. දිව්‍ය පූජාව පැවැත්වීමද තහනම් විය. සියලු කතෝලික දෙව්මැඳුරු හා පාසල් ද පුණ්‍ය ආයතනය ද විනාශ කරන ලදී. නැතහොත් රෙපරමාදු සභාවේ පූජකයින්ට පවරන ලදී. සියලුම පාසල්වල රෙපරමාදු දහම පමණක් උගන්වන ලද අතර එම පාසල්වලට දරුවන් යැවීමට අසතුටු වූවන්ට දඩ නියම කරන ලදී. රෙපරමාදු දේවස්ථානයක ප්‍රසාද ස්නාපනය

නොලැබූ අයගේ උපත ලියාපදිංචි කිරීම වලංගු ලෙස නොසළකන ලදී. රෙපරමාදු චතාවත් අනුව සිදු නොවන විවාහ නොපිළිගන්නා ලදී. රෙපරමාදු ආගමට හැරුණු අයට විශේෂ වරප්‍රසාද ලැබුණු අතර කතෝලිකයින් යැයි කියාගත් අයට රජයේ කිසිදු අනුග්‍රහයක් නොලැබුණි. කතෝලිකයින් මුහුණ දුන් මහත් විපත නම් ඔවුන්ගේ ආගමික කටයුතු සඳහා පූජාප්‍රසාදිවරුන් නොමැතිවීමය. ලන්දේසීන් විසින් මෙරට සේවය කළ ධර්මදූතවරුන් රටෙන් පිටුවහල් කරන ලදී. යම් පූජකතුමකු මෙරට සැඟවී සිටියේ නම් එය මරණ දණ්ඩනය ලැබීමට හේතුවක් ලෙස සළකන ලදී. ගිහියන් විසින් පූජකවරුන්ට රැකවරණය දීම ද දඬුවම් ලැබිය යුතු වරදක් විය. පෘතුගීසී යුගයේ අවසානය වන විට පූජකරුවන් 120 දෙනෙකු පමණ මෙරට සේවය කළ නමුත් ලන්දේසි යුගයේ දී එකම පියතුමකු හෝ මෙරට ඉතිරි නොවීය.

## ලන්දේසීන් මෙරට කතෝලිකයින්ට පීඩා කිරීමට හේතු

1. කතෝලික ආගම, රෙපරමාදු ලන්දේසීන් නොරිස්සූ ආගමක් විය. කතෝලික දහමේ ප්‍රතිමා භාවිතය, සාන්තුවරයන් පිදීම, දිව්‍ය පූජාව වැනි වත්පිළිවෙත් නිසා ඔවුන් එය සැලකුවේ මිථ්‍යා දෘෂ්ටික ආගමක් ලෙසය. එය වෙනුවට දේශිය කතෝලිකයන් ලන්දේසී රෙපරමාදු ආගමට හරවා ගැනීම තමන්ගේ ආගමික යුතුකමක් ලෙස ලන්දේසිහු සැළකූහ.

2. දේශීය ජනයා තමන්ගේ රෙපරමාදු දහම වැළඳ ගැනීමෙන් ඔවුන් හා තමන් අතර සුහද සම්බන්ධයක් ඇතිවනු ඇතැයි ද එය දේශපාලනමය වශයෙන් ප්‍රයෝජනවත් වනු ඇතැයි ද ලන්දේසිහු බලාපොරොත්තු වූහ.

3 විශේෂයෙන්ම කතෝලික දහම මෙරට කතෝලිකයින් හා පෘතුගීසීන් අතර ප්‍රබල පුරුකක් වනු ඇතැයි සිතූ නිසාය. එවැනි ආගමික සම්බන්ධතා නිසා කතෝලික ජනයා ලන්දේසීන්ට පක්ෂපාති නොවනු ඇතැයි ද නැවත පෘතුගීසින් මෙහි ගෙන්වා ගැනීමට වෑයම් කරනු ඇතැයි ද ඔවුහු සිතූහ.

## ලන්දේසි පීඩන හමුවේ මෙරට කතෝලිකයින්ගේ ප්‍රතිචාරය

ලන්දේසීන්ගේ පීඩන නීති නිසා කතෝලිකයින්ට තම ආගම ඇදහීමේ නිදහස සම්පූර්ණයෙන් අහිමි විය. එපමණක් නොව විවිධ වූ දුක් ගැහැට විඳින්නට සිදුවිය. එක් පූජකතුමකුවත් රටේ නැතිව අවුරුදු තිහක් (30) පමණ කාලයක් තිස්සේ තමන්ගේ විශ්වාසය රැක ගන්නට ගිහි ජනතාවට සිදුවිය.

ලන්දේසි නීති රීති හමුවේ තමන්ගේ වාසිය පතාගෙන කතෝලික දහම අතහැර රෙපරමාදු දහම වැළඳගත් සුළු පිරිසක් හැරෙන්නට, කතෝලික ජනයාගෙන් විශාල පිරිසක් තම ආගමට පක්ෂපාතීව, එය අත් නොහැර ඊට අතිශයින් ලැදිව සිටි බව පෙනේ. තම විශ්වාසය වෙනුවෙන් ඕනෑම දඬුවමක් විඳීමට ඇතැම් අය

සූදානම් ව සිටියහ. විශේෂයෙන්ම මීගමුව, හලාවත ප්‍රදේශවල විසූ කතෝලිකයෝ තමන් රෙපරමාදු ධර්මය වැළඳ ගැනීමට අකැමැති බව ප්‍රසිද්ධියේ කියා සිටියහ. එපමණක් නොව තමන්ගේ දරුවන්ට රෙපරමාදු ධර්මය ඉගැන්වීම ගැනද විරෝධය දැක්වූහ . මීගමුවේ කතෝලික පිරිස අතර නායකත්වය දැරුවේ ඒ පළාතට රජයේ ප්‍රධාන නිළධරයා වූ " දොන් අපෝන්සු පෙරෙයිරා " නම් වූ ප්‍රභූවරයෙකි. ඔහුට කතෝලික ඇදහිල්ල වෙනුවෙන් තමා සතු සියල්ල පරිත්‍යාග කිරීමට සිදුවූවා පමණක් නොව නොයෙක් දුක් කරදර විඳීමෙන් පසු රටින් පිටුවහල් කරනු ලැබ ජීවිතය අවසන් කළේ බ්‍රිතාන්‍යයේය. ඔහුගේ පවුලේ සෙසු අයටද අත්වූයේ ඒ ඉරණමය. මෙසේ පීඩන මැද කතෝලික සමයට හිතේෂීව සිටි අය බොහෝ වූහ.

මෙරට කතෝලික පූජකවරුන් කිසිවකු නොසිටීමෙන් අපගේ කතෝලිකයින් පත්වූයේ මහත් අසරණ තත්ත්වයකටය. ඒනිසා කතෝලික පූජාප්‍රසාදිවරයකු සිටි නැවක් කොළඹ වරායට පැමිණි හැමවිටම කොළඹ නගරයේ කතෝලිකයෝ තමනට සිදුවිය හැකි අන්තරාය නොතකා නැවට ගොස් දේව ප්‍රසාද නිධාන ලබා ගත්හ.

මහනුවර රාජ්‍යයෙහි විසූ කතෝලිකයින්ට යම් තරමක නිදහසක් තිබුණු නමුත් ඔවුන්ටද දේවස්ථාන නොමැතිවිය. පූජකවරු නොසිටියහ. ඒනිසා ඉරුදින එක්ව දේව වන්දනාව පැවැත්වීමට නොහැකිවූ බවද එක් එක් කතෝලිකයා ගෙදරදී තමාට හැකි ආකාරයෙන් යාච්ඤා කළ බවද, දරුවන්ට ගිහියන් විසින් ප්‍රසාද ස්නාපනය දුන බවද, තමන්ගේ දරුවන්ට යාච්ඤා කිරීමට ඉගැන්වූ බවද, තමන් කතෝලිකයන් වීමේ බාහිර ලකුණක් වශයෙන් සමහරුන් ජපමාල හා කුරුස පැළඳූ බවද රොබට් නොක්ස් 1680 දි ලියා තිබේ.

ගිහියන් වශයෙන් තමන්ට කළහැකි සියල්ල කර ගත්තද, පූජකතුමන්ගෙන් තමන්ට ලැබිය යුතු සේවාව, විශේෂයෙන් දිව්‍ය පූජාව, දිව්‍ය සත්ප්‍රසාදය සහ පාපොච්චාරණය සම්බන්ධ සේවා නොලැබීම කතෝලිකයින්ට විශාල පාඩුවක් වූයෙන් මෙරටට පූජකවරුන් ඉල්ලා ගෝවේ හි සභා නායකයින්ට ලිපි ලියූහ. එහි පූජාප්‍රසාදිවරුන් ලංකාවේ කතෝලිකයින්ට සහනය දෙන ලෙස ඕලන්දියන්ගෙන් අවනතව ඉල්ලා සිටිය ද, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මාර්ගවලින් ඉල්ලීම් ඉදිරිපත් කළ ද ඒ සියල්ල නිෂ්ඵල විය. කිසිම පූජකවරයකුට ලක්දිවට යන්නට අවසර නොදීමට ඕලන්ද රජය ස්ථිර ලෙස තීරණය කරගෙන සිටියේය.

### ලන්දේසී යුගයේ අධ්‍යාපනය

ලන්දේසීන්ගේ අධ්‍යාපන අරමුණු ද පෘතුගීසීන්ගේ අධ්‍යාපන අරමුණු හා සමාන වෙමින් අධ්‍යාපනය හරහා ආගම ප්‍රචාරය කිරීමට මුල් තැන දුන් බව පෙනේ. එහෙත් පෘතුගීසීන්ට වඩා ක්‍රමානුකූල හා සංවිධානාත්මක බවත් ලන්දේසීන්ගේ අධ්‍යාපන කටයුතුවල තිබිණි. සෑම මීසමකම පාසලක් පිහිටුවූ අතර " කතිකිස්ක්

නම් ගුරුවරයකුට සෑම පාසලකම ආගම ඉගැන්වීම භාර විය. දේශීය පූජකවරුන් පුහුණුව සඳහා පුහුණු මධ්‍යස්ථාන (සෙමනේරි) ආරම්භ කරන ලදී.

ලන්දේසී යුගයේදී අධ්‍යාපනය අනිවාර්ය විය. වයස අවු 15 තෙක් අනිවාර්ය වූ අධ්‍යාපනය අවසන් වූ විට පාසලෙහි විභාගයක් පවත්වා " ලාගීර්ඩන්" නැමැති සහතිකය ප්‍රදානය කරන ලදි. එතැනින් නොනැවති ළමුන්ට වයස අවු 19 තෙක් අනුක්‍රමික අධ්‍යාපන ක්‍රමයක් සැකසිණි. වඩා දක්ෂ ළමුන්ට උසස් අධ්‍යාපනයට, ගුරු පුහුණුවට හා සමහරවිට උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගත්වීමටද පාසල් ක්‍රමය මග පාදා දුණි.

එකල අධ්‍යාපනය පිළිබඳ සෘජු වගකීම ලන්දේසි රජය විසින් බාරගෙන සියලු වැය දරා ගුරුවරුන් පත් කිරිම පුහුණු කිරීම, පාලනය සහ පරීක්ෂකවරුන් මගින් පාසල් නිරීක්ෂණයට භාජනය කිරීම ද සිදුවිය. එම කටයුතු " ස්කොලාකල් කොමිසම" නැමැති විශේෂ ආයතනයක් මගින් පාලනය කෙරිණි.

**ලන්දේසි පාලන සමයේ හිතකර ලක්ෂණ**

වසර 140 කට ආසන්න කාලයක් ලන්දේසීන් විසින් මෙරට මුහුදුබඩ පළාත් පාලනය කරන ලදී. එම කාලය මෙරට කතෝලිකයින්ට පීඩන සමයක් වුවද ලන්දේසි පාලන සමය ශ්‍රී ලංකාවේ ප්‍රගතියට මහත් සේ දායක වූ බව පිළිගත හැකිය.

1. වෙළදාම දියුණු කිරීම හා ආර්ථික භෝග වගාවට යොමුවීම නිසා මෙරට ආර්ථිකයේ පණගැන්වීමක් සිදුවිය.
2. වෙළඳ කටයුතු සඳහා මං මාවත් සෑදීම, ඇළ දොළ පිළිසකර කිරීම හා ප්‍රවාහනය සඳහා ජලමාර්ග යොදාගැනීම ද ලන්දේසි පාලන සමයේ සිදුවිය.
3. රෝම ලන්දේසි නීතිය මෙරටට දුන්නේ ද අධිකරණය මගින් නඩු ඇසීම හා නීත්‍යානුකුල දඬුවම් පැමිණවීම ආරම්භ කළේ ද ලන්දේසීන් විසිනි.
4. පරිපාලන කටයුතු මනා ලෙස සංවිධානය කරමින් කච්චේරි ආරම්භ කිරීමද එමගින් පුරවැසියන්ගේ උපත, විවාහය, මරණය වැනි දේ ලියා පදිංචි කිරීමද ඇරඹිණි.
5. අධ්‍යාපන කටයුතු මනා ලෙස සංවිධානය වීමද ලන්දේසි යුගයේ ප්‍රතිඵලයකි.
6. ඕලන්ද රෙපරමාදු දහම මෙරට පැතිරයාමෙන් එම දහමේ හරය මෙරට ජන සමාජයට මුසුවිය.
7. මුද්‍රණ යන්ත්‍රය මෙරටට හඳුන්වාදීම, ශු බයිබලය සිංහලට පරිවර්තනය හා ජනයා අතර ව්‍යාප්ත කිරීම ආදිය ද ආරම්භ විය.

**ගෞරවනීය ජුසේ වාස් පියතුමාගෙන් ලක් සසුනට වූ සේවය**

ක්‍රි. ව. 1680 වන විට ශ්‍රී ලංකාව තුළ එකම කතෝලික පූජාප්‍රසාදිවරයකුවත් නොවීය. එවැනි සමයක මෙරට කතෝලිකයින් වෙනුවෙන් තම ජීවිතයම කැපකර උදාර දහම් සේවයකට ඇප කැපවූ කිතුනු වීරයකු ලෙස ජුසේ වාස් පියතුමා හැඳින්විය හැකි ය.

එතුමා උපත ලැබුවේ ඉන්දියාවේ ගෝව ප්‍රදේශයේ සෙන්කොආලේ යන ග්‍රමයේ බ්‍රාහ්මණ වාංශික ක්‍රිස්ටෝෆර් වාස් සහ මරියා මිරැන්ඩා යන දෙමාපියන්ට දාව ක්‍රි.ව 1651 අප්‍රේල් 21 වන දාය. කුඩා කල පටන් දැහැමි ලෙස හැඩගැසුණු හෙතෙම තුරුණු වියේදී පූජක දිවිය වැළඳ ගත්තේය. ඒ 1676 දී ගෝව රදගුරු වසමේ සේවය සඳහා ගෝව අගරදගුරු තුමන් අතිනි. වසර පහක් පමණ ගෝවේ සේවය කළ වාස් පියතුමා ගෝවට දකුණින් පිහිටි කැනරා ප්‍රදේශයේ ප්‍රදේශියාධිපති වශයෙන් පත්කරනු ලැබ එහි සේවාවේ යෙදුණේය.

මේ අතරතුර වාස් පියතුමාගේ සිත ශ්‍රී ලංකාව දෙසට යොමු වූයේ මෙරට කතෝලිකයින්ගේ අසරණ තත්ත්වය ගැන අසන්නට ලැබීමෙන් ය. ඕලන්ද මුරකරුවන්ගෙන් බේරී කතෝලික පූජකවරයකු ලෙස ලක්දිවට ඇතුළුවීමේ දුෂ්කරතාව දැනසිටි එතුමා ඒ සඳහා සුදුසු මගක් සොයමින් කල්ගත කළේ ය. 1685 දී කැනරාවේ සේවය නිමකර ආපසු ගෝවට ගිය එතුමා ඉන්දීය ඔරතෝරියානු පූජක සංසයේ සාමාජිකත්වය ලබා ගත්තේය. 1687 දී කම්කරුවකු ලෙස වෙස් වලාගෙන මන්නාරමට ගොඩබසින්නට එතුමන් සමත් විය.

ජුසේ වාස් පියතුමා ශ්‍රී ලංකාවට පැමිණියේ කිසිවෙකුගේ ආරාධනයකින් තොරව ස්ව කැමැත්තෙන්මය. ගැඹුරු විශ්වාසයක් තිබුණු එතුමා තම ජීවිතය පවා පරදුවට තබා නොදන්නා රටක, නොදන්නා භාෂාවක් කතා කරන , නාඳුනන සෙනගක් අතර කිසිදු සහයෝගයක් බලාපොරොත්තු විය නොහැකි දුෂ්කර සේවාවකට යොමුවීම තමන්ට දෙවියන් වහන්සේ දුන් කැඳවීමක් ලෙස පිළිගත්තේය. මෙරටට පා තැබූ මොහොතේ සිට ජීවිතයේ අවසානය දක්වාම එතුමා අඛණ්ඩ දහම් සේවාවක නියුතු වූයේ තම සුව පහසුව ගැන කිසිත් නොතකමින්ය. කිතුනුවන් සොයාගොස් ඔවුනට සේවය කළේ ඉමහත් කැපවීමකින්ය.

ලන්දේසි සමයේ දී වසර 20 ක් පමණ කාලයක් ලංකාවේ සිටි එකම කතෝලික පූජාප්‍රසාදිවරයා වූයේ ජුසේ වාස් පියතුමා ය. එතුමා උතුරේ සිට දකුණටත්, දකුණේ සිට මධ්‍යම පළාතටත් සැරිසැරුවේ විවිධ දුෂ්කර මාර්ගවල, පා ගමනින් ය. කුසට අහරක් පවා නොලද අවස්ථා එමට විය. මහනුවරට ගිය මුල් අවස්ථාවේ දීම එතුමා ඔත්තුකරුවකු බවට සැකකර රජතුමා විසින් සිරගත කරන ලදී. මෙසේ දුක් කරදර රාශියක් විඳිමින් ශ්‍රී ලංකාවේ කතෝලික දහම ලන්දේසි යුගයේ දී

ආරක්ෂා කර දීමට ජුසේ වාස් පියතුමන්ගෙන් ඉටු වූ දහම් සේවය විස්තර කළ නොහැකි තරම් අගනේය.

ජුසේ වාස් පියතුමා විසි වසරක් පමණ කාලයක් තිස්සේ කරගෙන ආ සේවය තම මරණින් පසුව ද ඉදිරියට ගෙනයාම සඳහා කටයුතු සම්පාදනය කළේය. ඒ ඉන්දියානු ඔරතෝරියානු නිකායේ පියවරුන් මෙරට සේවය සඳහා ගෙන්වා ගැනීමෙන් ය.

ක්‍රි. ව 1711 ජනවාරි 16 වන දින ජුසේ වාස් පියතුමා සවර්ගස්ථ වන විට එතුමන්ගේ වයස අවුරුදු 66 ක් විය. එවිට පියතුමකු ලෙස වසර 35 ක් ද ලංකාව තුළ සේවය වසර 24 ක් ද සම්පූර්ණ කර තිබිණි. එතුමන්ගේ මරණ මොහොතේදී එතුමා වටා සිටි අනෙක් පියවරුන්ගේ ඉල්ලීම අනුව දෙන ලද අවසාන අවවාදය වූයේ, " තේරුම් ගන්න. කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ නොසළකා හැරිය දෙයක්, ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකි ය" යනුයි.

## ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති

1. එතුමා මෙරටට පැමිණියේ හා සේවය කළේ හුදෙක් ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයකු ලෙස පමණි. කිසියම් දේශපාලන සම්බන්ධයක් හෝ රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිව වුවද ධර්ම ප්‍රචාරය සාර්ථකව ඉටුකළ හැකිබව තම සේවාව තුළින් කතෝලික ලෝකයට පෙන්වා දුන්නේය.

2. යටත් විජිත යුගයේ යුරෝපීය ධර්මදූතවරුන් විසින් කිතුනු නොවූ ආගමිකයින් සළකන ලද්දේ මිථ්‍යාදෘෂ්ටිකයින්, රූප ඇදහිලිකාරයින් ලෙසටය. එහෙත් වාස් පියතුමා අන්‍ය ආගමිකයින් පිළිබඳ වෙනස් ආකල්පයකින් ක්‍රියා කළේ ය. දයා සේවාවේදි කිතුනු නොකිතුනු සැමට එකසේ සැලකුවේය. කතෝලික දහමට තම ජීවිතයෙන් සාක්ෂි දැරුවේය.

3. දේශීය භාෂා මැනවින් නො ඉගෙන ධර්මදූත සේවාවේ යෙදීම දුෂ්කර බව පිළිගත් වාස් පියතුමා සිංහල හා දෙමළ භාෂා හොඳින් ඉගෙන ගත්තේ සේවයේ යහපත සඳහා ය. මෙරට පැමිණි අන් ධර්මදූතවරුන්ටද භාෂා ඉගෙනීමට දිරිදුන් අතර ජාකොමේ ගොන්සාල්වේස් පියතුමන්ව ග්‍රන්ථකරණයට යොමුකර වීමෙන් දේශීය භාෂාවලින් දහම් පොත පත සම්පාදනයට අතහිත දුන්නේය.

4. ලක්දිව කතෝලික දහමට දේශීය සංස්කෘතික ලක්ෂණ සම්බන්ධ කිරීමට ද ජුසේ වාස් පියතුමා වෑයම් කළේ ය. එකල සිරිත අනුව ජන වන්දනාව ලතින් බසින් සිදුවුවද දේශීය භාෂාවලින් යාච්ඤා කිරීමට මග සලසා දුන්නේය. දේශීය ගායනය හා වාදනය ද භාවිත කළේ ය. මෙසේ දේශීයකරණය සඳහා සංස්කෘතික විවෘතභාවයේ මඟ පෙන්වා දුන්නේ ය.

5. ධර්ම ප්‍රචාරය සඳහාත්, නව රදගුරු වසම් පාලනය සඳහාත් යුරෝපීය ධර්මදූතවරුන් යවනු ලැබූ කාලයක, දේශීය පූජකවරුන්ටද සාර්ථක ලෙස ඒ කාර්යයෙහි යෙදිය හැකි බව තම ජීවිත ආදර්ශයෙන් ද, ඔරතෝරියානු පියවරුන්ගේ සේවාවෙන්ද පෙන්වා දී ඇත.

**ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා**

| | |
|---|---|
| 1676 - | ගෝවේ දිවාරි නම් ග්‍රාමයේදී උපත ලැබීම. ( 1676.06.08) |
| 1695 | පූජකවරය ලැබීම |
| 1700 | ඔරතෝරියානු පැවදි නිකායට ඇතුළු වීම. |
| 1705 | ශ්‍රී ලංකාවේ සේවයට පැමිණීම. |
| 1708 | මීගමුව, කොළඹ, මාතර ප්‍රදේශවල සැරිසැරීම |
| 1710 | සිංහල භාෂාව ඉගෙනීමට අවකාශ ලැබීම |
| 1724 | ශ්‍රී ලංකාවේ අනුනායක ලෙස පත්වීම |
| 1730-1740 | බෝලවත්ත ප්‍රදේශයේ ස්ථිර පදිංචිය හා සිංහල කතෝලික පොත් පත් රාශියක් ලිවීම. |
| 1742 | බෝලවත්තේදි සවර්ගස්ථ වීම (1742.07.17) |

**ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාගෙන් වු සේවය**

ගොන්සාල්වේස් පියතුමා වූ කලි, සහජ කුසලතා රැසකින් පිරි ඉතා විරල ගනයේ පුද්ගලයකු ලෙස හැඳින්විය හැකිය. එතුමා තීක්ෂණ බුද්ධියකින් ද, භාෂා හැදෑරීමේ කුසලතාවෙන් ද, සංගීත ඥානයෙන් හා ලේඛන දක්ෂතාවෙන් ද හෙබි දැහැමි පුද්ගලයකු විය. එ නිසා එතුමන් ලක්දිවට පැමිණීම නිසා ලක් කිතු සසුනට නව යුගයක් උදාවූ බව කිව යුතු ය.

තම මව් බස වූ කොන්කානි ද ලතින්, පෘතුගීසි හා ස්පාඤ්ඤ භාෂා ද දැන සිටි ගොන්සාල්වේස් පියතුමා මෙරට දී දෙමළ හා සිංහල භාෂා ද මැනවින් ප්‍රගුණ කළේය. එම භාෂා දැනුම උපයෝගි කර ගනිමින් ග්‍රන්ථකරණයේ නියැලුණු එතුමන් විසින් සිංහල බසින් පොත් 21 ක් ද, දෙමළ බසින් 15 ක් ද, පෘතුගීසී බසින් 4 ක් ද ලන්දේසි බසින් 1ක්ද ලියා ඇති බව ඔරතෝරියානු වාර්තාවල සඳහන් වේ. එතුමන් විසින් ලියන ලද ඇතැම් පොත් ගද්‍ය භාෂාවෙන් ද ඇතැම් ඒවා පද්‍ය ආකාරයෙන් ද ඉදිරිපත් කර ඇත. එතුමාගේ භාෂා ඥානය හා භාෂා ශෛලිය දෙස බලනවිට ඉතා ගැඹුරු දේවධර්ම ශාස්ත්‍රීය කරුණු සිංහලෙන් ඉදිරිපත් කිරීමේදී සංස්කෘත වචන රැසක් භාවිතා කර ඇත. උගතුන් සඳහා ලියූ පොත්වල ගැඹුරු භාෂාවක් ද, සාමාන්‍ය ජනයා සඳහා ලියූ පොත්වල සරල ගැමි වහරක් ද දක්නට ලැබේ. එයින් පෙනීයන්නේ එතුමන් සතුවූ පුළුල් භාෂා ඥානයයි.

සංගීත කුසලතාවකින් ද යුක්ත වූ ගොන්සාල්වේස් පියතුමා විසින් කිතුනු බැති ගී රැසක් ද නිර්මාණය කරන ලදී. පසන් ගී, ලතෝනි ගී, නාට්‍ය ගී හා සාමාන්‍ය ගීතිකාවලට පද නිර්මාණය හා තනු නිර්මාණය කරමින් කතෝලික සිංහල සංගීතයට නව පණක් ලබා දුන්නේය. විවිධ අවස්ථාවලට ඔබින ලෙස නිර්මාණය කරන ලද එම ගී අද පවා භාවිතයට ගැනෙයි.

සිංහල කතෝලික සාහිත්‍යයේ පුරෝගාමියා ලෙස හැඳින්වෙන ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා විසින් රචනා කරන ලද ප්‍රධානතම ග්‍රන්ථ කිහිපයක් මෙසේ ය.

i දේව වේද පුරාණය
ii සුවිශේෂ විසර්ජනය
iii ඥානාංජනය
iv සූක්‍ෂ්ම දර්පණය
v අඥාන ඖෂධය
vi වේද කාව්‍යය
vii පසන් පොත
viii මංගල ගීතය
ix ආනන්ද කලිප්පුව
x දුක්ප්‍රාප්ති ප්‍රසංගය

**ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන්ගෙන් ලද සේවය**

16 වන සියවසේ දී සා. පිලිප් නේරි තුමා විසින් රෝමයේ ආරම්භ කරන ලද ඔරතෝරියානු නිකාය, පැවිදි නිකායක් නොව පදවි පූජකවරුන්ට සාංඝිකව ජීවත්වීමට පිහිටුවන ලද සැලැස්මකි. එක් එක් ස්ථානයේ ඔරතෝරියානු නිකාය ස්වාධීනය. සාමාජිකයින් තැනින් තැනට මාරු කිරීමක් නැත. සෑම නිකායකටම පොදු වන්නේ ව්‍යස්ථා මාලාවය.

එම ව්‍යවස්ථා මාලාව යටතේ පිහිටුවාගත් ගෝවේ ඔරතෝරියානු නිකාය හා ශ්‍රී ලංකා කතෝලික සභාව අතර ඇත්තේ කිට්ටු සබැඳියාවකි. මෙරට කතෝලිකයින්ට පූජකවරුන්ගේ සේවය නොලැබ සිටීමට සිදුවූ තත්ත්වයක් තුළ ඕලන්ද පාලන සමය අවසන් වන තෙක් ද බ්‍රිතාන්‍ය යුගයේ මුල් පනස් වසර අවසන් වී යුරෝපීය ධර්මදූතවරුන් යළි දිවයිනට පැමිණෙන තෙක් ද මෙරට කතෝලික ජනතාවට සේවය කළේ ගෝව ඔරතෝරියානු නිකායික පියවරුන් ය. මඩු පල්ලිය, පුත්තලම, කොළඹ, කොච්චිකඩේ, ගල්ගමුව හා ගුරුබැවිල වැනි ප්‍රදේශවල ඔරතෝරියානු දහම් සේවය ව්‍යාප්ත විය. දුෂ්කර සමයකදී මෙරට කිතු සසුනට අද්විතීය සේවයක් ඉටුකළ ජුසේ වාස් පියතුමා හා ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ඇතුළු ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුනට අපි සදා ණයගැති වෙමු.

**පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමා**

ලන්දේසි යුගයේදී රෙපරමාදු ධර්ම ප්‍රචාරය සඳහා මහත් සේවයක් ඉටු කළ මෙතුමා 1658 දී ලංකාවට පැමිණියේ හමුදාව භාරව කටයුතු කිරීමටය. පළමුව ගාල්ලේ ඕලන්ද සේනාංකයේ පූජක සේවාව බාරව ක්‍රියා කළ අතර ඉන් පසුව යාපනයේ සේවය කළේ ය. ඵලදායක සේවයක් සඳහා වෙහෙසුණු එතුමා ආගමික පොත් පත් දේශීය භාෂාවලට පරිවර්තනය කර මුද්‍රණය කිරීමට පියවර ගන්තේය. කතිකිස්තවරුන් (ආගමික උපදේශකවරුන් ) පුහුණු කළේ ය. සෑම දේවස්ථානයක් ආශ්‍රිතවම පැරිෂ් පාසල් ආරම්භ කර රාජ්‍ය අනුග්‍රහය ඇතිව ඒ තුළින් ධර්ම ප්‍රචාර කටයුතු සංවිධානය කළේය. පසු කලෙක ලන්දේසි පාලකයින් සමඟ ඇතිවූ මත ගැටුම් හේතුකොට ගෙන මෙරට සේවය නිමාකර ආපසු ඕලන්දයට ගියේය.

**8.1.4 බ්‍රිතාන්‍ය යුගය ක්‍රි.ව. 1796 1948**

ක්‍රි. ව. 1789 දී යුරෝපයේ හටගත් ප්‍රංශ විප්ලවය නිසා ලන්දේසීන්ගේ මව් රට වූ ඕලන්දයේ තත්ත්වය අවිනිශ්චිත අඩියකට පත්විය. ඕලන්ද රාජ්‍ය නායකයා රටින් පිටවී බ්‍රිතාන්‍යයට ගොස් ලන්දේසීන් සතු යටත් විජිත සියල්ල බ්‍රිතාන්‍යයට පවරා දුන්නේය. නියෝගය නොපිළිගත් හෙයින් 1795 දී බ්‍රිතානය ඉන්දීය පෙරදිග වෙළඳ සමාගම ත්‍රිකුණාමලයේ ලන්දේසි බලකොටුවට පහරදී එය යටත් කර ගත්තේය. ඉන් පසු 1796 දී ලංකාවේ ලන්දේසි පාලනයට යටත්ව පැවැති සියලු ප්‍රදේශ බ්‍රිතාන්‍යයට භාර දීමත් සමග ලන්දේසි පාලන සමය නිමාවට පත්විය. එය බ්‍රිතාන්‍ය පාලන සමයේ ආරම්භය විය. මුලදී මුහුදුබඩ පළාත් පමණක් පාලනය කළ ඉංග්‍රීසින්ට 1815 දී මුළු දිවයිනේම පාලන බලය සතුකර ගැනීමට හැකි විය.

**ආගමික නිදහස**

1796 දි ලන්දේසීන් සතු ලංකාවේ සියලු ප්‍රදේශ ඉංග්‍රීසීන් වෙත බාරදීමෙන් පසු මෙරට ප්‍රථම බ්‍රිතාන්‍ය රජයේ නියමය අනුව 1799 සැප්තැම්බර් 23 දින ලංකා වාසීන් සැමට තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස ලබා දුන්නේය. මෙසේ බ්‍රිතාන්‍ය යුගය ආරම්භයේදීම ආගමික නිදහස උදාවන්නට විය. එහෙත් ඇතැම් කතෝලික විරෝධී නීති රීති පොත්වල තවමත් පැවතිණි.

**කතෝලිකයින්ට පූර්ණ ආගමික නිදහස ලබාදුන් " මැග්නා කාර්ටා' පණත**

ෆෙඩ්රික් නෝර්ත් ට පසුව ආණ්ඩුකාර ධූරයට පත්වූයේ තෝමස් මෙට්ලන්ඩ් ය. ඔහු රටේ ආගම් වෙත වඩා සාධාරණ වූත්, කාරුණික වූත්, පිළිවෙතක් අනුගමනය කළේය. මෙරට කතෝලිකයින්ගේ ආගමික නිදහස සම්බන්ධයෙන් කිසිදු සැකයකට ඉඩ නොතබනු සඳහා ඉතා වැදගත් පියවරක් ගත්තේය. එනම් කතෝලිකයින්ට විරුද්ධව පනවා තිබුණු සියලු නීති නියෝග අහෝසි කොට ඔවුන්ට සම්පූර්ණ ආගමික නිදහස ලබාදෙන රෙගුලාසියක් නීතිගත කළේය. එය 1806 මැයි 27 දින නිකුත්වූ ' මැග්නා කාර්ටා' පණත යි.

මෙතැන් සිට බ්‍රිතාන්‍ය පාලනයට යටත් ලංකාවේ සෑම ප්‍රදේශයකම කතෝලිකයිනට කිසිම බාධාවකින් තොරව තම ආගම ඇදහීමට නිදහස හිමිය. සියලු සිවිල් වරප්‍රසාද හා පත්වීම් ඔවුන්ටද අත්විය. කතෝලික දේවස්ථානවල පවත්වන ලද විවාහ වලංගු බවට පිළිගනු ලැබීය.

මෙලෙස උදාවූ ආගමික නිදහසින් උපරිම ලෙස ප්‍රයෝජන ගනු සඳහා ඔරතෝරියානු පියවරු නොපසුබටව ක්‍රියා කළහ. සභාවට අයිති දේපළ නැවත ඉල්ලා සිටීම, සභාවේ කටයුතු පුනරුත්ථාපනය, කැඩී බිඳී ගිය දෙව්මැදුරු නැවත ගොඩනැගීම, කිතුනු වත්පිළිවෙත් සංවිධානය කිරීම හා මෙරට කිතුනු ජනයා ඒකරාශී කිරීම වැනි කාර්යයන් සියල්ලම බ්‍රිතාන්‍ය පාලන සමයේදී මුලින්ම සංවිධානය කළේ එම ධර්මදූතවරුන් විසින්ය. ඔවුන්ගේ ප්‍රයත්නය නිසා කිතුනු සභාවට යම් ස්ථාවරත්වයක් ලැබුණි.

**විදේශීය ධර්මදූතයින් මෙරටට පැමිණීම**

මෙරට කිතුනුවන්ට පූර්ණ ආගමික නිදහස හිමිවීමත් සමඟ මෙරට සේවය සඳහා ධර්මදූතයින්ට පැමිණීමේ නිදහස ද හිමිවිය. ඒ අනුව ධර්ම ප්‍රචාරය සඳහා ඇංග්ලිකානු සහ රෙපරමාදු ධර්මදූත සමාගම් තම ශාඛා මෙරට පිහිටුවාගෙන දහම් සේවය ආරම්භ කළහ. වැඩි වශයෙන් එම සමාගම්වලට අයත් ගිහියන් විසින් ධර්මදූත සේවය ඉටුකරන ලදී.

මෙසේ 1805 දී ලන්ඩන් ධර්මදූත කණ්ඩායම ද
1812 දී බැප්ටිස්ට් ධර්මදූත කණ්ඩායම ද
1814 දී වෙස්ලියන් ධර්මදූත කණ්ඩායම ද
1816 දී ඇමරිකානු ධර්මදූත කණ්ඩායම ද
1818 දී සභා ධර්මදූත සංගමය ( සී.එම්. එස් ) ද
1883 දී ගැලවීමේ හමුදාවේ ධර්මදූත කණ්ඩායම ද මෙරට සේවය එක්විය.

මෙම ධර්මදූත කණ්ඩායම්වල සාමාජිකයෝ දේශීය භාෂා ඉගෙන මහත් උනන්දුවෙන් ධර්මදූත සේවාවේ යෙදුණහ. විශේෂයෙන් ප්‍රධාන නගරවල පාසල් පිහිටුවා ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා පෙරමුණ ගෙන ක්‍රියා කළහ. දහම් ප්‍රචාරයද ඒ ඔස්සේ සිදුවිය. එපමණක් නොව සෞඛ්‍ය සේවය, දුගී දුප්පතුන්ට පිහිටවීම වැනි දයා සේවාවන් ද ඔවුන් විසින් ඉටුකරන ලදී.

**ලන්ඩන් ධර්මදූත කණ්ඩායම**

එංගලන්ත සභාව නියෝජනය කරමින් මෙරටට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායමය. මෙරට ඔවුන්ගේ සභාව ලංකා සභාව ලෙස හැඳින්විණි. දේවස්ථාන හා පාසල් ගොඩනගාගෙන ධර්මදූත සේවයේ යෙදුණු අතර 1840 දි දේශීය පූජකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ද අරඹන ලදී.

**බැප්ටිස්ට් ධර්මදූත කණ්ඩායම**

ජේම්ස් චාටර් නැමැත්තා විසින් මෙරට සේවාව අරඹන ලදී. බැප්ටිස්ට් සභාවේ පියතුමකු වූ චාල්ස් කාටර්ගේ පුරෝගාමිත්වයෙන් සිංහල - ඉංග්‍රීසි , ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂ බිහි විය.

**වෙස්ලියානු ධර්මදූත කණ්ඩායම (මෙතෝදිස්ත)**

ඔවුහු විශේෂයෙන්ම බටහිර මුහුදුකරයේ සේවය කළහ. දහම් ප්‍රචාරය, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා කෙරෙහි ඔවුන්ගේ විශේෂ අවධානය යොමුවිය.

**ඇමරිකානු ධර්මදූත කණ්ඩායම**

අධ්‍යාපනයට විශේෂ ස්ථානයක් දුන් කණ්ඩායමකි. උතුරේ යාපනය ආශ්‍රිතව ධර්මදූත ව්‍යාපෘති ගණනාවක් ඇරඹීය. නේවාසික, ප්‍රාථමික , උසස්, ගම්බද, මධ්‍යම , දිවා , බාලිකා වශයෙන් විවිධ වූ පාසල් ආරම්භ කළ අතර ගුරුවරුන් පුහුණු කිරීමට මනා ලෙස සැලසුම්ගත සේවාවක්ද දියත් කරන ලදී. මෙම ධර්මදූත කණ්ඩායමට අයත් කාන්තා ධර්මදූතවරියන් විසින් මෙරට කාන්තා අධ්‍යාපනය ජනප්‍රිය කිරීමටද වෙහෙස දැරීය.

**සභා ධර්මදූත සංගමය**

ධර්ම ප්‍රචාරය හා අධ්‍යාපනය සඳහා බොහෝ සේ වෙහෙසී කටයුතු කළේ ය. කොළඹ කාන්තා විද්‍යාලය, මහනුවර හිල්වුඩ් විද්‍යාලය වැනි විදුහල් සභා ධර්මදූත සංගමය මගින් අරඹන ලදී.

**ගැලවීමේ හමුදාවේ ධර්මදූත කණ්ඩායම**

මෙය වෙනස් ආකාරයක ධර්මදූත සේවාවක් වූ අතර කුසගින්න නිවීම, පිරිසිදු කිරීම, ගැලවීම යන තේමා යටතේ සංවිධානය වී දුගී දුප්පතුන්ට පිහිටවීමේ සේවා දියත් කළහ.

**බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ කතෝලික සභාව**

16 වන සියවසේ පෘතුගීසින්ගේ පැමිණීමෙන් පසුව කතෝලික දහම ලංකා වාසීන්ට හඳුන්වාදීමත් සමගම මෙරටේ ශාසනික කටයුතු පාලනය වූයේ දකුණු ඉන්දියාවේ කොචින් රදගුරු පදවිය යටතේය. එහෙත් 1834 දි xvi වැනි ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා විසින් ලංකාව කොචින් රදගුරු පදවියෙන් වෙන් කර අපෝස්තලික විකාරි වසමක් බවට පත් කරන ලදී. ඒ අනුව ලංකාවේ පළමු රදගුරු ලෙස පත්කරනු ලැබුවේ ඔරතෝරියානු නිකායේ වින්සන් රොසයිරෝ උතුමාණන්ය. එතුමා 1842 දි සවර්ගස්ථ වීමෙන් පසු 1843 දී ඉන්දීය ධර්මදූතවරයකු වූ අන්තෝනියෝ කයිතානෝ පියතුමා එම තනතුරට පත්කරනු ලැබීය.

1833 දි පෘතුගාලයේ රජය මගින් ගත් තීරණයක් අනුව ගෝවේ ඔරතෝරියානු නිකාය අහෝසි විය. එමනිසි මෙරට සේවයට ඉන්දිය ඔරතෝරියානු ධර්මදූතයින් සපයා ගැනීම දුෂ්කර විය. එසේ වුවද ඒ වන විට මෙරට සිටි ඉන්දීය ධර්මදූතවරු තමන් කළ සේවය දිගටම කරගෙන ගියහ. යුරෝපීය ධර්මදූතවරුන් පැමිණ සිටියදීත් ඔවුහු ඔවුන් සමග සේවය කළහ. මෙහිම ජීවිතය කෙළවර කළහ. ලක්දිව සේවය සඳහා යුරෝපීය ධර්මදූතවරුන් සොයාගැනිම එකල ශුද්ධාසනයට පහසු නොවීය. එසේ වුවද ශුද්ධාසනය (ප්‍රොපගන්දාව) විසින් එවන ලද ප්‍රථම යුරෝපීය ධර්මදූතවරයා වූ ඉතාලි ජාතික හා ඔරතෝරියානු නිකායික ඔරාෂියෝ බැටකිනී පියතුමා 1842 දි ලංකාවට පැමිණියේය. එතුමා ලංකාවේ උතුරු ප්‍රදේශය භාරව කටයුතු කළේ ය.

1845 දී සිල්වෙස්ත්‍රින බෙනදිකාන නිකායේ ජෝසප් බ්‍රාවි පියතුමා සහ සිස්ටර්ෂියාන නිකායේ තාපසයන් දෙදෙනෙක් ද මෙරටට පැමිණියහ. මේ තාක් රටට එවන ලදදේ පැවදි නිකායවලට අයත් ධර්මදූතවරුන් වුවද 1847 දී ශුද්ධාසනය විසින් පදවි පූජකවරුන් සතර දෙනෙකුද එවන ලදී.

මෙසේ ලංකාව තුළ ඉන්දීය ධර්මදූතවරුන්ගේ සංඛ්‍යාව අඩුවෙමින් ද, යුරෝපීය ධර්මදූතවරුන්ගේ සංඛ්‍යාව වැඩිවෙමින් ද පැවැති මේ කාලයේ ශුද්ධාසනය විසින් යුරෝපීය ධර්මදූතයකු වූ ඉතාලි ජාතික ඔරාෂියෝ බැටකීනී පියතුමා මෙරට අපෝස්තලික විකාරි තැනගේ යුව රදගුරු ලෙස පත්කරන ලදී. ඒ 1848 මැයි 5 වැනිදාය. 1846 දි එතුමා රදගුරු අභිෂේකය ලැබුවේය. ලක්බිමේ දි රදගුරුවරයකු ලෙස අභිෂේක ලත් ප්‍රථමයා වූයේ එතුමාය. (ඊට පෙර රදගුරුවරුන් අභිෂේක ලැබුවේ ඉන්දියාවේ දීය) මේ තාක් එක් අපෝස්තලික විකාරි වසමක් වූ ලක්දිව 1843 දි උතුර හා දකුණ ලෙස කොටස් දෙකකට වෙන් කරන ලදී. බැටකීනි රදගුරුතුමාට උතුරු ප්‍රදේශ භාර විය. කයිතානෝ අන්තෝනියෝ රදගුරු තුමාට දකුණ භාරවිය. ඒ සමගම ජෝසප් බ්‍රාවි පියතුමා දකුණු විකාරි වසමේ යුව රදගුරු වශයෙන් පත්වීම් ලැබීය. 1883 දක්වා වසර 36 ක කාලයක් මෙසේ විකාරි වසම් දෙකක් ලෙස ශාසනික කටයුතු ක්‍රියාත්මක විය.

### නිර්මල මරිය නිකායේ ධර්මදූතවරුන් ලක්දිවට පැමිණීම

උතුරු විකාරි වසමේ කටයුතු බාරගත් බැටකීනි රදගුරු තුමා මුහුණ දුන් ප්‍රධාන ගැටලුව වූයේ ධර්මදූතවරුන්ගේ හිඟයයි. එනිසා ධර්මදූතවරුන් සොයා යුරෝපයට ගිය එතුමා ප්‍රංශයේ නිර්මල මරිය නිකායේ නිර්මාතෘ එව්ජින් ද මැසනඩ් රදගුරුතුමන් හමුවී ලක්දිවට එම නිකායේ පියවරුන් එවන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව ස්ටීවන් සෙමේරියා පියතුමාගේ නායකත්වය යටතේ සතර දෙනෙකුගෙන් යුත් ධර්මදූත කණ්ඩායමක් 1847 දි ලක්දිවට පැමිණියෝ ය. මේ පියවරු යාපනය ප්‍රදේශයේ ධර්මදූත කටයුතු ඉතා වේගවත් ලෙස ව්‍යාප්ත කළහ. කලින් කලට තවත් පියවරුන්

නිමල මරිය නිකාය මගින් එවනු ලදුව 1850 පමණ වනවිට ධර්මදූත වරුන්ගේ සංඛ්‍යාව 13 දක්වා වැඩිවිය. 1856 දි යාපනයට පැමිණ එහිදි නිර්මල මරිය නිකායට එක්වූ ක්‍රිස්ටෝෆර් බොන්ජින් පියතුමාද සුවිශේෂී ධර්මදූතයකු බවට පත්විය. පසු කලෙක එතුමා යාපනයේ රදගුරු ලෙසද 1887 දි කොළඹ පදවියේ ප්‍රථම අගරදගුරු හිමි ලෙසද පත්වීම් ලැබුවේය.

මෙසේ නි.ම.නි පියවරු ශ්‍රී ලංකාවේ කතෝලික සභාවට ඉතා අගනා සේවයක් ඉටු කළහ. විශේෂයෙන්ම කොළඹ හා යාපනයේ පදවි තුළ මෙම පියවරුන් යටතේ ප්‍රධාන පෙළේ ඉංග්‍රීසි විද්‍යාල කිහිපයක් බිහිවිය. 1900 න් පසුව කොළඹ හා යාපනයේ පදවිවල සේවය සඳහා විවිධ තාපසික නිකාය මෙරටට කැඳවා ගැනීම සඳහා ද නි.ම.නි පියවරු ක්‍රියා කළහ. එසේ පැමිණි නිකාය කිහිපයක් ලෙස, මරියතුමියගේ ප්‍රැන්සිස්කාන සොහොයුරියෝ, ශුද්ධවූ පවුලේ සොහොයුරියෝ, අපෝස්තලික කාර්මෙල් සොහොයුරියෝ, දේවාරක්‍ෂාවේ සොහොයුරියෝ, සදාසරණ සොහොයුරියෝ හා ඩොමිනිකාන සොහොයුරියෝ දැක්විය හැකිය.

## සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ ධර්මදූතවරු

මෙම නිකායේ සේවය ශ්‍රී ලංකාව තුළ ආරම්භ වූයේ 1845 දි ජෝශප් බ්‍රාවි පියතුමා මෙරටට පැමිණීම සමගම ය. 1857 දී එතුමා දකුණු විකාරි වසමේ (කොළඹ) පාලක ධූරයට පත්වූ අතර එම ප්‍රදේශයේ සේවය සඳහා තවත් බෙනදිකාන පියවරු මෙහි පැමිණියහ. 1863 - 1878 කාලය තුළ විකාරි වසම පාලනය කළේ හිලේරියන් සිල්ලානි නම් වූ බෙනදිකාන රදගුරු තුමාය. එතුමාගේ පාලන සමය දකුණු විකාරි වසමේ දියුණුව සඳහා විශාල සේවාවක් ඉටුවූ සමයක් විය.

- ශා ලුසියා ආසන දෙව්මැදුර ඉදිකිරීමට ආරම්භ කිරීම
- ශා. බෙනඩික්ට් විද්‍යාලය ඇතුළු පාසල් රැසක් ඇති කිරීම
- යහපත් එඬේරා සොහොයුරියන් මෙරට සේවයට ගෙන්වීම
- කොළඹ අවට වන මෝදර, ග්‍රෑන්ඩ්පාස් වැනි ප්‍රදේශවල විශාල දෙව්මැදුරු ඉදිකිරීම.
- කතෝලික පුවත් පත් Ceylon Catholic Messenger 1869 දි හා ඥානාර්ථ ප්‍රදීපය 1873 දී ආරම්භ කිරීම.
- මහනුවර ප්‍රදේශයේ තැන් කීහිපයක සේවයට බෙනදිකාන පියවරු යැවීම ආදී සේවාවන් ඒ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකිය.

1878 හිලේරියන් සිල්ලානි රදගුරු තුමාගේ සවර්ගයේ වීමෙන් පසු එම ධූරයට පත් කරන ලද්දේ ක්ලේමන්ට් පඤ්ඤානි රදගුරු තුමාය. එතුමා වසර 4 ක් පමණ කොළඹ ප්‍රදේශයේ ශාසන පාලක ලෙස කටයුතු කළේ ය. එම කාලයේ බෙනදිකාන පියවරුන්ගේ පැමිණීම හිඟ වූ නිසා කොළඹ ප්‍රදේශයේ සේවය නිමාකර එය නි.

ම.නි පියවරුන්ට බාර දීමට සිදු වූ අතර බෙනදිකානුවෝ ලංකාවේ මධ්‍යම හා ඌව පළාතේ සේවයට යොමු වූහ.

1887 වන විට සිරිලක කතෝලික සභාව රදගුරු පදවි තුනක් ලෙස සංවිධානය විය. ඒ යාපනය, කොළඹ, මහනුවර වශයෙනි. යාපනය හා කොළඹ නි. ම. නි පියවරුන් යටතේ ද මහනුවර බෙනදිකාන පියවරුන් යටතේ ද පාලනය විය.

මෙලෙස ප්‍රංශයේ නිර්මල මරිය නිකායේ පියවරුන් හා ඉතාලියේ සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායික පියවරුන් මෙන්ම බෙල්ජියමේ ජේසු නිකායික පියවරුන් ද, මාරිස්ට් සොහොයුරන් ද, ලාසල් සොහොයුරන් ද පැවිදි සොහොයුරියන් ද මෙරටට සේවය සඳහා එක් වූ ධර්මදූත ධර්මදූතිකාවෝ වූහ. මොවුහු ශ්‍රී ලංකාවේ ආගමික, අධ්‍යාපනික සමාජීය, සෞඛ්‍යය යන සියලු අංශවලම සේවයේ යෙදෙමින් ඉතා අගනා දායකත්වයක් සැපයූහ.

### පැවදිවරියන්ගේ සේවාව

ආගමික නිදහස සමග මෙරට පැමිණි පැවදිවරියන්ගේ සේවාවද මෙරට කතෝලික සසුනේ ප්‍රගතියට මග සැලසීය. පෘතුගීසි යුගය ආරම්භයේ සිට 19 වන සියවසේ මැද භාගය පමණ වන තුරු, එනම් වසර 350 ක් පමණ කාලයක් තුළ මෙරට කතෝලිකයින්ට ධර්මදූතවරුන්ගේ සේවය ලබන්නට හැකි විය. එහෙත් එම කාලය පුරා මෙරට ජනයාට පැවිදිවරියන් දැකගැනීමට පවා අවස්ථාවක් උදා නොවීය. ප්‍රථමයෙන් ම පැවදිවරියන් ලංකාවට පැමිණියේ 1862 වසරේ දී ය. ඒ, යාපනයේ අපෝස්තලික විකාරී වූ ස්ටීවන් සෙමේරියා රදගුරු තුමා විසින් කැඳවාගෙන එන ලද ප්‍රංශයේ ශු පවුලේ නිකායේ පැවිදිවරියන් ය. ඔවුහු උතුරු විකාරී වසමේ තම සේවය ආරම්භ කළහ.

1869 දී දකුණු විකාරී වසමටද පළමු වරට පැවිදිවරියෝ පැමිණියහ. ඒ කොළඹ අපෝස්තලික විකාරි සිල්ලානි රදගුරුතුමාගේ කැඳවීම අනුව පැමිණි ප්‍රංශයේ යහපත් එඬේරා නිකායේ පැවදිවරියන් ය. ඔවුහු කොටහේනේ බාලිකා අධ්‍යාපන සේවාවේ යෙදුණහ..

බොන්ජීන් අගරදගුරුතුමා කොළඹ වසමේ පාලකව සිටියදී 1886 දි මරියතුමියගේ ප්‍රැන්සිස්කාන ධර්මදූතවරියෝ මොරටුව ප්‍රදේශයේ බාලිකා විදුහලක් ද අනාථදරුවන් සඳහා නිවාසයක් ද ඇරඹූහ.

1888 දී දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ නැමැති නිකාය ප්‍රංශයෙන් පැමිණ වයස්ගත වූවත් සඳහා සේවය ඇරඹීය. වයෝවෘද්ධ අය සඳහා නිවාසයක් මරදානේ ආරම්භ කරන ලදී.

1896 දී දයාවේ සොහොයුරියන්ගේ නිකාය පැමිණි අතර ඔවුහු ගාල්ලේ දිව්‍ය හෘදයේ බාලිකා විදුහලේ සේවාව ආරම්භ කළහ.
1922 දි අපෝස්තලික නිකායේ තාපසිකාවෝ මෙරටට පැමිණ ඔවුන්ගේ පළමු නිවාසය ත්‍රිකුණාමලයේ පිහිටුවා ගත්හ.

1903 දී ගාල්ලේ රදගුරුව සිටි ජෝසප් වැන්රීත් හිමියන් විසින් දේශීය පැවදි නිකායක් ආරම්භ කළේ ය. ඒ සුරදූත සොහොයුරියන්ගේ නිකාය යි.

**බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය**

බ්‍රිතාන්‍ය රජය, මුලදී රටේ අධ්‍යාපනය අංග්ලිකානු දේවගැතිවරුන් අතට පවරා, ඔවුන්ට ඒ සඳහා ආධාර මුදල් ද ලබා දුන්නේය. වරින් වර මෙරටට පැමිණි රෙපරමාදු ධර්මදූත සමාගම් ද මුදලින් රජයේ ආධාර ලබාගෙන අධ්‍යාපන සේවයේ යෙදුණහ. ඔවුන් යටතේ ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු විය.

ඇමරිකා ධර්මදූතවරු මුල සිටම නේවාසික පාසල් ඇරඹූහ. ඔවුන් ආරම්භ කළ යාපනයේ ප්‍රාථමික පාසලේ දක්ෂ ළමුන් සඳහා 'සෙන්ට්‍රල්" පාසලක් ද පිහිටුවන ලදී. උසස් පාසල් ආරම්භ කර ඒවායේ ඉංග්‍රීසි, භූගෝලය, ගණිතය, තර්ක ශාස්ත්‍රය, යුරෝපා සාහිත්‍යය, යාන්ත්‍රික විද්‍යාව යන විෂයය උගන්වන ලදී. ඊට අමතරව බාලිකා විදුහල්ද ඇරඹීම සිදුවිය. මෙසේ උතුරුකරයේ අධ්‍යාපනය දියුණුවීමට මග සැලසිණි.

බ්‍රිතාන්‍ය පාලන සමයේ මුල් කාලයේ දී පාසල් සම්බන්ධයෙන් කතෝලික සසුන සිටියේ දුර්වල තත්ත්වයකය. පීඩන සමයක නිමාව සමග කතෝලිකයින්ගේ අවධානය දෙව්මැදුරු ගොඩනගා ගැනීම වෙත යොමු වූ නිසාද, ආර්ථික වශයෙන් ශක්තිමත් නොවූ නිසාද එවකට සිටි ඉන්දීය ධර්මදූතයින්ට ඉංග්‍රීසි භාෂාව ගැටලුවක් වූ නිසා ද ඉංග්‍රීසි පාසල් ආරම්භ කිරීම පහසු නොවීය. පසු කාලීනව පැමිණි විවිධ පැවදි නිකාය නිසා අධ්‍යාපනය තුළ මහත් ප්‍රගතියන් අත් කරගත හැකිවිය.

1832 දී කෝල්බෘක් කොමිසම කළ යොජනා අනුව, ඉංග්‍රීසි භාෂාව රජයේ සියලුම පාලන අංශවල භාවිත කරන්නටත් පාසල්වල උගන්වන්නටත් වූ විට කතෝලිකයින්ටද ඉංග්‍රීසි පාසල් අවශ්‍ය විය. ඉංග්‍රීසි දැන සිටීම රැකී රක්ෂා ලබා ගැනීමට ද මාර්ගයක් විය. කෝල්බෘක් කොමිසමේ ප්‍රතිසංස්කරණ නිසා නගරවල අධ්‍යාපනය දියුණු විය. ලංකාවේ අධ්‍යාපනික සංවිධානය 1841 දී මධ්‍යම පාසල් කොමිසමට පවරන ලදී. මෙම කොමිසම මිෂනාරී හා පැවිදි සමාගම් මගින් පිහිටුවන ලද පාසල්වලට මුදලින් ආධාර සපයන ලදී. මෙසේ මිෂනාරි අධ්‍යාපනය දියුණු වූ අතර රජය යටතේ පැවති අධ්‍යාපන අප්‍රාණිකව පැවතිණි මේ තත්ත්වය තුළ මිෂනාරි අධ්‍යාපනයට ජනතාවගේ කැමැත්ත පළවිය.

1841 දි පිහිටවූ මධ්‍යම පාසල් කොමිසම මගින් පහත දැක්වෙන දෑ ඉටුකර ගැනීමට හැකිවිය.

- සේවා නියුක්තියට වූ ප්‍රතිලාභ නිසා " කොළඹ ඇකඩමිය' සමෘද්ධිමත් විය.
- ගුරු පුහුණුව සඳහා " නෝමල් පාසල් " ආරම්භ විය.
- අධ්‍යාපනයට ප්‍රායෝගික නැඹුරුවක් ලබාදීම සඳහා ගාල්ල, මහනුවර හා කොළඹ මධ්‍යම පාසල් තුනක් මධ්‍යම පාසල් කොමිසම මගින් ඇරඹීම.
- කොළඹ හා මහනුවර උසස් බාලිකා පාසල් ඇරඹීම.

**ආධාර ලබන පාසල් (උපකෘත පාසල්)**

1869- 1896 දක්වා පැවති අධ්‍යාපන ක්‍රමයෙන් ලාංකික ළමුන්ට සාර්ථක අධ්‍යාපනයක් ලබන්නට හැකිවූයේ ඉංග්‍රීසි මාධයයෙන් පමණි. ඉංග්‍රීසි පාසල්වල ශිෂ්‍යයින්ට තම මවුබස හෝ රටේ ඉතිහාසය හා පරිසරය ගැන දැනුමක් නොදෙන ලදී. ස්වභාෂා අධ්‍යාපනය නිෂ්ඵල දෙයක් ලෙස ගණිනු ලැබීය. සියලුම පාසල් පොත් ඉංග්‍රීසි භාෂාවෙන් වූ අතර ඉගැන්වීමේ ක්‍රම හා විභාග පැවැත්වීම බ්‍රිතාන්‍යයේ ක්‍රමයට විය. මෙවන් තත්ත්වයන් තුළ ස්ව භාෂා අධ්‍යාපනය පිළිබඳව රජයට යෝජනා ඉදිරිපත් කළේ ක්‍රිස්ටෝපර් බොන්ජින් පියතුමාය.

ඉංග්‍රීසි භාෂාව මෙන්ම ජාතික භාෂාවද පාසල් අධ්‍යාපනයට එකතු කළ යුතුයැයි එතුමා රජයට අවධාරණයෙන් කියා සිටියේය. අධ්‍යාපනය සඳහා මවුබස යොදාගැනීමේ අත්‍යවශ්‍යතාව පෙන්වා දුන්නේය. රජයේ අසාධාරණ අධ්‍යාපන පිළිවෙත ද සැම කිතුනු සභාවලට ම පොදු කිතු දහමක් උගන්වන පාසල් ක්‍රමයද දැඩි සේ විවේචනය කළේ ය. එතුමා කියා සිටියේ ගෙදරදී මෙන්ම පාසලේ දී ද දරුවාගේ අධ්‍යාපනය ආගම හා සම්බන්ධ කළ යුතු බවය. එවැනි අධ්‍යාපනයක් දීම ඒ ඒ ආගමික සංස්ථාව විසින් කළ යුතු බවත්, එබැවින් කොයි ආගමටත් පාසල් පවත්වා ගැනීමට ඉඩ තිබිය යුතු බව හා රජය එබඳු පාසල්වලට මුදලින් ආධාර දිය යුතු බවත් ය. බොන්ජින් පියතුමාගේ යෝජනා රජයේ අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලදුව ආධාර ලබන පාසල් හෙවත් උපකෘත පාසල් ක්‍රමය ආරම්භ විය. එමගින් කිතුනු සභාවලට පමණක් නොව මේ තාක් රජයේ සැළකිල්ල නොලද බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ආගම්වලට ද මේ අධ්‍යාපන ක්‍රමය මහත් රුකුලක් විය.

**ක්‍රිස්ටෝෆර් බොන්ජින් පියතුමා**

1823 සැප් 23 දා උපත ලැබූ එතුමා 1847 දී පැරිස් ධර්මදූත නිකායේ සභිකයකු ලෙස ඉන්දියාවට ගොස් එහි වසර නවයක් සේවය කළේ ය. 1856 දි ලංකාවට පැමිණ යාපනයේ දී (නි.ම.නි) ඔබ්ලේට් නිකායට බැඳී උතුරේ සේවය කළේ ය. ලක්දිවට ආ කාලෙය් පටන්ම වාගේ එතුමා ලක් කතෝලික සසුනේ කටහඬ විය. එතුමා

ප්‍රධාන වශයෙන් සටන් කළේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ය. එතුමන්ගේ උත්සාහයේ ප්‍රතිඵලය ලෙස මෙරට උපකෘත පාසල් ක්‍රමය බිහිවිය. එනිසා උපකෘත පාසල් ක්‍රමයේ පීතෘවරයා ලෙස එතුමන්ව හඳුන්වනු ලැබේ. යාපනයේ රදගුරු තනතුරට පත්වූ එතුමා පසුව මෙරට ප්‍රථම අගරදගුරු ලෙස පත්වීම් ලැබීය. දේශීය පූජකයන් පුහුණු කිරීම සඳහා ලංකාවේ ප්‍රථම දේව ශාස්ත්‍රාලය වූ ශාන්ත මාර්ටින් දෙව්සත්හල 1869 දී ඇරඹුවේද බොන්ජීන් අගරදගුරු තුමාය. කොළඹට පැමිණි පසු 1883 දී සාන්ත බේර්නාර්දු දෙව්සත්හල ද විවෘත කළේය. කොළඹ සාන්ත ජෝසප් විදුහල හා වෙනත් විදුහල් විවෘත කිරීමට එතුමා දායක වුණේ ය. කොළඹ මහ රෝහලේ සේවය කිරීම සඳහා කතෝලික පැවිදිවරියන් යොමු කිරීම ද බොන්ජීන් අගරදගුරු සමයේ දී සිදු විය. එපමණක් නොව නොයෙක් පළාත්වලින් වන්දනාකරුවන් ගෙන්වන ජුලි මඩු මංගල්‍යය ආරම්භ කරන ලද්දේ ද 1870 දි බොන්ජීන් රදගුරු තුමා විසින් ය.

වසර 69 ක් වූ තම ජීවිතයෙන් වසර 36 ක් ලක්දිව සේවය කළ බොන්ජීන් අගරදගුරු හිමි මෙරට කතෝලිකයින්ට පමණක් නොව අන්‍ය ආගමිකයින්ගේ ද අයිතිවාසිකම් ලබාදීමට නොබියව සටන් කළ උතුමෙකි.

**ශ්‍රී ලංකාවට නිදහස ලබාගැනීම සඳහා කිතුනු දායකත්වය**

බ්‍රිතාන්‍ය යුගයේ දී ඉංග්‍රීසි අධ්‍යාපනය නිසා ඇතැම් පිරිස් විදේශීය සිතුම් පැතුම් හා සංස්කෘතිය බටහිර පන්නයට අනුව හැඩගස්වා ගත් අතර ඇතැම් පිරිස් දේශයේ නිදහස වෙනුවෙන් සංවිධානය වූහ. කිතුනු පාසල් වල ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ එෆ්. ආර්. සේනානායක, ඊ.ඩබ්. පෙරේරා, වෛත්‍යලිංගම්, රාමනාදන් හා ඩී. එස්. සේනානායක වැනි අය ජාති ආගම් කුළ භේද නොතකා පෙරමුණ ගත්හ.

එසේම කිතුනු බැතිමතුන්ද ජාතික හැඟීමෙන් යුතුව තම දිවි පරදුවට තබා නිදහස් සටනට දායකවූ බව ඉතිහාසය තුළින් අනාවරණය වේ. ඊට නිදසුනක් වන්නේ ඊ. ඩබ්. පෙරේරා මහතාය.

1915 දී මෙරට ඇතිවූ බෞද්ධ මුස්ලිම් කෝලහලවලදී එවකට මෙරට සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා මෙරට බෞද්ධ ප්‍රභූන්ට විරුද්ධව ගත් තීන්දුව වහාම අහෝසි කිරිම සඳහා ක්‍රියා කිරීමට ඉදිරිපත් වූයේ කිතුනුවෙකු වූ ඊ. ඩබ්. පෙරේරාය. ඒ සඳහා අවශ්‍ය නියෝග පත්‍ර රහසේ ලබාගෙන තම සපත්තුව තුළ සඟවාගෙන එතුමා බ්‍රිතාන්‍යයට ගියේය.

ශ්‍රීමත් ජේම්ස් පීරිස්, ඇල්බට් ඒ. වික්‍රමසිංහ, ජේ. ඒ. එල් කුරේ, ස්ටැන්ලි සොයිසා වැනි කිතුනු ප්‍රභූවරුන්ද නිදහස පතා දායක වූ අය වෙති.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය පිළිබඳව සාකච්ඡා කරන්න.
- පෘතුගීසී යුගය පිළිබඳව කතිකාවතක් ගොඩ නගන්න
- ලන්දේසි යුගය පිළිබඳව සාකච්ඡා කරන්න.
- බ්‍රිතාන්‍ය යුගය පිළිබඳව සාකච්ඡා කරන්න.

**මූලාශ්‍ර**


1. ලක්දිව කිතුනු පුරාණය (රීටා වෙල්ගම්පල)
2. සිරිලක් කිතු සසුන (තිමති කොළඹමුන්නේ පියතුමා)
3. සවිස්තර සිරිලක් කිතු සසුන ( - එම - )
4. ලක්දිව කතෝලික උදාව (දොන් පීටර් පියතුමා)
5. ලක්දිව කතෝලික පීඩනය( - එම - )
6. ලක්දිව කතෝලික ව්‍යාප්ති සමය ( - එම )
7. ඕලන්ද සමය (එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා )
8. බොන්ජින් අගරදගුරු (ආචාර්ය දොන් පීටර් පියතුමා)
9. ESP 1205 අධ්‍යාපන මොඩියුලය (විවෘත විශ්ව විද්‍යාලය)

නිපුණතාව 8.0 : **ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය හදාරා ලාංකේය කිතුනු අනන්‍යතාවට සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 8.2** : නිදහස් ශ්‍රී ලංකාවක් තුළ සභාව පිළිබඳ කරුණු හදාරයි

**කාලච්ඡේද** : කාලච්ඡෙද 30

**ඉගෙනුම් ඵල** :

- නිදහස් ශ්‍රී ලංකවේ දේශපාලන හා සමාජීය පසුබිම තුළ කිතුනු සභාවට මුහුණදීමට සිදුවූ ගැටලු හා ඒවාට තුඩු දුන් හේතු විමසා අවබෝධ කරගනියි.
- දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ දැක්ම හා ඉගැන්වීම ලංකේය කිතුනු සභාවට බලපෑ අයුරු හා එහි බලපෑම අධ්‍යයන කර නවෝදයක් සඳහා කටයුතු කරයි.
- වර්තමාන ලාංකේය කිතුනු සභාවේ දූත සේවාවේ ස්වභාවය හා සභාව මුහුණ දෙන අභියෝග විමසා කිතුනු අනන්‍යතාවට සාක්ෂය දරයි.
- ශ්‍රී ලාංකේය සමාජයේ විවිධ අංශවලට සභාවෙන් වූ දායකත්වය උගෙන කිතුනුවකු ලෙස වත්මන් සමාජ සංවර්ධනයට තම දායකත්වය දීමට කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**8.2.1 නිදහසින් පසු සභාව මුහුණු දුන් ගැටලු**

ලංකාව (ශ්‍රී ලංකාව) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්ව ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයකු යටතේ පාලනය වී. පසුව දේශපාලන නිදහස ලැබූයේ 1948 පෙබරවාරි 04 දීය. එවක් පටන් රටතුළ පැවැති, දේශපාලන, සමාජීය, සංස්කෘතික හා ආර්ථික පසුබිමේ මාංශගතවී ක්‍රිස්තුස් වහන්සේගේ ගැලවීමදායක සුබාරංචිය මෙරට පතළ කරමින් දූත සේවාවේ නිරතවීමේදී කිතුනු සභාවට මුහුණ පෑමට සිදුවූ ගැටලු බොහෝය. ඒ අතරින් ප්‍රධාන ගැටලු කිහිපයක් පමණක් මෙහිලා විස්තර කෙරේ.

**අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම**

1960 දී පැවැති මහාමැතිරණයෙන් බලයට පැමිණි රජය ආධාර ලබන ආගමික පාසල් රජයට පවරාගැනීම හා ඉන් ඇතිවූ ප්‍රතිඵල මෑත ඉතිහාසයේ මෙරට කිතුනු සභාවට මුහුණ පෑමට සිදුවූ ගැටලු අතර ප්‍රධාන තැනක් ගනියි. එදා එම තීරණය ගැනීමට රජය පෙළඹුණු කරුණු කුමක් වුවද, එතැන් සිට ගතවූ අඩ සියවසක් පමණ වූ කාලය තුළ මෙරට අධ්‍යාපනයේ ප්‍රගතිය හා විනය පිළබඳ කතා කරන මධ්‍යස්ථ විචාරකයන් එම තීරණයේ අනිටු ඵල විපාක සමස්ත රටටම බලපෑ ආකාරය හෙළි කරනු විටින් විට ඇසේ.

පසුකාලීනව 1886 දි කොළඹ අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ ලෙස පත්වූ ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා මෙරට කතෝලික අධ්‍යාපනය හා පාසල් ක්‍රමයේ උන්නතිය සඳහා ප්‍රජාප්‍රසාදිවරයකුව සිටි කාලයේ සිටම ඇප කැපවුණු ඒ සඳහා අඩිතාලම දැමූ උදාර චරිතයකි. ආධාර ලබන පාසල් ක්‍රමය වෙනුවෙන් සටන් කළ, ඉංග්‍රිසි භාෂාව මෙන්ම ජාතික භාෂාවද අධ්‍යාපනයට එක් කළ යුතු යැයි අවධාරණය කළේ මෙතුමාය. එතුමන් පිළියෙල කළ ආධාර ලබන පාසල් සැලැස්ම 1867 දී රජයේ අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගෙන ආගමික උපකෘත පාඨශාලා ක්‍රමය නමින් භාවිතයට පැමිණියේය. මෙම ක්‍රමය යටතේ සෑම පුරවැසියකුගේම ආගම ඇදහීමේ නිදහස සහතික කළ අතර තම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා තමන්ට කැමැති පාසලක් තෝරා ගැනීමට දෙමාපියන්ට ඇති අයිතවාසිකම පිළිගැනිණ. අධ්‍යාපනය සම්බන්ධයෙන් භේද නොසළකා ආධාරදීම රජයේ යුතුකමක් බවටද පිළිගැනිණි.

එසේම, මෙම ක්‍රමය යටතේ සෑම ආගමකටම තමන්ගේ පාසල් ඉදිකිරිමටද පාසල් පරිපාලනය, නඩත්තුව, කළමනාකාරිත්වය සඳහා සම්පූර්ණ නිදහසද පැවැරිණි. කතෝලික සභාව මගින් පාලනය වුණු පාසල්වල පැවැති විනය, පිළිවෙල හා අධ්‍යාපන ක්‍රමවේදය නිසා එම පාසල් අන්‍යාගමිකයන් අතර පවා ජනප්‍රිය විය. අන්‍යාගමිකයන් පවා තම දරුවන් කතෝලික පාසල්වලට ඇතුළු කිරීමට උත්සුක වූ බැව් සඳහන්ය. කතෝලික නොවන සිසු සිසුවියන්ද මෙම පාසල්වලට ඇතුළු වීමේ ප්‍රවණතාවක් ඇතිවූයේ මෙම කතෝලික පාසල් පිහිටුවීමේ අරමුණ කතෝලික දරු දැරියන්ට අධ්‍යාපනය හා චරිත හැඩගැස්වීම ලබාදීම ප්‍රමුඛතාව වී තිබියදී ය.

මෙවැනි සමාජීය පසුබිමක් බිහිවෙමින් තිබියදී 1956 බෞද්ධ කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයක් වූ ආධාර ලබන ආගමික පාසල් රජයට පවරා ගැනීම අනුව යමින් 1960 දී කතෝලික සභා ශ්‍රේෂ්ඨායන් හා ජනතාවගේ දැඩි විරෝධය මධ්‍යයේ ආගමික පාසල් රජයට පවරා ගැනිණි.

මෙම තීරණය ක්‍රියාත්මක වීමෙන් පාසල්වල අධ්‍යාපන ක්‍රමවේදය, විනය හා ආචාර ධර්ම චරිත හැඩගැස්වීමට සිදුවූ බලපෑම් ඉන් පසු ලාංකේය ජන සමාජයේ සිදුවූ සිදුවීම් විමසා බැලීමෙන් අවබෝධ කර ගත හැකි ය.

## ක්‍රිස්තියානි ආගමිකයන් කෙරෙහි නිර්දය විවේචන

පෘතුගීසි යුගයේදී ඇතැම් පෘතුගීසි සෙන්පතියන් හා සොල්දාදුවන් ගේ කෲර ක්‍රියා ඉස්මතු කරමින් එහි වරද වර්තමාන කතෝලිකයන් මත පටවමින් නිර්දය ලෙස විවේචනය කිරිම ද කතෝලිකයන් වනාහි පෘතුගීසීන්ගෙන් පැවත එන ජන කොටසක් ලෙස ඇතැමුන් විසින් විවිධ අවස්ථාවලදී ගැරහීමට ලක් කිරීම ද මෙහිලා අවධානයට ලක් කිරීම වටී. දේශීය සිරිත් විරිත් වලට ආගන්තුකව සිටි ඉහළ සමාජ ස්ථරයේ කිතුනුවන් විවේනය කරමින් කිතුනුවන් වනාහි පරගැති, දේශීය සංස්කෘතිය, නොසළකන

සිරිත් විරිත් ගරු නොකරන පිරිසකැයි වරින් වර එල්ලවූ පදනම් විරහිත, අභූත චෝදනා ද සුබාරංචිය පතළ කිරීමේ දූත කාර්යයට සක්‍රීයදායක වන කිතුනු වගකීම " කතෝලික ආක්‍රමණය " ලෙස වපරැසින් බලා නිර්දය විවේචනයට ලක්වීම ද නිදහසින් පසු කිතුනු සභාවට මුහුණු දීමට සිදුවූ අභියෝගකාරි තත්ත්වයකි.

**ජනවාර්ගික ගැටලුව සහ සාම ක්‍රියාදාමය**

1970 දශකය අගභාගයේදී ශ්‍රී ලාංකික සමාජයේ හටගත් සිංහල - දමිල ගැටුම් මෙරට මෑත ඉතිහාසයේ සිදු කළ ව්‍යසනය සුළු පටු නොවේ. ඇතැමුන් විසින් ජනවාර්ගික අර්බුදයක් ලෙසින්ද ත්‍රස්තවාදයක් ලෙසින්ද අර්ථ දැක්වූ මෙම ගැටුම් හා හිංසාකාරී ක්‍රියා හමුවේ ක්‍රිස්තු සුබාරංචියට අනුව කටයුතු කරන්නට මෙරට කිතුනු සභාව දරූ උත්සාහය හා ස්ථාවරය බාහිර සමාජයේ වැරදි වැටහීමකට හේතු වූ බැව් කිතුනු සභාවට එල්ල වූ චෝදනාවලින් පෙනී යයි. ශුද්ධ වූ බයිබලය චින්තනය හා කිතුනු දැක්ම හිංසාව හා යුද්ධ ගැටුම් එකහෙළා ප්‍රතික්ෂෙප කරයි. මානව ගරුත්වය කෙළෙසන හා මානව හිමිකම් උල්ලංඝනය වන හිංසාවාදී පිළිවෙතකට ආශිර්වාද කිරීමට ක්‍රිස්තුස් වහන්සේ අනුයන කිතුනුවනට හෝ කිතුනු සභාවට නුපුළුවන. එසේම, මේ අරගලයට මුල් වූ සිංහල දමිල දෙජාතීන්ම උතුර හා දකුණ යා කරමින් එකම සභාවක එකම දරු කැළක් සේ සිටීමද කිතුනුවන් ලෙස එකම දෙවියන් වහන්සේට වන්දනා කරන එකම දරුකැලක් වීමද හේතුකොට ජනවාර්ගික අර්බුදය හිංසාවෙන් තොරව, සාකච්ඡාවෙන් හා සාමක්‍රියාදාමයකින් විසඳාගෙන දේශපාලන විසඳුමකට යන්නැයි නිතර අදාළ පාර්ශවවලට දැන්වීමට ද බලකිරීමට ද එම ස්ථාවරය වෙනුවෙන් නොබියව පෙනී සිටිමට ද සභාවට සිදුවිය. මෙම ස්ථාවරය නිසාම, කිතුනුවන් මෙරටට හිතැති නොවන, ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන පිරිසක් ලෙස ජනමාධ්‍යය ඔස්සේ අසාධාරණ විවේචනවලට ලක්වීම ද සභාව මුහුණ පෑ ගැටලුවකි. කරුණු කෙසේ වුවද, " සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය.." යන කිතු සමිඳාණන්ගේ වදන අනුව යමින් සාමකාමී දේශපාලන විසඳුමක් වෙනුවෙන් පෙනීසිටිමින් හිංසාව හා ගැටුම් ප්‍රතික්ෂෙප කිරීමෙන් සැබෑ කිතුනු සාක්ෂ්‍යක නිරතවීම හා සාධාරණ අයිතීන් ගරු කරමින් සැමට සාධාරණත්වය ඉටුවිය යුතුය යන සභා ඉගැන්වීම වෙනුවෙන් පෙනී සිටීම සමාජ අභියෝගයක් වූ බැව් පැහැදිලිය.

**බෙදීගිය කිතුනු ආගමික ව්‍යාපාර**

මෑත ඉතිහාසයේ මෙරට කිතුනු සභාවට මුහුණ දීමට සිදුවූ බරපතල ගැටලුවක් වූයේ ඇතමුන් විසින් මූලධර්මවාදීන් ලෙස හඳුන්වනු ලබන බෙදිගිය කිතුනු ආගමික ව්‍යාපාර හා එම අනුගාමිකයන් හා ඔවුන් අනුගමනය කළ ධර්මප්‍රචාරණ ක්‍රම වේදයයි. සදාචාර විරෝධී ක්‍රියා මගින් අන්‍යාගමිකයන් සිය ආගමට හරවා ගනිතියි චෝදනා කරමින් එය බලහත්කාරයෙන් ආගම වෙනස් කරවීමක් ලෙස අර්ථ කථනයක් ද ඇතිවිය. සාම්ප්‍රදායික පිළිගත් කිතුනු සභා හා මෙම කිතුනු ආගමික ව්‍යාපාර අතර ඇති පැහැදිළි වෙනස දැන හෝ නොදැන මේ පිළිබඳ අන්‍යාගමික නායකයන් හා

සංවිධානවල විවේචන එල්ලවූයේ කතෝලික සභාව ප්‍රධාන පිළිගත් සාම්ප්‍රදායික කිතුනු සභාවලටය. මෙම විවේචන හා මූලධර්මවාදී ආගමික ව්‍යාපාර වල සදාචාර නොවන ලෙස හඳුන්වන ක්‍රියා මෙරට සභාවට ගැටලුවක් විය. මේ පිළිබඳව සමාජයේ පැවැති කතිකාව කොතරම් උග්‍රවී ද යත් බලහත්කාරයෙන් අන්‍යාගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පණත් කෙටුම්පතක් ද 2004 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් වී ඒ පිළිබඳ නොයෙකුත් සංවාද ඇති වී තිබේ. මූලධර්මවාදී ක්‍රියා හේතුකොට මෙරට කතෝලික සභාවට ද අනපේක්ෂිත ප්‍රතිඵලවලට මුහුණදීමට සිදුවීම බරපතල ගැටලුවක් ලෙස දිස්වේ.

### 8.2.2 දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ බලපෑම්

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවවත්මන් යුගයේ ශුද්ධ වූ සභාව තුළ සිදුවූ සුවිශාල මෙහෙවරක් මෙන්ම සභා ඉතිහාසයේ නවෝදයකට මං හෙළි කළ සන්ධිස්ථානයක් ද වේ. පළමු පෙන්තකොස්ත දිනයේ පේදුරු තුමන් මගින් කතා කළ ශුද්ධාත්මයාණන්ට සවන් දෙන්නට විවිධ ජාතීන් පැමිණ සිටියාක් මෙන් ශුද්ධවූ සභාවේ නව උපතක් ලෙස සැළකිය හැකි දෙවන වතිකාන මන්ත්‍රණ සභවේ දී ශු පේදුරු තුමන්ගේ තැනට පත් අනුප්‍රාප්තික විශ්ව එඬේරාණන් වූ ශුද්ධෝත්තම පියතුමන් මගින් කතා කළ ශුද්ධාත්මයාණන්ගේ හඬට සවන් දෙන්නට ද විවිධ මහද්වීපවලට අයත් රටවලින් නියෝජිතයෝ පැමිණ සිටියහ.

මෙම මන්ත්‍රණ සභාවට පෙර හා ආරම්භයේදී පැවැති දැඩි මත, දැඩි ස්ථාවර ලිහිල් වී නම්‍යශීලීව කතිකා කර තීරණවලට එළඹ, නවෝදයකට අවශ්‍ය විවෘතභාවය කරා ගමන් කිරීම ම මෙම මන්ත්‍රණ සභාව තුළ ශුද්ධාත්මයාණන්ගේ මෙහෙයවීම හා ක්‍රියාකාරිත්වයට කදිම උදාහරණයකි. විවිධ රටවල් හා සංස්කෘතීන් එකට එක් කර සංවාදයකින් යුතුව නව දැක්මක් කරා ශුද්ධ වූ සභාව මෙහෙය වූ මන්ත්‍රණ සභාවක් ලෙස මෙය හැඳින්විය හැකිය.

මෙම මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් අඩංගු ප්‍රකාශන 16 ක් එළිදැක්විණි. 1965 සිට ගෙවී ගිය දශක කිහිපය තුළ එහිදි කතිකා කළ නවෝදය හා බැඳි චින්තනය හේතුකොට ශ්‍රී ලංකාව තුළ සිදුවූ ප්‍රගතිය හා ඉදිරිගමන විමසා බලන කළ එය ගෙවුණු කාල සීමාවට සාපේක්ෂව ප්‍රමාණවත් නොවන බව හැඟේ. එහෙත් කතිකාවතේ ඇතැම් ඉගැන්වීම් හා ප්‍රගතිශීලි චින්තනය ශ්‍රී ලාංකේය කතෝලික සභාවේ විවිධ අංශවලට යම් ආකාරයකින් කළ බලපෑම් නිසා ඇතිවූ සාධනීය ලක්ෂණ ගැන සතුටුවිය හැකිය.

#### ජනවන්දනාව

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන අතරින් ප්‍රථමයෙන් එළිදුටුවේ ජනවන්දනාව පිළිබඳ වේද සත්‍ය ව්‍යවස්ථාවයි. මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් හා ප්‍රතිසංවිධාන ඉක්මනින් හා බොහෝ දුරට බලපෑමක් ඇති කළේ ජනවන්දනාව කෙරෙහි ය.

මෙම ව්‍යවස්ථාවට අනුව,
ජන වන්දනාව දෙවි මිනිස් සබැඳියාව පෙන්නුම් කරයි. ශුද්ධවූ සභාවේ එකම කාර්ය වන්නේ ජනතාව දෙවියන් වෙත ද දෙවියන් ජනතාව වෙත ද ගෙන ඒමය. ශුද්ධවූ සභාවේ සෑම අයෙකුටම තම ප්‍රසාද සනාපනය නිසා ක්‍රිස්තුස් වහන්සේගේ පූජක කාර්යට ක්‍රියාකාරීව හවුල් විය හැකිය. මනුෂ්‍යයාගේ ශුද්ධවන්තභාවය ද දේව මහිමය ද සිදුවන්නේ ජනවන්දනාවෙනි.

ශුඬවූ සභාවේ ක්‍රියාකාරිත්වයේ " හිනිපෙත" සහ ශුඬවූ සභාවේ මුළු ශක්තිය ගලා එන "උල්පත" වනුයේ ජනවන්දනාවයි (SC 1O)

එහෙත් ජනවන්දනාව සඳහා සක්‍රීය දායකත්වය ඉතා වැදගත් ය.

ජන වන්දනාවේ ප්‍රධාන නිල භාෂාව වූයේ ලතින් භාෂාවයි. එහෙත් කතිකාවට පසුව ස්වභාෂාවලින් වත්පිළිවෙත් සිදු කරන්නට අවසරය ලැබීමත් සමඟ ශ්‍රී ලංකාවේ ද සිංහල - දෙමළ භාෂාවලින් ජනවන්දනා පිළිවෙත් සිදු කරන්නට සිදු විය.

- ජනවන්දනා පිළිවෙත් සඳහා ක්‍රියාකාරිව දායකවීම මුල්තැන්ගත් හෙයින් ජනතාවගේ ක්‍රියාකාරී දායකත්වය වැඩි වර්ධනය විය.

ජනවන්දනා පිළිවෙත්වල නියමිත කාර්යයන් සඳහා ඒ ඒ තේවාධූරවලට අදාළ කාර්යයන් අර්ථාන්විතව සිදු කිරීමට මඟ සැලසීම

දේශීය භාෂාවලින් ගීතිකා සකසා ගැනීමට ලද අවසරයෙන් දේශීය සංගීතයට, ආරට අනුව සවදේශීය ගායනයට හා නිර්මාණවලට ඉඩකඩ ලැබීම.

ජන වන්දනාවේ භාවිත පූජා භාණ්ඩ හා පූජා ඇඳුම් දේශීය සිරිතට හා ලක්ෂණවලට අනුකූලව නිර්ණය වීම.

දේවස්ථාන ගොඩනැඟීමේදී දේශීය කලාවට හා ගෘහ නිර්මාණ ශිල්පයට අනකූලව සිදුවීම.

විවාහ මංගල්‍ය හා වෙනත් උත්සව ආදියේ දී දේශීය සම්ප්‍රදායානුකූල සැරසිලි හා කලා අංග එකතු වීම.

දේව වචනයට ප්‍රධාන තැනක් ලැබීම හා ඒ කෙරෙහි ජීවමාන ප්‍රේමයක් හා ගෞරවයක් ඇතිවීම.

රෝමානු පිළිවෙතේ අනන්‍යතාව සුරකෙන සේ ජනවන්දනා පොත් දේශීය භාෂාවලට පරිවර්තනය කිරීමට ලද අවසරයෙන් දේශීය භාෂාවලින් යුත් පිළිවෙත් භාවිතයට ඒම.

### දේව ජනතාව නම් සංකල්පය

දෙවන වතිකාන කතිකාව ගැන සඳහන් කරන විට අනිවාර්යෙන්ම සඳහන් කළ යුතු ව්‍යවස්ථාව වනුයේ " ජාතීන්ගේ ආලෝකය" (ලුමෙන් ජෙන්ටියුම්) හෙවත් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව පිළිබඳ වේද සත්‍ය ව්‍යවස්ථාව බව අවිවාදයෙන් පිළිගැනේ. මෙම ව්‍යවස්ථාවේ සභාව ගැන ලබා දෙන ඉතා කෙටි හා අගනා නිර්වචනය වන්නේ " සභාව' ' දේව ජනතාව' යන්නයි. මෙම වචන දෙක ශුද්ධවූ බයිබලයෙන් උපුටාගෙන ඇති නිසා එහි ඇත්තේ විශේෂත්වයකි. ආබ්‍රහම් නම් විශ්වාසයේ පියා මගින් දෙන ලද ආශිර්වාදය ප්‍රකාර තෝරාගත් ජනතාව දෙවියන් වහන්සේගේ ජනතාව බවට පත්වී පසුව එම ආශිර්වාදය වෙනත් ජාතීන්ට ගලා යෑම ශුද්ධවූ බයිබලය ඇසුරින් අනාවරණය වේ. ක්‍රිස්තුන් වහනසේගේ පාස්කු අභිරහස තුළින් ගොඩනැගෙන නව දේව ජනතාව උන්වහන්සේ කේන්ද්‍රකොට සාමූහිකව ක්‍රියාත්මක වන අයුරු පැහැදිලි කෙරේ.

මෙම දේව ජනතාව, සුළු පිරිසක් මෙන්, මුහුන් මෙන් ලෝකය තුළ ක්‍රියාත්මක වෙති. එසේම නව දේව ජනතාවට එම කැඳවීම තුළ ශුද්ධ වන්තභව කරා යාමට ඇරයුමක් ද ඇත. එම ශුද්ධ වන්තභාවය ලබා ගනුයේ දෙවියන් වහන්සේ සමග ඇති සම්බන්ධතාව හා අන් ජනතාව සමග ඇති සහෝදරත්වයේ බැඳීම කරණ කොටගෙනය. දේව ජනතාව යන සංකල්පයෙන් ජනිතවන සාමූහික බැඳීම මින් වඩා පැහැදිලි වේ. වර්තමානයේ සභා ජීවිතයේ දී ද කිතුනු සාක්ෂිය දැරීමේ දී ද සාමූහිකත්වයෙන් කටයුතු කිරීම හෙවත් සාංඝීක බව මින් පැහැදිලි වේ. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මෙම සාමූහිකත්වය හා කිතුනු සාංඝිකත්වය ගැන නිතර කතා කරන අතර වර්තමාන අභියෝග ජයගත හැක්කේ එම සාංඝීකත්වය තුළින් බව අපට අවබෝධ වේ. තවද කිසිදු උස් පහත් භේදයකින් තොරව සියලු ජාතීන් දේව ජනතාවට අයත් වන හෙයින් සියලු දෙනා අතර ඇති සමානත්වය හා සමතුලිත බව ශ්‍රී ලාංකික ජන සමාජයේ අපට ද කදිම ආදර්ශයකි.

### ගිහි ධර්මදූත සේවය

පැවිදි වරය හෝ පූජකවරය නොලැබූ සියල්ලෝ ගිහියෝ වෙති යන සාම්ප්‍රදායික අර්ථකථනයෙන් ඔබ්බට ගොස් ප්‍රසාද සනාපනය තුළ දේව ජනතාවගේ සාමාජිකත්වය ලබන ගිහියා ක්‍රිස්තුස් වහන්සේගේ පූජක, දිවැසි, එඬේරික යන ත්‍රිවිධ කාර්යයන්ට හවුල් වෙමින් ලෝකය තුලත්, සභාව තුළත් මෙහෙවරක යෙදෙන්නකු ලෙස ගිහියා පිළිබඳ වටිනා නිර්වචනයක් ඉදිරිපත් කිරීමට කතිකාවතට හැකිවිය.

ප්‍රසාද ස්නාපනය මගින් දේව ජනතාවගේ සමාජිකත්වය ලබන ගිහියා ඔහුට/ ඇයට ආවේනික අයුරින් සභාව තුළ ද ලෝකය තුළ ද සේවාවේ යෙදෙයි, පැවිදි හා පූජක අය මෙන් ලෝකයෙන් වෙන් නොවී ඍජුවම ලෝකය /සමාජය තුළ තම කැඳවීමට සාක්ෂ්‍ය දරයි. ගිහියාගේ ධර්ම දූතික කැඳවීම හා සේවාව පිළිබඳ දෙවන වතිකාන කතිකාවක් ගිහි ධර්මදූත සේවාව පිළිබඳ නියෝගයේ මනාව විස්තර කෙරේ.

කතිකාවෙන් පසු ගෙවී ගිය කාල පරිච්ඡේදයේ ශ්‍රී ලාංකික කිතුනු සභාවේ ගිහියාගේ දායකත්වය හා ධර්මදූත සේවාව පෙරට වඩා සතුටුදායක බැව් පැහැදිලිය. සභා ජීවිතයේ මෙන්ම බාහිර ලෝකයේ ද ගිහි ක්‍රියාකාරිත්වයේ විවිධ සේවාවන් හා අවස්ථා දැකිය හැකිය. සභාවේ සාමාජිකයන් අතර වැඩි පිරිසක් ගිහියන් වන බැවින් සභා නවෝදයක් සඳහා කටයුතු කිරිමෙහිලා ගිහි ධර්මදූත කාර්යයන්හි දායකත්වය ඉතා වැදගත් ය.

### කිතුනු සභා එකමුතුව හා සංවාදය

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ක්‍රිස්තියානි සභා අතර ඒකතාව නැංවීම පිළිබඳ ප්‍රකාශය මනාව තේරුම්ගැනීමට නම් මුල සිටම ශුද්ධ වූ සභාවට එල්ල වූ අභියෝග, භේද හා එම භේදවලට තුඩු දුන් කරුණු අවබෝධ කරගැනීම අත්‍යවශ්‍යය. සභා බෙදීම් සිදුවුයේ ඉතිහාසයේ මිනිස් දුබලකම් හා වැරදීම් නිසා විනා දේව අභිප්‍රාය මත නොවේ. මෙම භේද හා සභා බෙදීම් දේව අභිමතයට පටහැනිය. එහෙයින් අතීතයේ සිදු වූ අත්වැරදි හා දුබලතා මත එල්බ නොසිට ක්‍රිස්තුස් වහන්සේ තුළ එකම සභාවක් ගොඩනගන්නට සභා සංවාදය මගින් ප්‍රයත්න දැරීම ද, ඒ වෙනුවෙන් යාච්ඤා කිරීම ද ධාර්මික කරුණු අරබයා සංවාදයේ යෙදෙමින් එකම ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂිය දැරීම පිළිබඳ මෙමගින් මඟ පෙන්වයි.

වත්මන් ශ්‍රී ලංකාවේ ද විවිධ කිතුනු සභාවලට අයත් ජනතාව ජීවත් වෙති. ඔවුන් අතර මෙන්ම නිල වශයෙන් සභා අතර ද එකමුතුකම සඳහා මෑත ඉතිහාසයේ සිදු වු ප්‍රයත්නයක් මෙම මන්ත්‍රණ සභාව ඉදිරිපත් කළ සභා එකමුතුව පිළිබඳ ඉගැන්වීම ඔස්සේ ගොඩනැගී ඇත.

### අන්තර් ආගමික සංවාදය

ශ්‍රී ලංකාව ලොව ප්‍රධාන ආගම් අදහන ජනතාවගෙන් සැදුම් ලත් බහු ආගමික රටකි. එහෙයින් විවිධ ආගමිකයන් අතර සහජීවනය ඉතා වැදගත් ය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ " ක්‍රිස්තියානි නොවු ආගම් කෙරෙහි ශුද්ධ වූ සභාවේ සබඳකම් පිළිබඳ ප්‍රකාශනය මෙරට විවිධ ආගම් අතර සංවාදයක් ඇති කරලීමට කරන මඟ පෙන්වීම සුළු පටු නොවේ. ශු සභාව කිසිදු ආගමක යහපත් දෑ බැහැර නොකරයි. ඒ ඒ ආගම්වල අති වටිනාකම් මහත් සේ අගය කරයි. කතිකාවට පසු ගෙවිගිය කාලය තුළ, විවිධ ආගම් සමග සංවාදය සඳහා දැමු අඩිතාලම නිසා ආගම් අතර තිබු

දුරස්බව හා සැක බොහෝ දුරට මිදී අවබෝධයෙන් කටයුතු කිරීමේ වාතාවරණයක් සංවාදයක් අප ජන සමාජයේ ඇතිවී ඇත.

**පූජක හා පැවදි ජීවිතය**

පූජක ජීවිතය හා පැවිදි ජීවිතය සම්බන්ධයෙන් මෙම මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් මගින් කරන ලද මඟ පෙන්වීම් මත දේශීය සංස්කෘතිය හා ශ්‍රී ලාංකික සමාජ යථාර්ථයන්ට උචිත වූ පූජක හා පැවැදි පුහුණුවක් මෙරට ඇති කිරීමට දෙව්සත්හල්, කන්‍යාරාම හා පුහුණු ආයතනවල විවිධ වෙනස්කම් පසුගිය දශක කිහිපය මුළුල්ලේ සිදුවිය. ජනතා ප්‍රශ්නවලට සංවේදී වූ ශ්‍රී ලාංකික සමාජයට ආවේනික වූ ධර්මදූත කාර්යයක නියැලෙන පූජාප්‍රසාදිවරුන් බිහිකිරීමට විවිධ ප්‍රයත්න දරා ඇත.

**ජන සන්නිවේදනය මාධ්‍ය**

ජන මාධ්‍යයන් පිළිබඳ පැවැති පටු අදහස් මන්ත්‍රණ සභාවේ ඒ පිළිබඳ ඉගැන්වීම් සමග වෙනස් විය. ජනමාධ්‍ය මිනිසාගේ යහපත හා වර්ධනය පිණිස යෙදවිය යුතුය. ජනතාව දැනුවත් කිරීමට, ඉගැන්වීමට හා ධර්මදානය කටයුතු සඳහා මාධ්‍ය මෙවලම් භාවිත කිරීමට කරන ලද මඟපෙන්වීම නිසා ලාංකේය ජන සමාජයේ ද එම අරමුණු වෙනුවෙන් මාධ්‍ය භාවිතයේ වර්ධනයක් ඇති විය.

ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත් පත්, සිනමාව, පරිගනක තාක්ෂණය හා බැඳි විවිධ ක්‍රියාකාරකම් ක්‍රිස්තුවටිනානම් ජනතාව වෙත ගෙන යන සමාජයේ සදාචාර වර්ධනයට යොදාගත යුතු ය, යන්න කතිකා ඉගැන්වීම්වලින් පැහැදිලිය. මෙහිලා ශ්‍රී ලාංකේය සමාජයේ වර්ධනය ප්‍රමාණවත් නොවුවද ජනමාධ්‍ය මෙවලම් භාවිතයේලා කිතුනු සභාවේ උත්සාහය අගය කළ යුතු ය.

**මනුෂ්‍යත්වයේ උසස් බව, මිනිසාගේ අයිතිවාසිකම් හා වගකීම්**

දෙවිඳුන්ගේ උසස්තම මැවිල්ල වන මිනිසාගේ සමාජීය ජීවිතය ගැන විශේෂයෙන් සංස්කෘතික , ආර්ථික , දේශපාලනික ආගමික ආදී විවිධ ක්ෂේත්‍රවල මිනිසාගේ දායකත්වය මෙන්ම ලෝක සාමය උදෙසා මිනිසාගේ වගකීම් හා යුතුකම් ගැන මෙම කතිකාවක වෙසෙසින් කතා කරයි. එමෙන්ම මිනිසකු වීම නිසාම හිමිවන වෙනස් කළ නොහැකි මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව ද ඒවා සුරැකීමට ඇති වගකීම ගැනද උගන්වයි. වර්තමාන ලෝකයේ ශුධවූ සභාව යන කතිකා ව්‍යවස්ථාව මෙහිලා ප්‍රධාන තැනක් ගනියි.

**8.2.3 වත්මන් සමාජය තුළ ලාංකේය සභාව**

නිදහස් ශ්‍රී ලංකාවේ ගෙවී ගිය වසර 60 කට අධික වූ කාල පරිච්ඡේදය තුළ විවිධ ගැටලු, අභියෝග හා දුෂ්කරතා පසුකර කිතුනු සභාව, වර්තමානය දක්වා පැමිණි ගමන් මඟ පිළිබඳ ආවර්ජනය කරන විට එය කිසිසේත් පහසු සතුටුදායක මාර්ගයක්

නොවන බව පැහැදිලිය. විවිධ වකවානුවල පැවැති දේශපාලනික සමාජීය, ආර්ථික හා ආගමික වාතාවරණය තුළ අභියෝග , ගැටලු හා ගැරහුම් වලට මුහුණ දෙමින් ඉන් වඩ වඩා ශක්තිමත් වී, පවතින සමාජ යථාර්ථය හමුවේ නොසැළී නොබියව ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචියට සාක්ෂිදරමින් පැමිණි මෙම ගමන සමස්ත කිතුනු සභාවේ භාග්‍යයක් ලෙස සැළකිය හැකිය. මෙහිලා කන්ද උඩ දේශනයේ කිතු සමිඳාණන් පවසන " මිනිසුන් මා නිසා ඔබට නින්දා පීඩාකොට නානාවිධ අයුතු චෝදනා නඟන කළ ඔබ භාග්‍යවන්තයෝය" ( මතෙව් 5 /11) යන වචන කිතුනු සභාවේ සාමාජිකත්වයට මහත් ශක්තියකි. ධෛර්යකි.

වත්මන් සමාජය තුළ ලාංකේය කිතුනු සභාව ගැන විමසා බැලීමේ දී ඉහත නිපුණතාවක අධ්‍යයනය කළ පරිදි කතෝලික සභාව සහ පිළිගත් සෙසු ක්‍රිස්තියානි සභා හත මඟින් සිදුවන දූත සේවාව සහ කිතුනු සාක්ෂ්‍ය දැරීම ගැන සැළකීම ඉතා වැදගත් ය.

මෙම සභා නිලවශයෙන් ද සභා සාමාජිකත්වය පෞද්ගලිකවද සිය කිතුනු කැඳවීම තුළ කටයුතු කරමින් මෙරට උපන් ස්වදේශීකයන් ලෙස තම මව් රටට ආදරයෙන් ද රට පිළිබඳ හැඟීමකින්ද කටයුතු කර ඇති බව පැහැදිලිය. මෙරට කිතුනුවන් වනාහි විදේශ ගති පැවතුම්වලින් හෙබි පිරිසක් නොව මෙරට බිහිවී , මෙරට සමාජය තුළ හැදී වැඩෙමින් සිය හැකියා දක්ෂතා සමාජයේ වර්ධනය හා උන්නතිය උදෙසා යොදවන පිරිසක් වන්නෝය. නිදහස් සටන වෙනුවෙන් උරදුන්, ඇපකැපවුණු විවිධ පරිත්‍යාග සිදු කළ පුරෝගාමීන් අතර කිතුනුවන් රාශියක් ද සිට බව නොරහසකි. එමෙන්ම, මෙරට ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාවය හා සාමය වෙනුවෙන් පසුගිය තිස්වසරක පමණ කාලයක් පැවැති ගැටුම් හා යුද්ධයේ දී රට වෙනුවෙන් දිවි කැපකළවුන් අතර කිතුනුවෝ ද බොහෝ වූහ.

එසේම මෙරට අධ්‍යාපනය, සංස්කෘතිය, කලාව, නාට්‍ය, ලේඛන කලාව, නාඩගම් කලාව, සමාජ සුබ සාධනය, දයා සේවාව යන විවිධ ක්ෂේත්‍රවලට දායකවෙමින් කිතුනු සභාව සිදු කළ සේවාවද එහිලා විවිධ හැකියා දක්ෂතාවලින් පිරිපුන් කිතුනුවන් දැක්වූ දායකත්වය ද අති විශිෂ්ට බැව් මැදිහත් විචාරකයින්ගේ ඇගැයුමට ද ලක් වී ඇත. මින් ඇතැම් ක්ෂේත්‍රවල පුරෝගාමීත්වය කිතුනුවන්ගෙන් වූ බව ඉතිහාසය තහවුරු කරයි.

නිදහසින් පසු ගෙවී ගිය කාල පරිච්ඡේදයේ සභාවට මුහුණ පෑමට සිදුවූ ගැටලු අභියෝග කෙතෙක් වුවද, කුමන ස්වරූපයක් දැරුවද ඒවාට මුහුණ දෙමින් අඩුලුහුඬු මඟහරවා ගෙන කිතුනු සභාව අද ද විවිධ ක්ෂේත්‍රවලට තම දායකත්වය දක්වයි.

ලැබී ඇති සීමිත අවස්ථා තුළ, අධ්‍යාපනයෙහි ලා කිතුනු සභාවේ දායකත්වය ඉතා වැදගත් ය. කිතුනු දරු දැරියන් කිතුනු වටිනාකම් තුළ හැඩගස්වමින් චරිත වර්ධනය හා පෞරුෂය ගොඩනැංවීම් අරමුණින් කිතුනු සභාව මූලික වී පවත්වාගෙන යන පාසල් හා අධ්‍යාපන ආයතනවලට අන්‍යාගමිකයින්ගේද ඇත්තේ දැඩි කැමැත්තකි. අධ්‍යාපනය, ජන සන්නිවේදනය, සංස්කෘතිය , සමාජ සුබ සාධනය, දයා සේවාව යන කුමන ක්ෂේත්‍රයක වුවද කිතුනු සාක්‍ෂ්‍ය පෙරදැරි කරගෙන කිතුනු වටිනාකම් තුළ ඒවා මෙහෙයවමින් සමාජයේ මුහුන් පිඩක් සේ සෙසු අයට ද ආදර්ශයක් වෙමින් කිතු සමිඳාණන්ගේ සුබාරංචියට සාකෂ්‍ය දරන්නට වර්තමාන සමාජ පසුබිම තුළ ලාංකේය කිතුනු සභාව කටයුතු කරන අයුරු ප්‍රශංසනීයය.

ක්‍රිස්තුස් වහන්සේ වනාහි අපද අයත් ආසියාවේ ජනිත වූ අපේම ආසියාතික සංස්කෘතියට අයත් වූ මාංශගතවූ දේව පුත්‍රයාණෝය. එහෙයින් උන්වහන්සේගේ ඉගැන්වීම්වල ඇති අපට සමීප බව ඉස්මතු කරන්නට විශේෂයෙන් ජනවන්දනා හා දේවනමස්කාරයේ වත්පිළිවෙත්වලදී දේශානුකරණය තුළ මෙරට පොදු ජනතාවගේ හදගැස්මට සමීපවන්නට කිතුනු සභාව මහත් ප්‍රයත්නයක් දරනු පෙනේ.

අතීතයේ මෙන් නොව, අද මෙරට කිතුනු සභාවේ ශ්‍රේෂ්ඨයන්, පැවිදි වරුන් හා වරියන්, ගිහි නායක නායිකාවන් බොහෝ දෙනෙකු සවදේශීකයන්ය. එහෙයින් විදේශීය මිෂනාරිවරුන් මෙරට සභාව මෙහෙයවූ කලට වඩා දේශීය සංස්කෘතික වටිනාකමේ දේශීය සිරිත් විරිත්, ගති පැවතුම් හා හද ගැස්ම තුළ දේශීය අනන්‍යතාවෙන් පිරි කිතුනු සභාවක් ගොඩනගන්නට ඇති ඉඩකඩ පෙරට වඩා වැඩි බැව් පැහැදිලි ය. එවන් දේශීය අනන්‍යතාවක් ගොඩනැංවීම යුගයේ කාර්යයක් මෙන්ම අභියෝගයක් ද බැව් වටහාගත යුතු ය.

වර්තමානයේ දී ද ලාංකේය කිතුනු සභාවට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝග බොහෝ ය. සේවාවන් සිදු කිරීමේ දී මුහුණ දෙන ප්‍රතික්ෂේප කිරීම් , වැරදි වැටහීම්, ගැරහීම් හා අන්තවාදීන්ගේ ප්‍රහාර හමුවේ මෙරට සමාජයේ සැබෑ කිතුනු වගකීම ඉටු කරන්නට හා කිතුනු පුරවැසියන්සේ රට වෙනුවෙන් තම යුතුකම් ඉටු කරන්නට කිතුනු සභාව කිසිසේත් පසුබට නොවේ. එමෙන්ම, මෙරට පවතින බෞද්ධ , හින්දු, ඉස්ලාම් යන අන්‍යාගම්වල නායකයින් හා සාමාජිකත්වය සමග සහජීවනයෙන් කටයුතු කරමින් කිතුනුවන් ඔවුනොවුන් අතර ද අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් කටයුතු කරමින් කිතු සමිඳුන්ගේ සුබාරංචියට සාක්ෂිය දැරීම වර්තමාන ලාංකේය කිතුනු සභාවේ ලක්ෂණයකි.

එකම කිතුනු සභාවක් ලෙස එකම ක්‍රිස්තුස් වහන්සේට සාක්‍ෂ්‍ය දැරීමටද එමඟින් ශ්‍රී ලාංකේය ජන සමාජයට ක්‍රිස්තුස් වහන්සේගේ ජීවමාන සළකුණක් වන්නට ද මෙරට කිතුනු සභාව ද සභා සාමාජිකයන් ද කටයුතු කළ යුතු ය. ඒ සඳහා දෙවන වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම්වල ඇති මඟ පෙන්වීම් සහ ඉඩ ප්‍රස්ථා උපරිමයෙන් යොදාගැනීමට කටයුතු කළ යුතු ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1-** නිදහසින් පසු සභාව මුහුණ දුන් ගැටලු පිළිබඳව කතිකාවතක් ගොඩනගන්න.

**පියවර 2 -** දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙ බලපෑම් පිළිබඳ සාකච්ඡා කරන්න.

**පියවර 3 -** වත්මන් සමාජය තුළ ලාංකේය සභාව පිළිබඳව කතිකාවතක් ගොඩනගන්න.

**මූලාශ්‍ර :**


i කතෝලික සභා ධර්මෝපදේශය

ii දෙවන වතිකාන කතිකා ප්‍රකාශන

iii බෙදී ගිය කිතුනු පිරිස් හා නූතන ආගමික ව්‍යාපාර, 1986

iv සිරිලක් කිතුසසුන, දෙවන කාණ්ඩය, ගරු තිමති කොලමුන්නේ පියතුමා ,

v දහම් දියඹ, 6 වන කලාපය.

**නිපුණතාව 8.0** : **ශ්‍රී ලංකාවේ සභා ඉතිහාසය හදාරා ලාංකේය කිතුනු අනන්‍යතාවට සාක්ෂි දරයි.**

**නිපුණතා මට්ටම 8.3** : ශ්‍රී ලංකේය සමාජයට සභාවෙන්වූ දායකත්වය හදාරයි

**කාලච්ඡේද** : කාලච්ඡෙද 10

**ඉගෙනුම් ඵල** :

- විදේශීය පාලන යුගයේ දී ශ්‍රී ලංකාවේ පැවැති අධ්‍යපන ක්‍රමවලට සභාවෙන් වූ දායකත්වය විමසා බලයි.
- නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ දියුණුව කතෝලික අධ්‍යාපනය කෙරෙහි ඇතිකළ බලපෑම් මධ්‍යයේ එහි දියුණුව කතා ක්‍රියා කළ අධ්‍යාපනඥයන් ගැන දැන ගනියි.
- ශ්‍රී ලංකේය සමාජයේ ආගමික උන්නතිය වෙනුවෙන් කිතුනුවන්ගෙන් ලද හැකියා හා කුසලතා අගය කරයි.
- මුල් යුගයේ ධර්මදූතවරුන්ගේ අමිල කැපවීම මත කිතුනු කලාවට අත්තිවාරම වැටුණු බව පිළිගනියි.
- ශුද්ධ වූ බයිබලීය චින්තනය හා ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම අනුව කිතුනු දයාව යන්න නිවැරදිව වටහාගෙන එම දහම නිසාම සමාජ සුබසාධනයට දායක වෙයි.
- ශ්‍රී ලංකේය ජන සමාජයේ සුබසාධනය උදෙසා සභාවේ දායකත්වය උගෙන කිතුනු කැඳවීම තුළ එම සුභසාධනය සඳහා හදවතින්ම ඉදිරිපත් වෙයි.
- සමාජයීය වගකීම් ඉටුකිරිමෙහි ලා සුව සේවාව හා සුබසාධනයේ වැදගත්කම අවබෝධ කරගෙන කිතුනු දයාව පෙරදැරි කෙට ඒ සඳහා ඉදිරිපත් වෙයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**8.3.1 ශ්‍රී ලාංකේය අධ්‍යාපනය සඳහා සභාවේ දායකත්වය**

**පෘතුගීසි යුගයේ අධ්‍යාපනය (ක්‍රි.ව. 15051665)**

- පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ ප්‍රැන්සිස්කාන ජේසු, දොමිනිකාන, අගොස්තීනු යන අධ්‍යාපනයේ නිපුණත්වයක් තිබූ මිෂනාරී නිකායිකයින් ශ්‍රී ලංකාවට ගොඩ බැසීමත් සමඟ දේශනය, ,වන්දනාව, පාසල් අධ්‍යාපනය සාහිත්‍යය, නාට්‍යය, සමාජ සේවාව ආදියෙහි උන්දුවක් දැක්වූහ.
- මොවුන්ගේ මේ සේවාවන් සියල්ල ද කතෝලික වත් පිළිවෙත් ද බටහිර රටවල සංස්කෘතිය මුල් කරගෙන කළ නිසා බෞද්ධ, හින්දු ආගමික වත් පිළිවෙත් හා අතිශයින්ම වෙනස්ව පෙනුණි.
- පෘතුගීසි යුගයේ දී ස්වදේශිකයන් අතර කතෝලික දහම පතුරුවා ඔවුන් කතේලිකයන් බවට හැරවීමේ අරමුණින් අධ්‍යාපනය දෙන ලදී.

- මොවුන්ගේ කාලයේ දී විවිධ මිෂනාරී නිකාය වල පූජකවරු ගුරුවරුන් ලෙස ද සේවය කළ බැවින් පාසල් වල ආගමික අධ්‍යාපනයට මඟපෙන්වීමක් ඇතිවිය.
- මේ කාලයේ දී බටහිර අධ්‍යාපන ක්‍රමය හඳුන්වාදීම, ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ඇති වූ විශාල වෙනසක් ලෙස හැඳින්විය හැකි ය.

**ලන්දේසි යුගයේ අධ්‍යාපනය (ක්‍රි.ව. 1658 1796)**

- ලන්දේසීහු, පෘතුගීසීන් මෙන් අධ්‍යාපනය සම්පූර්ණයෙන් පූජකවරුනට භාර නොදී රජු යටතේ මනා පරිපාලනයකින් යුතුව අධාපනය දීමට උත්සාහ කළහ.
- අඩු වියදමකින් උසස් අධාපනයක් දිය හැකි ක්‍රමවේද අනුගමනය කරන ලදී.
- ලන්දේසි යුගයේ දී සතරාකාර පාසල් ක්‍රමයක් පවත්වාගෙන යන ලදී.
    - දේවස්ථානයට අනුබද්ධිත පාසල්
    - දෙව්සත්හල් (සෙමනේරි)
    - ලන්දේසි පාසල්
    - අනාථ නිවාස
- පෘතුගීසීන් පවත්වාගෙන ආ දේවස්ථානයට අනුබද්ධිත පාසල් ලන්දේසීහු පවත්වාගෙන ගියහ.
- රාජ්‍ය ව්‍යවස්ථා මගින් පාසල් වල සේවය කළ ගුරවරුන්ගේ සේවා කාලය, පුහුණුවීම්, ඔවුන්ගේ කාර්ය භාරය වරින් වර පැහැදිලි කරන ලදී.
- පාසල් වල සේවය කළ ගුරුවරුන් අතුරෙන් කිතුනුවකු, වැඩිමහල් අයෙකු උසස් ප්‍රභූ පවුලක කෙනෙකු මුල් ගුරුවරයා ලෙස පත් කරන ලදී.
- මුල් ගුරුතුමාට තෝම්බු පවත්වාගෙන යාම ද භාරවිය (තම පාලන ප්‍රදේශය තුළ ලියාපදිංචි කිරීමේ කටයුතු ) උපත, විපත, විවාහ ලියාපදිංචි කිරීම, ප්‍රසාද ස්නාපනය ලියා පදිංචි කිරීම ආදිය මුල් ගුරුතුමාට භාරවිය. සමහර අවස්ථාවලදී ඉඩම් ලියා පදිංචි කිරීමද කළේ ය. මේ නිසා මුල් ගුරුවරයාගේ වැදගත්කමත්, ගෞරවයත් සමාජයේ කැපී පෙනුණි.
- ලන්දේසීහු අධ්‍යාපන සඳහා වැයවන වියදම් අඩු කිරීමට ඕලන්දයේ සිට ගුරුවරුන් ගෙන්වීම වෙනුවට ස්වදේශිකයන් ගුරුවරුන් ලෙස පුහුණු කර පාසල්වල සේවයට යොදා ගත්හ.
- දේශීය ගුරුවරුන් සේවය කළ දේවස්ථානයට අනුබද්ධිත පාසල්වල සිංහල හා දෙමළ භාෂාඉගැන්වීම ට ද සිදුවිය. මොවුන්ගේ ඉගැන්වීම් අතර ප්‍රශ්නෝත්තර ක්‍රමය, කියවීම, ලිවීම, ක්‍රිස්තියානි නීතිරීති ආදිය ඇතුලත් විය.

- වයස අවුරුදු 8 සිට 15 ක්වා සියලුම ළමුන් පාසල් යාම අනිවාර්ය කරන ලදී. ඊට පසුවත් වසර 3 ක් හෝ 4 ක් වාරයකට වරක් දහම් පාසල් යාම අනිවාර්ය කරන ලදී.

- ලන්දේසි පාසල් නගෙනහිර ඉනදීය වෙළඳ සමාගම් පාලනය යටතේ තැබූ අතර රාජ්‍ය පරිපාලනය ක්‍රමවත් කිරීමට 1663 දී ලංකාවේ රාජ්‍ය පරිපාලන කණ්ඩායමක් ඇති කරන ලදී.

- මේ පරිපාලන කමිටුවේ ලන්දේසි පූජකවරු මුල්තැන ගත් අතර මේ කමිටුවට ගුරුවරුන් පත් කිරීම, පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම ආදිය භාරවිය.

- සිසුන් කියවීම, ලිවීම, ආගමික ප්‍රශ්න උත්තර, දස පණත, විශ්වාස ලක්ෂණය, ස්වාමිවාක් ආරාධනාව ආදිය කමිටුව මගින් අධීක්ෂණයට ලක්විය. පළමුවෙන් ප්‍රශ්න අසා පසුව තිළිණ ප්‍රදානය කරන ලදී.

- ලන්දේසි යුගයේ දී දේවස්ථානයට අනුබද්ධිත පාසල් වලට වඩා දෙව්සත්හල් (සෙමනේරි පාසල ) ඉදිරියන් තිබුණි. සෙමනේරි පාසල්වල බටහිර අධ්‍යාපන ක්‍රම ක්‍රියාත්මක විය.

- කුලවත් පවුල්වල කුලවන්ත දරුවෝ රජයේ විදයමින් ඕලන්ද විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලැබූහ

- ඕලන්ද පාලන සමයේදී ඕලන්ද පාසල් සමහරක් ලංකවේ පැවතුණි. මෙහි ඕලන්ද (ලන්දේසි), පරංගි (පෘතුගීසි) දරුවෝ ඉගෙනුම ලැබූහ. පූජකවරු හා තේවාචාර්යවරු මෙහි ඉගැන්වූහ. ලිවීම, කියවීම, ගණිතය මෙහි උගන්වන ලදී.

- 1737 දී ලංකාවේ මුද්‍රණාල ආරම්භ විය. මේ මුද්‍රණාලවල පාසල් අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය අත් පත්‍රිකා, සාහිත්‍ය ලේඛන මුද්‍රණය කළහ.

**ඉංග්‍රීසි යුගයේ අධ්‍යාපනය (ක්‍රි.ව. 1796 1948)**

- ලංකාවේ බහුතරයක් ජනතාව ඉංග්‍රීසි බස උගත්හ.

- 1798 දී ඉංග්‍රීසීන් පාසල්වල භාරකාරත්වය තමන්ට පවරාගෙන් (ඇංග්ලිකන්) රෙපරමාදු, බැප්ටිස්ට්, වෙස්ලියන්, ඇමරිකානු මිෂනාරි ආදී පූජක නිකායවල් වලට භාර දුන්හ.

- ඉංග්‍රීසි පාලන යුගයේ දී තුන් ආකාර පාසල් දැකිය හැකි විය.

  i රජයේ පාසල් -

  මේවායේ බහුතරයක් දෙමළ, සිංහල භාෂාවලින් ඉගැන්වීම් කටයුතු සිදුවිය. මේවා බහුතරයක් රෙපරමාදු පූජකවරුන් විසින් පාලනය කරන ලදී.

ii මිෂන් පාසල්

මේවා ප්‍රෙතෙස්තන්ත පූජකවරුන් විසින් පාලනය කරන ලදී.

iii පිරිවෙන් පාසල්

මේවා බෞද්ධ භික්ෂූන් වහන්සේලා විසින් පාලනය කරන ලදී.

- 1829- 1832 කාලය අතරතුරදී ඇතිවූ කෝල්බෲක් , කැමරන් කොමිසම මගින් කොළඹ එක් පාසල් පරිපාලන කොමිසමක් ද අනෙකුත් ප්‍රදේශවල පාසල් කමිටු ද ඇති කරන ලදී.
- කොළඹ ආරම්භ කළ පාසල් පරිපාලන කොමිසමේ රෙපරමාදු සහා පූජකවරු සාමාජිකත්වය දැරූහ. මේ කොමිසම මගින් ඉංග්‍රීසි පාසල් සමහරක් පවත්ගෙන යන ලදී. උදා - කොළඹ රාජකීය විද්‍යාලය
- මෙම පාසල් ඉතා ඉහළ මට්ටමින් පවත්වාගෙන ගිය බැවින් බොහෝ දෙනා මේවාට ඇදී ආහ. ඉංග්‍රීසින්ගේ කාලයේදී පාසල් අධ්‍යාපනය මගින් දහම් දැනුම බෙදාහරින ලදී.
- ඉංග්‍රීසින්ගේ පාලන සමයේ දී බොහෝ ක්‍රිස්තියානි පූජකවරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලුණහ.

  i 1801 දී බැප්ටිස්ට් මිෂනාරි සංගමය ලංකාවට පැමිණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලුණ හ. කොළඹ රාජකීය විද්‍යාලය ආරම්භ කලේ මොවුන්ය.

  ii 1815 දී වෙස්ලියන් මිෂනාරී සභාව ලංකාවේ සමහර ප්‍රදේශවල අධ්‍යාපන ආයතන ආරම්භ කළහ. කොළඹ වෙස්ලි මෙතෝදිස්ත විදුහල, නුවර කිංග්ස්වුඩ් විදුහල , ගාල්ලේ රිච්මන්ඩ් විදුහල මොවුන් ආරම්භ කළ විදුහල් ය.

  iii ඇමෙරිකාන මිෂනාරි සභාව යාපනයේ වට්ටුකෝට්ටෙයි ප්‍රදේශයේ උසස් අධ්‍යාපන පාසල් ද යාපනය නගරයේ සෙන්ට්‍රල් කොලිජිය, උඩුවිල්හි බාලිකා විදුහල ආදිය ආරම්භ කළේ ය.

  iv 1845 දී මෙරට පැමිණි කතෝලික සභාවට අයත් පූජකවරු, පැවිදි සහෝදරවරු, පැවිදි සහෝදරවරියෝ විවිධ පාසල් ලංකාවේ ආරම්භ කළහ. මෝදර දලාසල් විදුහල, කොටහේන සාන්ත බෙනඩික්ට් විදුහල, සාන්ත ජෝශප් විදුහල, යහපත් එඬේරාගේ බාලිකා විදුහල, ශුද්ධ වූ පවුලේ බාලිකා විදුහල, යාපනයේ සාන්ත පැට්‍රික් විදුහල මීන් ප්‍රධාන වේ. පසු කාලයේ දී පාසල් 750 කට අධික සංඛ්‍යාවක් කතෝලිකයන් සතුවිය.

- මෙලෙස නිදහස ලබන තෙක් ඉංග්‍රීසි පාලන සමයේ දී පාසල් 235 කට අධික සංඛ්‍යාවක් ආරම්භ කර සිසු සිසුවියන් 10,000 කට අධික පිරිසකට අධ්‍යාපනය දුන්හ.
- ඉංග්‍රීසි යුගය තුළ ජාති ආගම් භේදයෙන් තොරව සියලු දෙනා එක්ව අධ්‍යාපනය ලැබීමත් කාන්තාවන් අධ්‍යාපනයේ දියුණුව ලැබීම හා අධ්‍යාපනය කෙරෙහි උනන්දුවක් ඇතිවීමත් සිදුවිය.

- මේ කාලයේ දී යාපනයේ සේවය කරමින් සිටි ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා ලංකාවේ අධ්‍යාපන සැලසුම් ගැඹුරින් සොයා බලා ඇන්ග්ලිකන්, ප්‍රොතෙස්තන්තක ක්‍රමවේද එම ආගම්වලට අයත් නැති අයට බලපාන බවට ඉතා වැදගත් ලිපි 3 ක් පළකළේ ය. ඒවා නම්

    1. ලාංකීය කතෝලික අධ්‍යාපනය පිළිබඳ වදන් ස්වල්පයක් (මෙය 1860 දී පළ කළේ ය,
    2. විවිධ ආගම් හා මිශ්‍ර පාසල් යන මැයෙන් තවත් ලිපියක් 1861 දී පළ කළේ ය.
    3. කතෝලික සභාව සහ නාගරීකරණය මැයෙන් තෙවන ලිපිය 1867 දී පළ කළේ ය.

- මෙතුමාගේ මේ ලිපි මගින් ලාංකීය අධ්‍යාපනය පිළිබඳව මනා අවබෝධයක් ලැබූ ඉංග්‍රීසි රජය 1869 දී අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඇති කළේ ය. එය අද දක්වාම පැවත එයි.
- මෙමගින් කතෝලික සභාවට පමණක් නොව බෞද්ධ, හින්දු, ඉස්ලාම්, සැමට පාසල් ආරම්භ කර තම මව්බසින් අධ්‍යාපනය දීමට හැකි බවට නීතිමය අවසරය ලැබුණි.
- මෙලෙස විවිධ ආගමිකයන්ට පාසල් ලංකාවේ ඇරඹීමට මුල් වූයේ ගරු බොන්ජීන් පියතුමන් නිසාය.

**නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කතෝලික අධ්‍යාපන සේවය.**

- 1969 දී ගෙන ආ නව අධ්‍යාපන චක්‍රලේඛනය අනුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් ආරම්භ කළ අතර කතෝලික පාසල් වඩාත් දියුණුවට පත්විය.
- නගරබදව උසස් පාසල් සියලු පහසුකම් ඇතිව ආරම්භ කරන ලදී. ඒවා රජයේ පරීක්ෂාව යටතේ විවිධ ක්‍රිස්තියානි සභා මගින් පාලනය විය.
- කතෝලික පාසල් අධීක්ෂණය කිරීමට එක් එක් පළාත්වල අධ්‍යක්ෂවරයකු බැගින් පත් කරන ලදී. මීසම් පාලක පියතුමන්ලා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙනුවෙන් සේවය කළහ.
- කතෝලික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගුරු විදුහල් මග්ගොන, බෝලවලාන, කොලුම්බුතුරෙයි ආදී ස්ථානවල ඇති කරන ලදී.
- කතෝලික සභාවට අයත් පාසල් පාලනය සඳහා යම් යම් ස්ත්‍රී හා පුරුෂ පැවිදි නිකාය ඉදිරිපත් වූහ.

- බෙනදික්තාන නිකාය (Order of Sylvestro Bendeictine)
- නිර්මල මරිය නිකාය (Oblates of Mary Immaculate)
- ජේසු නිකාය (Society of Jesus)
- දලාසල් සහෝදරවරු (Christian Brothers)
- මාරිස්ට් සහෝදරවරු (Marist Brothers)
- ශුද්ධවූ පවුලේ කන්‍යා සොයුරියන් (Holy Family Sisters)
- යහපත් එඬේරාගේ කන්‍යා සොයුරියෝ (Good Shepherd Sisters)
- ෆ්‍රැන්සිස්කන් කන්‍යා සොයුරියෝ (Franciscan Sisters)
- අපෝස්තලික කාර්මේල් කන්‍යා සොයුරියෝ (Apostolic Carmel Sisters)
- දයාවේ කන්‍යා සොයුරියෝ (Charity Sisters)

- ස්වභාෂාවෙන් අධ්‍යාපන දීම දියුණු කිරීම සඳහා මග්ගොන හා මාතලේ ෆ්‍රන්සිස්කාන නිකායේ සහෝදරවරු ද යාපනය හා කොලුඹුතුරෙයි හි සාන්ත ජෝශප් නිකායේ සහෝදරවරු ද ෆ්‍රැන්සිස්කාන කන්‍යා සොයුරියන්ගේ නිකාය ආදිය ද ලංකාවේ ස්ථාපිත කරන ලදී.
- මෙලෙස නිදහස් ශ්‍රී ලංකාවේ විවිධ කිතනු සභා නිසා අධ්‍යාපනය සීඝ්‍රයෙන් දියුණුවිය.
- 1960 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාලනයට පත් වූ විට 750 කට වැඩි කතෝලික පාසල් රජයට පවරා ගන්නා ලදී. ගොඩනැගිලි, ඉඩම්, ලී බඩු ආදියට කිසිදු වන්දියක් නොගෙවා සියල්ල රාජසන්තක කර ගන්නා ලදී.
- පාසල් පමණක් නොව ගුරුවිද්‍යාලද, රජයට පවරා ගන්නා ලදී. කතෝලික පාසල් 40 ක් පමණ රජයේ ආධාර නොලබා සිසුන්ගේද කිසිදු උපකාරයක් බලාපොරොත්තු නොවී පවත්වාගෙන යාමට අනුමැතිය ලබාගත්තත් කාලයාගේ ඇවෑමෙන් ආර්ථික අපහසුතා නිසා ඒවායින් සමහරක් ක්‍රම ක්‍රමයෙන් රජයට භාරදෙන ලදී.
- 1980 දී එවකට එක්සත් ජාතික පක්ෂය රජය ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතුමාගේ අනුමැතිය ඇතිව ඉතිරි පාසල්වල ගුරුවරුන්ට රජයෙන් වැටුප් ගෙවන ලදී.
- මේ ගැටලු සභාවට විශාල බලපෑමක් ඇති කළේ ය. කතෝලික පාසල්වල කතෝලික සිසු සිසුවියන්ට ආගමික අධ්‍යාපනය දීම ප්‍රතික්ෂේප කළ අතර බොහෝ පාසල්වල කතෝලික ගුරුවරු, කතෝලික විදුහල්පතිවරු නොමැති තත්ත්වයක් උදාවිය.
- මීසම් මට්ටමින් දහම් පාසල් දිනෙන් දින දියුණු විය.
- කතෝලික සභාව තුළ ගිහියන් අතර පිබිදීමත් ඇතිවුවා පමණක් නොව මීසම් පාලක පියතුමා, දෙමාපියන් හා සිසුන් අතර සමීප සුහදතාවක් ඇතිවිය.

### 8.3.2 ශ්‍රී ලාංකේය සංස්කෘතිය කලාව උදෙසා සභාවේ දායකත්වය

ශ්‍රී ලාංකේය කලාව තුළ කිතුනු අනන්‍යතාව රැක ගැනීමට කිතුනුවන්ට හැකිවී ඇත. ලේඛන කලාව, චිත්‍ර ශිල්පය, සංගීතය, නාට්‍ය හා නාඩගම් කලාව යන ක්ෂේත්‍ර තුළ කලාව උදෙසා දායකවීමට කිතුනුවන්ට හැකිවී ඇත.

**ලේඛන කලාව**

ශ්‍රී ලංකාවේ මුල් කිතුනු ලේඛන සම්පාදනය වූයේ ආගමික හා ජන වන්දනාත්මක පරමාර්ථ වෙනුවෙන්ය. රටේ ජන ජීවිතයට සමීපවීමට නම් දේශීය භාෂා හැදෑරීම අත්‍යවශ්‍ය සාධකයක් විය. දේශීය ජනතාව සිය භාෂාවට හා සංස්කෘතියට දැක්වූ ලැදියාව පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යුගවල සිටි විදේශික කිතුනු ලේඛකයෝ දැන සිටියෝ ය.

**පෘතුගීසි යුගයේ ක්‍රිස්තියානි ලේඛන**

- ක්‍රි.ව 1645 දී ජේසු නිකායික ගරු පියරේ බෙර්ගුවින් පියතුමා කාණ්ඩ 3 කින් සමන්විත සිංහල ව්‍යාකරණ පොතක් ලියා ඇත. Arte E Grmmetica de Linguwa Chingala
- මල්වානේ ගරු පෙද්‍රෝ ෆ්‍රැන්සිස්කෝ නම් ජේසු නිකායික පියතුමා ලියා ඇති සාන්තුවරයන්ගේ ජීවිත චරිත 26 ක් හා ධර්මෝපදේශ ග්‍රන්ථයක්ද ස්වාමීන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය ගැන ග්‍රන්ථයක්ද මෙකල වැදගත් ලේඛන වශයෙන් ගත හැකි ය.
- ඉපැරණිම දෙමළ කතෝලික පොත වන " සන්තියෝගු මායොර් අම්මානෙ" නමැති ග්‍රන්ථය ක්‍රි.ව. 1647 දී ගරු ජෝ ආඩ් කර්වල්ලේ ජේසු නිකායික පියතුමා තුළින් කිතුදහම හඳුනාගත් පේර්ද්‍රෝ නැමැති වියත් ලේඛකයා ලියා ඇත.
- වර්ෂ 1612 දී කිතු දහම වැළඳගත් අලගියවන්න මුකවෙටි කවියා දොන් ජෙරොනිමෝ නමින් ප්‍රසාද ස්නාපයන ලැබීය. සුභාෂිතය, සැවුල් සන්දේශය වැනි ජනප්‍රිය කාව්‍ය පොත් රචනා කළ මොහු කුන්ස්තන්තීනු හටන නම් ප්‍රථම සිංහල ක්‍රිස්තියානි කාව්‍යය ක්‍රි.ව. 1620 දී රචනා කර ඇත. කොන්ස්ටන්ටයින් ද සා නැමැති පෘතුගීසි සෙන්පතියා විසින් අන්තෝනියෝ බරෙත්තු ගෙවත් කුරුවිට රාළ පරදවා ජයගැනීම වර්ණනා කිරීම සඳහා රචනා කර ඇති මෙම කාව්‍ය පැරණි සිංහල ලේඛක පරපුර විසින් සම්පාදිත අවසාන කෘතිය ද වේ.

**ලන්දේසි යුගයේ ක්‍රිස්තියානි ලේඛන**

ලන්දේසි ව්‍යාකරණ ග්‍රන්ථ. වදන් පුස්තක, ශබ්ද කෝෂ යනාදිය ලන්දේසි සහ සිංහල භාෂාවලින් සම්පාදනය කළේ ය. ගීතාවලියේ ගීත, බැතිගීත, ජනවන්දනා පුස්තක ලන්දේසි භාෂාවෙන් සිංහලට පරිවර්තනය කරන ලදී.

- ක්‍රි. ව. 1755 දී කොළඹ දෙව්සත් හලේ ආචාර්ය මණ්ඩලයේ ඇන්තනී පෙරේරා සහ ලුවී ද සේරම් විසින් පද රචනය කළ මුද්‍රිත ගීතිකා පොතක් නිර්මාණය විය. මෙම ගීතිකාවල තනු යුරෝපීය ක්‍රමයට යොදා ගැනිණි.

- ලන්දේසි රජයෙන් කිතුනු සාහිත්‍යයට පිරිනැමුණු වැදගත්ම දායකත්වය වන්නේ ශුද්ධවූ බයිබලයේ සම්පූර්ණ නව ගිවිසුමද පැරණි ගිවිසුමේ කොටසක් ද සිංහල භාෂාවට පරිවර්තනය කිරීමයි.

- ක්‍රි.ව 1705 මැයි 09 දින ලංකාවට පැමිණි ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා සිංහල හා දෙමළ කිතුනු සාහිත්‍යයට කළ සේවය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් විස්තර කළ නොහැකි ය. මෙතුමා ප්‍රතිභාපූර්ණ සාහිත්‍යධරයෙකි. මෙතුමාගෙන් සිදුවූ සේවය පිළිබඳව 8.1 නිපුණතා මට්ටම යටතේ හැදැරූ කරුණු පිළිබඳව අවධානය නැවත යොමු කරන්න.

**19/20 වෙන ශතවර්ෂවල කිතුණු ලේඛකවරු**

- මෙම සියවසේ දී කිතුනු ලේඛකයින් රැසක් ලේඛනය සම්බන්ධයෙන් දායකත්වය ලබා දී ඇත. කිතුනු පූජකවරුන් මෙන්ම කිතුනු ගිහි කොටස් ද මෙම කර්තව්‍ය වෙනුවෙන් දායක වී ඇති බව පෙනේ.

- ක්‍රි.ව 1866 දී ජුනි 07 දින සිට අද දක්වා සංස්කරණය වන ශ්‍රී ලංකාවේ ඉපැරණිම සිංහල පුවත්පත වන ඥානාර්ථ ප්‍රදීපය තුළින් ලේඛකයන් රැසක් බිහිවී ඇත.

- මෙරට දේශීය කිතුනු කලාව බැබළවූ මිණිපහන ලෙස සළකනු ලබන්නේ 1902 ජුනි 03 දා දංකොටුවේ දී උපත ලැබූ ගරු මර්සලීන් ජයකොඩි පියතුමාය.

- 1949 අග භාගයේ දී මෙතුමා ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතේ සංස්කාරක පදවිය දරා ඇත. කතෝලිකයන්ගේ හැබෑ සිංහලකම, මව් භාෂා දැනුම, ළබැදියාව උකහා දැක්වීමට මෙතුමෝ ඥානාර්ථ ප්‍රදීපය අවියක් කර ගත්හ.

- ක්‍රි.ව 1889 දි ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ ඉපැරණිම සඟරාව වන " භක්ති ප්‍රබෝධනය" නිර්මල මරිය නිකායික පියවරුන් විසින් වර්තමානයේ දී ද පවත්වාගෙන යනු ලබයි.

- අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිගේ හා ගරු ඇස්. ජී. පෙරේරා, ගරු ඩබ්. එල්. ඒ. දොන් පීටර් පියතුමාගේ ලේඛක දායකත්වයද විශේෂිතය.

**දෙමළ කිතුනු ලේඛක**

- බටහිර ධර්මදූත කණ්ඩායම් මෙරට සේවයේ යෙදෙන අවස්ථාවලදී කිතු දහම, ශුද්ධ වූ ලියවිලි , සාන්තුවර චරිත පිළිබඳ ජනතාවට ඉගැන්වීම සඳහා පහසුවෙන් යොදාගෙන ඇත්තේ දෙමළ කිතුනු ලේඛනයන්ය.

- පෘතුගීසි, ලන්දේසි යුගයේ විවිධ දෙමළ කිතුනු ලේඛන නිර්මාණය වූ අතර එය අඛණ්ඩව නිර්මාණය වී ඇත.

**පෘතුගීසි යුගය**

පෘතුගීසි සමයේ මෙරටට පැමිණි ෆ්‍රැන්සිස්කාන හා ජේසු නිකායේ ධර්මදූතවරු විවිධ දෙමළ කිතුණු ලේඛන නිර්මාණය කළ අතර දේශීය ගත්කරුවන් දෙමළ ලේඛණ කලාවට යොමු කළහ.

- දෙමළ කිතුනු සාහිත්‍යයේ පීතෘවරයා ලෙස හඳුන්වන්නේ හෙන්රි හෙනරිකස්ය. ඔහු දකුණු ඉන්දියාවේ සේවය කළ සමයේ දෙමළ බසින් විවිධ ලේඛන පරිවර්තනය කර ඇත. මෙතුමා තෙවසරක් මන්නාරමේ සේවය කළ අතර එහි දී විවිධ පරිවර්තන නිර්මාණ කළ බව වාචික සම්ප්‍රදායේ සඳහන් වේ. එහෙත් මේ ලේඛණ සොයාගත නොහැක.

- දකුණු ඉන්දියාවේ ධර්මදූත සේවයේ නියලුණු ඩි නෝබිලේ පියතුමා විවිධ දෙමළ කිතුනු ලේඛන නිර්මාණය කළේ ය. මෙතුමා තම මහළු වයසේ දී යාපනයේ තෙල්ලිපලෙල ප්‍රදේශයේ වසර 2 ක් පදිංචිව විවිධ කිතුනු ලේඛන නිර්මාණය කළ බව සම්ප්‍රදායේ පවතී.

- 'සන්දියෝගු මයෝරි අම්මනෙ' දෙමළ කිතුනු නාටාර් ලේඛන අතර මුලින්ම කියවුණු මෙම ලේඛනය අද දක්වා පවවති.

- යාපනයේ නෙල්ලිපෙලෙල ප්‍රදේශයේ සේවය කළ ජේසු නිකායේ සුවං කර්වාලු පියතුමාගේ සහය ඇතිව නෙල්ලිපලෙල හිඳී කතෝලික ධර්මය වැළඳගත් පේදුරු පූලවර් විසින් එම ලේඛනය නිර්මාණය කළේ ය.

- ඥානප්පල්ලු නමැති ලේඛනය කෙටි දෙමළ ලේඛන 96 අතරින් ප්‍රධාන වේ. මෙම ලේඛනය අනුව නිර්මාණය වූ කිතුනු ලේඛන ඥානප්පල්ලු ලෙස හැඳින්වේ.

- කතෝලික ධර්මය වැළඳගත් හින්දු ආගමිකයන් කුඹුරේ වැඩපළෙහි යෙදෙන අවස්ථාවලදී ධර්මය ඉගැන්වීමට මෙම ලේඛනය යොදා ගන්නා ලදී.

- පන්තෙක්කාරන් (දෙවියන් වහන්සේ) පල්ලන් (ක්‍රිස්තුස් වහන්සේ) ,මුත්ත පල්ලි (ජෙරුසලම්), ඉලෙයපල්ලි (රෝමය) යන චරිත 4 ක් කේන්ද්‍ර කොට මෙම ලේඛන නිර්මාණය විය.

- ක්‍රි.ව 1645- 1650 දක්වා කාලය තුළ මෙම ලේඛනය තෙල්ලිප්පලෙල පේදුරු පුලවර් විසින් රචිත නිර්මාණයක් විය හැකි බව අති උතුම් දියෝගුපිල්ලේ රදගුරුතුමා සිය පර්යේෂණ මගින් සඳහන් කොට ඇත.

**ලන්දේසි යුගය**

- ලන්දේසි පාලන සමය තුළ කැල්වින් දර්ශනය ව්‍යාප්ත කිරීමට පිලිප් පල්දේවුස් නමැති පුද්ගලයා මූලික වී ඇත.
- පර්සිවල් අයියර් නැමැති පුද්ගලයා ආර්මුගනාවලර් ගේ සහය ඇතිව ශුද්ධ වූ බයිබලය දෙමළ භාෂාවට පරිවර්තනය කළේ ය.

**19/20 වන සියවස් වල දෙමළ කිතුනු ලේඛන**

- 20 වන සියවසේ දෙමළ කිතුනු ලේඛන නිර්මාණය කිරීමට විවිධ පුද්ගලයන් දායක වී ඇත.
- " නල්ලූර් ස්වාමි' නමින් හඳුන්වන ලේඛනය ඥාන ප්‍රකාශර් නි. ම. නි පියතුමා විසින් නිර්මාණය කළේ ය.
- මෙම පියතුමා ශ්‍රී ලාංකීය සභා ඉතිහාසය, ජාකොමේ ගොන්සල්වේස් පිය චරිතය, මෝච්චපාදෙ, සෙපට්වෙන්ඩු, භක්ති පෝකිකිෂම්, මෝටඩ, කපාඩම්, තිත්තිය ආරාධනෙ ආඬවර් ආයින්ද කති, යන ග්‍රන්ථ නිර්මාණය කළේ ය. සංවාදශීලී දේශන මෙතුමා විසින් රචනාකොට ඇත.
- ක්‍රි.ව. 1877 සිට අම්ල උට්පව ඉටාක්කිනිත් කුදර් යන මාසික සඟරාව ප්‍රකාශනය කළේ ය.

**උදය කාරකෙ**

ශ්‍රී ලංකාවේ පැරණිතම හා පළමු ක්‍රිස්තියානි සඟරාව ලෙස මෙය හැඳින්වේ. වර්ෂ 1841 දී ඇමරිකානු ධර්මදූතවරුන් විසින් යාපනයේ දී මෙම සඟරාව ආරම්භ කරන ලදී.

**පාදුකාවලන**

යාපනයේ රදගුරු පදවියේ ප්‍රකාශනයක් වන මෙය ශ්‍රී ලංකාවේ පළමු කතෝලික දෙමළ සඟරාවයි. වර්ෂ 1876 දී ආරම්භ කරන ලදී. කතෝලික බැතිමතුන්ගේ විශ්වාසය නැඹුරු කිරීම මෙහි පරමාර්ථය විය.

**චිත්‍ර ශිල්පය**

අධ්‍යයනයේ පහසුව සඳහා ප්‍රාග් පෘතුගීසි යුගය, ලන්දේසි යුගය, බ්‍රිතාන්‍ය යුගය සහ නිදහසින් පසු උදාවූ යුගය තුළ සොයාගන්නා ලද කිතුනු ලාංජන සහ චිත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

**ප්‍රාග් පෘතුගීසි යුගය**

I. **අනුරාධපුර කුරුසිය**

ක්‍රි.ව 1912 දී ඊ. ආර්. අයර්ටන් නැමැති පුරාවිද්‍යාඥයා විසින් අනුරාධපුරයේ මැද නගරයේ තිබී ගලින් නිමවූ පසුතලයක කොටන ලද විශේෂ හැඩයකින් යුතු කුරුසියක් සොයාගෙන ඇත. මෙම කුරුසිය කළුගල් කුළුනක කොටා ඇති අතර මෙම කුරුස ලාංඡනය එහි ඉදිකර තිබුණු දෙව් මැදුරක කණුවක් බව පිළිගනු ලැබේ.

- මෙම කුරුස ලාංඡනය ක්‍රි.ව. 2000 දී අනුමත කරන ලද බහුලව භාවිත කෙරෙන ශ්‍රී ලංකා කතෝලික ධජයේ යොදා තිබේ.

- කලකට ඉහත දී මෙම අනුරාධපුර කුරුස ලාංඡනය වේදභේද කිතුනු නිකායක්ව නෙස්ටෝරියානුවන්ගේ කුරුසියක් බව වරදවා විශ්වාස කරන ලදී. එහෙත් පසුකල ලැබී ඇති දත්ත අනුව මෙය පැහැදිලිවම එකල පෙරදිග කතෝලික පිරිස් අතර ජනප්‍රිය වු කුරුසියේ සළකුණක් බව අවබෝධ වී ඇත. මෙය ශුද්ධ වූ තෝමස් අපෝස්තුලුවරයාණන් විසින්ම නිර්මාණය කරන ලද කුරුසියක අනුකරණයක් බව අද පොදු පිළිගැනීමයි.

II **බෞතිස්ම පොකුණු**

වවුනියාවේ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ගලෙන් නිමැවූ ප්‍රසාද ස්නාපන ජල බඳුන.

මෙහි වට ප්‍රමාණය සෙ.මි. 300 කි. විශ්කම්භය සෙ.මි. 118 කි. ගැඹුර සෙ.මි. 35 කි. ඝනකම සෙ.මි.7 කි.

මෙම බේසම නිමවා ඇත්තේ එකම ගලකින් ය මෙය හමුවී ඇත්තේ මාතොට වරාය අසල තිබීයදී ය.

III කැළණි ගඟ මුවදොර ශුද්ධ වූ තෝමස් මුනිඳුන් සිහිවීම සඳහා කුරුසියක් සහිත කුළුණක් හමුවී ඇත. නූතනයේ එංගලන්ත සභාවේ ගොඩනැගිල්ලක් වන ජින්තුපිටියේ ශාන්ත තෝමස් දේවස්ථානය තනා ඇත්තේ මෙම ස්ථානයේ යැයි ඉතිහාසඥයෝ සැක කරති.

**පෘතුගීස් යුගය**

I ගලක කෙටූ පෘතුගීසීන්ගේ නිල ලාංඡනය මෙය ජනාධිපති මන්දිරය පහළින් ඇති ඉඩමක ඇත.

II සාන්ත ආනා තිර රෙද්ද

1666 දී සාන්ත ආනා මැණියන්ගේ නවගමුව දේවස්ථනයේ ඇති තිරය සඳහා භාවිත කර ඇති මෙම චිත්‍රය අද තේවත්ත කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

**ලන්දේසි යුගය**

I කුරුණෑගල රිදී විහාරයේ මල් ආසනයෙහි ක්‍රිස්තියානි චිත්‍ර ඇඳ ඇති ටයිල් රැසක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සොයාගෙන ඇත. පහත සඳහන් ක්‍රිස්තියානි තේමා එම ටයිල්වල අඩංගු කර ඇත.

- ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණය, කුඩා වියේ දී උන්වහන්සේව ඔප්පු කිරීම, ජේසුස් වහන්සේ මුහුදමත ඇවිදීම, අන්‍ය රූප විපර්යාසය, මාර්තා හා මරියා යන නවගිවිසුමේ කථා මෙම චිත්‍රවලට තේමා වී ඇත.
- මෙම චිත්‍රවල විශේෂත්වය වන්නේ ක්‍රිස්තුන් වහන්සේට ලන්දේසි ඇඳුම් අන්දවා තිබීමය. එතුමාගේ හිස වටා රැස් වලල්ලක් නිර්මාණය කර ඇත.

**බ්‍රිතාන්‍ය යුගය**

- බෙෂෙල් නවරත්න නොහොත් මුහන්දිරම් මුදියන්සේ නවරත්න නම් දක්ෂ කැටයම් කරුවා පන්සල්වල කැටයම් නිර්මාණය කළ පුද්ගලයෙකි. මොහු බව්තීස්මය ලබා බෙෂෙල් නවරත්න නමින් තම නාමය වෙනස්කළේය.
- පේරාදෙණිය ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ලී කැටයම් වලින් දේවස්ථානයක් මොහු විසින් නිර්මාණය කර ඇත.

**නිදහසින් පසු යුගය**

**පෝල් නවරත්න**

1939-1940 කාලයේ දී කිතු උපත පිළිබඳ මොහු චිත්‍රණය කර ඇත.

**හෙන්රිකස්**

- මෝදර සාන්ත ජේම්ස් දෙව්මැදුරේ චිත්‍ර ඇඳ ඇත. මොහු ඇඳ ඇති අන්තිම රාත්‍රී භෝජනය චිත්‍රයේ මොහු තමාවම ගෝලයෙක් වශයෙන් නිර්මාණය කර ඇත.

**එන්. ඇස්. ගොඩමාන්න.**

- මීගමුව මහා විදීය ශාන්ත මරියා දෙව්මැදුරේ වෘත්තාකාර සිවිලිමක් නිර්මාණය කළේ ය. මොහු බෞද්ධයෙකි. ඔහු බයිබලයේ සුලබ අවස්ථා චිත්‍රයට නගා ඇත.

**සංගීතය**

හෙළ කිතුනු ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ ඉතා වැදගත් අංශයකි.

- සිංහල සංගීතයට කිතුණු සංගීතය දායකත්වය ලබා දී ඇත්තේ කෙසේ ද ?
- ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාගේ ඉපැරණි නිර්මාණ මගින්
- වහකෝට්ටේ, දූවේ, බෝලවත්තේ ගැයුණු පසන්, ලතෝනි, විලාප මගින්
- නත්තල් කැරොල් ගීත සම්ප්‍රදාය මගින්

**හෙළ කිතුනු සංගීතයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායකවූවෝ**

**1. ගරු ජාකොමෙ ගොන්සාල්වේස් පියතුමා**

ත්‍රී එක සුර ජේසුනි, නමෝ නමෝ මරිය, අහස පොළොව නිදොසින්නේ ආරම්භෙන් පෙර, දෙව්ඳු උපන්නේය සතුනි ආදී කිතුනු ගීතිකා තවමත් අප අතර භාවිත වේ.

- බැති ගී පමණක් නොව නාඩගම් ගී, ශෛලිගත නාට්‍ය ආදිය සඳහා ද ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ නිර්මාණ බලපා තිබේ. "මනමේ" නාට්‍යයේ එන ප්‍රේමයෙන් මනරංජිත වේ ගීතයේ තනුව ගොන්සාල්වෙස් පියතුමාගේ ගීයක අනුකරණයකි.
- එතුමාගේ ගීතිකාවට රිද්මය තනුව සොයා එතුමා කන්ද උඩරට, පහතරට සබරගමුව කරා ගියේය. එහි දවුල , තම්මැට්ටම, ගැට බෙරය, දෙවොල් බෙරය, හොරණෑව, තාලම්පට එනම් පංචතුර්ය නාද රටා සොයා ගියේ ය. හෙළ ජනතාවගේ ගීත රිද්මය, තම හද ගැස්මට එකතුකරගත් මෙතුමා හෙළයේ නාටක, නැටුම් සමඟ තමන් උපන් දේශයේ දුටු නාඩගම් කලාවන් අත්දැකීමට ගනිමින් කතෝලික සංගීතයට පණ පෙවුවේ ය.
- මෙතුමා ලියා ඇති ගීත ප්‍රබන්ධ 5 කි.
  - වේද කාව්‍යය
  - පසන් පොත
  - ආනන්ද කලිප්පුව
  - මංගල ගීතය
  - ලතෝනි පොත

- දේව ධර්මාචාර්ය අති උතුම් එඩ්මන්ඩ් පීරිස් (නි.මනි) රදගුරුතුමා ගරු මොසැසී පෙරේරා මාහිමි, සුනිල් ශාන්ත, ජේ. කේ. එස් පෙරේරා ගරු මර්සලීන් ජයකොඩි (නි.ම.නි) පියතුමා සිරිලක සංගීතය ඔපමට්ටම් කළ කිතු විරුවන් ය.

**නාට්‍ය හා නාඩගම් කලාව**

- කිතුනු ප්‍රධාන මංගල්‍ය පැවැති අවස්ථාවල එම මංගල්‍ය උත්සවයට හේතු වන ප්‍රධාන කරුණු බැතිමතුනට අර්ථාන්විතව පදහදාදීම අරමුණු කරගෙන දෙව්මැදුරු ආශ්‍රිතව ඒ පුවත් නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීමේ සිරිතක් පැවතුණි.

නාට්‍ය රඟ දැක්වීම සඳහා ම දෙව්මැදුරු ආශ්‍රිතව රඟ මඩලක් ඉදිකරන ලදී. බල් දෙවුස් නම් ඕලන්ද දේවගැති තුමා 1656-1665 කාලයේ දී කළ නිරීක්ෂණයක් අනුව එතුමා පැරණි කතෝලික දෙව්මැදුරු ගැන මෙසේ ලියා ඇත. මෙහි බොහෝ දේවස්ථාන අසල අට්ටාල හෙවත් රඟ මඩුලු ඉදිකර තිබේ. ඒවායේ ජේසු නිකායේ පාතුගීසි පියතුමන්ලා මංගල දිනයන් හි බයිබලය රඟ දැක්වූහ.

**පෘතුගීසි යුගයේ ධර්මදූතවරු ක්‍රිස්තියානි නාට්‍ය රඟ දැක්වූ අවස්ථා**

**ජේසු නිකාය**

- ක්‍රි.ව. 1604 දී කොළඹ ජේසු නිකායට අයත් දේව් මැදුරේ මංගල්‍යයේ දී ගිවිසුම් දා ගැබ හා දේව මාතාවන් යන තේමාව පිළිබඳව කරුණු ඇතුලත් නාට්‍යයක් වේදිකා ගත විය.

- ක්‍රි.ව. 1617 දී හලාවත අභිනව දෙව් මැදුර ආසිරි ගැන්වීමේ දී කුන්ස්තන්තීනු අග රජුගේ හිත් හැරීම රඟ දක්වා ඇත.

**ප්‍රැන්සිස්කාන නිකාය**

- මාතර ධර්ම සේවයේ නිරතව සිටි අන්තෝනියෝ පෙශෝවා තුමා වැදගත් වේ. 1636 දී ලියා ඇති ග්‍රන්ථයක ක්‍රිස්තුන් වහන්සේ ද, ආදම් සහ ඒව යන දෙදෙනාගේ චරිතාපදාන වස්තු කොට ගෙන දෘශ්‍ය කාව්‍ය කීපයක් ලියා වේදිකාගත කර ඇති බව සඳහන්ය..

**පාස්කු නාට්‍ය සම්ප්‍රදාය**

- චතාරිත කාලය සහ ශුද්ධවූ සතිය ආශ්‍රිතව ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීම ඉතා සුලභ දසුනකි.

- ක්‍රි.ව 1706 දී ඉහත කී පරිසරය තුළ ගෝවේ ඔරතෝරියානු නිකායෙන් ගෙන්වා ගත් පළඳනා භාවිත කරමින් පාස්කු ප්‍රදර්ශනයක් වේදිකා ගත කළ බව ඔරතෝරියානු වාර්තාවක සඳහන් වී ඇත.

- 16 වන සියවසේ සිට මෙවැනි නාට්‍ය ප්‍රදර්ශන ගෝව නගරයේ ජනප්‍රිය කලාවක්ව පැවතුණු අතර මෙරට දහම් මෙහෙවර සඳහා පැමිණි පියවරු නාට්‍ය කලාව පිළිබඳ ප්‍රගුණත්වයක් ලබා සිටියෝය. ජුසේ වාස් පියතුමා සහ ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ද එවකට ගෝවේ ප්‍රචලිතව තිබූ පාස්කු නාට්‍ය කලාව පිළිබඳව ප්‍රවීණත්වයක් ලැබ සිටියේ ය.

**පාස්කු නාට්‍ය කලාවේ ප්‍රභවය**

- සාම්ප්‍රදායික සිංහල නාට්‍ය කලාවක ඓතිහාසික තොරතුරු නොමැති අතර දේශීය නාට්‍ය කලාවක් බිහිකිරීමේ ප්‍රබල දායකත්වයක් දුන් පාස්කු නාට්‍ය කලාවේ ප්‍රභවය ඇතිවූයේ පෘතුගාලයේ සහ ස්පාඤ්ඤයේ පැවැති ආගමික නාට්‍යයක් අනුසාරයෙනි.

**ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය කලාවේ විකාශනය**

- ජේසාලෙ, දූව, පිටිපන, පමුණුගම, බොරලැස්ස යන ප්‍රදේශවල මුළුමනින්ම ජීවමාන නළු පිරිසක් විසින් කිතු සමිඳාණන්ගේ දුක් ප්‍රාප්තිය රඟ දක්වනු ලැබීය.

**සිංහල නාඩගම් කලාව**

- නාඩගම් වඩාත් ප්‍රචලිත වූයේ බටහිර මුහුදුබඩ වෙරළ ආශ්‍රිත හලාවත සිට තංගල්ල දක්වා වූ ප්‍රදේශවලයි.

- නාඩගම් වූ කලී අවශේෂ ගැමි නාටක විශේෂයකට වඩා අංග සම්පූර්ණ දෘශ්‍ය කාව්‍ය ලෙස සැළකිය හැකිය. සොකරි, කොහොඹා කංකාරි, කවි, නාඩගම් ආදියට වඩා කාව්‍ය ලක්ෂණ වලින් ද රංග ශෛලයෙන් ද යුක්ත වූ නාට්‍ය විශේෂ වූයේ නාඩගම්ය. ඒවා ප්‍රභවය ලද්දේ දක්ෂිණ භාරතයේ තෙරකුකු නමැති වීදි නාට්‍ය විශේෂයෙන්ය.

**ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා සහ සිංහල නාට්‍ය කලාව**

- සිංහල සාහිත්‍ය ඉතිහාසයේ නාට්‍ය සාහිත්‍යාංගය දෘශ්‍ය මාන නොවූ අවධියෙක සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයක් සහ නාට්‍ය කලාවක් බිහිවීමට රුකුලක් වූයේ ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ සාහිත්‍යාවලිය බව කිව යුතුමය.

- දේව නීති විසර්ජනය නාට්‍යෝචිත අවස්ථාවන්ගෙන් පිරිපුන් දෘශ්‍ය වූ කාව්‍ය ප්‍රබන්ධයක් වූ අතර නඩුපොත යනුවෙන්ද ඇතැම්හු මෙය හඳුන්වති.

- සිංහල නාඩගම් ගී රචකයින්ට ගොන්සාල්වේස් පියතුමාගේ නිර්මාණ' පූර්වාදර්ශයක් හා අමුද්‍රව්‍ය සපයා ඇත. මංගල ගීතයෙන්, පසන් පොතින්, නාඩගම් රචකයින් එතුමාගේ ප්‍රබන්ධයක් උපුටාගත් බව එම්. එච්. එම්. ගුණතිලක මහතා සිය ආචාර්ය උපාධිය සඳහා සම්පාදනය කළ නාඩගම් නම් නිබන්ධයේ සඳහන් කර ඇත.

උදා - පුරාණ රජතුන් කට්ටුව නාඩගම රචනයේ දී කතුවරයා ගොන්සාල්වේස් පියතුමන් රචනා කළ දේවවේද පුරාණය මත යැපුණු බව පැහැදිලි වේ. එමෙන්ම දුක් ප්‍රාප්ති ප්‍රසංගයෙන් සුවිශේෂ විසර්ජනයෙන් ගත් යෙදුම් ද බෞද්ධ රචකයින් විසින් ප්‍රබන්ධ කරන ලද නාඩගම් වල විද්‍යාමාන වේ.

**දෙමළ නාට්‍ය හා නාඩගම් කලාව**

**නට්ටාර් නාඩගම් කලාව**

- නාඩගම්, නාට්ටාර් නාඩගම්, ග්‍රාමීය නාඩගම්, නාට්ටුකුත්තු කුන්තු යන අංග එකම අර්ථයක් දෙයි. මේ නැටුම් හා ගැයුම් ඒකාබද්ධව නරඹන්නන්ට පණිවුඩයක් ගෙන දෙන මාධ්‍යයක් වේ. දෙමළ ජනතාවගේ පාරම්පරික කලාව තුළ නාට්ටුකුක්කු කලාව සාමාන්‍ය ජනතාව අතර ජනප්‍රිය වූ අතර ආරක්ෂා කර ගැනීමද සිදුවිය.

- ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව ජීවත් වූ යාපනය, මඩකලපුව, මන්නාරම, මාතෝඩ්ඩම්, වන්නි පුත්තලම, හලාවත යන ප්‍රදේශවල නාඩගම් කලාව පැවතුණි. දෙමළ නාඩගම් කලාව , හින්දු ආගමෙ පුරාණ ඉතිහාසයේ තිබූ භක්ති ප්‍රේමය, වීර්යය, යුද්ධය වැනි තේමා ඔස්සේ පැවතුණි.

- කතෝලික ධර්මයේ ඉගැන්වීම් හා වටිනාකම් ජනතාවට ගෙනයාමේ මාධ්‍යයක් ලෙස පෘතුගීසීන් පාලනය කළ යුගයේ මෙරට සේවාවේ නියැලුණු ෆ්‍රැන්සිස්කන් හා ජේසු නිකායික පියවරු නාට්ටුකුත්තු කලාව යොදා ගෙන ඇත. මෙහි ප්‍රධාන තේමා ලෙස සාන්තුවර චරිත හා යුරෝපීය කථා පදනම් කරගෙන ඇත. කතෝලික නාඩගම් කලාව මෙරට බිහිවන අවස්ථාවේ ලන්දේසි පීඩනයට මුහුණ දෙමින් සිටි නිසා නාට්ටුකුත්තු හි දුක්වීදීම මූලික තේමාව විය.

- කතෝලික නාට්ටුකුත්තු බොහෝවිට සාන්තුවර චරිතවල ආභාෂය ලබා ඇත. සාන්තුවර බැතිය හා ගෞරවය ප්‍රකාශ කරන මාධ්‍යයක් ලෙස මෙම නාට්‍යය යොදාගෙන ඇත. එම නිසා සාන්තුවර චරිතය රඟ දැක්වුයේ නැත. ඒ වෙනුවට ගීතිකා ගායනා කළහ. එලෙස කිරීමට හේතුව වූයේ සාන්තුවර ගෞරවය ගෙන දීමය.

**සාම්ප්‍රදායික කතෝලික නාට්‍ය කලාවේ ආරම්භය**

- සාම්ප්‍රදායික කතෝලික නාට්ටුකුත්තු මන්නාරම, යාපනය ප්‍රදේශවල ආරම්භ වී වර්ධනය විය.

- ලෝරෙන්සු පිල්ලේ පුලවර් මහතාගේ මුණුපුරා වන කීනාම්පිල්ලේ විසින් එරුමෙ, නොන්ඩි, එන්රික් එම්පරාදෝ, පුරිසීන කන්ති යන නාඩගම් ගායනා කරන ලදී. මෙහිදී වඩපාංගු( යාපනයේ ශෛලය ) ශෛලය යොදා ගෙන තිබේ.

**බ්‍රිතාන්‍ය යුගයේ නාට්ටුකුත්තු**

- බ්‍රිතාන්‍ය යුගයේ කතෝලික නාටය සඳහා ප්‍රබල විරෝධතා ඇතිවිය. මත්පැන් භාවිතය හා ස්ත්‍රී පුරුෂ සියල්ලෝ මිශ්‍රව කටයුතු කිරීම මගින් සචාදාරයට බාධාවක් විය හැකි නිසා නාඩගම් තහනම් කරන ලදී.

**සිංහල නාඩගම් කලාවට දායකවීම**

- සිංහල නාට්‍ය නාඩගම් සම්ප්‍රදාය බිහිවී වර්ධනය වීමට දෙමළ නාට්ටුකුත්තු මූලික වී ඇත. විශේෂයක්ව සමහර සිංහල නාට්ටුකුත්තු දෙමළ නාට්ටුකුත්තිවලින් සෘජුව පරිවර්තනය කොට ඇත.

  උදා - එස්තාකි හි ජෝසපාත්, සන්තිකිලාර්, ඥාන සෞන්දරි යන නාඩගම් සඳහන් වේ.

### 8.3.3. කිතුනු දයාව හා සමාජ සුබසාධනය

### ශුද්ධ වූ බයිබලීය චින්තනය

**පැරණි ගිවිසුම**

සියලු මැවීලි අතර උසස්තම මැවිල්ල මිනිසා බවත්, මිනිසා තනව විසීම දෙවියන් වහන්සේගේ අභිමතය නොවූ බවත් උත්පත්ති පොත ආරම්භයේදී ම සඳහන් කරයි. (උත්පත්ති 2/18) එහෙයින් , මිනිසා සමාජීය සත්ත්වයෙකි. දෙවියන් වහන්සේ මිනිසා පවුල් ජීවිතයට, පවුල් ජීවිතයකට හෙවත් සමාජීය ජීවිතයකට කැඳවන බව මින් පැහැදිලිය. සමාජීය ජීවිතයේ සාර්ථකත්වය සඳහා ආත්මාර්ථය බිඳ හැර පරිත්‍යාගශීලී බවකින් ජීවත්වීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා දේව ප්‍රේමය හා දයාව තුළ ජීවිත ගොඩනගා ගැනීමට අවශ්‍යය දයාව පෙරදැරි කරගෙන සාධාරණත්වයෙන් කටයුතු කිරීමෙන් සමාජයේ පොදු යහපත හා සැබෑ සාමය ගොඩනැගෙන බව ශුද්ධ වූ බයිබලීය චින්තනය අපට පවසයි.

මෝසෙස් තුමාගේ නායකත්වය යටතේ ඊජිප්තුවේ වහල්කමින් මිදුණු ඊශ්‍රායෙල් ජනයා පොරොන්දු දේශයට යන ගමනේ දී, දෙවි සමිඳාණන් වහන්සේ ඔවුනට දුන් නීති නියෝග හා ඉගැන්වීම්වල හරය වූයේ සහෝදර දයාවෙන් එකිනෙකාට යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීමයි. විශේෂයෙන් එම සමාජයේ ජීවත් වූ දුගී දුප්පතුන්ට, අසරණයන්ට, වැන්දඹුවන්ට හා දරුවන්ට දයාව දැක්වීම හා සරණය පැම මෙම අණපණත් හා නියෝගවලින් වඩා ඉස්මතු වෙයි.

- ලෙවී ව්‍යවස්ථාව 19/9, 10, 13, 15, 17, 18
- ලෙවී ව්‍යවස්ථාව 25/35 , 38
- නික්මයාම 22/21-27

ඇසට ඇසද, දතට දත ද (නික්මයාම 21/24) යන නීතියෙන් පිළිබිඹු වන්නේ ද සමාජ සාධාරණත්වයයි. එය, බැලූ බැල්මට පිළිගැනීමක් සේ දිස්වුව ද එකළ සමාජ සන්දර්භය තුළ තමාට සිදුවූ හානිය ඉක්මවා යන හානියකට කිසිසෙත් අවසරයක් නොදෙන සාධාරණත්වයක් ඉන් ගම්‍ය වේ.

**නව ගිවිසුම**

ඇසට ඇසද, දතට දත ද යන පුරාණ ගිවිසුමේ නීතිය, ඉන් ඔබ්බට ගොස් ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් හා ජීවිතාදර්ශය මගින් උඩුයටිකුරු වී " ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤාකරන්න." (මතෙව් 5/43) ලෙස සහෝදර ප්‍රේමය නව දැක්මකින් යුතුව එළිදකින අයුරු ක්‍රිස්තුස් වහන්සේගේ කන්ද උඩ දේශනයේ දැක්වේ.

උන් වහන්සේගේ ඉගැන්වීම් හා දේශනා තුළින් ප්‍රකට වූ මෙම ප්‍රේමයේ නව අභිධර්මය කුරුසියේ ජීවිත පූජාව මගින් තහවුරු වී සතුරන්ට පවා සමාව දෙන සීමාවකින් තොර ප්‍රේමයක් උන්වහන්සේගේ ජීවිතයේ අපි දකින්නෙමු. කිතුනු දයාව හා එකිනෙකාගේ සුබසාධනය සඳහා පදනම හා ජවය වන්නේ කිතුනු අනුගාමිකයන්ගේ ජීවිතවල ද තිබිය යුතු මෙම ප්‍රේමයයි.

ජාතීන්ගේ විනිශ්චය දවසේ දී එඬේරකු එළුවන්ගෙන් බැටලුවන් වෙන් කරන්නාක් මෙන් දෙවියන් වහන්සේ ජනතාව දෙපසට වෙන්කර පවසන " මමසාගිනිව සිටියෙමි. ඔබ මට කන්න දුන්නාහුය. පිපාසව වි සිටියෙමි, ඔබ මට බොන්න දුන්නාහුය. (මතෙව් 25/31-46) යන ඉගැන්වීමෙන් උන්වහන්සේ පසක් කරන්නේ ප්‍රේමයේ ජීවිතය හා දයාව දැක්වීම ක්‍රිස්තු ශ්‍රාවකයකු, අනුගාමිකයකු වීම නිසා උරුම වන , වෙන්කළ නොහැකි, බැහැර කළ නොහැකි වගකීමක් හා යුතුකමක් බවයි. සමාජයේ වෙසෙන කාහට වුව ද යහපතක් කළේ නම් ඒ කළේ උන් වහන්සේටම බව ද මින් පැහැදිළිය. "සැබැවින් ම මම ඔබට කියමි. මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම් එය කළේ මටයැ." (මතෙව් 25/40) එසේ නොකළා නම් නොකළේ ද උන් වහන්සේටම ය. (මතේව් 25/45)

එම නසා, කිතුනු දයාව යනු කිතුනු ශ්‍රාවකයකුට බැහාර කළ නොහැකි ශ්‍රාවකත්වයේම යුතුකමකි. තමා ජීවත්වන කිනම් ජීවිත තත්ත්වයක, රැකියාවක වුව ද ජීවත්වන ස්ථානය, සමාජ පරිසරය තුළ සමාජ සුබසාධනය හා පොදු යහපත වෙනුවෙන් ඇපකැප වී දයාවේ පුණ්‍ය ක්‍රියාවල යෙදීමට සිය ස්වාමියාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගෙන් නියමවුණු ප්‍රේමයේ පමණක් කිතුනුවනට ලැබී ඇත. කිතුනුවාට ඉන් බැහැරවීමට නොහැකිසේ ම කිසිවකුට එය නතර කිරීමට නොහැකි ය.

බයිබලීය දැක්මට අනුව ගොඩනැගුණු කිතුනු චින්තනය, අසල්වැසියාට ප්‍රේම කිරීමේ ණය යුක්තිය අපට සිහිගන්වයි. තවද තමාට මෙන් ම අසල්වැසියාට ප්‍රේම කිරීම දේව ප්‍රේමය නිසාම සිදුවන්නකි. ( 1 ජොහන් 4/7-19) ක්‍රිස්තියානි දයාවේ අරමුණ, අස්ල්වැසියාට ප්‍රේම කිරීම මගින් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම බව මින් ඉතා පැහැදිළි ය.

සියලු ධර්මතා අතර ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමයයි. ප්‍රේමය නොමැති තැන ඇත්තේ හිස්බවකි. පුහු ඝෝෂාවක් පමණි. ( 1 කොරින්ති 13/1-13) එහෙයින්, ප්‍රේමය, දයාව නොමැති තැනැත්තා සැබෑ කිතනුවකු ද නොවන බව පැහැදිළි ය.

දෙවියන් වහන්සේට හා අසල්වැසියාට ප්‍රේම කිරීම හැර ශ්‍රේෂ්ඨ අන් කිසි අඥාවක් නැත. (මාක් 12/29-31) මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න යනු ජේසුස් ක්‍රිස්තුන් වහනසේ සිය ශ්‍රාවකයන්ට දුන් අලුත් අඥාවයි. (ජොහන් 13/34)

අප උන් වහන්සේගේ ගෝලයන් බව සියල්ලන් දැනගන්නේ මෙම ප්‍රේම කිරීම නිසා බව ද උන්වහන්සේ පවසති.

**කතෝලික සභා ධර්මෝපදේශය (නො. 1889, 2196)**

**ශ්‍රී ලංකාව තුළ සමාජ සුබසාධන කටයුතු**

කිතුණු දයාව පෙරදැරි කරගෙන සමාජයේ පොදු යහපත වෙනුවෙන් කටයුතු කිරීම සහ සමාජ සුබසාධනයට දායකවීම කිතුනු වගකීමයි. සමාජ සුබසාධනයෙහිලා වැදගත් වනුයේ භෞතික දියුණුව පමණක් නොව මිනිසා පූර්ණ මනුෂ්‍යයකු ලෙස සමාජයේ ජීවත්වීමට අවශ්‍ය පසුබිම සකස් කිරිමයි. දේව සමානකමකට මවන ලද මිනිසාගේ එම මිනිස් ගරුත්වය ඔප්නැංවෙන ලෙස කටයුතු කිරීමට සහාය වීමයි.

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ දී මෙන් විශේෂයෙන් වර්තමානයේ ද මෙම දැක්ම අනුව කිතුනු දයාව පෙරදැරි කරගෙන ජාති, ආගම්, කුල, පංති ආදි භේද නොතකා සමාජ සුබසාධනය හා මානව සංවර්ධනයට අදාල ක්‍රියාවලසභාවක් ලෙස ද විවිධ සමිති හා සංවිධාන ලෙස ද පෞද්ගලික වශයෙන් ද කිතුනුවෝ නිරතව සිටිති.

16 ශත වර්ෂයේ මෙරටට පැමිණි කිතුනු මිෂනාරි නිකායවල සේවාව පිළිබඳ පිරික්සන කළ ඔවුන්ගේ දූත සේවාවේ අරමුණ වූයේ ආත්ම ගලවා ගැනීම බව ඓතිහාසික ලේඛනවල සඳහන් වේ එහෙත් මිනිසා ආත්මයකින් පමණක් හෙබි පුද්ගයකු නොව ශරීරයකින් ද හෙබි ය. එම නිසා ආත්මික අවශ්‍යතා මෙන් ම ශාරීරික අව්‍යශතා ද මනුෂ්‍යත්වයට නිගරුවක් නොවන ලෙස ජීවිතය ගෙනයාමට අවශ්‍ය මූලික පහසුකම් වෙනුවෙන් ද ඔවුන් කටයුතු කළ බැව් පැහැදිළි ව පෙනේ. ආරම්භයේ සිටම සභාව මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා දයාවේ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් සේවාවේ නියැලුණු බව පෙනී යයි. වර්තමානයේ දී නොයෙකුත් ශාරීරික හා භෞතික මිනිස් අවශ්‍යතා සඳහා ජනතාව කිතුනු දේවස්ථාන, ආයතන හා සංවිධාන වෙත දිව එන්නේ මෙම කිතුනු දයා සරණ සේවා පිළිබඳ සමාජගත වී ඇති ආකල්ප හේතුකොට බව පැහැදිළි ය.

පෘතුගීසි ආගමනයේ සිට මේ දක්වා ගෙවී ගිය කාලවකවානුව තුළ සිදු වූ කිතුනු දයා සේවාව පිළිබඳ නිරීක්ෂණය කරන කළ විවිධ ස්ත්‍රී පැවිදි නිකාය පැමිණීම හෙවත් කරු කන්‍යා සොහොයුරියන්ගේ දූත සේවාව වැදගත් සාධකයක් සේ ඉස්මතු වෙයි. මෙය ලංකා ඉතිහාසයේ යටත් විජිත යුගයේ සිදුව වැදගත් විමුක්තිදායක සිද්ධියකැයි හැඳින්වුවාට වරදක් නැත. පිරිමි පැවිදි නිකායවලින් සිදුවූ සේවාව ද මේ හා බැඳේ. එම නිකායවලින් සිදුවූ සේවාව හා ඉතිහාසය පිළිබඳ ස්වයං අධ්‍යයනයක යෙදීම ඉතා යෝග්‍ය ය.

ඉහත සඳහන් කළ විදේශවලින් පැමිණි පැවිදි නිකායන් මෙන් ම ඊට පරිබාහිරව මෙරට ආරම්භ වී ක්‍රියාත්මක වන පැවිදි නිකාය තමන්ට ආවේණික වූ කරිස්මාව ඔස්සේ සේවාවේ නිරත වුව ද ඒ සෑම සේවාවකට ම පදනම වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් වූ කිතුනු දයාවයි.

මෙම පැවිදි නිකායවලින් සිදුවූ හා දැනටමත් සිදුවන සේවා අතර රෝගීන්ට උපස්ථාන කිරීම, අනාථ ළමුන් හා හංසාවට, අතරවලට ලක්වූ අවිවාහක මව්වරුන් රැකබලා ගැනීම, අන්ධ, ගොළු, බිහිරි හා වෙනත් ආබාධයන්ට ලක්වූ දරුවන් රැකබලා ගැනීම, ඔවුනට සරිලන අධ්‍යාපනයක්, වෘත්තීය පුහුණුවක් ලබා දීම, මහලු හා වැඩිහිටියන් විශේෂ නිවාසවල රැකබලා ගැනීම, විධිමත් පාසල් අධ්‍යාපනය, වීථි දරුවන්ගේ නොවිධිමත් අධ්‍යාපනය, සිරගත වූවන්ට හා මානසික ආබාධවලට ලක්වූවන්ට සරණය, උපදේශන සේවා, රෝහල් හෙද සේවාව, මන්ද මානසික දරුවන් බලා ගැනීම, පවුල් අපෝස්තලික සේවා හා යුද්ධයෙන් අවතැන් වූ දරුවන් සහ සරණාගත කඳවුරුවල සිටින්නන්ට සේවා සැපයීම සඳහන් කළ හැකිය. මෙම සේවාව විවධ ක්ෂේත්‍රවල විසිරී පැවතුණ ද එහි අරමුණ හා පදනම කිතුනු දයාව මිස අනෙකක් නොවන බැව් පැහැදිළි ය.

වර්තමානයේ සභාව තුළ මීසම් හා කිතිනු දේවස්ථාන මට්ටමින් ද, පැවිදි නිකාය හා පූජා ප්‍රසාදිතුමන්ලාගේ හා රාජගුරු ප්‍රසාදි තුමන්ලාගේ උදව්වෙන් මෙවැනි බොහෝ දයාවේ සේවාවන් ක්‍රියාත්මක වේ. ඒවා විවිධ ආයතන, සමිති සමාගම්, සංවිධාන ස්වරූපයෙන් ද ක්‍රියාත්මක වේ.

**කිතුනු සමාජ සුබසාධන දයා සේවා ආයතන**

**කරිටාස් (ශ්‍රී ලංකා) සෙඩෙක්**

මෑත ඉතිහාසයේ මෙරට කතෝලික දයා සරණ සේවා හා සමාජ සංවර්ධන, සුබසාධන කටයුතු නිරීක්ෂණය කිරීමේ දී ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය යටතේ ක්‍රියාත්මක මෙරට කතෝලික සභාවේ සමාජ සේවා අංශය වන කරිටාස් (ශ්‍රී ලංකා) - සෙඩෙක් ආයතනය වැදගත් තැනක් ගනී.

1968 දී ස්ථාපිත, දැනට ශ්‍රී ලංකාවේ සෑම රදගුරු වසමකම විවිධ නම්මලින් දයා සේවාවේ හා සමාජ සුබසාධනයේ යෙදෙන කරිටාස් (ශ්‍රී ලංකා) සෙඩෙක් ආයතනය විශේෂයෙන් මිනිසුන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරැකීම, සමාජීය අවශ්‍යතා සපුරාලීම, මානව සංවර්ධනය හා සාධාරණත්වයෙන් හෙබි සමාජයක් ගොඩනගන්නට විවිධ ව්‍යාපෘති හා ක්‍රියා මාර්ග ඔස්සේ දායක වෙයි.

**සාන්ත වින්සන් ද පාවුලා දයා සේවාව**

ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක මෙම කතෝලික දයා සේවාව ශ්‍රී ලංකාවේ විවිධ රදගුරු වසම්වල ස්ථාපිත මධ්‍ය මණ්ඩල මුල් කරගෙන මීසම් මට්ටමින් ක්‍රියාත්මක වේ. දේවාස්ථාන මට්ටමේ ගිහි සැදැහැවතුන් එකට එක්වී පරිත්‍යාගශීලීන්ගේ ආධාර මගින් දයා සරණ සේවාවේ නියැලීම දක්නට ලැබේ.

**තරුණ ක්‍රිස්තියානි සංගමය (YMCA)**

විවිධ කිතුනු සහා සාමාජිකයින්ගේ එකතුවකින් සැදි ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධිත සමාජ සේවා හා දයා සේවාවන්හි නිරත ආයතනයකි.

**තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය (YWCA)**

විවිධ සමාජ සේවා හා දයා සේවා ව්‍යාපෘතිවල නිරතවන විවිධ කිතුනු සභා සාමාජිකාවන් (කාන්තා) ගේ එකමුතුවකින් සැදි ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධිත ආයතනයකි.

**මානව හිමිකම් හා සමාජ සංවර්ධනය**

ඕනෑම සමාජයක උන්නතිය හා සංවර්ධනය රඳා පවතිනුයේ එම සමාජයේ ගොඩනැගෙන සාමය හා සංහිඳියාව මත ය. එම සාමය හා සංහිඳියාව ඇතිවීම සඳහා විශේෂයෙන් හේතු වනුයේ සමාජයේ පුරවැසියන්ගේ මානව හිමිකම් රැකදීම හෙවත් සුරැකීමයි. සියලු මනුෂ්‍යයන්ගේ මනුෂ්‍යභාවයට උරුම වූ ගරුත්වය රැකෙන සේ සාධාරණත්වයෙන් සැළකීමයි.

මානව ඉතිහාසය පුරා මෙන් ම වර්තමානයේ ද මානව හිමිකම් කෙළෙසීම්, උල්ලංඝනය කිරීම්, මානව ගරුත්වයට නොගැපෙන සිදුවීම් ජනමාධ්‍ය ඔස්සේ වාර්තා වේ. එසේ වුව ද, මිනිස් අයිතිවාසිකම් කඩවුණු අඳුරු අතීතයක් සමඟ බිහිවුණු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් ප්‍රඥප්තිය මිනිස් පවුලේ සෑම කෙනෙකුටම හිමිවිය යුතු අන් සතු කළ නොහැකි. උල්ලංඝනය නොකළ යුතු මානව හිමිකම් වගන්ති 30 කින් ප්‍රකාශ කරයි. ජගත් සංවිධානයට අයත් රටවල් විසින් පිළිපැදීමට බැඳී සිටින මෙම ප්‍රඥප්තිය සඳහා පදනම වූ කරුණු අතර මානව ගරුත්වය පිළිබඳ ශුද්ධ වූ බයිබලීය චින්තනය, කිතුනු දැක්ම හා මෑත ඉතිහාසයේ සභා ඉගැන්වීම් ද හේතු වී ඇතැයි කිවහොත් නිවැරදි ය.

ශුද්ධ වූ බයිබලීය චින්තනයට අනුව මනුෂ්‍යයකු ලෙස බිහිවීමේ විශේෂ වටිනාකමක් ඇත. මිනිසා දෙවිඳුන්ගේ ස්වරූපයට හා සමානත්වයට මවන ලද්දකි. (උත්පත්ති 1/26) සියලු මැවිලි අතර අග්‍රස්ථානය ද මිනිසා ය (ගීතාවලිය 8/4-6)

මෙම කිතුනු චින්තනයට අනුව ජාති, ආගම්, කුල පංති ආදි භේදවලින් තොරව ශ්‍රී ලාංකේය ජන සමාජයේ මිනිස් බවේ ගරුත්වය රැකීමට හා මානව හිමිකම් සුරැකීමට විවිධ යුගවල දි ද විශේෂයෙන් වර්තමානයේ දී ද සභාව විවිධ ප්‍රයත්න දරා ඇත. ශ්‍රී ලංකාව වැනි විවිධ ජාතීන් හා විවිධ ආගමිකයන් වෙසෙන සමාජ පරිසරයක, මානව හිමිකම් අතින් කෙනෙකු ඉහළිනුත්, කෙනෙකු පහළිනුත් සිටින සේ සැළකීම් හා බෙදීම් කිසිසේත් සාධාරණ නොවන බවත්, එය සැබෑ සාමකාමී ජන සමාජයක් ගොනැංවීමට ද, සමාජ සංවර්ධනයට මහත් බාධාවක් බවත් සභාව අවධාරණයෙන් පෙන්වා දෙන්නීය. මානව හිමිකම් සුරැකීම සහ සැමට සමානත්වයෙන් සැළකීමෙන් සාමයට හා සංවර්ධනයට අවතීරණ විය හැකි බව කිතුනු සභාවේ විවිධ ප්‍රවේශ මගින් පෙන්වා දී ඇත.

මෑත ඉතිහාසයේ අප ශ්‍රී ලංකා දේශය තුළ මානව ගරුත්වය කෙළෙසුණු හා මානව හිමිකම් කඩවුණු අවස්ථාවල දී ඊට දැඩි විරෝධය දක්වමින් සාමය හා සමානත්වතාව වෙනුවෙන් සභාව සමස්ත ජාතියටම අනුශාසනා කළ අවස්ථා බොහෝ ය. ඒ අතරින් කිහිපයක් පමණක් මෙහි දැක්වේ.

**විවිධ ජාතීන්ගේ හා ආගමිකයන්ගේ සමාජ කණ්ඩායම්වල සමාන අයිතිවාසිකම් හා යුක්තිය වෙනුවෙන් හඬනැගීම.**

- 1983 ජුලි මස සිදුවූ ජාතිවාදි ගැටුම්වලින් පසු ලාංකික ජන සමාජයේ ඇතිවුණු භේද භින්නතා, හිංසනය, ගැටුම් හමුවේ සාමය සඳහා වූ අභියෝග පිළිබඳ 1984 ජුනි 10 දින ශ්‍රී ලංකාවේ කතෝලික රාජගුරු මණ්ඩලය නිකුත් කළ ශ්‍රී ලාංකික ජාතිය නැවත ගොඩනැංවීම කරා යන අනුශාසනා පත්‍රය.
- 1983 ජුලි මාසයේ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන විමසමින් ඇසකට ඇසක් ය, දතකට දතක් ය යන ගෝත්‍රික පළිගැනිමටත් වඩා පහළ මට්ටමේ සදාචාරයකට අප පත් වී ඇති බව පවසමින් අහිංසක දමිල වැසියන් වෙත එල්ල කරන ලද ප්‍රහාර ගැන කම්පා වෙමින් කිතුනු ප්‍රේමයේ දැක්ම තුළ සමාජ සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරන්නට ආරාධනා කරමින් සභා සාමාජිකයන් හා ශ්‍රී ලාංකික ජනතාව වෙත කුරුණෑගල දියෝකිසීයේ අතිඋතුම් ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමන් නිකුත් කළ එතුමන්ගේ අවසාන පණිවිඩය.
- වසර තිහක පමණ කාලයක් ඇදිගිය යුද්ධයේ දිනෙන් දින සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා, බිහිසුණු ඝාතන, බෝම්බ පිපිරීම් ආදියේ දී ප්‍රචණ්ඩ ක්‍රියා තරයේ හෙළා දකිමින්, සාකච්ඡා මාර්ගයෙන් සාමකාමි විසඳුමකට එන ලෙස අදාළ පාර්ශවලට බලකරමින් සභා නිවේදන හා අනුශාසනා මගින් ඉල්ලීම.
- යුද්ධයේ දී සිදුවූ මානව හිමිකම් කඩවීම්වලට විරුද්ධව හඬනැගීම, අසාධාරණ අත්අඩංගුවට ගැනීම්, රඳවා තබාගැනීම්වලට විරුද්ධව හඬ නැගීම.

- වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් වැඩ වර්ජනයේ නියැලීමේ හේතුවෙන් රැකියා අහිමි වූ 1980 ජූලි වර්ජකයන්ගේ රැකියා අවස්ථා නැවත ලබාගැනීම සඳහා හඬනැගීම සහ ඔවුනට සරණ වීම.
- 1988- 1989 භීෂණ සමයේ සිදුවූ පැහැරගෙන යාම්, ඝාතන, නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීම්, රඳවා තැබීම්, අතුරුදහන් කිරීම්, හිංසා සහ වදබන්ධනවලට එරෙහිවීම් හා එම පීඩාවන්ට ගොදුරුවූවන්ට හා ඔවුන්ගේ පවුල්වලට ආධාර කිරීම.
- නිදහස් වෙළඳ කලාපයේ සේවාවේ නිරතවූවන්ගේ කම්කරු ශ්‍රමයේ වටිනාකම පසක් කර සේවක අයිතිවාසිකම් පාලකයන්ගේ අවධානයට ලක් කිරීම, සේවක අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම.
- පරිසරයට හා ජනතාවට හානිකර විවිධ යෝධ සංවර්ධන ව්‍යාපෘතිවල අහිතකර ඵලවිපාක පිළිබඳ සියල්ලන් දැනුවත් කර අවිහිංසාවාදී විරෝධතා, සාකච්ඡා මගින් බලධාරීන්ගේ අවධානය යොමුකර ජනතා සුබසිද්ධිය වෙනුවෙන් හඬ නැඟීම.
- ශ්‍රම සංක්‍රමණිකයන් හා විදේශගත ලාංකිකයන්ග් සුබසිද්ධිය සඳහා කටයුතු කිරීම

**ආරෝග්‍යශාලා සේවය**

වෛද්‍ය ක්ෂේත්‍රය හා ආරෝග්‍යශාලා සේවය ගැන සළකන කළ පෘතුගීසී සමයේ ද මෙරට ආරෝග්‍යශාලා පැවති බව ඉතිහාසයේ සඳහන් වේ. පෘතුගීසී සොල්දාදුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා මූලකි වූ ආරෝග්‍යශාලාවක් කොළඹ කොටුවේ ඇරඹිණි. එය පවත්වාගෙන ගියේ ෆ්‍රැන්සිස්කාන මිෂනාරිවරුන් විසිනි. හලාවත සහ යාපනයේ ආරෝග්‍යශාලා දෙකක් විය. එකක් සොල්දාදුවන්ට හා අනෙක කතෝලික , කතෝලික නොවන සැමට විවෘත වූ ආරෝග්‍යශාලා දෙකක් මන්නාරම් දූපතේ ඇති විය. ජෙරමියෝ පියතුමා විසින් නිලධාරීන් සඳහා වූ ආරොග්‍යශාලාවක් මන්නාරම් බලකොටුවේ විවෘත කරන ලදි. කිතුනුවන් එහි ස්වේච්ඡාවෙන් සේවය කළ බැව් සඳහන් ය.

වසූරිය, කොළරාව, මැලේරියාව ආදී වසංගත රෝග වැළඳුණු විට ගම්බිම්, ගෙවල් දොරවල් හැරයාම වෙනත් විකල්පයක්, සෞඛ්‍ය සේවාවන් එතරම් දියුණු නොවූ එකල නොවීය. 1612 දී යැවූ ලිපියකට අනුව ජේසු නිකායික මිෂනාරීවරුන් ද වසූරිය වසංගතයට මුහුණපෑම ගැන කියැවේ. රොබට් නොක්ස් ද සිය ලේඛනවල සඳහන් කරන පරිදි දෙමාපියන් රෝග වැළඳුණු දරුවන්ද සැමියන් බිරින්දෑවරුන් ද , ගම්බිම් ද දමා පලාගියේ සුදුසු සෞඛ්‍ය සේවාවන් නොමැති නිසා ය. එහෙත් ක්‍රිස්තියානි මිෂනාරීවරු රෝගීන් අතහැර පලා නොගියහ. සැමදෙන ඔවුන්ගේ මෙම සත්ක්‍රියාව හා පරිත්‍යාගය අගය කළ බැව් සඳහන් ය. 1609 දී මොරටුව හා කම්මල ප්‍රදේශවල වසූරිය පැතිරුණු බව ද කම්මල දී ක්‍රිස්තියානීන් 70 ක් පමණ මියගිය බව ද සැළයි.

ලන්දේසී පාලන සමයේ දී 1697 අවසානයේ මහනුවරට වසූරිය වසංගතය පැතිරුණු අවස්ථාවේ භාග්‍යවත් ජුසේ වාස් පියතුමා ප්‍රමුඛත්වය ගෙන රෝගීන්ට උවටැන් කිරීමේ දයා සේවාවන් ඇරඹීම ඉතිහාසයේ සඳහන් වේ. එවකට වසංගතය හේතුවෙන් ඥාතීන් විසින් ගම්බිම් ද රෝගීන්ගේ මළ සිරුරුද දමා පළායාම සිදුවිය. දෙවන විමලධර්මසූරිය රජු ද මහනුවර හැර දමා පළා ගියේ ය. එහෙත් ජුසේ වාස් පියතුමා තමන්ට රෝගය වැළඳීමේ අවදානම තිබියදී එය නොතකා සිය සහායක ජෝසප් කර්වල්ලෝ පියතුමා සමග ගෙයින් ගෙට ගොස් රෝගීන්ට ඇප උපස්ථාන කිරීම , මෘත ශරීර භූමදාන කිරීම සිදුකළේ කතෝලික, අකතෝලික භේදයකින් තොරවය. රජු හා ජනතාව ද මෙම දයාවේ සරණ සේවාව ගැන මවිත වූ බැව් සඳහන් ය. මනුෂ්‍යයා ආත්මයකින් පමණක් නොව ශරීරයකින් ද හෙබි හෙයින් ශාරීරික සුවතාව වෙනුවෙන් ජුසේ වාස් පියතුමන් කළ මෙම කැපවීමේ දයා සේවාව මෙරට ආරෝග්‍යශාලා සේවා හා ශරීර සුවතාව වෙනුවෙන් සිදුවූ කිතුනු දායකත්වය හැරදැරීමේ දී කිසිසේත් සුළුවෙන් තැකිය නොහැකි ය.

බ්‍රිතාන්‍ය යුගයේ දී ද මෙම රෝගීන්ට උපස්ථාන කිරීමේ දයා සේවාව ක්‍රියාත්මක විණි. නිර්මල මරිය නිකායේ පියවරු ලංකාවට පැමිණ වසර 3 ක් ගතවන විට 1850 දී දරුණු කොළරාව වසංගතයක් ප්‍රදේශ පුරා පැතිරුණු බැව් සඳහන් ය. එම මිෂනාරීවරු දැඩි වෙහෙසකාරී තත්ත්වයක රෝගීන්ට උපස්ථාන කළහ. එම නිකායේ ෆීලික්ස් ඇලෙක්සැන්ඩර් හා වික්ටර් යන පියවරු සිය දූත සේවාව ආරම්භයේ දී ම රෝගයට ගොදුරු වී මියගිය බව සඳහන් ය. දරුණු වසංගතයක් පවතිද්දි අප මිෂනාරිවරු දයාවේ ප්‍රාතිහාර්යයන් සිදු කරතියි මැසනඩ් රදගුරුතුමා එම නිකායට යැවූ ලිපියක ද සඳහන් කර ඇත.

ෆ්‍රැන්සිස්කාන මිෂනාරි සොයුරියන් 1886 දී රජයේ ඉල්ලීම පරිදි හෙදි පුහුණු පාසලක් කොළඹ අරඹා පසුව එම සේවාව මන්නාරමට ද ව්‍යාප්ත කර ඇත. හැඳල සහ මාන්තිව් හි ලාදුරු රෝහල් දෙකක් ආරම්භ කළ එම නිකාය, එහි රෝගීන් සඳහා කැපවෙමින් සේවය කළේ ය. මෙම නිකායේ කන්‍යා සොහොයුරියෝ මඳකලක් කොළඹ ජාතික රොහලේ හෙද සේවාවේ නිරත වූහ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1-** ශ්‍රී ලාංකේය සමාජයට සභාවෙන් වූ දායකත්වය ගැන පහත මාතෘකා ඔස්සේ කතිකාවක් ගොඩනගන්න.

1. අධ්‍යාපනය
2. සංස්කෘතිය හා කලාව
3. සමාජ සේවාව

මූලාශ්‍ර :


i සනාතන නිමැවුම්, චන්ද්‍රකීර්ති කුලරත්න

ii ශ්‍රී ලංකාවේ කිතුනු දායකත්වය, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ

iii ක්‍රිස්තියානියේ ඉතිහාසය, සාහිත්‍යය හා කලාව, ආචාර්ය ඇන්තනි ප්‍රනාන්දු

iv හෙළ කලාවේ කිතුනු සළකුණ, ගොන්සාල්වේස් සිංහල ආයතනය, දයා වැලිකඩ ආරච්චි පියතුමා

v ශුද්ධවූ බයිබලය, නව අනුවාදය, දෙවන සංස්කරණය, 1990

vi කතෝලික සභා ධර්මෝපදේශය

නිපුණතාව 9.0 : **කිතුනු ජනවන්දනාවට සහභාගි වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි.**

නිපුණතා මට්ටම 9.1 : කිතුනු විශ්වාසය ගොඩනැගීමට ජනවන්දනාව දායක වූ ආකාරය සොයා බලයි.

කාලච්ඡේද : කාලච්ඡෙද 12

ඉගෙනුම් ඵල :

- මුල් සභාවේ ජනවන්දනාව අධ්‍යයනය කරයි.
- පෙරදිග සභාවේ ජනවන්දනා ක්‍රම අධ්‍යයනය කරයි.
- බටහිර සභාවේ ජනවන්දනා ක්‍රම අධ්‍යයනය කරයි.

විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :

9.1.1 මුල් කිතුනු සභාව හා ජනවන්දනාව

ශුද්ධවූ සභාව ආරම්භයේ සිටම යම් ආකාරයකින් මෙම ජනවන්දනාත්මක ක්‍රියාවන්හි නියැලුණි. මෙසේ ආරම්භ වූ බොහොමයක් වැඳුම් පිදුම් ක්‍රම ජුදා, ග්‍රීක, රෝම සංස්කෘතීන්ගෙන් අභාෂය ලබා ඇති බව නොරහසකි. ශුද්ධ බයිබලයේ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත හා පාවුලු තුමාගේ සංදේශ මේ සඳහා උදාහරණ ලෙස ගත හැකිය. එනම් අපෝස්තුලුවරු හා ජුදා කිතුනුවෝ ජුදා දේව මාළිගයට ගියහ.

" තවද ඔවුහු දිනපතා නොකඩවාම, එක්සිත්ව, දේවමාලිගාවේ රැස්වෙමින්ද ගෙයින් ගෙට යමින්ද කල් යැවූහ" (ක්‍රියා 2 : 46)

" දිනක් පේදුරු හා ජොහන් යාච්ඤා වේලාව වූ සවස 3.00 ට පමණ දේව මාලිගයට ගියහ. (ක්‍රියා 3 : 1) මොවුහු ජුදා සිරිත් විරිත් අනුගමනය කරමින් මෝසෙස්ගේ නීතිය පිලිපැද්දෝය ජුදා නොවන කිතුනුවනට ජුදා සිරිත් විරිත් බලෙන්ම පිළිපැදීමට සැලැස්වීම පිළිබඳව පාවුලුතුමා ප්‍රශ්න කරයි (ගලාති 2 : 14)

මුල් කිතුනු සභාවේ ජනවන්දනාව ප්‍රතිභා සම්පන්න වූයේ අල්ප වශයෙනි. එවක පැවැති බලවත් වැඳුම් පිඳුම් සංස්කෘතීන් නිරායාසයෙන්ම කිතුනුකරණය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් වැදගත් මුලාශ්‍ර දෙක ජුදා මුලාශ්‍රය හා ග්‍රීක මුලාශ්‍රයයි.

ජුදා මුලාශ්‍රවලින් ලද අභාෂය

හත් දින සතිය, ඉරු දිනයට හරවන ලද සබත, විශ්වාසීන්ගේ යැදුම, දේව වාක්‍ය පිළිවෙත, පූප කැඩීමේ පිළිවෙත, පාස්කුව සහ පෙන්තකොස්ත මංගල්‍යය යාම යැදුමේ වේලාවන්, මහා සාධුකාරය වැනි දේ ගත හැක.

## ග්‍රීක මූලාශ්‍ර වලින් ලද ආභාෂය

ජනවන්දනාවේ භාවිත කරන බොහෝ වෙචන (*Liturgy, Eucharist. Mystery*) වැඩිහිටි ප්‍රසාද ස්නාපන පිළිවෙත්වලට එකතු වු ආලේප කිරීම් සහ යකුන් දුරු කිරීම්, සර්ව රාත්‍රික බෞතීස්මය, බෞතීස්මය පූර්ව රාත්‍රියට ගෙන ඒම සහ ප්‍රාර්ථනා ශෛලිය යැදුම් ගත හැකි ය.

පසු කාලීනව රෝම සංස්කෘතික මූලාශ්‍රවල ආභාෂයද අවශේෂණය විය. පූජා ඇඳුම් , පහන් සහ දූම් පුජා, ජනවන්දනා යැදුම්, ලතින් භාෂාව, ග්‍රෙගෝරියානු ගායන සම්ප්‍රදාය ඇතැම් විවාහ හා අවමංගල්‍ය සිරිත් විරිත් ඒ අතර වේ.

කෙලෙස හෝ දිව්‍ය පුජාවේ ප්‍රධාන කොටස් 2 වන දේව වාක්‍යය පිළිවෙත හා දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත ජුදා ආභාෂය තුළින් ලද දායාදයන්ය.

අපෝස්තලික යුගයේ දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත එනම් පළමු ශත වර්ෂයේදී දිව්‍ය යාගය සිදු කර ඇත්තේ භෝජන සංග්‍රහයක් ද ඇතුළත්වය. එසේම ක්‍රිස්තුන් වහන්සේ සිදු කළා වූ ප්‍රථම පුප කැඩීමේ මෙහෙයද පාස්කු භෝජන සංග්‍රහය හා සම්බන්ධ වූවකි. ග්‍රීක භාෂාවෙන් " අගපේ " (*Agape*) යන නම මෙම පූප කැඩීම හා සම්බන්ධව පැවැති භෝජන සංග්‍රහයට දෙනු ලැබීය මෙහි අර්ථය වූයේ " ප්‍රේමයේ " භෝජන සංග්‍රහය යනුයි. පරහට දයා කිරීමත්, එකමුතුව ජීවත් වීමත් දෙවියන් වහන්සේට පුදනු ලබන වන්දනාවේ ලක්ෂණ සේ සැලැකූ අතර මෙම භෝජන සංග්‍රහය වන්දනා ක්‍රමයේ අංගයක් ලෙස සලකන ලදි.

අපෝස්තලික යුගයේ ජනවන්දනාව කොටස් 3 කින් සමන්විත විය.

1. දේව වාක්‍ය මෙහෙය
2. "අගපේ" භෝජන සංග්‍රහය හා
3. පූප කැඩීමේ පිළිවෙතට මුල් කිතුනු ජනතාව තම තමන්ගේ ආහාරපාන රැගෙන එක් නිවසකට රැස්වූහ. තම තමන් ගෙනා ආහාරපාන එකිනෙකා සමග බෙදාගෙන අනුභව කළහ. ඉන්පසු පවුලේ සිටින වැඩිමහල්ලා පූපය හා මිදිරස ගෙන එම ස්තෝත්‍රය පවසා පුප හා මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරිරය හා ශ්‍රී රුධිරය බවට පරිවර්තනය කළේය. පසුව ශ්‍රී පුපය කඩා රැස්වී සිටින්නවුනට අනුභවය සඳහා බෙදා දුණි. රැස්ව සිටි පිරිස ශ්‍රී කුසලානයෙන් පානය කළ පසු පිරිසේ නායකයා දේශනයක් පැවැත්වීය. දේශනය අවසාන යේදී ගීයක් ගයා මෙහෙය අවසන් කළේය. මෙහෙයට පැමිණි අය විසින් ප්‍රේමයේ භෝජන සංග්‍රහයෙන් කොටසක් මෙහෙයට නොපැමිණි කිතුනුවන් සඳහා තම තමන්ගේ ගෙවල්වලට ගෙන යන ලද්දේය. මෙලෙස ගෙන යනු ලැබුයේ ආහාර පාන මිස පුප හා මිදිරස නොවේ.

**ප්‍රසාද නිධාන**

**ප්‍රසාද ස්නාපනය**

අද මෙන් එදා ශුද්ධ වූ සභාවට ඇතුළුවන දොරටුව වූයේ ප්‍රසාද ස්නාපනයයි. වර්තමානයේදී මෙන් එකල බැති පිළිවෙත් විකාශය වී නොතිබුණු නිසා ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ පිළිවෙළ සරල විය. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ බලය අපෝස්තුලුවරුනට පමණක් නොව අන් අයටද තිබුණි.

උදාහරණ -

එතියෝපියානු නපුංසකයාට ප්‍රසාද ස්නාපනය දානය කළේ උපස්ථායක පිලිප්ය. ශු. පාවුලුතුමා ප්‍රසාද ස්නාපනය ලැබුයේ අනනියස් නම් ගෝලයකු අතිනි.

- ක්‍රියා 19 ፡ 48 (කොරෙනේලියස් ....)
- ක්‍රි.ව. 30 - 70 පමණ අතර කාලය තුළ දී ප්‍රසාද ස්නාපනය දානය කරන ලද්දේ ජේසුස් වහනසේගේ නාමයෙනි.

  උදා - ක්‍රියා 2 ፡ 38 , ක්‍රියා 10 ፡ 48 , කොලොස්සි 2 ፡ 12

**දෙවැනි සියවස ආරම්භයේ දී ප්‍රසාද ස්නාපනය**

" අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් " නම් ග්‍රන්ථයෙහි දක්වා ඇත. මෙහිදී ප්‍රසාද ස්නාපනය ලැබීමට බලාපොරොත්තු වු සියලු දෙනාටම සෑහෙන කාලයක් යහපත් මාර්ගය හා අයහපත් මාර්ගය උගන්වන ලදී.

- ප්‍රසාද ස්නාපනය දානය කරන ගැනීමට පෙර එක්වරු ශීලය රැකිය යුතුය.
- ප්‍රසාද ස්නාපනය දානය කරන ලද්දේ " පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන්ගේ නාමයෙනි
- දියෙහි ගිල්වා ප්‍රසාද ස්නාපනය කිරීම සාමාන්‍ය සිරිත වූයේ ය.
- ජලය හිස මත වත් කිරීමද භාවිත විය.

එනම් අපෝස්තලික යුගයේ දී ප්‍රසාද ස්නාපන පිළිවෙත ප්‍රථම භාගයේ තිබුණාට වඩා පසු භාගයේ වෙනස්කම්වලට භාජනය විය.

**අභිවෘද්ධි ආලේපය හෙවත් හස්ත තැබීමේ පිළිවෙත.**

අපෝස්තලික යුගයේ දී ප්‍රසාද ස්නාපනය මගින් ශුද්ධවූ සභාවට ඇතුළත් කරනු ලැබූ නවකයන් මත අපෝස්තලුවරු තම හස්ත තබා ශුද්ධාත්මයාණන් දානය කළහ. සාමාන්‍යයෙන් මෙම පිළිවෙත ප්‍රසාද ස්නාපනය සිදු කරන අවස්ථාවේදී ම සිදු කරනු ලැබුහ. මෙය " අත්තැබීමේ පිළිවෙත " නමින් ද හැඳින්විය. පස්වන සියවසේ දී මෙයට අභිවෘද්ධි ආලේපය යන නම භාවිත විය. මෙහි විශේෂ ලක්ෂණය නම් මෙම පිළිවෙත සිදු කළ හැකි වූයේ, එනම් බලය සතු වූයේ අපෝස්තුලුවරුන්ට හා අපෝස්තලික බලය ලැබූ අයට පමණි.

**පශ්චත්තාපයේ ප්‍රසාධ නිධානය**

පව් කමා කිරීමේ බලය හා නොකිරීමේ බලය ජේසුස් ස්වාමීන් වහන්සේ විසින්ම ශ්‍රාවකයන්ට දානය කරන ලදී. (ජොහන් 20 :23)

- මුල සිටම ශුධ වූ සභාව මෙම බලය ක්‍රියාවේ යෙද වූ බව පෙනේ.

උදා - අනනියස් හා සපිරා සිද්ධිය (ක්‍රියා 5 පරි:)

- ශුද්ධාත්ම බලය මුදලට ගැනීමට සිතූ සයිමන්ට පේදුරු තරවටු කිරීම (ක්‍රියා 8 : 9-24)

- ශු. ජාකොබ් තුමාගේ සංදේශයේ පව්කරුවනට තම හස්ත පිරිසිදු කරගෙන හෘදයන් පවිත්‍රකර ගන්නට අණ කර තිබේ.

- අපෝස්තලික යුගයේ දී පව් කමාව ලබා ගැනීම සඳහා හෘදයාංගම පශ්චත්තාපය පමණක් නොව තමන් කළ පාපයන් උච්ඡාරණය කිරීමද අවශ්‍ය විය. (ජොහන් 8 : 10 ජාකොබ් 5 : 6) මුල් යුගයේ දී බොරු දෙවිවරුන් ඇදහීම, මිනි මැරීම, කාම මිත්‍යාචාරය වැනි පාපය කමා කිරීමට සභාව මැලි වූ නමුදු දෙවන සියවසේ දී එම දැඩි භක්තිය ලිහිල් කරනු ලැබීය.

**රෝගීන්ගේ ආලේපය**

ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී ද රෝගීන් ආලේප කිරීමේ සිරිතක් තිබූ බව සුවිශේෂයෙන් අනාවරණය වේ. "තවද ඔවුහු බොහෝ යක්ෂයන් දුරු කොට බොහෝ රෝගීන් ද තෙලින් ආලේප කොට සුවපත් කළ සේක." (මාක් 6 : 13)

අපෝස්තලික යුගයේ දී  මෙම සිරිත ශු සභාවේ ප්‍රචලිතව තිබූ බව ශු ජාකොබ් තුමාගේ සංදේශයෙන් ප්‍රත්‍යක්ෂ වේ.
ජාකොබ් ( 5/14)

**පූජකවරය**

අපෝස්තලික යුගයේ දී පූජකවරය නැමැති ප්‍රසාද නිධානය හා සම්බන්ධ බැති පිළිවෙත ඉතා සරල විය. එහි විශේෂ අංගයන් වූයේ ආධුනිකයන් මත අපෝස්තුලුවරුන් හෝ අපෝස්තුලුවරුන්ගේ සම්ප්‍රදාය යන පොතේ විස්තර කරයි.

**9.1.2 පෙරදිග කතෝලික ජනවන්දනා පිළිවෙත්**

ක්‍රි.ව. 395 දී 1 වෙනි තියඩෝසියස් නම් අධිරාජයාගේ කාලයෙන් පසු පරිපාලනමය වෙනස් කමක් රෝම රාජ්‍යය තුළ ඇතිවිය. ක්‍රි. ව. 4 න් පසු කොන්ස්තන්තිනෝපලය (තුර්කීය - ස්තාන්බුල් ) ජනිතව ව්‍යාප්තවූ පිළිවෙත් පෙරදිග පිළිවෙත් ලෙස හැඳින්වේ. කාලයාගේ ඇවෑමෙන් තව තවත් පෙරදිග මධ්‍යස්ථාන බිහිවිය.

පෙරදිග කතෝලික පිළිවෙත්

- කොන්ස්තන්තිනෝපලය (තුර්කිය)
- ඇලෙක්සැන්ඩ්‍රියාව (ඊජිප්තුව-උ. අප්‍රිකාව)
- අන්තියෝකිය (සිරියාව)
- ආර්මේනියාව

මෙම පිළිවෙතෙහි ප්‍රධාන ලක්ෂණය වන්නේ සාම්ප්‍රදායික බවයි. පෙරදිග පූජාවන් සඳහා ගතවන කාලය පැය 3 1/2 යි. (කෝප්තික පූජාව) මෙහි දිව්‍ය පූජාවේ ඇතුලු වී තිබෙන්නේ එකම දේ නැවත නැවත සිදු කිරීම මඟින් එකම දේ නැවත නැවත සිහි කිරිමයි. දිව්‍ය පූජාව පවත්වන ආකාරය වෙනස් ය. මෙයට හේතුව සංස්කෘතික ගති පැවතුම් වල බලපෑමය.

පෙරදිග කියවීම් ග්‍රන්ථාකාරයට කියවනු ලබයි. මෙහි භාෂා ශෛලය ව්‍යක්ත බැවින් පෙර අධ්‍යයනයක් අවශ්‍ය වේ. පෙරදිග පිළිවෙත් වල අවධානය 100% ක්ම තිබිය යුතුය. පෙරදිග සංකල්පය අනුව වේලාවට ම යනු ප්‍රජාවට පෙර පැමිණීමයි. මේ නිසා විවිධ කාර්‍යයන් ඉෂ්ඨ කරන තේවාධරයින් විසින් තමන්ගේ කාර්‍යයන් ඉහළ ගුණාත්මක භාවයක් පවත්වා ගත යුතු ය.

නිතර සීනු නාද කිරීම ජනවන්දනාවේ අධික සම්ප්‍රදායික බව පෙන්වයි. ගායනයේ කැපී පෙනෙන විශේෂ ලක්ෂණය වනුයේ සජ්ඣායනායි. මේ පිළිවෙතෙහි විශේෂ සංකේත භාවිතා කරනු ලැබේ. බහුල ලෙස දුම් පූජා භාවිතය, දැල්වූ පහන පෙරහැර සමඟ අලංකාර පෙරහැරද මෙහි කැපී පෙනෙයි.

චිත්‍ර කලාව මෙහි වූ විශේෂත්වයකි (icons) මෙම චිත්‍ර කලාවේ ත්‍රිමාන රූප දැකීම අපහසුය. ඒවා සමතල චිත්‍ර ලෙස ඉදිරිපත් කර ඇත. ජ්‍යාමිතික හැඩ ලෙස වක්‍ර සහ ඉලිප්සාකාර හැඩ බොහෝ විට භාවිත වේ. චිත්‍ර තුළ සමතුලිත භාවය ගුප්ත බවද විනයානුකූල වර්ණ සංකලයක් ද ඇත. රූප ඇඳීමේ දී ඇස් ඉතා ලොකුවට ඉදිරිපත් කර ඇති අතර කට සහ නාසය ඉතා කුඩාවට ඉදිරිපත් කර ඇත.

ශරීරය සහ ඇඟිලි සිහින්ව නිර්මාණය කොට ඇත. ඇස්වල විශේෂ නාභිගත වීමක් ද නැත.

මේවායින් අදහස් කෙරෙන ප්‍රධාන පණිවිඩ කිහිපයක් ද ඇත. ගැලවීමේ අභිරහස ගුප්ත සහ අභිරහස්මය බව ඉන් ප්‍රධාන වේ. සමතල චිත්‍ර නිර්මාණයෙන් මේවා විනිවිද යා යුතු බව අදහස් කෙරේ. වර්ණ සංකලනය තුළ බොහෝ විට තඹ පැහැය, රන්වන් පැහැය, භාවිත කිරීමෙන් දේවත්වය නිරූපණය කෙරේ. ඇස්වලින් භාවාත්මක ආකල්පයන් ද බොහෝ දේ අවධානයට නතු කර ගැනීමේ හැකියාවක් ද ඉස්මතු කෙරේ.

මෙහි ආගමික පින්තූර හා දේවමාතා ප්‍රතිමා බහුලව දැකිය හැක.

මෙම පිළිවෙතහි සංස්කෘතික අංගයන් ඇතුළත් වී ඇත. දේවස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පය ඉතා පැරණිය. පැරණි ඇඳුම් පැළඳුම් දැකිය හැක.

**9.1.3 අපරදිග කතෝලික ජනවන්දනා පිළිවෙත්**

අපරදිග (බටහිර) කතෝලික පිළිවෙත් වල ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස සැලකෙන්නේ රෝමයයි.

**අපරදිග කතෝලික පිළිවෙත්**




සමස්තයක් ලෙස බාහිර කතෝලික ජනවන්දනාවට කාලය වැය වන්නේ අඩු වශයෙනි. ඊට හේතු වන්නේ බටහිර මානසිකත්වය තුළ ඍජුව සහ කෙටියෙන් අදහස් ප්‍රකාශ කිරීමේ සංස්කෘතිමය ලක්ෂණයයි.

**රෝමානු පිළිවෙත්වල විශේෂ ලක්ෂණ**

1. ගම්භීර බව - මෙහි ප්‍රධාන කාරණා දෙකක් ඇත.
   1 මනා පෙර සූදානම
   2. සාමාන්‍ය තත්ත්වයට වඩා උසස් ගුණාත්මක බව

උදා - පූජාවේදී පියතුමාට සහ තේවාදරයින්ට විවිධ ඇඳුම් ඇත. (තේවා ඇඳුම්) මෙම ඇඳුම් ඇඳීමෙන් ගම්භීර භාවයක් ඇත. භාණ්ඩ හා සිරිත් විරිත් තුළ ගම්භීර බව ප්‍රකාශ වීම විශේෂිතය.

2. සංයමයෙන් යුක්තයි.

භාෂාව, ඇඳුම්, පැළඳුම්, ඇවිදීම, කථා කිරීම මේ සැම දෙයක්ම සංයමයෙන් යුක්තය. මෙය බොහොම තැන්පත් පිළිවෙතකි. කථා කිරීමේදී වචනවල සංයමයක් තිබිය යුතු ය.

උදා - ගායනා කණ්ඩායමේ ගායනයන් (ග්‍රෙගෝරියානු සංගීතය)

3. බුද්ධිගෝචරය

අපේ යාච්ඤා හා පුජාව ගෝචර වන්නේ බුද්ධියටයි. හැඟීම් බර ස්වභාවය අඩුය.

4. කෙටිය -

අපරදිග රටවල දිව්‍ය පුජාවේ (රෝමානු පිළිවෙතෙහි ) අඩංගු වන්නේ අත්‍යවශ්‍ය දේය.

නියමිත වේලාවට පූජාවට පැමිණීම මෙහි දැකිය හැකි විශේෂත්වයකි. රෝමානු පිළිවෙත ලියැවුණේ 4 වන සහ 7 වන ශත වර්ෂ අතර ඉතා උගත් පඬිවරු විසින් ය. ඒවා කාව්‍යම හා ව්‍යක්ත භාෂා වලින් ලියැවුණි. මෑත කාලවලදී දේශීය භාෂාවන්වලට පරිවර්තනය වීමේදීද ඒවායේ ව්‍යක්ත බව බොහෝ දුරට රඳවා ගන්නා ලදී.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1** 1. මුල් කිතුණු සභාව හා ජනවන්දනාව පිළිබඳව කතිකාවතක් ගොඩනගන්න.

**පියවර 2** 2. පෙරදිග සභාවේ ජනවන්දනා ක්‍රම පිළිබඳව කතිකාවතක් ගොඩනගන්න.

**පියවර 3** 3. බටහිර සභාවේ ජනවන්දනා ක්‍රම පිළිබඳව සාකච්ඡා කරන්න.

| | | |
|---|---|---|
| නිපුණතාව 9.0 | : | **කිතුනු ජනවන්දනාවට සහභාගි වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි.** |
| නිපුණතා මට්ටම 9.2 | : | කිතුනු ජීවිතය තුළ ප්‍රසාද නිධාන ලබාගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. |
| කාලච්ඡේද | : | කාලච්ඡේද 20 |

**ඉගෙනුම් ඵල** :

- සියළු ප්‍රසාද නිධාන ක්‍රිස්තු කේන්ද්‍රීය බව අවබෝධ කර ගනියි.
- කිතුනුවකු ලෙස ප්‍රසාද ස්නාපනීය කැඳවීමට සාක්ෂි දැරීමට ප්‍රයත්න දරයි.
- ක්‍රිස්තුස් වහන්සේ මුලාරම්භක සක්‍රමේන්තුව බව දැන ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**9.2.1 ප්‍රසාද නිධාන ක්‍රිස්තු කේන්ද්‍රීය බව**

**හැඳින්වීම**

සෑම දේව ප්‍රසාද නිධානයක්ම ක්‍රිස්තු කේන්ද්‍රියව පවතින බව කිතුනු අප අවබෝධ කර ගත යුතු සත්‍යතාවයකි. දේව ප්‍රසාද නිධාන හෙවත් සක්‍රමේන්තු ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ප්‍රදානය කරනු ලබන අතර ඒ ඔස්සේ ප්‍රබල ලෙස ක්‍රියාකාරී වන්නේද උන්වහන්සේමය. එමෙන්ම දේව ප්‍රසාද නිධාන නතු කර ගැනීමට කිතුනුවන් හට මාවත විවෘතව පවතියි. මෙලෙස කතිකා කිරීමේ දී සක්‍රමේන්තු ප්‍රදානය කිරීමේ පරමාර්ථ දෙසද අප අවධානය යොමු කරලීම ඉතා වැදගත්ය.

සාන්ත සභා මාතාවගේ සාමාජිකත්වය ලබා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට අනුබද්ධ වීම තුළ අප ආත්මික වර්ධනය නංවාලන්නටද එමෙන්ම පූර්ණත්වයක් කරා යොමු වන්නටද අපට බෙහෙවින් උපකාරී වේ.

" එබැවින් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණ ව සිටින්නාක් මෙන් ඔබද සර්ව සම්පූර්ණව සිටින්න" (මතෙව් 5/48)
තවද මෙම පූර්ණත්වය නතු කර ගැනීමට නිතැතින්ම උන්වහන්සේට අප සම්බන්ධ විය යුතු ය. " පුනරුප්ජිවනයද, ජීවනයද මම වෙමි. මා අදහා ගන්නා මැරුණත් ජිවත් වන්නේය" (ජොහන් 11/25) " මම යහපත් එඬේරා වෙමි, යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේ ය " (ජොහන් 10/11)

ක්‍රිස්තු කේන්ද්‍රිය ස්වභාවය අරභයා ම මිනිස් පැවැත්ම ශුද්ධවන්ත වෙයි. මේ සඳහා ක්‍රිස්තුස් වහන්සේගේ ක්‍රියාකාරිත්වය තුළ ශුද්ධාත්ම බලය හෙවත් දේව වරප්‍රසාදයන්ගෙන් පොහොනි වන්නට විශ්වාසකයින්ට අවස්ථාව උදා වෙයි.

ක්‍රිස්තු දේහය නංවාලීමේ වගකීමට අනුබද්ධ වන්නට ද ඉඩකඩ සැලසෙන බව අප අවබෝධ කර ගත යුතු ය. තවද මෙය බෞතිස්මය තුළින් නතුකර ගන්නා කැඳවීමක් ලෙසද විස්තර කළ හැකි ය. ජීවිත පරිවර්තනයක් සඳහා ඇරයුම් කරන දේව ප්‍රසාද නිධාන කිතුතුමන් තුළ එය වඩ වඩා තහවුරු කර ගන්නට ඇරයුම් කරයි. සකේවුස්ගේ ජීවිත පරිවර්තනය, කනානීය ස්ත්‍රීය නතු වූ ජීවිත වෙනස් වීම නිදසුන් ලෙස ඉදිරිපත් කළ හැකි ය.

සකේවුස් නැගිට " ස්වාමිනි මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි, යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම්, ඔහුට සතර ගුණයක් ආපසු දෙමි ' යි ස්වාමින් වහන්සේට කීහ. (ලූක් 19/8-9) ස්ත්‍රීය තම වතුර කළය එතන තබා නුවරට ගොස් " එන්න ඇවිත් බලන්න. මා කළ සියල්ල මට කී මනුෂ්‍යයෙක් සිටියි. එතුමා ක්‍රිස්තුස් විය නොහැකි දැයි සෙනඟට කීවාය. ඔව්හු නුවරින් නික්ම ජේසුස් වහන්සේ වෙත එන්නට පටන් ගත්හ ( ජුවාම් 4 /28 - 30)

**ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මූලාරම්භක සක්‍රමේන්තුව ලෙස**

ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේගේ සක්‍රමේන්තුව ලෙස වටහා ගැනීමට තැත් කිරීමේ දී අප අවධානයට නිතැතින්ම යොමුවනුයේ නව ගිවිසුම වෙතය. නව ගිවිසුම තුළ අපට මුණ ගැසෙන උන්වහන්සේගේ වචන සහ ක්‍රියා දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ බලපරාක්‍රමය, විද්‍යාමන කරවන ප්‍රබල සංකේතයක් ලෙස අවබෝධ කර ගන්නට ආරාධනා කරයි. තවද දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය කරුණාව සහ සංරක්ෂණය විදහාපාන දෘෂ්‍යමාන සළකුණක් ලෙසට ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ව සැළකිය හැක. එමෙන්ම උන්වහන්සේගේ මුළු ජීවිතය මෙන්ම ධර්මදූත කාර්යයද දෙවියන් වහන්සේගේ ප්‍රබල ක්‍රියා තව දුරටත් විස්තර කරයි. මේ තළ ජේසුස් වහන්සේගේ සක්‍රමේන්තු පැවැත්ම කෙරෙහිද අපගේ අවධානය යොමු වීම වැදගත් කරුණකි, ( 2 කොරින්ති 4, කොලොස්සි, 1 : 1-5 , හෙබ්‍රෙව් 1:1-2, 1 ජොහන් 1 : 1)

එමෙන්ම මංගගතවීම තුළ මුළු මිනිස් වර්ගයාටම තම ස්වකීය දේව ආදරය අනාවරණය කරවීම සඳහා යොමු වූ දෙවියන් වහන්සේ මුළු මිනිස් වර්ගයා සමගම මෙලෙස තාත්වික ලෙස සම්බන්ධ වූ බව ශු. බයිබලය අපට පසක් කරයි. දෙවි මිනිස් සම්බන්ධතාවය තව තවත් ස්ථිර කිරීමට මෙන්ම සනාථ කිරීමටද මෙය සුවිශේෂ අවස්ථාවක් විය.

ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ සක්‍රමේන්තුව ලෙස අවබෝධ කර ගන්නට තව දුරටත් උත්සුක වීමේදී නව ගිවිසුම් දේව ධාර්මික ප්‍රවණතාවයන් වන " අභිරහස්‍යමය' සංකල්ප දෙසටද අප අවධානය යොමු කරවීමත් වැදගත් ය. (Mystery) ඈත අතීතයේ සිට මෙම සංකල්ප එළිදරව් නොවූ සහ අනාවරණය වන්නාවූ සත්‍යතාවයන් අරුත් ගැන්වුවද, නව ගිවිසුම තුළ මෙය තව දුටත් අභිරහසක් ව පවතින සත්‍යතාවක් නොව මුලුමනින්ම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ අනාවරණය වූ දේව ආදරය වෙත අප අවධානය යොමු කරන්නකි. (හෙබ්‍රෙව් 1 : 1 -2 ) ශු පාවුලු තුමා විසින් රචිත, එපීස සහ කොලොස්සි සංග වලට යවන ලද හසුන් මේ සඳහා කදිම නිදසුන්ය. (හොසියා 1:9-10, 2:11, 3:13, කොලොස්සි 1:20-27, 2:2). දේව ආදරය සහ බලපරාක්‍රමය තාත්වික ලෙස අනාවරණය වීම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිදු විය.

මෙලෙස නිර්වචනය කිරීමට ප්‍රවණතාවයක් තිබූ බවට සභා පියවරුන්ගේ කාල පරාසය අපට ඉඟි කරයි. සා. තෝමස් ඇක්වයිනස් නමැති මහා දේව ධර්මාචාර්යවරයා විටක ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ " මූලික ප්‍රාථමික සක්‍රමේන්තුව " ලෙස නම් කර ඇත. (Fundamental Sacrament) තවද උන්වහන්සේගේ මානුෂික ස්වභාවයය දේවත්වයේ සළකුණක් වන අතර එය ගැලවීම සඳහා මඟපාදන බවද දැක්විය.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සක්‍රමේන්තු ස්වභාවය සහ සාන්ත සභා මාතාවගේ සක්‍රමේන්තු ස්වභාවය අතර පවතින සමීප සම්බන්ධතාව දෙස අවධානය යොමු කිරීමේ දී 19 වන ශත වර්ෂයේ දී පමණ අවධානයට ලක් වූ සහා විද්‍යාවේ ප්‍රබෝධය දෙසද අප අවධානය යොමු වේ. මෙලෙස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උතුම් සක්‍රමේන්තුව" බවට ද ප්‍රචලිත වන්නට ද වන ක්‍රිස්තුන් ජේසුස් වහන්සේට " මුලාරම්භක සක්‍රමේන්තුව" ලෙසද විරුදාවලිය හිමි වූයේ 20 වන ශත වර්ෂයේදී පමණ Carl Feckes නැමැත්තාගේ දායක සහයෝගයෙනි. තවද මුළු මහත් සක්‍රමේන්තු ක්ෂේත්‍රයම උන්වහන්සේ මත පවතින බව තවදුරටත් සනාථ කළ හැක. එක් එක් දේව ප්‍රසාද නිධාන ප්‍රධානය ද මේ අඩිතාලම මත සවිමත් වන බව අප අවබෝධ කර යුතු සත්‍යතාවකි. තවද උන්වහන්සේම මූලික පදනම ලෙස අවධාරණයෙන් සිහිපත් කර ඇති අතර සුවිශේෂ කොට දේව ආදරය ගලා එන ප්‍රධාන මාවත ලෙසට ද උන්වහන්සේ පත්ව ඇති බවද සිත්හි තබා ගත යුතු ය.

එඩ්වඩ් ස්කිලබෙක්ස් යන දේව ධර්මාචාර්යවරයා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ඉදිරිපත් කර ඇත්තේ " දෙවියන් වහන්සේ හා සමඟ සම්බන්ධ වන සක්‍රමේන්තුව ලෙසටය"

ජේසුස් වහන්සේව හඳුන්වා ඇත්තේ ලෝකයේ පවතින විජයග්‍රාහි යුගාන්තවාදි දේව ආදරයේ ඓතිහාසික ව්‍යුහය තුළ ජීවමාන වැඩි සිටීම යනුවෙනි. මේ නයින් බලන කළ මිනිස් ඉතිහාසය තුළ පවතින සක්‍රමේන්තුමය මූලාරම්භය දේව වචනය ලෙසට විග්‍රහ කළ හැක. මෙයින් ගම්‍ය වනුයේ ජේසුස් වහන්සේගේ අසහාය, අද්විතීය සහ

අසමසම පැවැත්මයි. තවද උන්වහන්සේ තුළ සමන්විත වූ දේව බලපරාක්‍රමය දිස්වූ අධිකාරි බලය සම්බන්ධව යොමු කළ එක් ඉගියක් ලෙසට ද නිර්වචනය කිරීම සාධාරණය. මෙලෙස කතිකා කිරිමේ දී ක්‍රිස්තු වහන්සේ මුලාරම්භක සක්‍රමේන්තුව ලෙස පිළිගැනීම දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පවා ඉදිරිපත් කිරීමට පාදක කොට ගෙන ඇත්තේ ක්‍රිස්තු දේව ධර්මය සම්බන්ධව පැවැති මන්ත්‍රණ සභාව සහ ශු. තෝමස් ඇක්වයිනස් මහා දේව ධර්මාචාර්ය පඬිවරයාගේ දායකත්වය මත බව නොරහසකි.

**සාන්ත සභාව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මූලික, ප්‍රාථමික සක්‍රමේන්තුව ලෙස**

දෙවියන් වහන්සේගේ අපිරිමිත මැවිම සම්පූර්ණ වන විටම ශුද්ධාත්මානුභාවය තුළ මිනිස් වර්ගයාගේ පැවැත්ම යහපත් කරවීමේ ක්‍රියාවලිය නැමැති ධර්මදූතික කාර්යභාරය උත්ථාන වූ ස්වාමින් වහන්සේ ඉටු කරන සේක. මේ සෑම දෙයක්ම දෙවියන් වහන්සේගේ මහිමය අරබයා සිදුවන ක්‍රියාවලියකි.

සභාව යනු මුල් ශ්‍රාවක සංසය ලෙස හඳුන්වන ලදී. මෙම මූලික සංසයේ කැපී පෙනෙන විශේෂත්වය වන්නේ, ක්‍රිස්තු කේන්ද්‍රීයවීමයි. තවද උන්වහන්සේ මත ගොඩනැගී පවතින සේම, උන්වහන්සේ තුළම පෝෂණය වෙමින් උන්වහන්සේගේ කාර්යභාරය ඉදිරියට ගෙන යාමයි. මෙම ක්‍රිස්තු කාර්යය තම ශ්‍රාවකයන් තුළින් ක්‍රියාශීලි ලෙස ඉදිරියට දියත් කරනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම ඔස්සේ බවද කිසි විටක අමතක කළ නොහැක. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වැඩ සිටීම තාත්විකව පිළිඹිබු වන සේ මෙම සංසය ශුද්ධාත්ම බලය තුළ නව පන්නරයක් ලැබූ බවද කැපී පෙනෙන සත්‍යතාවයකි.

ශු පාවුලු තුමා එපීසි සහ පිලිප්පි යන සංසවලට යන ලද හසුන්වල සඳහන් වන පරිදි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වන සේක. මෙම අදහස නව ගිවිසුමට සුවිශේෂාකාරීව ආවේනික වන අතර සභාව ක්‍රිස්තුන් වහන්සේ මත නිරන්තරයෙන්ම යැපෙන බවද අවධාරණය කරනුයේ උන්වහන්සේ යහපත් එඬේරාණන්ද, මනාලයාද වන බැවිනි. තවද සභාවේ බලකොටුව ලෙසද අරුත් ගැන්විය හැක. ක්‍රිස්තුන් වහන්සේ සහ සභාව අතර පවතින බැඳීම උන්වහන්සේ මත ගොඩනැගෙයි. " යැපීම'' සම්බන්ධව සිහිපත් කරනු ලබයි. එමෙන්ම පවතින සමීප සම්බන්ධතාවයේ යැපීම සහ පදනම ක්‍රිස්තුන් වහනසේ බවද මනා ලෙස අනාවරණය වේ. මෙම යැපීම සැදැහැවතුනට ගැලවීම අත්පත් කර ගනු ලබන්නට නියම ධර්මදූත කාර්යයන් බවටද බෙහෙවින් ඉවහල් වේ. තවද සභාව සහ සාන්ත සභාවද මේ කාර්යය සඳහා සම්බන්ධ වනුයේ දේව වචනය ප්‍රකාශ කිරීම සහ සක්‍රමේන්තු හෙවත් දේව ප්‍රසාද නිධාන දානය කිරීම ඔස්සේ ක්‍රිස්තු කේන්ද්‍රීය ජිවිත ගත කිරීමට සැදැහැවතුන්ට ආරාධනා කරමිනි. දේව ප්‍රසාද නිධාන ඔස්සේ ගැඹුරු සමීප සහ තාත්වික ලෙස එළිදරව් වන දේව ආදරය සහ සුරක්ෂිතභාවය තවදුරටත් ඉස්මතු වෙයි.

දේව වචනයට මුල්තැන දීමට මෙන්ම දේව වචනය තුළ පන්නරයක් ලබන්නට සැදැහැවතුන් මත සාන්ත සභාව එලෙස ක්‍රියාකාරී වන්නට සවිමත් වනුයේ ක්‍රිස්තුන් වහන්සේ තුළ බව අප සිත්හි රඳවා ගැනීම වැදගත් ය. උන්වහන්සේගේ ජීවමාන වැඩ සිටීම විද්‍යාමාන වන්නට යෝග්‍ය තෝතැන්නක් මෙන්ම ක්‍රියා කිරීමේ භාග්‍යය ඇය හිමි කර ගන්නීය. එමෙන්ම, විශ්වාසි සැදැහැවත් සංඝයක් ලෙස තම වගකීම් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සඵලවත් කර ගන්නට උත්සුක වන අතර ඉතා ගැඹුරු සබඳතාවයකට ශුද්ධාත්මයාණන් වහන්සේගේ අනුහස තුළ යොමුවන්නීය.

දෙවියන් වහන්සේ හස්තයේ ඇති සළකුණක් ලෙස අති සුවිශේෂි කාර්යභාරයක ඇය නියැලි සිටින අතර සැදැහැවත් ජනතාවගේ ශුද්ධවන්තභාවය අරබයාද මහත් පරිශ්‍රමයක් ඇය දරන බවට නොරහසකි. (වර්තමාන ලෝකයේ ශු. සභාව නැමැති ව්‍යවස්ථාව ගැඹුරු ලෙස මෙය පසක් කරයි) දේව අණසක පැතිරවීමෙහිලා දායක වන සභා මාතාව නිරන්තරයෙන්ම තම දූත කාර්යය තුළ ඵල දැරීම සඳහා ශුද්ධාත්ම බලය සඳහා ද නිතරම විවෘතව සිටින්නීය. මෙය එඩ්වඩ් ස්කිලබෙක්ස් නැමැති දේව ධර්මාචාර්යවරයා ප්‍රකාශ කර ඇත. සභාවේ සක්‍රමේන්තු ස්වභාවය සම්බන්ධ විවිධ අදහස් පල වී ඇති අතර ෆිව්රාන් (1968) නැමැත්තා සභාව වන්දනා ගමනක නිරත වන බව පවසා ඇත. සාන්ත සිප්‍රියන් මුනිතුමාද සභාව " සක්‍රමෙන්ටුම් යුනිටාටිස්" යනුවෙන් හඳුන්වා ඇත.

සා. අගෝස්තිනු මුනිතුමාද සභාව හඳුන්වා ඇත්තේ මහත් ගැලවීමේ ක්‍රියාදාමයට ඍජු ලෙසම සම්බන්ධ වන ඒකකයක් ලෙසිනි. දෙවන වතිකාන කතිකාවද මේ හා සම්බන්ධ අදහස් ගෙනහැර දක්වා ඇත. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ශු. සභාව සහ එක් එක් සක්‍රමේන්තු සම්බන්ධව අවධානය යොමු කර ඇත. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මුලාරම්භක සක්‍රමේන්තුව ලෙස සලකන්නේ නම් සභාව උතුම් සක්‍රමේන්තුව ලෙස සැලකිය හැක. මුලාරම්භ සක්‍රමේන්තු යන නාමය ප්‍රථමයෙන්ම දායද වී ඇත්තේ ඔත්තෝ සෙමෙල්රොත් සහ කාල් රානර් යන දේව ධර්මාචාර්යවරුන් වෙතිනි. එනමුත් යම් අපහැදිලි තත්වයක් මෙහි සඳහන්ව ඇත. මුලාරම්භක සක්‍රමේන්තුව ලෙස සභාව හැඳින්වීමේ දී Root Sacrament යන නාමය ඔත්තෝ සෙමෙල්රොන්ද (Fundamental Sacrament) යන න්‍යාය කාල් රානර් ද පවසා ඇත.

සභාව ක්‍රිස්තුන් වහන්සේ වෙතින් නික්මෙන අතර නැවත උන්වහන්සේ වෙතටම යොමු වන බව සත්‍යතාවයකි. තවද ඒ ඔස්සේ මුළු මිනිස් සංහතිය සඳහා ද දායද වී ඇති ආදරය සේවයේ සලකුණක් බවට සභාව පත් වී ඇත. බාහිර ලෙස විද්‍යාමාන වන පද්ධතියක් ලෙස පැවතුනද ආධ්‍යාත්මික පන්නරයකින් හෙබි බවද දනිමු. තව දුරටත් දේව වචනයේ දූත සේවය සඳහා යොමු වන ශු. සභා මාතාව ඒ ඔස්සේ ක්‍රිස්තුන් වහන්සේ ගේ දූත කාර්යය සඳහා ඍජු ලෙසම සම්බන්ධ වන බව පැහැදිලියට. දෙවියන් වහන්සේගේ පීතෘක සෙනෙහස තුළ ඇගේ පව්කාරි ස්වරූපය නොසලකා

ගැලවීමේ කාර්යභාරය සඳහා සම්බන්ධ කරන සේක. මෙය දෙවියන් වහන්සේ දායාද කර ඇති මාර්ගයකි. මෙය සියලු දෙනාගේම ගැලවීම සඳහා බව අපට පසක් කර දෙයි.

දෙවියන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාදාමයේ කර්තෘ ලෙස පෙනී සිටිමෙන් එය පරිපූර්ණ කරන තැන්වහන්සේ ඒ යුගයෙන් යුගයට සම්බන්ධ කරනුයේ තමන් වහන්සේ ඉතිහාසය තුළ සන්නිවේදනය කරවමින් ය.

මාංශගතවීම අභිරහස තුළ දිව්‍යමය සන්නිවේදනය ඉතා ගැඹුරු මානුෂික මුහුණු වරක් ඇති කළ සේක. සභාව සහ එක් එක් සක්‍රමේන්තුව පිටස්තර සිටින දෙවියන් වහන්සේගේ ඖෂධීය මැදිහත් වීමක නොව මිනිස් ඓතිහාසික ව්‍යුහය තුළ උන්වහන්සේගේ අසීමිත ආදරය විද්‍යාමාන කිරීමකි. මෙයින් උන්වහන්සේ සතුව පවතින ජීවමාන ස්වභාවය පිළිබිඹු වේ.

**9.2.2 ප්‍රසාද ස්නාපනීය කැඳවීම.**

**ක්‍රිස්තුන් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය**

ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේම බෞතිස්ම ස්නාපනය ලබා ගත් බව අපට පැහැදිළිව දක්නට ලැබේ. ජේසුස් වහන්සේගේ බෞතිස්මය පිළිබඳව විස්තරාත්මකව සමදර්ශක සුවිශේෂයන් තුළින් අපට මුණ ගැසේ. (මතෙව් 3:13 -17)

"එසමයෙහි ජේසුස් වහන්සේ ගලීලයෙහි නාසරෙත්හි සිට වැඩම කර ජොහන් විසින් ජොර්දාන් ගඟෙහි බෞතිස්ම ස්නාපනය කරනු ලැබූ සේක. උන්වහන්සේ දියෙන් ගොඩ නැගෙත්ම ස්වර්ගය විවර වී ආත්මයාණන් වහන්සේ පරවියෙකු මෙන් තමන් පිට බැස එනු දුටු සේක. තවද ස්වර්ගයෙන් නික්මුණු හඬක් ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමියි පැවසීය" (මාක් 1:9- 11)

"තවද මුළු සෙනඟ බෞතිස්ම ස්නාපනය ලැබූ විට ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපන ලබා යාච්ඤා කරමින් සිටියදී ස්වර්ගය විවර වී ශුද්ධාත්මයාණෝ පරවියෙකුගේ රූපාකාරයෙන් උන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක. එවිට ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය, ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි" යි අහසින් හඬක් නික්මිණි. (ලූක් 3 :21-22)

සතරවන සුවිශේෂකවරයා මෙම සිද්ධිය පිළිබඳ සඳහන් නොකළද එය අනියම් ලෙස අවබෝධ කරවයි. " මම උන්වහන්සේ නොහැඳින සිටියෙමි: එහෙත්, වතුරෙන් බෞතිස්ම ස්නාපනය කරමින්, මා පැමිණියේ උන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට ප්‍රකාශ වන පිණිසය" යි

කීය. තවද ජොහන් සාක්ෂි දරමින් ආත්මයාණන් පරෙවියෙකු මෙන් අහසින් බැස උන්වහන්සේ මත වැඩ හිඳුනු මම දිටිමි" (ජුවම් 1:31-32)

මාක් 1:9-11 මෙම ඡේදයේ වාර්තා කර ඇත්තේ ජේසුස් වහන්සේ ජොර්දාන් නදියේ ජොහන් විසින් බෞතිස්ම කරනු ලැබූ සිද්ධියයි. මෙම අවස්ථාවේදී ස්වර්ගයෙන් නික්මුණු " ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය" යන හඬ ශබ්දය මගින් ක්‍රිස්තුන් වහන්සේගේ කැඳවීම ප්‍රකාශ කරනු ලබයි.

ක්‍රිස්තුන් වහන්සේගේ මෙම කැඳවීම පිළිබඳ වචන උච්චාරණය කරනු ලබන්නේ පැරණි ගිවිසුමේ භාෂාවෙනි . මෙම වචනවලින් අපට දෙනු ලබන අදහස කුමක් ද? " ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය." (ගිතාවලිය2:7) මම මේ දේව නියෝගය ප්‍රකාශ කරන්නෙමි. එතුමාණෝ මට කථා කොට,' "නුඹ මාගේ පුත් කුමරුය, අද මම ඔබේ පිය රජු වුයෙමි." " ඔබ කෙරෙහි මම ඉතා ප්‍රසන්න වෙමි" මා සහාය දෙන මාගේ සේවකයා මෙන්න. මට ප්‍රිය වූ මාගේ තෝරා ගත් තැනැත්තා මෙන්න. මාගේ ආත්මානුභාවය මා එතුමාට ප්‍රදානය කර ඇත. සියලු ජාතීන්ට එතුමා යුක්තිය ගෙන දෙනු ඇත." (යෙසායා 42:1) කැඳවීම ප්‍රකාශ කිරීම සඳහා (ගීතාවලිය 2:3) " අප හිර කර ඇති විලංගු බිඳ දමමින් යදම් කඩා දමමින් " අපි නිදහස ලබමු" යි ඔවුහු පවසන්නෝය. දෙවියන් වහන්සේ සම්බන්ධ කර ගනු ලැබුයේ මන්ද ? ගිතාවලිය අංක 2 වනාහි අභිෂේක කිරීමේ ගීතයකි. (එය රාජකීය ගීතයකි) ඇතැම් විට රජෙකු අභිෂේක කිරීමේ දී ගායනා කෙරේ. නාසරෙත්හි ජේසුස් වහන්සේ පැරණි ඉශ්‍රායෙල් රජුන් වැනි රජකු නොවන බව දෙවියන් වහන්සේ ප්‍රකාශ කරන සේක. සේවක රජ කෙනකු නොහොත් දුක් විඳින රජ කෙනෙකු වන බව උන්වහන්සේ පවසන සේක. " ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය..... "යන්න සහ දුක් විඳින සේවකයා හි අඩංගු මම ඔබ කෙරෙහි ප්‍රසන්න වෙමි" යන කොටසෙහි සම්බන්ධතාවයට හේතුව මෙය වේ.

ජේසුස් වහන්සේ බව්තිස්මය ලැබීමත් සමගම උන්වහන්සේ පසුපස පරීක්ෂාවන් හඹා එන්නට විය. අනිකුත් සුවිශේෂයන්ගේ දැක්වෙන පරිදි ජේසුස් වහන්සේගේ බලය භාවිත කරමින් ගල් ගෙඩි පාන් බවට පත් කිරීමටද, ස්වර්ගීය දූතයන්ගේ සහාය ලබා ගනිමින් මහිමතාවයට පැමිණීම හා වස්තු සම්පත් ඉදිරියේ දණ නැවීමටද සාතන්ට අවශ්‍ය වූ බව අපි දනිමු. වස්තු සම්පත් බලය හා මහිමතාවය යනු රජෙකුට අයත් ලක්ෂණයන් වේ. මේවායින් රජකුගේ අනන්‍යතාවය ප්‍රකාශ කරනු ලබයි. මේ අයුරින් බලය, වස්තුව හා මහිමතාවය තුළින් රජකම් කළ ඉශ්‍රායෙල් රජවරුන් වැනි රජකු වන්නට ජේසුස් වහන්සේද පරීක්ෂාවට ලක්වූ බව අපට සිතිය හැකිය. නමුත් ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ බෞතිස්මය කැඳවීම වූ සේවක රජකු වීමේ කැඳවීමට විශ්වාසවන්ත වීම තුළින් එවැනි රාජකියත්වයක් ප්‍රතික්ෂේප කළ සේක.

" එසමයෙහි ජේසුස් වහන්සේ ගලීලයෙහි නාසරෙත්හි සිට වැඩම කර ජොහන් විසින් ජෝර්දාන් ගඟෙහි බෞතිස්ම ස්නාපනය කරනු ලැබූ සේක. උන්වහන්සේ දියෙන් ගොඩ නැගෙත්ම ස්වරගය විවර වි ආත්මයාණන් වහන්සේ පරවියකු මෙන් තමන් පිට බැස එනු දුටු සේක. තවද ස්වර්ගයෙන් නික්මුණ් හඬක් , " ඔබ මාගේ ප්‍රියාදර

පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි" යි පැවසීය" (මාක් 1:9-11) සෙබදිගේ පුත් ජාකොබ්ද, ජොහන්ද උන්වහන්සේ වෙත අවුත් " ගුරු දේවයෙනි. අප ඉල්ලන දේ ඔබ අපට දෙන සේක් නම් අපි කැමැත්තෙමුයි" කීහ. මා ඔබට කුමක් කර දෙනවාට ඔබ කැමැත්තහුදැයි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. " ඔබගේ තේජශ්‍රීයේදී, අපෙන් එක් කෙනෙකුට ඔබගේ දකුණු පසද එක්කෙනෙකුට වම් පසද හිඳ ගන්නට වර දුන මැනවැයි" ඔවුහු උන්වහන්සේට කීහ. එහෙත් ජේසුස් වහන්සේ " ඔබ ඉල්ලන්නේ කුමක් දැයි ඔබම නොදන්නහුය. මා බොන දුක් වේදනා නමැති කුසලානෙන් බොන්න හෝ මා ලබන බව්තිස්ම ස්නාපනය ලබන්නට හෝ ඔබට හැකි දැ යි ඔවුන්ගෙන් ඇසූ සේක. අපට හැකි යැයි ඔවුහු උන්වහන්සේට කීහ. ජේසුස් වහන්සේද මා බොන කුසලානෙන් ඔබත් බොනු ඇත. මා ලබන බව්තිස්ම ස්නාපනයෙන් ඔබත් බව්තිස්ම ස්නාපනය ලබනු ඇත. එහෙත් මාගේ දකුණු පසද, වම් පසද ඉඳගන්න දීම මා සතු දෙයක් නොවේ. යම් අය සඳහා එය නියමකර ඇත්ද, එය අයිතිවන්නේ ඔවුන්ට යැයි වදාළ සේක. එවිට අනිත් දසදෙනා ඒ අසා ජාකොබ් සහ ජොහන් සමග අතිශයින් කෝප වූහ. ජේසුස් වහන්සේ ඔවුන් තමන් වෙතට කැඳවා මෙසේ වදාළ සේක. විජාතීන් අතර ආණ්ඩුකාරයන් වශයෙන් වූවන් ඔවුන් කෙරෙහි ආධිපත්‍ය පවත්වන බවත්, ඔවුන්ගේ ප්‍රධානීන් ඔවුන් කෙරෙහි බලය පාන බවත් ඔබ දන්නාහුය. එහෙත් ඔබ අතර එසේ නොවේ ඔබ අතර ප්‍රධානියා වන්න කැමති යමෙක් ඇත්ද ඔහු ඔබේ සේවකයා විය යුතු ය." (මාක් 10:35-43)

කිතුනු අනන්‍යතාව ගැන සිතා බැලීමේ දි " බව්තිස්ම කැඳවීම' වෙත අවධානය යොමු නොකරන්නේ නම් වැරදි සහගතය. කිතුනු දිවියේ බීජය බව්තිස්මයය විකාශනය වන්නාවූ ද ශක්තිමත් වන්නාවූ ද කිතුනු අනන්‍යතාවය මුළුමනින්ම පදනම් වනුයේ මෙහිදී බව අපි දනිමු. එම නිසා බෞතිස්මයේ කැඳවීමට සාක්ෂි දැරීම සඳහා ගනු ලබන අවංක ප්‍රයත්නයද ආදර දෙවි පියාණන් වහන්සේ අබියස ප්‍රසන්න වනු ඇත. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට වඩා අනුරූපි වන්නට අප තුළ ඇති ජ්වලිතභාවය සවිමත් වනුයේ අන් අය සමඟ අප ඇති කරන්නාවු " ආදර - සබැඳියාව" මත බව අමතක නොකළ යුතුයි. බෞතිස්ම කැඳවීම මත පූජක, එඬේරික සහ දිවැසිවර කාර්යයන් අප ජිවත් වන පරිසරය තුළ ජිවත් කරවීම අරබයා උත්සුක වීම අපගේ ප්‍රධානතම වගකීමයි.

## කිතුනු අපගේ පූජක කාර්යභාරය

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියේ කතුවරයා ක්‍රිස්තුන් වහන්සේගේ පූජක කාර්යය ගැන අපට මතක කරනු ලබයි. පූජක පැලැන්තියෙන් නොපැමිණියද ඔවුන් වහන්සේ පූජකයෙකු බව සනාථ කරයි. පූජකයා යනු මැදිහත්කරුවකි. දෙවි- මිනිස් සබඳතාවයේ අසහාය මධ්‍යස්ථභාවය ඔවුන් වහන්සේගේ ධර්මදූත කාර්යය තුළ කැපී පෙනෙන්නකි. අප ජිවිත තුළද මෙම මධ්‍යස්ථභාවය ජිවත් කරවීමට උත්සුක විය යුත්තෙමු. එමෙන්ම අභිවෘද්ධි ආලේපය ඔස්සේ ප්‍රසාද ස්නාපනය දායාද කරන " පූජක කැඳවීම" එලදැරිය යුතුය.

සමාජය තුළ දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර මැදිහත්කරුවන් වන්නට උත්සාහ කිරිම අප සතු ප්‍රධාන වගකීමකි. මෙය සාක්ෂි දැරීමේ වගකීමක් ලෙස සැලකිය හැකි ය.

**කිතුනු අපගේ එඬේරික කාර්යභාරය (රාජකීය)**

මෙය හුදෙක් ශ්‍රාවකත්වය මත (රාජකීය) පදනම් වූ දූත මෙහෙවරකි. " කුමක් හෙයින්ද මනුෂ්‍ය පුත්‍රයාණන් වුවද වැඩියේ සේවය ලැබීමට නොව සේවය කිරීමටය. බොහෝ දෙනාගේ මිදීම පිණිස සිය දිවි පිදීමටය." (මාක් 10/45) කිතුනුවන් ලෙස අපට හිමිව ඇති නායකත්වය අත්දැකීම සඳහා ලැබෙන ඇරයුමක් ලෙස සැලකිය හැකිය. " කිතුනු නායකත්වය" යන්න නියම ලෙස වටහා ගත යුතුව ඇත. මෙය ලෞකික වටිනාකම් සමග පටලවා ගැනීම අඥාන ක්‍රියාවකි. තම නමට පිටුපසින් අකුරු කීපයක් දමා ගැනීම නායකත්වය නොවේ. තවද ඒකාධිකාරි ක්‍රියාමාර්ගයකට පිවිසීම ද නායකත්වය නොවන බව සිත්හි තබා ගත යුතුය. ජොහන් තුමාගේ සුබාරංචියේ දස වන පරිච්ඡේදය ආශ්‍රිතව මෙය වටහා ගැනීමට යත්න දැරීම කාලෝචිතය. නියම නායකත්වය කුමක්දැයි ස්වාමින් වහන්සේගේ අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේදී අපට තව දුරටත් වටහා ගැනීමට ඇරයුමක් ලැබේ.

**කිතුනු අපගේ දිවැසිවර කාර්යභාරය**

දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන පුද්ගලයා දිවැසිවරයෙකි. සමිඳාණන් වහන්සේගෙන් ජෙරමියා වෙත පැමිණ පණිවුඩය මෙසේය. "නව ගිවිසුමේ නියමයන්ට කන් දෙන්න. ජුදාහි මිනිසුන්ට ජෙරුසලමෙහි වැසියන්ට කතා කරන්න." (ජෙරමියා 11/1-2)

" උශ්ශීයා, ජෝතාම්, ආහාස් සහ හෙසකියා පිළිවෙලින් ජුදාහි රජවරුන්ව සිටි කාලයේ දී ද, ජෝසුවාස්ගේ පුත් ජෙරොබෝවම් ඉශ්‍රායෙල් රජව සිටි කාලයේ දී ද බෙයේරිගේ පුත් හොසියාට සමිඳාණන් වහනසේ දුන් පණිවුඩය මෙසේ ය. සමිඳාණන් වහන්සේ හොසියා මගින් පළමු වරට ඉශ්‍රායෙල් සෙනඟට කථා කළ විට මෙසේ වදාළ සේක. " නුඹ ගොස් වෙසඟනක විවාහ කර ගෙන ඇගේ වෛශ්‍යාකමින් දරු එල ලබා ගන්න. මන්ද මේ රට සමිඳාණන්ගෙන් වෙන් වී යාමෙන් වෙසඟනකට සමාන වී ඇත. එවිට හොසියා ගොස් දිබ්ලයිම්ගේ දුව වු ගෝමෙර් සරණ පවා ගත්තේය. ඈ ඔහුට දාව ගැබ් ගෙන දරුවකු ලැබුවාය" (හොසියා 1:1-3)

දෙවියන් වහන්සේගේ පණිවුඩය රැගෙන යාම මෙම පසුතලයේ කේන්ද්‍රයයි. පුරාණ ගිවිසුම විශ්ලේෂණය කිරීමේදී " පණිවුඩය" සහ " ප්‍රකාශ කරන්නා" දෙදෙනෙකු ලෙස පැහැදිලි වන නමුත් ක්‍රිස්තුන් වහන්සේ තුළ මෙය පූර්ණත්වය කරා යොමු විය. හුදෙක් පණිවුඩය මෙන්ම ප්‍රකාශ කරන්නාද ඔවුන් වහන්සේම විය. මෙය සුවිශේෂ වු තත්වයකි.

අපිදු සත්‍යයට සාක්ෂි දරන්නේ නම් යුක්තිය වෙනුවෙන් සාපිපාස වන්නේ නම්, සාධාරණය අරබයා ක්‍රියා කරන්නේ නම් දෙවියන් වහන්සේගේ වචනයේ මෙවලම් බවට පත් වෙමු.

කිතුනු අනන්‍යතාව පරිණත වන්නට නම් මෙම වගකීම් නිසි ලෙස ඉටු කරලීම අත්‍යවශ්‍යයයි. බව්තිස්මය ඔස්සේ අපට දායාද වන පූජක කාර්යය අන් අය වෙනුවෙන් යාච්ඤා කිරීම තුළ අත්දැකිය හැකි බව ගම්‍ය වන කරුණකි. අපට යාච්ඤාව ඔස්සේ දෙවි පියාණන් සමඟ සම්බන්ධ වීමේ දී නිරන්තරයෙන්ම අන් අයවද සිහිපත් කර ඔවුන් වෙනුවෙන් ද දේව ආශිර්වාදය ඉල්ලා සිටීම වැදගත් වේ.

අභිවෘද්ධි ආලේපය නැමැති දේව ප්‍රසාද නිධානය මාර්ගයෙන් මේ අයුරින් කටයුතු කිරීම සඳහා අපව සුදතුම් වරමින් පොහොනි කරන බව විශ්වාසයෙන් යුතුව පිළි ගනිමු. අධික ලෙස කාර්යය බහුලව පවතින වත්මන් සමාජ ව්‍යුහයන් තුල ජීවත්වන අපට මෙය අනගි අත්දැකීමක් වනු ඇත. ආත්මාර්ථකාමි ගතිගුණ තුළ මංමුලා වී සිටින අපට සමහර විට මෙය කළ නොහැකි මෙන්ම නො සිතිය නොහැකි සෘණාත්මක අභියෝගයක් වනු ඇත.

දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කිරීමට, ක්‍රියා කිරීමට අපට අවස්ථාවක් උදා නොවන්නේ ද යන්න අපම අපගෙන් අසා දැන ගත යුතුය. මෙවැනි අවස්ථාවක් තුළදී අප පෞද්ගලික ලාභය ඉස්මතු වීම අරබයා දෙවියන් වහන්සේව සුළු මොහොතකට හෝ අමතක කරන්නට අප පෙළඹෙන්නේ නැද්ද යන්න ද ඇසිය යුතු ප්‍රශ්නයකි.

මෙවැනි ප්‍රශ්න හමුවේ අප අභියස පවතින දිවැසිවර කාර්යය ක්‍රමානුකුලව ඔප් නැංවන බව සිතේ තබා ගැනීම වැදගත් ය.
"නායකයා - සේවකයා" සංකල්පය නායකත්වය සේවය ලබන්නට නොව සේවය කිරීම සඳහා ය. අසිසීයේ සාන්ත ප්‍රැන්සිස් මුනිතුමාගේ ජීවිතාදර්ශය මෙය අපට වඩ වඩා තහවුරු කරවන කරුණකි. " ආදරය සහ පරිත්‍යාගය" මත ගොඩ නැගුණු සේවයේ මෙවලමක් බවට සෑම කිතුනු ජීවිතයක්ම පරිවර්තනය විය යුතුය. ඒ ඔස්සේ බව්තිස්ම කැඳවීමක් වන එඬේරික කාර්යභාරය ඉටුවන බව අපි දනිමු.

" මන්ද ජොහන් වතුරෙන් බව්තිස්ම ස්නාපනය කළේ ය. එහෙත් මින් නොබෝ දවසකින් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් බෞතිස්ම ස්නාපනය කරනු ලබන්නේ ය" යි වදාළ සේක (ක්‍රියා 1/5) ශුද්ධූ ලියැවිල්ල අපට අවධාරණයෙන් සිහිපත් කරනුයේ ද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නිසා ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ අප ලබන පන්නරයයි. ශක්තියයි. කිතුනු අපගේ අනන්‍යතාව නියාමාකාර ලෙස ඔප්නැංවෙන්නේද, ශුද්ධාත්මයාණන් වහන්සේ තුළය. එම නිසා ශුද්ධාත්ම බලය දෝවනය වීම අරබයා අප තුල විවෘත භාවයක් " මෙසේ අයහපත් වූ ඔබ, ඔබේ දරුවන්ට යහපත් දේ

දෙන්නට දන්නාහු නම්, ඊට කොපමණ වැඩියෙන් ඔබේ ස්වර්ගිය පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මයාණන් නොදෙන සේක්ද?" (ලුක් 11/13) තිබීම අතිශයින්ම වැදගත් ය. එමෙන්ම, ශුද්ධාත්මයාණන් වහන්සේට විරුද්ධව ක්‍රියා කිරීම අපට විනාශයකට යොමු කරනු ලබයි (ලුක් 12/8-12)

මෙහි නිගමනය ලෙස අපට වටහා ගත හැකි වනුයේ කිතුනු අනන්‍යතාව යනු " ප්‍රේමයේ - බැඳියාව" සඳහා දමනු ලබන සවිමත් අඩිතාලමක් ලෙසටය.

### 9.2.3 ස්වාමින් වහන්සේගේ යාගික බොදුන සහ සහජීවනය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වටා අප එක් රැස් වන විට

" රැගෙන වළඳන්න , මේ මාගේ ශරීරයයි ... ඔබ සියල්ලන්ම මෙයින් ගෙන පානය කරන්න. මෙය . . . . ගිවිසුම් රුධිරයවේ" (මතෙව් 26:26-29) " මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න" (ලූක් 22:19 1 කොරින්ති 11:23-25)

දිව්‍ය සත්ප්‍රසාදය කෙන්ද්‍රීය වන්දනා පිළිවෙත් පදනම වන්නේ මෙම අභිරහස්‍යමය ශ්‍රී වදන් පෙළයි. කිතු සමිඳාණන් වටා එක් රැස් වූ ශ්‍රාවක සංඝය නව මං පෙත් ගැන්වූ භෝජන පිළිවෙතේ නව සම්ප්‍රදායක් ඇති කළ මෙම කාරුණික බලවත් නියෝගය කතෝලික සාන්ත සභාව තුළ පමණක් නොව වෙනත් කිතුනු සභාවන් තුළද අද නොකඩවා ක්‍රියාත්මක වේ
" මම ද කල්පාන්තය දක්වා සදහටම ඔබ හා සමඟ සිටිමි" (මතෙව් 28:20)

ක්‍රිස්තුන් වහනසේගේ මෙම ප්‍රතිඥාවත් ඉහත නියෝගයත් ඒකාබද්ධ වන මහා අභිරහස්‍යමය සක්‍රමේන්තුව දිව්‍ය සත්ප්‍රසාදයයි. ඔවුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කරනු ලැබූ ශ්‍රාවකයන් වටා ගොඩනැගුණු ජෙරුසලෙමෙ හි මූලික කිතුනු සංඝය තුළ මෙය සාම්ප්‍රදායික පිළිවෙතක් විය. " ඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද සහභාගිකමෙහි ද පුප කැඩීමෙහි ද යාච්ඤාවෙහිද නිරතව කල් ගත කළහ. (ක්‍රියා 2:42)

ජනවන්දනාව තුළ දිව්‍ය සත්ප්‍රසාද වන්දනාත්මක මෙහෙය හැඳින්වූයේ "පුප කැඩීම' යනුවෙනි ගෙයින් ගෙට යමින් පුප කඩමින්ද තමන් අතරේ ප්‍රිතියෙනුත් ත්‍යාගිවන්ත සිතිනුත් ආහාර බෙදා ගනිමින්ද ...." (ක්‍රියා 2:46) මූලික ක්‍රිස්තියානි සංඝයේ දිව්‍ය සත්ප්‍රාසාදය කේන්ද්‍ර කර ගත් මූලික අරමුණ වූයේ දේව ප්‍රශංසාවත් ඒ හා සම්බන්ධ වන සහෝදර ප්‍රේමයත් ය. සංඝයේ හදවත හා කේන්ද්‍රය වූයේ ද මෙයයි. මේ අනුව පුප කැඩීම ශ්‍රේෂ්ඨතම ක්‍රිස්තු ආඥාව ක්‍රියාවට නැංවීමක් විය. " නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කරන්න. නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල් වැසියාටත් ප්‍රේම කරන්න." (මතෙව් 22:36 - 40)

මුල් කිතුනු සභාව අනුවද සාන්ත සභාවද දිව්‍ය යාගය තුළ උත්තම දේව වන්දනාව පවත්වමින් අන්තිම රාත්‍රි භෝජන පිළිවෙතට හවුල් වන්නට තම දේව ජනතාව කැඳවන්නීය. මෙයට අරථවත්ව සහභාගි වීම සඳහා දිව්‍ය සත්ප්‍රසාදිය ඇදැහිල්ල තහවුරු කර ගැනීම වැදගත් වේ.

### පැරණි ගිවිසුම තුළ දේව ජනතාව

මිසරයේ වහල් බවින් මුදාගත් රතු මුහුදින් එතෙර කරනු ලැබූ ජනතාව සීනායි කන්ද පාමුල දී දේව ජනතාවක් බවට පත් වූහ. "නුඹලා මට පූජක රාජ්‍යයක් ද කැපවූ ජාතියක් ද වන්නහුය" (නික්මයාම 19:8) මෙය ද්විපාර්ශ්වික ගිවිසුමක් විය. මෙම ගිවිසුමට අනුව ස්වාමීන් වහන්සේ ඔවුන් " මන්නා" බොදුනෙන් පෝෂණය කරමින් ද විවිධාකාර විපතින් ආරක්ෂා කර ගනිමින් ද රතු මුහුදින් එතෙර කර ඔවුන්ට මඟ පෙන්වමින් ද ආබ්‍රහම්ට පොරොන්දු වූ දේශය කරා ගෙන ගිය සේක. මෙසියාන සංකල්පය තුළ වරින් වර දිවැසිවරුන් මඟින් ගැලවීමේ අපේක්ෂාවන් පණගන්වමින් ඔවුන් ශක්තිමත් කළ සේක. ජනතාවද දස පණත පිළිපදිමින් , යාග පූජාවන් පවත්වමින්, විපතේදී කන්නලව් කරමින් සහ විටක මැසිවිලි කියමින් හා කොඳුරමින් ද ස්වාමීන් වහනසේ වටා එක්රොක් වී සිටියහ. මෙම එතෙර වීම සිහිපත් කරමින් පාස්තු මංගල බොදුන් මේසය වටා වසරක් පාසා මෙම දේව ජනතාව එක්රැස් වූහ.

### නව ගිවිසුම තුළ දේව ජනතාව

ගිවිසුම් ජනතාවක් වශයෙන් එතෙර වීමේ මංගල්‍යය සැමරූ ජුදා ජනතාවගේ යාගික බොදුන වූයේ කුළුදුල්, පිරිසිදු බැටළු පැටවෙකි. ජොහන් සුවිශේෂයට අනුව, නිසාම් මස 13 වන දින එනම් නුමුහුන් පුප මංගල්‍යයේ පළමුවන දින ජේසුස් වහන්සේ ද තම ශ්‍රාවකයන් සමඟ ජෙරුසලමට පැමිණි පාස්කු යාගයට සූදානම් වීම සඳහා උඩුමහලට රැස් වූ සේක. ඔවුන් එම රාත්‍රියේ බොදුන් මේසය වටා රක්රුස් වූයේ රොටි අනුභව කර මිදි රස පානය කිරීමටයි. ජේසුස් වහන්සේ තම කණ්ඩායමේ ප්‍රධානියා ලෙස රොටි කඩා බෙදා හදා වැළඳීම එදින සිදු විය. නමුත් , වෙනදා අයුරින් නොවේ. තමන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරය ශ්‍රී ලෙසටයි.

දිව්‍ය පුජාව ගැන සාකච්ඡා කිරීමේ දී වෙනස් කළ නොහැකි සත්‍යතාවයන් කිහිපයක් ඇති බව සිත්හි තබා ගත යුතු ය. දිව්‍ය පූජාවේ භාවිත කරන පූප හා මිදියුෂ වෙනුවට වෙන කිසිම විකල්පයක් යොදාගත් නොහැක. තවද මිදිරස ස්වභාවික විය යුතු බවත් කිසිම දෙයක් මිශ්‍ර නොකළ යුතු බවත් අපි දනිමු.

දිව්‍ය පුජාව භෝජනයක් ලෙසද වටහා ගත හැකි බව අපි දනිමු. ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය මෙහි දී ඉතාමත් වැදගත් බව පිළිබිඹු වී ඇත. ඇතැම් විට සැදැහැවත් ජනතාව අතර මේ සම්බන්ධයෙන් විවිධ මත භේදයන් පවතින බව ද නොරහසකි. මුළුමනින්ම පුජාවට සහභාගි නොවී දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට පෙළෙඹෙන

අයද සිටින අතර සත්ප්‍රසාද වහන්සේ ලබා නොගත්තොත් එය මදිකමක් ලෙස කල්පනා කරන අයද සිටියි. මෙහිදී දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩ සිටින ජීවමාන ජේසුසමිදාන්ව ලබා ගැනීමේදී අත්පත් වන ආධ්‍යාත්මික පන්නරය ඔවුන් නොසලකයි. ආධ්‍යාත්මික පන්නරය ලැබිය යුත්තේ පූජාවට පෙරාතුව මෙන්ම පූජාව අවස්ථාවේදී ද නිසි ලෙස සූදානම් වීමෙනි. තවද මේ සම්බන්ධයෙන් ව්‍යවස්ථාව මෙසේ පවසයි. " බව්තිස්මය ලද කිතුනුවනට දණගසා හෝ සිට ගනිමින් ජේසුව ලබා ගැනීමට අවස්ථාව ඇත. තවද තම සුරතට දිව්‍ය සත්ප්‍රදාද වහන්සේ ඉතාමත් භක්තියෙන් ලබා ගත හැක.

කිතුනුවන් ලෙස අපට අසීමිත දේව ආදරය තුළ දායාද වී ඇති සෑම දෙයක් වෙනුවෙන්ම තුති පුදන්නට ඇති ප්‍රධානතම මාර්ගය ලෙස දිව්‍ය සත්ප්‍රසාදය හැඳින්විය හැක. එමෙන්ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ප්‍රබල ලෙස ජීවමාන වන බව අපි දනිමු. මේ නිසාම ජනතාව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වටා එක් රොක් වෙයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ භෝජනයක් ලෙස පැවැත්වූ අවස්ථාවන් ඉතිහාසය අපට මතක් කර දෙයි.

"මිදියාතෝර් දේයි" (දෙවියන් වහන්සේගේ මාස්ටකයාණෝ ) නැමැති විශ්ව ලේඛනය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට කරන ලද වන්දනාචාර්යයන් මෙන්ම එයට සම්බන්ධව පවතින විවිධ භක්ති අභ්‍යාසයන් දෙස අප අවධානය යොමු කරයි. තවද, රෝගී අය ගැන මෙන්ම මරණ මොහොතට පත්ව ඇති අය කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කරනුයේ ඒ අය සඳහා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ පෝෂණය සහ පන්නරය ලබා දීම තුළිනි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සත්ප්‍රසාද නිවහනේ තැන්පත් කර තැබීමේ මූලික අදහස වූයේ මෙය විය. පසුව එය ජනතාවගේ වන්දනාවට, ගෞරවයට සහ ප්‍රශංසාවට ලක් විය.

ස්වර්ගස්ථ වූ දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් 2003 වසරේ අප්‍රේල් මස 17 වන දින නිකුත් කරන ලද විශ්ව ලේඛනය වන " දිව්‍ය සත්ප්‍රසාදයේ සාන්ත සභාව" (එක්ලේසියා දි එයුකරිස්තියා) ට අනුව දිව්‍ය සත්ප්‍රසාදය ඉතා උත්කෘෂ්ඨ වනුයේ ශුද්ධ වූ සභාව ශුද්ධවත් කරන ප්‍රධාන මාර්ගය නිසාය. එමෙන්ම එහි යැපීමද එහි පැවැත්ම මෙන්ම වර්ධනයද කිතුනුවන්ගේ ප්‍රබල වැඩ සිටීම ක්‍රමානුකූලව අනාවරණය වන බවද මෙම අනාවරණයේ මුදුන්මලකඩ වන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගැනද ඉමහත් භක්ති ආදරයෙන් යුක්තව කථා කරයි.

" මිස්ටේරියුම් ෆිදෙයි" (විශ්වාසයේ අභිරහස) නැමැති විශ්ව ලේඛනය දිව්‍ය පූජාව කිතුනු ජීවිතයේ කේන්ද්‍රීය තත්ත්වය ගැන සාකච්ඡා කරන අතර එම ලේඛනය සුවිශේෂාකාරයෙන් සත්ප්‍රසාදීය අභිරහස අප සහභාගී වන ජන වන්දනාවේ හදවත බවට සනාථ කරයි. අප විශ්වාසය තුළ දෙවියන් වහන්සේට වන්දනා කරන්නට ඇති ප්‍රධානතම සහ වැදගත්ම මාර්ගය දිව්‍ය පූජාවයි. ජනවන්දනාව සම්බන්ධ

ව්‍යවස්ථාවේ අංක 10 ද මීට තවදුරටත් සාක්ෂි දරයි. "දිව්‍ය සත්ප්‍රසාදයේ විශ්වාසිකයෝ ක්‍රිස්තුන් වහන්සේ වෙත බලවත් ප්‍රේමයකින් ඇදෙති. ඒ ප්‍රේම ගින්නෙන් ඇවිලෙති. එබැවින් දේව ජනතාව ජන වන්දනාවෙන්, විශේෂකොට දිව්‍ය සත්ප්‍රසාදි උල්පතකින් මෙන් දේව වරප්‍රසාද අප වෙත ගලා එන අතර ශුද්ධ වූ සභාවේ සියලුම වැඩ කටයුතුවල පරමාර්ථය වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දේව ජනතාවගේ ආධ්‍යාත්මය දෙවියන් වහන්සේගේ මහිමයද සඵලවත් ලෙස නතුකර ගත හැකි වෙයි"

තවද දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කළ මහ බ්‍රහස්පතින්දා අන්තිම රාත්‍රි භෝජනය සම්බන්ධව පවතින වාර්තාවන් දෙස අවධානය යොමු කිරීමද මෙහිදී වැදගත් ලෙස සැලකිය හැක.

**මතෙව් තුමාගේ වාර්තාව**

ඔවුන් කෑම කමින් සිටියදි, ජේසුස් වහන්සේ රොටී ගෙන ආශිර්වාදය පවසා ඒවා කඩා ශ්‍රාවකයන්ට දී " රැගෙන වළදන්න. මේ මාගේ ශරීරය" යි වදාළ සේක. ඔවුන් වහන්සේ කුසලානයක්ද ගෙන තුති පුදා ඔවුන්ට දී ' ඔබ සියල්ලෝම මෙයින් පානය කරන්න. මෙය පව් කමාව පිණිස බොහෝ දෙනෙකු උදෙසා වගුරවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය යි පැවසූ සේක" (මතෙව් 26:26-28) ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ රුධිරය ගිවිසුම් රුධිරයක් ලෙස මෙහිදී හඳුන්වන සේක. පැරණි ගිවිසුමේ යාගික පුජාවකදි සතකු මරා ලෙය පූජාසනය මත ද ජනතාව මතද ඉසීමෙන් ගිවිසුමේ කොන්දේසි රකින බවට දිවුරුම් දීමක් සිදු විය. මෙලෙස දෙවි පියාණන් විසින් ලෝකයේ ගැලවීම සඳහා එවන ලද පව් කමාව සඳහා පූජා කරනු ලබන බැටළුවා තමන්වහන්සේ බව සනාථ කෙරිණි.

**මාක් තුමාගේ වාර්තාව**

ඔවුන් ආහාර වළඳමින් සිටියදී ඔවුන් වහන්සේ රොටී ගෙන ආශිර්වාදය පවසා, ඒවා කඩා ශ්‍රාවකයන්ට දී " ගන්න මේ මාගේ ශරීරය යි" වදාළ සේක. ඔවුන් වහන්සේ කුසලානයක්ද ගෙන තුති පුදා ඔවුන්ට දුන් සේක. "මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරවනු ලබන මාගේ ගිවිසුම් රුධිරය වේ" මාක් 14:22-24)

පැරණි ගිවිසුමේ දේව ජනතාව ද්වි පාර්ශවික ගිවිසුම කඩ කළහ. නමුත් ස්වාමීන් වහන්සේ තම ගිවිසුම නොකඩා අවසානයේ දී තම එක ජනිත පුත්‍රයාණන්, එනම් මෙසියස් තුමන් මෙලොවට එවූ සේක. ඔවුන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රී රුධිරය වැගිරවීමෙන් මෙම ගිවිසුම පූර්ණත්වයට පත් කළ සේක.

**ලූක් තුමාගේ වාර්තාව**

"රොටි ගෙන තුති පුදා, ඒවා කඩා ඔවුන්ට දී " ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මෙය. මා සිහිකිරීම පිණිස මෙය කරන්න" භෝජනයෙන් පසු " ඒ කුසලාන ද ඔබ

උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමය" (ලූක් 22:19-20). ජේසුස් වහන්සේ රුධිරය වගුරවනු ලබන්නේ මිනිසා උදෙසාම බවත්, ඒ තුළින් නව ගිවිසුමක් ගොඩ නගනු ලබන බවත් සහ මෙම ගිවිසුම් පිළිවෙත නොකඩවා ගෙන යමින් මතු මතුද උන්වහන්සේගේ ජීවිත පූජාව සැමරිය යුතු බවත් පෙන්වා දෙයි.

**පාවුලු තුමාගේ වාර්තාව**

ස්වාමීන් වන ජේසුස් වහන්සේ පාවා දෙනු ලැබූ රාත්‍රියේදී රොටියක් රැගෙන ස්තුති කොට කඩා මෙය ඔබ උදෙසා දෙන, මාගේ ශරීරයය මා සිහි කිරීම පිණිස මෙය කරන්න" යි වදාළ සේක. එලෙස රාත්‍රි කෑමෙන් පසු කුසලානද රැගෙන මේ මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුමය. යම් පමණ වර ඔබ මෙයින් පානය කරන්නහු ද? එපමණ වර මා සිහි කරන පිණිස මෙය කරන්න" වදාළ සේක (1 කොරින්ති 11: 23-25)

සමහර කිතුනු සංසයන් හි පූප කැඩීමට පෙර භෝජන සංග්‍රහයක් පැවැත්විණි. මෙය ප්‍රේම මංගල්‍යය හෙවත් "අගාපේ" යනුවෙන් හැඳින්විණ. මෙයින් අදහස් කරන්නේ ජේසුස් වහන්සේගේ ᵖ ජීවිත පූජාව මඟින් නව ගිවිසුමක් පිහිටුවනු ලැබූ බවයි. කුසලානෙන් පානය කරන සෑම වරකදීම රාත්‍රි භෝජන අවසථාව සැමරිය යුතු බවයි.

මාක්, මතෙව් සුවිශේෂයන් හි ජේසු සමිඳු රොටි හා කුසලාන මතුපිට ආශිර්වාදය පවසයි. මෙය ඇලෙක්සැන්ඩ්‍රියානු සම්ප්‍රදායයි. ලූක් තුමා හා පාවුලු තුමා පවසන්නේ පූපය හා පාත්‍රය මතුපිට තුති පිදූ බවයි. මෙය පලස්තින සම්ප්‍රදායයි. ආශිර්වාදය හා තුති දීම එකම අරුතක් ගෙන දෙන්නකි. මෙය සම්ප්‍රදායන් දෙකක ලක්ෂණයන් වේ. එහෙත් පිළිවෙත එකක්මය. මෙය ගිවිසුම් සම්ප්‍රදායට අනුව දිවැසි වැකියක් ඉටුවීමක්ද වේ.

"ඉශ්රායෙල් සෙනඟ හා ජුදා සෙනඟ සමගද මා අලුත් ගිවිසුමක් කරන කාලය පැමිණෙන්නේය. අලුත් ගිවිසුම ඔවුහු කඩ නොකරන්නෝය. ගිවිසුම් පණත් ඔවුන්ගේ සිත්වල ලියනු ලබන්නේය මේ ගිවිසුම තුළ ඔවුන්ගේ අපරාධ කමා කරන්නේය. ඔවුන්ගේ පාප තවත් සිහි නොකරන්නේය" (ජෙරමියා 31:31-40)

ජොහන් සුවිශේෂය තුළින් අපට හමුවන්නේ ජීවන දායක භෝජනය මමය (ජොහන් 6:35-38) යි වදාළ ගුරුදේවයාණන් ද නායකයාණන්ද වන ජේසුස් වහන්සේ ᵖ මේසයේදී දෙසූ සමු ගැනීමේ (අවසන් ) දෙසුම් ය.

මෙම ශුද්ධ ලියවිලි පාඨයන්ගෙන් පෙනී යන්නේ එදා ශ්‍රාවකයන් බොදුන් මේසය වටා එක්රැස් වූයේ ජේසුස් වහන්සේගේ සමඟ දෙව්පියාණන්ට තුති පිදීමට බවයි. මිනිසාගේ පාපය වෙනුවෙන් රුධිරය වැගිරූ කුරුසියේ ජීවිත පූජාවට හා උත්ථානයටත්

-පව් කමාවේ යාගයටත් - ශ්‍රී රුධිරයෙන් පිහිටුවනු ලබන නව ගිවිසුමටත් - සහෝදරත්වය බෙදා හදා ගැනීමට සහභාගි වීමටක් බවයි. අනාගත සභාව දෙසට යොමු වීමටත් - බැහැපත් කමේ නායකත්වයට හුරු වීමටත් - මේ මොහොතේ ඔවුන්ට අවස්ථාව සැලසුණු බව පෙනී යයි.

මේ අනුව හැඩ ගැසුණ ශ්‍රාවක සංඝය ශුද්ධාත්ම බලයෙන් පූර්ණ කරනු ලැබූ පසු ජේසුස් වහන්සේගේ දූත කාර්යය දසත දියත් කරනු ලැබුයේ " පුප කැඩීම" මුල්කොට ගෙනය. එම පුප කැඩීම දිව්‍ය යාගය තුළින් සිදු කරන සාන්ත සභාව පූපය සහ මිදිරස තුළ වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාදය වටා තම දේව ජනතාව එක්රැස් කරන්නේද මුල් ශ්‍රාවක සංඝයන් පුප කැඩිම මගින් අත්කර ගත් භාග්‍ය උදාකර දිමටය.

විශේෂයෙන්ම මධ්‍යතන යුගයේ සභා පියවරුන් මඟින් දිව්‍ය සත්ප්‍රසාදයේ සත්‍යතාවට විරෝධී අභියෝගයන්ට පිළිතුරු දෙනු ලැබූ අතර මන්ත්‍රණ සභා මඟින්ද සාන්ත සභාව තම විශ්වාසය ඍජුව ප්‍රකාශ කළාය. එනම් කිතු සමිදාණන් තම ශ්‍රී ශරීරය ද රුධිරය ද යාගික පූජාව මඟින් දිව්‍ය සත්ප්‍රසාද යාගය ස්ථාපිත කරන ලද බවත්, එම සත්‍යතාවය ඔවුන්වහන්සේ සමඟ බැඳි පවතින බවත් ය. දෙවන වතිකාන කතිකාවේ ධර්ම ප්‍රචාරක ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් වන්නේ (එපීසි 4:13 අනුව) ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවමාන අවයවයන් වශයෙන් සංයුක්ත වීම නම් දිව්‍ය සත්ප්‍රසාදය මගින් ඔවුන්වහන්සේගේ ආකාරයට (ස්වරූපයට) වෙනස් කරනු ලැබිය යුතු බවයි. " ලූමෙන් ජෙන්සියුම්" හෙවත් ජාතීන්ගේ ආලෝකය නැමැති ධර්ම ප්‍රකාශනයේ ශුද්ධවූ සභාව අභිරහසක් ලෙස හඳුන්වා දෙන අතර ජේසුස් සමිදාණන් හා සභාව අතර බැඳීම ගැන ද ඔවුන්වහන්සේගේ යාගය හා දිව්‍ය සත්ප්‍රසාදය ගැනද විස්තර කරමින් සත්ප්‍රසාදය කිතුනු ජීවිතයේ උල්පත හා උච්චස්ථානය වශයෙන් හඳුන්වා දෙයි. (ලූ. ජෙ. අංක 37)

එම්මාවුස් නගරයට යන ශ්‍රාවකයන් දෙදෙනාගේ ආරාධනය වූ " අප සමඟ නතර වුව මැනව ස්වාමිනි" යන වැකියට අනුව දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් නිකුත් කරන ලද අපෝස්තලික ලිපියේ සඳහන් වන්නේ ලෝකයේ ආලෝකයද ජීවමාන ජේසුස් වහන්සේද වන දිව්‍ය සත්ප්‍රසාදය අවිශ්වාසයේ අඳුර පහ කරන ආලෝකයක් වෙමින් දේව අභිරහස හඳුන්වා දෙන බවයි.

එහෙයින් කිතුනුවන් වශයෙන් දිව්‍ය යාගයට සහභාගී වෙමින්ද දේව වචනයට සවන් දෙමින් ද දිව බොදුන වැළඳීම සඳහා දිව්‍ය සත්ප්‍රසාදය වටා අප එක් රැස් විය යුත්තේ නිසි සුදානමකින් යුතුවයි. "නුසුදුසු ලෙස ශ්‍රී පූපය වළඳන - කුසලානෙන් පානය කරන අය ස්වාමින් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා රුධිරයට විරුද්ධව වරදකරුවන් වන්නේය" ( 1 කොරින්ති 11:28) මෙය ශු සභාවටද සහෝදර ජනතාවටද විරුද්ධව කරන වරදකි. මෙම සක්‍රමේන්තුව සංකේතාත්මකව අනුස්මරණ සිද්ධියකට පමණක්

සීමා නොවන්නකි. එම නිසා දේව බොදුන වළඳන අපි. අප සමඟ වෙසෙන සහෝදර ජනතාවටද නිසි ගෞරවය දැක්විය යුත්තෙමු. ශ්‍රමය වැය කරමින් සමාජ යහපත සඳහා මමත්වය ත්‍යාජ කළ යුත්තෙමු. යහපත් සමරිතානුවරයාගේ උපමාව පරිදි අපගේ අසල්වැසියා කෙරෙහි සහෝදර දයාවෙන් කටයුතු කරමින් සත්ප්‍රසාදීය ජීවිතය සමාජය තුළ සජීවී කිරිම නව ගිවිසුමේ දේව ජනතාවක් වන අපගේ වගකීමයි.

අපට ඇති ඉමහත් ප්‍රේමය නිසා අප වෙනුවෙන් තම ජීවිතය කුරුස ගසක පුද කළ උන්වහන්සේගේ ජීවමාන ශරීරය ලෙස සභාව හැඳින්විය හැකිය. ශු පාවුලු තුමා විසින් කොරින්ති සංඝය වෙතට යවන ලද ලිපිය පිරික්සා බැලිමේදී පැහැදිලි ලෙස පෙනෙන කරුණක් නම් එම කිතුනු ජනතාව එම භෝජනය සතුව දිය යුතු අවධානය ක්‍රමයෙන් හීන කළ බවයි. තවද ස්වමීන් වහන්සේ තුළ "සිහිකරන පිණිස" සිදු කරන මෙම පිළිවෙත තුළ අනිවාර්යෙන්ම සමන්විය යුතු ආදරය, ප්‍රේමය දැක්වීම කළ බවයි. ආදරයෙන් තොරව පවත්වන ලද මෙවැනි භෝජන අවස්ථාවන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ භෝජනය ආත්මාර්ථකාමීත්වයට යොමු කළ අවස්ථාවන් ලෙස සැලකිය හැක. (1 කොරින්ති 11:17-37)

මෙය සාක්ෂි දැරිය හැකි අවස්ථාවක් වන අතර එය අවමානයට ලක් කිරීම සුදුසු නැත. එමෙන්ම සංඝයක් ලෙස ස්වාමීන් වහන්සේ තුළ සාමයෙන් එකමුතු වීමේදී ඔවුන් තුළ අනිවාර්යයෙන්ම සහ ජීවනයේ පන්නරය විද්‍යාමාන විය යුතු අතර උන්වහන්සේගේ ජීවමාන ප්‍රබල වැඩසිටීමද දිස්විය යුතුය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ භෝජනයක් අයුරින් අන් අයව උන්වහන්සේ වටා එක් රැස් කරවන සේක. කිතුනු පැවැත්මේ කේන්ද්‍රීය වන දිව්‍ය යාගය ඔස්සේ දෙවියන් වහන්සේ සහ ජනතාව අතර පවතින ගැඹුරු සම්බන්ධතාව තව දුරටත් සවිමත් ලෙස ඉදිරියට ගමන් කරවමින් සෑම දිව්‍ය යාගයකදීම ස්වාමින් වහන්සේ තුළින් නික්මෙන ආද්‍යාත්මිකත්වය සැදැහැවත් ජනතාවගේ ජීවිත ප්‍රතිරූපය බවට පත් කර ගන්නට ආරාධනා ලැබේ. මෙලෙස සාකච්ඡා කරන කළ අපට පෙනී යනුයේ ශුද්ධ වූ. සභාව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේම තිළිණයක් ලෙස දායාද කර ගෙන ඇති බවය. (1 කොරින්ති 11:23) (මතෙව් 26:19, මාක් 14:22-23 සහ ලූක් 14 :20) උන්වහන්සේගේ ජීවිත කාලය තුළදී පැවති සෑම භෝජන සංග්‍රහයකින්ම යම් අයුරකින් දේව රාජ්‍යයේ සමීප බව පිළිබිඹු විය. භෝජනය සහ වෙළි පවතින මිත්‍රත්වය දේව රාජ්‍යය හා සම්බන්ධ වූ බව අපට පසක් කර දෙන අතරම ගැලවීමේ අභිරහසට අපවද යොමු කරනු ලබයි.

පූප කැඩීම තුළින් පිළිබිඹු වූ උන්වහන්සේගේ වැඩ සිටීම තම ශ්‍රාවකයන්ට අත් දකින්නට මඟ සැලසුනි. මෙලෙස අවසාන රාත්‍රි භෝජනය ස්වාමීන් වහන්සේගේ වචන සහ ක්‍රියා ඔස්සේ ප්‍රධාන සක්‍රමේන්තුව බවට පත්වී ඇත. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නැමැති සක්‍රමේන්තුව, සළකුණ හා සංකේත ඔස්සේ ජේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ අපිරිමිත ප්‍රේමය සැදැහැවතුන්ට යොමු කරන ගැඹුරු සම්බන්ධතාවයකි.

1 කොරින්ති 11:24 ක්‍රියා 2:42 ශුද්ධ ලියවිල්ල සඳහන් කරන ආකාරයට දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත හැඳින්වීම සඳහා නාම දෙකක් සඳහන් කර ඇත. ඒ පූප කැඩීම සහ ස්වාමීන් වහන්සේගේ අන්තිම රාත්‍රි භෝජනය යි. මුල් කිතුනු සංසයේ ලක්ෂණ කිහිපයක් දැකිය හැක. ඉගැන්වීම, සහභාගිකම සහ යාච්ඤාව යනු ඒවාය තවද ස්වාමීන් වහන්සේ තම ශ්‍රාවකයින් සමඟ පවත්වන අන්තිම රාත්‍රි භෝජනය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම පිළිබඳ විස්තරය උපුටා දැක්විය හැක. (1 කොරින්ති 15:26, මතෙව් 26:30,මාක් 14:22-26 ලූක් 22:14-20) පාවුලු තුමාගේ ජීවිත පරිවර්තනයට අනුව එතුමා අන්තියෝකියේ සංසය සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වා ගත් බව පැහැදිළිය. ඒ තුළ ඉස්මතු වන දෑ අන්තියෝකියානු සභා සම්ප්‍රදාය සහ ජන වන්දනා ක්‍රියා මාර්ග තුළින් ගත් බව බයිබල් විශාරදයන්ගේ මතයයි.

අන්තිම රාත්‍රි භෝජන සංග්‍රහය සම්බන්ධව සලකා බැලීමේදී එය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා මරණය ආශ්‍රිතව සිදු වූ බව නොරහසකි. මේ නිසා දෙවියන් වහන්සේ වෙතින් අප ලද මහඟු තිළිණය ලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හැඳින්විය හැක. දිව්‍ය පූජාවට සහභාගි වීම සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම නිතැතින්ම විශ්වාසයන් හට අන් අයට ප්‍රේම කරන්නට සහ ඔවුන් වෙනුවෙන් පරිත්‍යාගී ජීවිත පසුබිමක් ජනිත කරගන්නට බෙහෙවින් උපකාරී වේ. ඉරුදින දිව්‍ය පූජා යාගයට සම්බන්ධ වන අප උත්සුක විය යුත්තේ අන් අය වෙනුවෙන් වැය වන්නට සහ ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා කැපවීමටය. අන්තිම රාත්‍රි භෝජනයේදී සිදු වූ පූප කැඩීමේ ක්‍රියාව අපටද ඇරයුම් කරනුයේ කුරුසියේ තම ජීවිතය පූජා කළ ක්‍රිස්තුන් වහන්සේ නිසා අප දිවිද එලෙසම සකස් කර ගැනීම සඳහාය. දිව්‍ය සත්ප්‍රසාද නිවහනයේ වැඩ සිටින ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට ලබා දිය යුතු නිසි ගෞරවය සහ භක්තිය අපි ලබා දෙන්නෙමු. එනමුත් එම ස්වාමීන් වහන්සේව දිව්‍ය පූජාව තුළදී ලබා ගන්නා අපට නිසි හැඟීමක් සහ අවබෝධයක් ඇතිදැයි යන්න සලකා බැලිය යුතු කරුණකි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හෙවත් ප්‍රේමයේ ප්‍රසාද නිධානයට නතු වීමෙන් ගැලවීම දායක ජීවිතයක් සඳහා අපටද මුල පිරිය හැක.

ස්වාමීන් වහන්සේගේ ශරීරය සහ රුධිරය සමඟ සම්බන්ධ වන ගැලවීමේ තිළිණය ලෙසද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හැඳින්විය හැක. මෙම තිළිණය දායාද කරනු වස් ප්‍රබල ලෙස දායක වන ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය කිසිවිටකත් අමතක කළ නොහැකි. මෙම තිළිණය ඔස්සේ අප මැවුම්කරුවාණන් වන මහෝත්තම වූ දෙවියන් වහන්සේ සමඟ නිරන්තරයෙන්ම ගැඹුරු සම්බන්ධතාවයක් ඇතිව ජීවත් වන්නට අපව යොමු කරයි. ඒ තුළ අප පාපිෂ්ඨ ප්‍රවණතාවලට සමාව ලබා ගත හැක. (මතෙව් 26:28) එමෙන්ම දෙවියන් වහන්සේට තුති ප්‍රශංසා කිරීමට මෙන්ම උන්වහන්සේ තුළ අපට දායාද වන නිමක් නොමැති සමාව, කරුණාව සහ සෙනෙහස කෙරෙහිද අප සිත් යොමු කරලීම මඟ සලසයි.

මිනිස් පාපිතර ලැදියාව නොසලකා අප වෙනුවෙන් දායාද කරන වරප්‍රසාද උදෙසා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වටා ඒකරාශී වන සැදැහැවත් ජනතාව උන්වහන්සේට තුති පුද කළ යුතුය.

**එකම පූපයක් එකම ශරීරයක්**

දිව්‍ය සත්ප්‍රසාද සාංඝිකත්වය තුළින් ඇතිවන මෙම විශේෂ බැඳීම සාන්ත සභාවේ සාංඝිකත්වයට සම්බන්ධව මිස වෙන අයුරකින් ප්‍රමාණවත් ලෙස අවබෝධ කර ගැනීමට හෝ මුළුමනින්ම අත් දැකීමට හෝ නොහැකිය. ශුධවූ. සභාව යනු ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයයි. අපි ක්‍රිස්තුන් වහන්සේ සමඟ ගමන් කරන්නේ ඔවුන්වහන්සේගේ ශරීරය සමඟ' සම්බන්ධව ඉන්නා තරමට පමණි. ශුද්ධාත්මයාණන් වහන්සේ වගුරවනු ලැබීමෙන් ක්‍රිස්තුන් වහන්සේ මෙම සාංඝිකත්වය ජනිත කිරීමට සහ එය වර්ධනය කිරීමට අවැසි දේ සපයා දුන් සේක. තමන්වහන්සේගේ දිව්‍ය සත්ප්‍රසාදිය වැඩ සිටීම මගින් ක්‍රිස්තුන් වහන්සේ මෙම සාංඝිකත්වය නිරන්තරයෙන්ම ගොඩ නඟන සේක. අපව එකම ශරීරයක් බවට පත් කරන්නේ මෙම එකම දිව්‍ය සත්ප්‍රසාදීය පූපයයි. පාවුලු අපෝස්තුලු තුමා සඳහන් කරන්නේ මෙලෙසය.

" මා මේ අනුශාසනා කරන විට මම ඔබට ප්‍රශංසා නොකරමි. මන්ද ඔබේ රැ ස්වීම්වලදී යහපතට වඩා අයහපත සිදු වන බැවිනි " ( 1 කොරින්ති 10,17)

තමන්වහන්සේගේ උත්තම පූජක යැදුමෙන් ඉස්මතු වු උත්තරිතර ආදර්ශයට අනුව දිව්‍ය සත්ප්‍රසාදීය අභිරහස තුළ ජේසුස් වහන්සේ සාන්ත සභාව සාංඝිකත්වයක් ලෙස වර්ධනය කරන සේක.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1** ප්‍රසාද නිධාන ක්‍රිස්තු කේන්ද්‍රීය වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

**පියවර 2** කිතුනු ජීවිතය තුළ ප්‍රසාද ස්නාපනය කැඳවීම පිළිබඳව සාකච්ඡා කරන්න.

පියවර 3 ස්වාමීන් වහන්සේගේ යාගික බොදුන හා සහ ජීවනය පිළිබඳව කතිකාවතක් ගොඩ නගන්න.

## මූලාශ්‍ර -

මූලාරම්භක දේව ප්‍රසාද නිධාන , ඉන්ද්‍රා රත්නසිරි පියතුමා

නිපුණතාව 9.0 : **කිතුනු ජනවන්දනාවට සහභාගි වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි.**

**නිපුණතාව මට්ටම 9 3** : නව කිතුනු දැක්මක් සඳහා ශුධාත්ව ක්‍රියාකාරිත්වයේ අවශ්‍යතාව විස්තර කරයි.

කාලච්ඡේද : කාලච්ඡෙද 12

**ඉගෙනුම් ඵල** :

- ලෝකය තුල ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය අවබෝධ කරගනියි.
- තම ජීවිතයෙන් ශුධාත්මයාණන් වහන්සේට සාක්ෂි දරයි.

**විෂය කරුණු පැහැදිලි කරදීමට අත්වැලක් :**

**9.3.1 ලෝකය තුල ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය**

" පියාණෙනි, මා මෙසේ යච්ඤා කරන්නේ ඔබ මා තුළද මා ඔබ තුළද සිටින්නාක් මෙන් ඔවුන්ද අප තුළ එකත්වයක් වන පිණිසත්, ඔබ මා ඒවා වදාළ බව ලෝකයා විශ්වාස කරන පිණිසත්ය" (ජොහන් 17,21)

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සාන්ත සභා සාංඝිකත්වයේ මූලාශ්‍රයද එහි ප්‍රබලතම ප්‍රකාශ වීමද වෙයි. දිව්‍ය සත්ප්‍රසාදය සාංඝිකත්වයේ දිව්‍යමය ප්‍රකාශ වීමකි. මේ හේතුව නිසා දිව්‍ය පූජාව පැවැත්වීමේ දී එහි පූර්ණ සහභාගිත්වය සම්බන්ධයෙන් ශුද්ධ වූ සභාව කොන්දේසි පනවන්නීය. මෙම විවිධ සීමාවන් දිව්‍ය සත්ප්‍රසාදීය සාංඝිකත්වය සම්බන්ධයෙන් ජේසුස් වහන්සේ අපගෙන් ඉල්ලන විශේෂිත තත්වයන් පිළිබඳව පෙරටත් වඩා අවධානයකින් කටයුතු කිරීමට අප යොමු කළ යුතුය. දිව්‍ය පූජාවේ ස්තෝත්‍ර යාගික යැදුමේ හමුවන ශුද්ධෝත්තම පියතුමන් සහ පදවියේ රදගුරු තුමන් සඳහන් කිරිම්වලින් ගම්‍ය වන පරිදි මෙම සාංඝික්තවය විවිධ භූමිකාවන් සහ තේවාධූර මත පදනම් වූ ධූරාවලිමය සාංඝිකත්වයකි. එය, අන්‍යොන්‍ය විවෘත බව, දයාව, අවබෝධය සහ සමාව දීම පිළිදැගුම් කරන " සාංඝික ආධ්‍යාත්මිකත්වයකින් වර්ධනය කෙරෙන සහෘද සාංඝිකත්වයකි.

විශ්වාසය තුළ ප්‍රසාද ස්නාපනය නැමැති දේව ප්‍රසාද නිධානය අපට දයාද කළ නව ජීවිතය සවිමත් කර ගැනීමට මෙන්ම විවිධ ප්‍රශ්න හමුවේ ජීවත් වීම අරබයා ශුද්ධාත්ම බලය ලබා ගැනීම අවශ්‍ය බව ශුද්ධ පාවුලු තුමාගේ ලිපි පිරික්සා බැලිමේදී අපට පැහැදිලි වන සත්‍යතාවකි (රෝම 8:1-18) එහෙත් ආත්මයාණන් වහන්සේ කරණකොට ගෙන ඇති වන ප්‍රතිඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සාමය ඉවසීම, කරුණාව යහපත්කම, විශ්වාසකම, මෘදුකම හා ආත්ම දමනය යන මේවාය (ගලාති 5:22) " ශුද්ධාත්මයාණන්

වහන්සේට දුක් නොදෙන්න,  මන්ද මිදීමේ දවසට සුදානමක් වශයෙන් එය ලබා ඇති සහතිකයේ මුද්‍රාව ඔවුන් වහන්සේය" (එපීස 4:30)

තවද ශුද්ධාත්ම ආලේපය තුළින් අපට දායාද වන වගකීම් නොපිරිහෙලාම ඉටු කිරීමට බෙහෙවින් උපකාරී වේ. ක්‍රිස්තුන් වහන්සේගේ "ආත්මය , ලෙසට ශුද්ධාත්මයාණන් වහන්සේව ශුද්ධ වූ පාවුලුතුමා අර්ථකනය කරයි. තවද ඔවුන් වහන්සේට සාක්ෂි දරන්නට සවිය ලැබෙන්නේද ශුද්ධාත්මයාණන් වහන්සේගෙනි. එමෙන්ම ක්‍රිස්තු ආකල්ප ජනිත කර ගන්නටද, ඒ තුළින් කිතුනු ප්‍රතිපත්තිවලට අනුකූලව සැදැහැවත් ජනතාවට ජීවත්වන්නට ද මඟ සලසා දෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ බව අපි දනිමු.

ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය ඔස්සේ මැවුම්කාර අප ආදර දෙවියන් වහන්සේ සහ අප අතර පැවතිය යුතු "ප්‍රේමයේ සබැඳිතාවය" තව දුරටත් සනාථ කරමින් එය ප්‍රබල ජීවමාන සදාතනික අත්දැකීමක් බවට පත් කරයි. එමගින් අරමණීය වූ පැවැත්මක් අරබයා යොමු කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය. අප ජීවිතයද ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට අනුබද්ධ කරමින් උත්ථානයේ සහ ආලෝකයේ දරු දැරියන් ලෙස ජීවත් වීමේ මාවත විවෘත කරන්නේ ද ඒ ඔස්සේ අප දිවි වලට නැවුම්භාවය මුසු කරනුයේ ද ශුද්ධාත්මයාණන් වහන්සේය.

සුපැහැදිළි ලෙස ඉස්මතු වන තවත් කරුණක් නම් ජේසුස් වහන්සේගේම ශ්‍රාවකයන්ට පවා නිර්භයවය සුබාරංචියට සාක්ෂි දැරීමේ ශක්තිය උදා වුයේ ශුද්ධාත්ම ආගමනයෙන් අනතුරුව බවය.  පෙන්තකොස්ත ඇත්දැකීම යනු ශුද්ධාත්මයාණන් වහන්සේට අප දිවි තුළ පූර්ණ ලෙස ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීමයි. ඒ ඔස්සේ ගැලවීමේ අභිරහසට ප්‍රබල ලෙස අපටද සම්බන්ධ විය හැක. මෙම අදහස ශුද්ධ වූ පාවුලුතුමාගේ බොහො ලිපි තුළ ඉස්මතු වන බව පැහැදිළි ය.

**කිතුනු වගකීම**

සැම ප්‍රසාද නිධානයක් තුළින්ම උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේව මුණ ගැසෙන බව අපගේ විශ්වාසයයි. එම නිසා ඔවුන් වහන්සේගේ උත්ථානය ප්‍රබල ලෙස අප ජීවිත වලට සම්බන්ධ කර ගන්නට උත්සුක වීම කිතුනු අපගේ පරම වගකීම වේ. ප්‍රසාද ස්නාපනය ඔස්සේ අප දායද කර ගත් කැඳවීම් (පූජක, දිවැසිවර සහ එඩේරික කාර්යයන්) අබිවෘද්ධි ආලේපය ඔස්සේ තවදුරටත් පරිණත විය යුතු බව අප වටහා ගත යුතු ය.

"සභාවේ වැඩිහිටි" මුහුකුරා ගිය සාමාජික සාමාජිකාවන් ලෙස කටයුතු කරන්නට මාර්ගය විවෘත වන අතර මෙම කැඳවීම් ප්‍රබල ලෙස ජීවත් කරවීම සඳහා අවස්ථාවන් උදා වේ. එනමුත් මෙහිදි අප සිත්හි තබා ගත යුතු තවත් කරුණක් වන්නේ සුදතුම් වරම් ලැබුණද අප තුළ අවංක ප්‍රයත්නයක් මත පදනම් වූ ගුණාංග නොමැති නම් ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය අඩපණ වන බවයි. ආධ්‍යාත්මික ප්‍රබෝධයක් ඇති කර ගනිමින්

දේව රාජ්‍යය ගොඩ නැගීමේ කාර්යභාරය නිතැතින්ම අප සිත්හි ධාරණය කර ගත යුතු ය. ඒ තුළින් අප ලද ප්‍රසාද ස්නාපනිය කැඳවීම් වන පූජක, දිවැසිවර සහ එඩේරික කාර්යයන් පණ ගැන්විය යුතුය.

දේව අණපනත් අනුසාර කරමින් ජීවත් වීම " කිතුනු අනන්‍යතාවය" ලෙස ඉතා සරල ලෙස අර්ථකථනය කළ හැක. දේව පණත් යනුවෙන් අර්ථවත් වන්නේ කුමක්දැයි ප්‍රථමයෙන්ම වටහා ගැනීම යෝග්‍යයය. දෙවියන් වහන්සේගෙන් නික්මෙන සෑම පණතක්ම ප්‍රේමය බව අප මතක තබා ගැනීම ඉතා වැදගත් ය. මෙම පණත් අප අතර ජීවමාන කළ උත්ථාන වූ ස්වාමීන් වහන්සේ සමග දැඩි සම්බන්ධතාවයක් ඇති කර ගැනීමේ වැදගත්කම ඉස්මතු වේ.

කිතුනු අනන්‍යතාවයේ කේන්ද්‍රස්ථානය උත්ථාන වූ ස්වාමීන් වහන්සේය. මෙම අනන්‍යතාව නියම ආකාරයට වටහා ගැනීම සඳහා සුදතුම් බලය අවශ්‍ය බව ප්‍රත්‍ය වන කරුණකි. ශුද්ධාත්මයාණන් වහන්සේට අප දිවි තුළ ඇති විවෘතභාවය "ක්‍රිස්තු කේන්ද්‍රීය ජීවිතයකට" අපව යොමු කරනු ලබයි. කිතු දහම් සුවිශේෂකත්වය මුළුමනින්ම ගොනු වී අත්තේ මේ පදනම මත බව සත්‍යතාවයකි. උත්ථාන වූ තැනන් වහන්සේ අප සමඟ ජීවත් වීම අප නතු කර යුතු අත්දැකීමයි. තම ශ්‍රාවකයින්ව ශක්තිමක් කළ ඔවුන් වහන්සේ " ඉක්බිති ඔවුන්ගෙන් දෙදෙනෙකු පිටිසරට යන කල ඔවුන් වහන්සේ අන් විලසකින් ඔවුන්ට දර්ශනය වූ සේක" (මාක් 16:22), වත්මන් සමාජය තුළ විවිධ පීඩාකාරි තත්තවයන් අභියස දිවි ගෙවන අපවද උන්වහන්සේ සවිමත් කරන බව නොරහසකි. මෙය අප සතු ප්‍රබල අත්දැකීමය. " මාර්ගයද සත්‍යයද ජීවනයද මම වෙමි " (ජොහන් 14:6), අතීතය තුළ පමණක් නොව වර්තමානයේ මෙන්ම අනාගතයේද අපට ප්‍රදානය වන සෑම දේව ප්‍රසාද නිධානයක් මගින් ද උත්ථාන වූ ස්වාමීන් වහන්සේව අපි ප්‍රබල ලෙස අත් දකිමු. ඔවුන් වහන්සේ අප සමඟ ඇති කරගන්නා " සමීප- ආදර" සබැඳියාව" අන් අය සමගද බෙදා ගැනීම කිතුනු අනන්‍යතාව තව තවත් තහවුරු කිරීමකි. මෙය අපගේ දෛනික ජීවිත රාමුව තුළ සිදු වේ.

ඉශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේ අසීමිත ලෙස ආදරය කළ බව සත්‍යයකි. " මවකට හැකිද කුසේ දැරූ බිළිඳා අමතක කරන්න ? හැකිද ඇට ඇගේම කිරි දරුවාට පෙම් නොකරන්න ? මවක ඇගේ දරුවා අමතක කළත් මම නම් කිසිදා නුඹ අමතක නොකරමි (යෙසායා 49:15) නව ඉශ්‍රායෙල් ජනතාව වන අපටද එලෙසම දේව ආදරය උරුම ව පවතින බව සත්‍යයකි. මෙහිදී අප වටහා ගත යුතුව තිබෙන තවත් කරුණක් නම් මෙම සංරක්ෂණය අප දිවි තුළ නව වෙනසක් ජනිත කරන බවයි. ස්වාමීන් වහන්සේව මුණ ගැසීම අප දිවි තව තවත් ක්‍රියාකාරී ජීවිත බවට පරිවර්තනය කරන බව අපගේ දැඩි විශ්වාසයයි. ශුද්ධ වූ ලියවිල්ලද මෙම සත්‍යතාවය තව දුරටත් සනාථ කරයි.

මෙසේ ඔහු ගමන් කරමින් දමස්කයට ළං වූ කල, හදිස්සියෙන් අහසින් ආලෝකයක් ඔහු අවට බැබිළිණි. ඔහු භ්‍රාන්ත වී බිම වැටුණේය. එවිට " සාවුල් සාවුල්, ඔබ මට පීඩා කරන්නේ මන්දැ යි " කියන හඬක් ඔහුට ඇසිණ. " ස්වාමීනි , ඔබ කවරෙක් ද? යි ඔහු ඇසීය. " මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්ය. නැගිට නුවරට ඇතුළු වන්න. ඔබ කළ යුතු දේ ඔබට කියනු ලබන්නේය. " යි ඒ හඬ පැවසීය. ඔහු සමඟ ගමන් කළ මිනිසුන්ට ඒ හඬ ඇසුණු නමුත්, ඔවුහු කිසිවෙකු නොදැක තුෂ්ණීම්භූතව සිටියෝය. සාවුල් නැගිට ඇස් ඇරිය කළ, ඔහුට කිසිවෙක් පෙනුණේ නැත. ඔහුවු අතින් අල්ලාගෙන දමස්කයට ගෙන ගියහ. ඔහු තුන් දවසක් ඇස් නොපෙනී, නොකා නොබී සිටියේය" (ක්‍රියා 9:3-9)

සාවුල්ගේ ජීවිත වෙනසකට භාජනය වූ උත්ථාන වූ ස්වාමීන් වහන්සේව අත්දැකීමේ සිද්ධිය මෙහිදී ඉස්මතු වන බව අපි දනිමු. එම ප්‍රබල අත්දැකීම ජීවිත පරිවර්තනයකට පමණක් නොව විනාශකාරී යොමුවක් තිබූ ජීවිතය දේව රාජ්‍යය ගොඩ නැගීමේ මෙවලමක් බවට පත් වන්නටද මුල් වූ බව සත්‍යතාවකි.

තවද ස්වාමීන් වහන්සේව මුණ ගැසීම ඔස්සේ ජීවිත ප්‍රබල ලෙස ක්‍රියාශීලි වන ආකාරයද අපට පැහැදිළි ය. ස්වාමීන් වහන්සේ සමඟ ඇති කර ගන්නාවූ සම්බන්ධතාවය අප සතු චරිතාකම් මෙන්ම වගකීම් දෙසද නැඹුරු වීමකට යොමු කරනු ලබයි.

ස්ත්‍රිය ඔවුන් වහන්සේ අමතමින්, " මහතාණෙනි, ඔබ දිවැසිවරයෙකු බව මට පෙනේ. අපේ පියවරු මේ කන්ද මත නමස්කාර කළහ. එහෙත්, මිනිසුන් නමස්කාර කළ යුතු ජෙරුසලමෙහි යයි ඔබ කියන්නහුය" යි කීවාය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, " ස්ත්‍රිය මා විශ්වාස කරන්න. මේ කන්දේදීවත්, ජෙරුසලමේදිවත්, ඔබ පියාණන් වහනසේට නමස්කාර නොකරන කාලයක් පැමිණෙන්නේය. ඔබ නමස්කාර කරන්නේ ඔබ හරියටම නොදන්නා කෙනෙකුටය. අප නමස්කාර කරන්නේ අප දන්නා කෙනෙකුටය මන්ද ගැලවීම පැමිණෙනෙන්නේ ජුදෙව්වරුන්ගෙන්ය. එහෙත්, නමස්කාර කරන්නන්, ආත්මානුභාවයෙන්ද අවංක සිතින් ද, පියාණන් වහනසේට නමස්කාර කරන කාලයක් සැබැවින්ම පැමිණෙන්නේය. දැනටමත් පැමිණ ඇත. තමන් වහනසේව නමදින පිණිස පියාණන් වහන්සේ සොයන්නේ එවැන්නන්ය. දෙවියන් වහන්සේ ආත්මයයි. ඔවුන් වහන්සේට නමස්කාර කරන්නන් ආත්මානුභාවයෙන්ද අවංක සිතින්ද නමස්කාර කළ යුතුය''යි. වදාළ සේක. ස්ත්‍රිය පිළිතුරු දෙමින් " ක්‍රිස්තුන් වහන්සේ යයි කියන මෙසියස් තුමාණන් එන බව දනිමි. ඔවුන් වහන්සේ පැමිණි කල සියල්ල අපට දන්වා වදාරණ සේකැ "යි කීවාය. " මේ ඔබ සමඟ කතා කරන මම, ඒ තැනැත්තා වෙමි' යි ජේසුස් වහන්සේ වදාළ සේක (ජොහන් 4 : 19-26)

උත්ථාන වූ ස්වාමීන් වහන්සේට සම්බන්ධ වීමෙන් අපටද අනාවරණය වන අසීමිත දේව ආදරය සහ දේව අභිප්‍රාය ක්‍රමානුකූලව විහිදී පවතියි. ක්‍රිස්තුන් වහන්සේගේ" මම වෙමි ප්‍රකාශන පිරික්සා බැලීමේ දී මෙහි රඳා පවතින වැදගත්කම පැහැදිළිය. " ඔබ මා තෝරාගත්තේ නැත. මම ඔබ තෝරා ගෙන පත් කළෙමි. එසේ කළේ ඔබ ගොස් එල දරන පිණිසත්, ඔබේ එල පවතින පිණිසත්, මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් ඉල්ලන කවර දෙයක් වුවද ඔවුන් වහන්සේ ඔබට දෙන පිණිසත් ය'' (ජොහන් 15:16)

**9.3.2 ශුද්ධාත්මයන්ට හා සාක්ෂි දැරිම**

**සාක්ෂි දැරීම කිතුනු දිවියේ පැතිකඩකි :**

කිතුනු අනන්‍යතාවය නිතැතින්ම සැදැහැවත් ජනතාව යොමු කරනුයේ විශ්වාස කරන ලද සාක්ෂි දැරීමකට පරිවර්තනය කිරීමට බව අපි දනිමු. සාක්ෂි දැරීම හුදෙක් වචනයට වඩා ක්‍රියාවට නැඹුරුවන්නකි.

එවිට පේදුරු " මා දිවි ඇති තෙක් කවදාවත් මගේ පාද සෝදන්නට නම් ඉඩ නොදෙමි" යි කීය. ජේසුස් වහනසේ පිළිතුරු දෙමින් මා ඔබ නොසේදුවොත් මා සමඟ සම්බන්ධකමක් ඔබට නැතැ" යි ඔහුට වදාළ සේක(ජොහන් 13:8) අසීමිත ලෙස සමාව දීමට ශ්‍රාවකයන් හට උගන්වා වදාළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුස ගසේ දී තම ක්‍රියාව තුළ එය සනාථ කළ බව අපි දනිමු. විශ්වාස කරන දේ සඳහා සාක්ෂි දැරදීමට අප සවිමත් කරනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේය. ශ්‍රාවකයන් ස්වාමීන් වහන්සේ කළ කී දෑ නියමාකාරයෙන් වටහාගෙන ඒ සඳහා සාක්ෂි දැරීමට යොමු කරන ලද්දේ ශුද්ධාත්මයාණන් වහන්සේ බව අපි විශ්වාස කරමු. තම ජීවිත පවා ස්වාමීන් වහන්සේ වෙනුවෙන් පරිත්‍යාග කිරීමට පන්නරය ඔවුන් නතු කර ගත්තේ ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් බව ශුද්ධ ලියවිල්ල අපට මතක් කරයි.

**සුදතුම් පන්නරය :**

ශුද්ධ වූ පාවුලු තුමා විසින් රෝමවරුන්ට ලියන ලද ලිපියේ 8 : 1 - 17 ඔස්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය සම්බන්ධව සුවිශේෂිත වූ විස්තරයක් ඉදිරිපත් වන බව අපි දනිමු.

" මෙසේ ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වෙන්නවුනට විරුද්ධව නඩු තීන්දුවක් නැත. ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ තුළ වූ ජීවන දායක ආත්මයාණන්ගේ ආධ්‍යාත්මික ප්‍රතිපත්ති පාපයේ සහ මරණයේ නියමයෙන් ඔබ නිදහස් කර ඇත. මිනිස් දුර්වලතා නිසා ව්‍යවස්ථාවට ඉටු කළ නොහැකි දේ දෙවියන් වහන්සේ ඉටු කළ සේක. එසේ කෙළේ පාපයේ බලය බිඳින පිණිස, ස්වකීය පුත්‍රයාණන්ට අපේ පාපිවූ මිනිස් කයට සමාන කයක් දී එවීමෙන් ඒ මිනිස් කයේ සිටියදී දෙවියන් වහන්සේ විසින් පාපයට විරුද්ධව තීන්දුව දීමෙනි. ඔවුන් වහන්සේ එසේ කළේ මාංශය අනුව නොව

ආත්මයාණන් අනුව හැසිරෙන අප තුළ නීතියේ නියමයන් ඉටු වන පිණිසය. මාංශික ලෙස ජීවත් වන්නෝ මාංශික ලෙස දේවලටද ආත්මයාණන් අනුව ජීවත් වන්නෝ ආධ්‍යාත්මික දේවලටද මුළු සිතින් ප්‍රිය කරයි. මාංශික චේතනාවේ විපාකය මරණය වේ. ආධ්‍යාත්මික චේතනාවේ විපාකය ජීවනය හා ශාන්තිය වේ. මාංශික චේතනාව දේව විරෝධකමකි. එය දෙවියන් වහන්සේගේ ආඥාවට යටත් නොවූවකි. එසේම යටත් නොවන්නකි. මාංශික තෘෂ්ණාවලට වසඟ වූවන්ට දෙවියන් වහනසේ සතුටු කළ නොහැකිය. අපි දරුවෝ නම් උරුමක්කාරයෝද වම්හ. දෙවියන් වහන්සේගේ උරුමක්කාරයෝ ද ක්‍රිස්තුන් වහන්සේ හා සමග හවුල් උරුමක්කාරයෝ ද වම්හ. මන්ද, දැන් ඔවුන් වහන්සේගේ දුක් විඳීමේ පංගුකාරයන් වීමෙන් අනාගතයේ දී ඔවුන් වහන්සේගේ මහිමයේ පංගුකාරයෝ ද වම්හ" (රෝම 8:1-17)

මෙහිදී කිතුනු අප විශ්වාසයටද වැදගත් ස්ථානයක් හිමි වන අතර ප්‍රසාද ස්නාපනය නමැති දේව ප්‍රසාද නිධානය ඔස්සේ ඇරඹෙන " නව ජීවිතයක් " අරබයා ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය අවශ්‍ය බව සිහිපත් කරනු ලබයි. එමෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේ සම්බන්ධව මනා අවබෝධයක් ඇතිව ජීවත් වීම දෙවියන් වහන්සේ සමග ගැඹුරු සම්බන්ධතාවයකට නතු වීම සඳහා මඟ පහදා දෙයි.

"එබැවින් මේ ඉගැන්වීම ප්‍රතික්ෂේප කරන්නා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ මනුෂ්‍යා නොව, ස්වකීය ශුද්ධාත්මයාණන් ඔබට ප්‍රදානය කරන දෙවියන් වහන්සේය. එහෙත් සහෝදර ප්‍රේමය ගැන ඔබට ලියා එවීම වුවමනා නැත. කුමක් හෙයින්ද, එකිකොට ප්‍රේම කිරීමට ඔබ දෙවියන් වහන්සේගෙන් ඉගෙන ගෙන සිටින්නහුය" ( (1 තෙසලෝනකි 4 :8 -9)

දෙවියන් වහන්සේ සමග අප ගොඩ නගා ගන්නා ගැඹුරු, සමීප සම්බන්ධතාවය සඳහා ශුද්ධාත්ම බලය සෘජු ලෙසම බලපාන බව කිව යුතුය. පෙර සඳහන් කළ පරිදි බෞතිස්මය තුළින් අත්පත් වන " නව ජීවිතය" අමරණීය තත්ත්වය සඳහා ඔසවාලනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ මඟින් ය.

එම නිසා බව්තිස්මය ලද කිතුනුවන් ලෙස අප ජීවත් වීමේ දී ශුද්ධාත්මයාණන් වහන්සේගේ නිරන්තර වැඩ සිටීම සහ ශුද්ධවත් කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීම වඩා ඥානාන්විතය. කිතුනු ජීවිත ස්වාමින් වහන්සේගේ ගැළවීමේ අභිරහසට සාක්ෂි දැරීමේ ජීවිත පරිවර්තනය කරලීමෙහිලා උත්සුක වීමේ දී ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ අප ලබන පන්නරය කිසිසේත්ම අමතක කළ නොහැක. සුදතුම් වරම් /දීමනා/එල නැමැති මාවත ඔස්සේ විවෘත වන මම " ශුද්ධාත්ම පන්නරය දෙසද අප අවධානය මෙසේ යොමු කරමු"
ශුද්ධවූ පාවුලු තුමා විසින් කොරින්ති සංඝය වෙත යවන ලද පළමු හසුන ඔස්සේ අප සාකච්ඡාව ඇරඹීම ඉතාමත් ඵලදායකය.

**කොරින්ති ලිපිය (1214 පරිච්ඡේද)**

" විවිධාකාර දීමනා ඇතත්, සිටින්නේ එකම ශුද්ධාත්මයාණෝය. විවිධාකාර සේවා ඇතත්, සිටින්නේ එකම ස්වාමීන් වහන්සේය. විවිධාකාර දේව බල ක්‍රියා කරතත් සිටින්නේ සියල්ලන් තුළ ක්‍රියා කරන එකම දෙවියන් වහන්සේය. අන්‍යෝන්‍යව එකිනෙකාට ආත්මයාණන්ගේ ප්‍රකාශ වීමක් දී ඇත. කෙනෙකුට ආත්මයාණන් මගින් උපදෙස් දීමේ ප්‍රඥාවද, තවත් කෙනෙකුට එම ආත්මයාණන් මගින්ම ධර්මය පහදා දීමේ ඥානයද දී ඇත. අන් කෙනෙකුට ආත්මයාණන් තුළ විශ්වාසයද, එම ආත්මයාණන් තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ වරමද දී ඇත. තවත් කෙනෙකුට හාස් කම් කිරීමේ බලයද තවත් කෙනෙකුට දිවැසි වැකි කීමේ බලයද, තවත් කෙනෙකුට ආත්ම විසඳීමේ හැකියාවද, තවත් කෙනෙකුට විවිධ ශබ්දවලින් කතා කිරීමේ පුළුවන්කමද, තවත් කෙනෙකුට එම ශබ්ද පහදා දීමේ ශක්තියද දී ඇත. මේ සියලු දීමනා තමන් කැමති පරිදි වෙන් වෙන් වශයෙන් එකිනෙකාට බෙදා දෙන්නේ එකම ආත්මයාණන් වහන්සේය. ඒ හෙයින් ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වන්නාහුය. මෙසේ දෙවියන් වහන්සේ පළමු කොට ප්‍රේරිතයන්ද, දෙවනුව දිවැසිවරයන්ද, තුන්වනුව ගුරුවරුන්ද, ඉන්පසු හාස්කම් කරන අයද සුව කිරීමේ වරම ලත් අයද, උපකාර කරන්නන්ද, පරිපාලනය කරන්නන්ද, විවිධ ශබ්ද ව්‍යවහාර කරන්නන්ද සභාවේ පිහිටුවා වදාළ සේක. සියල්ලෝම ප්‍රේරිතයෝද? සියල්ලෝම දිවැසිවරයෝද? සියල්ලෝම ගුරුවරුද ? සියල්ලෝම හාස්කම් කරන්නෝද? සුව කිරීමේ වරම සියල්ලන්ටම තිබේ ද? සියල්ලෝම විවිධ ශබ්ද ව්‍යවහාර කරත් ද? සියල්ලෝම ශබ්ද පහදා දෙන්නෝද? මේවාට වඩා උතුම් දීමනා කෙරෙහි අතිශයින් ආශාවන්න. දැන් මම ඔබට වඩාත් විශිෂ්ඨ මාර්ගයක් පෙන්වමි" (1 කොරින්ති 12:1-31)

දීමනා විවිධාකාර වුවද ශුද්ධාත්ම බලය සම්බන්ධව මෙයින් අරුත් ගැන්වෙන අතර ඔවුන් වහන්සේ කරණකොට ගෙන අප ජීවිත ශුද්ධාත්ම බලයෙන් පොහොනි වෙන බවද සිහිපත් කරනු ලබයි.

" ඔබ එක සිතින්, එක මුවින් ඔබගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පිය වූ දෙවියන් වහන්සේට ගෞරව කරන පිණිස, ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශය ලෙස ඔබ එකිනෙකා සමග එක්සිත්ව විසීමට, ඉවසිල්ලේ හා ධෛර්යයේ උල්පත වූ දෙවියන් වහන්සේ ඔබට වරම් දෙන සේක්වා" (රෝම 15:5-6)

අප ලබන අධ්‍යාත්මික දීමනා වල විවිධත්වය මෙන්ම ඒකත්වය සම්බන්ධවද පැහැදිලි වාර්තාවක් ලෙස ඉදිරිපත් වී ඇත. තවද දීමනා මත කිතුනු ජීවිත අවතක්සේරු නොවිය යුතු බවද තවදුරටත් පැහැදිලිය. ශුද්ධාත්ම දීමනා වලට නතුවන අය තුළ කිසිසේත්ම අන් අයව හෙළා දැකීමේ ප්‍රවණතාවයක් ජනිත විය නොහැක.

"ඒ නිසා නුඹ මට ඕනෑ නැතැයි අත අමතා ඇසට වත්, නුඹලා මට ඕනෑ නැතැයි පා අමතා හිසට වත් කිරිමට නොහැකිය" ( 1 කොරින්ති 12:21)

ඇස - සංකේතවත් වනුයේ දර්ශන දකින ක්‍රිස්තියානි ජනතාව විය හැක.

අත - එදිනෙදා ජීවිත ගමන තුළ යම් සේවයක් කරන අය ලෙස අර්ථකථනය කළ හැක.

හිස- නායකත්වය තුළ සිටින හෝ නායකත්වය දරන්නට සුදුසු අය ලෙස

විග්‍රහ කළ හැක.

පාදය - සුවිශේෂ දීමනා නොලැබ සිටින සාමාන්‍යය කතෝලික ජනතාව යයි සිතිය හැක. තවද 12:22, දුර්වල යැයි හඳුන්වනු ලැබුවේ සංඝය තුළ ජීවත්වන වඩාත් දුර්වල සැදැහැවතුන් ලෙස නම් කළ හැක.

**අපෝස්තුළුවරු :**

උත්ථානවූ කිතු සමිඳුන්ට සාක්ෂි දරණ ඔවුන් වහන්සේ විසින්ම යවනු ලැබූ අය ය. " ඉන්පසු උන් වහන්සේ ජාකොබ්ටද අනතුරුව සියලු ප්‍රේරිතයන්ටද දර්ශනය වූ සේක" (1 කොරින්ති 15:7)

**දිවැසිවරු :**

දිවැසිවරුන්ව මින් අනතුරුව පෙළ ගස්වා ඇති බව අපි දනිමු " දිවැසිවර ආනුභාසම්පන්න භාවය" ගැනද මුල් කිතුනු සභාවේ අවධානය යොමු වූ බවද නොරහසකි.

**ගුරුවරු :**

" අන්තියෝකියේ පිහිටි සභාවෙහි දිවැසිවරුද ගුරුවරුද සිටියහ. එනම්, බාර්ණබස් සහ නිගර් නම් සිමියොන්ද, සිරේනියේ ලුසියස්ද යුව රජ වූ හෙරෝද් සමග ඇති දැඩි වූ මානයින්ද සාවුල් ද යන මොහු ය " (ක්‍රියා 13 :1)

"එවිට උන් වහන්සේ ඔවුන්ට කථා කොට, එහෙයින් ස්වර්ග රාජ්‍යයෙහි ගෝලයකු බවට පත්වන යම් විනයධරයෙක් වේද, ඔහු සිය ගබඩාවෙන් නවින දේත් පැරණි දේත් පිටතට ගෙනෙන ගෘහ මූලිකයෙකුට සමාන යැයි වදාළ සේක" (මතෙව් 13:52)

" මා මිනිසුන්ගේ ද දේව දූතයන්ගේද භාෂාවලින් කතා කරතත් ප්‍රේමය මට නැත්නම් මම ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට හෝ සමාන වෙමි. දිවැසි වැකි දෙසීමේ වරම මට තිබුණත්, සියලු අභිරහස් දරන අවබෝධයද සකල ඥානයද මට ඇතත්. කඳු සෙලවීමට තරම් බලවත් විශ්වාසයක් මට තිබුණත් ප්‍රේමය මට නැත්නම් මම හිස් තැනැත්තෙක්මි. ප්‍රේමය ඉවසිලිවන්තය. කරුණාවන්තය. ප්‍රේමය ඊර්ෂ්‍යා වන්නේ නැත. පාරට්ටු කරගන්නේ නැත. උඩගු වන්නේ නැත. ප්‍රේමය අවිනීත නොවේ. ආත්මාර්ථකාමී නොවේ. හනික නොකිපේ. නපුර සිතේ

ධාරණය කර නොගනියි. ප්‍රේමය අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී, හරි දේ ගැන ප්‍රීති වෙයි. ප්‍රේමය සියල්ල උසුලයි. ප්‍රේමයේ විශ්වාසයට ඉමක් නැත. බලාපොරොත්තුවට නිමක් නැත. ඉවසීමට අගක් නැත. ප්‍රේමය සදාතනිකය. දිවැසිවැකි වුවද පහව යන්නේය. විවිධ ශබ්ද හා දෙසුම් වුවද නිම වන්නේය. ඥානය වුවද නැති වන්නේය. මන්ද අපේ ඥානය අසම්පූර්ණය. දිවැසි වැකි දෙසීමද අසම්පූර්ණය. සම්පූර්ණ දේ පැමිණි විට අසම්පූර්ණ දේ පහව යන්නේය. ඇදහිල්ල බලාපොරොත්තුව හා ප්‍රේමය සදහටම පවතින ධර්මතා තුනකි. මෙයින් ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමයයි" (1 කොරින්ති 13:1-13)

මෙහි දී ප්‍රේමයේ අද්විතිය ස්වරූපය ඉස්මතු වේ. ප්‍රේමය රහිත කිසිදු දීමනාවක ප්‍රයෝජනයක් නොමැති බව අවධාරණයෙන් මතක් කරයි.

" ප්‍රේමය ඔබේ පරමාර්ථය කර ගන්න. ආධ්‍යාත්මික දීමනා ප්‍රධාන කොට දිවැසි වැකි දෙසීම, අත්කර ගැනීමට වීර්ය කරන්න. අන් භාෂා කථනය කරන්නා මිනිසුන්ට නොව දෙවියන් වහන්සේට කථා කරයි. ඔහු ආත්මයාණන් කරණ කොටගෙන අභිරහස් කතා කරන බැවින්, කිසිවෙකුට ඔහු තේරුම් ගත නොහැක. එහෙත් දිවැස් වැකි දෙසන්නා, අභිවෘද්ධිය ද ධෛර්යය හා සැනසීම ද දෙන වචන මිනිසුන්ට කථා කරයි. අන් භාෂා කථනය කරන්නා තමාගේම අභිවෘද්ධිය සලසා ගනී. දෙවියන් වහන්සේගේ වචනය නික්ම ගියේ ඔබ කෙරෙන්ද ? නොහොත් එය පැමිණියේ ඔබ වෙත පමණක් ද ? යමෙක් දිවැස් වැකි දෙසන්නෙකු හෝ අධ්‍යාත්මික කුසලතා ඇත්තෙකු හෝ යැයි සිතන්නේ නම් ඔබට ලියන කරුණු ස්වාමීන් වහන්සේගෙන් එන ආඥාවක් බව ඔහු ඒත්තු ගනීවා! යමෙක් මේ කරුණ නොසලක්නේ නම් ඔබද ඔහු නොසලකා හැරිය යුතුය. එබැවින් සහෝදරවරුනි, දිවැස් වැකි දෙසීමට තදින් ආසා වන්න අන් භාෂා කථනය ආසා නොකරන්න. සියල්ල විනීතව ද විධිමත්වද කළ යුතුය (1 කොරින්ති 14 :1-40)

දිවැසිවර කාර්යය මෙන්ම අන්‍ය භාෂාවලින් කතා කිරීම අරබයා යොමු වූ සාකච්ඡාවක් ලෙස නම් කළ හැක. මෙහි දී වඩාත් වැදගත් වනුයේ දිවැසිවර කාර්යයද, එසේත් නැත්නම් අන්‍ය භාෂාවලින් කතා කිරීමද යන්න කොරින්ති සංසයේ ඉස්මතු වන ලද ප්‍රශ්නයක් වූ බැවින් ශුද්ධවූ පාවුලු තුමාගේ අනුශාසකත්වය අනුව මෙම දීමනාවන් (ශුද්ධාත්ම දීමනා නිසා) නතු කරලීමේ අවැසිතාවය පෙන්වා දෙන ලදී.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 - ලෝකය තුළ ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය පිළිබඳව කතිකාවතක් ගොඩනගන්න.

- ශුද්ධාත්මයානන් හා සාක්ෂි දැරීම පිළිබඳව සාකච්ඡා කරන්න

**මූලාශ්‍රය** - මූලාරම්භක දේව ප්‍රසාද නිධාන, ඉන්ද්‍රා රත්නසිරි පියතුමා

නිපුණතාව 10.0 : **කිතුනු ජනවන්දනාවට සහභාගී වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි.**

**නිපුණතා මට්ටම 10.1** : **මිනිසා ගැන හා සමාජය පිළිබඳ කිතුනු චින්තනය**

**කාලච්ඡේද** : **කාලච්ඡෙද 16**

**ඉගෙනුම් ඵල** :

- මිනිසකු වී මෙලොව උපත ලැබීම දෙවි සමිඳාණන්ගෙන් ලද උතුම් තිළිණයක් බව දැන, මිනිස්කමේ උදාරත්වය රැකෙන අයුරින් කටයුතු කරයි.
- ලෝකයේ පැවැත්ම හා සමාජය ගොඩනැඟීමෙහිලා කාන්තාවන්ගේ භූමිකාව හා දායකත්වය අවබෝධ කරගෙන කාන්තාවන් ගරුත්වයෙන් සළකයි (කාන්තාවක වීම ගරුත්වයෙන් සළකයි)
- මිනිසා තනි තනිව ජීවත් වන්නකු නොවන බව වටහා ගෙන සමස්ත සමාජ වටපිටාව සමඟ සුහද සබඳතා ගොඩනඟා ගනියි.
- සමාජයේ වර්ධනය හා දියුණුව පිණිස කටයුතු කිරීමට මිනිසාට දේව කැඳවීමක් ලැබී ඇති බව වටහාගෙන තම ජීවිත තත්ත්වය හා සමාජ පරිසරය තුළ පොදු යහපත් සහ උන්නතිය වෙනුවෙන් කටයුතු කරයි.
- මානව සංවර්ධනය , යහපැවැත්ම, සමාජ උන්නතිය යන ක්‍ෂෙත්‍ර කෙරෙහි දැනුම්වත් වී කිතුනුවකු ලෙස ඒ සඳහා තම උපරිම දායකත්වය සහ සහභාගිත්වය ලබා දෙයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**10.1.1 මිනිස් බවේ ගරුත්වය**

සෑම මනුෂ්‍යයකුටම, මිනිසකු ලෙස මෙලොව බිහිවීම කරුණකොට සවභාවයෙන්ම විශේෂිත ගරුත්වයක් සහ උත්තරිතර බවක් හිමිවේ. ලොව පවතින සෑම ප්‍රධාන ආගමකම පාහේ මනුෂයත්වය ලැබ මෙලොවට බිහිවීමේ දුර්ලභ වටිනාකම සහ උදාරත්වය ගැන විවිධ දෘෂ්ඨිකෝණ වලින් ගෙන හැර දැක්වේ.

මනුෂ්‍යාගේ පැවැත්ම, වර්ධනය සහ සමාජ ක්‍රියාකාරීත්වය ගැන විමසිල්ලෙන් බලන කළ, ලෝ පහළ වන සියලු සත්ත්වයන්, ජීවින් අතර බුද්ධියෙන් හා ප්‍රඥාවෙන් අනූන, තියුණු කල්පනා ශක්තියකින් හා මනා සන්නිවේදන රටාවකින් පිරිපුන් උසස්තම සත්ත්වයා මිනිසා බව තහවුරු වේ.

**ශුද්ධවූ බයිබලීය චින්තනය**

ශුද්ධවූ බයිබලීය චින්තනයට අනුව මනුෂ්‍යයකු ලෙස මෙලොව බිහිවීමේ විශේෂිත වටිනාකමක් හා ගෞරවයක් ඇත. දෙවිඳුන්ගේ ස්වරූපයට හා සමානකමට මවන ලද මනුෂ්‍යත්වයේ උදාරත්වය සහ උත්තරීතර බව සමස්ත ශුද්ධවූ බයිබලය පුරා පුන පුනා

ගලා යයි. මිනිස් බවේ උත්තරීතර බව පිළිබඳ කිතුනු දැක්මට ද ශුද්ධ වූ සහා ඉගැන්වීම්වලටද පාදක වන්නේ මෙම ශුද්ධ බයිබලීය චින්තනයයි.

ශුද්ධ වූ බයිබලීය චින්තනයට ද කිතුනු ඇදහිල්ලට ද අනුව, මිනිසා දෙවියන් වහනසේගේ ස්වරූපයට හා සමානත්වයට මවන ලද මැවිල්ලකි. " අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු" (උත්පත්ති 1:26) " දෙවියන් වහන්සේ තම සවරූපය අනුව මිනිසා මැවූ සේක : දෙවියන් වහන්සේගේම සවරූපය අනුව ඔවුන් මවා වදාළ සේක" (උත්පත්ති 1:27) එහෙයින්, දෙවියන් වහන්සේගේ සියලු මැවිල් අතර අග්‍ර ස්ථානය ද කිරුළ ද හිමි වන්නේ මනුෂ්‍යයාටය.

" මිනිසා ගැන සිතන්නට තරම් ඔහු කවරෙක් ද ? මිනිසා ගැන සළකන්නට තරම් ඔහු සතු වටිනාකම කුමක්දැයි මට සිතෙන්නේය. එහෙත්, ඔබ මිනිසා මවා ඇත්තේ දෙවිඳුන්ට පමණක් දෙවැනි වන ලෙසින්ය. තෙද යස කිරුළක් ඔහු හිස පළඳන ලද්දේය. මැවූ හැම දේ ඔහුට යටත් කළ සේක" (ගීතාවලිය 8:4-6)

දෙවි සමිඳාණන් වහන්සේ මනුෂයා මැවීමේදී බුද්ධිය, නිදහස් කැමැත්ත සහ අමරණීය ආත්මය යන තිළිණය මනුෂ්‍යයාට දුන් සේක. වෙනත් මැවිලිවලට නොලැබුණු, මනුෂ්‍යයාට පමණක් ලැබුණු මෙම උත්තරීතර බව මනුෂ්‍යත්වයේ වටිනාකම සහ උදාරත්වය ඉස්මතු වීමට හේතු වන බව පැහැදිලිය. මෙම ශුද්ධ වූ බයිබලීය චින්තනය අනුව සියලු මැවිලි (ජීවීන්) අතර ශ්‍රේෂ්ඨතම වන්නේ ද බුද්ධියෙන් හා ප්‍රඥාවෙන් අනූන වන්නේ ද තියුණු කල්පනා ශක්තියකින් හා මනා සන්නිවේදන රටාවකින් පිරිපුන් වන්නේද මනුෂ්‍යයයා. යන්න කිතුනු අපට අරුමයක් නොවේ. " තෙද යස කිරුළක් ඔහු හිස පළඳන ලද්දේය. මැවූ හැම දේ ඔහුට යටත් කළ සේක" යනුවෙන් ගීතාවලියේ සංගීතකරුවා මනුෂ්‍යත්වයේ උදාරත්වය ගැන උදන් අනමින් දෙවි සමිඳාණන් පසසන්නේ එහෙයිනි.

## බුද්ධිය

බුද්ධිය සහ ප්‍රඥාව, මනුෂ්‍යා වෙත ගලා එන්නේ සියලු ප්‍රඥාවේ උල්පත හා පූර්ණත්වය වන දෙවි සමිඳාණන්ගෙනි. වෙනත් මැවිලි වලට නොමැති, මිනිසා ලබා ඇති මෙම බුද්ධිය දේව සමාන කමේ ලක්ෂණයකි. බුද්ධිය නම් දේව තිළිණය භාවිත කරමින් මනුෂ්‍යා නව නිර්මාණ බිහි කරයි. එමඟින් නිර්මාණකරුවකු ලෙස දෙවිඳුන්ගේ මැවීමේ කාර්යයට ද හවුල් වෙයි. සත්‍ය සහ යහපත වන දෙවි සමිඳාණන් සොයා යාමටද ප්‍රඥාව විසින් මනුෂ්‍ය බුද්ධිය මෙහෙයවයි. එම ප්‍රඥාවෙන් පිරෙන්නට, ප්‍රඥාවේ උල්පත හා පූර්ණත්වය වන දෙවිඳුන් යැදිය යුතුය " ප්‍රඥාවත් , දැනගැන්මත්" (Wisdom & knowledge) ඉල්ලා සලමෙන් රජ දෙවි සමිඳුන්ට කන්නලව් කළ අයුරු කදිම නිදසුනකි. (2 වංශාවලිය 1:10) බුද්ධිමත්ව කටයුතු කිරීමට නම් ප්‍රඥාව අවශ්‍යය. එම ප්‍රඥාව ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලැබෙන දීමනාවක් බව ශුද්ධ වූ බයිබලීය චින්තනය අපට උගන්වයි.

**නිදහස් කැමැත්ත**

මනුෂ්‍යයා ලද නිදහස් කැමැත්ත හෙවත් නිදහස් හෘදය සාක්ෂිය ඔහු තුළ වූ දෙවියන් වහන්සේගේ සමානකමේ සළකුණකි. මනුෂ්‍යයා නිදහස් කැමැත්තෙන් ක්‍රියා කිරීම දෙවියන් වහන්සේගේ අභිමතය විය. හෘදය සාක්‍ෂ්‍යයේ හඬට සවන්දී යහපත හා සත්‍යය අවබෝධ කරගෙන දෙවිඳුන් කරා ගමන් කිරීම උන්වහන්සේගේ අභිප්‍රාය විය. " ආරම්භයේ දී උන්වහන්සේ මිනිසා මැවූ සේක. ඔහුගේම තීරණවලට ඉඩ දුන් සේක. හැසිරීමට ඔබ තුළ බලයක් ඇත්තේය. ඔබ ඉදිරියෙහි උන් වහන්සේ ගින්න ද ජලයද තැබූ සේක. අත දිගු කර ඔබ වඩා කැමති දේ තෝරා ගන්න. මිනිසා අබිමුව ජීවිතයද මරණයද ඇත්තේය. මෙයින් මිනිසාට ඔහු වඩා කැමති දේ දෙනු ලබන්නේය" (උපදේශකයා 15:15-17)

**අමරණීය ආත්මය**

මිනිසා මවනු ලැබුවේ ශරීරයක් පමණක් නොව ආත්මයක් ද ඇතිවය. එමඟින් මනුෂ්‍යත්වයේ දේව පිළිඹිබුව මනාව ප්‍රකට වේ" ''දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළූසේක" (උත්පත්ති 2:7) ශරීරයට ආත්මයද එක්විය. ශරීරය මරණයෙන් පසු දිරා ගියද ආත්මය අමරණීයය. එම ආත්මය, මරණින් පසු, නැවත දෙවි සමිඳාණන් හා එක්වීම දේව අභිප්‍රායයි. මනුෂ්‍යාගේ සදාතන ආනන්දය ද එයය. " දෙවිඳුන් කෙරෙහි, ජීවමාන දෙවිඳුන් කෙරෙහි මාගේ සිත පිපාසා වන්නේය. මම කවදා අවුත් දෙවිඳුන් ඉදිරියේ පෙනී සිටීම් ද? (ගීතාවලිය 42:2)

ශුද්ධ වූ පාවුලු අපෝස්තුලුතුමන්ගේ දේව ධාර්මික චින්තනය මනුෂ්‍යයා තුළ ඇති අමරණීය ආත්මය පිළිබඳ වඩා පැහැදිලි කරයි. මනුෂ්‍යයා තුළ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වැඩ වසන හෙයින් මිනිස් සිරුර දෙවියන් වහන්සේගේ මන්දිරයය. එහෙයින් එය විශුද්ධය. " ඔබ දෙවියන් වහන්සේගේ මන්දිරය බවත්, ඔබ තුළ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වැඩ වසන බවත් නොදන්නහුද ? කිසිවකු දේව මන්දිරය වැනසුවොත් දෙවියන් වහන්සේ ඒ තැනැත්තා වනසන සේක. දෙවියන් වහනසේගේ මන්දිරය විශුද්ධය. ඒ මන්දිරය නම් ඔබය " (1 කොරින්ති 3:16) එමෙන්ම, මනුෂ්‍යයාගේ ශරීරය වනාහි ශුද්ධාත්මයාණන් වහන්සේගේ මන්දිරයයි. " ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ , ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය බව ඔබ නොදන්නහු ද ? ඔබ ඔබටම අයිති නැත. ඔබ මිලයට ගත් අය වන්නහුය. එබැවින් ඔබගේ ශරීර දේව මහිමය සඳහා යොදවන්න. (1 කොරින්ති 6:9)

අකීකරුවීමේ පාපය නිසා දේව වරප්‍රසාදයෙන් ඈත්ව පාපයට වැටුණු දුබල මනුෂ්‍යයාට ගැලවීම දෙන පිණිස දෙවි සමිඳාණෝ මිනිස් බව ගෙන මනුෂ්‍ය කයක් දරා මෙලොවට වැඩියහ. " අප සමඟ ද වාසය කළේ ය" හෙවත් " ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක" (ජොහන් 1:14) යන ශුද්ධ වූ ලියවිලි පාඨය පසක් කරනුයේ

මාංශගතවීමේ අභිරහස මගින් මනුෂ්‍යත්වය උත්තරිතර බවට පත්කිරීමයි. එසේ මනුෂ්‍යත්වය තවත් උත්තරීතර බවට පත් කළ සමිඳාණෝ සිය සෙනඟ සමඟ වාසය කරන්නාහ. " අපි ජීවමාන දෙවියන් වහන්සේගේ මන්දිර වෙමු. ඒ බව දෙවියන් වහන්සේ මෙසේ වදාළ සේක" " මම මොවුන් සමඟ වාසය කරන්නෙමි. ගැවසෙන්නෙමි, මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වෙමි. ඔව්හු මාගේ සෙනඟ වන්නෝය" (2 කොරින්ති 6:16)

දුබල, දුර්වල පව්කාර මනුෂ්‍යයාට ගැලවීම ගෙන දී පාරිශුද්ධත්වයට පත් කළේ. දේව පුත්‍රයාණන් වූ කිතු සමිඳාණන්ගේ ශ්‍රී රුධිරයෙන්මය " උන්වහන්සේ එළුවන්ගෙත්, වස්සන්ගෙත් ලෙයින් නොව, තමන්ගේම ලෙයින් අප උදෙසා සදාතන විමුක්තිය ලබා සදහටම එක් වරක් ශුද්ධාස්ථානයට ඇතුළු වූ සේක" ( හෙබ්‍රෙව් 9 :12)

මේ අනුව බලන කළ, ශුද්ධවූ බයිබලීය චින්තනයට අනුව, මනුෂ්‍යයාගේ උත්තරීතර බව, සියලු මැව්ලි අතර අග්‍ර ස්ථානය දරමින් දෙවි සමිඳුන් ඉදිරියේ දරන්නාවූ වටිනාකම මැනවින් පැහැදිළි වේ.

**ශුද්ධ වූ සභා ඉගැන්වීම්**

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ' වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව' ව්‍යවස්ථාව ආරම්භයේ දීම, එහි පළමු පරිච්ඡේදයේ (12-18) මනුෂ්‍යත්වයේ උසස් බව ගැන හා එම උසස් බව රැකිය යුතු ආකාරය ගැන අවධාරණය කරයි.

**මනුෂ්‍යත්වයේ උසස් බව**

- දෙවියන් වහන්සේගේ සමාන කමට මවන ලද හෙයින් සියලු මැව්ලි අතරෙන් මිනිසා උතුම් වේ.
- මිනිසා දෙවියන් වහන්සේගේම සවරූපයය.
- මිනිසා ප්‍රධාන වශයෙන් ශරීරයකින් හා ආත්මයකින් යුතුය.
- මිනිසා අභ්‍යන්තර සවභාවයෙන්ම සමාජීය සත්ත්වයෙකි.
- බුද්ධිය හා ප්‍රඥාව නිසා මිනිසා දෙවිඳුන්ගේ සිතුම් පැතුම් යනාදියට පංගුකාරයෙක් වෙයි. ඔහුගේ බුද්ධිමය ස්වභාවය පිරිපුන් වන්නේ ප්‍රඥාවෙනි.
- මිනිසාගේ උතුම්කම රදාපවතිනුයේ ඔහුටම විශේෂිත හෘදය සාක්ෂ්‍ය නිසාය. එය හේතුකොට දේවාධාරයෙන් යහපතට හා සත්‍යයට ඇදී යයි. අයහපතින් හා අසත්‍යයෙන් වැළකී සිටියි.
- නිදහස් කැමැත්ත දේව සමාන කමේ විශේෂ සළකුණකි. එය භාවිත කළ යුත්තේ දෙවිඳුන් සොයා ගොස් තම පූර්ණත්වය එතුමන් මඟින් ලබා ගැනීමටය.
- බුද්ධිය මිනිසා ලද දේව දීමනාවකි. එය නිර්මාණකරණයට යෙදවීමෙන් මිනිසා

මැවීමේ කාර්යයට දායක වී මැවිල්ල පූර්ණත්වය කරා ගෙන යාමට සහය වේ.

- ශරීරයකින් සහ ආත්මයකින් හෙබි මනුෂ්‍යයා පාපයේ වහල් බවේ බැමි වලින් මුදා ගන්නා පිණිස ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ජීවිතය පූජා කළ සේක.
- ශරිරය දෙවියන් වහන්සේ විසින් මැවූ හෙයින් ද අන්තිම දවසේදී එය නැවත නැඟිටවනු ලබන හෙයින්ද, එය යහපත් වූද, ගෞරවය ලැබීමට යෝග්‍යවූද දෙයක් වශයෙන් සැළකීම ඔහුගේ යුතුකමකි. ශාරීරික ජීවිතය පහත් කොට සැළකීම යුතු නොවේ. එහෙයින් මනුෂ්‍යයා තම ශරීරයේ දෙවියන් වහන්සේගේ මහිමය නඟාලිය යුතුය.

**කතෝලික සභා ධර්මෝපදේශය (ක.ස.ධ /c.c.c.)**

- මැවුම්කාරයාණන් වහන්සේගේ මැවිල්ලේ අග්‍රස්ථානය වන්නේ මනුෂ්‍යයාය (343)
- දැසට පෙනෙන සියලු මැවිලි අතරෙන් " මැවුම්කාරයාණන් දැනගෙන උන්වහන්සේට ප්‍රේම කළ හැක්කේ " (GS 23:3) මනුෂ්‍යයාට පමණි. එමෙන්ම, " දෙවියන් වහන්සේගේ මැවිලි අතරෙන් උන්වහන්සේ ඔහු නිසාම අධිෂ්ඨාන කළ මිහිපිට එකම මැවිල්ල" ද මනුෂ්‍යයා ය (356)
- දේව සමානකමට මවන ලද නිසාම, මනුෂ්‍යයා උත්තරිතර බව දරයි. ඔහු " දෙයක් ' නොව ' කෙනෙකි' හෙවත් ' පුද්ගලයෙකි' සව අවබෝධයෙන් හෙබි, සෙසු පුද්ගලයන් සමග සබඳතා පැවැත්විය හැකි ඔහුව, මැවුම්කරුවාණන්හට විශ්වාසයේ හා ආදරයේ ප්‍රතිචාරයන් දැක්වීමට ගිවිසුමේ ජීවිතයකටද කැඳවා ඇත. ඔහුට හැර වෙනත් කිසිදු මැවිල්ලකට එසේ ගිවිසුමේ ජීවිතයට ප්‍රතිචාර දැක්විය නොහැකිය ( 357)
- දෙවියන් වහන්සේ සියල්ල මවා වදාළේ මනුෂ්‍යයා සඳහා ය. (GS 12:1) එහෙත් මනුෂ්‍යයා මවා වදාළේ උන්වහන්සේට සේවය කිරීමට හා ආදරය කිරීමට හා සියලු මැවිල්ල නැවත උන්වහන්සේට ඔප්පු කිරීමටත් ය. (358)
- දේව සමානකමට මවන ලද මනුෂ්‍යයා, එකවිට ශරීරයකින් ද ආත්මයකින්ද හෙබිය " ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළු " (උත්පත්ති 2/7) හෙයින් මනුෂ්‍යයා සම්පූර්ණයෙන් සහ මුළුමනින් දෙවි සමිඳුන් අභිමතයකි. (362)
- මනුෂ්‍ය ශරීරය " දෙවියන් වහන්සේගේ ස්වරූපයට " පංගුකාර වෙයි. එහෙත් එය තවමත් මනුෂ්‍ය ශරීරරයකි. මන්ද ආත්මයෙන් ප්‍රාණවත් වී, ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මන්දිරයක් වීමට සම්පූර්ණ පුද්ගලයා කැඳවා ඇති හෙයිනි (364)
- ශුද්ධ වූ සභාව උගන්වන පරිදි සෑම ආත්මයක්ම දෙවියන් වහන්සේ විසින් මවනු විනා එය දෙමාපියන්ගේ " නිෂ්පාදනයක්" නොවේ. එම ආත්මය සදාකාලිකය. මරණයේදී ශරීරයෙන් වෙන් වුවද එය විනාශ නොවේ. අවසාන මාංශෝත්ථානයේදී එම ආත්මය ශරීරය සමග නැවත එක් වේ. (366)

### 10.1.2 කාන්තාවන් පිළිබඳ කිතුනු චින්තනය

**පැරණි ගිවිසුම**

ශුද්ධවූ බයිබලයේ සඳහන් පරිදි දෙවියන් වහන්සේ ප්‍රථමයෙන් මිනිසා මවා, පසුව ඔහු බර නින්දකට පත් කර " ඔහු නිදා සිටියදී උන්වහන්සේ ඔහුගේ ඉල ඇට වලින් එකක් ගෙන " එම ඉල ඇටයෙන් "ස්ත්‍රියක මවා ඔහු වෙත ගෙනා සේක" (උත්පත්ති 2:21) **මැවීමේ ක්‍රියාවලියේ දී මිනිසාට පසු ස්ත්‍රිය මවනු ලැබුවද ස්ත්‍රිය කිසිසේත් පුරුෂයාට දෙවැනි නොවේ. දෙදෙනාම මවනු ලැබුවේ දේව සමානකමකටය. (උත්පත්ති 1:27) එහෙයින් පුරුෂයාද ස්ත්‍රිය ද අතර ඇත්තේ සමානත්වයකි. එකෙකු අනෙකාට වඩා උසස් නොවේ.**

පසුව දෙවියන් වහන්සේ ආශිර්වාදය දානය කළේත්, දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී පොළොව යටත් කරගෙන මැවිල්ල මත බලය පවත්වන්නැයි වදාළේත් පුරුෂයා හා ස්ත්‍රිය යන දෙදෙනාටමය. (උත්පත්ති 1:28)

" මිනිසා තනිව සිටීම සුදුසු නැත. ඔහුට සුදුසු සහකාරියක මවා දෙන්නෙමි " (උත්පත්ති 1 :18)

හෙබ්‍රෙව් පිටපතේ " මිනිසා තනිව සිටීම සුදුසු නැත " යන මුල් වචනාර්ථයෙන් අදහස් වනුයේ සමාජීය වශයෙන් තනිවීම හා අසරණවීම හෙවත් අසම්පූර්ණබවයි. එම අසම්පූර්ණ බව හා තනි බව පිරවීම සඳහා " සුදුසු සහකාරියක' ලෙස දෙවියන් වහන්සේ ස්ත්‍රිය පුරුෂයාට ලබා දුන් සේක. එහෙයින්, ස්ත්‍රිය වනාහි පුරුෂයාට බැල මෙහෙවරකම් කරන සේවිකාවක නොව පුරුෂයා සමගම ජිවිත ගමනේ නියැලෙන සමානත්වයේ සහකාරියකි. හෙබ්‍රෙව් අර්ථය ඉඟි කරන පරදි " සහකාරිය' යනු යම් දෙයක් සම්පූර්ණත්වයට පත් කරන්නියකි. තනිව සිටින පුරුෂයාගේ තනි බව මැකෙන්නේ, සම්පූර්ණත්වය ඇති වන්නේ සතුන්ගෙන් , ගස් කොළන් වලින් නොව ' සහකාරිය ' වන ස්ත්‍රියගෙනි.

"මිනිසා බර නින්දකට පත් කළ සේක " (උත්පත්ති 2 :21)

මිනිසා බර නින්දකට පත් කර ඔහුගෙන් ගත් ඉල ඇටයකින් ස්ත්‍රිය මැවීමෙන් අදහස් කරනුයේ සමාජීය වශයෙන් අසම්පූර්ණ මිනිසා ස්ත්‍රිය මගින් සම්පූර්ණත්වයට පත් කිරීමකි. විවාහයේ සක්‍රමේන්තු ස්වභාවයද මින් වඩා පැහැදිලි ය.

'' ඔහුගෙන් ගත් ඉල ඇටයකින් ස්ත්‍රියක මවා ''

බයිබල් විශාරදයන්ගේ මතය අනුව ඉල ඇටය සංකේතවත් කරනුයේ ලේ නෑදෑකමක් හා බිඳිය නොහැකි සමීප සම්බන්ධතාවකි. මිනිසාගේම ඉල ඇටයකින් මවන ලද ස්ත්‍රිය මිනිසාගේම මාංශයයි, ඔහුටම බැඳී පවතියි. පළමුවරට ස්ත්‍රිය දකින මිනිසා ඇයට දක්වන ප්‍රතිචාරයෙන් එය වඩා පැහැදිළි වේ (උත්පත්තිය 2 : 23)

"ඇට "ස්ත්‍රී" යයි කියනු ඇත.

මැවීමේ ක්‍රියාවලියෙන් පසු මවන ලද සියලු සතුන්ද අනෙක් සියලු පක්ෂීන් ද මත නම් තබන පිණිස දෙවියන් වහන්සේ මිනිසාට බාර කළසේක. නම් තැබීම, එම මැවිලි මත බලය හා ආධිපත්‍ය පැවැතීමේ සංකේතයකි. එහෙත් මිනිසා සෙසු මැවිලවලට නම් තැබීම සිදු කළ ආකාරයේ නම් තැබීමක් ස්ත්‍රීය සම්බන්ධයෙන් දක්නට නැත. ඒ වෙනුවට "ඇයට ස්ත්‍රී ' යයි කියනු ඇත. යන කර්ම කාරක සඳහනක් ඇත. ශුද්ධ වූ බයිබලයේ කර්මකාරකය ඉඟි කරනුයේ දෙවියන් වහන්සේගේ කර්තෘත්වයයි. එබැවින් ස්ත්‍රීය පුරුෂයාගේ ආධිපත්‍යයට යටත් දාසියක නොව පුරුෂයාගේ සම්පූර්ණත්වයට ඉවහල් වන සහකාරියන යන බයිබලීය චින්තනය අවධාරණය කරයි.

**නව ගිවිසුම**

ගැලවීමේ ඉතිහාසය තුළ ගැලවීමේ කාර්යයට විවිධාකාරයෙන් දායක වූ කාන්තාවන් රාශියකගේ උදාර චරිත දක්නට ලැබේ. ඒ අතර පව්කාර මනුෂ්‍ය සංහතිය පාපයෙන් මුදා ගැලවීම ගෙන දීමට මෙලොවට වැඩි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ බිහිවීම සඳහා තෝරාගනු ලැබූ භාග්‍යවත් නිත්‍ය කන්‍යාමරිය මාතාවන්ගේ චරිතය සුවිශේෂීය. ඕ තොමෝ වනාහි " කාලය සම්පූර්ණ වූ කල " දෙවියන් වහන්සේ විසින් තෝරාගත් " ස්ත්‍රීයකි" (ගලාති 4 : 4)

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දූත සේවාවේ දී උන්වහන්සේ අනුගාමීවූ, සහය වූ ඇප උපස්ථාන කළ, සමීපව සිටි සුවය සහනය අත් දුටු කුරුසිය පාමුල සිටි ආදී බොහෝ කාන්තාවන් ගැන සුබාරංචි පොත්වල සඳහන් වේ. එමෙන්ම උත්ථානයේ සුපුවත අපෝස්තුලුවරුන් වෙත ගෙන යාමට තෝරා ගනු ලැබුයේ ද කාන්තාවකි.

මුල් කිතුනු සභාවේ, ධර්මදූත සේවාවේදී අපෝස්තුලුවරුන්ට සහය වූ කාන්තාවන් ගැන ද ක්‍රියා පොතේ හා සංදේශවල සඳහන් ය.

ශුද්ධ වූ පාවුලු අපෝස්තුලුතුමන් පවසන පරිදි සියල්ලන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ එක් කෙනෙකු මෙන් සිටින නිසා කිසිදු භේදයක් නැත" ස්ත්‍රී පුරුෂ භේදයවත් නැත. (ගලාති 3:28)

මේ අනුව ශුද්ධ වූ බයිබලයේ සඳහන් දැක්ම මත ගොඩ නැගුණු කිතුනු චින්තනය ස්ත්‍රීයද, පුරුෂයා මෙන් ගරුත්වයෙන් හා සමානත්වයෙන් සළකයි.

**සභා ඉගැන්වීම්**

"සමස්ත සමාජ ජීවිතයෙහි ලා අද වනිතාවෝ ඉතා උද්යෝගීමත් අයුරින් සහභාගි වෙති. එම නිසා ඔවුන් සභාවේ අපෝස්තලික සේවාවෙහි ද නියැලී විවිධ සේවාවන්හි පංගුකාර වීම වැදගත් වෙයි " (ගිහි ධර්මදූත සේවාව 09.දෙවන වතිකාන කතිකාව ) .

"සකල මනුෂ්‍යයන් තුළ දිලෙන දේව ස්වරූපයට නිසි ගරුත්වය ලැබෙන පිණිස වනිතාවන් සියලු වෙනස්කම් හා ප්‍රභේදකරණීය බලපෑම් වලින් මුදාගැනීම සඳහා, යෝග්‍ය දේව මෙහෙවර සේවාව දියත් කිරීම අප කාගේත් යුතුකම වෙයි " (ෆමිලියාරිස් කොන්සොර්ත්සිඔ 24, )

"මිනිසා හා ස්ත්‍රීය මැවීම දේව අභිමතය විය. මනුෂ්‍යයන් වශයෙන් සම්පූර්ණ සමානත්වයෙන්ද "පුරුෂයා" " ස්ත්‍රීය" ලෙස තමන්ට ආවේනික සවභාවයෙන්ද දෙදෙනාටම මැවුම්කාරයාණන් වන දෙවියන් වහන්සේගෙන් ලැබෙන උසස් බවත් ගරුත්වයත් හිමිවේ. දෙදෙනාටම එක සමාන උත්තරීතර බවක් හිමි ය. එය " දේව සමානකම වේ " ක.ස.ධ 369

**10.1.3 මිනිසාගේ සමාජ ජීවිතය**

දෙවියන් වහන්සේගේ සියලු මැවිලි අතර දේව සමානකමට මවන ලද, උත්තරීතර මැවිල්ල වන මිනිසා සමාජීය සත්ත්වයකු බව ශුද්ධ වූ බයිබලය අපට පවසයි. " මිනිසා තනිව විසීම සුදුසු නැත" (උත්පත්ති 2-18) මැවීමේ ක්‍රියාවලියේ දී මැවුම්කාර දෙවියන් වහන්සේගේ අභිමතය වූයේ මිනිසා තනිව, හුදකලාව ජීවත්වීම නොව ස්ත්‍රීය හා පුරුෂයා ලෙස පවුලක් ව ජීවත්වීමය, සබඳතා ගොඩනඟා ගැනීමය.

ඕනෑම මිනිස් සමාජයක කුඩාම ඒකකය වනුයේ පවුලයි. මිනිසකු හා ස්ත්‍රීයක අතර සිදුවන විවාහය පවුල් සංස්ථාවේ පදනම වේ. ශුද්ධ වූ බයිබලීය චින්තනයට අනුව , ආදම් ඒව, යන ආදී මව්පියන් වූ පළමු මිනිසා සහ ස්ත්‍රීය සමාජීය වශයෙන් පවුලක් ලෙස ජීවත්වීම දේව අභිමතය විය. තනිව සිටි මිනිසාට සහකාරියක ලබා දුන්නේ එම සමාජීය ජීවිතයේ අර්ථය සම්පූර්ණ වීමටය. තනිව සිටි මිනිසා - ආදම් සම්පූර්ණත්වය ලැබුවේ තමන් හා සමාන වූ ස්ත්‍රීය - ඒව නිසාය.

ගැලවීමේ ඉතිහාසය පුරා දිග හැරෙන මානව සංහතියේ කතා පුවත තුළ මනුෂ්‍යයාගේ සමාජ ජීවිතය හා බැඳුණු, ඒ මත ගොඩනැගුණු විවිධ අත්දැකීම් හා සිද්ධි විස්තර කෙරේ. ඒ හැම අත්දැකීමකම පෙනී යන සුවිශේෂී ලකුණක් වනුයේ මනුෂ්‍යයා සමාජයක් ලෙස දෙවියන් වහන්සේ අත්දැකීම හා සමාජීය වශයෙන් සිදුවන දේව අනාවරණයයි, දෙවියන් වහන්සේ මවා වදාළ මිනිසා තනි මිනිසෙකු වුවද ස්ත්‍රීය නිසා සම්පූර්ණත්වය ලබා පවුලක් බවට පත්වී පවුල, දරු පරපුරක්ද, ගෝත්‍රයක් ද, පසුව ගෝත්‍ර දොළසකින්

තෝරාගත් ජනතාවක් ද වී එය සියලු භේද ඉක්මවා එක් මානව පවුලක් දක්වා ගොඩනැගෙන අයුරු ඉතා අසිරිමත් ඓතිහාසික අත්දැකීමකි.

එහෙයින් මානව සමාජයේ තනි තනිව , වෙන් වී හුදකලාව ජීවත්වීමට මනුෂ්‍යයාට නුපුළුවන. මානව උදාරත්වය වඩා තීව්‍ර වනුයේ මිනිසා සමාජීය වීම මතය. එම නිසා මිනිසා දේව ප්‍රේමයෙන් මෙන්ම ගැඹුරු සහෝදර ප්‍රේමයකින් ද වෙළී ජීවත් විය යුතු ය.

මිනිසා සම්පූර්ණවන්නේ දෙවිඳුන් හා අන්‍යයන් සමඟ සබඳතා ගොඩනගා ගන්නා තරමටය. මිනිසා උත්තරීතර මැවිල්ල වන හෙයින් සදාචාරය හා වටිනාකම් මත ජීවත්විය හැක්කේ ඔහුට/ඇයට පමණි. මන්ද 'බුද්ධිය, නිදහස් කැමැත්ත හා අමරණීය ආත්මය ' නැමැති තිළිණය මිනිසා ලබා ඇත.

නිදහස් කැමැත්ත දේව දීමනාවක් වුවද තමන් කැමති ඕනෑම දෙයක් සිතූ සිතූ ලෙස කිරීමට බලපත්‍රයක් ඉන් නොලැබේ. එහෙයින් සමාජයේ යහපත වෙනුවෙන් කටයුතු කිරීම, සදාචාරාත්මක ජීවිත පිළිවෙතක නියැලීම ස්වභාවයෙන්ම මනුෂයයාට පැවරෙන වගකීමකි, යුතුකමකි. ඉන් මිනිසා තුළ ඇති දේව සමානකම හා ස්වරූපය පිළිඹිබු වෙයි.

මේ අනුව බලන කළ, සමාජීය ජීවිතයක් සඳහා එකිනෙකා යොමු කරන්නාවූ 'ප්‍රේමය' නම් ධර්මගුණය උතුම් වන්නේ ය. දෙවියන් වහන්සේ වෙත ප්‍රේමය ද සමාජයේ අසල්වැසියන් වෙත ප්‍රේමය ද වෙන් කළ නොහැකි ය. " මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" සියලු මනුෂ්‍යයන් සමාජීය වශයෙන් එකාවන්ව ජීවත් වී දෙවියන් වහන්සේ හා ඒකත්වයෙන් බැඳීමට මිනිසාට ඇරයුමක් ලැබී ඇත. " ඔබ මා තුළ ද මා ඔබ තුළ ද සිටින්නාක් මෙන් ඔවුන් ද අප තුළ ඒකත්වයක් වන පිණිස .. " (ජොහන් 17-20)

සමාජීය ජීවිතයේ දී සහජීවනය වර්ධනය වී සෑම කෙනෙක්ම අනෙකාගේ මානව ගරුත්වය සැළකීම, මිනිස් අයිතිවාසිකම් සුරැකීම, පොදු යහපත මුල් කරගෙන කටයුතු කිරීම ඉතා වැදගත් ය.

මිනිසා තනිව විසීම දේව අභිමතය නොවන නිසා, සමාජීය ජීවිතය වර්ධනය කරගෙන එමගින් තමන් තුළ ඇති දේව සමානත්වය හා ස්වරූපය ලොවට පළ කිරීම ද අන්‍යයන්ට ගරු කරමින් පොදු යහපත වෙනුවෙන් කටයුතු කිරීමද ඔහු /ඇය විසින් කළ යුතු ය.

**සහා ඉගැන්වීම්**

" මනුෂ්‍යයා සවභාවයෙන්ම සමාජීය වන හෙයින් ඔහු අනුන් සමඟ එකතු වී ජීවත් වීම ද එකිනෙකාගේ ශුභ සිද්ධිය සඳහා වැඩ කිරීම ද අවශ්‍ය වන්නේ ය. (ලෝක සාමය Pacem in Terris)

" .... එහෙයින්, මනුෂ්‍යයා ඔහුගේ අභ්‍යන්තර ස්වභාවයෙන්ම සමාජීය සත්ත්වයෙකි. අවශේෂ අය සමඟ සම්බන්ධකම් නොමැතිව ජීවත් වීමට හෝ තමාගේ ශක්තීන් වර්ධනය කර ගැනීමට හෝ ඔහුට නුපුළුවන. . . " (වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව, 12)

" .... මනුෂ්‍යයාගේ කැඳවීම පූර්ණත්වයට පත් කරනු සඳහා සමාජීය ජීවිතය අත්‍යවශ්‍ය සාධකයක් වන්නේය..." (ක.ස.ධ 1886 )

**10.1.4 මානව සංවර්ධනය හා කිතුනු සහභාගිත්වය**

දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිසා, තනිව විසීම උන්වහන්සේගේ අභිමතය නොවිය. එබැවින් මිනිසා සමාජීය සත්ත්වයෙකි. මෙම ශුද්ධ වූ බයිබලීය දැක්මට අනුව කටයුතු කිරීමට බැඳී සිටින මිනිසාට (කිතුනුවාට) සමස්ත මානව පවුලේ වර්ධනය හා උන්නතිය උදෙසා කටයුතු කිරීමට වගකීමක් සහ යුතුකමක් මිනිසකු වීමේ (කිතුනුවකු වීමේ) සවභාවයෙන්ම හිමිවේ. එමගින් ඔහු ඇය දේව මැවිල්ල වැඩි වර්ධනය කිරීමට දායක වෙයි. සමාජයේ පොදු යහපත හා මානව සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම කිතුනු වගකීමක් බව ඉන් පැහැදිලිය.

**පොදු යහපත**

සමාජයේ පරම යුතුකම හා අරමුණ විය යුත්තේ එම සමාජයේ පුරවැසියන්ගේ පොදු යහපත සැලසීමයි. පොදු යහපත යනු " සමස්තයක් වශයෙන් සමාජයේ යහපත සහ අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකා හා සමාජය කෙරෙහි බැඳී සිටින තනි තනි පුද්ගලයන්ගේ යහපත සැලසීමයි" (ක.ස.ධ 1906) පොදු යහපත සළසමින් සමාජයේ උන්නතිය සඳහා ද පුද්ගලයන්ගේ අභිවෘද්ධිය සඳහා ද කටයුතු කිරීමට කිතුනුවාට ඇති වගකීම ශුද්ධවූ බයිබලීය දැක්ම අපට ඉදිරිපත් කරයි.

**ශුද්ධවූ බයිබලීය චින්තනය**

මවන ලද මිනිසාට ආසිරි පතමින්, මුළු මැවිල්ල වර්ධනය කිරීමට ද පාලනය කිරීමට ද බලය ඔහුට/ ඇයට දුන් සේක. " නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී , පොළොව පුරා පැතිර ..." (උත්පත්ති 1-28)

සමාජයේ වෙසෙන සහෝදර පුරවැසියන්ගේ යහපත වෙනුවෙන් කටයුතු කිරිම - යහපත් සමාරියයාගේ උපමාව (ලූක් 10:25-37) ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාව (ලූක් 16-19-31)

" පෙනෙන සහෝදරයාට ප්‍රේම නොකරන්නාට, නොපෙනෙන දෙවියන් වහන්සේට ප්‍රේම කළ නොහැකි ය. දෙවියන් වහන්සේට ප්‍රේම කරන තැනැත්තා තම සහෝදරයාටත් ප්‍රේම කළ යුතුය යන ආඥාව අපි උන්වහන්සේගෙන් ලැබුවෙමු " (1 ජොහන් 4:20-21)

ඉහත සඳහන් ශුද්ධ වූ බයිබලීය චින්තනය පැහැදිළි කරනුයේ දේව මැවිල්ල වර්ධනය කිරීම හෙවත් මානව පවුලේ සංවර්ධනය සහ පොදු යහපත වෙනුවෙන් ඇපකැපවීම දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයාට පවරන ලද කැඳවීමේ ස්වභාවයටම ආවේනික වූවක් බවයි.

**සභා ඉගැන්වීම්**

මනුෂ්‍යයා තමාගේ යුතුකම් අනුදැන අන්‍යොන්‍ය සහයෝගයෙන් එකිනෙකාගේ සුබ සිද්ධිය වෙනුවෙන් වැඩ කළ යුතු ය.

" මනුෂ්‍යයන් ස්වභාවයෙන්ම සමාජීය වන හෙයින් ඔවුන් අනුන් සමග එකතු වී ජීවත්වීමද එකිනෙකාගේ ශුභ සිදධිය සඳහා වැඩ කිරීමද අවශ්‍ය වන්නේය. එකිනෙකාගේ අන්‍යොන්‍ය අයිතිවාසිකම් පිළිගෙන ඒවාට ගරු කිරීමද, යුතුකම් දැනගෙන ඒවා ඉටු කිරීම ද ක්‍රමවත් මනුෂ්‍ය සමාජයක විශේෂ ලක්ෂණයක් විය යුතුයි" (ලෝක සාමය 31-33)

මිනිසා වගකීමෙන් යුතුව කටයුතු කිරීම සමාජයේ යහ පැවැත්ම හා සුබ සිද්ධිය සඳහා අවශ්‍ය වන්නේය.

" නිදහසින් හා වගකීමෙන් යුක්තව ක්‍රියා කිරීමට හැකිවීම මනුෂ්‍ය පුද්ගලයාගේ ගරුත්වයට උචිත අංගයකි. එහෙයින් සමාජ සම්බන්ධකම්වලදී අයිතිවාසිකම් ක්‍රියාත්මක කරනවිට ද යුකුකම් ඉටු කරන විට ද ප්‍රධාන වශයෙන් නිදහස් වගකීම හා මුල් පිරීමේ ශක්තිය අනුව ක්‍රියා කිරීමට ඔහුට අවකාශයක් තිබිය යුතු යි.." (ලෝක සාමය 34)

" එක එක මනුෂ්‍යයාගේ දියුණුව හා මනුෂ්‍ය සමාජයේ ප්‍රගතිය අතරේ අන්‍යොන්‍ය සම්බන්ධතාවක් ඇති බව මනුෂ්‍යයාගේ සමාජීය ස්වභාවයෙන් පෙනී යයි..." (වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව 25)

" පොදු යහපත යනුවෙන් අදහස් කරනුයේ සමාජ කණ්ඩායම්වලට හා ඒ කණ්ඩායම්වල සියලු සාමාජිකයනට තමන් සම්පූර්ණකර ගැනීමට ඉඩ සලසන නියමන්හි මුළු එකතුවය..." (වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව 26)

" සමාජය වූ කලී, එකමුතුකම පරමාර්ථය කරගෙන එකට බැඳුණු , පුද්ගලයන් සමූහයයි. අතීතයෙන් ඉගෙන අනාගතය සැළසුම් කරන සාමූහිකත්වයෙකි. සමාජය මාර්ගයෙන් සෑම මනුෂ්‍යයකුම එහි " උරුමකරුවකු " ද වෙයි. එමෙන්ම ඔහුගේ " තලෙන්තු" මගින් තම අනාගතය දියුණු කරගෙන ඒවා වර්ධනය කරගනියි..." (ක.ස.ධ 1880 )

" මානව සංවර්ධනය " සහභාගීත්වය" ලෙස හඳුන්වනුයේ එකිනෙකා , සමාජ යහපැවැත්ම හා පොදු යහපත වෙනුවෙන් ස්වේච්ඡාවෙන් හා පරිත්‍යාගශීලිව ඉදිරිපත් වීමයි. පොදු යහපත සඳහා එකිනෙකා තමාගේ තත්ත්වය හා භූමිකාව අනුව දායක විය යුතුය. මෙම අනිවාර්ය යුතුකම මනුෂත්වය හා සවභාවයෙන් බැඳී පවතී..." (ක.ස.ධ 1913 )

මානව සංවර්ධනය හා කිතුනු දායකත්වය ගැන කතා කිරීමේදී සමාජයේ පොදු යහපත හා ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැපවීම අත්‍යවශ්‍ය කරුණකි. සමාජීය, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික අංශ. කිතුනු දායකත්වය තුල දේව රාජ්‍යයේ වටිනාකම් වලින් පෝෂණය වන කළ මිනිස් සමාජය මිහිපිට " දේව රාජ්‍ය " බවට පත්වනු ඇත. කිතුනු කැඳවීම වන්නේද දේව රාජ්‍යයේ උදාව වෙනුවෙන් කටයුතු කිරීමයි. මෙහිලා පළමුව පුද්ගලයාට ගරුත්වය දැක්වීම, දෙවනුව සමාජ සුබ සිද්ධිය හා සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම තුන්වනුව සමාජයේ සාමය හා සහජීවනය වෙනුවෙන් වෙහෙසීම යන අංග තුන ඉතා වැදගත් ය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1** මිනිස් බවේ ගරුත්වය පිළිබඳව සාකච්ඡා කරන්න.

**පියවර 2** කාන්තාවන් පිළිබඳ කිතුනු චින්තනය පිළිබඳව කතිකාවතක් ගොඩ නගන්න.

**පියවර 3** මිනිසාගේ සමාජ ජීවිතය පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා කරන්න.

**පියවර 4** මානව සංවර්ධනය හා කිතුනු සහාගීත්වය පිළිබඳව කතිකාවතක් කර ගොඩනගන්න.

**මූලාශ්‍ර**

- ශුද්ධ වූ බයිබලය, නව අනුවාදය, දෙවන සංස්කරණය 1990
- ක්‍රිස්තුස් වහන්සේගේ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව (LG)
- වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව (G S)
- ලෝකයේ සාමය, 23 ජුවාම් ශුද්ධෝත්තම පියතුමන්ගේ විශ්ව ලේඛනය1963
- ගිහියෝ, II ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන්ගේ අපෝස්තලික අනුශාසන පත්‍රය, 1988
- දහම් දියඹ, දහතුන් වැනි කලාපය, කිතුනු විවාහය

නිපුණතාව 10.0 : **කිතුනු ජනවන්දනාවට සහභාගි වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි.**

**නිපුණතාව මට්ටම 10.2** : වත්මන් සමාජ ගැටලු පිළිබඳව කිතුනු වගකීම ගෙනහැර දක්වයි.

**කාලච්ඡේද** : කාලච්ඡෙද 08

**ඉගෙනුම් ඵල** :

- සමස්ත මැවිල්ල, තිළිණයක් ලෙස මිනිසාට බාර කළ දෙවියන් වහන්සේගේ අභිමතය වනුයේ මිනිසා ප්‍රචණ්ඩත්වයෙන් සහ හිංසාවෙන් වැළකී, සියලු මැවිලි සමග සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත්වීම බව වටහා ගනියි.
- බයිබලීය චින්තනය හා කිතුනු දැක්ම අනුව, සාමය යනු ප්‍රචණ්ඩත්වය හා යුද්ධ ගැටුම් නොමැතිවීම පමණක්ම නොව, එකිනෙකාගේ සාධාරණ අපේක්ෂාවෙන් හ,අයිතීන් ඉටු කරලීම මගින් ඔවුන් තුළ ඇතිවන තෘප්තිමත් වීමේ සතුට හා පූර්ණත්වයේ අත්දැකීම බව අවබෝධ කර ගනියි.
- දෙවියන් වහන්සේගේ සමානත්වයට හා ස්වරූපයට මවන ලද මිනිසා, ස්වභාව ධර්මයේ , පරිසරයේ භාරකරු හා නියමුවා බව වටහාගෙන පරිසරය සංරක්ෂණය කිරීම හා තවත් ලස්සන කිරීමට තමන් සතු වගකීම මනාව අවබෝධ කරගනියි.
- ස්වභාව ධර්මය තුළින් අනාවරණය වන දෙවියන් වහන්සේගේ මහිමය හා බලය අවබෝධ කරගෙන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙන් දැඩි පාරිසරික බැඳීමකින් වෙලි ස්වභාව ධර්මයට හා පරිසරයට වඩ වඩා සමීපව කටයුතු කිරීමට සිතට ගනියි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**10.2.1 ගැටුම් නිරාකරණය හා සාමය නඟාලීම**

**'සාමය' පිළිබඳ ශුද්ධ වූ බයිබලීය චින්තනය**

ශුද්ධ වූ බයිබලීය චින්තනයට අනුව බලන කල 'සාමය' යනුවෙන් අදහස් කරනුයේ යුද්ධය නොමැති, ගැටුම්,හිංසා නොමැති පරිසරයක් බිහිවීම පමණක් නොවේ. ඊට එහා දිවෙන ගැඹුරු අර්ථයක් ඉන් ධ්වනිත කරවයි.

පැරණි ගිවිසුමේ " සාමය' සඳහා භාවිත ' ෂලොම් (Shalom) යන හෙබ්‍රෙව් වචනයේ පුළුල් අර්ථය වනුයේ යමකුගේ සාධාරණ අපේක්ෂාවන්, සිතුම් පැතුම් ඉටුවීම හේතුකොට ඔහු ඇය තුළ ඇතිවන සැහිමකට පත්වීම හෝ තෘප්තිමත් වීමෙන් ජනිතවන සන්තුෂ්ටියයි. එය පුද්ගලයා තුළ ඇතිවන පූර්ණත්වයේ අත්දැකීමක් ලෙස ද හැඳින්වීම නිවැරදිය. ' සාමය' යන සංකල්පය සැම විටකම කෙනෙකුගේ සාධාරණ ඉල්ලීම්, අයිතිවාසිකම් හා යුක්තිසහගත අපේක්ෂාවන් හා එකට බැඳී පවතී. ඒවා ඉෂ්ඨ වන විට සාමය උදාවීම හෙවත් පූර්ණත්වය ලබා ගැනීමේ අවස්ථාව උදාවේ. ගැටුමක් ඇතිවන්නේ යුක්තිය, සාධාරණත්වය අහිමි වන විටදීය, යුක්තිය ඉටුවන විට ගැටුමකට යාමට

අවශ්‍ය නොවේ. එබැවින් ගැටුම් නිරාකරණය සඳහා යුක්තිය, සාධාරණත්වය ඉටු කිරීමෙන් සාමය නඟාලිය යුතු ය.

සමස්ත මැවිල්ල, දේව තිළිණයක් ලෙස මිනිසාට බාර කළ දෙවියන් වහන්සේගේ අභිමතය වනුයේ මිනිසා සියලු මැවිලි සමඟ සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත්වීමයි. එම නිසා ප්‍රචණ්ඩත්වය, ගැටුම්, හිංසාව හා යුද්ධය කිසිසේත් දේව අභිමතය නොවන බව ශුද්ධවූ බයිබලීය චින්තනය අපට කියයි.

පුරාණ ගිවිසුමේ 'සාමය' හුදෙක් පුද්ගලයකුගේ හෘද අභ්‍යන්තරයේ ජනිතවන හැඟීමකට වඩා කණ්ඩායමක් ජන සමූහයක් තුළ සාංඝිකව, සාමූහිකව ලබන අත්දකීමක් ලෙස විස්තර කෙරේ. සංඝයේ සියලු දෙනාගේ අවශ්‍යතා ඉටුවීම, සමාන අයිතිවාසිකම් ලැබීම, බෙදා හදා ගැනීම මගින් සාධාරණත්වය ඉටුවීම මගින් ජනිතවන සම්පූර්ණත්වය, සංහිඳියාව සාමය ලෙස හැඳින්වේ.

**මෙසියස්තුමාණන් සාමයේ කුමාරයාණෝ ය (යෙසායා 9:6)**

සාමයේ උදාව ගැන යෙසායා දිවැසිවරයා අපූර්ව අර්ථකථනයක් ඉදිරිපත් කරයි. " වෘකයා බැටළු පැටවා සමඟ වාසය කරන්නේ ය..." (යෙසායා 11:6-9)

සියලු ජාතීන් එක්ව විනාශකාරී ආයුධ භාවිතය හා සැහැසිකම් නවතා ලොව සංවර්ධනය හා යහපත වෙනුවෙන් කටයුතු කළ යුතුය. " තමන්ගේ කඩුවලින් නගුල් ද හෙල්ල වලින් දෑකැතිද සාදා ගන්නෝය.." (යෙසායා 2:1-5)

**මෙසියානු රාජ්‍ය සාමයේ රාජ්‍යයකි (මීකා 5:4)**

මෙසියානු ඉගැන්වීම අනුව සාමය ස්ථාපිත වීමට නම් අනිවාර්ය කොන්දේසි දෙකක් ඉටුවිය යුතුය. එනම් යුක්තිය හා ධර්මිෂ්ඨකමයි.

යුක්තිය - කෙනෙකුට හිමිවිය යුතු සාධාරණ අයිතිවාසිකම් ඔහුට/ඇයට ලබා දීමයි.

ධර්මිෂ්ඨකම - දේව අභිමතය විමසා බලා එයට අවනතව ඒ ඔස්සේ ක්‍රියාකිරීමයි, ජීවත්වීමයි. (යෙසායා 9:7-11)

මේ අනුව, සාමය යනු ඉබේ පහළවන්නක් නොවේ. සාමය නඟාලීම යනු යුක්තිය, සාධාරණත්වය ඉටු කිරීමයි. සාධාරණත්වය ඉටු වන්නේ කොතැනද, එතැන සාමය උදාවේ, යන්න ශුද්ධ වූ බයිබලීය දැක්ම අපට පවසයි. අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ දී පීඩිතයන් සූරාකෑමේදී , නිර්දය හෙළා දැකීම්වලදී සාමය කඩවී අහෝසි වී යන බවද එය අපට පවසයි. (ආමොස් 4:1-2) (ජෙරමියා 22:13-14) සාමය අහෝසි වී

යන තැන ගැටුම් සැහැසිකම් ඉස්මතු වන අතර සමාජය තව තවත් අගාධය කරා ඇදී යාමට ඒ හේතු වේ.

**නව ගිවිසුමේ දෘෂ්ඨි කෝණය**

නව ගිවිසුම තුළ සාමය යන සංකල්පය ගැන කතා කිරීමේ දී පුරාණ ගිවිසුමේ 'ෂලොම්' යන වදනට සමාන අර්ථය භාවිත වුවද පුරාණ ගිවිසුමේ ඉගැන්වීම්වලට අමතරව ආධ්‍යාත්මික ස්වරූපයක් ඉන් ගම්‍ය වේ.

දිවැසිවරුන් බලාපොරොත්තු වූ මෙසියස් තුමාණෝ ' සාමයේ කුමාරයාණෝ ය. එහෙයින් එතුමාණන්ගේ උපත සුබාරංචියකි. එය "සකල ජනයා හට ආනන්ද ජනක මංගල පුවතක් ද වෙයි. එම සාමයේ දීමනාව උන් වහන්සේගෙන් ලබන්නෝ " දේව ප්‍රසාදයලත් ' හෙවත් සුසිත් ජනයෝය (Men of goodwill) දේව ප්‍රසාදය ලත් ජනයා වනාහි දේව අභිමතය හඳුනාගෙන ඒ ඔස්සේ ජීවත් වන ජනතාවය (ලූක් 2:10-14) දෙවිඳුන්ගෙන් ලැබෙන සාමය අත්දැකිය හැක්කේ ද සාමය උදාකළ හැක්කේ ද ඔවුනට පමණි.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් ලැබෙන සාමය ලෝකයාගෙන් ලැබෙන සාමයට වඩා අති වෙනස් ය. (ජොහන් 14 :27) මනුෂ්‍යයාගේ අවශ්‍යතා, අපේක්ෂා කොතෙක් ඉටුවුවද හෘද අභ්‍යන්තරයේ සාමය ඇත්දැකීමට නොහැකිවුවහොත් අසහනයට, කැළඹීමට පත්වේ. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට දෙන්නේ ලෝකයාට දිය නොහැකි මෙවන් උත්තරීතර සාමයකි. උන් වහන්සේ අන්‍යයන් උදෙසා හිස්වී සිය ජීවිතය පූජා කර සාමයට මඟපෑදූ සේක. (එපීස 2: 14-16) ස්වකීය උත්ථානයෙන් පසු දර්ශනය වූ සෑම අවස්ථාවකම " ඔබට සාමය වේවා" යි (ලූක් 24:36) පවසා උන්වහන්සේ දානය කළේ මෙම මහඟු සාමයේ තිළිණයයි. ලෝකයා සාමය යන්නෙන් අදහස් කරන දේ හා උන් වහන්සේ අපට දෙන සාමය අතර ඇති පරස්පරය මින් අපට වැටහේ.

කිතුනු අනුගාමිකයකු ලෙස සාමය උදාකිරීම වෙනුවෙන් කටයුතු කිරීමේ දී පරිත්‍යාගශීලීවීම අත්‍යවශ්‍යය. පරිත්‍යාගයකින් තොරව සාමයක් නූපදීයි. (ජොහන් 15:12-13) සාමය හා ප්‍රේමයෙන් පරිත්‍යාගවීම අතර ඇත්තේ දැඩි සම්බන්ධයකි.

කන්ද උඩ දේශනයේ අප දකින උන් වහන්සේගේ අවිහිංසාවාදී ප්‍රතිපත්තිය ඉතා වැදගත් ය. " යමෙක් ඔබගේ දකුණු කම්මුලට ගැසුවොත් ඔහුට අනෙක් කම්මුල ද හරවන්න. " (මතෙව් 5 :9)

කිතු දහම තුළ සැහැසිකම්, ප්‍රචණ්ඩත්වය හා යුද්ධ ගැටුම්වලට ඉඩක් නැති බව මින් සනාථ වෙයි. හිංසාවට අවිහිංසාවෙන් පිළිතුරු දී හිංසාව, ප්‍රචණ්ඩත්වය පරාජය කිරීම කිතුනුවකුගේ පරම යුතුකමකි.

තවද ජීවත්වන සමාජයේ සාමය උදාකිරීමට කිතුනුවකුට වගකීමක් පැවරේ. කන්ද උඩ දේශනයේ මංගල වාක්‍යවල "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝ ය.." (මතේව් 5 :9) යන සමිඳුන්ගේ මංගල වාක්‍ය අනුව සාමය වෙනුවෙන් පරිත්‍යාගයෙන් ඇපකැපවීම කිතුනුවකුගේ පරම වගකීමකි. (1 -කොරින්ති 1:10)

**සභා ඉගැන්වීම්**

- "ලෝක සාමය (Pacem in Terris) 23 ජුවාම් ශුද්ධෝත්තම පියතුමන්ගේ විශ්ව ලේඛනය
- වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව G.S 5 වන පරිච්ඡේදය - සාමය නඟාලීම හා ජාතීන්ගේ සමාජයේ දියුණුව සඳහා ක්‍රියා කිරීම නො 77-82
- කතෝලික සභා ධර්මෝපදේශය (ක.ස.ධ)

  2302 -2306 - සාමය සුරැකීම

  2307 - 2330 යුද්ධය වැළැක්වීම

**10.2.2 පරිසරය සුරකීමේ කිතුනු වගකීම**

**මැවීමේ කතාවේ පාරිසරික සබැඳියාව**

**මැවීම පිළිබඳ පළමු කතාව (උත්පත්ති 1/12, 4 අ)**

මැවීමේ කතාව රචකයාගේ මුඛ්‍ය පරමාර්ථය , විශ්වයේ සියලු දේට ඉහළින් දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍ය හා බලය තහවුරු කිරීමයි. එහෙයින් විශ්වයේ අපිළිවෙල, අසංවිධානය, හිස්බව, දෙවියන් වහන්සේගේ මැවීමේ ක්‍රියාවලිය තුළ පූර්ණ ලෙස 'පිළිවෙල' 'සංවිධානය' බවට පත්වී මනහර වන ආකාරය රචකයා පෙන්වා දෙයි. " ආරම්භයේ දී දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. පොළොව හිස්ව පාළුව තිබිණි...." (උත්පත්ති 1:11)

සමස්ත මැවිල්ල, ස්වභාව ධර්මයා හෙවත් පරිසරය ඇතිවන්නේ දෙවියන් වහන්සේගේ ආධිපත්‍යයෙනි. එහි ආරම්භය ඇතිවනුයේ මිනිසාට පෙරය. පසුව අවසානයේදී දෙවියන් වහන්සේගේ සමානත්වයට හා ස්වරූපයට මවන ලද මිනිසා පරිසරයේ භාරකරු හා නියමුවා බවට පත්වේ. මැවිල්ල සුරැකීමට මිනිසා දේව නියමයෙන් බැඳී සිටියි. මුළු මහත් සොබා දහම, පරිසරය පුරා පිළිඹිබු වන්නේ, දේවාත්මානුභාවයයි. උන්වහන්සේ මැවූ සියල්ල " ඉතා මනහර බව" දෙවියන් වහන්සේ දුටු සේක. (උත්පත්ති 1:31)එම මනහර බව, දර්ශනීය බව, ස්වභාවික සෞන්දර්‍ය දූෂණය නොකොට, විකෘති නොකර සුරැකීම හා තව තවත් ලස්සන කිරීම මනුෂ්‍යයා සතු වගකීමකි. මුළු මහත් මැවිල්ල මිනිසාට බාර දි එය සුරැකීමට දෙවියන් වහන්සේ ඔහු /ඇය හා ගිවිසුමක් ඇති කර ගත් සේක. (උත්පත්ති 2:15) එබැවින් පරිසරයේ භාරකාරත්වය දැරීම පමණක් නොව, එය වර්ධනය කිරීම හා සුරැකීම මිනිසාගේ පරම වගකීමකි.

**මැවීම පිළිබඳ දෙවන කතාව (උත්පත්ති 2:4ආ 3 :24)**

දෙවියන් වහන්සේ ඒදන් හි උයනක් තනා එහි දැකුම්කලු ප්‍රණීත ආහාරයට ගත හැකි සියලු ගස් වර්ග ද වැඩෙන්නට සලසා මිනිසා එහි පදිංචි කරවූ සේක. (උත්පත්ති 2:19)

මෙම රචකයාගේ ලේඛනයේ " ආදම්' යන වචනය දූවිල්ලට ද මනුෂ්‍යයාටද භාවිත කිරීමෙන් මනුෂ්‍යයා පොළොවට කෙතරම් සමීපදැයි හැඟේ. මනුෂ්‍යයා මවනු ලබන්නේ පොළොවේ දූවිල්ලෙනි (උත්පත්ති 2:7) පෙළොව සරුසාරය, සරුඵලගෙන දෙයි. එමනිසා එය අස්වැද්දිය යුතුය. පොළොව අස්වැදීමට නම් එය ආරක්ෂා කළ යුතුය. එය ආරක්ෂා කළ යුත්තේ මනුෂ්‍යයාය. ශුද්ධවූ බයිබලීය දැක්මට අනුව පොළොව අස්වැද්දීමම දේව නමස්කාරයේ ක්‍රියාවකි, දෙවි සමිඳුන්ට ප්‍රශංසා කිරීමකි, දේව වන්දනාවකි, පරිසරය සොබා දහම වර්ධනය හා සුරැකීම දේව වන්දනාවක් වීමෙන්ම එම වගකීමේ බැරෑරුම් බව වටහා ගත හැකි ය.

මිනිසා හා පරිසරය අතර මෙන්ම මිනිසා හා සතුන් අතරේ ද ඇත්තේ දැඩි සබැඳියාවකි. මිනිසා මවනු ලබන්නේ ද දූවිල්ලෙනි (උත්පත්ති 2:7) සතුන් මවනු ලබන්නේ භූමියෙනි (උත්පත්ති 2:19)

ඇතැම් බයිබල් විශාරදයන් පවසනුයේ උත්පත්ති පොතේ හමුවන මැවීමේ කතාව උත්පත්ති 9 පරිච්ඡේදයේ එන නෝවා සමග ඇතිකරගත් දේව ගිවිසුම සමග සම්බන්ධ කර අවබෝධ කරගත යුතු බවයි.

" මා හා නුඹලා ද නුඹලා සමග සිටින සියලු ජීවමාන සතුන්ද අතර මතු සියලු පරම්පරාවක් සඳහා මා පිහිටුවන ගිවිසුම් ලකුණ නම් මෙයයි " (උත්පත්ති 9:12)

මෙම ගිවිසුම දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර පමණක් නොව මුළු මහත් මැවිල්ලද සමඟය. පරිසරයද, සොබාදහම ද එහි කොටස්කරුවන් වන බැවින් මිනිස් අප සැම දේව මැවිල්ලේ භාරකරුවන් වන්නෙමු.

**ගීතාවලිය තුළ පාරිසරික ආධ්‍යාත්මිකත්වය**

දේව මැවිල්ලෙ අග්‍රස්ථානය මිනිසා බව ගීතාවලිය තහවුරු කරයි " ... තෙද යස කිරුළක් ඔහු පිට පළඳන ලද්දේය. ඔබ මැවූ හැමදේ ඔහුට යටත් කළ සේක. ඔබ ඔහු මුළු සක්වළට අධිපති කළ සේක..." (ගීතාවලිය 8:4-7) මේ මුළු මහත් මැවිල්ල සමඟ මිනිසා දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි. ගොළු පරිසරයට වනන්නට නොහැකි ප්‍රශංසාව, ස්තුතිය තම වන්දනාවෙන්, ප්‍රශංසාවෙන් සජීවී කරන මිනිසා සමස්ත මැවිල්ලේ අග්‍රපූජකයාණන් බව ගීතාවලිය පෙන්නුම් කරයි. ගීතාවලියේ එන ප්‍රශංසාවේ ස්තුතියේ ගීතිකාවල අලෝකය, අහස්තලය, පොළොව, ගස් කොළන්, හිරු රාජයා,සඳ මඬල, මසුන්, පක්ෂීන්, පර්වත, කඳු ශිඛර, මහ සයුර, පොළොව, පත්ල, අගාධය, නිම්න,

කඳුකරය, මිනිසා යන සොබා දහමේ සමස්ත මැවිල්ල නිතර නිතර සිහි කිරීම මැවුම්කරුවාණන් පසසන ගැඹුරු පාරිසරික ආධ්‍යාත්මිකත්වයක් ඉස්මතු කර දක්වයි.

**ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ හා පාරිසරික බැඳීම**

- ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දූත සේවාව පලස්තීනයේ පාරිසරික සෞන්දර්ය හා සම්බන්ධව වන අයුරු සුබාරංචි පොත්වල මනාව දිස්වේ.
- පලස්තීනයේ බිහිසුණු කාන්තාර, කඳුවැටි , බියකරු ප්‍රපාත, ගොයම ගස් කොළන්, සතුන් , පක්ෂීන්, මල් පළතුරු, ඇළදොළ, ගංගා නිම්න, මුහුද, පොකුණු, අහස් කුස, හිරු සඳු, සුළඟ, පර්වත, ආදිය උන්වහන්සේට කිසිසේත් ආගන්තුක නොවීය.
- උන් වහන්සේ ස්වභාව ධර්මයට , පරිසරයට, අධිපතියාණෝය, සොබා දහමද උන් වහන්සේගේ අණට කීකරුය. (මාක් 4:35-41) මතෙව් 14:22-23)
- පරිසරය, සොබාදහම තුළින් දේව අනාවරණය සිදුවේ. ඒ තුළින් දේව බලය අත්දැකිය හැකිය. (මතෙව් 24:29-31)
- ජීවිතය හා හෙට දවස ගැන කනස්සලු නොවන ලෙස කළ දේශනය සොබා දහම හා අපූරු ලෙස සම්බන්ධවේ. (මතෙව් 6:26-31, ලූක් 12:22-29)
- උන්වහනසේගේ උපතේදී ස්වර්ගයද, මිහිතලයද ආනන්දයෙන් ඉපිලී ගියේය. (ලූක් 2:14) තාරකාවක් අහසේ පැයූහ. (මතෙව් 2:2, 9-10)
- උන් වහන්සේ බව්තිස්ම ස්නාපනය ලැබූයේ ජෝර්දාන් නදීයේය. (මාක් 1:9 -11) එහි දී ශුද්ධාත්මයාණන් වැඩියේ පරෙවි විලාසයකිනි.
- පාස්කු අභිරහසටද , ඔලිව් කන්ද, මල් උයන, ගොල්ගොතාව, කිද්‍රෙන් ඇල, කුරුසියේ මරණයේ දී තද අන්ධකාරයක් පහළවීම, පොළොව කම්පා වීම, ගිරිකුළු දෙදරීම, සොහොන් ගෙවල් විවරවීම (මතෙව් 27:45-46) ආදී සොබා දහමේ ක්‍රියා සහ පරිසරය දැඩි සේ සම්බන්ධය.

ඉහත සඳහන් ශුද්ධවූ බයිබලීය දැක්ම හා සොබාදහම නම් දේව තිළිණය ගැන මෙනෙහි කරන විට පරිසරය සුරැකීමේ, ස්වභාවධර්මය ආරක්ෂා කිරීමේ හා වර්ධනය කිරීමේ කිතුනු වගකීම මැනවින් පැහැදිලි වෙයි.

එහෙයින් පරිසර දූෂණය, කිරීම, කෙලෙසීම, කිතුනු දැක්මට විරුද්ධය. එහෙයින් තමා ජීවත්වන පරිසරයේ පිවිතුරු බව රැකගැනීම, පරිසර සංරක්ෂණය හා පරිසරයේ මනහර බව රැකගැනීමට කිතුනුවා බැඳී සිටියි. එය සොබා දහමට යුක්තිය ඉටු කිරීමකි. එනම් රසායනික ලෝකය, වාක්ෂලතා ලෝකය, සත්ත්ව ලෝකය හා මනුෂ්‍ය ලෝකය සුරකිමින් එය වර්ධනය පිණිස ඇපකැප වීමයි.

මිනිසා දෙවියන් වහන්සේ සමඟ ද සෙසු මිනිසුන් සමගද ස්වභාව ධර්මයා සමගද සමීප සැබැදියාවක් ගොඩ නඟා ගතයුතු බව මින් වඩා පැහැදිලි වෙයි.

**සභා ඉගැන්වීම්**

වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව, 69

| | | | |
|---|---|---|---|
| ක.ස.ධ | 299 | - | දෙවියන් වහන්සේ මනහර ලෝකයක් මිනිසාට තිළිණ කළ සේක. |
| | 338 | - | සියල්ලේ නිර්මාතෘවරයාණෝ දෙවියන් වහන්සේය. |
| | 347 | - | සියලු මැවිලි දෙවියන් වහනසේට ප්‍රශංසා කළ යුතුය. |
| | 341 | - | මැවිල්ල ඉතා මනහරය |
| | 2415-2418 | | මැවිල්ලට, පරිසරයට, ආදරය කිරීම හා සංරක්ෂණය |
| | 668 | - | ක්‍රිස්තුස් වහන්සේ මැවිල්ලේ ස්වාමියාණෝ ය. |

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1**   **ගැටුම් නිරාකරණය හා සාමය නගාලීම පිළිබඳව සාකච්ඡා කරන්න.**

**පියවර 2**   **පරිසරය සුරැකීමේ කිතුනු වගකීම් පිළිබඳව කතිකාවතක් ගොඩ නගන්න.**

මූලාශ්‍රය

ශුද්ධ වූ බයිබලය, නව අනුවාදය, දෙවන සංස්කරණය 1990

ක්‍රිස්තුස් වහන්සේ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව LG

වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව G S

ලෝක සාමය, 23 ජුවාම් ශුද්ධෝත්තම පියතුමන්ගේ විශ්ව ලේඛනය 1963

ගිහියෝ, II ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන්ගේ අපෝස්තලික අනුශාසන පත්‍රය, 1988

නිපුණතාව 10.0 : **කිතුනු ජනවන්දනාවට සහභාගි වෙමින් ක්‍රිස්තියානි ජීවිතය වැඩි වර්ධනය කර ගනියි.**

නිපුණතා මට්ටම 10.3 : කිතුනු එකමුතුව හා විවිධ ආගම් වග සහජීවනය සඳහා වඩාත් වගකීමකින් ක්‍රියා කරයි.

කාලච්ඡේද : කාලච්ඡෙද 08

ඉගෙනුම් ඵල :

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා පිළිබඳ කරුණු දැන විවිධත්වය තුළ එකම ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂය දරමින් සුබ වදනේ ධර්මදූත වගකීම අවබෝධ කරගනියි.
- ඉතිහාසයේ සිදු වූ මිනිස් දුර්වලකම් නිසා, සභා බෙදීම් සහ වෙන්වීම් සිදු වුවද එය ක්‍රිස්තුස් වහන්සේගේ අභිමතය නොවන හෙයින් ඒකත්වයේ කිතුනු සභාවක් වෙනුවෙන් සහා සංවාදයේ වැදගත්කම අවබෝධ කර ඒ වෙනුවෙන් කැපවෙයි.
- අන්‍යාගම් පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේගේ ආකල්ප හා සහා ඉගැන්වීම් දැනගෙන අන්තර් සාමයික සමගිය මගින් ආගමික සහජීවනය උදා කිරීමට දායක වෙයි.
- කිතුනු නොවන ආගම් තුළ දකින යහපත් ලක්ෂණ වටිනාකම් සහ හරවත් ඉගැන්වීම් ගෞරවයෙන් අගයමින් හොඳ හිත පළ කර දූත සේවාවේ නියැලෙමින් ඔවුනටද ගැලවීමේ පණිවුඩය ප්‍රකාශ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර දීමට අත්වැලක් :**

**ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා**

* කතෝලික සභාව
* ලංකා සභාව
* මෙතොදිස්ත සභාව
* ප්‍රෙස්බේටේරියන් සභාව
* බැප්ටිස්ට් සභාව
* ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
* ගැලවීමේ හමුදාව
* දකුණු ඉන්දියානු සභාව

**කතෝලික සභාව**

සාමාන්‍ය වහරේ දී රෝමානු කතෝලික සභාව යනුවෙන් ද හැඳින්වෙන මෙම සභාව ක්‍රිස්තුස් වහනසේ විසින්ම ස්ථාපිත (මතෙව් 16/18-19) අපොස්තුලුවරුන්ගෙන් පැවත එන (APOSTOLIC ) එකම (ONE ) ශුද්ධ වු (HOLY) කාතෝලික (CATHOLIC) යන ලක්ෂණ සහිත සභාව ලෙස ඉතිහාසය පුරා අර්ථ ගැන්වේ. ශුද්ධ වූ පේදුරු අපෝස්තුලුතුමනගේ අනුප්‍රාප්තිකයාණන් ලෙස රෝමයේ රාජගුරුප්‍රසාදි තනතුරට

පත්වන ශුද්ධෝත්තම පාප්වහන්සේ මෙම සභාවේ විශ්ව නායක එඬේරාණන් ලෙස නායකත්වය උසුලයි. උන් වහන්සේගේ නායකත්වය යටතේ විවිධ රජගුරු පදවිවල රාගුරු ප්‍රසාදීන් වහන්සේලා සාමුහික බැඳීමෙන් සේවයේ නිරත වෙති.

ශ්‍රී ලංකාවේ බහුතර කිතුනු ජනතාවක් අයත්වන කතෝලික සභාව රාජගුරු පදවි 11 කින් යුතුව රාජගුරුප්‍රසාදීන් වහන්සේගේ එඬේරිකත්වය යටතේ දූත සේවාවේ නිරත වෙයි.

**ලංකා සභාව**

ඇන්ග්ලිකාන සහෝදරත්වය හා බැඳි ක්‍රියාත්මක වන ලංකා සභාව කොළඹ සහ කුරුණෑගල යන දියොකිසී හෙවත් රාජගුරු පදවි දෙකක් යටතේ සේවාවේ නිරත වේ. ඒ ඒ දියෝකිසී ස්වාධීනව ක්‍රියාත්මක වේ. රදගුරු හිමි පැවිදි පක්ෂය හා ගිහි සැදැහැවතුන්ගෙන් සමන්විත දියොකිසි මන්ත්‍රණ සභාව මගින් අදාළ දියෝකිසියේ සේවාවන්ට අදාල තීන්දු, ප්‍රතිපත්ති ආදිය සකස් කෙරේ.

**මෙතෝදිස්ත සභාව**

ඇන්ගලිකාන සභාවේ ගෞරවනීය ජෝන් වෙස්ලිගේ සුබාරංචි සේවාවේ පුනරුදයක් ලෙස මෙතෝදිස්ත සභාවේ මුලාරම්භය සැළකිය හැකි ය. මෙම සභාවට අයත් පස දෙනෙකුගෙන් යුත් මුල්ම කණ්ඩායමක් ප්‍රථම වරට 1814 ජුනි 29 දා ගාල්ල ට ළඟා වීමෙන් මෙම සභාවේ මෙරට ආරම්භය සිදු වී ඇත.

**ප්‍රෙස්බෙටේරියන් සභාව**

මෙම සභාව 1742 දී ගාල්ල නගරයේ දී අරඹන ලදී. එවකට ඕලන්ද සභාවේ සහයෝගය හා පිළිසරණ ලැබ මෙය සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. මෙහි ධර්ම දූත සේවාව කොළඹ හා මහනුවර ප්‍රදේශවල සිදු වේ.

**බැප්ටිස්ට් සභාව**

මෙම සභාවේ ගරු ජේම්ස් කාටර් 1812 දි ලන්ඩනයේ සිට ශ්‍රී ලංකාවට පැමිණියේ ය. එවකට ඉංග්‍රීසි රජයේ සහයෝගය මත එතුමාගේ ආගමික සේවාව ආරම්භ වූයේ ග්‍රෑන්පාස් ප්‍රදේශයෙනි. ආරම්භයේ සිට ම මෙම සභාවේ සේවාව බස්නාහිර වයඹ හා මධ්‍යම යන පළාත් දක්වා විහිදී ගියේ ය.

**ක්‍රිස්තියානි රෙපරමාදු සභාව**

මෑතක් වනතුරු (2007) ඕලන්ද රෙපරමාදු සභාව වශයෙන් ද හැඳින්වුණු මෙම සභාවේ මෙරට දූත සේවාව ඇරඹුයේ 1647 දීය. ආරම්භයේ දී ඕලන්ද ජාතිකයනට සීමා වුවද පසුව සිංහල ජනතාව අතර ද පැතිරිණි. ලන්දේසි ආගමනයක් සමග ඇරඹි මෙම සභාව ශ්‍රී ලංකාවේ පැරණිතම ප්‍රොතෙස්තන්ත සභාව වේ.

**දකුණු ඉන්දියානු සභාව**

ඇන්ග්ලිකාන, මෙතෝදිස්ත, කොන්ග්‍රිගේෂනල් හා ප්‍රෙස්බෙටේරියන් යන විවිධ ආගමික සම්ප්‍රදායන්ගෙන් හෙබි සභා කිහිපයක එකමුතුවක ප්‍රතිඵලයක් ලෙස 1947 සැප්තැම්බර මස මෙම සභාව ඉන්දියාවේ දී බිහිවිය. රදගුරු හිමියන්ගේ ආධ්‍යාත්මික මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ. රාජගුරු පදවිය පාලනය වන්නේ සංසදයකිනි. (*Synod*) එම සංසදය මගින් රදගුරු හිමිපත් කෙරේ.

### 10.3.2 කිතුනු සභා සංවාදය

ගැලවීමේ සැලැස්ම මානව සංහිතිය පුරා යුගාන්තය දක්වා සිදුවන පිණිස මිහිපිට ගැලවීමේ සළකුණක් ලෙස, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ශුද්ධ වූ පේදුරු අපෝස්තුලුතුමන්ගේ නායකත්වය මත ශුද්ධ වු සභාව සථාපනය කළ සේක. උන් වහන්සේ ස්ථාපනය කළේ එක් ශුද්ධ වූ සභාවකි, සභා කිහිපයක් නොවේ. මෙම සභාවේ බෙදීම් වෙන්වීම් ඇතිවීම උන්වහන්සේගේ අභිමතය නොවීය.

ඉතිහාසය මුළුල්ලේ සිදුවුණු සභා බෙදීම් අධ්‍යයනය කරන කළ, විවිධ හේතු මත එම බෙදීම් සිදුවුණු බව පසක් වුවද ඊට අදාළ පොදු සාධකය වන්නේ මනුෂ්‍යයන්ගේ දුර්වලකම් හා පව්කාරී ස්වභාවයය. එම නිසා මෙම සභා බෙදීම්, විසිරයෑම් සභා ඉතිහාසයේ ඉතා අවාසනාවන්ත සිද්ධීන් ලෙස දිස්වේ.

ඉතිහාසයේ ඇතිවුණු බෙදීම්, විසිරීම් වලට හේතු වූ කරුණු කුමක් වුවද ඒවා ක්‍රිස්තුස් වහන්සේගේ අභිමතයට පටහැනිය. සිය උත්තම පූජක යාච්ඤාවේ දී උන් වහන්සේ පියාණන් වහන්සේට යාඥ්ඤා කළේ අනුගාමිකයන් සැමගේ එකමුතුකම හා ඒකත්වය වෙනුවෙනි. (ජොහන් 17/11) එසේනම් වර්තමානයේ විවිධ සභාවලට හා කණ්ඩායම්වලට බෙදීවෙන්වී එකම ක්‍රිස්තුස් වහන්සේ අදහමින් සුබාරංචියට සාක්ෂ්‍ය දරණ ක්‍රිස්තු අනුගාමික අප සැමගේ වගකීම වන්නේ " ඒකත්වයේ කිතුනු සභාවක්" මගින් උන්වහන්සේ අභිමත වූ ඒකත්වය නගාලීමයි. ඒකත්වයෙන් උන් වහන්සේට සාක්ෂ්‍ය දැරීමයි. එසේනම් සභා ඉතිහාසයේ සිදුවු මිනිස් දුබලකම්, අත්වැරදි, බෙදීම්, වෙන්වීම් කුමක් වුවද ඒ සියල්ල අකාමකා එකම ක්‍රිස්තුස් වහන්සේගේ එකම සභාවක් වෙනුවෙන් ඇප කැපවීම හෙවත් ඒ වෙනුවෙන් දරණ ප්‍රයත්නය වනුයේ " "කිතුනු සභා සංවාදයයි" (Ecumenism)

එහෙයින් මෙම බෙදීම්, වෙන්වීම් තුළ තවදුරටත් සභා ඒකත්වය හා සමගිය වෙනුවෙන් කටයුතු කළ නොහැකි බව සියලු කිතුනුවන් වටහාගත යුතු ය. ඉතිහාසයේ පටු සීමා හා වැරදිවල එල්බ නොසිට සභා සමගිය, සභා ඒකත්වය වෙනුවෙන් කළ හැකි සෑම දෙයක් මගින්, ක්‍රිස්තුස් වහන්සේගේ අභිලාෂය පරිදි එකම සභාවක ක්‍රිස්තු ප්‍රතිරූපය දකින්නට අපට හැකිවනු ඇත.

**සභා ඉගැන්වීම්**

ඉතිහාසය දෙස හැරී බැලීමේ දී කතෝලික සභාව විසින් නිලවශයෙන් සභා සමගිය උදෙසා දැමූ ප්‍රථම හා ප්‍රබල අඩිතාලම ලෙස දෙවන වතිකාන මන්ත්‍රණ සභාව හැඳින්විය හැකිය . ( 1962-1965) ක්‍රිස්තුස් වහන්සේ සභා කිහිපයක් ස්ථාපිත නොකළ සේක. එකම ශුද්ධ වූ සභාවක් පමණක් පිහිට වූ සේක. " මෙසේ එක රැළක් ද එක එඬේරෙක් ද වන්නා හ. " (ජොහන් 10/16) යන ඒකත්වයේ සභාවක් සඳහා පියවර නගන්නට මෙම මන්ත්‍රණ සභාව මහත් පිටිවහල් විය. මෙම මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන 16 න් දෙකක්ම වෙන්වනුයේ ක්‍රිස්තියානි සභා සංවාදය සහ සභා සමගිය පිළිබඳ කතෝලික සභාවේ ඉගැන්වීම ප්‍රකාශ කිරීමය.

පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය
කිතුනු සභා ඒකත්වය නඟාලීමේ නියෝගය

මෙයට අමතරව, වතිකාන මන්ත්‍රණ සභාවේ, ක්‍රිස්තුස් වහන්සේගේ සභාව පිළිබඳ ජාතීන්ගේ ආලෝකය නම් ව්‍යවස්ථාවේ අංක 15 වෙනත් කිතුනු සභා තුළ ඇති සාධනීය යහපත් ලක්ෂණ ගෙන හැර දක්වමින් කිතුනු සභා සමගිය ඉත සිතින් ප්‍රාර්ථනා කරයි.

II ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ " ඒකත්වයක් වන පිණිස" ( *Utunum sinct*)

ක්‍රිස්තු ශ්‍රාවකයන්ගේ මනුෂ්‍ය දුබලකම නිසා අතීතයේ සිදුව වැරදී හා අනවබෝධය මතසභා බෙදීම්, වෙන්වීම් සිදුවුවද ඒවා තව තවත් බෙදී වෙන්වීමකට හේතු නොකොට, පශ්චාත්තාපයෙන්ද සහෝදර හැඟීමෙන් ද දේව අභිමයට සහ ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වයට විවෘත වී කටයුතු කළහොත් දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ අභිමතය අනුව සුදුසු යෝග්‍ය අවස්ථාවේදී කිතුනු සභා සමගිය හා ඒකත්වය නමැති ලෝකෝත්තර තිළිණය අපහට දානය කරන බැව් නිසැකය.

එහෙයින් කිතුනු සභා අතර දේව ධාර්මික වශයෙන් ද සමාජිකයන් අත්දකින එකඟතා මුල් කරගෙන සංවාදයක යොමු වී සභා සමගිය උදෙසා යාච්ඤා කිරීමත් ඒ වෙනුවෙන් වෙහෙසීමත් කිතුනු අප සැමගේ යුතුකමකි. මන්ද " එකම එඬේරෙක් යටතේ එකම රැළක් "වීමට සමිඳාණෝ අප කැඳවා ඇත.

**සභා සංවාදයේ ප්‍රතිඵල**

කිතුනු සභා සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා කිතුනු සභාවේ මෑත කාලයේ දී ඇතිවූ සාධනීය ලක්ෂණ කිහිපයක් සඳහන් කරනු වටී.

- ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය සහ සෙසු කිතුනු සභා එකඟත්වයෙන් 1983 දී දොරට වැඩි නව සිංහල ශුද්ධ වූ බයිබලය.
- විශ්ව සභාව හා සම්බන්ධ වී, සෑම වසරකම ජනවාරි මාසයේ සහ සමගිය උදෙසා කෙරෙන යැදුම් සතිය.
- ආගමික , සමාජීය කටයුතුවලදී සුහදතාවයෙන් කටයුතු කිරීම.
- දේවධාර්මික එකඟතා මුල්කරගෙන සිදුවන ශාස්ත්‍රීය හා ධාර්මික සාකච්ඡා හා සංවාද.
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙ) විභාගය සඳහා සෑම කිතුනු සභාවකටම පොදු වූ විෂය නිර්දේශයක් සැකසීමට හැකි වීම.

**10.3.3 විවිධ ආගම් සමඟ සහජීවනය**

විවිධ ආගම් මඟ සහජීවනයෙන් කටයුතු කිරීම හෙවත් " අන්තර් ආගමික සංවාදය" ලෙස හැඳින්වෙනුයේ සමාජයේ පවතින විවිධ ආගම් සහ ආගමික ජන කොටස් සමඟ එකමුතු වෙමින් වෙළි ජීවත්වීමට දරණ සහා ප්‍රයත්නයයි.

ලෝකයේ විවිධ ආගම් සහ දර්ශන ඒ ඒ ඉගැන්වීම් අනුව යමින් සත්‍යය සොයායන ගමනක නිරතවෙති. අප ශ්‍රී ලංකාව ද ලොව ප්‍රධාන ආගම් හතරේ අනුගාමිකයන්ගෙන් හෙබි බහු ආගමික රටකි. එහෙයින්, බෞද්ධ, හින්දු, ඉස්ලාම් යන සෙසු ආගමික සැදැහැවතුන් හා සංවාදයක යෙදෙමින් සහජීවනයෙන් කටයුතු කිරීම කිතුනු අපට ඉතා වැදගත් ය.

**අන් ආගම් පිළිබඳ බයිබලීය පසුබිම**

ශුද්ධවූ ලියවිල්ල රචනා කළ කතුවරුන්ගේ දැක්ම හා අරමුණ වූයේ එකළ වූ අන් ආගම් පිළිබඳ ඉගැන්වීම් නොව, මානව ඉතිහාසය තුළ තමන් අත්දුටු, අනාවරණය වූ එකම දෙවියන් වහන්සේ ගැන සිය අත්දැකීම් බෙදාගැනීමය. එහෙයින් තෝරාගත් ජනතාවගේ ඇසින් පුදා නොවන අන් ආගම් දෙස විවෘතව බැලීමක් බොහෝ විට දක්නට නොලැබිණි.

එහෙත් නික්මයාම සිද්ධියට ප්‍රථමයෙන් පැවැති ගිවිසුම මගින් දෙවියන් වහන්සේගේ ගැලවීම සැමටම විවෘතව තිබූ බව පෙන්වා දෙයි. (උත්පත්ති 1/11) සමස්ත මිනිස් වර්ගයා සඳහාම ඇත්තේ එකම ගැලවීමේ ඉතිහාසයක් බව මින් මනාව පැහැදිලි වේ. නෝවා සමග ඇති කරගත් ගිවිසුම මානව ඉතිහාසයේ දේව මැදිහත්වීමකි. එහෙයින් ඉශ්‍රායෙලයේ දෙවියන් වහන්සේගේ කැමත්ත වනුයේ ස්වල්ප දෙනෙකුගේ ගැලවීම නොව සියලු දෙනාම උන් වහන්සේගේ ගැලවීම අත්දැකීමය. එනම් දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වය භේදයකින් සීමාවකින් තොරව සෑම ජාතියකටම, ආගමකට දර්ශනයකටම විවෘතව පවතී.

**අන්‍යආගම් පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේ ගේ ආදර්ශය**

ක්‍රිස්තුස් වහන්සේ අන්‍යාගම් හා අන්‍යාගමිකයන් ප්‍රතික්ෂේප නොකොට අන් මත ඉවසමින් සංවාදයේ නියැලුණු අවස්ථා කිහිපයක් සුබාරංචි පොත් ඇසුරෙන් දැක්විය හැකි ය.

1. සමාරියේ ස්ත්‍රීය සමඟ ළිඳ ළඟදී කරන සංවාදය (ජොහන් 4(1-22)
2. කනානීය ස්ත්‍රීය හමුවීම (මාක් 7/24-30)
3. ශතාධිපතියාගේ දාසයා සුව කිරීම (මතෙම් 8/5-13, ලූක් 7/1-10)

එමෙන්ම දේව රාජ්‍ය පිළිබඳ උන් වහන්සේගේ ඉගැන්වීම එක් ජනකොටසකට පමණක් සීමාවූවක් නොව සැමට විවෘත පණිවුඩයකි. ගැලවීම ජුදා ජාතිකයන්ට පමණක් නොව මානව පවුලේ සියලු දෙනාට බව උන්වහන්සේගේ ඉගැන්වීම හා උපමා රූපක මගින් පැහැදිලි කරයි. (මතෙව් 8/10-11, 20- 24, 25(31-32, 43)

**ශුද්ධ වූ පාවුලු තුමා හා විවිධ ආගම්**

නාඳුනන දෙවියන් පිළිබඳ අරියෝපගයේ දේශනය (ක්‍රියා 17ඃ)

ශ්‍රී ලාංකිකයන් වන කිතුනු අපි බහු ආගමික සමාජයක ජීවත්වෙමින් අපගේ කිතුනු විශ්වාසය ප්‍රකාශ කරමින් දෙවි සමිඳුන් වන්දනා කරන්නෙමු. එවැනි බහු ආගමික සමාජයක දී ආගමික සහජීවනය හෙවත් අන්තර් ආගමික සංවාදය අපට බෙහෙවින් වැදගත්ය. එය සාමකාමී ජීවිත රටාවකටද හේත වෙයි. දෙවි සමිඳුන්ගේ ගැලවීමේ තිළිණය අපට අත්දැකිය හැකි වන්නේ සියලු ආගම් සමඟ ඇතිවන සංවාදය හේතුවෙන් උපදින අන්‍යොන්‍ය තේරුම්ගැනීම, සුහදතාව, සහයෝගය මුල්කරගෙන ගොඩනැගෙන ප්‍රේමයෙන් පිරුණු සමාජයක් තුළිනි.

**සභා ඉගැන්වීම්**

**දෙවන වතිකාන මන්ත්‍රණ සභාව**

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ බොහෝ ප්‍රකාශන වලින් කිතුනු නොවන අන්‍ය ආගම් කෙරෙහි ශුද්ධ වූ සභාවේ දැක්ම හා ආකල්ප මෙන්ම සබඳතා පිළිබඳ අවධානය යොමු කරති. මේ සම්බන්ධයෙන් එම කතිකාවෙන් පසු නිකුත්වුණු ඉගැන්වීම් ද බහුලය. මෙම මන්ත්‍රණ සභා දැක්ම යථාර්ථයක් බවට පත්කරගන්නට 1964 දී vi වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා විසින් ලේකම් කාර්යාංශයක්ද ස්ථාපිත කිරීම කැපී පෙනේ.

කිතුනු නොවූ ආගම් කෙරෙහි ශුද්ධවූ සභාවේ සබඳතා පිළිබඳ වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශය (NA) විශ්ව ආගම්වල ඇති සත්‍යතාවන් දකියි. ඒවා අගය කරයි. ඒ සත්‍යතා සොයාබලා තේරුම් ගැනීමට සහා මාතාවට ආරාධනා කරයි. හින්දු, ඉස්ලාම්, බෞද්ධ, ජුදා යන ආගම්වල ගැබ්ව ඇති සත්‍යතාවන්ද ඉතා සංක්ෂිප්තව මෙම ප්‍රකාශනයේ සටහන් කරමින් ඒ සත්‍යතා දකින්න සැමගේ හදවත් විවර කරයි.

" මෙම ආගම්වල ඇති ශුද්ධවූ ද සත්‍යවූ ද කිසිවක් කතෝලික සභාව ප්‍රතික්ෂේප නොකරන්නීය. තම ආගමික ඉගැන්වීම්වලට බොහෝ දේ වෙනස් වුවත් මෙම ආගම්වල ජීවිත ප්‍රතිපදාවන්, ධර්ම ඉගැන්වීම් සහ ධර්ම ශික්ෂණ ඉතා ඉහලින් අගය කරයි. ( NA 2, 3)

කිතුනු නොවන ආගම් අදහන අයද විශේෂාකාරයකින් දේව ජනතාවට බද්ධවෙති. එම නිසා ඔවුන්ටද හොඳ හිත පා දූත සේවාවන් ඉටු කිරීමට සභාවට කැඳවීමක් ඇත. ( LG 16, 17)

එපමණක් නොව සභාවට හිරිහැර කරන්නවුන් කෙරෙහි හොඳහිත පා ගැලවීම ප්‍රකාශ කිරීමට සභාවට කැඳවීමක් ඇති බව මෙම මන්ත්‍රණ සභාව පෙන්වා දෙයි. (G S 92)

අප අන්‍යාගම්වල පවතින යහපත්, සාර්ධර්ම හා වටිනාකම් ගෞරවයෙන් සළකන අතරම අපගේ විශ්වාසය අනුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨතම අනාවරණය බවත් " මාර්ගය ද සත්‍යයද ජීවනයද " ඃජොහන් 1ඃ(6) බවත් වටහාගෙන උන් වහන්සේ හඳුනාගෙන ඒකාබද්ධ වන්නට ලැබීම ගැන සතුටු වෙමින් එම අත්දැකීම අන්‍යයන් හා බෙදා ගැනීමට ද උත්සුක විය යුත්තෙමු. එසේ කිරීම අපගේ යුතුකමක් හා වගකීමකි. එහෙත්, අප එසේ කළ යුත්තේ අන්‍යයන්ගේ ආගමික නිදහසට බාධා නොවන සේ, එම නිදහසට මහත් සේ ගරු කරමින්ය. එසේම අන්‍යාගමිකයන්ගේ ආධ්‍යාත්මික හා ශීලධාර්මික සත්‍යතා ඔවුන්ගේ සමාජීය ජීවිතය හා සංස්කෘතිය සුරකිමින් හා අගය කරමින් ය (NA 2 )

අන්‍යාගම්වල අති වටිනාකම්, සත්‍යතා සහා මාතාව අගය කර ගරු කරන්නීය යනුවෙන් අදහස් කරන්නේ එම ධර්මයන් තුළ දුර්වලතා, අසම්පූර්ණතා නැතැයි කියා සිතීම නොවේ. " සංවාදය සහ ප්‍රකාශනය' අංක 30, 31, 32 සඳහන් කරන්නේ ලෝකය තුළ පාපය, අයහපත පවතින්නාසේ ආගමික සම්ප්‍රදායන් තුළ අසම්පූර්ණතා හා අහිතකර අංග ක්‍රියාත්මක වෙමින් තිබිය හැකි බවයි.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මනුෂ්‍යායට තමන්ට කැමැති ආගමක් ඇදහීමට ඇති නිදහස පිළිගනියි. මෙම නිදහස තනි පුද්ගලයන්, කණ්ඩායම් ආදී සියල්ල වෙත තිබිය යුතු අතර කිසිවකු විසින් තවත් ආගමක් පිළිගැනීම කෙරෙහි තවකෙකුට බලපෑමක් නොකළ යුතු බව දන්වයි. (DH2 )

මෙතෙක් සුබාරංචිය නොපිළිගත් කිතුනු නොවන ආගම්වලට අයිති අය ද විවිධාකාරයෙන් දේව ජනතාවට බද්ධ වන බව මෙම මන්ත්‍රණ සභාව උගන්වයි (LG 16, 17)

**කතෝලික සභා ධර්මෝපදේශය (ක.ස.ධ)**

- 839 - 848

**සංවාදය සහ ප්‍රකාශනය**

ශුද්ධාසනයේ අන්තර් ආගමික සංවාදය පිළිබඳ ලේකම් කාර්යාංශයේ ප්‍රකාශනයකි.

ඇතැම් ප්‍රදේශවල කිතුනු ජනතාව ඉතා සුළුතරයකි. අන්‍යාගමික බහුතරයක් මැද ජීවත්වන විට කිතුනු අප ද ඔවුන් හා ජීවිත සංවාදයේ යෙදිය යුතු ය. " ඔවුන් මෙම මනුෂ්‍යයන්ට ගෞරවයෙන් හා ප්‍රේමයෙන් සම්බන්ධ වී තමන් ද ඒ කණ්ඩායම්වවල සාමාජිකයන් බව පිළිගතයුතු වන්නේ ය. ඔවුහ් ඒ මනුෂ්‍යයන්ගේ සමාජීය වු ද සංස්කෘතිකවූ ද ජීවිතයට නොයෙක් ආකාර හුවමාරුවලින් හා ව්‍යාපාරවලින් පංගුකාර වෙත්වා " (AG 11)

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1: ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභාවල ලැයිස්තුවක් ගොඩනැගීමට උපදෙස් දීම.

පියවර 2 : ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා පිළිබඳව සාකච්ඡා කරන්න.

පියවර 3 : ඒකත්වයේ කිතුනු සභාවක් වෙනුවෙන් සභා සංවාදයේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න.

පියවර 4 : අන්‍යාගම් පිළිබඳව ක්‍රිස්තුස් වහන්සේගේ ආකල්ප හා ඉගැන්වීම් මගින් අන්තර් ආගමික සමගිය ආගමික සහජීවනය උදාකරන ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.

මූලාශ්‍ර :
- ශුද්ධවූ බයිබලය, නව අනුවාදය, දෙවන සංස්කරණය 1990
- ක්‍රිස්තුස් වහන්සේගේ ශුද්ධවූ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව (*L G*)
- කිතුනු නොවූ ආගම් කෙරෙහි ශුධවූ සභාවේ සම්බන්ධතාව පිළිබඳ ප්‍රකාශනය (*NA* )
- ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශය (*DHe*)
- වර්තමාන ලෝකයේ ශුධවූ සභාව ( *GS*)
- පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝග (OE)
- කිතුනු සභා එකත්වය නගාලීමේ නියෝග (UR)
- සංවාදය හා ප්‍රකාශනය
- දහම් දියඹ, තෙවැනි කලාපය 2004 ජුනි සමයාන්තර සංවාදය
- සිරිලක් කිතු සසුන, ගරු තිමති කොලමුන්නේ පැතුනි.පියතුමා

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයෙකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයෙකු ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීමට සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර, සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත්, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය :

| | |
|---|---|
| 01. පැවරුම් | 02. ව්‍යාපෘති |
| 03. සමීක්ෂණ | 04. ගවේෂණ |
| 05. නිරීක්ෂණ | 06. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම් |
| 07. ක්ෂේත්‍ර චාරිකා | 08. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නලය |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත්, මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 01

   **උපකරණ අංකය** - 01

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 6.1

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** - ශුද්ධවූ සභාවේ ආරම්භක අවධිය
   පාවුලුතුමාගේ ධර්මදූත ගමන්
   පාවුලුතුමාගේ මූලික ඉගැන්වීම්

4. **උපකරණයේ ස්වභාවය** - බිත්ති පුවත් පත - 18

5. **අරමුණු** -
   - ශුද්ධාත්මාගමනය තුළ සිදුවූ ශුද්ධ සභාවේ ආරම්භය පිළිබඳව අධ්‍යයනය කරයි.
   - මුල් කිතුනු සභාවේ විශේෂ ලක්ෂණ ගෙන හැර දක්වයි
   - පාවුලුතුමාගේ ධර්මදූත ගමන් හා ඔහුගේ මූලික ඉගැන්වීම් පිළිබඳ තොරතුරු ලියා දක්වයි.

6 ඇගයීම් ක්‍රමය -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති සම්බන්ධතාව/ එහි උචිත බව | 04 |
| 2. සංවිධාන්තමක බව හා ප්‍රමාණාත්මක බව | 04 |
| 3. අලංකරණය සඳහා යොදා ඇති කරුණු හා ඒවායේ යෝග්‍ය බව | 04 |
| 4. අන්තර්ගතයේ ඇති නිර්මාණශීලී බව හා තර්කානුකූල බව | 04 |
| 5. බිත්ති පුවත්පතක් වශයෙන් නිමැවුමෙහි සාර්ථක බව | 04 |
| මුළු ලකුණු | 20 |

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 01

   **උපකරණ අංකය** - 02

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 6.2

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -
   - ප්‍රධාන මන්ත්‍රණ සභා
   - සභාපියවරු

4. **උපකරණයේ ස්වභාවය** - ක්ෂණික කථා

5. **අරමුණු** -
   - ප්‍රධාන මන්ත්‍රණ සභා පිළිබඳව විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කරයි.
   - සභා පියවරුන්ගේ දිවිය තම දිවියට ආදර්ශයක් වන ආකාරය පැහැදිලි කරයි.

6 **ඇගයීම් ක්‍රමය** -

| නිර්ණායක | ලකුණු |
|---|---|
| 1. ප්‍රවේශය, මාතෘකාව පැහැදිළිව හැඳින්වීම හා එහි උචිත බව | 04 |
| 2. සංවිධානාත්මක බව, මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම නිවැරදි බස | 04 |
| 3. විශේෂ යෙදුම්, පුද්ගල ප්‍රකාශ ආදිය යොදා ගැනීම හා නිර්මාණශීලී බව | 04 |
| 4. පැහැදිලි බව, නිවැරදි කටහඬ පාලනය, අංග චලනය, නිවැරදි උච්චාරණය | 04 |
| 5. නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 04 |
| මුළු ලකුණු | 20 |

# පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 01
   **උපකරණ අංකය** - 03

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 6.3

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -
   - 5-9 ශත වර්ෂවල යුරෝපයේ කිතුනු ව්‍යාප්තිය
   - මධ්‍යතන යුගය

4. **උපකරණයේ ස්වභාවය** - ව්‍යුහගත රචනා

5. **අරමුණු** -
   - මුල් ශතවර්ෂවල යුරෝපය තුළ සභාව ව්‍යාප්ත වූ ආකාරය අධ්‍යයනය කරයි.
   - මධ්‍යතන යුගය තුළ සිදුවූ විශේෂිත සිද්ධීන් ගෙනහැර දක්වයි.
   - ඉතිහාසය තුළ සභාවේ වැටීම් හා නැගිටීම් පැහැදිලි කරයි

6 **ඇගයීම් ක්‍රමය** -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. මාතෘකාව හැඳින්වීම | 04 |
| 2. විෂය කරුණුවල වැදගත්කම/මාතෘකාවට අදාළ බව | 04 |
| 3. සංවිධානය, ඡේද බෙදීම, අනුපිළිවෙල, විවිධ උපක්‍රම භාවිතය | 04 |
| 4. භාෂාවේ නිවැරදි බව, නිවැරදි ව්‍යාකරණ, විරාම ලක්ෂණ උචිත යෙදුම් පැහැදිලි බව හා නිර්මාණශීලී බව | 04 |
| 5. නිගමනවලට එළඹීම, සාධාරණීකරණය, තර්කානුකූලව කරුණු ඉදිරිපත් කිරීම | 04 |
| මුළු ලකුණු | 20 |

# පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 02
   **උපකරණ අංකය** - 01

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 7.2

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -
   - පුනරුදය හා සභා ප්‍රතිසංස්කරණය
   - නූතන යුගය

4. **උපකරණයේ ස්වභාවය** - පැවරුම

5. **අරමුණු** -
   - පුනරුදය ඇතිවීමට බලපෑ සාධක හඳුනා ගනියි
   - පුනරුදය නිසා ඇතිවූ සභා ප්‍රතිසංස්කරණ විස්තර කරයි
   - නූතන යුගය තුළ දක්නට ලැබෙන සභා ක්‍රියාකාරීත්වය පැහැදිලි කරයි.

6 **ඇගයීම් ක්‍රමය** -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. විෂය ක්ෂේත්‍රයට /ඉගෙනුම් අරමුණුවලට ඇති සම්බන්ධතාවය අදාළ බව හා නවතාවයකින් යුතුවීම | 04 |
| 2. නිර්මාණය සඳහා යොදා ගන්නා විවිධ ක්‍රමවල හා මාධ්‍යයේ උචිත බව | 04 |
| 3. සංවිධානය, ඉදිරිපත් කිරීම, නිර්මාණශීලී බව | 04 |
| 4. අරමුණු ඉටුවන ආකාරයට ගොඩනැඟී තිබීම | 04 |
| 5. අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ සාර්ථකත්වය | 04 |
| මුළු ලකුණු | 20 |

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 02

**උපකරණ අංකය** - 02

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 8.2

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -

- නිදහසින් පසු සභාව මුහුණු දුන් ගැටලු
- දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ බලපෑම්
- වත්මන් සමාජය තුළ ලාංකේය සභාව

4. **උපකරණයේ ස්වභාවය** - ව්‍යාපෘති

5. **අරමුණු** -

- නිදහසින් පසු සභාව මුහුණ දුන් ගැටලු විශ්ලේෂණය කරයි.
- දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ බලපෑම් විග්‍රහ කරයි.
- වත්මන් සමාජය තුළ ලාංකේය සභාවේ ගමන් මග විස්තර කරයි.

6 **ඇගයීම් ක්‍රමය** -

| නිර්ණායක | ලකුණු |
|---|---|
| 1. මාතෘකාව/ගැටලුව අවබෝධ කර ගැනීම හා අර්ථ දැක්වීම, විෂය කේෂත්‍රයට එහි ඇති සම්බන්ධතාවය අවබෝධ කරගැනීම හා අරමුණු ගොඩනැගීම | 04 |
| 2. සැලසුම් කිරීම, කාල රාමුවක් සැකසීම, තොරතුරු රැස් කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග තීරණය කිරීම සහ ඒවා සංවිධානය කර ගැනිම | 04 |
| 3. තොරතුරු රැස් කිරීම හා ඒවායේ නිවැරදි බව | 04 |
| 4. සැලැස්ම අනුව නියමිත කාලය තුළ වැඩ අවසන් කිරීම, රැස් කර ගන්නා තොරතුරු ආශ්‍රයෙන් නිගමනවලට එළඹීම හා හේතු දැක්වීම | 04 |
| 5. ගැටලුව හා අරමුණුවලට අදාළව එළඹී නිගමන ඇසුරින් අදහස් දැක්වීම, වාර්තා ලිවීම, විෂය ක්ෂේත්‍රයට එහි ඇති සබඳතාව පැහැදිලි කිරීම | 04 |
| මුළු ලකුණු | 20 |

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 02
   **උපකරණ අංකය** - 03

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 7.3

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -
   - අධ්‍යාපනය
   - විද්‍යාව හා තාක්ෂණය
   - කලාව

4. **උපකරණයේ ස්වභාවය** - විවාද

5. **අරමුණු** -
   - ලෝකයට සභාවෙන් ලැබුණු දායකත්වය විස්තර කරයි.
   - විද්‍යාව හා තාක්ෂණය සභාවේ උන්නතියට යොදාගත් ආකාරය විග්‍රහ කරයි
   - කලාව තුළින් බිහිවූ නිර්මාණයන් හේතුකොට ගෙන සභාව මුහුණ දුන් අභියෝගයන් විවේචනාත්මකව විග්‍රහ කරයි

6 **ඇගයීම් ක්‍රමය** -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ප්‍රවේශය, මාතෘකාව පැහැදිලිව හැඳින්වීම හා එහි උචිත බව | 04 |
| 2. මාතෘකාවලට අදාළව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක බව | 04 |
| 3. අදහස් නිර්මාණශීලීව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීම | 04 |
| 4. උචිත ලෙස අංග චලනය හා කාල කළමනාකරණය | 04 |
| 5. සම්පිණ්ඩනය, නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | 04 |
| මුළු ලකුණු | 20 |

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 03

   **උපකරණ අංකය** - 01

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 9.1

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -
   - මුල් කිතුනු සභාව හා ජනවන්දනාව
   - පෙරදිග සභාවේ ජනවන්දනා ක්‍රම
   - බටහිර සභාවේ ජනවන්දනා ක්‍රම

4. **උපකරණයේ ස්වභාවය** - ප්‍රදර්ශනය

5. **අරමුණු** -
   - මුල් කිතුනු සභාව තුළ පැවැති ජනවන්දනාව ගෙනහැර දක්වයි
   - පෙරදිග සභාවේ ජනවන්දනා ක්‍රම චිත්‍ර මගින් නිරූපනය කරයි
   - බටහිර සභාවේ ජනවන්දනා ක්‍රම පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරයි

6 **ඇගයීම් ක්‍රමය** -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ප්‍රදර්ශන තේමාව උචිත බව හා විෂය ක්ෂේත්‍රයට ඇති සම්බන්ධතාව අරමුණු ගොඩ නැඟීම | 04 |
| 2. අරමුණු අනුව යොදාගන්නා විවිධ ද්‍රව්‍යවල හා මාධ්‍යයේ උචිත බව සංවිධානය කිරීම | 04 |
| 3. ප්‍රදේශීය සම්පත් යොදා ගැනීම, සකසුරුවම් ලෙස ද්‍රව්‍ය පරිහරණය, අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ සාර්ථකත්වය (අරමුණු අනුව) | 04 |
| 4. ඉදිරිපත් කිරීම, නිර්මාණශීලී බව, අරමුණු ප්‍රත්‍යක්ෂවන අයුරින් ඉදිරිපත් කිරීම | 04 |
| 5. ප්‍රදර්ශනය ඵලදායි ලෙස ඉගෙනුම් කාර්යයට සම්බන්ධ කිරීම, සිසුන් යොදාගත් අරමුණුවලට ළඟාවී තිබීම | 04 |
| මුළු ලකුණු | 20 |

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 03

**උපකරණ අංකය** - 02

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 10.2

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -

- ගැටුම් නිරාකරණය හා සාමය නඟාලීම
- පරිසරය සුරැකීමේ කිතුනු වගකීම
- වත්මන් සමාජය තුළ ලාංකේය සභාව

4. **උපකරණයේ ස්වභාවය** - ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්

5. **අරමුණු** -

- මිනිසා ප්‍රචණ්ඩත්වයෙන් හා හිංසාවෙන් වැළකී සියලු මැවිලි සමඟ සාමයෙන් හා සංහිදියාවෙන් ජීවත්වීම දේව අභිමතය වන ආකාරය පැහැදිලි කරයි.
- පරිසරය සුරැකීමේ කිතුනු වගකීම් බයිබලීය පාඨ ඇසුරින් ගෙන හැර දක්වයි.
- ගැටුම් නිරාකරණය හා සාමය නගාලීම සම්බන්ධව සභාව ප්‍රකාශයට පත්කොට ඇති විශ්වලේඛනවල අන්තර්ගතය ඉදිරිපත් කරයි.

6 **ඇගයීම් ක්‍රමය** -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. විෂයට අදාළවන පරිදි ප්‍රශ්න සකස්කර ගැනීම | 04 |
| 2. උචිත පරිදි කණ්ඩායම් සංවිධානය කර ගැනිම | 04 |
| 3. ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ කුසලතාව | 04 |
| 4. පිළිතුරු ඉදිරිපත් කිරීමට දක්වන දායකත්වය | 04 |
| 5. ලකුණු වාර්තා කිරීම හා සමස්ත දායකත්වය | 04 |
| මුළු ලකුණු | 20 |

## පාසල් පදනම් කරගත් තක්සේරුව

1. **පාසල් වාරය** - 03

   **උපකරණ අංකය** - 03

2. **ආවරණය කරන නිපුණතා මට්ටම** - 10.3

3. **ආවරණය කරන විෂයය අන්තර්ගතය** -
   - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා
   - කිතුනු සභා සංවාදය
   - විවිධ ආගම් සමග සහජීවනය

4. **උපකරණයේ ස්වභාවය** - ගවේෂණය - 4

5. **අරමුණු** -
   - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභාවන් පිළිබඳව නාමාවලියක් සකස් කරයි.
   - ඒකත්වයේ කිතුනු සභාවක් වෙනුවෙන් සභා සංවාදයේ වැදගත්කම ගෙන හැර දක්වයි
   - කිතුනු නොවන ආගම් ලබ්ධිකයන් සමග සහජීවනයෙන් ජීවත් වන ආකාරය නිරූපනය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරයි.

6 **ඇගයීම් ක්‍රමය** -

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ගැටලුව / විෂය මාතෘකාව අවබෝධකර ගැනීම හා අරමුණු ගොඩනගා ගැනීම, අරමුණු හා විෂයයට ඇති සබඳතාවය පිළිබඳ දැනීම | 04 |
| 2. ක්‍රියාවලිය - සැලසුම් කිරීම, සංවිධානය හා දත්ත රැස්කරගැනීමට ගන්නා ක්‍රියා මාර්ග තීරණය කිරීම | 04 |
| 3. තොරතුරු රැස් කිරීම හා ඒවායේ නිවැරදි බව | 04 |
| 4. දත්ත විශ්ලේෂණය සහ වගු හා ප්‍රස්තාර මගින් ඒවා නිරූපනය කිරීම | 04 |
| 5. නිගමනවලට එළඹීම, හේතු දැක්වීම, වාර්තා සකස් කිරීම | 04 |
| මුළු ලකුණු | 20 |